# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2007 අංක 07 දරන සමාගම් පනත

---

[සහතිකය සටහන් කළේ 2007 මාර්තු මස 20 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2007 මාර්තු මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පල කරන ලදී.

ශ්‍රී ලංකා ජනරජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිල : රු. යි.　　　　තැපැල් ගාස්තුව : රු. යි

වගන්තිය පිටුව

## 2007 අංක 07 දරන සමාගම් පනත

වගන්ති නාමාවලිය


1. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මකවීමේ දිනය 1


### I වන කොටස-සමාගම් සංස්ථාගත කිරීම සහ අදාළ කාරණා

සමාගම්වල පැවතිය යුතු ආවශ්‍යක ලක්ෂණ


2. සමාගමක නෛතික තත්වය සහ ශක්නුතාව 1
3. විවිධ වර්ගයේ සමාගම් 2


සමාගම් සංස්ථාගත කිරීම


4. සමාගමක් සංස්ථාගත කිරීමේ ක්‍රමය 2
5. සමාගම සංස්ථාගත කිරීම 3


සමාගම් නම්


6. නාමය පිළිබඳ නියම 4
7. නම් සම්බන්ධයෙන් සීමා කිරීම 5
8. නම වෙනස් කිරීම 6
9. නම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම 8
10. නම වෙනස් කිරීමට විධාන කිරීම 9
11. සමාගමක තත්ත්වය වෙනස්වීම මත නම වෙනස් කිරීම 10
12. සමගමේ නම හා සමාගමේ අංකය භාවිත කිරීම 11


සාංගමික ව්‍යවස්ථාවලිය


13. ව්‍යවස්ථාවලියේ ඇතුළත් කාරණා 12
14. ආදර්ශ ව්‍යවස්තාවලියක් අදාළකර ගැනීම 13
15. ව්‍යවස්ථාවලියක් අදාළ කර ගැනීම හෝ සංශෝධනය කිරීම 13
16. ව්‍යවස්ථාවලියේ බලපෑම 14
17. ව්‍යවස්ථාවලියේ පරමාර්ථ පිළිබඳ ප්‍රකාශයේ බලපෑම 14
18. ව්‍යවස්ථාවලියේ පිටපතක් ලබා ගැනීමට කොටස් හිමියන්ට අයිතිවාසිකමක් ඇති බව 15




2-PL 001387- 425 (2006/08)

වගන්තිය පිටුව

සමාගම් ගිවිසුම් ආදිය

19. ගිවිසුම්වලට ඇතුළත් විය හැකි ආකාරය 15
20. ඇටෝර්නි බලකරුවෝ 17
21. අධ්‍යක්ෂවරයන්ගේ, නිලධරයන්ගේ හා අනුයෝජිතයන්ගේ අධිකාරය 17
22. සම්ප්‍රයුක්ත දැන්වීමක් නොමැති බව 18

පූර්ව-සංස්ථාගත කිරීමේ ගිවිසුම්

23. පූර්ව-සංස්ථාගත කිරීමේ ගිවිසුම් ස්ථිර කළ හැකි බව 19
24. පූර්ව සංස්ථාගත කිරීමේ ගිවිසුම්වල ව්‍යංජිත ඇපවීම් 19
25. ස්ථිර කිරීම පැහැර හැරීම 20

සමාගම විසින් ලේඛන සැබෑ බවට සහතික කිරීම

26. සමාගම විසින් ලේඛන සැබෑ බවට සහතික කිරීම 21

II වන කොටස-පෞද්ගලික සමාගම්

27. පෞද්ගලික සමාගමේ ව්‍යවස්ථාවලිය 21
28. සමාගමක් පුද්ගලික සමාගමක් වීම අවසන් වීම 21
29. සමාගමක් පෞද්ගලික සමාගමක් බවට පත් විය හැකි බව 22
30. පෞද්ගලික සමාගම් විසින් සම්බන්ධතා රෙජිස්ටරය තබා ගැනීම අවශ්‍ය නොවන බව 22
31. කොටස්හිමියන් විසින් දක්වනු ලබන ඒකමතික එකඟත්වය 23

III වන කොටස-ඇපයෙන් සීමිත සමාගම්

32. ඇපයෙන් සීමිත සමාගමක් සංස්ථාගත කිරීම සඳහා වූ ඉල්ලීම 25
33. ඇපයෙන් සීමිත සමාගමකට ව්‍යවස්ථාවලියක් තිබිය යුතු බව 25
34. පුණ්‍ය සමාගම්වල සහ වෙනත් සමාගම්වල නමෙහි වූ සීමාසහිත යන වචනය අත්හැරීමේ බලය 26
35. ඇපයෙන් සීමිත සමාගම්වලට අදාළවන විධිවිධාන 28

IV වන කොටස-කොටස් සහ සෘණ පත්‍ර

සංස්ථා ප්‍රකාශය

36. සංස්ථා ප්‍රකාශයට දිනය යෙදීම 28
37. සංස්ථා ප්‍රකාශයේ විස්තර පිළිබඳ නිශ්චිතව සඳහන් නියමයන් 28

වගන්තිය පිටුව

38. විශේෂඥයකුගේ ප්‍රකාශයක් ඇතුළත් සංස්ථා ප්‍රකාශයක් නිකුත් කිරීමට ඔහුගේ කැමැත්ත අවශ්‍ය බව 31
39. සංස්ථා ප්‍රකාශයෙහි නම ඇතුළත් කිරීම සඳහා බැංකුවේ හෝ නීතිඥවරයකුගේ හෝ විගණකවරයකුගේ හෝ කැමැත්ත අවශ්‍ය බව 32
40. සංස්ථා ප්‍රකාශය ලියාපදිංචි කිරීම 33
41. සංස්ථා ප්‍රකාශයෙහි ඇති අසත්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් සිවිල් වගකීම 35
42. සංස්ථා ප්‍රකාශයේ ඇති අසත්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් සාපරාධී වගකීම 39
43. කොටස් හෝ සෘණ පත්‍ර විකිණීම සඳහා අර්පණයක් ඇතුළත් ලේඛනයක් සංස්ථා ප්‍රකාශයක් ලෙස සැලකිය යුතු බව 40
44. සංස්ථා ප්‍රකාශවලට අදාළ විධිවිධාන අර්ථ නිරූපණය කිරීම 41

විභජනය

45. අවම සහභාගය ලැබී ඇත්නම් මිස, විභජනය තහනම් බව 42
46. අවිධිමත් විභජනයක ප්‍රතිඵලය 43
47. කොටස් හා සෘණ පත්‍ර සඳහා සහ ඒවා විභජනය කිරීම පිණිස වූ ඉල්ලීම් 43
48. මහජනයාට කොටස් හෝ සෘණ පත්‍ර අර්පණය කිරීම පිළිබඳ සඳහන් කිරීම අර්ථ නිරූපණය කිරීම 45

කොටස්වල ස්වභාවය සහ කොටස් වර්ග

49. කොටස්වල ස්වභාවය සහ කොටස් වර්ග 46

කොටස් නිකුත් කිරීම

50. ආරම්භක කොටස් 47
51. කොටස් නිකුත් කිරීම 47
52. කොටස් නිකුත් කිරීම සඳහා ප්‍රතිඡ්ඨාව 48
53. අලුත් නිකුත් කිරීම්වලට ඇති පූර්වක්‍රය බල අයිතිය 49
54. කොටස් නිකුත් කිරීමේ ක්‍රමය 49

කොටස් මත ඇරයුම්

55. කොටස් මත ඇරයුම් 49

කොටස් හිමියන් වෙත බෙදා හැරීම

56. බෙදාහැරීම 50
57. ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණය 51
58. ප්‍රකාශ කළ ප්‍රාග්ධනය 52

වගන්තිය පිටුව

59. ප්‍රකාශ කළ ප්‍රාග්ධනය අවකරණය කිරීම 52
60. ලාභාංශ 54
61. බෙදා හැරීම් ආපසු ලබා ගැනීම 54
62. කොටස් හිමියාගේ වගකීම අඩුකිරීම, බෙදා හැරීමක් වීම 55

කොටස් නැවත මිලට ගැනීම

63. සමාගම විසින්, එය සතු කොටස් අත්කර ගැනීම හෝ නිදහස් කිරීම 56
64. සමාගමේ ම කොටස් සමාගම විසින් මිල දී ගැනීම 57
65. කොටස් මිලට ගැනීම සඳහා වූ කොන්ත්‍රාත්තුවක් බලාත්මක කිරීම 58

කොටස් නිදහස් කිරීම

66. නිදහස් කළහැකි යන්නෙහි අර්ථය 59
67. සමාගමේ මනාපය පරිදි නිදහස් කිරීම 59
68. කොටස් හිමියාගේ මනාපය පරිදි නිදහස් කිරීම 59
69. නියම කරන ලද දිනයේ දී නිදහස් කිරීම 60

කොටස් මිලට ගැනීම සම්බන්ධයෙන් මුදල් ආධාර

70. මුදල් ආධාර දීම සම්බන්ධයෙන් පරිසීමා 60
71. 70 වන වගන්තිය මගින් තහනම් කරනු නොලැබූ ගණුදෙනු 62

ප්‍රතිලෝම කොටස් දැරීම

72. පාලිත සමාගමක් පාලක සමාගමක කොටස් දැරීම සම්බන්ධයෙන් සීමා 63

කොටස් සහ ඍණ පත්‍ර පැවරීම

හිමිකම පිළිබඳ සාක්ෂි ආදිය

73. පැවරුම් සාධන පත්‍රයක් ඉදිරිපත් කළ විට හැර පැවරීම ලියාපදිංචි නොකළ යුතු බව 64
74. නීත්‍යානුකූල නියෝජිතයා විසින් පැවරීම 64
75. පැවරුම්කරුගේ ඉල්ලීම පිට පැවරුමක් ලියාපදිංචි කිරීම 64
76. පැවරුමක් ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම 65
77. පැවරුම් සහතික කිරීම 65
78. සහතික නිකුත් කිරීම සම්බන්ධයෙන් සමාගම සතු යුතුකම් 66
79. සහතිකය හිමිකම පිළිබඳ සාක්ෂියක් විය යුතු බව 67
80. ප්‍රොබේට් බලපත්‍රය ආදිය ප්‍රදානය කළ බවට සාක්ෂි 67

වගන්තිය පිටුව

## සෘණ පත්‍ර පිළිබඳ විශේෂ විධිවිධාන

81. සෘණ පත්‍ර දරන්නන්ගේ ලේඛනය පරීක්ෂා කිරීමට හා භාර ඔප්පුවේ පිටපත් ගැනීමට සෘණ පත්‍ර දරන්නන් හා කොටස් හිමියන් සතු අයිතිය 68
82. භාරකරුවන් වශයෙන් ක්‍රියා කිරීම අධ්‍යක්ෂවරයන්ට තහනම් බව 69
83. නිත්‍ය සෘණ පත්‍ර 69
84. නිදහස් කරනු ලැබූ සෘණ පත්‍ර ඇතැම් අවස්ථාවල නැවත නිකුත් කිරීමේ බලය 70
85. සෘණ පත්‍රවලට සහභාගිවීම සඳහා වූ ගිවිසුම් එසේම ඉටුකිරීම 71

## V වන කොටස- කොටස්හිමියන් සහ ඔවුන්ගේ අයිතිවාසිකම් හා බැඳීම්

86. “කොටස් හිමියා” යන්නෙහි අර්ථය 71

## කොටස් හිමියන් සතු වගකීම

87. කොටස් හිමියන් සතු වගකීම 72
88. ඇරයුම් සම්බන්ධයෙන් වගකීම 73
89. වගකීම වැඩි කිරීමට කොටස් හිමියන් එකඟ විය යුතු බව 73

## කොටස් හිමියන්ගේ බලතල

90. කොටස් හිමියන්ට විශේෂ වූ බලතල ක්‍රියාත්මක කිරීම 74
91. සාමාන්‍ය යෝජනා සම්මතයක් මගින් බලතල ක්‍රියාත්මක කිරීම 74
92. විශේෂ යෝජනා සම්මතයක් මගින් ක්‍රියාත්මක කරනු ලබන බලතල 74

## සුළු කොටස් හිමියන්ගේ කොටස් මිල දී ගැනීමේ අයිතිවාසිකම්

93. කොටස් මිලට ගන්නා ලෙස, කොටස් හිමියකු විසින් සමාගමෙන් ඉල්ලා සිටිය හැකි බව 75
94. මිල දී ගන්නා ලෙස ඉල්ලා සිටින දැන්වීම 76
95. සමාගම විසින් මිල දී ගැනීම 77
96. තුන්වන පාර්ශ්වකරුවකු විසින් කොටස් මිලදී ගැනීම 79
97. අධිකරණය විසින් නිදහස් කිරීමක් ප්‍රදානය කළ හැකි බව 79
98. සමාගම වස්තු භංගත්වයට පත්ව ඇත්නම්, අධිකරණය විසින් නිදහස් කිරීමක් ප්‍රදානය කළ හැකි බව 80
99. කොටස් හිමි අයිතිවාසිකම් වෙනස් කිරීම 81
100. කොටස් මිල දී ගන්නා ලෙස, කොටස් හිමියකු විසින් සමාගමෙන් ඉල්ලා සිටිය හැකි බව 82
101. නිර්බල නොවන ක්‍රියා මාර්ග 82

වගන්තිය පිටුව

## VI වන කොටස-සෘණ භාර ලියාපදිංචි කිරීම

### රෙජිස්ට්‍රාර්වරයා වෙත සෘණ භාර ලියාපදිංචි කිරීම


102. ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වූ සමාගම් විසින් ඇති කරනු ලැබූ සෘණ භාර ලියාපදිංචි කිරීම 83
103. ලියාපදිංචි නොකළ සෘණ භාර ඇතැම් අවස්ථාවල බලරහිත බව 87
104. අත්කර ගන්නා ලද දේපළ විෂයෙහි පවත්නා සෘණ භාර ලියාපදිංචි කිරීම, සමාගමේ කාර්යයක් බව 88
105. සෘණ භාර ලේඛනය රෙජිස්ට්‍රාර්වරයා විසින් තබා ගත යුතු බව 89
106. ලියාපදිංචි කිරීමේ සහතිකය සෘණ පත්‍රවල පිටසන් කිරීම 90
107. තෘප්තිය හෝ මුදා හැරීම පිළිබඳ සටහන් 90
108. සෘණ භාර ලේඛනය නිවැරදි කිරීම 91


### සමාගමේ සෘණ භාර ලේඛන හා සෘණ භාර ඇති කෙරෙන සාධන පත්‍ර පිටපත් පිළිබඳ විධිවිධාන


109. සෘණ භාර ඇති කෙරෙන සාධන පත්‍ර පිටපත්, සමාගම විසින් තබා ගත යුතු බව 91
110. සමාගමේ සෘණ භාර ලේඛනය 91


### සෘණ භාර ලේඛනය නැවත පරීක්ෂා කිරීම


111. සෘණ භාර ලේඛනය නැවත පරීක්ෂා කිරීම 92


### ශ්‍රී ලංකාවෙන් පිටත සමාගම්වලට මේ කොටස අදාළ කිරීම


112. ශ්‍රී ලංකාවෙන් පිටත සමාගමක් විසින්, ඇති කරන ලද සෘණ භාරවලට හා අත්කර ගන්නා ලද සෘණ භාරයකට යටත් දේපළවලට මේ කොටස අදාළ කිරීම 93


## VII වන කොටස-පරිපාලනය හා කළමනාකරණය

### ලියාපදිංචි කාර්යාලය


113. සමාගමේ ලියාපදිංචි කාර්යාලය 94
114. ලියාපදිංචි කාර්යාලය වෙනස් කිරීම 94
115. ලියාපදිංචි කාර්යාලය වෙනස් කිරීමට නියම කිරීම 94

වගන්තිය | පිටුව

## සමාගම් වාර්තා

116. සමාගමේ වාර්තා තබා ගත යුතු ස්ථානය 96
117. වාර්තාවල ආකෘතිය 98

## සමාගමේ වාර්තා පරීක්ෂා කිරීම

118. අධ්‍යක්ෂවරයන් විසින් වාර්තා පරීක්ෂා කිරීම 98
119. කොටස් හිමියන් විසින් සමාගමේ ලේඛන පරීක්ෂා කිරීම 99
120. සමාගමේ වාර්තා මහජනයා විසින් පරීක්ෂා කරනු ලැබීම 99
121. පරීක්ෂා කිරීමේ ආකාරය 100
122. ලේඛනවල පිටපත් 101

## කොටස් ලේඛනය

123. සමාගම විසින් කොටස් ලේඛනය පවත්වා ගෙන යා යුතු බව 101
124. කොටස් ලේඛනයේ ස්ථානය 102
125. ශ්‍රී ලංකාවෙන් පිටත ලේඛනයක ලියාපදිංචි කරනු ලබන කොටස් සම්බන්ධයෙන් මුද්දර ගාස්තු 103
126. කොටස් හිමියන්ගේ සුචිය 104
127. ලේඛනය වසා තැබීමේ බලය 104
128. ලේඛනය නිවැරදි කිරීමට අධිකරණය සතු බලය 104
129. භාර කොටස් ලේඛනයේ ඇතුළත් නොකළ යුතු බව 106
130. කොටස් ලේඛනය සාක්ෂියක් වන බව 106

## වාර්ෂික වාර්තාව

131. වාර්ෂික වාර්තාව 107
132. පෞද්ගලික සමාගමක් විසින් වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශය සහ සහතිකය යැවිය යුතු බව 107

## රැස්වීම් හා රැස්වීම්වල කටයුතු

133. වාර්ෂික මහා සභා රැස්වීම 108
134. අධියාචනයක් මත අති විශේෂ මහා සභා රැස්වීමක් කැඳවීම 110
135. රැස්වීම් කැඳවීම සඳහා දැන්වීම් කළ යුතු කාලසීමා 111
136. රැස්වීම් හා ඡන්ද පිළිබඳ විධිවිධාන 112
137. රැස්වීමක් පවත්වන ලෙස ආඥා කිරීමට අධිකරණයට බලය ඇති බව 113
138. වෙනත් සමාගම්වල හා ණය හිමියන්ගේ රැස්වීම්වල දී සමාගම නියෝජනය කිරීම 114
139. ප්‍රතියුක්තයෝ 114
140. ඡන්ද විමසීමක් ඉල්ලා සිටීමට අයිතිය ඇති බව 116

| වගන්තිය | | පිටුව |
|---|---|---|
| 141. | ඡන්ද විමසීමක දී ඡන්දය දීම | 117 |
| 142. | කොටස් හිමියන්ගේ අධියාචන මත වූ යෝජනා සම්මත සංසරණය කිරීම | 117 |
| 143. | විශේෂ යෝජනා සම්මත | 120 |
| 144. | රැස්වීමක් වෙනුවට යෝජනා සම්මතය | 121 |
| 145. | විශේෂ දැන්වීමක් අවශ්‍ය යෝජනා සම්මත | 122 |
| 146. | අඩාලව කල් තබනු ලැබූ රැස්වීම්වල දී සම්මත කරන ලද යෝජනා සම්මත | 123 |
| 147. | කොටස් හිමියන්ගේ සහ අධ්‍යක්ෂවරයන්ගේ රැස්වීම්වල කටයුතු පිළිබඳ වාර්තා | 123 |


## ගිණුම් වාර්තා


| | | |
|---|---|---|
| 148. | ගිණුම් වාර්තා තබා ගැනීමට ඇති යුතුකම | 124 |
| 149. | ගිණුම් වාර්තා තබාගත යුතු ස්ථානය | 125 |


## මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට ඇති යුතුකම


| | | |
|---|---|---|
| 150. | මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට ඇති බැඳීම | 126 |
| 151. | මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් විය යුතු කරුණු සහ ආකෘතිය | 126 |
| 152. | සමූහ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට ඇති බැඳීම | 127 |
| 153. | සමූහ මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් විය යුතු කරුණු සහ ඒ ප්‍රකාශවල ආකෘතිය | 128 |


## විගණකවරයන්


| | | |
|---|---|---|
| 154. | විගණකවරයා පත් කිරීම | 130 |
| 155. | විගණකවරයාගේ ගාස්තු හා වියදම් | 131 |
| 156. | හවුල් ව්‍යාපාරයක් විගණකවරයා ලෙස පත් කිරීම | 131 |
| 157. | විගණකවරයන්ගේ සුදුසුකම් | 132 |
| 158. | ස්වයංක්‍රීය නැවත පත්වීම | 133 |
| 159. | ප්‍රථම විගණකවරයා පත් කිරීම | 134 |
| 160. | විගණකවරයා ප්‍රතියෝජනය කිරීම | 134 |
| 161. | විගණකවරයකු වශයෙන් ධුර දැරීම නතර වන තැනැත්තා විසින් කරනු ලබන ප්‍රකාශය | 134 |
| 162. | විගණකවරයා බැඳීම් ගැටලුවලින් වැළකී සිටිය යුතු බව | 136 |
| 163. | විගණකවරයාගේ වාර්තාව | 136 |

වගන්තිය පිටුව

164. තොරතුරුවලට විගණකවරයාගේ ප්‍රවේශය 137
165. කොටස් හිමියන්ගේ රැස්වීමට විගණකවරයා පැමිණ සිටීම 138

කොටස් හිමියන්ගේ වාර්ෂික වාර්තාව

166. වාර්ෂික වාර්තාව පිළියෙල කිරීමට ඇති බැඳීම 139
167. වාර්ෂික වාර්තාව කොටස් හිමියන්ට යැවීම 139
168. වාර්ෂික වාර්තාවෙහි ඇතුළත් විය යුතු දේ 139
169. වාර්තාව යැවීම පැහැර හැරීම ආදිය 141

මූල්‍ය ප්‍රකාශ ලියාපදිංචි කිරීම

170. මූල්‍ය ප්‍රකාශ ලියාපදිංචි කිරීම 142

අර්ථකතනය

171. ශේෂ පත්‍රයේ දිනය 142

සමාගමක කටයුතු විමර්ශනය

172. සමාගමේ කටයුතු, කොටස් හිමියන් විසින් කරනු ලබන ඉල්ලීමක් මත, විමර්ශනය කිරීම 143
173. වෙනත් අවස්ථාවල දී සමාගමේ කටයුතු විමර්ශනය කිරීම 144
174. සම්බන්ධිත සමාගම්වල කටයුතු පිළිබඳව විමර්ශන පැවැත්වීමට පරීක්ෂකවරුන්ට ඇති බලය 145
175. විමර්ශනයේ දී ලේඛන සහ සාක්ෂි ඉදිරිපත් කිරීම 146
176. පරීක්ෂකවරයාගේ වාර්තාව 148
177. පරීක්ෂකවරයාගේ වාර්තාව මත නඩු කටයුතු 149
178. සමාගමේ කටයුතු විමර්ශනය කිරීම හා සම්බන්ධ වියදම් 150
179. පරීක්ෂකවරයාගේ වාර්තාව සාක්ෂි විය යුතු බව 152
180. සමාගමේ අයිතිය විමර්ශනය කිරීම සඳහා පරීක්ෂකවරයන් පත් කිරීම සහ ඔවුන්ගේ බලතල 152
181. කොටස් හෝ සෑණ පත්‍ර සම්බන්ධයෙන් සම්බන්ධතාවක් දක්වන තැනැත්තන් පිළිබඳව තොරතුරු ඉල්ලා සිටීමට ඇති බලය 154
182. කොටස් හෝ සෑණ පත්‍ර මත පරිසීමා නියම කිරීමට ඇති බලය 155
183. වත්කම් හා බැරකම් සත්‍යායනය කිරීමට රෙජිස්ට්‍රාර්වරයාට ඇති බලය 157

කළමනාකරණය පිළිබඳ බලතල

184. සමාගම කළමනාකරණය කිරීම 158

| වගන්තිය | | පිටුව |
|---|---|---|
| 185. | ප්‍රධාන ගණුදෙනු | 158 |
| 186. | බලතල පවරා දීම | 160 |


අධ්‍යක්ෂවරයන්ගේ කාර්යය


| | | |
|---|---|---|
| 187. | සද්භාවයෙන් සහ සමාගමේ සම්බන්ධතා උදෙසා ක්‍රියා කිරීම අධ්‍යක්ෂවරයන්ගේ යුතුකම් බව | 160 |
| 188. | අධ්‍යක්ෂවරයන් විසින් පනත සහ සමාගමේ ව්‍යවස්ථාවලිය අනුව ක්‍රියා කළ යුතු බව | 161 |
| 189. | අධ්‍යක්ෂවරයකුගේ සැලකිලිමත් වීමේ ප්‍රමිතිය | 161 |
| 190. | තොරතුරු හා උපදෙස් ප්‍රයෝජනයට ගැනීම | 161 |


අධ්‍යක්ෂවරයකුට සම්බන්ධතාවක් ඇති ගණුදෙනු


| | | |
|---|---|---|
| 191. | "සම්බන්ධතාවක් " යන්නෙහි අර්ථය | 162 |
| 192. | සම්බන්ධතා අනාවරණය කිරීම | 163 |
| 193. | ගණුදෙනු වැළැක්වීම | 164 |
| 194. | පාර්ශ්වකරුවන් කෙරෙහි බලපෑම | 165 |
| 195. | ඇතැම් අවස්ථාවල දී 192 සහ 193 වන වගන්ති අදාළ නොවන බව | 165 |
| 196. | සම්බන්ධතාවක් ඇති අධ්‍යක්ෂවරයකු විසින් ඡන්දය පාවිච්චි කරනු ලැබිය හැකි බව | 165 |
| 197. | සමාගම සතු තොරතුරු ප්‍රයෝජනයට ගැනීම | 166 |


කොටස් විෂයයෙහි අධ්‍යක්ෂවරයන්ගේ සම්බන්ධතා අනාවරණය කිරීම


| | | |
|---|---|---|
| 198. | "අදාළ සම්බන්ධතාව" යන්නෙහි අර්ථය | 167 |
| 199. | ඇතැම් අවස්ථාවල දී අදාළ සම්බන්ධතා නොසලකා හැරිය යුතු බව | 170 |
| 200. | අධ්‍යක්ෂවරයන් විසින් කොටස් ගණුදෙනු අනාවරණය කළ යුතු බව | 171 |


අධ්‍යක්ෂවරයන් පත් කිරීම සහ ඉවත් කිරීම


| | | |
|---|---|---|
| 201. | අධ්‍යක්ෂවරයන් සංඛ්‍යාව | 172 |
| 202. | අධ්‍යක්ෂවරයන්ගේ සුදුසුකම් | 172 |
| 203. | අධ්‍යක්ෂවරයාගේ කැමැත්ත අවශ්‍ය බව | 173 |
| 204. | පළමුවන අධ්‍යක්ෂවරයා සහ තදනන්තර අධ්‍යක්ෂවරයන් පත් කිරීම | 173 |
| 205. | අධ්‍යක්ෂවරයන් පත් කිරීම සඳහා වෙන වෙනම ඡන්දය දිය යුතු බව | 174 |
| 206. | අධ්‍යක්ෂවරයන් ඉවත් කිරීම | 174 |
| 207. | අධ්‍යක්ෂවරයා ධුරය දැරීම නතර වීම | 175 |
| 208. | අන්තිමට ඉතිරිව සිටින අධ්‍යක්ෂවරයා ඉල්ලා අස්වීම | 176 |
| 209 | අධ්‍යක්ෂවරයාගේ ක්‍රියාවල වලංගුභාවය | 176 |

වගන්තිය පිටුව

අධ්‍යක්ෂවරයන්ගේ විශ්‍රාම ගැනීමේ වයස

210. අධ්‍යක්ෂවරයන් සඳහා වයස් සීමාව 176
211. වයස් සීමාව අදාළ නොවිය යුතු ලෙස සමාගම සම්මත කර ගතහොත් වයස් සීමාව අදාළ නොවිය යුතු බව 177
212. වයස හෙළිදරව් කිරීම අධ්‍යක්ෂවරුන්ගේ යුතුකම බව 177

අධ්‍යක්ෂවරයන්ගේ නුසුදුසුකම්

213. සමාගම් කළමනාකරණය කිරීම තහනම් කර ඇති තැනැත්තන් 178
214. අධිකරණය විසින් අධ්‍යක්ෂවරයන් නුසුදුස්සන් කරනු ලැබිය හැකි බව 179

අධ්‍යක්ෂවරයන්ට අදාළ විවිධ විධිවිධාන

215. අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්ය පටිපාටිය 181
216. පාරිශ්‍රමික සහ වෙනත් ප්‍රතිලාභ 181
217. අධ්‍යක්ෂවරයන්ට දෙනු ලබන ණය සීමා කිරීම 183
218. හානිපූරණය හා රක්ෂණය 185
219. වස්තු භංගත්වය පිළිබඳව අධ්‍යක්ෂවරයන් සතු යුතුකම 187
220. තදබල ප්‍රාග්ධන පාඩුවක දී අධ්‍යක්ෂවරයන්ගේ යුතුකම් 188

ලේකම්වරයන්

221. ලේකම්වරයා 189
222. ලේකම්වරයාගේ සුදුසුකම් නියම කළ යුතු බව 190

අධ්‍යක්ෂවරයන් සහ ලේකම්වරයන් පිළිබඳ ලේඛනය

223. අධ්‍යක්ෂවරයන් සහ ලේකම්වරයන් පිළිබඳ ලේඛනය. 190

පීඩාකාරීත්වය සහ අයථා කළමනාකරණය වැළැක්වීම

224. පීඩාකාරීත්වය. 192
225. අයථා කළමනාකරණය. 192
226. අධිකරණය වෙත ඉල්ලීමක් කළ හැක්කේ කවරකු විසින් ද යන වග. 193
227. ගණන් බේරා වසා දැමීමේ නඩු කටයුතු පවතින විට 224 වන වගන්තිය හෝ 225 වන වගන්තිය හෝ යටතේ ක්‍රියා කිරීමට අධිකරණයට ඇති බලය. 194
228. 224 වන වගන්තිය හෝ 225 වන වගන්තිය හෝ යටතේ වූ ඉල්ලීමක දී අධිකරණයට ඇති බලය. 195

වගන්තිය පිටුව

229. 224 වන වගන්තිය හෝ 225 වන වගන්තිය හෝ යටතේ වූ ආඥාවකින් සමාගමේ ව්‍යවස්ථාවලිය වෙනස් කිරීමේ බලපෑම. 196
230. 224 වන වගන්තිය හෝ 225 වන වගන්තිය හෝ යටතේ වූ ඉල්ලීමකට වගඋත්තරකරුවන් එකතු කිරීම. 197
231. ඇතැම් ගිවිසුම් අවසන් කිරීම හෝ සුළු වශයෙන් වෙනස් කිරීමේ ප්‍රතිඵල. 197
232. කොටස් හිමියා යන්නෙහි ව්‍යාප්ත අර්ථය. 198

## වැළැක්වීමේ ආඥා

233. වැළැක්වීමේ ආඥා. 199

## ව්‍යුත්පන්න නඩු

234. ව්‍යුත්පන්න නඩු. 200
235. ව්‍යුත්පන්න නඩුවකට අදාළ නඩු ගාස්තු සමාගම විසින් දැරිය යුතු බව. 201
236. අවසර දී ඇති අවස්ථාවක අධිකරණය සතු බලය. 202
237. ව්‍යුත්පන්න නඩුවක් සමථයකට පත් කර ගැනීම, බේරුම් කර ගැනීම හෝ නතර කිරීම. 202

## ස්ථිර කිරීම

238. අධ්‍යක්ෂවරයන්ගේ ඇතැම් ක්‍රියා ස්ථිර කිරීම්. 202

## VIII වන කොටස - ඒකාබද්ධ කිරීම්

239. ඒකාබද්ධ කිරීම්. 203
240. ඒකාබද්ධ කිරීමේ යෝජනාව. 203
241. ඒකාබද්ධ කිරීමේ යෝජනාව අනුමත කිරීම. 205
242. කෙටි ක්‍රමයට ඒකාබද්ධ කිරීම. 208
243. ඒකාබද්ධ කිරීමේ යෝජනාව ලියාපදිංචි කිරීම. 210
244. ඒකාබද්ධ කිරීමේ සහතිකය. 211
245. ඒකාබද්ධ කිරීමේ සහතිකයේ බලපෑම. 212
246. වැඩිදෙනකු විසින් අනුමත කරන ලද යෝජනා ක්‍රමයකට හෝ ගිවිසුමකට අකමැති කොටස් හිමියන්ගේ කොටස් මිලදී ගැනීමේ බලය. 213

## IX වන කොටස - ණය හිමියන් සමග සමථයකට එළඹීම

247. අර්ථ නිරූපණය. 214
248. සමථයට එළඹීමේ යෝජනාව. 215

වගන්තිය පිටුව

249. යෝජනා සමථයට එළඹීම පිළිබඳ දැන්වීම. 216
250. සමථයකට එළඹීමේ බලපෑම. 217
251. සමථයට එළඹීම සුළු වශයෙන් වෙනස් කිරීම. 218
252. අධිකරණය සතු බලතල. 219
253. සමාගමක් ඈවර කරනු ලැබීමේ දී සමථයකට එළඹීමේ බලපෑම. 220
254. සමථයට එළඹීමෙහි ලා වියදම. 221


X වන කොටස - වැඩ පිළිවෙලවල්, ඒකාබද්ධ කිරීම් සහ සමථයට එළඹීම් අධිකරණය විසින් අනුමත කිරීම

255. අර්ථ නිරූපණය. 222
256. වැඩපිළිවෙලවල්, ඒකාබද්ධ කිරීම් සහ සමථයට එළඹීම් අධිකරණය විසින් අනුමත කිරීම. 222
257. අධිකරණය විසින් අතිරේක ආඥා කරනු ලැබිය හැකි බව. 224
258. VIII වන කොටස අදාළ කිරීම. 226
259. මේ කොටස යටතේ අනුමත කරන ලද සමථයට එළඹීමට 256 වන වගන්තිය අදාළ කිරීම. 226


XI වන කොටස - අක් වෙරළ සමාගම්වලට අදාළ විධිවිධාන

260. මේ කොටසේ අර්ථ නිරූපණය. 226
261. ශ්‍රී ලංකාවෙන් පිටත ව්‍යාපාර කටයුතු සඳහා සංස්ථාගත කරන ලද සමාගම්. 226
262. අක් වෙරළ සමාගමකට ලියාපදිංචි කිරීමේ සහතිකය ප්‍රදානය කිරීම. 227
263. අක් වෙරළ සමාගමක ව්‍යාපාර කටයුතු දිගටම පවත්වාගෙන යාම. 229
264. ශ්‍රී ලංකාවේ ව්‍යාපාර කටයුතු කර ගෙන යාම තහනම් කිරීම. 229
265. අක් වෙරළ සමාගමක් වශයෙන් ව්‍යාපාර කටයුතු කර ගෙන යාම නතර කිරීම. 229


XII වන කොටස - ගණන් බේරා වසා දැමීම

(I) මූලික

ගණන් බේරා වසා දැමීමේ ක්‍රම

266. "සහදායක" යන්නෙහි අර්ථ කථනය. 230
267. ගණන් බේරා වසා දැමීමේ ක්‍රම. 230

## සහදායකයෝ


268. වර්තමාන සහ ආදි කොටස් හිමියන්ගේ වගකීම බලාත්මක කිරීමට ඇවරකරු සතු බලය. 230
269. ගෙවා නොමැති ඇරැයුම් සම්බන්ධයෙන් ආදි කොටස් හිමියන්ගේ වගකීම. 231


## (II) අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම


270. අධිකරණය විසින් සමාගමක් ගණන් බේරා වසා දැමිය හැකි අවස්ථා. 231
271. ණය ගෙවීමට නොහැකි වීම යන්නෙහි අර්ථ කථනය. 232


## ගණන් බේරා වසාදැමීම සඳහා වූ පෙත්සම සහ එහි ප්‍රතිඵල


272. ගණන් බේරා වසාදැමීම සඳහා වූ ඉල්ලීම. 233
273. පෙත්සම් විභාග කිරීමේ දී අධිකරණය සතු බලතල. 234
274. සමාගමට විරුද්ධව පවත්නා නඩු කටයුතු නතර කිරීමේ හෝ තහනම් කිරීමේ බලය. 235
275. ගණන් බේරා වසා දැමීම ආරම්භ කිරීමෙන් පසු දේපළ ආදිය නීයාදනය කිරීම වැළැක්වීම. 236
276. තහනම් කිරීම ආදිය ශූන්‍ය කිරීම. 236


## ගණන් බේරා වසාදැමීම ආරම්භ කිරීම


277. අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම ආරම්භ කිරීම. 236


## ගණන් බේරා වසාදැමීම පිළිබඳ ආඥාවක ප්‍රතිඵල


278. ආඥාවේ පිටපතක් රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතු බව. 237
279. ගණන් බේරා වසා දැමීමේ දී නඩු නතර කළ යුතු බව. 237
280. ගණන් බේරා වසා දැමීමේ ආඥාවක බලපෑම. 237


## ගණන් බේරා වසාදැමීමේ දී නිල භාර ගැනුම්කරු


281. නිල භාර ගැනුම්කරු. 237
282. ඇතැම් අවස්ථාවල දී නිල භාර ගැනුම්කරුවකු අධිකරණය විසින් පත් කරනු ලැබීම. 237
283. සමාගමේ කටයුතු පිළිබඳ ප්‍රකාශය නිල භාර ගැනුම්කරු වෙත ඉදිරිපත් කළ යුතු බව. 238
284. නිල භාර ගැනුම්කරුගේ වාර්තාව. 240

වගන්තිය පිටුව

## ඇවරකරුවෝ


| | | |
|---|---|---|
| 285. | ඇවරකරුවන් පත් කිරීමට අධිකරණයට ඇති බලය. | 240 |
| 286. | තාවකාලික ඇවරකරුවකු පත් කිරීම හා ඔහු සතු බලතල. | 241 |
| 287. | ඇවරකරුවන් පත් කිරීම හා ඔවුන්ගේ අභිධාන ආදිය. | 241 |
| 288. | නිල භාර ගැනුම්කරු නොවන තැනැත්තකු ඇවරකරු වශයෙන් පත් කරනු ලැබූ අවස්ථාවක අදාළ වන විධිවිධාන. | 242 |
| 289. | ඇවරකරුවන් පිලිබඳ සාමාන්‍ය විධිවිධාන. | 242 |
| 290. | සමාගම් දේපළ පිලිබඳ භාරකාරත්වය. | 243 |
| 291. | සමාගමේ දේපළ ඇවරකරු සතු කිරීම. | 243 |
| 292. | ඇවරකරුගේ බලතල. | 243 |
| 293. | ඇවරකරුගේ බලතල ක්‍රියාත්මක කිරීම හා පාලනය කිරීම. | 246 |
| 294. | ඇවරකරු විසින් තබාගත යුතු පොත්. | 247 |
| 295. | ඇවරකරු විසින් බැංකුවට කරනු ලබන ගෙවීම්. | 247 |
| 296. | ඇවරකරුගේ ගිණුම් විගණනය කිරීම. | 247 |
| 297. | රෙජිස්ට්‍රාර්වරයා විසින් ඇවරකරු පාලනය කිරීම. | 248 |
| 298. | ඇවරකරුවන් මුදා හැරීම. | 248 |


## පරීක්ෂණ කමිටුව


| | | |
|---|---|---|
| 299. | පරීක්ෂණ කමිටුවක් පත්කළ යුතු ද නැද්ද යන්න නිශ්චය කිරීම සඳහා වූ ණය හිමියන්ගේ හා සහදායකයින් ගේ රැස්වීම්. | 249 |
| 300. | පරීක්ෂණ කමිටුවේ සංයුතිය හා කාර්ය පටිපාටිය. | 250 |
| 301. | පරීක්ෂණ කමිටුවක් නොමැති අවස්ථාවක අධිකරණය සතු බලතල. | 251 |


## අධිකරණය විසින් ගණන් බේරා වසා දමනු ලබන අවස්ථාවක දී අධිකරණයේ සාමාන්‍ය බලතල


| | | |
|---|---|---|
| 302. | ගණන් බේරා වසා දැමීම නතර කිරීමට ඇති බලය. | 251 |
| 303. | සහදායකයන් පිලිබඳ ලැයිස්තු බේරුම් කිරීම හා වත්කම් යෙදීම. | 252 |
| 304. | ඇවරකරු වෙත දේපළ භාරදීම. | 252 |
| 305. | සහදායකයකුගෙන් සමාගමට අයවිය යුතු ණය ගෙවීම හා හිලව් කිරීමට අවසර දෙනු ලබන ප්‍රමාණය. | 253 |
| 306. | සමාගමට ලැබිය යුතු මුදල් බැංකුවට ගෙවීම. | 253 |
| 307. | විශේෂ කළමනාකරු පත් කිරීම. | 254 |
| 308. | ණය හිමියන් හා සහදායකයින් විසින් පොත් පරීක්ෂා කිරීම. | 254 |

309. ගණන් බේරා වසා දැමීමේ වියදම් වත්කම්වලින් ගෙවීමට ආඥා කිරීමේ බලය. 254
310. සමාගමේ දේපළ ඇති බවට සැකකළ තැනැත්තන් කැඳවීමට ඇති බලය. 254
311. ප්‍රවර්ධකයන්, අධ්‍යක්ෂවරුන් ආදීන් ප්‍රසිද්ධියේ විභාග කිරීමට ආඥා කිරීමේ බලය. 255
312. විභාග කරනු ලැබීමට විධාන කරනු ලැබූ තැනැත්තකුට හෝ නිලධරයකුට නීතිඥවරයකු මගින් නියෝජනය කිරීමට හැකිබව යනාදිය. 256
313. පැනගොස් සැඟවී ඇති සහදායකයකු සිරභාරයට ගැනීමේ බලය. 257
314. සමුච්චිත අධිකරණ බලතල. 257
315. අධිකරණයේ ඇතැම් බලතල ඈවරකරුට පවරාදීම. 257
316. සමාගමක් විසුරුවා හැරීම. 258
317. අධිකරණ ආඥා බලාත්මක කරන ආකාරය. 258
318. වෙනත් අධිකරණයක ගණන් බේරා වසා දැමීමේ ආඥාවක් බලාත්මක කිරීම. 258

## (III) ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම

### ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම සඳහා වූ යෝජනා සම්මතය හා ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම ආරම්භ කිරීම

319. සමාගම ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමිය හැකි අවස්ථා. 259
320. ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම සඳහා වූ යෝජනා සම්මතයක් පිළිබඳ දැන්වීම. 259
321. ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම ආරම්භ කිරීම. 260

### ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමේ ප්‍රතිඵල

322. ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමෙන් සමාගමේ ව්‍යාපාරය සහ තත්ත්වය කෙරෙහි ඇතිවන බලපෑම. 260
323. ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම ආරම්භ කිරීමෙන් පසු පැවරීම් ආදිය බලරහිත විය යුතු බව. 260

### වස්තු භංගත්වයට පත් නොවීම පිළිබඳ ප්‍රකාශය

324. ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම සඳහා වූ යෝජනාවක් ඇති අවස්ථාවක, වස්තු භංගත්වයට පත් නොවීම පිළිබඳ ව්‍යවස්ථාපිත ප්‍රකාශය. 261

### කොටස් හිමියන්ගේ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැම්මකට අදාළ විධිවිධාන


| | | |
|---|---|---|
| 325. | කොටස් හිමියන්ගේ ගණන් බේරා වසා දැමීමකට අදාළ විධිවිධාන. | 261 |
| 326. | ඇවරකරුවන් පත්කිරීමට හා ඔවුන්ගේ පාරිශ්‍රමික නියම කිරීමට සමාගම සතු බලය. | 262 |
| 327. | ඇවැකරුගේ ධුරයෙහි පුරප්පාඩු පිරවීමට ඇති බලය. | 262 |
| 328. | සමාගමේ දේපළ විකිණීම සඳහා ප්‍රතිෂ්ඨාව වශයෙන් කොටස් ආදිය පිළිගැනීමට ඇවරකරුවන් සතු බලය. | 262 |
| 329. | වස්තු භංගත්වය සම්බන්ධයෙන් වන විට, ණය හිමියන්ගේ රැස්වීමක් කැඳවීම ඇවරකරුගේ කාර්යය බව. | 264 |
| 330. | එක් එක් වර්ෂය අවසානයේ දී මහා සභා රැස්වීමක් කැඳවීම ඇවරකරුගේ කාර්යය බව. | 264 |
| 331. | අවසාන රැස්වීම හා විසුරුවා හැරීම. | 265 |
| 332. | වස්තු භංගත්වය සම්බන්ධයෙන් වන විට වාර්ෂික සහ අවසාන රැස්වීම් පිළිබඳ විකල්ප විධිවිධාන. | 266 |


### ණය හිමියන්ගේ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැම්මකට අදාළ විය යුතු විධිවිධාන


| | | |
|---|---|---|
| 333. | ණය හිමියකුගේ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමකට අදාළ විය යුතු විධිවිධාන. | 266 |
| 334. | ණය හිමියන්ගේ රැස්වීම. | 267 |
| 335. | ඇවරකරු පත්කිරීම. | 268 |
| 336. | පරීක්ෂණ කමිටුව පත්කිරීම. | 268 |
| 337. | ඇවරකරුවන්ගේ පාරිශ්‍රමික නියමකිරීම සහ අධ්‍යක්ෂවරයන්ගේ බලතල අවසන්වීම. | 269 |
| 338. | ඇවරකරුගේ ධුරයෙහි පුරප්පාඩුව පිරවීමට ඇති බලය. | 270 |
| 339. | ණය හිමියන්ගේ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමක් සම්බන්ධයෙන් 328 වන වගන්තිය අදාළ කිරීම. | 270 |
| 340. | එක් එක් අවුරුද්ද අවසානයේ සමාගම් සහ ණය හිමියන්ගේ රැස්වීම් කැඳවීම ඇවරකරුගේ කාර්යය බව. | 270 |
| 341. | අවසාන රැස්වීම සහ විසුරුවා හැරීම. | 270 |


### ස්වේච්ඡාවෙන් කරනු ලබන සෑම ගණන් බේරා වසා දැම්මකට ම අදාළ විය යුතු විධිවිධාන


| | | |
|---|---|---|
| 342. | ස්වේච්ඡාවෙන් කරනු ලබන සෑම ගණන් බේරා වසා දැම්මකට ම අදාළ විධිවිධාන. | 272 |
| 343. | සමාගමේ දේපළ බෙදා හැරීම. | 272 |

344. ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමක දී ඈවරකරු සතු බලතල හා යුතුකම්. 272
345. ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමේ දී ඈවරකරු පත් කිරීමට හා ඉවත් කිරීමට අධිකරණය සතු බලය. 273
346. ඈවරකරු විසින් තම පත්වීම පිළිබඳව කරනු ලබන දැන්වීම. 273
347. වැඩ පිළිවෙලක් ණය හිමියන් කෙරෙහි අනුගමායවන අවස්ථා. 274
348. ප්‍රශ්න නිශ්චය කරගැනීම හෝ බලතල ක්‍රියාත්මක කරවීම සඳහා අධිකරණය වෙත ඉල්ලුම් කිරීමේ බලය. 274
349. ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමේ පිරිවැය. 274
350. ණය හිමියන්ගේ හා සහදායකයින්ගේ අයිතිවාසිකම්වලට ඉඩ තැබීම. 275

## (IV) අධිකරණයේ අධීක්ෂණයට යටත්ව ගණන් බේරා වසා දැමීම

351. අධීක්ෂණයට යටත්ව ගණන් බේරා වසා දමන ලෙස ආඥා කිරීමේ බලය. 275
352. අධීක්ෂණයට යටත් වූ ගණන් බේරා වසා දැමීම සඳහා වූ පෙත්සමේ ප්‍රතිඵලය. 275
353. අධීක්ෂණයට යටත්ව කරනු ලබන ගණන් බේරා වසා දැමීමකට 275 වන සහ 276 වන වගන්ති අදාළ කිරීම. 275
354. ඈවරකරුවන් පත්කිරීමට හෝ අස්කිරීමට අධිකරණය සතු බලය. 275
355. අධීක්ෂණ ආඥාවේ ප්‍රතිඵලය. 276

## හිමිකම් පෑම ඔප්පු කිරීම හා වර්ග කිරීම

356. පිළිගතයුතු හිමිකම් පෑම්. 277
357. සුරක්ෂිත නොවූ ණය හිමියන් විසින් කරනු ලබන හිමිකම් පෑම්. 277
358. සුරක්ෂිත ණය හිමියන්ගේ අයිතිවාසිකම් හා කාර්යය. 278
359. හිමිකම් පෑමේ මුදල් ප්‍රමාණය නිශ්චය කොට දැනගැනීම. 282
360. නිශ්චය කොට දැනගත් මුදල් ප්‍රමාණයක් නොවන හිමිකම් පෑම. 282
361. දඩ, දණ්ඩන සහ අයවිය යුතු මුදල් 282
362. ගණන් බේරා වසා දැමීම ආරම්භ කිරීමෙන් පසු ගෙවිය යුතු ණය වලට අදාළ හිමිකම් පෑම්. 283
363. අන්‍යොන්‍ය බැරකම් සහ හිලව් කිරීම්. 283
364. හිමිකම් පෑම්වලට පොළිය. 284
365. වරණීක හිමිකම් පෑම්. 284
366. වෙනත් ණය හිමියන්ගේ හිමිකම් පෑම් සහ අතිරික්ත වත්කම් බෙදා හැරීම. 285

## බල රහිත කළ හැකි ගනුදෙනු

367. වරණීය ප්‍රතිඵලය ඇති ගණුදෙනු. 286

| වගන්තිය | | පිටුව |
|---|---|---|


368. බල රහිත කළ හැකි සෘණ භාර. 286
369. වාණිජමය නොවන ගණුදෙනු. 288
370. බල රහිත කළ හැකි ගණුදෙනු හා බැඳීම් ඉවතලීමේ කාර්ය පටිපාටිය. 290
371. වෙනත් ආඥා. 291
372. ගණුදෙනු හා සෘණ භාර ඉවතලීම පිළිබඳ අතිරේක විධිවිධාන. 292
373. වරණ යනාදියට අදාළ අර්ථ නිරූපණය. 293


### ගණන් බේරා වසා දැමීමට ප්‍රථම අයථා ක්‍රියා සහ නිලධරයන්ගේ වගකීම්


374. ගණන් බේරා වසාදැමීම බලාපොරොත්තුවෙන් කරන වංචා යනාදිය. 295
375. වංචනික වෙළෙඳාම. 297
376. මුදල් ආපසු ගෙවන ලෙස හෝ දේපළ ආපසු භාර දෙන ලෙස තැනැත්තන්ට නියම කිරීමට අධිකරණයට බලය ඇති බව. 297
377. භාරදූර දේපළ පිළිබඳ අයිතිය අත්හැරීම. 298
378. සමාගමක ක්‍රියාවෙහි යෙදවීමක් හෝ තහනමක් පිළිබඳව ණය හිමියකු සතු අයිතිවාසිකම් සීමා කිරීම. 301
379. ක්‍රියාවෙහි යෙදවීමෙහි ලා ගත් භාණ්ඩ පිළිබඳව පිස්කල් සතු යුතුකම. 302


### ගණන් බේරා වසා දැමීමට පූර්වකව හෝ ගණන් බේරා වසා දැමීම කරන අතරතුර සිදු කරන වැරදි


380. ඈවර කරනු ලබන සමාගම්වල නිලධරයන් විසින් සිදු කරනු ලබන වැරදි. 304
381. නිසි ගිණුම් තබනු නොලැබූ අවස්ථාවක වගකීම. 306
382. සමාගමේ වරදකාර නිලධරයන්ට සහ සාමාජිකයන්ට නඩු පැවරීම. 307


### ගණන් බේරා වසා දැමීම පිළිබඳ පරිපූරක විධිවිධාන


383. ඈවරකරුවන්ගේ සුදුසුකම් 309
384. ඈවරකරු වශයෙන් පත් කිරීම කෙරෙහි බලපාන දූෂිත පෙළඹවීම. 310
385. වාර්තා ආදිය පිළියෙල කිරීමට ඈවරකරු සතු කාර්යය ක්‍රියාත්මක කිරීම. 310
386. සමාගමක් ඈවර කරනු ලබන බව දැනුම්දීම. 311
387. සමාගම ගණන් බේරා වසා දැමීමේ දී ඇතැම් ලේඛන මුද්දර ගාස්තුවලින් නිදහස් කිරීම. 311
388. සමාගමේ පොත් සාක්ෂි විය යුතු බව. 311
389. සමාගමේ පොත් හා පත් බැහැර කිරීම. 312
390. නොනිමි ඈවර කිරීම් පිළිබඳ තොරතුරු. 313
391. ණය හිමියන්ගේ හා සහදායකයින්ගේ අඩාලව කල් තැබූ සභා රැස්වීම්වල දී සම්මත වූ යෝජනා සම්මතයන්. 313

## අධිකරණය සතු අතිරේක බලතල

392. ණය හිමියන්ගේ හෝ සහදායකයන්ගේ ඇතැම් අභිප්‍රාය නිශ්චය කොට දැනගැනීම පිණිස වූ සභා රැස්වීම්. 313

## විසුරුවා හැරීම පිළිබඳ විධිවිධාන

393. සමාගමක් විසුරුවා හැරීම බලරහිත යයි ප්‍රකාශ කිරීමට අධිකරණය සතු බලය. 314
394. ක්‍රියා විරහිත බවට පත්ව ඇති සමාගමක් රෙජිස්ට්‍රාර්වරයා විසින් ලේඛනයෙන් කපා හැරිය හැකි බව. 314
395. විසුරුවා හරිනු ලැබූ සමාගමක දේපළ රජය සතු විය යුතු බව. 316

## සමාගම් ඈවරකිරීමේ ගිණුම

396. සමාගම් ඈවරකිරීමේ ගිණුම පිහිටුවීම. 316
397. සමාගම් ඈවර කිරීමේ ගිණුමට සහ එම ගිණුමෙන් ගෙවීම්. 317
398. අත්‍යාවශ්‍ය සේවා සැපයීම ප්‍රතික්ෂේප කිරීම තහනම් බව. 318

## රීති සහ ගාස්තු

399. ගණන් බේරා වසාදැමීම සඳහා ගාස්තු. 318

## XIII වන කොටස - අද්මිනිස්ත්‍රාසිකරුවෝ

## අද්මිනිස්ත්‍රාසිකරු පත්කිරීම

400. අර්ථ නිරූපණය. 319
401. අද්මිනිස්ත්‍රාසිකරු පත්කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට ඇති බලය. 319
402. අද්මිනිස්ත්‍රාසිකරු පත්කිරීම පිළිබඳ දැන්වීම සෘණභාරකරුට දිය යුතු බව. 321
403. අද්මිනිස්ත්‍රාසිකරු පත්කිරීමේ බලපෑම. 321

## මුල් රැස්වීම සහ පත්වීම ස්ථිර කිරීම

404. මුල් රැස්වීම කැඳවීම අද්මිනිස්ත්‍රාසිකරුගේ කාර්යය විය යුතු බව. 322
405. අද්මිනිස්ත්‍රාසිකරුගේ පත්වීම ස්ථිර කිරීමේ ප්‍රතිඵලය. 323

වගන්තිය පිටුව

## අද්මිනිස්ත්‍රාසිකරුගේ යෝජනා

406. යෝජනා ප්‍රකාශය. 324
407. ණය හිමියන්ගේ රැස්වීම මගින් යෝජනා සලකා බැලීම. 325
408. අද්මිනිස්ත්‍රාසිකරු ධුරය දැරීම අවසන් කළ අවස්ථාවක ආනුෂංගික ආඥා. 325
409. යෝජනාවලට හරවත් ප්‍රතිශෝධන පිළිබඳ අනුමතය. 325

## අද්මිනිස්ත්‍රාසි කිරීම පිළිබඳ දැන්වීම

410. අද්මිනිස්ත්‍රාසිකරුගේ පත්වීම පිළිබඳ දැන්වීම. 326
411. අද්මිනිස්ත්‍රාසි කිරීම පිළිබඳ දැන්වීම 327

## අද්මිනිස්ත්‍රාසිකරු

412. අද්මිනිස්ත්‍රාසිකරුගේ සුදුසුකම් 327
413. අද්මිනිස්ත්‍රාසිකරුගේ ක්‍රියාවල වලංගුභාවය. 329
414. පත්වීමට එකහගත්වය. 329
415. අද්මිනිස්ත්‍රාසිකරුගේ ධුරයේ පුරප්පාඩුව. 329

## අද්මිනිස්ත්‍රාසිකරුවන්ගේ බලතල

416. අද්මිනිස්ත්‍රාසිකරුවන්ගේ බලතල. 330
417. බැඳීම් ඇති දේපළ ආදිය සමග කටයුතු කිරීමට ඇති බලය. 331
418. අද්මිනිස්ත්‍රාසිකරුගේ සාමාන්‍ය කාර්යය 333
419. අද්මිනිස්ත්‍රාසිකරු නිදහස් කිරීම හෝ අද්මිනිස්ත්‍රාසිකරු පත් කිරීමේ යෝජනා සම්මතය වෙනස් කිරීම. 334
420. අද්මිනිස්ත්‍රාසිකරුගේ පාරිශ්‍රමිකය හා වියදම්. 335
421. අද්මිනිස්ත්‍රාසිකරුගේ වගකීම. 335
422. වගකීමෙන් සහන. 336

## සමාගමේ කටයුතු නිශ්චිතව දැනගැනීම සහ විමර්ශනය

423. තොරතුරු ආදිය සැපයීමට සමාගමේ අධ්‍යක්ෂවරයන්ගේ බැඳීම. 337

## විවිධ කරුණු

424. ණය හිමියන්ගේ කම්ටුව. 338
425. ණය හිමියන්ගේ හා කොටස් හිමියන්ගේ සම්බන්ධතා ආරක්ෂා කිරීම. 338
426. දේපළ භාර ගැණුම්කරුවන්ට අදාළ වූ විධිවිධාන අද්මිනිස්ත්‍රාසිකරුට අදාළ කිරීම. 339

XIV වන කොටස - චල සෘණ භාර

427. සමාගම විසින් චල සෘණ භාර ප්‍රදානය කළ හැකි බව. 340
428. චල සෘණ භාරය ඇති කරන සාධන පත්‍රය. 341
429. චල සෘණ භාරය ඇති කිරීමේ සාධන පත්‍රයේ විධිවිධාන. 341
430. දේපළ තහනම් කිරීමට පෙරාතුව චල සෘණ භාරයට යටත් දේපළ පිළිබඳව කටයුතු කිරීම. 342
431. චල සෘණ භාර වර්ග කිරීම. 343
432. චල සෘණ භාරය වෙනස් කිරීම හා නිදහස් කිරීම. 346
433. චල සෘණ භාරයක් දේපළට බද්ධ වන්නේ කවර අවස්ථාවල දී ද යන වග. 347

XV වන කොටස - දේපළ භාර ගැනුම්කරුවන් සහ කළමනාකරුවන්

434. අර්ථ නිරූපණය. 349

දේපළ භාර ගැනුම්කරුවකු පත් කිරීමේ බලය

435. දේපළ භාර ගැනුම්කරුවකු පත් කිරීමට සාධන පත්‍රය මගින් බලය පැවරිය හැකි බව. 351

දේපළ භාර ගැනුම්කරුවකුගේ සුදුසුකම්

436. දේපළ භාර ගැනුම්කරුවකුගේ සුදුසුකම්. 352

දේපළ භාර ගැනුම්කරුවකු පත් කිරීම

437. සාධන පත්‍රය යටතේ දේපළ භාර ගැනුම්කරුවකු පත් කිරීම. 353
438. දේපළ භාර ගැනුම්කරුවකු පත් කිරීමේ බලයේ ප්‍රමාණය. 354
439. අධිකරණය විසින් දේපළ භාර ගැනුම්කරුවකු පත්කළ හැකි බව. 354
440. දේපළ භාර ගැනුම්කරුවකු පත්කිරීම පිළිබඳ දැන්වීම. 355
441. දේපළ භාර ගැනුම්කාරත්වය පිළිබඳ දැන්වීම. 356
442. දේපළ භාර ගැනුම්කරුගේ ධුරයක පුරප්පාඩුව. 357

දේපළ භාර ගැණුම්කරුවන්ගේ බලතල

443. දේපළ භාර ගැනුම්කරුවන්ගේ බලතල. 358
444. දේපළ භාර ගැනුම්කරුවන් අතර ප්‍රමුඛත්වය. 358
445. කොටස් මත ඇරයුම් කිරීමේ බලය. 359
446. ලේඛන ලියා අත්සන් කිරීම. 360

| වගන්තිය | | පිටුව |
|---|---|---|
| 447. | සමාගමේ සහ අධ්‍යක්ෂවරුන්ගේ බැඳීම්. | 360 |
| 448. | දේපළ භාර ගැනුම්කරුවන්ගේ ක්‍රියාවල වලංගුභාවය. | 361 |
| 449. | දේපළ විකිණීම සඳහා උකස් ලාභියාගේ එකඟත්වය. | 361 |


## දේපළ භාර ගැනුම්කරුවන්ගේ කාර්ය


| | | |
|---|---|---|
| 450. | දේපළ භාර ගැනුම්කරුවන්ගේ පොදු කාර්ය. | 362 |
| 451. | දේපළක් විකුණන දේපළ භාර ගැනුම්කරුවකුගේ කාර්යය. | 363 |
| 452. | විත්තිවාචකයක් හෝ හානිපූරණයක් නොමැති බව. | 363 |
| 453. | මුදල් පිළිබඳ කාර්යය. | 364 |
| 454. | ගිණුම් වාර්තා. | 364 |


## දේපළ භාර ගැනුම්කරුවන්ගේ වාර්තා


| | | |
|---|---|---|
| 455. | දේපළ භාර ගැනුම්කරුවකුගේ පළමු වාර්තාව. | 364 |
| 456. | දේපළ භාර ගැනුම්කරුවකු විසින් සැපයිය යුතු වැඩිදුර වාර්තා. | 365 |
| 457. | වාර්තා පිළියෙල කිරීම සඳහා කාලය දීර්ඝ කිරීම. | 367 |
| 458. | වාර්තා ලැබීමට හිමිකම් ඇති තැනැත්තන්. | 367 |
| 459. | වාර්තා පරීක්ෂා කිරීමට හිමිකම් ඇති තැනැත්තන්. | 368 |
| 460. | මේ පනතේ යම් විධිවිධාන කඩ කිරීමක් දැනුම් දීමේ කාර්යය. | 368 |
| 461. | දේපළ භාර ගැනුම්කාරත්වය අවසානවීම පිළිබඳ වගකීම්. | 368 |


## දේපළ යෙදවීම සහ සමාගමේ බැඳීම් පිළිබඳව වගකීම්.


| | | |
|---|---|---|
| 462. | වරණීය හිමිකම් පෑම්. | 369 |
| 463. | ඇවර කිරීමේදී දේපළ භාර ගැනුම්කරුවකුගේ බලතල. | 370 |
| 464. | දේපළ භාර ගැනුම්කරුවන්ගේ වගකීම. | 370 |
| 465. | වගකීමෙන් නිදහස් කිරීම. | 372 |


## අධිකරණය විසින් දේපළ භාර ගැනුම්කරුවන් අධීක්ෂණය කිරීම


| | | |
|---|---|---|
| 466. | අධිකරණය විසින් දේපළ භාර ගැනුම්කරුවන් අධීක්ෂණය කිරීම. | 373 |
| 467. | අධිකරණය විසින් දේපළ භාර ගැනුම්කාරත්වය අවසන් කිරීම හෝ සීමාකිරීම කළ හැකි බව. | 375 |
| 468. | දේපළ භාර ගැනුම්කරුවකුගේ කාර්යය බලාත්මක කිරීම සඳහා ආඥා. | 376 |
| 469. | දේපළ භාර ගැනුම්කාරත්වයේ ඇති දේපළ ආරක්ෂා කරන ආඥා. | 379 |

වගන්තිය පිටුව

අත්‍යවශ්‍ය සේවා සැපයීම ප්‍රතික්ෂේප කිරීම

470. අත්‍යවශ්‍ය සේවා සැපයීම ප්‍රතික්ෂේප කිරීම තහනම් බව. 379

**XVI** වන කොටස - සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා සහ ලියාපදිංචි කිරීම

නිලධරයන් පත් කිරීම

471. නිලධරයන් පත් කිරීම. 380
472. රෙජිස්ට්‍රාර්වරයාගේ තීරණවලට විරුද්ධව අභියාචනා. 381

රෙජිස්ට්‍රාර් සහ ලේඛන ලියාපදිංචි කිරීම

473. තබාගත යුතු රෙජිස්ටර. 381
474. මුද්‍රාව තැබීමෙන් ලේඛන සත්‍යායනය කිරීම. 383
475. ලේඛන, ලේඛනවල පිටපත්, දැන්වීම් ආදිය ලියාපදිංචි කිරීම. 383
476. ගොනු කරන ලද ලේඛනවල පරිවර්තන. 384
477. ගාස්තු. 384
478. වියදම් සහ ගාස්තු අයකර ගැනීම. 385

අරමුදල

479. අරමුදල. 386

ලේඛන පරීක්ෂා කිරීම සහ ඉදිරිපත් කිරීම, වාර වාර්තා ඉදිරිපත් කිරීමට සමාගම්වලට ඇති කාර්යය බලාත්මක කිරීම සහ පොත් ඉදිරිපත් කිරීම සහ පරීක්ෂා කිරීම

480. රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් පවත්වාගෙන යනු ලබන ලේඛන පරීක්ෂා කිරීම, ඉදිරිපත් කිරීම හා ඒ පිළිබඳ සාක්ෂි. 387
481. රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත වාර වාර්තා ඉදිරිපත් කිරීමෙහිලා සමාගමේ කාර්යය කරන ලෙස බල කිරීම. 388
482. සමාගම සම්බන්ධ තොරතුරු නීති විරෝධී ලෙස අනාවරණය කිරීම. 389
483. වරදක් කරනු ලැබ ඇති බවට සැක කරනු ලබන අවස්ථාවන්හි දී පොත් ඉදිරිපත් කිරීම හා පරීක්ෂා කිරීම. 389
484. තොරතුරු ඉල්ලා සිටීමට සහ පොත්, රෙජිස්ටර සහ ලේඛන පරීක්ෂා කිරීමට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා සතු බලතල. 390

### XVII වන කොටස - පවතින සමාගම්වලට පනත අදාළ වීම


485. පවතින සමාගම්වලට පනත අදාළ වීම. 391
486. දැනට පවත්නා සමාගම්වල ව්‍යවස්ථාවලියට අදාළ විධිවිධාන. 393
487. දැනට පවත්නා සමාගම්වල සමාගම් අංකවලට අදාළ වූ විධිවිධාන. 393


### XVIII වන කොටස - විදේශ සමාගම්


488. අර්ථ නිරූපණය. 394
489. විදේශ සමාගම් විසින් රෙජිස්ට්‍රාර්වරයා වෙත භාරදිය යුතු ලේඛන සහ විස්තර. 395
490. විදේශ සමාගම්වලට ඉඩම් දැරීමට ඇති බලය. 397
491. ලේඛන ආදිය වෙනස් කරනු ලැබූ අවස්ථාවක වාර වාර්තාවක් රෙජිස්ට්‍රාර්වරයා වෙත භාරදිය යුතු බව. 397
492. විදේශීය සමාගම්වල මූල්‍ය ප්‍රකාශ. 397
493. විදේශ සමාගමේ නම. 398
494. සමාගමේ නම සහ විස්තර සඳහන් කිරීමට බැඳී සිටින බව. 400
495. විදේශ සමාගමක් වෙත භාරදීම. 400
496. සමාගමක්, ශ්‍රී ලංකාව තුළ තිබූ ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යාම නතර කළ විට, ඒ බව රෙජිස්ට්‍රාර්වරයා වෙත දැන්විය යුතු බව. 401
497. විදේශ සමාගමක් ශ්‍රී ලංකාවේ ඇති වත්කම් ඈවර කිරීම. 401
498. අනුකූලව ක්‍රියා නොකිරීම සඳහා දණ්ඩන. 402
499. මේ කොටසේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීමට ඇති යුතුකම ඉටුකිරීම බලාත්මක කිරීම. 402


### කොටස් විකිණීම හා විකිණීම සඳහා කොටස් අර්පණය කිරීම පිළිබඳ පරිසීමා


500. සංස්ථා ප්‍රකාශයට දින යෙදීම සහ එහි ඇතුළත් විය යුතු විස්තර. 403
501. විශේෂඥයන්ගේ කැමැත්ත සහ විභජනය පිළිබඳ වූ විධිවිධාන. 406
502. සංස්ථා ප්‍රකාශය ලියාපදිංචි කිරීම. 407
503. 500 වන වගන්තිය, 501 වන වගන්තිය හෝ 502 වන වගන්තිය කඩ කිරීම වෙනුවෙන් දණ්ඩන. 407
504. සංස්ථා ප්‍රකාශයක වැරදි ප්‍රකාශ කිරීම ගැන සිවිල් වගකීම. 408
505. සංස්ථා ප්‍රකාශ සම්බන්ධ විධිවිධාන අර්ථ නිරූපනය කිරීම. 408


### XIX වන කොටස - උපදේශක කොමිෂන් සභාව


506. උපදේශක කොමිෂන් සභාව පත්කිරීම ආදිය. 408

වගන්තිය පිටුව

## XX වන කොටස - සමාගම් ආරාවුල් මණ්ඩලය

507. සමාගම් ආරාවුල් මණ්ඩලය. 410
508. මණ්ඩලයේ සාමාජිකයන් විසින් ආරාවුල් සමථයකට පත්කළ හැකි බව. 412
509. සමථයට පත් කිරීමේ කටයුතු සම්බන්ධයෙන් වරප්‍රසාද. 413
510. සමථය සම්බන්ධයෙන් ගෙවිය යුතු ගාස්තු. 413

## XXI වන කොටස - වැරදි

### විවිධ වැරදි

511. අසත්‍ය ප්‍රකාශ සඳහා දණ්ඩනය. 414
512. වාර්තා කූට ලෙස වෙනස් කිරීම සඳහා දණ්ඩනය. 414
513. "සීමාසහිත" යන වචන අනිසි ලෙස භාවිත කිරීමට දණ්ඩනය. 415

### වරදවල් පිළිබඳ සාමාන්‍ය විධිවිධාන

514. ඇතැම් වරදවල් සමථයට පත් කිරීම. 415
515. ලඝු වශයෙන් විභාග කළ හැකි වරදවල්. 416
516. දඩමුදල් පැනවීම හා යෙදවීම. 416
517. පෞද්ගලික චෝදකයන්ට ඉඩ හැරීම. 416
518. වරප්‍රසාද ලත් විනැවුම්වලට ඉඩ හැරීම. 416

## XXII වන කොටස - විවිධ කරුණු

### සාමාජිකයන් විසි දෙනකුට වැඩි ගණනක හවුල් ව්‍යාපාර තහනම් කිරීම

519. සාමාජිකයන් විසි දෙනකුට වැඩි ගණනක හවුල් ව්‍යාපාර තහනම් කිරීම. 417

### අධිකරණය වෙත කරනු ලබන ඉල්ලීම් සහ යොමු කිරීම්

520. කාර්ය පටිපාටිය. 418
521. අතුරු සහන ප්‍රදානය කිරීම. 419
522. නීතිඥයන් හා බැංකුකරුවන් සඳහා ශේෂ කිරීම්. 420
523. සමාගමකට ලේඛන භාරදීම. 421
524. සාක්ෂි වශයෙන් ගනු ලැබිය යුතු ලේඛන. 421

වගන්තිය | පිටුව

525. ඇතැම් සීමාසහිත සමාගම් විසින් පවරනු ලබන නඩුවල ගාස්තු. 421
526. ඇතැම් නඩුවල දී සහනය දීමට අධිකරණයට ඇති බලය. 422
527. නියෝග. 422
528. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව. 423

## අර්ථ නිරූපණය.

529. අර්ථ නිරූපණය. 423

## අන්තර්කාලීන විධිවිධාන හා ශේෂ කිරීම්

530. අන්තර්කාලීන විධිවිධාන. 435
531. ශේෂ කිරීම්. 437
532. ගණන් බේරා වසා දැමීම සඳහා පවත්නා නඩු කටයුතු සඳහා ශේෂ කිරීම්. 437

## XXIII වන කොටස - ඉවත් කිරීම් සහ සංශෝධන

533. ඉවත් කිරීම්. 438
534. 1996 අංක 10 දරන පනතේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම. 338

පළමුවන උපලේඛනය 439
දෙවන උපලේඛනය 458
තුන්වන උපලේඛනය 459
හතරවන උපලේඛනය 459
පස්වන උපලේඛනය 467
හයවන උපලේඛනය 468
හත්වන උපලේඛනය 468
අටවන උපලේඛනය 474
නමවන උපලේඛනය 475
දහවන උපලේඛනය 478
එකොළස්වෙනි උපලේඛනය 480
දොලොස්වෙනි උපලේඛනය 482
දහතුන්වෙනි උපලේඛනය 484

# 2007 අංක 07 දරන සමාගම් පනත

[සහතිකය සටහන් කළේ 2007 මාර්තු මස 20 වන දින]

එල්.ඩී.—ඕ. 44/2005.

## සමාගම්වලට අදාළ නීතිය සංශෝධනය කිරීම සහ ඒකාබද්ධ කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1**. (1) මේ පනත 2007 අංක 07 දරන සමාගම් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මකවීමේ දිනය.

(2) මේ පනතේ විධිවිධාන, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයක ක්‍රියාත්මක විය යුතු ය.

### I වන කොටස

### සමාගම් සංස්ථාගත කිරීම සහ අදාළ කාරණා

සමාගම්වල පැවතිය යුතු ආවශ්‍යක ලක්ෂණ

**2**. (1) මේ පනත යටතේ සංස්ථාගත කරන ලද සමාගමක්, ඒ සමාගම කලින් කල ලියාපදිංචි කරනු ලබන්නේ යම් නමකින් ද, ඒ නමින් සංස්ථාවක් විය යුතු ය. සමාගමක නෛතික තත්වය සහ ශක්‍යතාව.

(2) සමාගමකට, ශ්‍රී ලංකාව ඇතුළත හා ඉන් පිටත යන දෙකෙහි දී ම—

(අ) පනතේ 13 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව යම් ව්‍යාපාරයක් හෝ කටයුත්තක් කරගෙන යාමට හෝ භාරගැනීමට, යම් ක්‍රියාවක් කිරීමට හෝ යම් ගනුදෙනුවකට ඇතුළත්වීමට, ශක්‍යතාව තිබිය යුතු ය ; තව ද

(ආ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, (අ) ඡේදයේ කාර්යය සඳහා අවශ්‍ය සියලු අයිතිවාසිකම්, බලතල හා වරප්‍රසාද තිබිය යුතු ය.

2-PL 001387- 425 (2006/08)

විවිධ වර්ගයේ සමාගම්.

**3**. (1) මේ පනත යටතේ සංස්ථාගත කරන ලද සමාගමක්—

(අ) සමාගමේ කොටස්වලට ඇඳනු ලැබ ඇති ලෙස සමාගමේ සංස්ථාවලියේ නිශ්චිතව සඳහන් කර ඇති සමාගමේ වත්කම් කිසිවක් වේ ද, ඒ වත්කම්වලට දායකවීමට කොටස් හිමියන්ට වගකීමක් ඇති (මේ පනතේ "සීමාසහිත සමාගමක්" යනුවෙන් සඳහන් කරනු ලබන) කොටස් නිකුත් කරන සමාගමක් ; හෝ

(ආ) සමාගමේ ව්‍යවස්ථාවලිය යටතේ සමාගමේ වත්කම්වලට දායකවීමට කොටස් හිමියන්ට සීමා රහිත වගකීමක් ඇති (මේ පනතේ "සීමාරහිත සමාගමක්" යනුවෙන් සඳහන් කරනු ලබන) කොටස් නිකුත් කරන සමාගමක් ; හෝ

(ඇ) සමාගම ඈවර කිරීමට සිදු වූ අවස්ථාවක, සමාගමේ ව්‍යවස්ථාවලියෙහි නිශ්චිතව සඳහන් ප්‍රමාණයකින් එහි වත්කම්වලට දායකවීමට එහි සාමාජිකයන් විසින් භාර ගනු ලබන (මේ පනතේ "ඇපයෙන් සීමිත සමාගමක්" යනුවෙන් සඳහන් කරනු ලබන) කොටස් නිකුත් නොකරන සමාගමක්,

විය හැකි ය.

(2) සීමාසහිත සමාගමක් පුද්ගලික සමාගමක් වශයෙන් හෝ අක්වෙරළ සමාගමක් වශයෙන් හෝ සංස්ථාගත කරනු ලැබිය හැකි අතර, එවැනි අවස්ථාවක, ඒ සමාගම කෙරෙහි පිළිවෙලින් II වන කොටසේ විධිවිධාන හෝ XI වන කොටසේ විධිවිධාන අදාළ විය යුතු ය.

### සමාගම් සංස්ථාගත කිරීම

සමාගමක් සංස්ථාගත කිරීමේ ක්‍රමය.

4. (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, සමාගමක් ලියාපදිංචි කිරීම සඳහා සමාගමේ එක් එක් ආරම්භක කොටස් හිමියන් විසින් අත්සන් කරන ලද නියමිත ආකෘතියෙහි වූ ඉල්ලුම් පත්‍රයක් සහ පහත දැක්වෙන ලේඛන ද, එනම්:—

(අ) ඒ තැනැත්තාගේ හෝ තැනැත්තන්ගේ උපරිම දැනුම අනුව සමාගමේ නම දැනට පවත්නා සමාගමක නමට සාකල්‍යයෙන්ම අනුරූපවන හෝ සමාන නොවන බව සඳහන් කරමින් වූ ප්‍රකාශයක් ;

(ආ) මෙහි වූ පළමුවන උපලේඛනයෙහි දක්වා ඇති ව්‍යවස්ථාවලිය සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියට වෙනස් නම්, සමාගමේ එක් එක් ආරම්භක කොටස් හිමියන් විසින් අත්සන් කරන ලද, සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය ;

(ඇ) සමාගමේ අධ්‍යක්ෂවරයකු ලෙස ක්‍රියා කිරීම පිණිස 203 වන වගන්තිය යටතේ එක් එක් ආරම්භක අධ්‍යක්ෂවරයාගෙන් ලබාගත් කැමැත්ත ;

(ඈ) සමාගමේ ලේකම්වරයා ලෙස ක්‍රියා කිරීම පිණිස 221 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ආරම්භක ලේකම්වරයාගෙන් ලබාගත් කැමැත්ත,

සමග වූ රෙජිස්ට්‍රාර්වරයා වෙත කරනු ලබන ඉල්ලීමක් මගින්, යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින්, ඇපයෙන් සීමිත සමාගමක් හැර, සමාගමක් සංස්ථාගත කිරීම පිණිස ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

(2) සමාගමක කොටස් හිමියන් දෙදෙනකුට වඩා අඩුවෙන් නොසිටිය යුතු ය : එසේ වුව ද, කොටස් හිමියා ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙනුවෙන් කොටස් දරන භාණ්ඩාගාරයේ ලේකම්වරයා හෝ පුද්ගලයකු හෝ සංස්ථාවක් වන අවස්ථාවක සමාගමක තනි කොටස්හිමියකු සිටිය හැකි ය.

**5**. (1) සංස්ථාගත කිරීම සඳහා නිසි ලෙස සම්පූර්ණ කරන ලද නියමිත ආකෘතියෙහි වූ ඉල්ලීමක් ලැබුණු විට, රෙජිස්ට්‍රාර්වරයා විසින්— සමාගම සංස්ථාගත කිරීම.

(අ) සමාගම පිළිබඳ විස්තර රෙජිස්ටරයේ ඇතුළත් කළ යුතු ය ;

(ආ) සමාගමේ අංකය ලෙස ඒ සමාගමට පරම අංකයක් වෙන්කර දිය යුතු ය ; තව ද

(ඇ) නියමිත ආකෘතියෙහි වූ සංස්ථාගත කිරීමේ සහතිකයක් ඉල්ලුම්කාර සමාගමට නිකුත් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද සංස්ථාගත කිරීමේ සහතිකයෙහි—

(අ) සමාගමේ නම සහ අංකය ;

(ආ) සමාගම සංස්ථාගත කරන ලද දිනය ;

(ඈ) සමාගම සීමාසහිත සමාගමක් ද සීමාරහිත සමාගමක් ද නැතහොත් ඇපයෙන් සීමිත සමාගමක් ද යන වග ;

(ඇ) සමාගම පුද්ගලික සමාගමක් ද යන වග ; සහ

(ඉ) සමාගම අක්වෙරළ සමාගමක් ද යන වග,

නිශ්චිතව සඳහන් විය යුතු ය.

(3) යම් සමාගමක් සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ නිකුත් කරන ලද සංස්ථාගත කිරීමේ සහතිකයක්—

(අ) සමාගමක් සංස්ථාගත කිරීමට අදාළ මේ පනත යටතේ වූ සියලු නියමයන් අනුව ක්‍රියා කර ඇති බව ; සහ

(ආ) ඒ සංස්ථාගත කිරීමේ සහතිකයේ නිශ්චිතව සඳහන් දිනයේ දී මෙම පනත යටතේ සමාගම සංස්ථාගත කර ඇති බව,

යන කරුණු සම්බන්ධයෙන් තීරණාත්මක සාක්ෂියක් විය යුතු ය.

## සමාගම් නම්

නාමය පිළිබඳ නියම.

6. (අ) නිල ලැයිස්තුගත සමාගමක් හැර, සෑම සීමාසහිත සමාගමක ම නමේ මුලට "සීමාසහිත" යන වචනය හෝ එහි කෙටි යෙදුම වන "සී/ස" යන්න යෙදිය යුතු ය ;

(ආ) සෑම පෞද්ගලික සමාගමක ම නමේ මුලට "සීමාසහිත" යන වචනය හෝ එහි කෙටි යෙදුම වන "සී/ස" යන්න සහ අගට යෙදෙන "සමාගම" යන වචනයට පූර්වයෙන්ම "(පෞද්ගලික)" යන වචනය හෝ එහි කෙටි යෙදුම වන "(පෞද්.)" යන්න යෙදිය යුතු ය ; සහ

(ඇ) නිල ලැයිස්තුගත සමාගමක් වන සෑම සීමාසහිත සමාගමක ම නමේ මුලට "සීමාසහිත" යන වචනය හෝ එහි කෙටි යෙදුම වන "සී/ස" යන්න සහ අගට යෙදෙන "සමාගම" යන වචනයට පූර්වයෙන් "පොදු" යන වචනය යෙදිය යුතු ය.

**7.** (1) පහත දැක්වෙන ආකාරයට, එනම් :—

නම් සම්බන්ධයෙන් සීමා කිරීම.

(අ) වෙනත් යම් සමාගමක හෝ ලියාපදිංචි කළ හෝ විදේශීය සමාගමක නමකට සාකල්‍යයෙන් ම අනුරූප වන්නේ නම්, නමට සමාන නමකින් ;

(ආ) සමාගම සිය නමට "සීමාසහිත" යන වචනය එකතු කිරීමෙන් තොර වූ 34 වන වගන්තිය යටතේ දෙන ලද බලපත්‍රයක් යටතේ ලියාපදිංචි කිරීමට යෙදෙන සමාගමක් වන්නේ නම් මිස, "වාණිජ මණ්ඩලය" යන වචන අඩංගු වන නමකින් ;

(ඇ) රෙජිස්ට්‍රාර්වරයාගේ මතය අනුව නොමඟ යවන සුළු නමකින් කිසිදු සමාගමක් ලියාපදිංචි කරනු නොලැබිය යුතු ය.

(2) ජාතියේ යහපත සැලකිල්ලට ගෙන අමාත්‍යවරයා විසින් දෙනු ලබන කැමැත්ත ඇතිව හැර, කිසිම සමාගමක් —

(අ) "ජනාධිපතිවරයා" හෝ "ජනාධිපති" යන වචන හෝ රෙජිස්ට්‍රාර්වරයාගේ මතය අනුව, ජනාධිපතිවරයාගේ අයිතිය නැතහොත් ආණ්ඩුවේ හෝ ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක් සමග සම්බන්ධතාව ඇති බව හඟවන හෝ හැඟවීමට ඉඩ සැලසෙන වචන ;

(ආ) "නාගරික" හෝ "සංස්ථාගත" යන වචන හෝ රෙජිස්ට්‍රාර්වරයාගේ මතය අනුව, යම් මහ නගර සභාවක් හෝ වෙනත් පළාත් පාලන ආයතනයක් නැතහොත් පාර්ලිමේන්තු පනතකින් සංස්ථාගත කරනු ලැබූ යම් සමිතියක් හෝ මණ්ඩලයක් සමඟ සම්බන්ධතාව ඇති බැව් හඟවන හෝ හැඟවීමට සැලසෙන වෙනත් වචන ;

(ඇ) "සමූපකාරය" හෝ "සමිතිය" යන වචන ; නැතහොත්

(ඈ) "ජාතික", "රාජ්‍ය" හෝ "ශ්‍රී ලංකා" යන වචන රෙජිස්ට්‍රාර්වරයාගේ මතය අනුව, රජය සමග හෝ යම් දෙපාර්තමේන්තුවක් සමග යම් සම්බන්ධතාවක් ඇති බව හඟවන හෝ හැඟවීමට ඉඩ සැලසෙන වෙනත් වචන,

අඩංගු වන නමකින් ලියාපදිංචි කරනු නොලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා එක් නමක් වෙනත් නමක් සමග සාකල්‍යයෙන් අනුරූප වන්නේ දැයි තීරණය කිරීමේ දී, පහත දැක්වෙන වචන සැලකිල්ලට ගනු නොලැබිය යුතු ය:—

(අ) සමාගමක ඉංග්‍රීසි භාෂාවෙන් යෙදෙන පාඨය පළමුවන වචනය "the" වන අවස්ථාවක, ඒ වචනය ;

(ආ) පහත සඳහන් වචන හෝ යෙදුම් සමාගමක නමක මුලට හෝ අගට යෙදෙන අවස්ථාවක, ඒ වචන හා යෙදුම් ;

(i) 'සමාගම' ;

(ii) 'සහ සමාගම' ;

(iii) 'සීමාසහිත සමාගම' ;

(iv) 'සීමාසහිත සහ සමාගම' ;

(v) 'සීමාසහිත' ;

(vi) 'සීමාරහිත' ;

(vii) 'පෞද්ගලික සීමාසහිත' ;

(viii) 'සීමාසහිත පොදු සමාගම';

(ඇ) 6 වන වගන්තියේ සඳහන් කෙටි යෙදුම් සමාගමක නමක මුලට හෝ අගට යෙදෙන "සමාගම" යන වචනයට පූර්වයෙන් හෝ යෙදෙන අවස්ථාවක, ඒ කෙටි යෙදුම් ;

(ඈ) අකුරු වර්ගය හා අකුරුවල ලොකු කුඩා බව, උච්චාරණ විධි, අකුරු අතර ඉඩ ප්‍රමාණය සහ විරාම ලකුණු ; සහ

(ඉ) "සහ" හෝ "හා".

නම වෙනස් කිරීම.

8. (1) රෙජිස්ට්‍රාර්වරයාගේ පූර්ව ලිඛිත අනුමතය ඇතිව, සමාගමක් විසින් විශේෂ යෝජනා සම්මතයක් මගින් එහි නම වෙනස් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ස්වකීය නම වෙනස් කිරීමට සමාගමක් විසින් යෝජනා සම්මත කරගෙන ඇති අවස්ථාවක, වෙනස් කිරීමේ දිනයේ සිට වැඩ කරන දින දහයක් ඇතුළත ඒ වෙනස් කිරීම පිළිබඳ දැන්වීම සමාගම විසින් නියමිත ආකෘතියෙහි රෙජිස්ට්‍රාර්වරයා වෙත දිය යුතු ය.

(3) සමාගමක් විසින් එහි නම වෙනස් කර ඇති බව දැක්වෙන දැන්වීම ලැබීමෙන් පසු, රෙජිස්ට්‍රාර්වරයා විසින් —

(අ) කලින් නම වෙනුවට සමාගමේ අලුත් නම රෙජිස්ටරයෙහි ඇතුළත් කළ යුතු ය ;

(ආ) නියමිත ආකෘතියෙහි :—

(i) නම වෙනස් කිරීම ; සහ

(ii) සමාගම පෞද්ගලික සමාගමක් බවට පත්ව හෝ පෞද්ගලික සමාගමක් ලෙස සිටීම අවසන් කර හෝ ඇති අවස්ථාවක, ඒ වෙනස් කිරීම පිළිබඳ කාරණය,

දැක්වීම පිණිස වෙනස් කරන ලද සංස්ථාගත කිරීමේ අලුත් සහතිකයක් නිකුත් කළ යුතු ය.

(4) නම වෙනස් කිරීම නිසා සමාගමේ අයිතිවාසිකම් හෝ බැඳීම් කිසිවකට බලපෑමක් නොවිය යුතු ය ; නැතහොත් සමාගම විසින් හෝ ඊට විරුද්ධව හෝ පවරා තිබෙන යම් නඩු කටයුතු බලරහිත නොවිය යුතු ය. තවද, සමාගමේ කලින් නමින් ඊට විරුද්ධව පවත්වාගෙන යා හැකිව තිබුණු හෝ ආරම්භ කරනු ලැබිය හැකිව තිබුණු නඩු කටයුතු, සමාගමේ අලුත් නමින් එයට විරුද්ධව පවත්වා ගෙන යාම හෝ ආරම්භ කිරීම හෝ කළ හැකි ය.

(5) (2) වන උපවගන්තියට අනුව ක්‍රියා කිරීම සමාගමක් විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක—

(අ) සමාගම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය ; තව ද

(ආ) පැහැර හැරීම කරන ලද, සමාගමේ සෑම නිලධරයකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

නම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම.

**9**. (1) මේ පනත යටතේ සමාගමක් සංස්ථාගත කිරීමෙන් වැඩ කරන දින තිහක් ඇතුළත,—

(අ) සමාගමේ නම සහ සමාගමට වෙන් කර දී ඇති අංකය ;

(ආ) සමාගමේ ලියාපදිංචි කළ කාර්යාලයේ ලිපිනය,

නිශ්චිතව සඳහන් කරමින්, එහි සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමක් පළ කළ යුතු ය.

(2) 8 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව සමාගමක් විසින් එහි නම වෙනස් කරන ලද අවස්ථාවක, එසේ වෙනස් කිරීම සිදු කිරීමෙන් වැඩ කරන දින විස්සක් ඇතුළත සමාගම විසින්—

(අ) සමාගමේ කලින් නම ;

(ආ) සමාගම් අංකය ;

(ඇ) සමාගමේ ලියාපදිංචි කළ කාර්යාලයේ ලිපිනය ; හා

(ඈ) සමාගමේ අලුත් නම,

නිශ්චිතව සඳහන් කරමින්, ඒ වෙනස් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමක් පළ කළ යුතු ය.

(3) (1) වන හෝ (2) වන උපවගන්තිය යටතේ නියම කර ඇති දැන්වීම පළ කිරීම සමාගමක් විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක,—

(අ) සමාගම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසක් නොඉක්මන දඩයකට යටත් විය යුතු ය ; තව ද,

(ආ) රෙජිස්ට්‍රාර්වරයා විසින් අදාළ දැන්වීම පළ කිරීමට කටයුතු සැලැස්විය යුතු ය.

**10**. (1) 7 වන වගන්තියේ විධිවිධාන කුමක් වුව ද, පහත සඳහන් අවස්ථාගත කරුණු යටතේ, එනම් :— නම වෙනස් කිරීමට විධාන කිරීම.

(අ) අනවධානයෙන් හෝ අන්‍යාකාරයෙන් සමාගමක් 6 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය වන නමක් සහිතව ලියාපදිංචි කරනු ලැබ ඇති අවස්ථාවක ;

(ආ) විරුද්ධ වී ඇති නම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම 9 වන වගන්තිය යටතේ සමාගම විසින් පළ කිරීමෙන් මාස තුනක් ඇතුළත වෙනත් සමාගමක් හෝ ලියාපදිංචි කළ විදේශීය සමාගමක් විසින් —

(i) පළමුවෙන් සඳහන් කළ සමාගමේ නම ව්‍යාකූලතාවක් ඇතිවීමට ඉඩ ඇති විය හැකි පරිදි ඉල්ලීම කරන සමාගමේ නමට බෙහෙවින් සමාන වන අවස්ථාවක; සහ

(ii) විරුද්ධ වී ඇති නමින් පළමුවෙන් සඳහන් කළ සමාගම ලියාපදිංචි කිරීමට පළමුව ඉල්ලීම කරන සමාගම එහි වත්මන් නමින්, ලියාපදිංචි කර ඇති අවස්ථාවක,

නම වෙනස් කරන ලෙසට රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විටක ; හෝ

(ඇ) යම් තැනැත්තකු විසින් නම වෙනස් කරන ලෙසට රෙජිස්ට්‍රාර්වරයාගෙන් ඉල්ලා සිටිනු ලැබ, නම ඉල්ලුම් කර ඇත්තේ සමාගම හඳුනා ගැනීමේ කාර්යය සඳහා සද්භාවයෙන් නොවන බවට රෙජිස්ට්‍රාර්වරයා සෑහීමකට පත් වූ විටක,

සමාගමේ නම වෙනස් කරන ලෙස රෙජිස්ට්‍රාර්වරයා විසින් සමාගමකට විධාන කරනු ලැබිය හැකි ය.

(2) රෙජිස්ට්‍රාර්වරයා විසින් (1) වන උපවගන්තිය යටතේ විධානයක් නිකුත් කරන ලද දිනයේ සිට සති හයක කාලයක් හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් ඔහුගේ අභිමතය පරිදි අවසර දෙනු ලැබිය හැකි වඩා දීර්ඝ කාලයක් හෝ ඇතුළත සමාගමක් විසින් ඒ විධානය අනුව ක්‍රියා කළ යුතු ය.

(3) මේ වගන්තිය යටතේ නිකුත් කරන ලද විධානයක් අනුව ක්‍රියා කිරීම පැහැර හරින සමාගමක් වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂ දෙකක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

සමාගමක තත්ත්වය වෙනස්වීම මත, නම වෙනස් කිරීම.

11. (1) සමාගමක් පෞද්ගලික සමාගමක් ලෙස පැවතීම අවසන් කළ අවස්ථාවක ඒ සමාගම විසින්, "(පෞද්ගලික)" යන වචනය අත්හැරීමෙන්, 8 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව එහි නම වෙනස් කිරීම පිණිස යෝජනා සම්මත කර ගනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) පෞද්ගලික සමාගමක් නොවන සමාගමක් 29 වන වගන්තිය යටතේ පෞද්ගලික සමාගමක් බවට පත්වන අවස්ථාවක, ඒ සමාගම විසින් එහි නමේ අගට ඇති "සමාගම" යන වචනයට පූර්වයෙන් "(පෞද්ගලික)" යන වචනය එකතු කිරීම මගින් 8 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව එහි නම වෙනස් කිරීම පිණිස යෝජනා සම්මත කර ගනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) සීමාසහිත සමාගමක් නිල ලැයිස්තුගත සමාගමක් බවට පත් වන අවස්ථාවක, ඒ සමාගම විසින්, එහි නමේ අගට ඇති "සමාගම" යන වචනයට පූර්වයෙන් "පොදු" යන වචනය එකතු කිරීම මගින් 8 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව එහි නම වෙනස් කිරීම පිණිස යෝජනා සම්මත කර ගනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) සීමාසහිත සමාගමක් නිල ලැයිස්තුගත සමාගමක් ලෙස පැවතීම අවසන් කළ අවස්ථාවක, ඒ සමාගම විසින්, එහි නමේ "සමාගම" යන වචනයට පූර්වයෙන් ඇති "පොදු" යන වචනය අත්හැර දැමීමෙන් 8 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව එහි නම වෙනස් කිරීම පිණිස යෝජනා සම්මත කර ගනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ සමාගමක් විසින් එහි නම වෙනස් කිරීම පිණිස යෝජනා සම්මත කර ගනු ලැබූ ලෙස සලකනු ලබන අවස්ථාවක, ඒ සමාගම විසින්, ඒ වෙනස් කිරීමෙන් වැඩ කරන දින දහයක් ඇතුළත වෙනස් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමක් පළ කර ඒ දැන්වීමේ පිටපතක් රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතු අතර, ඒ නම වෙනස් කිරීමට හා ඒ නම වෙනස් කිරීම සම්බන්ධයෙන් 8 වන වගන්තියේ (3) වන හා (4) වන උපවගන්තිවල විධිවිධාන අදාළ විය යුතු ය.

(6) (5) වන උපවගන්තියේ නියමයන් අනුව ක්‍රියා කිරීම සමාගමක් විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක—

(අ) සමාගම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය ; තව ද,

(ආ) පැහැර හැරීම කරන ලද, සමාගමේ සෑම නිලධරයකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

සමාගමේ නම හා සමාගමේ අංකය භාවිත කිරීම.

**12**. (1) සමාගමේ නම සහ එහි අංකය පැහැදිළිව සඳහන් කර තිබෙන බවට සමාගමක් වගබලා ගත යුතු ය.—

(අ) සමාගමේ සියලු ව්‍යාපාරික ලිපිවල ;

(ආ) සමාගමේ සියලු දැන්වීම්වල සහ වෙනත් නිල ප්‍රකාශනවල ;

(ඇ) සමාගම වෙනුවෙන් අත්සන් කරන ලද සියලු විනිමය බිල්පත්වල, පොරොන්දු නෝට්ටුවල, පිටසන් කිරීම්වල, චෙක්පත්වල සහ මුදල් හෝ භාණ්ඩ සඳහා වන ඇණවුම්වල ;

(ඈ) සමාගමේ සියලු ඉන්වොයිස් බලපත්‍රවල, ලදුපත්වල හා ණයවර ලිපිවල ;

(ඉ) සමාගමේ නෛතික බැඳීමක් ඇතිකරන්නා වූ හෝ එහි ලා සාක්ෂියක් වන්නා වූ සමාගම විසින් නිකුත් කරන ලද හෝ අත්සන් කරන ලද වෙනත් සියලු ලේඛනවල ; සහ

(ඊ) සමාගමට මුද්‍රාවක් ඇත්නම්, ඒ මුද්‍රාවේ,

පැහැදිළිව සඳහන් කර තිබෙන බවට සමාගමක් වගබලා ගත යුතු ය.

(2) සෑම සමාගමක් ම විසින් එහි නම සහ සමාගමේ අංකය එහි ලියාපදිංචි කළ කාර්යාලයේ පැහැදිලි ලෙස ප්‍රදර්ශනය කර තිබෙන බවට වගබලා ගත යුතු ය.

(3) සමාගමක් විසින් (1) වන උපවගන්තියේ හෝ (2) වන උපවගන්තියේ විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර හරිනු ලබන අවස්ථාවක—

(අ) සමාගම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය ; තව ද,

(ආ) පැහැර හැරීම කරන ලද සමාගමේ සෑම නිලධරයකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(4) (අ) සමාගමේ නෛතික බැඳීමක් ඇතිකරන්නා වූ හෝ එහි ලා සාක්ෂියක් වන්නා වූ ලේඛනයක් සමාගම විසින් හෝ සමාගම වෙනුවෙන් නිකුත් කර ඇති හෝ අත්සන් කර ඇති ; සහ

(ආ) සමාගමේ නම හා සමාගමේ අංකය ඒ ලේඛනයේ නිවැරදි ලෙස සඳහන් කර නොමැති අවස්ථාවක,

සමාගම ඒ බැඳීම ඉටු කිරීම පැහැර හරින්නේ නම් ;

(ඇ) ඒ බැඳීම සිදු කරන ලද්දේ යම් තැනැත්තකුගේ වාසියට ද ඒ තැනැත්තා, ලේඛනය නිකුත් කරන ලද හෝ අත්සන් කරන ලද වේලාවේ දී ඒ බැඳීම සමාගම විසින් සිදු කරන බව දැනගෙන සිටි බව ලේඛනය නිකුත් කළ හෝ අත්සන් කළ තැනැත්තා විසින් ඔප්පු කරන්නේ නම් මිස ; නැතහොත්

(ඈ) ඒ තැනැත්තා එලෙස බැඳීමට යටත් කිරීම යුක්ති සහගත සහ සාධාරණීය නොවන බවට අධිකරණය සෑහීමට පත්වන්නේ නම් මිස,

සමාගම බැඳීමට යටත් වන ප්‍රමාණයට ම, ලේඛනය නිකුත් කළ හෝ අත්සන් කළ සෑම තැනැත්තෙක් ම යටත් වන්නේ ය.

(5) (1) වන හා (2) වන උපවගන්තිවල කාර්ය සඳහා, සමාගමක් විසින්, ඒ සමාගමේ නමෙහි යම් වචනයක් සාමාන්‍යයෙන් පිළිගත් කෙටි යෙදුමක් භාවිත කිරීම නොමඟ යවන සුළු නම් මිස, සමාගම විසින්, එවැනි කෙටි යෙදුමක් භාවිත කරනු ලැබිය හැකි ය.

සාංගමික ව්‍යවස්ථාවලිය

ව්‍යවස්ථාවලියේ ඇතුළත් කාරණා.

**13**. සමාගමක සාංගමික ව්‍යවස්ථාවලියෙහි, මෙහි වූ පළමුවන උපලේඛනය හැර, මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන යම් කාරණයක් සඳහා විධිවිධාන සැලැස්විය හැකි අතර විශේෂයෙන් ම, පහත දැක්වෙන කාරණා සඳහා විධිවිධාන සැලැස්විය හැකි ය :—

(අ) සමාගමේ පරමාර්ථ ;

(ආ) සමාගමේ කොටස්හිමියන්ගේ අයිතිවාසිකම් හා බැඳීම් ; සහ

(ඇ) සමාගමේ කළමනාකරණය හා පරිපාලනය.

**14**. ආදර්ශ ව්‍යවස්ථාවලියක් බැහැර කරන, සුළු වශයෙන් වෙනස් කරන හෝ ඒවාට අනනුකූල ව්‍යවස්ථාවලියක් සමාගමක් විසින් අදාළ කර ඇති ප්‍රමාණයට හැරෙන්නට, (මෙහි මින් මතු "ආදර්ශ ව්‍යවස්ථාවලිය" යනුවෙන් සඳහන් කරනු ලබන) මෙහි පළමුවන උපලේඛනයේ දක්වා ඇති සාංගමික ව්‍යවස්ථාවලිය, ඇපයෙන් සීමිත සමාගමක් හැර යම් සමාගමක් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

ආදර්ශ ව්‍යවස්ථාවලියක් අදාළ කර ගැනීම.

**15**. (1) මේ පනතේ විධිවිධානවලට සහ ස්වකීය ව්‍යවස්ථාවලියේ ඇතුළත් යම් කොන්දේසිවලට යටත්ව, සමාගමක් විසින් කවර හෝ වේලාවක, විශේෂ යෝජනා සම්මතයක් මගින්,—

ව්‍යවස්ථාවලියක් අදාළ කර ගැනීම හෝ සංශෝධනය කිරීම.

(අ) නව ව්‍යවස්ථාව අදාළ කරගනු ලැබිය හැකි ය ;

(ආ) පළමුවන උපලේඛනයේ දක්වා ඇති සාංගමික ව්‍යවස්ථාවලියට වෙනස් ව්‍යවස්ථාවක් එයට ඇත්නම්, ඒ ව්‍යවස්ථාවන් එහි ව්‍යවස්ථාවලිය ලෙස අදාළ කර ගනු ලැබිය හැකි ය ; නැතහොත්

(ඇ) එහි ව්‍යවස්ථාවලිය වෙනස් කළ හැකි ය.

(2) සමාගමක් විසින් විශේෂ යෝජනා සම්මතයක් මගින් එහි ව්‍යවස්ථාවලිය වෙනස් කරනු ලබන අවස්ථාවක, ඒ යෝජනා සම්මතයේ සහ යම් අලුත් ව්‍යවස්ථාවල හෝ සමාගමේ ව්‍යවස්ථාවලියෙහි කරන ලද යම් වෙනස් කිරීම්වල පාඨ සම්පූර්ණයෙන් දක්වමින්, වැඩ කරන දින දහයක් ඇතුළත ඒ යෝජනා සම්මතය පිළිබඳ දැන්වීමක් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඒ සමාගම විසින් දෙනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ නියමයන් අනුව ක්‍රියා කිරීම සමාගමක් විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක—

(අ) සමාගම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය ; තව ද

(ආ) පැහැර හැරීම කරන ලද සමාගමේ සෑම නිලධරයකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

ව්‍යවස්ථාවලියේ බලපෑම.

**16.** 89 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, සමාගමක ව්‍යවස්ථාවලිය සමාගම සහ එහි කොටස්හිමියන් අතර පවත්නා ගිවිසුමක් වූවාක් මෙන් ඒ ව්‍යවස්ථාවලියෙන් සමාගම සහ එහි කොටස්හිමියන් බැඳී සිටින්නාහ. විශේෂයෙන් ම, ව්‍යවස්ථාවලිය යටතේ යම් කොටස්හිමියකු විසින් සමාගමට ගෙවිය යුතු මුදල් කිසිවක්, ඒ කොටස්හිමියාගෙන් සමාගමට අයවිය යුතු ණයක් වන්නේ ය.

ව්‍යවස්ථාවලියේ පරමාර්ථ පිළිබඳ ප්‍රකාශයේ බලපෑම.

**17.** (1) සමාගමක ව්‍යවස්ථාවලියෙහි සමාගමේ පරමාර්ථ දක්වා ඇති අවස්ථාවක, ව්‍යවස්ථාවලියෙන් අන්‍යාකාරයෙන් ප්‍රකාශිතව ම විධිවිධාන සලස්වා ඇත්නම් මිස, ව්‍යවස්ථාවලිය මගින්, ඒ පරමාර්ථ ඇතුළත් නොවන යම් ව්‍යාපාරයක් හෝ කටයුත්තක් කර ගෙන යාම කෙරෙහි සීමා කිරීමක් කර ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) සමාගමක ව්‍යවස්ථාවලියෙන්, ඒ සමාගම විසින් නිරත විය හැකි ව්‍යාපාර හෝ කටයුතු කෙරෙහි යම් සීමා කිරීමක් සඳහා විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක—

(අ) ඒ සීමා කිරීමෙන් සමාගමේ ශක්තුතාවට හා බලතලවලට බලපෑමක් නොවිය යුතු ය ; තව ද

(ආ) සමාගමේ කිසිදු ක්‍රියාවක්, කිසිදු ගිවිසුමක් හෝ සමාගම විසින් ඇතුළත් වී ඇති වෙනත් කිසිදු බැඳීමක් සහ සමාගම විසින් හෝ සමාගම වෙත කරනු ලබන කිසිදු දේපළ පැවරීමක්, ඒ සීමා කිරීම උල්ලංඝනය කරමින් සිදු කර තිබීමේ හේතුව නිසාම පමණක් අවලංගු නොවිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ ඇතුළත් කිසිවකින්—

(අ) සමාගම විසින් ව්‍යවස්ථාවලියෙන් කරන ලද සීමා කිරීමකට අනනුකූල වන ආකාරයෙන් ගිවිසුමකට හෝ වෙනත් අනුගම්‍ය බැඳීමකට ඇතුළත් වී ඇත්නම් මිස, ඒ ආකාරයෙන් ක්‍රියා කිරීම සමාගමට සීමා කිරීම පිණිස 233 වන වගන්තිය යටතේ අධිකරණය වෙත ඉල්ලීමක් කිරීමට සමාගමේ කොටස්හිමියකුට හෝ අධ්‍යක්ෂවරයකුට ඇති හැකියාව ; හෝ

(ආ) 188 වන වගන්තියේ විධිවිධාන කඩ කරමින් ක්‍රියා කිරීම සම්බන්ධයෙන් සමාගමේ අධ්‍යක්ෂවරයකුට ඇති වගකීම,

කෙරෙහි බලපෑමක් නොවිය යුතු ය.

**18.** (1) සමාගමේ ව්‍යවස්ථාවලියේ පිටපතක් ලබා ගැනීම සඳහා කවර හෝ අවස්ථාවක සමාගම වෙත ලියවිල්ලකින් වූ ඉල්ලීමක් කිරීමට කොටස්හිමියකුට අයිතිවාසිකමක් ඇති අතර, (2) වන උපවගන්තියට යටත්ව, ඒ ඉල්ලීම ලැබුණු දිනයේ සිට වැඩ කරන දින පහක් ඇතුළත සමාගම විසින් ඒ ඉල්ලීම අනුව ක්‍රියා කළ යුතු ය.

ව්‍යවස්ථාවලියේ පිටපතක් ලබා ගැනීමට කොටස්හිමියන්ට අයිතිවාසිකමක් ඇති බව.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් කරනු ලැබුවේ යම් සමාගමක් වෙත ද, ඒ සමාගම විසින් —

(අ) ව්‍යවස්ථාවලියේ පිටපතක් සැපයීමට ප්‍රථමයෙන් රුපියල් පන් සියයකට වැඩි නොවන ගාස්තුවක් ගෙවන ලෙස කොටස්හිමියාට නියම කරනු ලැබිය හැකි ය ; නැතහොත්

(ආ) පසුගිය හය මාසයක කාලය ඇතුළත ඒ කොටස්හිමියාට ව්‍යවස්ථාවලියේ පිටපතක් සපයා තිබුනේ නම්, පිටපතක් සැපයීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තියේ නියමයන් අනුව ක්‍රියා කිරීම සමාගමක් විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක—

(අ) සමාගම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ දෙකක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය ; තව ද

(ආ) පැහැර හැරීම කරන ලද සමාගමේ සෑම නිලධරයකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

### සමාගම් ගිවිසුම් ආදිය

**19.** (1) සමාගමක් විසින් පහත දැක්වෙන ආකාරයට ගිවිසුමකට හෝ වෙනත් ක්‍රියාවෙහි යෙදවිය හැකි බැඳීමකට ඇතුළත් විය හැකි ය :—

ගිවිසුම්වලට ඇතුළත් විය හැකි ආකාරය.

(අ) යම් බැඳීමකට ස්වාභාවික පුද්ගලයකු විසින්, ඇතුළත් වනු ලබන්නේ නම්, ඒ බැඳීම ලියවිල්ලකින් විය යුතු බවට හා ඒ පුද්ගලයා විසින් අත්සන් කළ යුතු බවට හා නොතාරිස්වරයකු විසින් සාක්ෂි දැරූ බවට නීතියෙන් නියම කර ඇත්නම්, ඒ බැඳීම සමාගම වෙනුවෙන් ලියවිල්ලකින් ඇතුළත් විය හැකි අතර, සමාගමේ නම යටතේ—

(i) සමාගමේ අධ්‍යක්ෂවරයන් දෙදෙනකු විසින් ;

(ii) එක් අධ්‍යක්ෂවරයකු පමණක් සිටින්නේ නම්, ඒ අධ්‍යක්ෂවරයා විසින් ;

(iii) වෙනත් යම් තැනැත්තකු හෝ තැනැත්තන් පංතියක් විසින් අත්සන් කිරීම පිණිස සමාගමේ ව්‍යවස්ථාවලියෙහි විධිවිධාන සලස්වා ඇත්නම්, ඒ වෙනත් යම් තැනැත්තා හෝ තැනැත්තන් පංතිය විසින් ; හෝ

(iv) සමාගම විසින් පත් කරන ලද එක් ඇටෝර්නි බලකරුවකු හෝ ඊට වැඩි ඇටෝර්නි බලකරුවන් ගණනක් විසින්,

අත්සන් කරනු ලැබ නොතාරිස්වරයකු විසින් සාක්ෂි දරනු ලැබිය යුතු ය ;

(ආ) යම් බැඳීමකට ස්වාභාවික පුද්ගලයකු විසින් ඇතුළත් වනු ලබන්නේ නම්, ඒ බැඳීම ලියවිල්ලකින් විය යුතු බවට හා ඒ පුද්ගලයා විසින් අත්සන් කළ යුතු බවට නීතියෙන් නියම කර ඇත්නම් ඒ බැඳීමට, සමාගමේ ප්‍රකාශිත හෝ ව්‍යංජිත අධිකාරය යටතේ ක්‍රියා කරන තැනැත්තකු විසින් අත්සන් කිරීමෙන් සමාගම වෙනුවෙන් ලියවිල්ලකින් ඇතුළත් විය හැකි ය ;

(ඇ) යම් බැඳීමකට ස්වාභාවික පුද්ගලයකු විසින් ඇතුළත් වනු ලබන්නේ නම්, ලියවිල්ලකින් විය යුතු නොවන බවට නීතියෙන් නියම කර ඇත්නම්, ඒ බැඳීමට සමාගමේ ප්‍රකාශිත හෝ ව්‍යංජිත අධිකාරය යටතේ ක්‍රියා කරන තැනැත්තකු විසින් සමාගම වෙනුවෙන් ලියවිල්ලකින් හෝ වාචිකව ඇතුළත් විය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන, යම් ගිවිසුමකට හෝ වෙනත් බැඳීමකට—

(අ) ඒ ගිවිසුමට හෝ බැඳීමට ශ්‍රී ලංකාවේ දී ඇතුළත් වූයේ හෝ නොවූයේ වුව ද ; එසේම

(ආ) ඒ ගිවිසුම හෝ බැඳීම පාලනය කෙරෙන නීතිය ශ්‍රී ලංකාවේ නීතිය වුව ද නොවුව ද,

අදාළ විය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්යය සඳහා, සමාගමක් විසින් ඒ සමාගමේ නමෙහි යම් වචනයක සාමාන්‍යයෙන් පිළිගත් කෙටි යෙදුමක් භාවිත කිරීම නොමග යවන සුළු නම් මිස, ඒ සමාගම විසින් එවැනි කෙටි යෙදුම භාවිත කළ හැකි ය.

ඇටෝර්නි බලකරුවෝ.

**20**. (1) සමාගමක් විසින්, එහි ව්‍යවස්ථාවලියට යටත්ව, 19 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ලියා අත්සන් කරන ලද ලියවිල්ලකින් වූ සාධන පත්‍රයක් මගින්, පොදුවේ හෝ නිශ්චිත කාරණයකට අදාළව හෝ එහි ඇටෝර්නි බලකරු වශයෙන් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් සාධන පත්‍රයට අනුකූලව කරන ලද ඇටෝර්නි බලකරුගේ යම් ක්‍රියාවක්, සමාගම විෂයයෙහි අනුගම්‍ය විය යුතු ය.

(3) (122 වන අධිකාරය වූ) ඇටෝර්නි බල ආඥාපනතේ විධිවිධාන සහ ස්වාභාවික පුද්ගලයකු විසින් ලියා අත්සන් කරන ලද ඇටෝර්නි බලපත්‍රවලට අදාළ නීතිය, සමාගම ස්වාභාවික පුද්ගලයකු වූයේ නම් ඒ ප්‍රමාණයට ම සහ ඈවර කිරීමේ ආරම්භය නැතහොත් ඈවර කිරීමක් නොමැත්තේ නම් සමාගම රෙජිස්ටරයෙන් ඉවත් කිරීම, තැනැත්තකුගේ මරණය ප්‍රමාණයට ම, අවශ්‍ය සුළු වශයෙන් වූ වෙනස් කිරීම් සහිතව, සමාගමක් විසින් ලියා අත්සන් කරන ලද ඇටෝර්නි බලපත්‍රයක් සම්බන්ධයෙන් ද අදාළ විය යුතු ය.

අධ්‍යක්ෂවරයන්ගේ, නිලධරයන්ගේ හා අනුයෝජිතයන්ගේ අධිකාරය.

**21**. (1) සමාගමක් විසින් නැතහොත් සමාගමක ඇති බැඳීමක ඇපකරු හෝ සමාගම යටතේ හිමිකම් කියා සිටින යම් තැනැත්තකු විසින්, ඒ තැනැත්තාට ඊට පටහැනි දැනුමක් ඇත්තේ නම් මිස හෝ ඒ තැනැත්තා සමාගමේ දරන තත්ත්වය ප්‍රකාරව හෝ සමාගම සමග ඇති සම්බන්ධතාව ප්‍රකාරව, ඊට පටහැනි දැනුමක් තිබිය හැකිවන්නේ නම් මිස, ඒ සමාගම සමග කටයුතු කරන හෝ ඒ සමාගමෙන් අයිතිවාසිකම් අත්කර ගෙන සිටින යම් තැනැත්තකුට විරුද්ධ—

(අ) සමාගමේ ව්‍යවස්ථාවලිය අනුව ක්‍රියා කර නොමැති යයි ; හෝ

(ආ) මේ පනතේ 223 වන වගන්තිය යටතේ ඉතා මෑත දී ගොනුකර ඇති දැන්වීමෙහි හෝ 131 වන වගන්තිය යටතේ බාරදෙන ලද වාර්ෂිකව නම් කර ඇති තැනැත්තන්, අවස්ථාවෝචිත පරිදි, සමාගමේ අධ්‍යක්ෂවරයන් හෝ ලේකම්වරයා නොවන්නේ යයි ; හෝ

(ඈ) ඒ සමාගමේ අධ්‍යක්ෂවරයකු, නිලධරයකු හෝ අනුයෝජිතයකු බවට සමාගම විසින් කියාපාන තැනැත්තකු—

(i) යථා පරිදි පත් කර නොමැති යයි ; හෝ

(ii) සමාගමේ ව්‍යාපාරික කටයුතුවල දී චාරිත්‍රමය වූ හෝ ඒ සමාගම විසින් කර ගෙන යනු ලබන වර්ගයේ ම ව්‍යාපාර කටයුතු කර ගෙන යන්නා වූ සමාගමක අධ්‍යක්ෂවරයකු, නිලධරයකු හෝ අනුයෝජිතයකු සඳහා සාමාන්‍ය වූ බලතල ක්‍රියාත්මක කිරීමට හා කාර්ය ඉටු කිරීමට ඉහත කී තැනැත්තන්ට අධිකාරය නොමැති යයි ; හෝ

(ඇ) ලේඛනයක් නිකුත් කිරීමට නියම වශයෙන් හෝ සාමාන්‍ය වශයෙන් අධිකාරය ඇති, සමාගමේ යම් අධ්‍යක්ෂවරයකු විසින්, ලේකම්වරයා විසින් හෝ යම් නිලධරයකු හෝ අනුයෝජිතයකු විසින් නිකුත් කරන ලද ලේඛනයක් වලංගු හෝ නිර්ව්‍යාජ නොවන්නේ යයි,

ප්‍රභාෂණය නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ආ) සිට (ඇ) තෙක් වූ ඡේදවල සඳහන් තැනැත්තකු විසින් වංචනික ලෙස ක්‍රියා කරන ලද හෝ සමාගම වෙනුවෙන් අත්සන් කර ඇත්තේ යයි පෙනෙන්නට තිබෙන ලේඛනයක හොර අත්සන් තබා ඇති අවස්ථාවක් සහිත තත්ත්වයක දී වුව ද, සමාගම සමග කටයුතු කරන තැනැත්තාට හෝ සමාගමෙන් අයිතිවාසිකම් අත්කරගෙන සිටින තැනැත්තාට ඒ වංචාව හෝ හොර අත්සන් යෙදීම පිළිබඳව නියම දැනුමක් ඇත්නම් මිස, (1) වන උපවගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

සම්ප්‍රයුක්ත දැන්වීමක් නොමැති බව.

**22.** 105 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, සමාගමක ව්‍යවස්ථාවලිය හෝ සමාගමකට අදාළ වෙනත් යම් ලේඛනයක් ගොනු කිරීම සඳහා රෙජිස්ට්‍රාර්වරයා වෙත භාර දී තිබීමේ හෝ සමාගමේ යම් කාර්යාලයක පරීක්ෂාව සඳහා ලබාගත හැකිවීමේ හේතුව නිසාම පමණක්, ඒ ව්‍යවස්ථාවලියේ හෝ ලේඛනයේ ඇතුළත් කරුණුවලින් තැනැත්තකුට බලපෑමක් ඇති නොවිය යුතු ය ; නැතහොත් ඒ තැනැත්තාට ඒ පිළිබඳ දැන්වීමක් ලැබී ඇත්තේ යයි හෝ දැනුමක් ඇත්තේ යයි සලකනු නොලැබිය යුතු ය.

## පූර්ව-සංස්ථාගත කිරීමේ ගිවිසුම්

පූර්ව-සංස්ථාගත කිරීමේ ගිවිසුම් ස්ථිර කළ හැකි බව.

**23**. (1) මේ වගන්තියේ සහ මේ පනතේ 24 වන හා 25 වන වගන්තිවල කාර්යය සඳහා "පූර්ව සංස්ථාගත කිරීමේ ගිවිසුම්" යන යෙදුමෙන්,—

(අ) සමාගමක් සංස්ථාගත කිරීමට කලින් එය විසින් ඇතුළත් වන ලදැයි උද්දේශිත ගිවිසුමක් ; හෝ

(ආ) සමාගමක් සංස්ථාගත කිරීමට කලින් සහ සංස්ථාගත කිරීමේ අපේක්ෂාවෙන් සමාගම වෙනුවෙන් තැනැත්තකු විසින් ඇතුළත් වන ලද ගිවිසුමක්,

අදහස් වේ.

(2) යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, පූර්ව-සංස්ථාගත කිරීමේ ගිවිසුමක් ඒ ගිවිසුමේ නිශ්චිතව සඳහන් යම් කාලයක් ඇතුළත හෝ එවැනි යම් කාලයක් නිශ්චිතව සඳහන් කර නොමැති නම්, ඒ සමාගම සංස්ථාගත කිරීමෙන් පසු යුක්ති සහගත කාලයක් ඇතුළත ඒ ගිවිසුමට ඇතුළත් වූයේ යම් නමකින් ද ඒ නමෙන් නැතහොත් යම් සමාගමක් වෙනුවෙන් ද ඒ වෙනුවෙන් ස්ථිර කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ ස්ථිර කරන ලද පූර්ව -සංස්ථාගත කිරීමේ ගිවිසුමක්, ඊට ඇතුළත් වන ලද අවස්ථාවේ දී සමාගම, ඒ ගිවිසුමට පාර්ශ්වකරුවකු වූවාක් මෙන් වලංගු හා ක්‍රියාවෙහි යෙදවිය හැකි විය යුතු ය.

(4) පූර්ව-සංස්ථාගත කිරීමේ ගිවිසුමක්, 19 වන වගන්තිය යටතේ සමාගමක් වෙනුවෙන් ඇතුළත් වී ඇති ගිවිසුමක් ස්ථිර කරනු ලබන ආකාරයෙන් ම, ස්ථිර කරනු ලැබිය හැකි ය.

පූර්ව සංස්ථාගත කිරීමේ ගිවිසුම්වල ව්‍යංජිත ඇපවීම්.

**24**. (1) යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇති ද, පූර්ව සංස්ථාගත කිරීමේ ගිවිසුමක පටහැනි චේතනාවක් ප්‍රකාශිතව ඇත්නම් මිස, ඒ ගිවිසුමෙහි, සමාගමේ නමින් හෝ සමාගම වෙනුවෙන් ඒ ගිවිසුමට ඇතුළත්වීමට අදහස් කරන තැනැත්තා විසින්—

(අ) ගිවිසුමේ නිශ්චිතව ම සඳහන් යම් කාලයක් ඇතුළත හෝ එවැනි යම් කාලයක් නිශ්චිතව සඳහන් කර නොමැති නම්, ගිවිසුම ඇති කර ගැනීමෙන් පසු යුක්ති සහගත කාලයක් ඇතුළත සමාගම සංස්ථාගත කරනු ලබන බවට ;

(ආ) ගිවිසුමේ නිශ්චිතව සඳහන් යම් කාලයක් ඇතුළත හෝ එවැනි යම් කාලයක් නිශ්චිතව සඳහන් කර නොමැති නම් ඒ සමාගම සංස්ථාගත කිරීමෙන් පසු යුක්ති සහගත කාලයක් ඇතුළත සමාගම විසින් ඒ ගිවිසුම ස්ථිර කරනු ලබන බවට,

කරනු ලබන ව්‍යංජිත ඇපවීමක් තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් ව්‍යංජිත ඇපවීම කඩ කිරීම පිළිබඳ වූ නඩුවක දී අයකර ගත හැකි අලාභවල ප්‍රමාණය, ගිවිසුම සමාගම විසින් ස්ථිර කරනු ලැබ ඇත්නම්, ගිවිසුම යටතේ ඉටු කර නොමැති බැඳීම් සමාගම විසින් කඩ කිරීම වෙනුවෙන් වූ අලාභ සඳහා සමාගමට විරුද්ධව ඇති නඩුවක දී අයකර ගනු ලැබිය හැකි අලාභවල ප්‍රමාණය ම විය යුතු ය.

(3) සමාගමක් සංස්ථාගත කිරීමෙන් පසු (23 වන වගන්තිය යටතේ සමාගම විසින් ස්ථිර කරන ලද ගිවිසුමක් නොවන) පූර්ව-සංස්ථාගත කිරීමේ ගිවිසුමක නියම පරිදි ම වූ හෝ ඊට ආදේශිත වූ ගිවිසුමකට සමාගමක් ඇතුළත් වන අවස්ථාවක, (1) වන උපවගන්තිය යටතේ වූ යම් තැනැත්තකුගේ වගකීමෙන් ඒ තැනැත්තා නිදහස් විය යුතු ය.

ස්ථිර කිරීම පැහැර හැරීම.

**25**. සමාගමක් සංස්ථාගත කිරීමෙන් පසුව ඒ සමාගම විසින් ස්ථිර නොකරන ලද පූර්ව-සංස්ථාගත කිරීමේ ගිවිසුමක් ප්‍රකාරව ඒ සමාගම විසින් දේපළ අත්කර ගෙන ඇති අවස්ථාවක, ඒ දේපළ අත්කර ගන්නා ලද්දේ යම් පාර්ශවයක් මගින් ද ඒ පාර්ශ්වය විසින් තත් කාර්ය සඳහා කරන ලද ඉල්ලීමක් මත අධිකරණය විසින්—

(අ) පූර්ව-සංස්ථාගත කිරීමේ ගිවිසුම යටතේ අත්කර ගන්නා ලද දේපළ ඒ පාර්ශ්වයට ආපසු දෙන ලෙස සමාගමට විධාන කරමින් ;

(ආ) ගිවිසුම සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් වලංගු කරමින් ; හෝ

(ඇ) අත්කර ගන්නා ලද දේපළට අදාළව ඒ පාර්ශ්වයේ වාසියට වෙනත් යම් සහනයක් ප්‍රදානය කරමින්,

ආඥාවක් කරනු ලැබිය හැකි ය.

### සමාගම විසින් ලේඛන සැබෑ බවට සහතික කිරීම

**26**. සමාගමක් විසින් සැබෑ බවට සහතික කිරීමට නියමිත ලේඛනයක් හෝ කටයුතුවල වාර්තාවක් සමාගමේ අධ්‍යක්ෂවරයකු, ලේකම්වරයකු හෝ වෙනත් බලයලත් නිලධරයකු විසින් අත්සන් කරනු ලැබිය යුතු ය. සමාගම විසින් ලේඛන සැබෑ බවට සහතික කිරීම.

II වන කොටස

### පෞද්ගලික සමාගම්

**27**. පුද්ගලික සමාගමක ව්‍යවස්ථාවලියෙහි— පෞද්ගලික සමාගමේ ව්‍යවස්ථාවලිය.

(අ) සමාගම විසින් නිකුත් කරනු ලබන කොටස් හෝ වෙනත් සුරැකුම්පත් මහජනයාට අර්පණය කිරීම සමාගමට තහනම් කරන ; සහ

(ආ) (i) සමාගමේ සේවානියුක්තයන් ; හෝ

(ii) ඒ සමාගමේ සේවානියුක්තයන්ව සිටිය දී සමාගමේ කොටස් හිමියන් බවට පත් වූ ද සමාගමේ සේවානියුක්තයන් ලෙස සිටීම අවසන් කිරීමෙන් පසු කොටස් හිමියන් ලෙස දිගට ම සිටින සමාගමේ කලින් සිටි සේවානියුක්තයන්,

වන කොටස් හිමියන් ඇතුළත් නොවන, එහි කොටස් හිමියන් සංඛ්‍යාව පණහකට සීමා කරන,

විධිවිධාන ඇතුළත් විය යුතු ය.

**28**. (1) පෞද්ගලික සමාගමක් විසින්, එහි ව්‍යවස්ථාවලිය 27 වන වගන්තියේ නියමයන්ට තවදුරටත් අනුකූලව ක්‍රියා නොකරන යම් ආකාරයකින් වෙනස් කරනු ලැබුවහොත්— සමාගමක් පුද්ගලික සමාගමක් වීම අවසන් වීම.

(අ) ඒ සමාගම පෞද්ගලික සමාගමක් වීම අවසන් විය යුතු ය ;

(ආ) ඒ සමාගමට 30 වන හා 31 වන වගන්තිවල විධිවිධාන අදාළවීම අවසන් විය යුතු ය ; තව ද

(ඇ) සමාගම විසින් 11 වන වගන්තියට අනුකූලව එහි නම වෙනස් කර ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) 27 වන වගන්තියේ නිශ්චිතව සඳහන් නියම අනුව ක්‍රියා කිරීම පෞද්ගලික සමාගමක් විසින් පැහැර හරිනු ලබන්නේ නම්,—

(අ) ඒ සමාගම පෞද්ගලික සමාගමක් වීම අවසන් විය යුතු ය ;

(ආ) ඒ සමාගමට 30 වන හා 31 වන වගන්තිවල විධිවිධාන අදාළවීම අවසන් විය යුතු ය ; තව ද

(ඇ) සමාගම විසින් 11 වන වගන්තියට අනුකූලව එහි නම වෙනස් කර ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) පෞද්ගලික සමාගමක් විසින් කරන ලද පැහැර හැරීමක් සම්බන්ධයෙන් පහත සඳහන් කාරණා පිළිබඳව අධිකරණය සෑහීමට පත් වන්නේ නම්, අධිකරණය විසින්, (2) වන උපවගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු යයි, තීරණය කරනු ලැබිය හැකි ය :—

(අ) අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැරීම අනවධානය හේතු කොට ගෙන සිදු වූ බව ; හෝ

(ආ) අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැරීම නිවැරදි කර ඇති බව ; හෝ

(ඇ) කාරණයේ සියලු අවස්ථාගත කරුණු අනුව, ඒ තීරණයට එළඹීම යුක්තිසහගත හා සාධාරණාත්මක බව.

සමාගමක් පෞද්ගලික සමාගමක් බවට පත් විය හැකි බව.

**29**. සීමාසහිත සමාගමක් විසින් එහි ව්‍යවස්ථාවලිය 27 වන වගන්තියේ නියමයන්ට අනුකූලවන පරිදි වෙනස් කරන ලද අවස්ථාවක—

(අ) සමාගම පෞද්ගලික සමාගමක් බවට පත්විය යුතු ය ; තව ද

(ආ) සමාගම විසින් එහි නම 11 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව වෙනස් කර ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

පෞද්ගලික සමාගම් විසින් සම්බන්ධතා රෙජිස්ටරය තබා ගැනීම අවශ්‍ය නොවන බව.

**30**. (1) පුද්ගලික සමාගමක් විසින් එහි කොටස්හිමියන්ගේ ඒකමතික යෝජනා සම්මතයක් මගින්, සම්බන්ධතා රෙජිස්ටරයක් තබා ගැනීමේ අවශ්‍යතාව අත්හැර දැමිය හැකි අතර, එවැනි යෝජනා සම්මතයක් බලාත්මකව පවතින අතරතුර, සමාගමක සම්බන්ධතා රෙජිස්ටරයෙහි යම් කාරණයක් ඇතුළත් කළ යුතු බවට වූ මේ පනතේ කිසිදු විධිවිධානයක් ඒ පෞද්ගලික සමාගමට අදාළ නොවිය යුතු ය.

(2) සමාගම විසින් සම්බන්ධතා රෙජිස්ටරයක් තබා ගැනීම, අවශ්‍ය බවට යම් කොටස්හිමියකු විසින් සමාගම වෙත ලියවිල්ලකින් වූ ලිඛිත දැන්වීමක් කරනු ලැබුවහොත්, (1) වන උපවගන්තිය යටතේ වූ ඒකමතික යෝජනා සම්මතයක් බලාත්මකව පැවතීම අවසන් විය යුතු ය.

**31**. (1) සමාගම විසින් ගන්නා ලද හෝ ගැනීමට තිබෙන යම් ක්‍රියාවකට පෞද්ගලික සමාගමක සියලු ම කොටස්හිමියන් ලිඛිතව එකඟවන අවස්ථාවක,— කොටස්හිමියන් විසින් දක්වනු ලබන ඒකමතික එකඟත්වය.

(අ) සමාගමේ ව්‍යවස්ථාවලියේ පටහැනිව යම් විධිවිධානයක් තිබුන ද, ඒ ක්‍රියාව සිදු කිරීමට සමාගම විසින් වලංගු ලෙස බලය දී ඇති ලෙස සලකනු ලැබිය යුතු ය ; තව ද

(ආ) මෙහි වූ දෙවන උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් මේ පනතේ වගන්ති ලැයිස්තුවේ අන්තර්ගත විධිවිධාන, ඒ ක්‍රියාවට හා ඒ ක්‍රියාව සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ එකඟ විය හැකි කාරණා සම්බන්ධයෙන් සීමා කිරීමක් නොමැතිව, පෞද්ගලික සමාගමක සියලු ම කොටස් හිමියන්—

(අ) සමාගම විසින් කොටස් නිකුත් කිරීම ;

(ආ) සමාගම විසින් විභජනයක් කිරීම ;

(ඇ) සමාගමේ කොටස් නැවත මිලට ගැනීම හෝ නිදහස් කර ගැනීම ;

(ඈ) සමාගමේ කොටස් මිලට ගැනීමේ කාර්යය සඳහා හෝ ඒ සම්බන්ධයෙන් සමාගමක් විසින් මූල්‍ය ආධාර දීම ;

(ඉ) අධ්‍යක්ෂවරයකුට පාරිශ්‍රමික ගෙවීම හෝ අධ්‍යක්ෂවරයකුට ණය මුදලක් දීම හෝ අධ්‍යක්ෂවරයකුට වෙනත් යම් ප්‍රතිලාභයක් ප්‍රදානය කිරීම ; හෝ

(ඊ) සම්බන්ධතාවක් ඇති අධ්‍යක්ෂවරයකු සහ සමාගම අතර ගිවිසුමකට ඇතුළත්වීම,

පිණිස එකඟවන්නා වූ හෝ සහානුමතිය ප්‍රකාශ කරන්නා වූ අවස්ථාවක, ඒ උපවගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ සමාගමක් විසින් විභජනය කරනු ලැබූ සහ ඒ විභජනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් නුබුන්වත් භාවය පිළිබඳ පරීක්ෂණය ඉටු කිරීමට සමාගම අසමත් වන අවස්ථාවක, ඒ විභජනය වලංගු ආකාරයෙන් කර ඇති ලෙස සලකනු නො ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ වලංගු ලෙස නොකරන ලද්දේ යයි සලකනු ලබන කොටස්හිමියකු වෙත කරන ලද විභජනයක්,—

(අ) කොටස්හිමියා විසින් ඒ විභජනය ලබාගෙන ඇත්තේ සද්භාවයෙන් සහ නුබුන්වත් භාවය පිළිබඳ පරීක්ෂණය ඉටුකිරීමට සමාගමේ අසමත් භාවය පිළිබඳ දැනුමක් නොමැතිව නම් මිස ;

(ආ) ඒ විභජනයේ වලංගුභාවය මත විශ්වාසය තබා කොටස්හිමියා විසින් තම තත්ත්වය වෙනස් කර ඇත්නම් මිස ; සහ

(ඇ) අවස්ථාගත කරුණු හේතු කොටගෙන, සම්පූර්ණයෙන් ආපසු ගෙවීමට හෝ කිසියම් මුදලක් ගෙවීමට නියම කිරීම අසාධාරණ වන්නේ නම් මිස,

ඒ කොටස්හිමියාගෙන් සමාගම විසින් අය කර ගනු ලැබිය හැකි ය.

(5) වලංගු ලෙස නොකරන ලද්දේ යයි සලකනු ලබන විභජනයක් කිරීමෙන් පසු, නුබුන්වත් භාවය පිළිබඳ පරීක්ෂණය ඉටු කිරීමට සමාගම සමත්වන්නේ යයි විශ්වාස කිරීම සඳහා සාධාරණ හේතු නොපැවතුනු අවස්ථාවක, ඒ විභජනය කරන ලද්දේ යම් කොටස්හිමියන්ට ද, ඒ කොටස්හිමියන්ගෙන් අයකර ගැනීමට සමාගමට නොහැකි වන විභජනයේ යම් ප්‍රමාණයක් සමාගමට ආපසු ගෙවීමට, ඒ විභජනය කිරීමට එකඟ වූ එක් එක් කොටස්හිමියා සමාගමට පුද්ගලිකව ම වගකීමට යටත් විය යුතු ය.

(6) (4) වන හෝ (5) වන උපවගන්තිය යටතේ කොටස්හිමියකුට විරුද්ධව මුදල් අය කර ගැනීම සඳහා නඩුවක් පවරා ඇති සහ වඩා අඩු ප්‍රමාණයක විභජනයක් කිරීම මගින් නුබුන්වත්භාවය පිළිබඳ පරීක්ෂණය ඉටු කිරීමට සමාගම සමත්වන බවට අධිකරණය සෑහීමට පත්වන අවස්ථාවක, අවස්ථාගත කරුණු යටතේ සමාගමට නියම වශයෙන් කළ හැකිව තිබුණු යම් විභජනයක වටිනාකමට සමාන මුදලක් අධිකරණය විසින්—

(අ) කොටස්හිමියාට රඳවා ගැනීමට අවසර දිය හැකි ය ; නැතහොත්

(ආ) ඒ මුදල සම්බන්ධයෙන් කොටස්හිමියා වගකීමෙන් මුදාහැරිය හැකි ය.

## III වන කොටස

## ඇපයෙන් සීමිත සමාගම්

ඇපයෙන් සීමිත සමාගමක් සංස්ථාගත කිරීම සඳහා වූ ඉල්ලීම.

**32**. ඇපයෙන් සීමිත සමාගමක් පිහිටුවීම පිණිස, එහි එක් එක් ආරම්භක සාමාජිකයකු විසින් අත්සන් කරන ලද නියමිත ආකෘතියෙහි වූ ඉල්ලීමක්, පහත දැක්වෙන ලේඛන ද සමග කවර හෝ තැනැත්තන් දෙදෙනකු හෝ ඊට වැඩි තැනැත්තන් ගණනක් විසින් රෙජිස්ට්‍රාර්වරයා වෙත කරනු ලැබිය හැකි ය :—

(අ) සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය ;

(ආ) සමාගමේ අධ්‍යක්ෂවරයකු ලෙස ක්‍රියා කිරීමට එක් එක් ආරම්භක අධ්‍යක්ෂවරයකු විසින් 203 වන වගන්තිය යටතේ දෙනු ලබන කැමැත්ත ; සහ

(ඇ) සමාගමේ ලේකම්වරයා ලෙස ක්‍රියා කිරීමට ආරම්භක ලේකම්වරයා විසින් 221 වන වගන්තිය යටතේ දෙනු ලබන කැමැත්ත.

ඇපයෙන් සීමිත සමාගමකට ව්‍යවස්ථාවලියක් තිබිය යුතු බව.

**33**. (1) ඇපයෙන් සීමිත සමාගමකට—

(අ) සමාගමේ පරමාර්ථ ; සහ

(ආ) ඒ සමාගම ඈවර කිරීමට භාජනය කරනු ලබන අවස්ථාවක් වේ නම් එවිට, සමාගමේ එක් එක් සාමාජිකයා විසින් සමාගමේ වත්කම්වලට දායක වීමට භාර ගනු ලබන මුදල් ප්‍රමාණය,

දැක්වෙන ව්‍යවස්ථාවලියක් තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් කිසිවකින්, ඇපයෙන් සීමිත සමාගමක් විසින් මෙහි වූ පළමුවන උපලේඛනයේ දක්වා ඇති සාංගමික ව්‍යවස්ථාවලියෙහි ඇතුළත් නිශ්චිත වගන්ති ඒ සමාගමට අදාළ විය යුතු බවට එහි ව්‍යවස්ථාවලියෙහි විධිවිධාන සැලැස්වීමෙන් වළක්වනු නොලැබිය යුතු අතර, ඒ විධිවිධාන ඒ අනුව බලාත්මක විය යුතු ය.

පුණ්‍ය සමාගම්වල සහ වෙනත් සමාගම්වල නමෙහි වූ "සීමාසහිත" යන වචනය අත්හැරීමේ බලය.

**34**. (1) ඇපයෙන් සීමිත සමාගමක් ලෙස පිහිටුවනු ලැබීමට ආසන්නව ඇති සංගමයක් වාණිජ්‍යය, කලාව, විද්‍යාව, ආගම, පුණ්‍ය කටයුතු, ක්‍රීඩා හෝ වෙනත් යම් ප්‍රයෝජනවත් පරමාර්ථයක් ප්‍රවර්ධනය සඳහා පිහිටුවනු ලබන බවටත්, සමාගමේ ලාභ කිසිවක් වේ නම් ඒ ලාභ හෝ වෙනත් ආදායම් එහි පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමෙහි ලා යෙදවීමට ද එහි සාමාජිකයන්ට යම් ලාභාංශයක් ගෙවීම තහනම් කිරීමට ද ඒ සංගමය අදහස් කරන බවටත් රෙජිස්ට්‍රාර්වරයා සෑහීමට පත් වන අවස්ථාවක,—

(අ) සංගමය එහි නමට "සීමාසහිත" යන වචනය එකතු නොකර ඇපයෙන් සීමිත සමාගමක් ලෙස ලියාපදිංචි කරනු ලැබිය හැකි යයි රෙජිස්ට්‍රාර්වරයා විසින් බලපත්‍රයක් මගින් විධාන කරනු ලැබිය හැකි ය ; තව ද

(ආ) ඒ සංගමය ඒ අනුව ලියාපදිංචි කරනු ලැබිය හැකි අතර, එසේ ලියාපදිංචි කරනු ලැබූ විට, සියලු වරප්‍රසාද බුක්ති විඳිය යුතු ය ; තව ද මේ වගන්තියේ විධිවිධානවලට යටත්ව, ඒ සමාගම සීමාසහිත සමාගමක සියලු බැඳීම්වලට ද යටත් විය යුතු ය.

(2) (අ) ඇපයෙන් සීමිත සමාගමක පරමාර්ථ (1) වන උපවගන්තියෙහි නිශ්චිතව සඳහන් පරමාර්ථවලට සහ ඒවාට ආනුෂංගික හෝ හිතකර වූ පරමාර්ථවලට සීමාකර ඇති බවට ; සහ

(ආ) සමාගමේ ව්‍යවස්ථාවලියෙන් සමාගමේ ලාභ හෝ වෙනත් ආදායම් එහි පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමෙහි ලා යෙදවීමට නියම කර ඇති බවට සහ එහි සාමාජිකයන්ට යම් ලාභාංශයක් ගෙවීම තහනම් කර ඇති බවට,

රෙජිස්ට්‍රාර්වරයා සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලැබූ අවස්ථාවක, රෙජිස්ට්‍රාර්වරයා විසින්, "සීමාසහිත" යන වචනය ඇතුළත් කොට හෝ ඒ වචනය ඉවත් කොට, එහි නම, විශේෂ යෝජනා සම්මතයක් මගින් වෙනස් කිරීම සඳහා බලපත්‍රයක් මගින් සමාගමට බලය දිය හැකි ය. මේ වගන්තිය යටතේ නම වෙනස් කිරීමකට 8 වන වගන්තියේ (2) වන, (3) වන, (4) වන හා (5) වන උපවගන්තිවල විධිවිධාන අදාළ විය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ ප්‍රදානය කරනු ලැබූ බලපත්‍රයක්, සංගමය විසින් (1) වන උපවගන්තියේ නියමයක් අනුව ක්‍රියා කර ඇති බවට

සහතිකවීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි රෙජිස්ට්‍රාර්වරයා කල්පනා කරන යම් නියමවලට හා කොන්දේසිවලට යටත් විය හැකි ය. සංගමය ඒ නියමවලින් හා කොන්දේසිවලින් බැඳී සිටිය යුතු අතර, ඒ නියම හා කොන්දේසි සමාගමේ ව්‍යවස්ථාවලියෙහි ඇතුළත් කරන ලෙස රෙජිස්ට්‍රාර්වරයා විසින් විධාන කරනු ලබන්නේ නම්, එසේ ඇතුළත් කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ බලපත්‍රයක් ප්‍රදානය කරනු ලැබ ඇති සමාගමක ව්‍යවස්ථාවලියෙහි වෙනස් කිරීම් කිසිවක් රෙජිස්ට්‍රාර්වරයාගේ පූර්ව ලිඛිත අනුමතය නොමැතිව කරනු නොලැබිය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ බලපත්‍රයක් ප්‍රදානය කරනු ලැබූ සමාගමක් සම්බන්ධයෙන් 6 වන වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(6) මේ වගන්තියේ විධිවිධාන යටතේ ප්‍රදානය කරන ලද බලපත්‍රයක්, ඒ බලපත්‍රය ප්‍රදානය කරනු ලැබූ සමාගම (1) වන උපවගන්තියේ හෝ (3) වන උපවගන්තියේ නියමයන් අනුව ක්‍රියා කිරීම පැහැර හරින අවස්ථාවක, රෙජිස්ට්‍රාර්වරයා විසින් කවර හෝ අවස්ථාවක ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි ය. බලපත්‍රයක් එසේ ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ විට, රෙජිස්ට්‍රාර්වරයා විසින් බලපත්‍රය ප්‍රදානය කරනු ලැබූ සමාගමේ නමට මුලින් "සීමාසහිත" යන වචනය රෙජිස්ටරයෙහි ඇතුළත් කරනු ලැබිය යුතු අතර, එවිට මේ වගන්තියේ විධිවිධාන මගින් ප්‍රදානය කරන ලද නිදහස් කිරීම් සහ වරප්‍රසාද සමාගම විසින් බුක්ති විඳීම අවසන් විය යුතු ය. මේ උපවගන්තිය යටතේ වූ නම වෙනස් කිරීමකට, 8 වන වගන්තියේ (3) වන හා (4) වන උපවගන්තිවල විධිවිධාන අදාළ විය යුතු ය.

(7) (6) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීමට පෙර, රෙජිස්ට්‍රාර්වරයා විසින් තම අදහස පිළිබඳව සමාගම වෙත ලියවිල්ලකින් දැනුම් දීමක් කළ යුතු අතර, ප්‍රත්‍යාදිෂ්ට කිරීමට විරුද්ධව කරුණු දැක්වීමේ අවස්ථාවක් සංගමයට හෝ සමාගමට ලබා දිය යුතු ය.

(8) මේ වගන්තිය යටතේ වූ බලපත්‍රයක් වලංගුව පවත්නේ යම් සංගමයක් සම්බන්ධයෙන් ද, ඒ සංගමය විසින් එහි පරමාර්ථ සම්බන්ධයෙන් එහි ව්‍යවස්ථාවෙහි ඇති විධිවිධාන වෙනස් කරනු ලබන අවස්ථාවක, රෙජිස්ට්‍රාර්වරයා විසින් බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ට කිරීම සුදුසු යයි ඔහුට පෙනී ගියහොත් මිස, ඒ බලපත්‍රය ප්‍රදානය කරනු ලැබුවේ යම් නියමවලට හා කොන්දේසිවලට යටත්ව ද ඒ නියම හා කොන්දේසි සුළු වශයෙන් වෙනස් කිරීම, ඒ නියමවලට හා කොන්දේසිවලට යමක් එකතු කිරීම හෝ ඒවා වෙනස් කිරීම කරනු ලැබිය හැකි ය.

ඇපයෙන් සීමිත සමාගම්වලට අදාළවන විධිවිධාන.

**35**. (1) මෙහි තුන්වන උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් මේ පනතේ වගන්ති ලැයිස්තුවේ ඇතුළත් විධිවිධාන ඇපයෙන් සීමිත සමාගමකට හා ඒ සම්බන්ධයෙන් හෝ අදාළ නොවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් වගන්තිවල විධිවිධාන හැර, මේ පනතේ විධිවිධාන, අවශ්‍ය සුළු වශයෙන් කරන ලද සියලු වෙනස් කිරීම් සහිතව, ඇපයෙන් සීමිත සමාගමකට,—

(අ) ඒ සමාගම සීමාසහිත සමාගමක් වූවාක් මෙන් ;

(ආ) කොටස්හිමියන් සම්බන්ධයෙන් කරන ලද සඳහන් කිරීමක් ඒ සමාගමේ සාමාජිකයන් සම්බන්ධයෙන් කරන ලද සඳහන් කිරීමක් වූවාක් මෙන් ;

(ඇ) එක් එක් සාමාජිකයා විසින්, සමාගමේ එක් කොටසක් දරනු ලැබුවාක් මෙන් ; සහ

(ඈ) කොටස් රෙජිස්ටරය සම්බන්ධයෙන් කරන ලද සඳහන් කිරීමක්, සාමාජික රෙජිස්ටරය සම්බන්ධයෙන් කරන ලද සඳහන් කිරීමක් වූවාක් මෙන්,

අදාළ විය යුතු ය.

## IV වන කොටස

## කොටස් සහ ඍණ පත්‍ර

### සංස්ථා ප්‍රකාශය

සංස්ථා ප්‍රකාශයට දිනය යෙදීම.

**36**. සමාගමක් විසින් හෝ වෙනුවෙන් නැතහොත් පිහිටුවීමට යන සමාගමකට අදාළව හෝ නිකුත් කරනු ලැබූ සංස්ථා ප්‍රකාශයක දිනයක් යොදනු ලැබිය යුතු අතර, පටහැනි තත්ත්වය ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඒ දිනය ඒ සංස්ථා ප්‍රකාශය පළ කරන ලද දිනය වශයෙන් සලකනු ලැබිය යුතු ය.

සංස්ථා ප්‍රකාශයේ විස්තර පිළිබඳ නිශ්චිතව සඳහන් නියමයන්.

**37**. (1) සමාගමක් විසින් හෝ වෙනුවෙන් හෝ සමාගම පිහිටුවීමේ යෙදී සිටින හෝ එහි ලා සම්බන්ධතාවක් දක්වන නැතහොත් සමාගමක් පිහිටුවීමේ යෙදී සිටි හෝ එහි ලා සම්බන්ධතාවක් දැක් වූ යම් තැනැත්තකු විසින් හෝ වෙනුවෙන් නිකුත් කරනු ලැබූ සෑම සංස්ථා ප්‍රකාශයක ම, මෙහි හතරවන උපලේඛනයේ

I වන කොටසේ නිශ්චිතව සඳහන් තොරතුරු ඇතුළත් විය යුතු අතර, ඒ උපලේඛනයේ II වන කොටසේ නිශ්චිතව සඳහන් වාර්තා ද ඒ සංස්ථා ප්‍රකාශයෙහි දක්වනු ලැබිය යුතු ය. ඒ උපලේඛනයේ III වන කොටසේ ඇතුළත් විධිවිධානවලට යටත්ව I වන හා II වන කොටස්වල අඩංගු විධිවිධාන බලපැවැත්විය යුතු ය.

(2) සමාගමක කොටස් හෝ සෑණ පත්‍ර සඳහා වූ ඉල්ලුම්කරුවකුට මේ වගන්තියේ යම් නියමයකට අනුකූලව ක්‍රියා කිරීම අත් හරින ලෙස නියම කෙරෙන හෝ ඒ සඳහා බැඳීමක් ඇති කෙරෙන කොන්දේසියක් හෝ සංස්ථා ප්‍රකාශයේ නිශ්චිතව සඳහන් කර නොමැති යම් ගිවිසුමක්, ලේඛනයක් හෝ කාරණයක් පිළිබඳ දැන්වීමක් ඔහු වෙත බලපාන ලෙස උද්දේශිත කොන්දේසියක්, ශූන්‍ය විය යුතු ය.

(3) සමාගමක කොටස් හෝ සෑණ පත්‍ර සඳහා වන යම් ඉල්ලුම් පත්‍ර ආකෘතියක් නිකුත් කිරීම එම ආකෘතිය මේ වගන්තියේ නියමයන්ට අනුකූල වූ සංස්ථා ප්‍රකාශයක් ද සමග නිකුත් කරනු ලබන්නේ නම් මිස, නීත්‍යානුකූල නොවිය යුතු ය :

එසේ වුව ද, ඉල්ලුම්පත්‍ර ආකෘතිය—

(අ) කොටස් හෝ සෑණ පත්‍ර පිළිබඳ ප්‍රාරක්ෂණ එකඟවීමකට ඇතුළත් වන ලෙස තැනැත්තකුට කරනු ලබන නිර්ව්‍යාජ ආරාධනයක් සම්බන්ධයෙන් ; හෝ

(ආ) මහජනයාට අර්පණය කරනු නොලැබූ කොටස් හෝ සෑණ පත්‍ර සම්බන්ධයෙන් ;

(ඇ) මහජනයාට අර්පණය කරනු ලැබූ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ ලැයිස්තුගත කරනු ලැබූ සමාගමක් වාරික පත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන්,

නිකුත් කරනු ලැබූ බව ඔප්පු කරනු ලැබූ අවස්ථාවක, මේ උපවගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(4) (1) වන හා (2) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, (3) වන උපවගන්තියේ විධිවිධාන කඩ කරමින් ක්‍රියා කරන යම් තැනැත්තකු වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ දෙකක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

(5) මේ වගන්තියේ නියමයන් කිසිවකට අනුකූලව ක්‍රියා කරනු නොලැබූ හෝ ඒ කිසිවක් කඩ කරනු ලැබූ විටක, සංස්ථා ප්‍රකාශය නිකුත් කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු අධ්‍යක්ෂවරයකු හෝ වෙනත් තැනැත්තකු :—

(අ) එළදරව් කරනු නොලැබූ යම් කාරණයක් සම්බන්ධයෙන් වන විට ඒ කාරණය තමා දැන නොසිටි බව ඔප්පු කළහොත් ; හෝ

(ආ) අවංකව ම තමා කරුණු වරදවා තේරුම් ගැනීම නිසා එසේ අනුකූලව ක්‍රියා නොකිරීම හෝ කඩ කිරීම සිදු වූ බව ඔහු ඔප්පු කළහොත් ; හෝ

(ඇ) එසේ අනුකූලව ක්‍රියා නොකිරීම හෝ කඩ කිරීම අධිකරණයේ මතය අනුව නොවැදගත් යම් කාරණයක් සම්බන්ධයෙන් නම්, හෝ සිද්ධියට අදාළ සියලු අස්ථානුගත කරුණු සැලකිල්ලට ගනු ලැබූ විට එසේ අනුකූලව ක්‍රියා නොකිරීම හෝ කඩ කිරීම අන්‍යාකාරයෙන් කෙබඳු වී ද යත්, ඒ අනුකූලව ක්‍රියා නොකිරීම පිළිබඳව හෝ කඩ කිරීම පිළිබඳව යුක්ති සහගතව සමාව දිය යුතු නම්,

එසේ අනුකූලව ක්‍රියා නොකිරීම හෝ කඩ කිරීම හේතුකොට ගෙන ඒ අධ්‍යක්ෂවරු හෝ වෙනත් තැනැත්තා විසින් යම් වගකීමක් දරනු නොලැබිය යුතු ය :

එසේ වුව ද, මෙහි වූ හතරවන උපලේඛනයේ 17 වන ඡේදයෙහි සඳහන් කාරණා සම්බන්ධයෙන් ප්‍රකාශයක්, සංස්ථා ප්‍රකාශයෙහි ඇතුළත් කිරීම පැහැර හරිනු ලැබූ විටක, එළිදරව් කරනු නොලැබූ කරුණු පිළිබඳව ඔහු දැන සිටි බව ඔප්පු කළහොත් මිස, ඒ පැහැර හැරීම සම්බන්ධයෙන් කිසිම අධ්‍යක්ෂවරයකු හෝ වෙනත් තැනැත්තකු විසින් යම් වගකීමක් දරනු නොලැබිය යුතු ය.

(6) වෙනත් තැනැත්තන්ගේ වාසියට අත්හැරීමේ අයිතිවාසිකම කොටස් හෝ සෘණ පත්‍ර සඳහා වූ ඉල්ලුම්කරුවකු සතුව තිබුණ ද නොතිබුණ ද, සමාගමක සිටින සාමාජිකයන් හෝ සෘණ පත්‍ර දරන්නන් වෙත සංස්ථා ප්‍රකාශයක් හෝ සමාගමේ කොටස්වලට හෝ සෘණ පත්‍රවලට අදාළ වූ ඉල්ලුම්පත්‍ර ආකෘතියක් නිකුත් කිරීම සම්බන්ධයෙන් මේ වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය. එහෙත්, ඉහත කී පරිදි හැර, සමාගමක් පිහිටුවීමේ දී හෝ පිහිටුවීම සම්බන්ධයෙන් හෝ නිකුත් කරනු ලැබුව ද, පසුව නිකුත් කරනු ලැබුව ද, සංස්ථා ප්‍රකාශයකට හෝ ඉල්ලුම්පත්‍රවල ආකෘතියකට මේ වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

(7) යම් ලිඛිත නීතියක් යටතේ හෝ (මේ වගන්තිය හැර) මේ පනත යටතේ යම් තැනැත්තකු විසින් දරනු ලැබිය හැකි යම් බැඳීමක්, මේ වගන්තියේ ඇතුළත් කිසිවකින් සීමා කිරීම හෝ අඩු කිරීම හෝ නොවිය යුතු ය.

(8) 40 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ලියාපදිංචි කිරීම සඳහා සංස්ථා ප්‍රකාශයක් යවනු ලැබ, එය රෙජිස්ට්‍රාර්වරයා විසින්

ලියාපදිංචි කර ඇති අවස්ථාවක, එම සංස්ථා ප්‍රකාශය ලියාපදිංචි කර ඇති හා නිකුත් කර ඇති බව සහ එහි පිටපත් ඉල්ලුම් කිරීමෙන් ලබාගත හැකි බව සඳහන් කෙරෙන යම් දැන්වීමක, චක්‍රලේඛයක හෝ ප්‍රචාරක දැන්වීමක, සමාගමක යම් කොටස් හෝ ඍණ පත්‍ර සඳහා සහභාගිවීමට හෝ ඒවා මිල දී ගැනීමට මහජනයාට යම් ආරාධනයක් අඩංගුව නොමැති නම්, ඒ දැන්වීම, චක්‍රලේඛය හෝ ප්‍රචාරක දැන්වීම නිකුත් කිරීම හෝ පළ කිරීම මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන කිසිවකින් වළක්වන්නේ යයි සලකනු නොලැබිය යුතු ය ; නැතහොත් එලෙස තේරුම් ගනු නොලැබිය යුතු ය.

විශේෂඥයකුගේ ප්‍රකාශයක් ඇතුළත් සංස්ථා ප්‍රකාශයක් නිකුත් කිරීමට ඔහුගේ කැමැත්ත අවශ්‍ය බව.

**38**. (1) සමාගමක කොටස් හෝ ඍණ පත්‍ර සඳහා සහභාගිවීමට තැනැත්තන්ට ආරාධනා කෙරෙන සහ විශේෂඥයකු විසින් කරනු ලැබුවේ යයි උද්දේශිත ප්‍රකාශයක් ඇතුළත් සංස්ථා ප්‍රකාශයක් :—

(අ) ප්‍රකාශය ද ඇතුළත්ව සහ එය ඇතුළත් කොට තිබෙන ආකෘතියෙන් හා සන්දර්භයෙන් යුතුව, එකී සංස්ථා ප්‍රකාශය නිකුත් කිරීම සඳහා ඒ විශේෂඥයාගේ ලිඛිත කැමැත්ත දී තිබේ නම් සහ ලියාපදිංචි කිරීම සඳහා සංස්ථා ප්‍රකාශයේ පිටපතක් භාර දීමට පෙර ඔහු තම ලිඛිත කැමැත්ත අස්කර ගෙන නොමැති නම් මිස ; සහ

(ආ) (අ) ඡේදයෙහි සඳහන් පරිදි ඒ විශේෂඥයාගේ කැමැත්ත දී ඇති බව සහ එය ඉල්ලා අස්කර ගෙන නොමැති බව සඳශන් වන ප්‍රකාශයක් සංස්ථා ප්‍රකාශයෙහි ඇතුළත් වන්නේ නම් මිස,

නිකුත් කරනු නොලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ විධිවිධාන කඩ කරමින් යම් සංස්ථා ප්‍රකාශයක් නිකුත් කරනු ලැබූ අවස්ථාවක, සමාගම සහ එය නිකුත් කිරීමෙහි ලා දැන දැනම පාර්ශ්වකරුවකු වන සෑම තැනැත්තකු ම වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ දෙකක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්යය සඳහා "විශේෂඥයා" යන වචනයට ඉංජිනේරුවරයකු, තක්සේරුකරුවකු, විගණකවරයකු, ගණකාධිකාරීවරයකු සහ සමාන වෘත්තීය සුදුසුකම් ඇති වෙනත් යම් තැනැත්තකු ද ඇතුළත් වේ.

සංස්ථා ප්‍රකාශයෙහි නම ඇතුළත් කිරීම සඳහා බැංකුවේ හෝ නීතිඥවරයකුගේ හෝ විගණකවරයකුගේ හෝ කැමැත්ත අවශ්‍ය බව.

**39**. (1) යම් බැංකුවක්, යම් සමාගමක බැංකුකරුවන් ලෙස, ඒ සමාගමේ කොටස් සඳහා හෝ සෘණ පත්‍ර සඳහා හෝ සහභාගි වීමට තැනැත්තන්ට ආරාධනය කෙරෙන යම් සංස්ථා ප්‍රකාශයක එහි නම ඇතුළත් කිරීම සඳහා ඒ බැංකුව විසින් ලිඛිත කැමැත්ත දී තිබේ නම් මිස සහ ලියාපදිංචි කිරීම සඳහා ඒ සංස්ථා ප්‍රකාශයෙහි පිටපතක් භාර දීමට පෙර ඒ බැංකුව විසින් ඒ කැමැත්ත අස්කර ගෙන නොමැති නම් මිස, ඒ සමාගමේ බැංකුකරුවන් වශයෙන් ඒ බැංකුව සංස්ථා ප්‍රකාශයෙහි නම් කරනු නොලැබිය යුතු ය :

එසේ වුව ද, බැංකුවක් විසින් සමාගමේ බැංකුකරුවන් වශයෙන් එහි නම සංස්ථා ප්‍රකාශයක ඇතුළත් කිරීම සඳහා කැමැත්ත දී තිබීමේ හේතුව නිසාම පමණක්, මේ පනතේ කාර්ය සඳහා සංස්ථා ප්‍රකාශයක් නිකුත් කිරීමට බැංකුව විසින් බලය දී ඇති ලෙස සලකනු නොලැබිය යුතු ය.

(2) යම් නීතිඥවරයකු යම් සමාගමක නීතිඥවරයා ලෙස, ඒ සමාගමේ කොටස් සඳහා හෝ සෘණ පත්‍ර සඳහා හෝ සහභාගිවීමට තැනැත්තන්ට ආරාධනය කෙරෙන යම් සංස්ථා ප්‍රකාශයක තම නම ඇතුළත් කිරීම සඳහා ඒ නීතිඥවරයා විසින් ලිඛිත කැමැත්ත දී තිබේ නම් මිස සහ ලියාපදිංචි කිරීම සඳහා ඒ සංස්ථා ප්‍රකාශයෙහි පිටපතක් භාර දීමට පෙර, ඒ නීතිඥවරයා විසින් ඒ කැමැත්ත අස්කර ගෙන නොමැති නම් මිස, ඒ සමාගමේ නීතිඥවරයා වශයෙන් ඒ නීතිඥවරයා සංස්ථා ප්‍රකාශයෙහි නම් කරනු නොලැබිය යුතු ය :

එසේ වුව ද නීතිඥවරයකු විසින් සමාගමේ නීතිඥවරයා වශයෙන් ඔහුගේ නම සංස්ථා ප්‍රකාශයක ඇතුළත් කිරීම සඳහා කැමැත්ත දී තිබීමේ හේතුව නිසාම පමණක්, මේ පනතේ කාර්ය සඳහා සංස්ථා ප්‍රකාශය නිකුත් කිරීමට ඒ නීතිඥවරයා විසින් බලය දී ඇති ලෙස සලකනු නොලැබිය යුතු ය.

(3) යම් විගණකවරයකු යම් සමාගමක විගණකවරයා ලෙස, සමාගමේ කොටස් සඳහා හෝ සෘණ පත්‍ර සඳහා හෝ සහභාගිවීමට තැනැත්තන්ට ආරාධනය කෙරෙන යම් සංස්ථා ප්‍රකාශයක තම නම ඇතුළත් කිරීම සඳහා ඒ විගණකවරයා විසින් ලිඛිත කැමැත්ත දී තිබේ නම් මිස සහ ලියාපදිංචි කිරීම සඳහා ඒ සංස්ථා ප්‍රකාශයෙහි පිටපතක් භාරදීමට පෙර, ඒ විගණකවරයා විසින් ඒ කැමැත්ත අස්කර ගෙන නොමැති නම් මිස, සමාගමේ විගණකවරයා වශයෙන් ඒ විගණකවරයා සංස්ථා ප්‍රකාශයෙහි නම් කරනු නොලැබිය යුතු ය :

එසේ වුව ද, විගණකවරයකු විසින් සමාගමේ විගණකවරයා වශයෙන් ඔහුගේ නම සංස්ථා ප්‍රකාශයක ඇතුළත් කිරීම සඳහා කැමැත්ත දී තිබීමේ හේතුව නිසාම පමණක්, මේ පනතේ කාර්ය සඳහා සංස්ථා ප්‍රකාශය නිකුත් කිරීමට ඒ විගණකවරයා විසින් බලය දී ඇති ලෙස සලකනු නොලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ විධිවිධාන කඩ කරමින් සමාගමක යම් සංස්ථා ප්‍රකාශයක කිසියම් බැංකුවක, නීතිඥවරයකුගේ හෝ විගණකවරයකුගේ නම ඇතුළත් කරනු ලැබ ඇති අවස්ථාවක, සමාගම සහ එය නිකුත් කිරීමට දැන දැනම පාර්ශ්වකරුවකු වන සෑම තැනැත්තකු ම වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ දෙකක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

සංස්ථා ප්‍රකාශය ලියාපදිංචි කිරීම.

**40.** (1) සමාගමක් විසින් හෝ වෙනුවෙන් නැතහොත් පිහිටුවීමට යන සමාගමකට අදාළව හෝ සංස්ථා ප්‍රකාශයක් නිකුත් කිරීම, එය පළ කරන ලද දින හෝ එදිනට පෙර සමාගමේ අධ්‍යක්ෂවරයකු ලෙස හෝ යෝජිත අධ්‍යක්ෂවරයකු ලෙස ඒ සංස්ථා ප්‍රකාශයෙහි නම් සඳහන් සෑම තැනැත්තකු ම විසින් හෝ ඒ අධ්‍යක්ෂවරයා විසින් ලියවිල්ලකින් බලය දෙන ලද ඔහුගේ අනුයෝජිතයකු විසින් හෝ අත්සන් තබා—

(අ) 38 වන වගන්තියෙන් නියම කර ඇති පරිදි සංස්ථා ප්‍රකාශය නිකුත් කිරීමට විශේෂඥයකුගෙන් ලබාගත් ලිඛිත කැමැත්ත ;

(ආ) සංස්ථා ප්‍රකාශයක් නිකුත් කිරීමට අදාළව මේ පනතේ විධිවිධාන තමා කියවා ඇති බවට සහ ඒ විධිවිධානවලට අනුකූලව තමා ක්‍රියා කර ඇති බවට සමාගමේ අධ්‍යක්ෂවරයකු වශයෙන් හෝ යෝජිත අධ්‍යක්ෂවරයකු වශයෙන් සංස්ථා ප්‍රකාශයේ නම් කර ඇති සෑම තැනැත්තකු ම විසින් කරනු ලැබ සහ අත්සන් කරනු ලැබූ ප්‍රකාශයක් ; සහ

(ඇ) පොදුවේ නිකුත් කරනු ලැබූ සංස්ථා ප්‍රකාශයක් සම්බන්ධයෙන් වූ විට, මෙහි හතරවන උපලේඛනයේ II වන කොටසින් නියමිත යම් වාර්තාවක් කරන තැනැත්තන් විසින්, ඒ උපලේඛනයේ 30 වන ඡේදයේ සඳහන් කර ඇති ආකාරයට යම් යථාවත් කිරීම් සිදු කර ඇති හෝ හේතු නොදක්වා ම එහි දක්වා ඇති අවස්ථාවක, එම යථාවත් කිරීම් සහ ඊට හේතු දක්වන්නා වූ ද, ඒ තැනැත්තන් විසින් අත්සන් කරනු ලැබුවා වූ ද, ලිඛිත ප්‍රකාශයක්,

පිටසන් කොට හෝ යා කර, ඒ සංස්ථා ප්‍රකාශයේ පිටපතක් ලියාපදිංචි කිරීම සඳහා රෙජිස්ට්‍රාර්වරයා වෙත භාර දී ඇත්නම් මිස, නොකළ යුතු ය.

(2) සෑම සංස්ථා ප්‍රකාශයක ම මුහුණතෙහි—

(අ) මේ වගන්තියෙන් නියම කර ඇති පරිදි ලියාපදිංචි කිරීම සඳහා එහි පිටපතක් භාර දී ඇති බව සඳහන් වී තිබිය යුතු ය ; තව ද

(ආ) එසේ භාර දෙනු ලැබූ පිටපතෙහි පිටසන් කරනු ලැබීමට හෝ ඊට යා කරනු ලැබීමට මේ වගන්තියෙන් නියම කර ඇති යම් ලේඛන පිළිබඳව නිශ්චය ලෙස දක්වා ඇත්තා වූ ද සංස්ථා ප්‍රකාශයේ ඇතුළත් කර තිබෙන්නා වූ ද, ප්‍රකාශ පිළිබඳව සඳහන් වී තිබිය යුතු ය ; නැතහොත් ඒ පිළිබඳව යොමු කරනු ලැබ තිබිය යුතු ය.

(3) රෙජිස්ට්‍රාර්වරයා විසින් සංස්ථා ප්‍රකාශයක්—

(අ) ඒ සංස්ථා ප්‍රකාශයේ පිටසන මේ වගන්තියෙන් නියම කර ඇති පරිදි, අත්සන් කර තිබේ නම් මිස ; සහ

(ආ) ඉහත කී පරිදි නිශ්චය ලෙස දක්වනු ලැබූ ලේඛන (කිසිවක් වේ නම්) ඒ ලේඛන ඒ සංස්ථා ප්‍රකාශයෙහි පිටසන් කර හෝ ඊට යා කර තිබේ නම් මිස ; සහ

(ඇ) මේ වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයාට ඒ සංස්ථා ප්‍රකාශයේ පිටපතක් භාර දුන් දිනය එහි සඳහන්ව තිබේ නම් හෝ 36 වන වගන්තියේ විධිවිධාන යටතේ ඒ සංස්ථා ප්‍රකාශයේ ඇතුළත් කරනු ලැබිය යුතු මතු දිනයක් එහි සඳහන්ව තිබේ නම් මිස ; සහ

(ඈ) මෙහි මින් පෙර විධිවිධාන සලසා ඇති පරිදි ඒ සංස්ථා ප්‍රකාශයෙහි මතු දිනයක් සඳහන්ව ඇති අවස්ථාවක, රෙජිස්ට්‍රාර්වරයා වෙත භාර දෙනු ලැබූ දැන්වීමක් මගින් ඒ දිනය ස්ථිර කරනු ලැබුවේ නම් මිස හෝ වෙනස් කරනු ලැබුවේ නම් මිස,

ලියාපදිංචි කරනු නොලැබිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා වෙත පිටපතක් භාර නොදී හෝ එසේ භාර දෙනු ලැබූ පිටපතෙහි (1) වන උපවගන්තියෙහි සඳහන් නියම කර ඇති ලේඛන පිටසන් නොකර හෝ නියම කර

ඇති ලේඛන යා නොකර සංස්ථා ප්‍රකාශයක් නිකුත් කරනු ලබන අවස්ථාවක, සමාගම සහ සංස්ථා ප්‍රකාශය නිකුත් කිරීම පිළිබඳව දැන දැනම පාර්ශ්වකරුවකු වූ සෑම තැනැත්තකු ම වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ දෙකක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

සංස්ථා ප්‍රකාශයෙහි ඇති අසත්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් සිවිල් වගකීම.

**41.** (1) මේ වගන්තියෙහි විධිවිධානවලට යටත්ව, සමාගමක කොටස් සඳහා හෝ සෘණ පත්‍ර සඳහා සහභාගිවීමට තැනැත්තන්ට සංස්ථා ප්‍රකාශයකින් ආරාධනා කෙරෙන අවස්ථාවක, සංස්ථා ප්‍රකාශය විශ්වාස කොට ගෙන කොටස් හෝ සෘණපත්‍ර කිසිවකට සහභාගි වූ සියලු තැනැත්තන්ට ඒ සංස්ථා ප්‍රකාශයෙහි ඇතුළත්ව ඇති යම් අසත්‍ය ප්‍රකාශයක් හේතු කොටගෙන ඒ තැනැත්තාට දරන්නට සිදු වී ඇති පාඩු හෝ අලාභ සඳහා ඔවුන්ට වන්දි ගෙවීමට පහත සඳහන් තැනැත්තෝ, එනම් :—

(අ) සංස්ථා ප්‍රකාශය නිකුත් කරනු ලැබූ වේලාවේ දී සමාගමේ අධ්‍යක්ෂවරයකු වන සෑම තැනැත්තකු ම ද ;

(ආ) අධ්‍යක්ෂවරයකු ලෙස හෝ වහාම නැතහොත් යම් කාලයකට පසුව අධ්‍යක්ෂවරයකු වීමට එකඟත්වය පළ කොට ඇති ලෙස සංස්ථා ප්‍රකාශයේ තම නම සඳහන් කිරීමට තමාට ම බලය දෙනු ලැබ, එසේ සංස්ථා ප්‍රකාශයේ නම සඳහන් කරනු ලැබ ඇති සෑම තැනැත්තකු ම ද ;

(ඇ) සමාගමේ ප්‍රවර්ධකයකු වූ සෑම තැනැත්තකු ම ද ;

(ඈ) සංස්ථා ප්‍රකාශය නිකුත් කිරීම සඳහා බලය දී ඇති සෑම තැනැත්තකු ම ද,

බැඳී සිටිය යුතු ය :

එසේ වුව ද, 38 වන වගන්තියේ විධිවිධාන යටතේ, සංස්ථා ප්‍රකාශයක් නිකුත් කිරීම සඳහා යම් තැනැත්තකුගේ කැමැත්ත අවශ්‍ය වන්නා වූ ද, ඒ තැනැත්තා විසින් ඒ කැමැත්ත ප්‍රකාශ කරනු ලැබ ඇත්තා වූ ද අවස්ථාවක, විශේෂඥයකු වශයෙන් ඔහු විසින් කරනු ලැබී යයි උද්දේශිත අසත්‍ය ප්‍රකාශයක් සම්බන්ධයෙන් හැර, ඒ කැමැත්ත දීමේ හේතුව නිසා සංස්ථා ප්‍රකාශය නිකුත් කිරීමට බලය දුන් තැනැත්තකු වශයෙන්, ඒ තැනැත්තා මේ උපවගන්තිය යටතේ යම් බැඳීමකට යටත් නොවිය යුතු ය.

(2) (අ) තමා සමාගමේ අධ්‍යක්ෂවරයකු වීමට කැමැත්ත දී තිබී සංස්ථා ප්‍රකාශය නිකුත් කිරීමට පෙර කැමැත්ත අස් කර ගත් බව හා තම බලය දීම හෝ කැමැත්ත නොමැතිව එය නිකුත් කරනු ලැබූ බව ; හෝ

(ආ) සංස්ථා ප්‍රකාශය නිකුත් කරන ලද්දේ තමා නොදැනුවත්ව හෝ තම කැමැත්ත නොමැතිව බව සහ එය නිකුත් කළ බව තමාට දැනගැනීමට ලැබුනු විට, එය නිකුත් කරන ලද්දේ තමා නොදැනුවත්ව බවට හෝ තම කැමැත්ත නොමැතිව බවට සාධාරණ ප්‍රසිද්ධ දැන්වීමක් වහාම කළ බව ;

(ඇ) සංස්ථා ප්‍රකාශය නිකුත් කිරීමෙන් පසු, ඒ යටතේ කිසියම් විභජනයක් කිරීමට පෙර, ඒ සංස්ථා ප්‍රකාශයෙහි යම් අසත්‍ය ප්‍රකාශයක් පිළිබඳව දැන ගැනීමට ලැබුණු විට තමා ඒ පිළිබඳව දී තිබූ කැමැත්ත අස්කර ගෙන, කැමැත්ත අස්කර ගන්නා ලද බව හා ඊට හේතු දක්වමින් සාධාරණ ප්‍රසිද්ධ දැන්වීමක් කළ බව ; හෝ

(ඈ) (i) විශේෂඥයකුගේ බලය හෝ රජයේ නිල ලේඛනයක හෝ ප්‍රකාශයක බලය ප්‍රකාර කරන ලදැයි උද්දේශිත නොවූ සෑම අසත්‍ය ප්‍රකාශයක් සම්බන්ධයෙන් වන විට, ඒ ප්‍රකාශය සත්‍ය බව විශ්වාස කිරීමට තමාට සාධාරණ හේතු තිබූ බව සහ අවස්ථාවෝචිත පරිදි, කොටස් හෝ ඍණ පත්‍ර විභජනය කිරීමේ කාලය දක්වා එසේ විශ්වාස කළ බව ; සහ

(ii) විශේෂඥයකු විසින් කරන ලද ප්‍රකාශයක් යයි උද්දේශිත සෑම අසත්‍ය ප්‍රකාශයක් ම හෝ විශේෂඥයකුගේ වාර්තාවක හෝ තක්සේරුවක පිටපතක් හෝ උධෘතයක් යයි උද්දේශිත පිටපතක හෝ උධෘතයක ඇතුළත් සෑම අසත්‍ය ප්‍රකාශයක් ම සම්බන්ධයෙන් වූ විට, එයින් ඒ ප්‍රකාශය සාධාරණ ලෙස නිරූපණය වන බව හෝ එය, අවස්ථාවෝචිත පරිදි, වාර්තාවේ හෝ තක්සේරුවේ නිවැරදි වූ ද, පැහැදිළි වූ ද පිටපතක් හෝ උධෘතයක් බව සහ ප්‍රකාශය කළ තැනැත්තා එය කිරීමට සුදුස්සකු යයි ද, සංස්ථා ප්‍රකාශය නිකුත් කිරීමට 38 වන වගන්තිය යටතේ නියම කරනු ලැබූ කැමැත්ත ඒ තැනැත්තා විසින් දී ඇතැයි ද, ලියාපදිංචි කිරීම සඳහා සංස්ථා ප්‍රකාශයේ පිටපතක් භාර දීමට පෙර හෝ තම දැනුම අනුව, ඒ යටතේ විභජනය කිරීමට පෙර ඒ කැමැත්ත අස්කර ගෙන නොතිබිනැයි ද, විශ්වාස කිරීමට තමාට සාධාරණ හේතු තිබූ බව, සංස්ථා ප්‍රකාශය නිකුත් කරනු ලැබූ වේලාව දක්වා ම තමා එය විශ්වාස කළ බව ; සහ

(iii) තැනැත්තකු විසින් තම නිල තත්ත්වයෙන් කරන ලද ප්‍රකාශයක් යයි උද්දේශිත ප්‍රකාශයක හෝ නිල වශයෙන් නිකුත් කරන ලද රාජ්‍ය ලේඛනයක පිටපතක් හෝ උධෘතයක් යයි උද්දේශිත ලේඛනයක ඇතුළත් සෑම අසත්‍ය ප්‍රකාශයක් ම සම්බන්ධයෙන් වූ විට, එය ප්‍රකාශයේ නිවැරදි සහ පැහැදිලි නිරූපණයක් බව හෝ ලේඛනයේ නිවැරදි සහ පැහැදිලි පිටපතක් නොහොත් උධෘතයක් බව,

යම් තැනැත්තකු විසින් ඔප්පු කරනු ලැබුවහොත්, (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ ඔහු බැඳීමකට යටත් නොවිය යුතු ය :

එසේ වුවද, විශේෂඥයකු වශයෙන් තැනැත්තකු විසින් කරනු ලැබුවේ යයි උද්දේශිත අසත්‍ය ප්‍රකාශයක් සම්බන්ධයෙන්, සංස්ථා ප්‍රකාශයක් නිකුත් කිරීමට බලය දෙන ලද තැනැත්තා වශයෙන්, 38 වන වගන්තියේ විධිවිධාන යටතේ දීමට නියමිත කැමැත්ත ඔහු විසින් දෙනු ලැබීමේ හේතුව නිසා බැඳීමකට යටත් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, ඒ තැනැත්තාට මේ උපවගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(3) විශේෂඥයකු වශයෙන් තැනැත්තකු විසින් කරනු ලැබුවේ යයි උද්දේශිත අසත්‍ය ප්‍රකාශයක් සම්බන්ධයෙන් සංස්ථා ප්‍රකාශයක් නිකුත් කිරීමට බලය දෙන ලද තැනැත්තකු වශයෙන්, මේ පනතේ 38 වන වගන්තියේ විධිවිධාන යටතේ නියමිත කැමැත්ත ඔහු විසින් දෙනු ලැබීමේ හේතුව නිසා, මේ උපවගන්තියේ විධිවිධානවලට අමතරව (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ බැඳීමකට යටත් විය හැකි තැනැත්තකු විසින්—

(අ) සංස්ථා ප්‍රකාශය නිකුත් කිරීමට 38 වන වගන්තියේ විධිවිධාන යටතේ තමාගේ කැමැත්ත දීමෙන් පසු, ලියාපදිංචි කිරීම සඳහා සංස්ථා ප්‍රකාශයේ පිටපතක් භාර දීමට පෙර එය ලියවිල්ලකින් ඉල්ලා අස්කර ගත් බව ; හෝ

(ආ) ලියාපදිංචි කිරීම සඳහා සංස්ථා ප්‍රකාශයේ පිටපතක් භාර දීමෙන් පසු, සහ ඒ යටතේ විභජනය කිරීමට පෙර, තමාට එහි වූ එම අසත්‍ය ප්‍රකාශය පිළිබඳව දැන ගැනීමට ලැබුණු විට, ඒ පිළිබඳව දී තිබූ කැමැත්ත ලියවිල්ලකින් ඉල්ලා අස් කර ගෙන, එම ඉල්ලා අස්කර ගැනීම හා ඊට හේතු දක්වමින් සාධාරණ ප්‍රසිද්ධ දැන්වීමක් කළ බව ; හෝ

(ඇ) ඒ ප්‍රකාශය කිරීමට තමා සුදුස්සකුව සිටි බව සහ ඒ ප්‍රකාශය සත්‍ය බව විශ්වාස කිරීමට තරම් සාධාරණ හේතු තිබූ බව සහ අවස්ථාවෝචිත පරිදි, කොටස් හෝ සෘණ පත්‍ර විභජනය කිරීමේ කාලය දක්වා ඒ ප්‍රකාශය සත්‍ය බව විශ්වාස කළ බව,

ඔප්පු කරනු ලැබුවහොත්, ඒ තැනැත්තා බැඳීමකට යටත් නොවිය යුතු ය.

(4) (අ) සමාගමේ අධ්‍යක්ෂවරයකු ලෙස හෝ ඒ සමාගමේ අධ්‍යක්ෂවරයකු වීමට එකඟ වී සිටින්නකු ලෙස තැනැත්තකුගේ නම සංස්ථා ප්‍රකාශයෙහි ඇතුළත්ව තිබෙන සහ අධ්‍යක්ෂවරයකු වීමට ඔහුගේ කැමැත්ත දී නොමැති හෝ සංස්ථා ප්‍රකාශය නිකුත් කිරීමට පෙර ඔහුගේ කැමැත්ත ඉල්ලා අස්කර ගෙන ඇති සහ ඒ සංස්ථා ප්‍රකාශය නිකුත් කිරීම සඳහා බලය හෝ කැමැත්ත දී නොමැති ; හෝ

(ආ) සංස්ථා ප්‍රකාශය නිකුත් කිරීමට 38 වන වගන්තිය යටතේ තැනැත්තකුගේ කැමැත්ත අවශ්‍ය වී ඇති සහ ඒ කැමැත්ත ඔහු විසින් දෙනු නොලැබූ හෝ සංස්ථා ප්‍රකාශය නිකුත් කිරීමට පෙර එය ඉල්ලා අස්කර ගෙන ඇති,

අවස්ථාවක, සංස්ථා ප්‍රකාශය නිකුත් කරනු ලැබුවේ සමාගමේ යම් අධ්‍යක්ෂවරයකුගේ දැනුම හෝ කැමැත්ත නොමැතිව ද, ඒ අධ්‍යක්ෂවරයා හැර, සමාගමේ සෙසු අධ්‍යක්ෂවරුන් සහ ඒ සංස්ථා ප්‍රකාශය නිකුත් කිරීමට බලය දෙන ලද වෙනත් යම් තැනැත්තකු, අවස්ථාවෝචිත පරිදි, (අ) ඡේදය යටතේ සංස්ථා ප්‍රකාශයේ තම නම ඇතුළත් කරන ලද තැනැත්තාට හෝ (ආ) ඡේදය යටතේ කැමැත්ත අවශ්‍ය වී ඇත්තේ යම් තැනැත්තකුගේ ද ඒ තැනැත්තාට හෝ අවස්ථාවෝචිත පරිදි, ඔහුගේ නම සංස්ථා ප්‍රකාශයෙහි ඇතුළත් කිරීම හෝ විශේෂඥයකු ලෙස තමා විසින් කරන ලදැයි උද්දේශිත ප්‍රකාශයක් එහි ඇතුළත් කිරීම හේතු කොට ගෙන හෝ ඒ සම්බන්ධයෙන් තමාට විරුද්ධව ඉදිරිපත් කරන ලද යම් නඩුවක් හෝ නඩු කටයුත්තක් සම්බන්ධයෙන් තමා වෙනුවෙන් විත්තිවාචක ඉදිරිපත් කිරීමේ ලා, දැරීමට සිදුවන සියලු අලාභ, නඩු ගාස්තු සහ වියදම් සඳහා වන්දි ගෙවීමට බැඳී සිටිය යුතු ය :

එසේ වුවද, විශේෂඥයකු ලෙස තැනැත්තකු විසින් කරනු ලැබුවේ යයි උද්දේශිත ප්‍රකාශයක් සංස්ථා ප්‍රකාශයක ඇතුළත් කිරීමට මේ පනතේ 38 වන වගන්තිය යටතේ නියම කර ඇති කැමැත්ත දී තිබීමේ හේතුව නිසාම පමණක්, මේ උපවගන්තියේ කාර්ය සඳහා ඒ තැනැත්තා විසින් ඒ සංස්ථා ප්‍රකාශය නිකුත් කිරීමට බලය දෙනු ලැබුවේ යයි සලකනු නොලැබිය යුතු ය.

(5) අධ්‍යක්ෂවරයකු වීම හේතුකොට ගෙන හෝ අධ්‍යක්ෂවරයකු ලෙස හෝ අධක්ෂවරයකු වීමට එකඟව සිටින්නකු ලෙස නම් කරනු ලැබීම හේතුකොට ගෙන හෝ සංස්ථා ප්‍රකාශය නිකුත් කිරීමට බලය දීම හේතුකොට ගෙන හෝ විශේෂඥයකු ලෙස තමා විසින් කරනු ලැබුවේ යයි උද්දේශිත ප්‍රකාශයක් ඒ සංස්ථා ප්‍රකාශයෙහි ඇතුළත් කිරීම හේතුකොට ගෙන හෝ මේ වගන්තිය යටතේ යම් ගෙවීමක් කිරීමට බැඳී සිටින සෑම තැනැත්තකු ම විසින්, වෙන වෙනම නඩු පවරනු ලැබුවහොත් එම ගෙවීම ම කිරීමට බැඳීමකට යටත් විය හැකි වෙනත් සෑම තැනැත්තකුගෙන්, එසේ බැඳී සිටින තැනැත්තා වංචනික ලෙස දුර්පණය කිරීමකට වරදකරු වී, ඒ වෙනත් තැනැත්තා ඊට වරදකරු නොවී සිටියහොත් මිස, ගිවිසුම්වල දී මෙන්ම ඒ වෙනත් තැනැත්තාගෙන් දායක මුදල් අය කර ගනු ලැබිය හැකි ය.

(6) මේ වගන්තියේ කාර්ය සඳහා,—

(අ) "ප්‍රවර්ධකයා" යන්නෙන්, සංස්ථා ප්‍රකාශය හෝ අසත්‍ය ප්‍රකාශය දැක්වෙන එහි කොටස හෝ පිළියෙල කිරීමෙහි ලා පාර්ශ්වකරුවකු වූ ප්‍රවර්ධකයකු අදහස් වන නමුත්, සමාගම පිහිටුවීමෙහි ලා නිරත වූ තැනැත්තන් වෙනුවෙන්, යම් තැනැත්තකු වෘත්තීය තත්ත්වයකින් ක්‍රියා කිරීම හේතු කොටගෙන ඒ තැනැත්තා ඊට ඇතුළත් නොවේ ; තව ද,

(ආ) "විශේෂඥයා" යන්නෙහි 38, වන වගන්තියෙන් ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය.

**42**. (1) නිකුත් කරනු ලැබූ සංස්ථා ප්‍රකාශයක, යම් අසත්‍ය ප්‍රකාශයක් ඇතුළත්ව ඇති අවස්ථාවක සංස්ථා ප්‍රකාශය නිකුත් කිරීමට බලය පැවරූ යම් තැනැත්තකු විසින්, ඒ ප්‍රකාශය නොවැදගත් බව හෝ ඒ ප්‍රකාශය සත්‍ය යයි විශ්වාස කිරීමට තමාට සාධාරණ හේතු තිබූ බව හා සංස්ථා ප්‍රකාශය නිකුත් කරන තෙක් එසේ විශ්වාස කළ බව ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඒ තැනැත්තා වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකින් බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය. සංස්ථා ප්‍රකාශයේ ඇති අසත්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් සාපරාධී වගකීම.

(2) විශේෂඥයකු වශයෙන් තැනැත්තකු විසින් කරනු ලැබුවේ යයි උද්දේශිත ප්‍රකාශයක්, සංස්ථා ප්‍රකාශයෙහි ඇතුළත් කිරීමට 38 වන වගන්තියේ විධිවිධාන යටතේ නියමිත කැමැත්ත දී තිබීමේ හේතුව

නිසාම පමණක්, මේ වගන්තියේ කාර්ය සඳහා ඒ තැනැත්තා විසින් සංස්ථා ප්‍රකාශය නිකුත් කිරීමට බලය දෙනු ලැබුවේ යයි සලකනු නොලැබිය යුතු ය.

(3) නීතිපතිවරයාගේ අනුමතය ඇතිව හැර, (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් කිසිම නඩු පැවරීමක් කරනු නොලැබිය යුතු ය.

කොටස් හෝ සෑණ පත්‍ර විකිණීම සඳහා අර්පණයක් ඇතුළත් ලේඛනයක් සංස්ථා ප්‍රකාශයක් ලෙස සැලකිය යුතු බව.

**43**. (1) සමාගමක කොටස් හෝ සෑණ පත්‍ර සියල්ල හෝ ඉන් කිසිවක් මහජනයාට විකිණීම සඳහා අර්පණය කිරීමේ අදහස ඇතිව ඒ සමාගම විසින් සමාගමේ කොටස් හෝ සෑණ පත්‍ර කිසිවක් විභජනය කරන හෝ විභජනය කිරීමට එකඟ වන අවස්ථාවක, මහජනයාට විකිණීම සඳහා අර්පණය කරනු ලබන්නේ යම් ලේඛනයකින් ද ඒ ලේඛනය ඒ සමාගම විසින් නිකුත් කරනු ලබන සංස්ථා ප්‍රකාශයක් ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය. තව ද, සංස්ථා ප්‍රකාශවල ඇතුළත් කරුණුවලට සංස්ථා ප්‍රකාශවල ඇතුළත් ප්‍රකාශ සම්බන්ධයෙන් හා සංස්ථා ප්‍රකාශවල ඇතුළත් කිරීම අත්හැර ඇති දේ සම්බන්ධයෙන් ඇති වගකීමට අදාළ වන්නා වූ ද, නැතහොත් සාමාන්‍යයෙන් අන්‍යාකාරයකින් සංස්ථා ප්‍රකාශ හා ක්‍රියාත්මක වන හෝ සංස්ථා ප්‍රකාශ හා සම්බන්ධ කාරණාවලට අදාළ වන්නා වූ ද, යම් ලිඛිත නීතියක විධිවිධාන, සහභාගි වීම සඳහා කොටස් හෝ සෑණ පත්‍ර මහජනයා වෙත අර්පණය කරනු ලැබූ විටක මෙන් ද, කොටස් හෝ සෑණ පත්‍ර කිසිවක් සම්බන්ධයෙන් වූ අර්පණය කිරීමක් භාර ගන්නා තැනැත්තන්, ඒ කොටස්වලට හෝ සෑණ පත්‍රවලට සහභාගි වූ විටක මෙන් ද, ඒ අනුව අදාළ වී, ක්‍රියාත්මක විය යුතු ය. එහෙත් ලේඛනයේ ඇතුළත් අසත්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් හෝ එහි වූ අන් කිසිවක් සම්බන්ධයෙන් අර්පණය කළ තැනැත්තන් සතු යම් වගකීමක් වේ නම් ඒ වගකීම කෙරෙහි එසේ අදාළ වී ක්‍රියාත්මක වීමෙන් හානියක් නොමැති විය යුතු ය.

(2) පටහැනි තත්ත්වය ඔප්පු කරනු ලැබුවහොත් මිස, මේ පනතේ කාර්ය සඳහා —

(අ) විභජනය කිරීමෙන් හෝ විභජනය කිරීමට එකඟ වීමෙන් පසු මාස හයක් ඇතුළත, කොටස් හෝ සෑණ පත්‍ර මහජනයා වෙත විකිණීම සඳහා අර්පණයක් කරන ලද බව ; හෝ

(ආ) අර්පණය කරන ලද දිනයේ දී, කොටස් හෝ සෑණ පත්‍ර සම්බන්ධයෙන් සමාගම විසින් ලැබිය යුතු සම්පූර්ණ ප්‍රතිඵලය එසේ ලැබී නොතිබුණ බව,

පෙන්වා දෙනු ලැබුවහොත්, ඒ කොටස් හෝ සෑණ පත්‍ර මහජනයා වෙත විකිණීම සඳහා අර්පණය කිරීමේ අදහස ඇතිව කොටස් හෝ සෑණ පත්‍ර විභජනය කිරීමක් කරන ලදැයි නැතහොත් විභජනය කිරීමට එකඟ වන ලදැයි සලකනු ලැබිය යුතු ය.

(3) අර්පණය කරන තැනැත්තන් සමාගමක අධ්‍යක්ෂවරයන් ලෙස සංස්ථා ප්‍රකාශයක නම් කරනු ලැබ සිටින තැනැත්තන් වූ විටක මෙන් 40 වන වගන්තියේ විධිවිධාන, මේ වගන්තිය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය. 37 වන වගන්තියෙන් නියම කර ඇති කාරණාවලට අතිරේකව,—

(අ) අර්පණය අදාළ වූ කොටස් හෝ සෑණ පත්‍ර සම්බන්ධයෙන් සමාගමට ලැබුණ ප්‍රතිෂ්ඨාවේ ශුද්ධ මුදල ; සහ

(ආ) එහි කොටස් හෝ සෑණ පත්‍ර විභජනය කර ඇත්තේ හෝ විභජනය කරනු ලබන්නේ යම් ගිවිසුමක් යටතේ ද, ඒ ගිවිසුම පරීක්ෂා කළ හැකි ස්ථානය හා වේලාව,

සංස්ථා ප්‍රකාශයක සඳහන් කරන ලෙස නියම කර ඇති විටක මෙන්, 37 වන වගන්තියේ විධිවිධාන මේ වගන්තිය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) මේ වගන්තිය අදාළවන අර්පණයක් කරන තැනැත්තකු සමාගමක් හෝ ව්‍යාපාර ආයතනයක් හෝ වන අවස්ථාවක, සමාගම වෙනුවෙන් හෝ ව්‍යාපාර ආයතනය වෙනුවෙන් ඉහත කී ලේඛනය, අවස්ථාවෝචිත පරිදි, සමාගමේ අධ්‍යක්ෂවරයන් දෙදෙනකු විසින් හෝ හවුල්කරුවන්ගේ සංඛ්‍යාවෙන් අඩකට අඩු නොවූ සංඛ්‍යාවක් විසින් අත්සන් කරනු ලැබීම ප්‍රමාණවත් විය යුතු අතර, එවැනි යම් අධ්‍යක්ෂවරයකු විසින් හෝ හවුල්කරුවකු විසින් හෝ ලියවිල්ලකින් බලය දෙනු ලැබූ තම අනුයෝජිතයා ලවා එය අත්සන් කරවිය හැකි ය.

සංස්ථා ප්‍රකාශවලට අදාළ විධිවිධාන අර්ථ නිරූපණය කිරීම.

44. මේ පනතේ මේ කොටසේ ඉහතින් වූ විධිවිධානවල කාර්ය සඳහා,—

(අ) සංස්ථා ප්‍රකාශයක ඇතුළත් කරනු ලැබ ඇති ප්‍රකාශයක්, එය ඇතුළත් කර ඇති ආකාරය සහ එහි සන්දර්භය නොමග යවන සුළු නම්, අසත්‍ය ප්‍රකාශයක් ලෙස සලකනු ලැබිය යුතු ය ; තව ද

(ආ) යම් ප්‍රකාශයක්, සංස්ථා ප්‍රකාශයක හෝ එහි මතුපිට දැක්වෙන යම් වාර්තාවක හෝ සංස්ථා පත්‍රයක ඇතුළත්ව තිබේ නම්, හෝ යොමු කිරීමෙන් එහි අන්තර්ගත කොට තිබේ නම්, හෝ ඒ සමග නිකුත් කරනු ලැබිණි නම්, ඒ ප්‍රකාශය ඒ සංස්ථා ප්‍රකාශයෙහි ඇතුළත් කර ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

## විභජනය

අවම සහභාගය ලැබී ඇත්නම් මිස, විභජනය තහනම් බව.

**45**. (1) මෙහි හතරවන උපලේඛනයේ 5 වන ඡේදයේ නිශ්චිතව සඳහන් විස්තර සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස, අධ්‍යක්ෂවරයන්ගේ මතය අනුව, කොටස් ප්‍රාග්ධනය නිකුත් කිරීමෙන් ලබා ගත යුතු අවම ප්‍රමාණය ලෙස සංස්ථා ප්‍රකාශයේ දක්වා ඇති ප්‍රමාණයට සහභාගි වී සහ එසේ දක්වා ඇති ප්‍රමාණය සඳහා ඉල්ලුම් කිරීමේ දී ගෙවිය යුතු මුදල සමාගමට ගෙවා සමාගම විසින් ඒ මුදල භාර ගෙන තිබේ නම් මිස, සහභාගි වීම සඳහා මහජනයා වෙත සමාගමක් විසින් අර්පණය කරනු ලැබූ යම් කොටස් ප්‍රාග්ධනයක් විභජනය නො කළ යුතු ය.

මේ උපවගන්තියේ කාර්ය සඳහා, සමාගම විසින් සද්භාවයෙන් යම් මුදලකට චෙක්පතක් ලැබ ඒ චෙක්පතට මුදල් නොගෙවනු ඇතැයි සමාගමේ අධ්‍යක්ෂවරයන් විසින් සැක කිරීමට හේතුවක් නොමැති වුවහොත්, සමාගමට ඒ මුදල ගෙවනු ලැබූ ලෙස සහ සමාගම විසින් ඒ මුදල භාර ගනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) සහභාග ලැයිස්තු නිම කිරීමේ දින සිට දින හැටක් ඉකුත් වීමේ දී (1) වන උපවගන්තියේ දක්වා ඇති කොන්දේසි අනුව ක්‍රියා කර නොතිබුණ අවස්ථාවක, ඉල්ලුම්කරුවන්ගෙන් කොටස් සඳහා ලැබුණු යම් මුදල් පොළියක් නොමැතිව වහාම ඔවුන්ට ආපසු ගෙවිය යුතු ය. තව ද සහභාග ලැයිස්තු නිම කිරීමේ දින සිට දින හැත්තෑ පහක් ඇතුළත එවැනි යම් මුදලක් එසේ ආපසු ගෙවනු නොලැබුවහොත්, දින හැත්තෑ පහ ඉකුත් වීමේ සිට නෛතික අනුපාතිකය අනුව වූ පොලිය ද සහිතව ඒ මුදල ආපසු ගෙවීමට සමාගමේ අධ්‍යක්ෂවරුන් එක්ව හා වෙන් වෙන්ව බැඳී සිටිය යුතු ය :

එසේ වුව ද, මුදල් ආපසු ගෙවීමෙහි ලා වූ පැහැර හැරීම, තමාගේ යම් විෂමාචාරයක් හෝ නොසැලකිල්ලක් හෝ හේතු කොටගෙන සිදු නොවූ බව යම් අධ්‍යක්ෂවරයකු විසින් ඔප්පු කරනු ලැබුවහොත් ඔහුගේ බැඳීමක් නොමැති විය යුතු ය.

(3) මේ වගන්තියේ යම් නියමයක් පිළිපැදීම අත්හැර දමන ලෙස කොටස් සඳහා ඉල්ලුම්කරුවකුට නියම කෙරෙන හෝ එසේ අත්හැර දමන ලෙස ඔහු බැඳීමකට යටත් කරන යම් කොන්දේසියක් ශුන්‍ය විය යුතු ය.

(4) සහභාගිවීම සඳහා මහජනයා වෙත අර්පණය කරනු ලැබූ කොටස්වල පළමු විභජනයෙන් පසු කරන ලද යම් කොටස් විභජනයකට මේ වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

අවිධිමත් විභජනයක ප්‍රතිඵලය.

**46**. (1) 45 වන වගන්තියේ විධිවිධාන කඩ කරමින්, සමාගමක් විසින් ඉල්ලුම්කරුවකු වෙත කරනු ලැබූ විභජනයක්, විභජනය කිරීමේ දිනයේ සිට එක් මාසයක් ඇතුළත, ඉල්ලුම්කරුගේ ඉල්ලීම මත ශුන්‍ය කළ හැකි විය යුතු ය ; තව ද සමාගම ගණින් බේරා වසා දැමීම සඳහා කටයුතු කරගෙන යමින් තිබිය දී වුව ද, එය නොතකා, එය එසේ ශුන්‍ය කළ හැකි විය යුතු ය.

(2) සමාගමක යම් අධ්‍යක්ෂවරයකු, දැන දැනම 45 වන වගන්තියේ විධිවිධාන අතුරෙන් යම් විධිවිධානයක් කඩ කරන හෝ කඩ කිරීමට අවසර දෙන හෝ බලය දෙන අවස්ථාවක, ඒ හේතුවෙන් සමාගම විසින් හෝ විභජනලාභී විසින් හෝ දරන ලද යම් අලාභයක් හෝ පාඩුවක් හෝ වියදමක් සඳහා පිළිවෙලින් සමාගමට සහ විභජනලාභීට වන්දි ගෙවීමට ඔහු බැඳී සිටිය යුතු ය :

එසේ වුව ද, විභජනය කිරීමේ දිනයේ සිට අවුරුදු දෙකක් ඉකුත් වීමෙන් පසු, එවැනි යම් අලාභයක් හෝ පාඩුවක් හෝ වියදමක් අය කර ගැනීම සඳහා කිසිම නඩු කටයුත්තක් ආරම්භ නොකළ යුතු ය.

කොටස් හා සෘණ පත්‍ර සඳහා සහ ඒවා විභජනය කිරීම පිණිස වූ ඉල්ලීම්.

**47**. (1) පොදුවේ නිකුත් කරනු ලැබූ සංස්ථා ප්‍රකාශයක් අනුව, සමාගමක යම් කොටස් හෝ සෘණ පත්‍ර විභජනය නොකළ යුතු අතර, පළමුවරට එසේ සංස්ථා ප්‍රකාශය නිකුත් කරනු ලැබුවේ යම් දිනයක දී ද, එම දිනයෙන් පසු තුන්වන දවස ආරම්භ වන තෙක් හෝ සංස්ථා ප්‍රකාශයෙහි යම් පසු කාලයක් නිශ්චිතව සඳහන් කරනු ලැබ, (මේ පනතේ මින් මතු "සහභාග ලැයිස්තු විවෘත කෙරෙන කාලය" යනුවෙන් සඳහන් කරනු ලබන) ඒ කාලය ආරම්භ වන තෙක්, එසේ නිකුත් කරනු ලැබූ සංස්ථා ප්‍රකාශයක් අනුව කරනු ලැබූ ඉල්ලීම් මත ක්‍රියා කරනු නොලැබිය යුතු ය.

(2) සංස්ථා ප්‍රකාශය පළමුවරට පොදුවේ නිකුත් කරනු ලැබූ දිනය පිළිබඳව (1) වන උපවගන්තියෙහි කර ඇති සඳහන, එය එසේ පළමුවරට ප්‍රවෘත්ති පත්‍ර ප්‍රචාරක දැන්වීමක් ලෙස නිකුත් කරනු ලැබූ දිනය ගැන කරනු ලැබූ සඳහනක් ලෙස තේරුම් ගනු ලැබිය යුතු ය :

එසේ වුව ද, එය වෙනත් යම් ආකාරයකින් එසේ පළමුවරට නිකුත් කරනු ලැබූ දිනයෙන් පසු දින තුනකට පෙර, එසේ ප්‍රවෘත්ති පත්‍ර ප්‍රචාරක දැන්වීමක් ලෙස නිකුත් කරනු නොලැබ තිබුණහොත්, ඒ සඳහන එය වෙනත් යම් ආකාරයකින් එසේ පළමුවරට නිකුත් කරනු ලැබූ දිනය පිළිබඳව කරන ලද සඳහනක් ලෙස තේරුම් ගනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන කඩ කිරීමකින් විභජනයේ වලංගු භාවයට බලපෑමක් නොවිය යුතු ය ; එහෙත් එවැනි යම් කඩ කිරීමක් සිදුවූ විටක,—

(අ) සමාගම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂ දෙකක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය ; තව ද

(ආ) ඒ පැහැර හැරීම සිදු කළ සමාගමේ සෑම නිලධරයකු ම වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(4) කොටස් හෝ සෘණ පත්‍ර විකිණීම සඳහා අර්පණය කෙරෙන සංස්ථා ප්‍රකාශයකට මේ වගන්තිය අදාළ කිරීමේ දී, මෙහි ඉහත සඳහන් උපවගන්ති, එහි විභජනය සම්බන්ධ සඳහන් කිරීම් විකිණීම් සම්බන්ධ සඳහන් කිරීම් ලෙස ද, පැහැර හැරීම කළ සමාගම සහ එහි සෑම නිලධරයකු හා සම්බන්ධ සඳහන් කිරීම ඒ අර්පණය යම් තැනැත්තකු විසින් කරනු ලැබුවේ ද නැතහොත් යම් තැනැත්තකු මගින් කරනු ලැබුවේ ද, එසේම දැන දැනම හා සිතාමතා එකී කඩ කිරීමට බලය දෙනු ලැබුවේ ද නැතහොත් අවසර දෙනු ලැබුවේ ද, ඒ තැනැත්තා හා සම්බන්ධ සඳහන් කිරීමක් ලෙස ද ආදේශ කර ඇති විටක මෙන් බලපැවැත්විය යුතු ය.

(5) පොදුවේ නිකුත් කරනු ලැබූ සංස්ථා ප්‍රකාශයක් අනුව, සමාගමක කොටස් සඳහා හෝ සෘණ පත්‍ර සඳහා හෝ කරනු ලබන ඉල්ලීමක් සහභාග ලැයිස්තු විවෘත කරන දිනයේ සිට තුන්වන දිනය ඉකුත් වන තෙක්, හෝ සංස්ථා ප්‍රකාශය සඳහා 41 වන වගන්තියේ විධිවිධාන යටතේ වගකිව යුතු යම් තැනැත්තකු විසින්, ඒ තැනැත්තාගේ වගකීම ඉවත් කිරීමේ හෝ සීමා කිරීමේ බලපෑම ඇති පොදු දැන්වීමක්, එකී තුන්වන දිනය ඉකුත් වීමට ප්‍රථම ඒ වගන්තිය යටතේ දෙන තෙක් හෝ ප්‍රත්‍යාදිෂ්ට කළ නොහැකි විය යුතු ය.

(6) මේ වගන්තියේ කාර්ය සඳහා, යම් දිනයකට පසුව තුන්වන දිනය තීරණය කිරීමේ දී, බැංකු නිවාඩු දිනයක් හෝ රජයේ නිවාඩු

දිනයක් වන යම් අතරමැද දිනයක් ගණන් ගනු නොලැබිය යුතු අතර, එසේ තීරණය කරනු ලැබූ තුන්වන දිනය ද බැංකු නිවාඩු දිනයක් හෝ රජයේ නිවාඩු දිනයක් වන අවස්ථාවක එකී කාර්ය සඳහා ඉන් පසුව එළඹෙන, බැංකු නිවාඩු දිනයක් හෝ රජයේ නිවාඩු දිනයක් හෝ නොවන පළමුවන දිනය ආදේශ කරනු ලැබිය යුතු ය.

මහජනයාට කොටස් හෝ සෑණ පත්‍ර අර්පණය කිරීම පිළිබඳ සඳහන් කිරීම අර්ථ නිරූපණය කිරීම.

**48.** (1) මහජනයාට කොටස් හෝ සෑණ පත්‍ර අර්පණය කිරීම පිළිබඳව මේ පනතේ ඇති යම් සඳහන් කිරීමක්, අදාළ සමාගමේ කොටස් හිමියන් වශයෙන් හෝ සෑණ පත්‍ර දරන්නන් වශයෙන් හෝ සංස්ථා ප්‍රකාශය නිකුත් කරන තැනැත්තාගේ සේවාදායකයන් වශයෙන් හෝ වෙනත් තත්ත්වයකින් හෝ තෝරාගනු ලබන, මහජනයාගේ යම් කොටසකට ඒවා අර්පණය කිරීම පිළිබඳ සඳහන් කිරීමක් ලෙස, මේ පනතේ ඇතුළත් යම් පටහැනි විධිවිධානයකට යටත්ව, තේරුම් ගනු ලැබිය යුතු ය. තව ද, කොටස්වලට හෝ සෑණ පත්‍රවලට සහභාගිවීමට මහජනයාට කෙරෙන ආරාධන සම්බන්ධයෙන් මේ පනතේ හෝ සමාගම් ව්‍යවස්ථාවලියේ ඇති සඳහන් කිරීම්, ඉහතින් වූ විධිවිධානවලට යටත්ව, එකී අයුරින් ම තේරුම් ගනු ලැබිය යුතු ය.

(2) යම් අර්පණයක් හෝ ආරාධනයක්, එම අර්පණය හෝ ආරාධනය ලබන තැනැත්තන් හැර අන් තැනැත්තන් විසින් සහභාගිවීම හෝ මිලට ගැනීම සඳහා කොටස් හෝ සෑණ පත්‍ර ලබාදීමේ ප්‍රතිඵලය කෙළින් ම හෝ අන්‍යාකාරයකින් ඇති කිරීමට අදහස් නොකරන ලද්දක් ලෙස සියලු අවස්ථාගත කරුණු යටතේ නිසි පරිදි සැලකිය හැකි නම්, හෝ එය කරන හෝ භාර ගන්නා තැනැත්තන්ගේ දේශීය ව්‍යාපාරයක් ලෙස නිසි පරිදි සැලකිය හැකි නම්, ඒ අර්පණය කිරීම හෝ ආරාධනය මහජනයා වෙත කරන ලද්දක් ලෙස සැලකිය යුතු බවට නියම කරන්නක් ලෙස (1) වන උපවගන්තියේ විධිවිධාන සලකනු නොලැබිය යුතු ය ; තව ද විශේෂයෙන් ම —

(අ) කොටස්වලට හෝ සෑණ පත්‍රවලට සහභාගිවීම සඳහා මහජනයාට ආරාධනා කිරීම තහනම් කෙරෙන සමාගමක ව්‍යවස්ථාවලියේ යම් විධිවිධානයක්, ඉහත කී ලෙස නිසි පරිදි සලකනු ලැබිය හැකි ආරාධනයක්, සාමාජිකයන්ට හෝ සෑණ පත්‍ර දරන්නන්ට කිරීම තහනම් කරන්නක් ලෙස සලකනු නොලැබිය යුතු ය ; තව ද

(ආ) පෞද්ගලික සමාගම්වලට අදාළ මේ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

## කොටස්වල ස්වභාවය සහ කොටස් වර්ග

කොටස්වල ස්වභාවය සහ කොටස් වර්ග.

**49.** (1) සමාගමක කොටස්, චංචල දේපළ විය යුත්තේ ය.

(2) සමාගම් ව්‍යවස්ථාවලියට යටත්ව, සමාගමක කොටසකින්—

(අ) සමාගමේ රැස්වීමක දී යම් යෝජනා සම්මතයක් සම්බන්ධයෙන් පවත්වනු ලබන ඡන්ද විමසීමක දී එක් ඡන්දයක් සඳහා අයිතිවාසිකම ;

(ආ) සමාගම විසින් ගෙවනු ලබන ලාභාංශවල දී සමාන පංගුවක් සඳහා අයිතිවාසිකම ;

(ඇ) ඈවර කිරීමේ දී අතිරික්ත වත්කම් බෙදීමේ දී සමාන පංගුවකට ඇති අයිතිවාසිකම,

ඒ කොටස් හිමියා වෙත පවරා දෙනු ලබන්නේ ය.

(3) සමාගමක් විසින් වෙනස් වෙනස් පංතිවල කොටස් නිකුත් කරනු ලැබිය හැකි අතර, විශේෂයෙන් ම—

(අ) නිදහස් කළ හැකි කොටස් ; හෝ

(ආ) විභජනය පිණිස වරණීය අයිතිවාසිකම් පවරා දෙන්නා වූ කොටස් ; හෝ

(ඇ) විශේෂ, සීමිත හෝ කොන්දේසි සහිත ඡන්දය දීමේ අයිතිවාසිකම් පවරනු ලබන්නා වූ හෝ ඡන්දය දීමේ අයිතිවාසිකම් කිසිවක් පවරා නොදෙන්නා වූ කොටස්,

නිකුත් කරනු ලැබිය හැකි ය.

(4) සමාගමක කිසිදු කොටසකට නාමික හෝ සමක අගයක් නොතිබිය යුතු ය.

(5) සමාගමක කොටසක් ව්‍යවස්ථාවලියෙන් විධිවිධාන සලස්වා ඇති ආකාරයට පවරා දෙනු ලැබිය හැකි අතර, ඒ ව්‍යවස්ථාවලියෙන් කොටසක් පවරා දෙනු ලැබිය හැකි ප්‍රමාණය පරිසීමා කිරීම හෝ සීමා කිරීම කරනු ලැබිය හැකි ය.

## කොටස් නිකුත් කිරීම

**50**. (1) 5 වන වගන්තිය යටතේ සමාගමක් සංස්ථාගත කිරීමෙන් ඉක්බිතිව ම, සමාගම විසින්, සංස්ථාගත කිරීම සඳහා කර ඇති ඉල්ලීමේ නම්කර ඇති එක් එක් කොටස්හිමියා වෙත ඒ තැනැත්තාට ලැබීමට හිමිකම් ඇති කොටස් නිකුත් කරනු ලැබිය යුතු ය. ආරම්භක කොටස්.

(2) 244 වන වගන්තිය යටතේ ඒකාබද්ධ කිරීම පිළිබඳ සහතිකයක් නිකුත් කිරීමෙන් ඉක්බිතිව ම, ඒකාබද්ධ කළ සමාගම විසින්, ඒකාබද්ධ කිරීමේ යෝජනාව යටතේ කොටස්වලට හිමිකම් ඇති එක් එක් තැනැත්තා වෙත, ඒ තැනැත්තාට ලැබීමට හිමිකම් ඇති කොටස් නිකුත් කරනු ලැබිය යුතු ය.

**51**. (1) 52 වන හා 53 වන වගන්තිවල සහ සමාගම් ව්‍යවස්ථාවලියේ විධිවිධානවලට යටත්ව, සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, උචිත යයි අධ්‍යක්ෂ මණ්ඩලය සලකන යම් තැනැත්තන් වෙත කොටස් නිකුත් කරනු ලැබිය හැකි ය. කොටස් නිකුත් කිරීම.

(2) නිකුත් කරන ලද කොටස්වලින් කොටස්හිමියා වෙත 49 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි දක්වා ඇති අයිතිවාසිකම් හැර වෙනත් අයිතිවාසිකම් පවරා දෙනු ලබන්නේ නම් හෝ යම් බැඳීමක් නියම කරනු ලබන්නේ නම්, මේ කොටස්වලට ඈඳනු ලැබූ අයිතිවාසිකම් සහ බැඳීම් දක්වා සිටිනු ලබන නිකුත් කිරීමේ නියම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද නිකුත් කිරීමේ නියම—

(අ) සමාගමේ ව්‍යවස්ථාවලිය සමඟ අනුකූල විය යුතු අතර, ඒවා එලෙස අනුකූල නොවන ප්‍රමාණයට අවලංගු හා බලරහිත විය යුතු ය ;

(ආ) ව්‍යවස්ථාවලියේ කොටසක් සංයුක්ත කරන ලෙස සලකනු ලැබිය යුතු අතර, 15 වන වගන්තියට අනුකූලව සංශෝධනය කරනු ලැබිය හැකි ය.

(4) මේ වගන්තිය යටතේ කොටස් කිසිවක් නිකුත් කරන ලද දින සිට වැඩකරන දින විස්සක් ඇතුළත, සමාගම විසින්—

(අ) නියමිත ආකෘතියෙන් රෙජිස්ට්‍රාර්වරයා වෙත—

(i) නිකුත් කරන ලද කොටස් සංඛ්‍යාව ; සහ

(ii) කොටස් නිකුත් කරන ලද්දේ යම් ප්‍රතිෂ්ඨාවක් සඳහා ද, ඒ ප්‍රතිෂ්ඨාවේ ප්‍රමාණය හෝ 58 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබූ පරිදි එහි වටිනාකම ; සහ

(iii) කොටස් නිකුත් කිරීමෙන් ඉක්බිතිව සමාගමේ ප්‍රකාශ කළ ප්‍රාග්ධනයේ ප්‍රමාණය,

පිළිබඳව දැන්වීමක් දිය යුතු ය ;

(ආ) (2) වන උපවගන්තිය යටතේ අනුමත කරන ලද නිකුත් කිරීමේ නියමවල පිටපතක් රෙජිස්ට්‍රාර්වරයා වෙත භාර දිය යුතු ය.

(5) (4) වන උපවගන්තියේ නියමයන් අනුව ක්‍රියා කිරීම සමාගමක් විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක—

(අ) සමාගම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය ; තව ද

(ආ) පැහැර හැරීම කරන ලද සමාගමේ සෑම නිලධරයකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

කොටස් නිකුත් කිරීම සඳහා ප්‍රතිෂ්ඨාව.

**52**. (1) කොටස් කිසිවක් නිකුත් කිරීමට පෙර අධ්‍යක්ෂ මණ්ඩලය විසින්—

(අ) කොටස් නිකුත් කරනු ලබන්නේ යම් ප්‍රතිෂ්ඨාවක් සඳහා ද, ඒ ප්‍රතිෂ්ඨාව තීරණය කරනු ලැබිය යුතු ය ; තව ද

(ආ) එහි මතය අනුව ඒ ප්‍රතිෂ්ඨාව සමාගමට සහ එවකට සිටින සියලු ම කොටස්හිමියන්ට යුක්ති සහගත සහ සාධාරණ ප්‍රතිෂ්ඨාවක් බවට යෝජනා සම්මත කරගත යුතු ය.

(2) කොටසක් නිකුත් කරනු ලබන්නේ යම් ප්‍රතිෂ්ඨාවක් සඳහා ද ඒ ප්‍රතිෂ්ඨාව, මුදල්, පොරොන්දු නෝට්ටු, අනාගත සේවා, කවර හෝ වර්ගයකට අයත් දේපළ හෝ සමාගමේ වෙනත් සුරැකුම්පත් ඇතුළුව, කිසියම් ආකාරයකින් විය හැකි ය.

(3) සමාගම ප්‍රතිෂ්ඨාව ලැබීමෙන් දින විස්සක් ඇතුළත දී කොටස් විභජනය කිරීම සිදු කළ යුතු ය.

අලුත් නිකුත් කිරීම්වලට ඇති පූර්වක්‍රය බල අයිතිය.

**53**. (1) සමාගම ව්‍යවස්ථාවලියට යටත්ව, ඡන්දය දීමේ හෝ බෙදා හැරීමේ අයිතිවාසිකම්වලට අදාළව දැනට පවත්නා කොටස්වලට සමාන හෝ ඒවාට ඉහළ තත්ත්වයක වූ කොටස් සමාගමක් විසින් නිකුත් කරනු ලබන අවස්ථාවක, ඒ කොටස්, අර්පණය පිළිගනු ලැබී නම්, ඒ කොටස්හිමියන්ගේ සාපේක්ෂව ඡන්දය දීමේ සහ විභජනයේ අයිතිවාසිකම් පවත්වා ගැනීමට හැකිවන ආකාරයට දැනට සිටින කොටස්හිමියන් වෙත අර්පණය කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සමාගමක් විසින් කිරීමට නියම කරනු ලැබ ඇති අර්පණයක්, පිළිගැනීම සඳහා සාධාරණ කාලසීමාවක් විවෘතව තැබිය යුතු ය.

කොටස් නිකුත් කිරීමේ ක්‍රමය.

**54**. (1) කොටස් හිමියාගේ නම කොටස් රෙජිස්ටරයේ ඇතුළත් කරනු ලැබ එහි ඇතුළත් කිරීම 51 වන වගන්තියේ (4) වන උපවගන්තිය අනුව කටයුතු කිරීමට පෙර සිදුකරනු ලැබ තිබිය යුතුව ඇත. ඒ කොටස් නිකුත් කරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) කොටස්හිමියා මත සමාගම කෙරෙහි වගකීමක් පනවනු ලබන කොටසක් සමාගමක් විසින් නිකුත් කිරීම, එය නිකුත් කරනු ලබන්නේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා විසින් ඒ කොටස්හිමියා වීමට ඔහුගේ කැමැත්ත ලියවිල්ලකින් දෙනු ලබන තෙක්, වලංගු නොවිය යුතු ය ; එසේම බලාත්මක නොවිය යුතු ය.

## කොටස් මත ඇරයුම්

කොටස් මත ඇරයුම්.

**55**. (1) කොටසක් මත හෝ කොටසකට ඈඳන ලද වෙනත් යම් බැඳීමක් මත ඇරයුමක් කරනු ලැබ, කොටස්හිමියා විසින් ඒ ඇරයුම ඉටු කරනු ලබන අවස්ථාවක, සමාගම විසින්, වැඩ කරන දින දහයක් ඇතුළත—

(අ) 58 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි ඇරයුමේ ප්‍රමාණය හෝ එහි වටිනාකම ; සහ

(ආ) ඇරයුම කිරීමෙන් පසු සමාගමේ ප්‍රකාශ කළ ප්‍රාග්ධනයේ ප්‍රමාණය,

පිළිබඳ දැන්වීමක් නියමිත ආකෘතියෙහි රෙජිස්ට්‍රාර්වරයා වෙත දිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ නියමයන් අනුව ක්‍රියා කිරීමට සමාගමක් විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක—

(අ) සමාගම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය ; තව ද

(ආ) පැහැර හැරීම කරනු ලැබූ සමාගමේ සෑම නිලධරයකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසක් නොඉක්වන දඩයකට යටත් විය යුතු ය.

### කොටස් හිමියන් වෙත බෙදා හැරීම

බෙදාහැරීම.

**56**. (1) සමාගමක් විසින් යම් කොටස් හිමියකු වෙත බෙදාහැරීමක් කිරීමට පෙර—

(අ) ඒ බෙදාහැරීම සඳහා (2) වන උපවගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බලය දෙනු ලැබිය යුතු ය ; තව ද

(ආ) ව්‍යවස්ථාවලියෙහි අන්‍යාකාරයෙන් විධිවිධාන සලස්වා ඇත්නම් මිස, ඒ බෙදාහැරීම කොටස් හිමියන් විසින් සාමාන්‍ය යෝජනා සම්මතයක් මගින් අනුමත කරනු ලැබිය යුතු ය.

(2) බෙදාහැරීමෙන් ඉක්බිතිව ම ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණය සමාගම විසින් ඉටු කරන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමට පත්වන අවස්ථාවක, එම මණ්ඩලය විසින් ණය ගෙවීමේ හැකියාව පිළිබඳ සහතිකයක් විගණකවරුන්ගෙන් ලබා ගන්නේ නම් සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලය විසින් උචිත යයි සලකන යම් වේලාවක දී හා යම් ප්‍රමාණයකින් බෙදාහැරීමට බලය දෙනු ලැබිය හැකි ය.

(3) බෙදාහැරීමට පක්ෂව ඡන්දය දෙන අධ්‍යක්ෂවරයන් විසින්, ඔවුන්ගේ මතය අනුව, බෙදාහැරීමෙන් ඉක්බිතිව ම සමාගම විසින් ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණය ඉටු කරන බව සඳහන් කරමින් සහතිකයක් අත්සන් කළ යුතු ය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණය අදාළ කිරීමේ දී "ණය" යන්නට ස්ථිර වරණීය ලාභ බෙදාහැරීම සඳහා බලය දීමට අධ්‍යක්ෂ මණ්ඩලයට ඇති බලයට යටත් විය යුතු බවට ප්‍රකාශ කර ඇති අවස්ථාවක හැර, බෙදාහැරීමක් කරනු ලැබුවේ යම් කොටස් සම්බන්ධයෙන් ද, ඒ කොටස්වලට ඉහළින් ශ්‍රේණිගත කොටස් මත වූ ස්ථිර වරණීය ලාභ ඇතුළත් වේ.

(5) (2) වන උපවගන්තියේ නියම අනුව ක්‍රියා කිරීම පැහැර හරින අධ්‍යක්ෂවරයකු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ දෙකක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

**57**. (1) (අ) සමාගමකට එහි ණයතුරුස්, ඒවා ගෙවිය යුතු වන විට, එහි සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රියාවලියේ දී ගෙවීමට හැකි වේ නම් ; සහ

ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණය.

(ආ) සමාගමේ වත්කම්වල අගය—

(i) එහි වගකීම්වල වටිනාකමට ; සහ

(ii) සමාගමේ ප්‍රකාශ කළ ප්‍රාග්ධනයට වඩා,

වැඩි නම්,

ඒ සමාගම විසින් ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණය සපුරා ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) සමාගමක් විසින් ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණය සපුරා තිබේදැයි තීරණය කිරීමේ දී, අධ්‍යක්ෂ මණ්ඩලය විසින්—

(අ) පනතේ 151 වන වගන්තියට අනුකූලව පිළියෙල කරන ලද සමාගමේ වඩාත්ම නවතම මූල්‍ය ප්‍රකාශ ;

(ආ) සමාගමේ වත්කම් සහ බැරකම්වලට බලපාන්නා වූ ද අධ්‍යක්ෂවරුන් දන්නා වූ හෝ දැනගත යුතු වන්නා වූ අවස්ථාවක් ;

(ඇ) නියමිත පරිදි, වත්කම්වල හෝ බැරකම්වල සාධාරණ තක්සේරු කිරීමක් හෝ ඒවායේ වටිනාකම ඇගැයීමේ වෙනත් ක්‍රමයක්,

සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

ප්‍රකාශ කළ ප්‍රාග්ධනය.

**58**. (1) 59 වන වගන්තියට යටත්ව, සමාගමකට අදාළව ප්‍රකාශ කළ ප්‍රාග්ධනය යන්නෙන්—

(අ) කොටස් නිකුත් කිරීම් සම්බන්ධයෙන් ; සහ

(ආ) කොටස් මත වූ ඇරයුම් සම්බන්ධයෙන්,

සමාගමට ලැබුණු හෝ ලැබිය යුතු සහ ගෙවිය යුතු සියලු මුදල්වල එකතුව අදහස් වේ.

(2) මුදල් හැර වෙනත් ප්‍රතිෂ්ඨාවක් සඳහා කොටසක් නිකුත් කරනු ලැබූ අවස්ථාවක, (1) වන උපවගන්තියේ කාර්ය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒ ප්‍රතිෂ්ඨාවේ මූල්‍යමය වටිනාකම තීරණය කරනු ලැබිය යුතු ය.

(3) ඇරයුම් ගෙවීම පිණිස ඇති බැඳීමක් හැර, වෙනත් බැඳීමක් කොටසකට ඈඳා ඇති සහ ඒ බැඳීම කොටස් හිමියා විසින් ඉටු කරනු ලබන අවස්ථාවක—

(අ) ඒ ඉටුකිරීමේ මූල්‍යමය වටිනාකමක් ඇත්නම්, ඒ වටිනාකම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය යුතු ය ; තව ද

(ආ) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා, ඒ ඉටු කිරීමේ මූල්‍යමය වටිනාකම, කොටස මත ගෙවීමට යෙදී ඇති ඇරයුමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

ප්‍රකාශ කළ ප්‍රාග්ධනය අවකරණය කිරීම.

**59**. (1) (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, සමාගමක් විසින් එහි ප්‍රකාශ කළ ප්‍රාග්ධනය මේ පනතේ විධිවිධානවලට අනුකූලව විශේෂ යෝජනා සම්මතයක් මගින් එය උචිත යයි කල්පනා කරන යම් ප්‍රමාණයකට අවකරණය කරනු ලැබිය හැකි ය.

(2) සමාගමක ප්‍රකාශ කළ ප්‍රාග්ධනයේ යෝජිත අවකරණයක් පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම, ප්‍රකාශ කළ ප්‍රග්ධනය අවකරණය කිරීම සඳහා වූ යෝජනා සම්මතය සම්මත කර ගැනීමට පෙර දින හැටකට නොඅඩු කාලයක් තුළ දී දෙනු ලැබිය යුතු ය.

(3) සමාගමේ ණය හිමියකුගේ පූර්ව කැමැත්ත නොමැතිව හෝ අවකරණය කරන වේලාවේ දී නිශ්චිත කොන්දේසි ඉටු කරන්නේ නම් මිස, හෝ සමාගමක් විසින් එහි ප්‍රකාශ කළ ප්‍රාග්ධනය නිශ්චිතව

සඳහන් ප්‍රමාණයකට වඩා අඩු ප්‍රමාණයකට අවකරණය නොකරන බවට ඒ සමාගම විසින් සමාගමේ ඒ ණයහිමියකු සමග ලියවිල්ලකින් එකඟ වනු ලැබිය හැකි ය. එවැනි යම් එකඟතාවයක් කඩකරමින් සම්මත කරගන්නා වූ ප්‍රකාශ කළ ප්‍රාග්ධනය අඩුකරන්නා වූ යෝජනා සම්මතයක් වලංගු සහ බලාත්මක නොවිය යුතු ය.

(4) (අ) 68 වන වගන්තිය යටතේ හෝ 69 වන වගන්තිය යටතේ නියම කර ඇති දිනයක දී කොටස් හිමියාගේ මනාපය අනුව කොටසක් නිදහස් කරගනු ලැබුවා වූ ; හෝ

(ආ) 95 වන වගන්තිය යටතේ සමාගම විසින් කොටසක් මිල දී ගන්නා වූ,

සහ නිදහස් කිරීමේ හෝ මිල දී ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් මේ උපවගන්තිය සම්බන්ධයෙන් වන අවස්ථාවක දී හැර, ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණය සපුරාලීමට සමාගම අපොහොසත් වන බවට මණ්ඩලය සෑහීමට පත්වන අවස්ථාවක ;

(ඇ) මණ්ඩලය විසින්, ණය ගෙවීමේ හැකියාව පිළිබඳ විගණකවරුන්ගේ සහතිකය ලබාගැනීමෙන් පසුව, ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණය එසේ සපුරාලීමට සමාගම අපොහොසත් වන්නේ යම් මුදලකින් ද, ඒ මුදල සමාගමේ ප්‍රකාශ කළ ප්‍රාග්ධනයෙන් අඩු කළ යුතු යයි, යෝජනා සම්මත කර ගනු ලැබිය යුතු ය ; තව ද

(ඈ) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ සිට (3) වන උපවගන්තිය තෙක් වූ උපවගන්තිවල ඇතුළත් විධිවිධානවල කුමක් සඳහන් වුව ද මණ්ඩලයේ යෝජනා සම්මතය බලපැවැත්විය යුතු ය.

(5) ස්වකීය ප්‍රකාශ කළ ප්‍රාග්ධනය අඩු කර ඇති සමාගමක් විසින්, අඩු කරන දින සිට වැඩ කරන දින දහයක් ඇතුළත අඩු කරනු ලැබූ මුදල සහ ස්වකීය ප්‍රකාශ කළ ප්‍රාග්ධනයෙන් අඩු කරනු ලැබූ මුදල නිශ්චිතව සඳහන් කරමින් ඒ අඩු කිරීම පිළිබඳව රෙජිස්ට්‍රාර්වරයා වෙත දැනුම්දීමක් කළ යුතු ය.

(6) (2) වන උපවගන්තියේ හෝ (5) වන උපවගන්තියේ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම සමාගමක් විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක—

(අ) සමාගම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පණස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය. ; තව ද

(ආ) පැහැර හැරීම කරනු ලැබූ සමාගමේ සෑම නිලධරයකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පණස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

ලාභාංශ.

**60**. (1) ලාභාංශයක් යනු, සමාගම විසින්, එය සතු කොටස්, සමාගම විසින් කරන ලද අත්කර ගැනීමක් හෝ සමාගම විසින් කරන ලද නිදහස් කිරීමක් හෝ නොවන, සමාගමේ ලාභවලින් කරනු ලබන බෙදාහැරීමක් වන්නේ ය.

(2) සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යම් පන්තියක වෙනත් කොටස් නොව, ඒ පන්තියේ ඇතැම් කොටස් සම්බන්ධයෙන් හෝ යම් පන්තියක වෙනත් කොටස්වලට වඩා ඒ පන්තියේ ඇතැම් කොටස් සම්බන්ධයෙන් වඩා වැඩි මුදලක ලාභාංශයකට —

(අ) සමාගම් ව්‍යවස්ථාවලිය යටතේ කොටස්වලට ඈඳී ඇති යම් බැරකමක අනුපාතයට අනුව ලාභාංශයේ ප්‍රමාණය අඩු කරනු ලැබ ඇත්තා වූ ; හෝ

(ආ) කිසිම ලාභාංශයක් හෝ අන්‍යාකාරයකින් ගෙවිය යුතු වන ලාභාංශයට වඩා අඩු ලාභාංශයක් ලැබීමට කොටස් හිමියකු ලියවිල්ලකින් එකඟ වී ඇත්තා වූ අවස්ථාවක හැර,

අවසර දෙනු නොලැබිය යුතු ය.

බෙදා හැරීම් ආපසු ලබා ගැනීම.

**61**. (1) බෙදා හැරීමක් කිරීමෙන් ඉක්බිතිව ම සමාගම විසින් ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණය සපුරාලීම නොකළ අවස්ථාවක දී, කොටස් හිමියකු වෙත කරන ලද බෙදා හැරීමක් —

(අ) කොටස් හිමියා බෙදා හැරීම ලබාගත්තේ සද්භාවයෙන් සහ සමාගම විසින් ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණය සපුරාලීම, පැහැර හැරීම පිළිබඳ දැනුමක් නොමැතිව නම් ;

(ආ) බෙදා හැරීමේ වලංගුභාවය කෙරෙහි විශ්වාසය තබමින් කොටස් හිමියා විසින් තම ස්ථාවරය වෙනස් කර ඇත්නම් ; සහ

(ඇ) අවස්ථානුගත කරුණු හේතු කොටගෙන සම්පූර්ණයෙන් හෝ කිසිසේත් නැවත ගෙවිය යුතු යයි නියම කිරීම අසාධාරණ වන්නේ නම් මිස,

සමාගම විසින් කොටස් හිමියාගෙන් ආපසු ලබාගත හැකි ය.

(2) (1) වන උපවගන්තිය අදාළ වන බෙදා හැරීමක් සම්බන්ධයෙන් 56 වන වගන්තියේ දක්වා ඇති කාර්ය පටිපාටිය අනුගමනය කර නොමැති හෝ සහතිකය අත්සන් කරන ලද අවස්ථාවේ දී සමාගම විසින් ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂාව සපුරාලන බවට විශ්වාස කිරීමට තරම් සාධාරණ හේතු නොතිබුණු අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි,—

(අ) කාර්ය පටිපාටිය අනුගමනය කිරීමට වග බලා ගැනීම සඳහා සාධාරණ පියවර ගැනීමට අපොහොසත් වූ ; හෝ

(ආ) සහතිකය අත්සන් කළ,

සෑම අධ්‍යක්ෂවරයකු ම, කොටස් හිමියන්ගෙන් ආපසු ලබා ගැනීමට සමාගමට නොහැකි බෙදා හැරීමේ යම් ප්‍රමාණයක් සමාගමට ආපසු ගෙවීමට පෞද්ගලිකව ම යටත් වන්නා හ.

(3) මේ වගන්තිය යටතේ අධ්‍යක්ෂවරයකුට හෝ කොටස් හිමියකුට විරුද්ධව ඉදිරිපත් කරන ලද නඩුවක දී, වඩා අඩු මුදල් ප්‍රමාණයක බෙදාහැරීමක් කිරීමෙන් ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණය සමාගමට සපුරාලිය හැකිව තිබූ බවට අධිකරණය සෑහීමට පත්වන අවස්ථාවක, නියමාකාරයෙන් කළ හැකිව තිබූ යම් බෙදා හැරීමක වටිනාකමට සමාන මුදල් ප්‍රමාණයක්—

(අ) රඳවා තබාගැනීමට කොටස් හිමියාට අවසර දීම ; හෝ

(ආ) ඒ මුදල් ප්‍රමාණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයා බැඳීමෙන් මුදා හැරීම,

අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.

කොටස් හිමියාගේ වගකීම අඩුකිරීම, බෙදා හැරීමක් වීම.

**62**. (1) සමාගමක් විසින්, අවස්ථාවෝචිත පරිදි, යම් වෙනස් කිරීමක්, අත්කර ගැනීමක් හෝ නිදහස් කිරීමක් සිදු කිරීමට පෙර දරන ලද කොටසකට අදාළව සමාගම කෙරෙහි කොටස් හිමියකුගේ වගකීම අවලංගු කෙරෙන හෝ අඩු කෙරෙන ආකාරයකින්—

(අ) ඒ සමාගමේ ව්‍යවස්ථාවලිය වෙනස් කරන්නා වූ ; හෝ

(ආ) ඒ සමාගම විසින් නිකුත් කරන ලද කොටස් අත්කරගන්නා වූ හෝ 67 වන වගන්තිය යටතේ කොටස් නිදහස් කරන්නා වූ,

අවස්ථාවක, එය වගකීම අඩු කරන ලද්දේ යම් මුදලකින් ද ඒ මුදලෙහි බෙදා හැරීමක් වූවාක් මෙන්, 61 වන වගන්තියේ (1) වන සහ (3) වන උපවගන්තිවල කාර්ය සඳහා ඒ වගකීම අවලංගු කිරීම හෝ නිදහස් කිරීම සලකනු ලැබිය යුතු ය.

(2) ඒකාබද්ධ කරන ලද සමාගමක කොටස් හිමියකුගේ, ඒකාබද්ධ කිරීමට පෙර දරන ලද කොටසකට අදාළව, ඒ සමාගමට ඇති වගකීම —

(අ) ඒ කොටස පරිවර්තනය කරන ලද්දේ යම් කොටසකට හෝ කොටස්වලට අදාළව ද ඊට අදාළව, ඒකාබද්ධ සමාගම කෙරෙහි වූ ඒ කොටස් හිමියාගේ වගකීමට වඩා විශාල වන්නා වූ ; හෝ

(ආ) ඒකාබද්ධ කිරීමේ දී ඒ කොටස අවලංගු කිරීමෙන්, අවලංගු කරනු ලැබ ඇත්තා වූ,

අවස්ථාවක, ඒකාබද්ධ කිරීම් මගින් බලාත්මක කරන ලද වගකීම අඩු කිරීම, 61 වන වගන්තියේ (1) වන සහ (3) වන වගන්තිවල කාර්ය සඳහා, ඒ වගකීම අඩු කරන ලද්දේ යම් මුදලකින් ද, ඒ මුදල, ඒ කොටස් හිමියා වෙත ඒකාබද්ධ සමාගම විසින් කරන ලද, බෙදා හැරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

## කොටස් නැවත මිලට ගැනීම

සමාගම විසින්, එය සතු කොටස් අත්කර ගැනීම හෝ නිදහස් කිරීම.

**63**. (1) සමාගමක් විසින්,—

(අ) 64 වන වගන්තිය හෝ 67 වන වගන්තිය යටතේ ; හෝ

(ආ) සමාගම පෞද්ගලික සමාගමක් නම්, 31 වන වගන්තිය යටතේ සියලු කොටස් හිමියන්ගේ කැමැත්ත හෝ එකඟත්වය ඇතිව ; හෝ

(ඇ) මේ පනත යටතේ අධිකරණය විසින් කරන ලද ආඥාවකට අනුකූලව,

ඒ සමාගම සතු කොටස් කිසිවක් මිලට ගැනීම හෝ අන්‍යාකාරයකින් අත්කර ගැනීම කරනු ලැබිය හැකි ය ; එහෙත් වෙනත් ආකාරයකින් එසේ මිලට ගැනීම හෝ අත්කර ගැනීම කළ නොහැකි ය.

(2) නිදහස් කළ හැකි කොටසක් වන යම් කොටසක්, සමාගමක් විසින්, 66 වන වගන්තියේ සිට 69 වන වගන්තිය තෙක් වූ වගන්තිවල විධිවිධානවලට අනුකූලව නිදහස් කරනු ලැබිය හැකි ය ; එහෙත් වෙනත් ආකාරයකින් එසේ නිදහස් කළ නොහැකි ය.

(3) සමාගමක් විසින් අත්කර ගන්නා ලද හෝ නිදහස් කරන ලද යම් කොටසක්, අවස්ථාවෝචිත පරිදි, ඒ අත්කර ගැනීමෙන් හෝ නිදහස් කිරීමෙන් ඉක්බිතිව ම අවලංගු කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) සමාගමක් විසින් කොටස් අත්කර ගැනීමෙන් හෝ නිදහස් කිරීමෙන් ඉක්බිතිව ම, අවස්ථාවෝචිත පරිදි, එසේ අත්කර ගන්නා ලද හෝ නිදහස් කරන ලද කොටස් සංඛ්‍යාව හා පන්තිය පිළිබඳව සමාගම විසින් රෙජිස්ට්‍රාර්වරයා වෙත දැනුම් දිය යුතු ය.

(5) (4) වන උපවගන්තියේ නියමයන් අනුව ක්‍රියා කිරීම සමාගමක් විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක—

(අ) සමාගම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පණස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය ; තව ද

(ආ) පැහැර හැරීම කරනු ලැබූ සමාගමේ සෑම නිලධරයකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පණස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

**64**. (1) සමාගමක කොටස් ඒ සමාගම විසින් ම මිල දී ගැනීම හෝ අන්‍යාකාරයකින් අත්කර ගැනීම පිණිස එහි ව්‍යවස්ථාවලියෙන් විධිවිධාන සලස්වා ඇත්නම්, සමාගම විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමතය ඇතිව එසේ කිරීමට එකඟ විය හැකි ය. සමාගමේ ම කොටස් සමාගම විසින් මිල දී ගැනීම.

(2) සමාගමක කොටස් ඒ සමාගම විසින් ම මිල දී ගැනීම පිණිස අර්පණය කිරීමට හෝ එකඟ වීමට පෙර, ඒ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්—

(අ) අත්කර ගැනීම, සමාගමේ යහපත සඳහා වන බවට ;

(ආ) අර්පණයේ හෝ එකඟවීමේ කොන්දේසි සහ කොටස් සඳහා ගෙවිය යුතු ප්‍රතිෂ්ඨාව සමාගමෙහි විගණකවරයන්ගේ මතය අනුව සාධාරණ වටිනාකමක් බවට ; සහ

(ඇ) කොටස්වල වටිනාකම තක්සේරු කිරීමකට වැදගත් වන්නා වූ කොටස් හිමියන්ට අනාවරණය නොකළ යම් තොරතුරක් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය නොදන්නා බවට සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් හෝ කොටස් සඳහා ඉදිරිපත් කෙරුණු අර්පණයක කොන්දේසි හෝ කොටස් සඳහා පිරිනමන ලද ප්‍රතිෂ්ඨාව, අර්පණය පිළිගන්නා කොටස් හිමියනට අසාධාරණ වන බවට යෝජනා සම්මත කරනු ලැබිය යුතු ය.

(3) සමාගමක් විසින්—

(අ) කොටස් අත්කර ගැනීම සඳහා වූ අර්පණයක් සම්පූර්ණයෙන් පිළිගනු ලැබී නම්, සියලු ම කොටස් හිමියන්ගේ සාපේක්ෂ ඡන්දය දීමේ හා බෙදා හැරීමේ අයිතිවාසිකම්වලට එයින් බලපෑමක් සිදු නොවන අර්පණයක් ඉදිරිපත් කිරීමට ; හෝ

(ආ) සියලු ම කොටස් හිමියන්ගේ සාපේක්ෂ ඡන්දය දීමේ හා බෙදා හැරීමේ අයිතිවාසිකම්වලට බලපෑමක් සිදු නොවන ආකාරයකින් වන වෙනත් ආකාරයකින් ඒ කොටස් අත්කර ගැනීම සඳහා එකඟවීමට,

පෙර, අවස්ථාවෝචිත පරිදි, අර්පණයක් ඉදිරිපත් කිරීම හෝ එකඟවීමට ඇතුළත් වීම, අර්පණය ඉදිරිපත් නොකරන ලද්දේ යම් කොටස් හිමියන් වෙත ද, ඒ කොටස් හිමියන්ට නැතහොත් එකඟ වීමට ඇතුළත් නොවන ලද්දේ යම් කොටස් හිමියන් සමග ද, ඒ කොටස් හිමියන්ට සාධාරණ වන බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබිය යුතු ය.

කොටස් මිලට ගැනීම සඳහා වූ කොන්ත්‍රාත්තුවක් බලාත්මක කිරීම.

**65**. (1) සමාගම විසින්, එහි කොටස් අත්කර ගැනීම සඳහා විධිවිධාන සලස්වන සමාගමක් සමග ඇතිකරගත් කොන්ත්‍රාත්තුවක්, කොන්ත්‍රාත්තුව ඉටු කිරීමෙන් පසුව, ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණය සපුරාලීමට සමාගම අපොහොසත්වන තාක් දුරට හැර, සමාගමට එරෙහිව නිශ්චිතව බලාත්මක කරනු ලැබිය යුතු අතර, කොන්ත්‍රාත්තුව ඉටු කිරීමෙන් පසුව, ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණය සපුරාලිය නොහැකි බව ඔප්පු කිරීමේ කාර්ය සමාගම වෙත පැවරෙන්නේ ය.

(2) (1) සමාගමක් විසින්, (1) වන උපවගන්තියේ සඳහන් කොන්ත්‍රාත්තුවක් සම්පූර්ණයෙන් ඉටු කරනු ලැබ ඇති තාක්, කොන්ත්‍රාත්තුවේ අනෙක් පාර්ශ්වකරු විසින්, සමාගමට එසේ ඉටු කිරීමට නීත්‍යානුකූලව හැකියාව ලැබුණු වහාම නැතහොත් ඇවර කිරීමක දී නම්, ණයහිමියන්ගේ අයිතිවාසිකම්වලට යටත් තත්ත්වයකට

පත් විය යුතුය. එහෙත් අනෙකුත් කොටස් හිමියන් විෂයයෙහි ප්‍රමුඛතාවක් ඇතිව, පත් වන්නා වූ හෝ හිමිකම් පාන්නකුගේ තත්ත්වය රඳවා ගනු ලබන්නේ ය.

### කොටස් නිදහස් කිරීම

**66**. මේ පනතේ කාර්ය සඳහා සමාගමක ව්‍යවස්ථාවලියෙන් සමාගම විසින් යම් කොටසක් නිදහස් කිරීම සඳහා විධිවිධාන සලස්වනු ලැබ ඇත්නම්, ඒ කොටස — *(නිදහස් කළ හැකි යන්නෙහි අර්ථය.)*

(අ) සමාගමේ මනාපය පරිදි ;

(ආ) කොටස දරන්නාගේ මනාපය පරිදි ; හෝ

(ඇ) ව්‍යවස්ථාවලියෙහි නිශ්චිතව සඳහන් දිනයක,

නිශ්චිතව සඳහන් කරන ලද ; හෝ සූත්‍රයකට යොමු කිරීමෙන් ගණනය කරන ලද හෝ සමාගම සමග සම්බන්ධකමක් හෝ සම්බන්ධතා නොමැති සුදුසුකම්ලත් තැනැත්තකු විසින් නියම කරනු ලැබිය යුතු යයි අණ කර ඇති ප්‍රතිෂ්ඨාවක් සඳහා නිදහස් කළ හැකි ය.

**67**. (1) සමාගමේ මනාපය පරිදි නිදහස් කළ හැකි යම් කොටසක් නිදහස් කිරීම සමාගමේ යහපත සඳහා වන බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කලින් යෝජනා සම්මත කර ඇත්නම්, ඒ කොටස නිදහස් කිරීම සඳහා සමාගම විසින් මනාපය ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය. *(සමාගමේ මනාපය පරිදි නිදහස් කිරීම.)*

(2) සමාගමේ මනාපය පරිදි යම් කොටසක් නිදහස් කිරීම—

(අ) 64 වන වගන්තියේ (3) වන උපවගන්තියේ කාර්ය සඳහා සමාගම විසින් කොටස අත්කර ගැනීමක් ; සහ

(ආ) 56 වන වගන්තියේ කාර්ය සඳහා බෙදා හැරීමක්,

ලෙස සලකනු ලබන්නේ ය.

**68**. (1) කොටස් හිමියාගේ මනාපය පරිදි කොටසක් නිදහස් කළ හැකි සහ කොටස නිදහස් කරන ලෙස සමාගමට නියම කරමින් කොටස් හිමියා විසින් සමාගම වෙත නියමාකාර දැනුම්දීමක් කරනු ලබන අවස්ථාවක— *(කොටස් හිමියාගේ මනාපය පරිදි නිදහස් කිරීම.)*

(අ) සමාගම විසින්, දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනයෙහි හෝ දිනයක් නිශ්චිතව සඳහන් කර නොමැති නම්, දැන්වීම ලැබුණු දිනයෙහි කොටස් නිදහස් කරනු ලැබිය යුතු ය ;

(ආ) නිදහස් කරනු ලැබූ දිනයෙහි කොටස අවලංගු කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය ; තව ද,

(ඇ) නිදහස් කිරීමේ දී ගෙවිය යුතු මුදල වෙනුවෙන් නිදහස් කරන ලද දිනයේ සිට, කලින් කොටස්හිමියා, සමාගමේ සුරක්ෂිත නොකරන ලද ණයහිමියකුගේ තත්ත්වයට පත් වන්නේ ය.

(2) මේ වගන්තිය යටතේ වූ නිදහස් කිරීමක් 56 වන වගන්තියේ කාර්ය සඳහා බෙදා හැරීමක් නොවන නමුත්, 61 වන වගන්තියේ (1) වන සහ (3) වන උපවගන්තිවල කාර්ය සඳහා බෙදා හැරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

නියම කරන ලද දිනයේ දී නිදහස් කිරීම.

**69**. (1) නියම කරන ලද දිනයක දී කොටසක් නිදහස් කළ හැකි අවස්ථාවක—

(අ) නිශ්චිත දිනයේ දී සමාගම විසින්, කොටස නිදහස් කරනු ලැබිය යුතු ය ;

(ආ) ඒ දිනයේ දී කොටස අවලංගු කරනු ලැබූ ලෙස සලකනු ලබන්නේ ය ; තව ද

(ඇ) ඒ දිනයෙහි සිට කලින් කොටස්හිමියා, නිදහස් කිරීම මත ගෙවිය යුතු මුදල වෙනුවෙන් සමාගමේ සුරක්ෂිත නොකරන ලද ණයහිමියකුගේ තත්වයට අයත් වන්නේ ය.

(2) මේ වගන්තිය යටතේ වූ නිදහස් කිරීමක්, 56 වන වගන්තියේ කාර්ය සඳහා බෙදා හැරීමක් නොවන නමුත්, 61 වන වගන්තියේ (1) වන හා (3) වන උපවගන්තිවල කාර්ය සඳහා බෙදා හැරීමක් ලෙස සලකනු ලබන්නේ ය.

## කොටස් මිලට ගැනීම සම්බන්ධයෙන් මූදල් ආධාර

මුදල් ආධාර දීම සම්බන්ධයෙන් පරිසීමා.

**70**. (1) මේ වගන්තියට අනුකූල වන ආකාරයෙන් හැර, සමාගමක් විසින්, සමාගමට අයත් කොටස් අත්කර ගැනීමේ කාර්යය සඳහා හෝ ඒ සම්බන්ධයෙන්, කෙළින් ම හෝ අන්‍යාකාරයකින් මුදල් ආධාර දෙනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, සමාගමක් විසින් සමාගමට ම අයත් කොටස් අත්කර ගැනීමේ කාර්යය සඳහා හෝ ඒ සම්බන්ධයෙන් මුදල් ආධාර දීම—

(අ) එසේ ආධාර දීම සමාගමේ යහපත සඳහා වන බවට ;

(ආ) එසේ ආධාර දෙනු ලබන්නේ යම් නියම හා කොන්දේසි මත ද, ඒ නියම හා කොන්දේසි සමාගමට හා ඒ ආධාර නොලබන යම් කොටස් හිමියන්ට සාධාරණ හා යුක්තිසහගත වන බවට ; සහ

(ඇ) එසේ ආධාර දීමෙන් ඉක්බිතිව ම, ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණය සමාගම විසින් සපුරාලනු ලබන බවට,

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කලින් යෝජනා සම්මත කරනු ලැබ ඇත්නම්, කරනු ලැබිය හැකි ය.

(3) ගෙවීම තවමත් හිඟ තබා ඇති, සමාගම විසින් දෙන ලද වෙනත් මුදල් ආධාර කිසිවක් ද සමග (2) වන උපවගන්තිය යටතේ අනුමත කරන ලද යම් මුදල් ආධාරයක ප්‍රමාණය සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් සියයට දහයක් ඉක්මවන අවස්ථාවක, සමාගම විසින්, එහි විගණකවරයාගෙන් හෝ සමාගමට විගණකවරයකු නොමැති නම්, එහි විගණකවරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා සුදුසුකම් ලත් තැනැත්තකුගෙන්—

(අ) සමාගමේ කටයුතුවල තත්වය පිළිබඳව තමා විසින් පරීක්ෂා කර ඇති බවට ; සහ

(ආ) ආධාර දීමෙන් ඉක්බිතිව ම, සමාගම විසින් ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණය සපුරාලීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය, සියලු අවස්ථානුගත කරුණු අනුව, අසාධාරණ යයි පෙන්නුම් කෙරෙන කිසිවක් පිළිබඳව තමා නොදන්නා බවට,

වූ සහතිකයක්, පළමුවෙන් ලබාගන්නේ නම් මිස, සමාගම විසින් ආධාර දෙනු නොලැබිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ මුදල් ආධාර දීම 56 වන වගන්තියේ කාර්ය සඳහා බෙදා හැරීමක් නොවන්නේ ය.

(5) සමාගමක්, මේ වගන්තියේ විධිවිධාන කඩ කරමින් ක්‍රියා කරන අවස්ථාවක පැහැර හැරීම කරනු ලැබූ සමාගමේ සෑම නිලධරයකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් දස ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු පහක් නොඉක්මවන කාලයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම හා දඩය යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

70 වන වගන්තිය මගින් තහනම් කරනු නොලැබූ ගණුදෙනු.

**71**. (1) සමාගමක් විසින්, සමාගමට ම අයත් කොටස් අත්කර ගැනීමේ කාර්යය සඳහා හෝ ඒ සම්බන්ධයෙන් මුදල් ආධාර දීම —

(අ) ආධාර දීමේ දී සමාගමේ ප්‍රධාන අරමුණ, ඒ අත්කර ගැනීමේ කාර්යය සඳහා එසේ ආධාර දීම නොවී නම්, නැතහොත්, ආධාර දීම, සමාගමේ වෙනත් යම් පුළුල් අරමුණක ආනුෂංගික කොටසක් වන්නේ නම් ; සහ

(ආ) ආධාර දීම කරනු ලබන්නේ සද්භාවයෙන් සමාගමේ යහපත සඳහා නම්,

70 වන වගන්තියේ විධිවිධාන, ඒ සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

(2) 70 වන වගන්තියේ විධිවිධාන—

(අ) 56 වන වගන්තිය යටතේ අනුමත කරන ලද කොටස් හිමියකු වෙත කරන ලද බෙදා හැරීමක් ;

(ආ) සමාගම විසින් කොටස් නිකුත් කිරීම ;

(ඇ) සමාගම විසින් කොටස් නැවත මිලට ගැනීමක් හෝ නිදහස් කිරීමක් ;

(ඈ) IX වන කොටසේ විධිවිධාන යටතේ එළඹුණු සමථයක් හෝ X වන කොටසේ විධිවිධාන යටතේ අනුමත කරන ලද සමථයක් හෝ වැඩ පිළිවෙලක් ප්‍රකාර කරන ලද යම් දෙයක් ;

(ඉ) සමාගමක සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලට මුදල් ණයට දීම ඇතුළත් වන අවස්ථාවක, ඒ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවල දී සමාගම විසින් මුදල් ණයට දීම ;

(ඊ) සේවා නියුක්තයන්ගේ කොටස් යෝජනා ක්‍රමයක කාර්ය සඳහා සමාගමක් විසින්, සද්භාවයෙන් සමාගමේ යහපත සඳහා මුදල් ආධාර සැපයීම ;

(උ) සමාගමක් විසින් සද්භාවයෙන් එහි අධ්‍යක්ෂවරයන් හැර, සේවානියුක්තයන්ට සමාගමේ කොටස්වල අර්ථලාභි අයිතිය ඒ සේවානියුක්තයන් විසින් අත්කර ගැනීම හැකි කරවීමේ අදහස ඇතිව ණය ප්‍රදානය කිරීම,

සම්බන්ධයෙන් ද අදාළ නොවිය යුතු ය.

## ප්‍රතිලෝම කොටස් දැරීම්

**72**. (1) (මේ වගන්තියේ 'පාලක සමාගම' යනුවෙන් හඳුන්වනු ලබන) වෙනත් සමාගමක පාලිත සමාගමක් වන්නා වූ සමාගමක් විසින්— පාලිත සමාගමක් පාලක සමාගමක කොටස් දැරීම සම්බන්ධයෙන් සීමා.

(අ) පාලක සමාගමේ කොටස් අත්කර ගනු නොලැබිය යුතු ය ;

(ආ) ඒ පාලිත සමාගම විසින්, එය පාලක සමාගමේ පාලිත සමාගමක් වීමට පෙර අත්කර ගන්නා ලද, පාලක සමාගමේ කොටස් කිසිවක් දිගට ම දැරිය හැකි නමුත්, ඒ කොටස් හා සම්බන්ධව ඡන්දය දීමේ යම් අයිතිවාසිකමක් ක්‍රියාත්මක කළ නොහැකි ය.

(2) (1) වන උපවගන්තියෙහි ඇතුළත් කිසිවක්—

(අ) භාරකරුවකු හෝ නෛතික නියෝජිතයකු වශයෙන් පමණක් පාලක සමාගමේ කොටස් දරන සහ කොටස් විෂයයෙහි අර්ථලාභි සම්බන්ධකමක් නොමැති සමාගමකට ; නැතහොත්,

(ආ) සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවල දී සහ සාමාන්‍ය නියම හා කොන්දේසි මත ඇතුළත් වූ ගණුදෙනුවක කාර්ය සඳහා ඇපයක් වශයෙන් පාලක සමාගමේ කොටස් විෂයයෙහි සම්බන්ධතාවක් දරන සමාගමකට,

අදාළ නොවිය යුතු ය.

(3) (අ) සංස්ථාවක්, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවීමට පෙර, පාලක සමාගමක කොටස් දරන්නකු වූ අවස්ථාවක, ඒ සංස්ථාවට ඒ සමාගමේ සාමාජිකයකු වශයෙන් දිගට ම කටයුතු කළ හැකි නමුත්, සමාගමේ යම් රැස්වීමක දී ඒ කොටස් හා සම්බන්ධව ඡන්දය දීමේ කිසිම අයිතිවාසිකමක් ඒ සංස්ථාවට නොමැත්තේ ය ; තව ද

(ආ) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය සහ මේ උපවගන්තියේ (අ) ඡේදය ප්‍රකාර පාලක සමාගමක සාමාජිකයකු වශයෙන් දිගට ම කටයුතු කිරීමට සංස්ථාවකට අවසර ලැබී ඇති අවස්ථාවක, සමාගමේ

සංචිත ප්‍රාග්ධනීකරණය මගින් සමාගමේ සම්පූර්ණයෙන් ගෙවා නිමි කොටස් පිළිබඳ විභජනයක් වලංගු ලෙස කරනු ලැබිය හැකි අතර, ඒ කොටස් හා සම්බන්ධව ද ඡන්දය දීමේ කිසිම අයිතිවාසිකමක් නොමැත්තේ ය.

(4) (1) වන, (2) වන හා (3) වන උපවගන්තිවල විධිවිධාන, පාලිත සමාගමක් වන සමාගමක නාමිකයකුට අදාළව, සමාගම සම්බන්ධයෙන් වූ සඳහන් කිරීමක් නාමිකයා සම්බන්ධයෙන් වූ සඳහන් කිරීමක් වූවාක් මෙන්, අදාළ විය යුතු ය.

## කොටස් සහ සෘණ පත්‍ර පැවරීම

### හිමිකම පිළිබඳ සාක්ෂි ආදිය

*පැවරුම් සාධන පත්‍රයක් ඉදිරිපත් කළ විට හැර පැවරීම ලියාපදිංචි නොකළ යුතු බව.*

**73**. සමාගමක ව්‍යවස්ථාවලියේ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, නිසි පැවරුම් සාධන පත්‍රයක් සමාගම වෙත භාර දෙනු ලැබ ඇත්නම් මිස, සමාගමේ කොටස් හෝ සෘණ පත්‍ර පැවරුමක් සමාගම විසින් ලියාපදිංචි කිරීම නීත්‍යානුකූල නොවිය යුතු ය :

එසේ වුව ද, නීතිය ක්‍රියාත්මක වීමෙන් සමාගමේ කොටස් හෝ සෘණ පත්‍ර කිසිවක් පිළිබඳ අයිතිය සම්ප්‍රේෂණය කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු වෙත ද, ඒ තැනැත්තා කොටස් හිමියකු හෝ සෘණ පත්‍ර දරන්නකු වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා සමාගම සතු යම් බලයක් කෙරෙහි මේ වගන්තියෙහි ඇතුළත් කිසිවක් බල නොපෑ යුතු ය.

*නීත්‍යානුකූල නියෝජිතයා විසින් පැවරීම.*

**74**. සමාගමක මියගිය කොටස් හිමියකුගේ කොටස් හෝ වෙනත් සම්බන්ධතා ඔහුගේ නීත්‍යානුකූල නියෝජිතයා විසින් පවරනු ලැබීම, ඒ නීත්‍යානුකූල නියෝජිතයා සමාගමේ කොටස් හිමියකු නොවුව ද, පැවරුම් සාධන පත්‍රය ලියා අත්සන් කරන වේලාවේ දී ඔහු සමාගමේ කොටස් හිමියකු වී සිටියාක් මෙන් වලංගු විය යුතු ය.

*පැවරුම්කරුගේ ඉල්ලීම පිට පැවරුමක් ලියා පදිංචි කිරීම.*

**75**. සමාගමක යම් කොටසක හෝ වෙනත් සම්බන්ධතාවක පැවරුම්කරු විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට, පැවරුම්ලාභියා විසින් ම ඇතුළත් කිරීම සඳහා ඉල්ලීම කරනු ලැබූ විටක, කළ යුතු ආකාරයෙන් ම හා ඒ කොන්දේසිවලට ම යටත්ව, සාමාගම විසින් පැවරුම්ලාභියාගේ නම සමාගමේ කොටස් ලේඛනයෙහි ඇතුළත් කරනු ලැබිය යුතු ය.

පැවරුමක් ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම.

**76**. (1) කොටස් හෝ සෘණ පත්‍ර කිසිවක් පැවරීම ලියාපදිංචි කිරීම සමාගමක් විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක, පැවරීම ඒ සමාගම වෙත ඉදිරිපත් කළ දිනයෙන් පසු මාස දෙකක් ඇතුළත ඒ ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම සමාගම විසින් පැවරුම්ලාභියා වෙත යවනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම සමාගමක් විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක—

(අ) සමාගම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පණස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය ; තව ද

(ආ) පැහැර හැරීම කරන ලද සමාගමේ සෑම නිලධරයකු ම, වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පණස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

පැවරුම් සහතික කිරීම.

**77**. (1) සමාගමක කොටස් හෝ සෘණ පත්‍ර පැවරීමේ යම් සාධන පත්‍රයක් සමාගමක් විසින් සහතික කිරීම, ඒ පැවරුම් සාධන පත්‍රයේ නම සඳහන් පැවරුම්කරුට ඒ කොටස් හෝ සෘණ පත්‍ර පිළිබඳව බැලූ බැල්මට පෙනෙන අයිතියක් තිබෙන බව දැන්වීම සඳහා වූ ලේඛන ඒ සමාගම වෙත ඉදිරිපත් කරන ලද බව, ඒ සහතික කිරීම කෙරෙහි විශ්වාසය තබා ක්‍රියා කරන යම් තැනැත්තකුට සමාගම විසින් කියා පෑමක් ලෙස සැලකිය යුතු නමුත්, එය ඒ කොටස් හෝ සෘණ පත්‍ර පිළිබඳව ඒ පැවරුම්කරුට අයිතියක් තිබෙන බව කියාපෑමක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

(2) සමාගමක් විසින් නොසැලකිල්ලෙන් කරන ලද ව්‍යාජ සහතික කිරීමක් කෙරෙහි විශ්වාසය තබා යම් තැනැත්තකු විසින් ක්‍රියා කරන ලද අවස්ථාවක, ඒ සහතික කිරීම වංචාකාරී ලෙස කරන ලද විටක සමාගම යටත් විය යුතු වගකීමට සමානව ම ඒ තැනැත්තාට වගකීමට, ඒ සමාගම යටත් විය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා—

(අ) "සහතික ඉදිරිපත් කරන ලදී" යන වචන හෝ ඒ අර්ථය ඇති වචන පැවරුම් සාධන පත්‍රයක සඳහන් කර තිබේ නම්, එය සහතික කර ඇතැයි සලකනු ලැබිය යුතු ය.

(ආ) පැවරුම් සාධන පත්‍රයක් සහතික කිරීම—

(i) ඒ සාධන පත්‍රය නිකුත් කරන තැනැත්තා, සමාගම වෙනුවෙන් සහතික කරන ලද පැවරුම් සාධන පත්‍ර නිකුත් කිරීමට බලය ලැබූ තැනැත්තකු වන්නා වූ ; සහ

(ii) සමාගම වෙනුවෙන් පැවරුම් සහතික දීමට බලය දී ඇති තැනැත්තකු විසින් හෝ එසේ බලය දී ඇති සමාගමේ නැතහොත්, සංස්ථාවක නිලධරයකු හෝ සේවකයකු විසින් එකී සහතික කිරීම අත්සන් කරනු ලැබ ඇත්තා වූ,

අවස්ථාවක, සමාගමක් විසින් කරන ලද සහතික කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(ඇ) සහතික කිරීමක්—

(i) අතින් ලියනු ලැබුව ද නොලැබුව ද යම් තැනැත්තකුගේ අත්සනින් හෝ තමේ මුල, කුරු වලින් එය සැබෑ බවට සහතික කර ඇතැයි අදහස් කෙරෙන ; සහ

(ii) ඒ අත්සන හෝ මුල'කුරු ඒ තැනැත්තා විසින් ම හෝ සමාගම වෙනුවෙන් පැවරුම් සහතික කිරීමේ කාර්යය සඳහා අත්සන හෝ මුල, කුරු භාවිත කිරීමේ බලය දී ඇති යම් තැනැත්තකු විසින් හෝ නොයෙදූ බව පෙන්වනු නො ලැබුවා වූ,

අවස්ථාවක, ඒ තැනැත්තා විසින් අත්සන් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

සහතික නිකුත් කිරීම සම්බන්ධයෙන් සමාගම සතු යුතුකම්.

**78**. (1) සෑම සමාගමක් විසින් ම, එහි කොටස්, සෑණපත්‍ර හෝ සෑණ පත්‍ර ස්කන්ධ කිසිවක් විභජනය කරන ලද දිනයේ සිට මාස දෙකක් ඇතුළත සහ ඒ කොටස්, සෑණ පත්‍ර හෝ සෑණ පත්‍ර ස්කන්ධ කිසිවක් පැවරීම සමාගම වෙත ඉදිරිපත් කරන ලද දිනයේ සිට මාස දෙකක් ඇතුළත, ඒ කොටස්, සෑණ පත්‍ර හෝ සෑණ පත්‍ර ස්කන්ධ නිකුත් කිරීමේ කොන්දේසිවලින් අන්‍යාකාරයෙන් විධිවිධාන සලස්වා ඇත්නම් මිස, ඒ සියලු ම කොටස් හා සෑණ පත්‍ර පිළිබඳ සහතික කිරීම සහ විභජන කළ හෝ පවරන ලද සියලු ම සෑණ පත්‍ර ස්කන්ධ පිළිබඳ සහතික සම්පූර්ණ කර භාර දීම සඳහා සූදානම් කර තිබිය යුතු ය.

මේ උපවගන්තියේ කාර්ය සඳහා "පැවරීම" යන යෙදුමෙන් විධිමත් පරිදි මුද්‍රා තබනු ලැබුවා වූ ද අන්‍යාකාරයකින් වලංගු වූ ද පැවරීමක් අදහස් වන අතර, යම් හේතුවක් නිසා ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීමට සමාගම හිමිකම් ලබන හා සමාගම විසින් ලියාපදිංචි කරනු නොලබන පැවරීමක් එයට ඇතුළත් නොවේ.

(2) සමාගමක් විසින්, (1) වන උපවගන්තියේ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරිනු ලබන අවස්ථාවක—

(අ) සමාගම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පණස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය; තව ද

(ආ) පැහැර හැරීම කරන ලද සමාගමේ සෑම නිලධරයකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පණස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධාන අනුව ක්‍රියා කිරීමෙහි ලා සිදු කරන ලද යම් පැහැර හැරීමක් යථාවත් කරන ලෙස නියම කරමින් දැන්වීමක් භාර දෙනු ලැබූ දිනයේ සිට දින දහයක් ඇතුළත ඒ පැහැර හැරීම යථාවත් කිරීමට අපොහොසත් වන අවස්ථාවක, සහතික හෝ සෘණ පත්‍ර තමා වෙත භාර දෙනු ලැබීමට හිමිකම් ඇති තැනැත්තා විසින් කරනු ලබන ඉල්ලීමක් මත අධිකරණය විසින්, ආඥාවක් කිරීමෙන්, ඒ ආඥාවේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් කාලයක් ඇතුළත ඒ පැහැර හැරීම යථාවත් කරන ලෙස සමාගමට හා සමාගමේ යම් නිලධරයකුට විධාන කරනු ලැබිය හැකි අතර, ඉල්ලීම පිළිබඳව හා ඊට ආනුෂංගික සියලු ගාස්තු සමාගම විසින් හෝ පැහැර හැරීම සම්බන්ධයෙන් වගකීව යුතු, සමාගමේ යම් නිලධරයකු විසින් හෝ දැරිය යුතු යයි එවැනි යම් ආඥාවකින් විධිවිධාන සලස්වනු ලැබිය හැකි ය.

**79**. යම් කොටස් හිමියකු විසින් දරනු ලබන කොටස් කිසිවක් නිශ්චිතව දැක්වෙන සමාගමේ අධ්‍යක්ෂවරයකු හෝ ලේකම්වරයකු විසින් සමාගමේ නාමය යටතේ අත්සන් කරන ලද සහතිකයක්, ඒ කොටස්වලට කොටස් හිමියා සතු හිමිකම පිළිබඳ බැලූ බැල්මට සාක්ෂියක් විය යුතු ය. සහතිකය හිමිකම පිළිබඳ සාක්ෂියක් විය යුතු බව.

**80**. මියගිය තැනැත්තකුගේ අන්තිම කැමති පත්‍රය පිළිබඳ ප්‍රොබේට් බලපත්‍රය හෝ බූදලය පිළිබඳ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය හෝ පොල්මඃකරු ලෙස ස්ථිර කිරීම හෝ යම් තැනැත්තකු වෙත ප්‍රදානය කර ඇති බවට නීතියෙහි ලා ප්‍රමාණවත් සාක්ෂියක් වන යම් ලේඛනයක් සමාගමක් ප්‍රොබේට් බලපත්‍රය ආදිය ප්‍රදානය කළ බවට සාක්ෂි.

වෙත ඉදිරිපත් කිරීම, එහි සාංගමික ව්‍යවස්ථාවලියේ කුමක් සඳහන්ව ඇත ද, එය ප්‍රදානය කළ බවට ප්‍රමාණවත් සාක්ෂියක් ලෙස සමාගම විසින් පිළිගනු ලැබිය යුතු ය.

### ස්කන්ධ පත්‍ර පිළිබඳ විශේෂ විධිවිධාන

ස්කන්ධ පත්‍ර දරන්නන්ගේ ලේඛනය පරීක්ෂා කිරීමට හා භාර ඔප්පුවේ පිටපත් ගැනීමට ස්කන්ධ පත්‍ර දරන්නන් හා කොටස්හිමියන් සතු අයිතිය.

**81.** (1) ස්කන්ධ පත්‍ර නිකුත් කර ඇති සෑම සමාගමක් විසින් ම, සමාගමේ ස්කන්ධ පත්‍ර දරන්නන්ගේ ලේඛනයක් පවත්වා ගෙන යනු ලැබිය යුතු ය. ඒ ලේඛනය යථා පරිදි වසා ඇති විටක හැර, (එහෙත් එක් එක් දවසේ පැය දෙකකට නොඅඩු කාලයක් පරීක්ෂණය සඳහා අවකාශ දිය යුතු වන පරිදි සමාගම විසින් මහා සභා රැස්වීමේ දී නියම කරනු ලැබිය හැකි සාධාරණ සීමා කිරීම්වලට යටත්ව) ලියාපදිංචි කරනු ලැබූ එවැනි යම් ස්කන්ධ පත්‍ර දරන්නකු හෝ සමාගමේ යම් කොටස්හිමියකු විසින් හෝ ගාස්තුවක් නොමැතිව සහ වෙනත් යම් තැනැත්තකු විසින් රුපියල් දහයක ගාස්තුවක් හෝ සමාගම විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන ඊට අඩු යම් මුදලක් ගෙවා පරීක්ෂා කරනු ලැබීම සඳහා විවෘතව තැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා සාංගමික ව්‍යවස්ථාවලියෙහි හෝ ස්කන්ධ පත්‍රවල හෝ ස්කන්ධ පත්‍ර ස්කන්ධ සම්බන්ධයෙන් වන විට, ස්කන්ධ සහතිකවල හෝ භාර ඔප්පුවේ හෝ ස්කන්ධ පත්‍ර නැතහොත්, ස්කන්ධ පත්‍ර ස්කන්ධ සුරක්ෂිත කෙරෙන වෙනත් ලේඛනයක ඇතුළත් විධිවිධානවලට අනුකූලව එහි නිශ්චිතව සඳහන් යම් අවුරුද්දක දී සම්පූර්ණ වශයෙන් දවස් තිහකට වැඩි නොවූ කාලසීමාවක් හෝ කාලසීමා තුළ ලේඛනයක් වසා තබනු ලැබුවහොත්, එය විධිමත් ලෙස වසා තැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) ඉහත කී පරිදි යම් ලියාපදිංචි ස්කන්ධ පත්‍ර දරන්නකු, කොටස්හිමියකු හෝ වෙනත් යම් තැනැත්තකු විසින්, පිටපත් කිරීමට අවශ්‍ය සෑම පිටුවක් සඳහා ම රුපියල් දහයක් නොඉක්මවන මුදලක් ගෙවීමෙන් සමාගමේ ස්කන්ධ පත්‍ර දරන්නන්ගේ ලේඛනයේ හෝ එහි යම් කොටසක පිටපතක් තමා වෙත සපයන ලෙස ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

(4) මේ ස්කන්ධ පත්‍ර නිකුත් කිරීමක් සුරක්ෂිත කිරීම සඳහා වූ යම් භාර ඔප්පුවක පිටපතක්, ඒ සෑම ස්කන්ධ පත්‍ර දරන්නකුගේ ම ඉල්ලීම අනුව මුද්‍රිත භාර ඔප්පුවක් සම්බන්ධයෙන් වන විට, රුපියල් දහයක් වූ මුදල හෝ සමාගම විසින් නියම කරනු ලැබිය හැකි යම් අඩු මුදලක් ගෙවීම මත, හෝ භාර ඔප්පුවක් මුද්‍රණය කර නොමැති අවස්ථාවක, පිටපත් කිරීමට අවශ්‍ය සෑම වචන එක් සියයක් සඳහා ම රුපියල් එකකට නොවැඩි මුදලක් ගෙවීම මත, ඔහු වෙත යවනු ලැබිය යුතු ය.

(5) ලේඛනය පරීක්ෂා කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබ හෝ ඉහත කී පරිදි එහි පිටපතක් දීම ප්‍රතික්ෂේප කරනු ලැබූ හෝ යවනු නොලැබූ හෝ අවස්ථාවක—

(අ) සමාගම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පණස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය ; තව ද

(ආ) පැහැර හැරීම කරන ලද, සමාගමේ සෑම නිලධරයකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පණස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(6) (5) වන උපවගන්තියේ සඳහන් පරිදි, සමාගමක් විසින් පැහැර හැරීමක් කරනු ලැබූ අවස්ථාවක, ලේඛනය වහාම පරීක්ෂා කරනු ලැබීමට බලකිරීම හෝ ඉහත කී පරිදි ඉල්වූ යම් පිටපතක් එය ඉල්වූ තැනැත්තා වෙත යැවිය යුතු ලෙස විධාන කිරීම අධිකරණය විසින් ආඥාවක් මගින් කරනු ලැබිය හැකි ය.

**82**. සමාගමක අධ්‍යක්ෂවරයකු සමාගමේ සෑණ පත්‍ර දරන්නන් වෙනුවෙන් භාරකරුවකු වශයෙන් පත්කරනු ලැබීමට සුදුස්සකු නොවන්නේ ය : *භාරකරුවන් වශයෙන් ක්‍රියා කිරීම අධ්‍යක්ෂවරයන්ට තහනම් බව.*

එසේ වුව ද, 1982 ජූලි සහ 2 වන දින හෝ එදිනට පෙර කරන ලද පත්වීමක් ප්‍රකාර, සමාගමක සෑණ පත්‍ර දරන්නන් වෙනුවෙන් භාරකරුවකු වශයෙන් ධුරය දරන්නා වූ සමාගමේ යම් අධ්‍යක්ෂවරයකු කෙරෙහි මේ වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු අතර, ඒ අනුව ඒ පත්වීම අවලංගු කරනු ලබන තෙක්, ඒ අධ්‍යක්ෂවරයාට භාරකරුවකු වශයෙන් තවදුරටත් ධුරය දැරිය හැකි ය.

**83**. නියමිත දිනයට පෙර හෝ පසුව හෝ නිකුත් කරනු ලැබුව ද, සෑණ පත්‍ර කිසිවක හෝ ලියා අත්සන් කරනු ලැබූ සෑණ පත්‍ර කිසිවක් සුරක්ෂිත කිරීම සඳහා වූ යම් ඔප්පුවක ඇතුළත් කොන්දේසියක් මගින් සෑණ පත්‍ර නිදහස් කරගත නොහැකි කර තිබීමේ හෝ කොතරම් දුරස්ථ වුව ද, යම් සිද්ධියක් සිදු වූ විට නැතහොත්, කොතරම් දීර්ඝ වුව ද යම් කාලසීමාවක් ඉකුත් වූ විට පමණක් නිදහස් කර ගත හැකි කර තිබීමේ හේතුව නිසාම පමණක්, ඒ කොන්දේසිය අවලංගු නොවිය යුතු ය. *නිත්‍ය සෑණ පත්‍ර.*

නිදහස් කරනු ලැබූ සෘණ පත්‍ර ඇතැම් අවස්ථාවල නැවත නිකුත් කිරීමේ බලය.

**84**. (1) කලින් නිකුත් කරන ලද සෘණ පත්‍ර කිසිවක් සමාගමක් විසින් නිදහස් කරනු ලැබූ අවස්ථාවක—

(අ) ප්‍රකාශිත හෝ ගම්‍යමාන හෝ යම් ප්‍රතිවිරුද්ධ විධිවිධානයක් සාංගමික ව්‍යවස්ථාවලියේ හෝ සමාගම විසින් ඇතුළත් වන ලද යම් ගිවිසුමක ඇතුළත් වන්නේ නම් මිස; නැතහොත්

(ආ) සෘණ පත්‍ර අවලංගු කළ යුතු යයි සමාගම අදහස් කරන බවට යෝජනා සම්මතයක් සම්මත කර ගැනීමෙන් හෝ වෙනත් යම් ක්‍රියාවකින් හෝ සමාගම විසින් ඒ අදහස පැහැදිලි කර ඇත්නම් මිස,

එවිට, ඒ සෘණ පත්‍රය නැවත නිකුත් කිරීමෙන් හෝ ඒවා වෙනුවෙන් වෙනත් සෘණ පත්‍ර නිකුත් කිරීමෙන් හෝ සෘණ පත්‍ර නැවත නිකුත් කිරීමේ බලය සමාගම සතුව තිබිය යුතු අතර, සෑම කල්හිම ඒ බලය සමාගම සතුව තිබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) නිදහස් කරන ලද සෘණ පත්‍ර නැවත නිකුත් කරනු ලැබූ විට, සෘණ පත්‍රවල හිමිකම ලැබූ තැනැත්තාට කිසි විටෙක සෘණ පත්‍ර නිදහස් කරනු නොලැබුවාක් මෙන් ප්‍රමුඛත්වය ලැබිය යුතු අතර, සෑම කල්හි ම ඒ ප්‍රමුඛත්වය ඔහුට ලැබී තිබුණු ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) ජංගම ගිණුමකින් හෝ අන්‍යාකාරයකින් කලින් කල අත්තිකාරම් ගැනීම සුරක්ෂිත කිරීම පිණිස සමාගමක් විසින් ස්වකීය සෘණ පත්‍ර කිසිවක් තැන්පත් කර ඇති අවස්ථාවක, සෘණ පත්‍ර එසේ තැන්පත් කර තිබිය දී සමාගමේ ගිණුම හර තත්ත්වයේ තිබීම නතර වී තිබීමේ හේතුව නිසාම පමණක්, ඒ සෘණ පත්‍ර නිදහස් කරනු ලැබ ඇතැයි සලකනු නොලැබිය යුතු ය.

(4) සමාගමක් විසින් මේ වගන්තියෙන් පවරා දී ඇත්තා වූ හෝ එය සතුව ඇතැයි සලකනු ලබන්නා වූ බලය යටතේ සෘණ පත්‍රයක් නැවත නිකුත් කිරීම හෝ ඒ වෙනුවට වෙනත් සෘණ පත්‍රයක් නිකුත් කිරීම, මුද්දර ගාස්තු පිළිබඳ කාර්ය සඳහා අලුත් සෘණ පත්‍රයක් නිකුත් කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය. එහෙත්, නිකුත් කිරීමට ඇති සෘණ පත්‍රවල ප්‍රමාණය හෝ සෘණ පත්‍ර සංඛ්‍යාව සීමා කෙරෙන යම් විධිවිධානයක් පිළිබඳ කාර්ය සඳහා එසේ සලකනු නොලැබිය යුතු ය :

එසේ වුව ද, මේ වගන්තියේ විධිවිධාන යටතේ නැවත නිකුත් කරනු ලැබූ විධිමත් ලෙස මුද්දර ගසා ඇති බව පෙනී යන සෘණ පත්‍රයක ඇපය පිට මුදල් ණයට දෙන යම් තැනැත්තකු විසින්, සෘණ පත්‍රයට විධිමත්

ලෙස මුද්දර අළවා නොමැති බව ඔහු දැන සිටියේ නම් හෝ ඔහුගේ නොසැලකිලිමත්කම නිසා නොවන්නට ඒ බව ඔහු විසින් අනාවරණය කරගත හැකිව තිබුණේ නම් මිස, ඔහුගේ ඇපය බලාත්මක කිරීම සඳහා වූ යම් නඩු කටයුතුවල දී, ඒ සම්බන්ධයෙන් මුද්දර ගාස්තු හෝ යම් දඩ ගෙවීමක් නොමැතිව, සෘණ පත්‍රය සාක්ෂි වශයෙන් ඉදිරිපත් කළ හැකි ය. එවැනි යම් අවස්ථාවක, නිසි මුද්දර ගාස්තුව හා දඩය ගෙවීමට සමාගම යටත් විය යුතු ය.

(5) නියමිත දිනයට පෙර ඇති කරගත් යම් උකසක් හෝ සෘණ භාරයක් යටතේ හෝ ඒ ප්‍රකාර, යම් තැනැත්තකුට ලැබිය හැකිව තිබූ යම් අයිතිවාසිකමකට හෝ ප්‍රමුඛත්වයකට, ඒ දිනයට පෙර නිදහස් කරනු ලැබූ සෘණ පත්‍ර ඒ දිනට පසු නැවත නිකුත් කිරීමෙන් හානියක් සිදු නොවිය යුතු ය.

**85**. සමාගමක සෘණ පත්‍ර කිසිවක් භාර ගෙන, ඒ සම්බන්ධයෙන් ගෙවීම් කිරීම පිණිස සමාගම සමඟ ඇති කරගත් ගිවිසුමක්, එසේම ඉටුකිරීම සඳහා වූ ආඥාවක් මගින් බලාත්මක කරනු ලැබිය හැකි ය. සෘණ පත්‍රවලට සහභාගිවීම සඳහා වූ ගිවිසුම් එසේම ඉටුකිරීම.

## V වන කොටස

## කොටස් හිමියන් සහ ඔවුන්ගේ අයිතිවාසිකම් හා බැඳීම්

**86**. (1) මේ පනතෙහි, "කොටස් හිමියා" යන යෙදුමෙන්— "කොටස් හිමියා" යන්නෙහි අර්ථය.

(අ) සමාගමේ කොටස් එකක් හෝ ඊට වැඩි ගණනක් තත් කාලයේ දරන්නා වශයෙන් කොටස් නාම ලේඛනයෙහි නම ඇතුළත් වන්නා වූ තැනැත්තෙක් ;

(ආ) සමාගමක් සංස්ථාගත කිරීම සඳහා වූ ඉල්ලීමක, ඒ සමාගම ලියාපදිංචි කරනු ලබන අවස්ථාවේ දී යම් තැනැත්තකුගේ නම කොටස් නාම ලේඛනයෙහි ඇතුළත් කරන තෙක් කොටස්හිමියකු වශයෙන් නම් කර ඇති තැනැත්තෙක් ;

(ඇ) කොටස් නාමලේඛනයෙහි යම් තැනැත්තකුගේ නම ඇතුළත් කරනු ලබන තෙක්, ඒ තැනැත්තාගේ නම, ලියාපදිංචි කරන ලද ඒකාබද්ධ කිරීමේ යෝජනාවක් යටතේ ඒකාබද්ධ කරන ලද සමාගමක කොටස්හිමියකු වශයෙන් ඒ කොටස් නාම ලේඛනයෙහි ඇතුළත් කර තැබීමට හිමිකම් ලබන තැනැත්තෙක් ;

(ඇ) කොටස් නාම ලේඛනයෙහි යම් තැනැත්තකුගේ නම ඇතුළත් කරනු ලබන තෙක්, කොටස් නාම ලේඛනයෙහි නම ඇතුළත් කළ යුතු එහෙත් නාම ලේඛනයෙහි නම ඇතුළත් කරනු ලැබ නොමැති සහ කොටසක් පවරනු ලැබ ඇති තැනැත්තෙක්,

අදහස් වේ.

(2) 129 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ සමාගමක කොටස් කිසිවක් සම්බන්ධයෙන් වූ යම් භාරයක් පිළිබඳ දැන්වීමක් කොටස් නාමලේඛනයෙහි ඇතුළත් කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ කොටස් භාරයක් වශයෙන් දරනු ලබන්නේ යම් තැනැත්තකුගේ ප්‍රතිලාභය සඳහා ද ඒ තැනැත්තා—

(අ) සමාගමේ කොටස් හිමියකු ලෙස සලකනු ලැබිය යුතු ය; තව ද

(ආ) ඔහුගේ නම, ඒ කොටස්හිමියා වශයෙන් කොටස් නාම ලේඛනයෙහි ඇතුළත් කරන ලද්දක් මෙන් සලකා මේ පනත යටතේ යම්තාක් වූ සියලු අයිතිවාසිකම් හා වරප්‍රසාද භුක්ති විඳිය යුතු අතර, යම්තාක් වූ සියලු යුතුකම්වලට හා බැඳීම්වලට යටත් විය යුතු ය.

(3) කොටස් පවරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු වෙත ද, ඒ තැනැත්තාගේ නම කොටස් නාම ලේඛනයෙහි ඇතුළත් කිරීමට සමාගමක් විසින් සාවද්‍ය ලෙස පැහැර හරිනු ලැබ ඇති අවස්ථාවක, ඒ තැනැත්තා—

(අ) සමාගමේ කොටස් හිමියකු ලෙස සලකනු ලැබිය යුතු ය; තව ද,

(ආ) ඔහුගේ නම, ඒ කොටස්හිමියා වශයෙන් කොටස් නාම ලේඛනයෙහි ඇතුළත් කරන ලද්දාක් මෙන් සලකා මේ පනත යටතේ යම්තාක් වූ සියලු අයිතිවාසිකම් හා වරප්‍රසාද භුක්ති විඳිය යුතු අතර, යම්තාක් වූ සියලු යුතුකම්වලට හා බැඳීම්වලට යටත් විය යුතු ය.

## කොටස් හිමියන් සතු වගකීම

කොටස්හිමියන් සතු වගකීම.

**87**. (1) යම් කොටස් හිමියකු, කොටස් හිමියකු වීමේ හේතුව නිසාම පමණක් සමාගමේ යම් ක්‍රියාවකට, පැහැර හැරීමකට හෝ බැඳීමකට යටත් නොවිය යුතු ය.

(2) සමාගම කෙරෙහි කොටස් හිමියකු සතු වගකීම, සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියෙහි හෝ මේ පනත යටතේ ප්‍රකාශිතව ම විධිවිධාන සලස්වා ඇති යම් වගකීමකට සීමා විය යුතු ය.

(3) කොටස් නිකුත් කිරීම සම්බන්ධයෙන් හෝ යම් සිවිල් වරදක් සම්බන්ධයෙන් හෝ කොටස් හිමියා විසින් සිදු කරන ලද විශ්වාසනීය යුතුකමක් පැහැර හැරීමක් හෝ නඩු පැවරිය හැකි වෙනත් සිවිල් වරදක් සම්බන්ධයෙන් වූ ගිවිසුමක් ද ඇතුළුව, යම් ගිවිසුමක් යටතේ සමාගමක් කෙරෙහි කොටස් හිමියකු සතු වගකීමකට මේ වගන්තියෙහි ඇතුළත් කිසිවක් බල නොපෑ යුතු ය.

**88**. (1) 269 වන වගන්තියට යටත්ව, යම් කොටසක් දැරීම නිසා, එය දරන්නා, ඇරයුම්වලට යටත් වන්නා වූ හෝ එය දරන්නා වෙත අන්‍යාකාරයෙන් වගකීම පැවරෙන්නා වූ අවස්ථාවක, ඒ කොටස එහි වත්මන් දරන්නාගේ නමින් ලියාපදිංචි කරනු ලැබීමට පෙර, වගකීම බලාත්මක වුව ද නොවුව ද, ඒ වගකීම, කොටස කලින් දැරූ තැනැත්තා වෙත නොව, තත් කාලයේ දරන තැනැත්තා වෙත යා විය යුතු ය. ඇරයුම් සම්බන්ධයෙන් වගකීම.

(2) (අ) යම් කොටසක් නිකුත් කිරීම සම්බන්ධයෙන් ගෙවිය යුතු මුළු ප්‍රතිෂ්ඨාව ම හෝ එහි ම කොටසක් ගෙවා නොමැති; සහ

(ආ) කොටස නිකුත් කරන ලද්දේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තා ඒ කොටස තවදුරටත් නොදරන අවස්ථාවක,

ගෙවා නොමැති ඒ ප්‍රතිෂ්ඨාව සම්බන්ධයෙන් වූ වගකීම තදනන්තර කොටස් හිමියන් වෙත යා නොවිය යුතු ය. එහෙත් ඒ වගකීම, කොටස නිකුත් කරන ලද්දේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තාගේ හෝ කොටස නිකුත් කරන ලද අවස්ථාවේ දී වගකීම භාරගත් වෙනත් යම් තැනැත්තකුගේ වගකීම ලෙස පැවතිය යුතු ය.

**89**. සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ පටහැනිව කුමක් සඳහන් වුව ද, යම් යෝජනා සම්මතයක් මගින් හෝ කොටස් කිසිවක් දැරීමෙන් සමාගම කෙරෙහි කොටස් හිමියාගේ වගකීම වැඩි කෙරෙන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, යෝජනා සම්මතයෙන් බැඳීමට හෝ කොටස් පිළිගැනීමට හෝ කොටස් හිමියා ලියවිල්ලක් මගින් එකඟවන්නේ නම් මිස— වගකීම වැඩි කිරීමට කොටස් හිමියන් එකඟ විය යුතු බව.

(අ) කොටස් හිමියකු, සාංගමික ව්‍යවස්ථාවලිය වෙනස් කෙරෙන යෝජනා සම්මතයක් මගින් නොබැඳිය යුතු ය; නැතහොත්

(ආ) කොටස් හිමියකුට සමාගමේ කොටස් අත්කර ගැනීමට හෝ වැඩි ගණනක් දැරීමට නියම කරනු නොලැබිය යුතු ය.

### කොටස් හිමියන්ගේ බලතල

කොටස් හිමියන්ට විශේෂ වූ බලතල ක්‍රියාත්මක කිරීම.

**90**. (1) මේ පනත මගින් සමාගමක කොටස් හිමියන්ට විශේෂ වූ බලතල—

(අ) කොටස් හිමියන්ගේ රැස්වීමක දී ; හෝ

(ආ) රැස්වීමක් වෙනුවට, 144 වන වගන්තිය ප්‍රකාර, යෝජනා සම්මතයක් මගින්,

පමණක් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(2) සමාගමක සාංගමික ව්‍යවස්ථාවලිය මගින් සමාගමේ කොටස් හිමියන්ට විශේෂ වූ බලතල ව්‍යවස්ථාවලියට යටත්ව—

(අ) කොටස් හිමියන්ගේ රැස්වීමක දී ; හෝ

(ආ) රැස්වීමක් වෙනුවට 144 වන වගන්තියට අනුව යෝජනා සම්මතියක් මගින්,

පමණක් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

සාමාන්‍ය යෝජනා සම්මතයක් මගින් බලතල ක්‍රියාත්මක කිරීම.

**91**. මේ පනත මගින් හෝ සමාගමක සාංගමික ව්‍යවස්ථාවලියෙහි අන්‍යාකාරයෙන් විධිවිධාන සලස්වා ඇත්නම් මිස, කොටස් හිමියන්ට විශේෂ වූ යම් බලයක් සාමාන්‍ය යෝජනා සම්මතයක් මගින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

විශේෂ යෝජනා සම්මතයක් මගින් ක්‍රියාත්මක කරනු ලබන බලතල.

**92**. (1) සමාගමක සාංගමික ව්‍යවස්ථාවලියේ පටහැනිව කුමක් සඳහන් වුව ද—

(අ) සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය වෙනස් කිරීමේ;

(ආ) මේ පනතේ 185 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) හෝ (ආ) ඡේදවල කාර්ය සඳහා විශාල ගණුදෙනුවක් අනුමත කිරීමේ;

(ඇ) මේ පනතේ 241 වන වගන්තිය යටතේ සමාගම ඒකාබද්ධ කිරීමක් අනුමත කිරීමේ;

(ඈ) සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය අඩු කිරීමේ;

(ඉ) මේ පනතේ 319 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) හෝ (ඇ) ඡේද ප්‍රකාර සමාගම ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමිය යුතු යයි යෝජනා සම්මත කිරීමේ;

(ඊ) සමාගමක නම වෙනස් කිරීමේ; හෝ

(උ) සමාගමක තත්ත්වය වෙනස් කිරීමේ,

බලයක් කොටස් හිමියන් විසින් ක්‍රියාත්මක කරනු ලබන විට, ඒ බලය විශේෂ යෝජනා සම්මතයක් මගින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ, (ආ) ඡේදයේ හෝ (ඇ) ඡේදයේ සඳහන් බලයකට අදාළව සම්මත කරන ලද විශේෂ යෝජනා සම්මතයක්, වෙනත් විශේෂ යෝජනා සම්මතයක් මගින් පමණක් පරිච්ඡින්න කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තියේ (ඈ) ඡේදයේ හෝ (ඉ) ඡේදයේ සඳහන් බලයකට අදාළව සම්මත කරන ලද විශේෂ යෝජනා සම්මතයක්, ඉන් අනතුරුව පරිච්ඡින්න කළ නොහැකි ය.

### සුළු කොටස් හිමියන්ගේ කොටස් මිල දී ගැනීමේ අයිතිවාසිකම්

**93**. 92 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ දක්වා ඇති බලය ක්‍රියාත්මක කිරීමේ දී කොටස් හිමියකු ඡන්දය දීමට හිමිකම් ලබන හා, සමාගම නිරත විය හැකි හෝ 92 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ හෝ (ඇ) ඡේදයේ දක්වා ඇති ව්‍යාපාර කටයුතු හෝ කටයුතු විෂයයෙහි සීමාවක් යෝජිත වෙනස් කිරීම මගින් නියම කරන හෝ ඉවත් කරන හා ඒ බලතල ක්‍රියාත්මක කිරීමට කොටස් හිමියන් විසින් යෝජනා සම්මත කරනු ලබන අවස්ථාවක, සහ— කොටස් මිලට ගන්නා ලෙස, කොටස් හිමියකු විසින් සමාගමෙන් ඉල්ලා සිටිය හැකි බව.

(අ) කොටස් හිමියාගේ නමින් ලියාපදිංචි කර ඇති හා එම අර්ථලාභී අයිතිකරුට ම ඇති, කොටස්වලට සම්බන්ධ සියලු ඡන්ද ඒ බලය ක්‍රියාත්මක කිරීමට එරෙහිව කොටස් හිමියා විසින් දෙනු ලබන අවස්ථාවක ; හෝ

(ආ) බලය ක්‍රියාත්මක කිරීම සඳහා වූ යෝජනා සම්මතය, 144 වන වගන්තිය යටතේ සම්මත කරනු ලැබූ අවස්ථාවක, කොටස් හිමියාගේ නමින් ලියාපදිංචි කර ඇති හා එකම අර්ථලාභී

අයිතිකරුට ම ඇති කොටස් සම්බන්ධයෙන් වූ යෝජනා සම්මතය කොටස්හිමියකු විසින් අත්සන් කර නොමැති අවස්ථාවක,

ඒ කොටස් 94 වන වගන්තියට අනුකූලව මිල දී ගන්නා ලෙස සමාගමෙන් ඉල්ලා සිටීමට ඒ කොටස් හිමියා හිමිකම් ලබන්නේ ය.

මිල දී ගන්නා ලෙස ඉල්ලා සිටින දැන්වීම.

**94**. (1) 93 වන වගන්තියේ හෝ 100 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර, කොටස් මිල දී ගන්නා ලෙස සමාගමෙන් ඉල්ලා සිටීමට හිමිකම් ලබන කොටස්හිමියකු විසින්—

(අ) කොටස් හිමියන්ගේ රැස්වීමක දී යෝජනා සම්මත කිරීමෙන් වැඩ කරන දින දහයක් ඇතුළත ; හෝ

(ආ) යෝජනා සම්මත, සම්මත කිරීම පිළිබඳ දැන්වීම කොටස් හිමියා වෙත දෙනු ලැබූ දිනයෙන් පසු වැඩ කරන දින දහයක් ඉකුත්වීමට පෙර, 144 වන වගන්තිය යටතේ යෝජනා සම්මතය සම්මත කරනු ලැබූ අවස්ථාවක,

ඒ කොටස් මිල දී ගන්නා ලෙස සමාගමෙන් ඉල්ලා සිටිමින් සමාගමට ලියවිල්ලකින් වූ දැන්වීමක් දෙනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් ලැබීමෙන් වැඩ කරන දින විස්සක් ඇතුළත අධ්‍යක්ෂ මණ්ඩලය විසින්—

(අ) සමාගම විසින් කොටස් මිල දී ගැනීම සම්බන්ධයෙන් එකඟ විය යුතු ය ;

(ආ) වෙනත් යම් තැනැත්තකු විසින් කොටස් මිල දී ගැනීම සම්බන්ධයෙන් එකඟවීම පිණිස වැඩපිළිවෙලක් පිළියෙල කළ යුතු ය ;

(ඇ) 97 වන වගන්තිය හෝ 98 වන වගන්තිය යටතේ ආඥාවක් ලබා ගැනීම සඳහා අධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු ය ; නැතහොත්

(ඈ) අවස්ථාවෝචිත පරිදි, 92 වගන්තියට අනුකූලව යෝජනා සම්මතය පරිච්ඡින්න කිරීම සඳහා අදාළ ක්‍රියා මාර්ගය ගැනීමට පෙර කටයුතු පිළියෙල කිරීම හෝ අදාළ ක්‍රියා මාර්ගය නොගැනීම සඳහා උචිත ආකාරයෙන් තීරණය කිරීම, කළ යුතු ය.

තව ද, මේ උපවගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගන්නා ලද තීරණය ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් කොටස් හිමියා වෙත දෙනු ලැබිය යුතු ය.

**95**. (1) සමාගම විසින් කොටස් මිල දී ගැනීම සම්බන්ධයෙන් 94 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි (අ) ඡේදය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එකඟ වනු ලබන අවස්ථාවක, ඒ උපවගන්තිය යටතේ දැනුම් දෙනු ලැබූ විට, හෝ එසේ කිරීමෙන් වැඩ කරන දින පහක් ඇතුළත අධ්‍යක්ෂ මණ්ඩලය විසින්— සමාගම විසින් මිල දී ගැනීම.

(අ) අත්කරගනු ලැබිය යුතු කොටස් සම්බන්ධයෙන් සාධාරණ හා යුක්තිසහගත මිලක් නියම කරනු ලැබිය යුතු ය ; තව ද

(ආ) ඒ කොටස් හිමියා වෙත නියම කරන ලද මිල පිළිබඳව දැනුම්දීමක් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක් කොටස් හිමියා වෙත ලැබුණු විටක, සමාගම විසින් කොටස් මිල දී ගනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කරන ලද මිල සාධාරණ හෝ යුක්තිසහගත නොවන්නේ යයි සලකන කොටස් හිමියකු විසින්, විරෝධතා දැන්වීමක් සමාගම වෙත වහාම දෙනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ කොටස් හිමියකු වෙත දැන්වීමක් දීමෙන් වැඩ කරන දින දහයක් ඇතුළත, මිල සම්බන්ධයෙන් වූ කිසිදු විරෝධතාවක් සමාගම වෙත ලැබී නොමැති නම්—

(අ) නියම කරන ලද මිල සමාගම විසින් කොටස් හිමියා වෙත වහාම ගෙවනු ලැබිය යුතු ය ; තව ද

(ආ) කොටස් සම්බන්ධයෙන් වූ යම් කොටස් සහතිකයක් කොටස් හිමියා විසින් සමාගම වෙත වහාම භාර දෙනු ලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ කොටස් හිමියකු වෙත දැන්වීමක් දීමෙන් වැඩ කරන දින දහයක් ඇතුළත, මිල සම්බන්ධයෙන් වූ විරෝධතාවක් සමාගම වෙත ලැබී ඇත්නම්, වැඩ කරන දින පහක් ඇතුළත සමාගම විසින්—

(අ) සාධාරණ හා යුක්තිසහගත මිල කවරක් වන්නේ ද යන ප්‍රශ්නය සමාගමේ විගණකවරයන් වෙත යොමු කරනු ලැබිය යුතු ය ; තව ද

(ආ) කොටස් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කරන ලද මිලට සමාන තාවකාලික මිලක් ගෙවනු ලැබිය යුතු ය,

සමාගම විසින් තාවකාලික මිල ගෙවනු ලැබූ විට, කොටස් සම්බන්ධයෙන් වූ යම් කොටස් සහතිකයක් කොටස් හිමියා විසින් සමාගම වෙත වහාම භාර දෙනු ලැබිය යුතු ය.

(6) (5) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ යොමු කිරීමක් කරනු ලැබූ අවස්ථාවක, මිල දී ගත යුතු කොටස් සම්බන්ධයෙන් සාධාරණ හා යුක්තිසහගත මිලක් විගණකවරයා විසින් කඩිනමින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(7) (6) වන උපවගන්තිය යටතේ නිශ්චය කරනු ලැබූ මිල—

(අ) ඒ වනවිටත් ගෙවා ඇති තාවකාලික මිල ඉක්මවන අවස්ථාවක, කොටස් හිමියාට අයවිය යුතු ඉතිරි මුදල සමාගම විසින් වහාම ගෙවනු ලැබිය යුතු ය ; නැතහොත්

(ආ) ඒ වනවිටත් ගෙවා ඇති තාවකාලික මිලට වඩා අඩුවන අවස්ථාවක, කොටස් හිමියා විසින් අතිරික්තය වහාම සමාගම වෙත ආපසු ගෙවනු ලැබිය යුතු ය.

(8) (7) වන උපවගන්තිය යටතේ ගෙවිය යුතු යම් ඉතිරි මුදලක් හෝ ආපසු ගෙවිය යුතු අතිරික්තයක් මත, සුදුසු යයි විගණකවරයන් කල්පනා කරන යම් අනුපාතිකයක් අනුව, ගෙවනු ලැබූ තාවකාලික මිල යුක්ති සහගත ද යන වග සැළකිල්ලට ගෙන, විගණකවරයන් විසින් පොලී නිශ්චය කරනු ලැබිය හැකි ය.

(9) විගණකවරයන් වෙත (5) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ, ප්‍රශ්නයක් යොමු කිරීම පාර්ශ්වකරුවන් විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක, (3) වන උපවගන්තිය යටතේ විරෝධතා දැන්වීමක් දී ඇති කොටස් හිමියෙක් විසින් සහ (6) වන උපවගන්තිය යටතේ තීරණය කරන ලද මිල පිළිබඳ සෑහීමකට පත් නොවූ කොටස් හිමියකු විසින් කොටස්වලට සාධාරණ සහ යුක්ති සහගත මිලක් තීරණය කිරීම පිණිස යයි හා සුදුසු පුද්ගලයකු පත් කරන ලෙස අධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, මේ වගන්තියේ කාර්යය සඳහා සුදුසු යයි අධිකරණය කල්පනා කරන යම් තැනැත්තකු අධිකරණය විසින්

පත් කරනු ලැබිය හැකි ය. එසේ අධිකරණය විසින් පත් කරන ලද තැනැත්තකු (8) වන උපවගන්තියේ විධිවිධාන පරිදි පොළී ප්‍රදානය කළ හැකි ය.

(10) මේ වගන්තිය යටතේ සමාගමක් විසින් කොටස් මිලට ගැනීමක්, 56 වන වගන්තියේ කාර්යය සඳහා බෙදාහැරීමක් ලෙස සලකනු නොලැබිය යුතු නමුත්, 61 වන වගන්තියේ (1) වන සහ (3) වන උපවගන්තිවල කාර්යය සඳහා බෙදාහැරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

තුන්වන පාර්ශ්වකරුවකු විසින් කොටස් මිල දී ගැනීම.

**96**. (1) 94 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයෙහි විධිවිධානවලට අනුකූලව මිල දී ගැනීම සඳහා සමාගම විසින් වැඩපිළිවෙලකට ඇතුළත් වී ඇත්තේ යම් තැනැත්තකු සමග ද ඒ තැනැත්තා විසින් කොටස් මිල දී ගැනීම සම්බන්ධයෙන්, 95 වන වගන්තියේ විධිවිධාන අවශ්‍ය විය හැකි යම් සුළු වශයෙන් වූ වෙනස් කිරීම්වලට යටත්ව, සහ විශේෂයෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලය හා සමාගම සම්බන්ධයෙන් ඒ වගන්තියේ වූ සඳහන් කිරීම් ඒ තැනැත්තා සම්බන්ධයෙන් වූ සඳහන් කිරීම් වූවාක් මෙන්, අදාළ විය යුතු ය.

(2) වැඩපිළිවෙලට අනුකූලව මිල දී ගනු ලබන කොටස්වල සෑම කොටස් හිමියකු ම, අවස්ථාවෝචිත පරිදි, 95 වන වගන්තියේ (6) වන හෝ (9) වන උපවගන්තිවල නියම කරන ලද හෝ ස්ථිර කරන ලද මිලට, කොටස් මිලට ගැනීමට එකඟ වූ තැනැත්තාගේ පැහැර හැරීම හේතුකොට ගෙන ඒ කොටස් හිමියාට දැරීමට සිදුවිය හැකි යම් පාඩුවක් සම්බන්ධයෙන්, සමාගම විසින් හානිපූරණය කරනු ලැබිය යුතු ය.

අධිකරණය විසින් නිදහස් කිරීමක් ප්‍රදානය කළ හැකි බව.

**97**. (1) 94 වන වගන්තිය යටතේ දැන්වීමක් දී ඇත්තේ යම් සමාගමකට ද, ඒ සමාගම විසින් ඒ දැන්වීම අදාළ වන්නා වූ කොටස්—

(අ) මිල දී ගැනීම අසමානුපාතිකව සමාගමට හානිදායක වීම ; හෝ

(ආ) මිල දී ගැනීම සඳහා මුදල් වියදම් කරන ලෙසට යුක්තිසහගතව සමාගමට නියම කළ නොහැකි වීම,

යන හේතු මත, මිල දී ගැනීමේ බැඳීමෙන් සමාගම නිදහස් කරන ලෙසට ආඥාවක් ලබා ගැනීම සඳහා අධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් මත, අධිකරණය විසින්, කොටස් මිල දී ගැනීමේ බැඳීමෙන් සමාගම නිදහස් කරමින් ආඥාවක් කරනු ලැබිය හැකි අතර—

(අ) කොටස් හිමියන්ගේ යෝජනා සම්මතයක් ඉවත් කරන ;

(ආ) ආඥාවේ සඳහන් යම් ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙස හෝ ගැනීමෙන් වැළකී සිටින ලෙස විධාන කරන ;

(ඇ) හානියට පත් කොටස් හිමියන්ට වන්දි ගෙවන ලෙස සමාගමට නියම කරන ; හෝ

(ඈ) අධිකරණය විසින් සමාගම ගණන් බේරා වසා දමන ලෙසට,

ආඥාවක් ද ඇතුළුව, සුදුසු යයි අධිකරණය කල්පනා කරන වෙනත් යම් ආඥාවක් ද කරනු ලැබිය හැකි ය.

(3) 94 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයට අනුකූලව වෙනත් තැනැත්තකු විසින් කොටස් මිල දී ගැනීම සඳහා වැඩපිළිවෙලක් යෙදීමට සමාගම යුක්තිසහගත ලෙස උත්සාහ කර ඇති බවට අධිකරණය සෑහීමට පත්වන්නේ නම් මිස, අධිකරණය විසින්, මේ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ වූ ආඥාවක් කරනු නොලැබිය යුතු ය.

සමාගම වස්තු භංගත්වයට පත්ව ඇත්නම්, අධිකරණය විසින් නිදහස් කිරීමක් ප්‍රදානය කළ හැකි බව.

**98.** (1) 94 වන වගන්තිය යටතේ සමාගමක් වෙත දැන්වීමක් දෙනු ලැබ ඇති, සහ—

(අ) සමාගම විසින් කොටස් මිල දී ගැනීමෙන් පසුව, ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණය සපුරාලීමට සමාගම අපොහොසත් වන්නේ යයි මණ්ඩලය විසින් සලකනු ලබන ; සහ

(ආ) 94 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධානවලට අනුකූලව වෙනත් තැනැත්තකු විසින් කොටස් මිල දී ගැනීම සඳහා වැඩපිළිවෙලක් යෙදීමට සමාගම විසින් යුක්තිසහගත ලෙස උත්සාහ කර ඇති නමුත්, එසේ කිරීමට සමාගමට නොහැකිව ඇති,

අවස්ථාවක, ඒ කොටස් මිල දී ගැනීමේ බැඳීමෙන් සමාගම නිදහස් කරන ආඥාවක් ලබා ගැනීම සඳහා සමාගම විසින් අධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) කොටස් මිල දී ගැනීමෙන් පසුව ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණ සපුරාලීමට සමාගම අපොහොසත් වන්නේ යයි සහ 94 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයට අනුකූලව වෙනත් තැනැත්තකු විසින් කොටස් මිල දී ගැනීම සඳහා වැඩ පිළිවෙලක් යෙදීමට සමාගම විසින් යුක්තිසහගත ලෙස උත්සාහ කර ඇති බවට අධිකරණය සෑහීමට පත් වූ අවස්ථාවක, (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් මත, අධිකරණය විසින්—

(අ) කොටස් මිල දී ගැනීමේ බැඳීමෙන් සමාගම නිදහස් කරන ආඥාවක් ;

(ආ) කොටස් මිල දී ගැනීමේ බැඳීම අත්හිටුවන ආඥාවක් ; හෝ

(ඇ) 97 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි සඳහන් යම් ආඥාවක් ඇතුළුව, සුදුසු යයි අධිකරණය කල්පනා කරන වෙනත් යම් ආඥාවක්,

කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා මිල දී ගැනීමෙන් පසුව ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණය සපුරාලීමට සමාගම අපොහොසත් වේ ද යන වග නිශ්චය කිරීමේ දී, සමාගමක ප්‍රකාශිත ප්‍රාග්ධනය සැලකිල්ලට ගනු නොලැබිය යුතු ය.

**99**. (1) කොටස් හා සම්බන්ධ අයිතිවාසිකම් කෙරෙහි බලපෑමක් ඇති කළ හැකි යම් ක්‍රියා මාර්ගයක් ගැනීම, සම්බන්ධතාවක් දක්වන එක් එක් කණ්ඩායම විසින් විශේෂ යෝජනා සම්මතයක් මගින් අනුමත කරනු ලැබ ඇත්නම් මිස, එවැනි ක්‍රියා මාර්ගයක් සමාගමක් විසින් ගනු නොලැබිය යුතු ය. කොටස් හිමි අයිතිවාසිකම් වෙනස් කිරීම.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා කොටසක් හා සම්බන්ධ අයිතිවාසිකම්වලට—

(අ) ඡන්දය දීමේ අයිතිවාසිකම් හා බෙදා හැරීමේ අයිතිවාසිකම් ද ඇතුළුව මේ පනත හෝ සාංගමික ව්‍යවස්ථාවලිය යටතේ වූ කොටසක් හා සම්බන්ධ අයිතිවාසිකම්, වරප්‍රසාද, සීමා කිරීම් හා කොන්දේසි ;

(ආ) 53 වන වගන්තිය යටතේ වූ පූර්වක්‍රය අයිතිවාසිකම් ;

(ඇ) මේ වගන්තියෙහි දක්වා ඇති කාර්ය පටිපාටිය හා සාංගමික ව්‍යවස්ථාවලිය සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම සම්බන්ධයෙන් සාංගමික ව්‍යවස්ථාවලිය මගින් නියම කර ඇති යම් වැඩිපුර කාර්ය පටිපාටියක් සමාගම විසින් පිළිපදිනු ලබන බවට වගබලා ගැනීමේ අයිතිවාසිකම ; සහ

(ඈ) සාංගමික ව්‍යවස්ථාවලිය සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම සම්බන්ධයෙන් සාංගමික ව්‍යවස්ථාවලිය මගින් නියම කර ඇති කාර්ය පටිපාටියක් සංශෝධනය නොකිරීමේ හෝ වෙනස් නොකිරීමේ අයිතිවාසිකම,

ඇතුළත් වන්නේ ය.

කොටස් මිල දී ගන්නා ලෙස, කොටස් හිමියකු විසින් සමාගමෙන් ඉල්ලා සිටිය හැකි බව.

**100**. කොටස් හා සම්බන්ධ අයිතිවාසිකම් කෙරෙහි බලපාන ක්‍රියා මාර්ගයක් ගැනීම සම්බන්ධතාවක් දක්වන කණ්ඩායමක් විසින් අනුමත කර ඇති හා ඒ ක්‍රියා මාර්ගය ගැනීමට සමාගම හිමිකම් ලබන අවස්ථාවක,—

(අ) යම් කොටස් හිමියකුගේ නමින් ලියාපදිංචි කර ඇති හා ක්‍රියා මාර්ග අනුමත කිරීමට එරෙහිව එකම අර්ථලාභී අයිතිකරුවකු ඇති කොටස් හා සම්බන්ධ සියලු ම ඡන්ද දැමූ, සම්බන්ධතාවක් දක්වන කණ්ඩායමේ සාමාජිකයකු වූ ඒ කොටස් හිමියා ; හෝ

(ආ) ක්‍රියා මාර්ගය ගැනීම අනුමත කෙරෙන යෝජනා සම්මතයක් 144 වන වගන්තිය යටතේ සම්මත කරනු ලැබූ අවස්ථාවක යම් කොටස් හිමියකුගේ නමින් ලියා පදිංචි කර ඇති හා එකම අර්ථලාභී අයිතිකරු ම ඇති, කොටස් සම්බන්ධයෙන් වූ යෝජනා සම්මතය අත්සන් නොකළ සම්බන්ධතාවක් දක්වන කණ්ඩායමේ සාමාජිකයකු වූ ඒ කොටස් හිමියා,

94 වන වගන්තියට අනුකූලව, ඒ කොටස්, මිල දී ගන්නා ලෙස සමාගමෙන් ඉල්ලා සිටීමට හිමිකම් ලබන්නේ ය.

නිර්බල නොවන ක්‍රියා මාර්ග.

**101**. සමාගමක් විසින් කොටස් හා සම්බන්ධ අයිතිවාසිකම් කෙරෙහි බලපාන යම් ක්‍රියා මාර්ගයක් ගැනීම, ඒ ක්‍රියා මාර්ගය 99 වන වගන්තිය යටතේ අනුමත කරනු නොලැබීමේ හේතුව නිසා ම පමණක්, නිර්බල නොවන්නේ ය.

## VI වන කොටස

## ණය භාර ලියාපදිංචි කිරීම

### රෙජිස්ට්‍රාර්වරයා වෙත ණය භාර ලියාපදිංචි කිරීම

**102.** (1) සමාගමක් විසින් මේ වගන්තිය අදාළ වන ණය භාරයක් ඇති කරනු ලැබූ අවස්ථාවක, ඒ ණය භාරය ඇති කරනු ලැබූ හෝ ඊට සාක්ෂි දරන්නා වූ හෝ සාධන පත්‍රයේ පිටපතක්, මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබීම සඳහා (3) වන උපවගන්තියෙහි නිශ්චිතව සඳහන් කාලය ඇතුළත රෙජිස්ට්‍රාර්වරයා වෙත භාර කිරීමට සැලැස්වීම සමාගමේ කාර්යය වන්නේ ය. ඒ සාධන පත්‍රයේ පිටපත් සමඟ, ඒ පිටපත සත්‍ය පිටපතක් බවට සහ ණය භාරය පිළිබඳ නියමිත විස්තර එහි අන්තර්ගත බවට සත්‍යායනය කරන සමාගමේ අධ්‍යක්ෂවරයකු හෝ ලේකම්වරයා විසින් හෝ සමාගමේ නීතිඥවරයා විසින් හෝ නිකුත් කරන ලද, නියමිත ආකෘතියෙහි වූ සහතිකයක් යැවිය යුතු ය.

ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වූ සමාගම් විසින් ඇති කරනු ලැබූ ණය භාර ලියාපදිංචි කිරීම.

(2) මේ වගන්තිය, පහත දැක්වෙන ණය භාරවලට අදාළ විය යුතු ය—

(අ) යම් ණය පත්‍ර නිකුත් කිරීමක් සුරක්ෂිත කිරීමේ කාර්යය සඳහා වූ ණය භාරයක් ;

(ආ) සමාගමේ ඇරයුම් නොකරන ලද කොටස් ප්‍රාග්ධනය පිළිබඳ ණය භාරයක් ;

(ඇ) පුද්ගලයකු විසින් ලියා අත්සන් කරනු ලැබුවේ නම්, විකුණුම් පත්‍රයක් ලෙස ලියාපදිංචි කිරීම අවශ්‍ය වන සාධන පත්‍රයක් මගින් ඇති කරනු ලැබූ හෝ ඒ සාධන පත්‍රය සාක්ෂි දරන හෝ ණය භාරයක් ;

(ඈ) කවර හෝ ස්ථානයක පිහිටා තිබුණ ද, ඉඩමක් පිළිබඳ වූ හෝ ඒ ඉඩමේ යම් සම්බන්ධතාවක් පිළිබඳ වූ ණය භාරයක් ;

(ඉ) සමාගමේ පොත් ණය පිළිබඳ ණය භාරයක් ;

(ඊ) සමාගමේ ව්‍යවසාය පිළිබඳ හෝ දේපළ පිළිබඳ චල ණය භාරයක් ;

(උ) ඇරයුම් කරනු ලැබූ එහෙත් ගෙවනු නොලැබූ ඇරයුම් පිළිබඳ සෘණ භාරයක් ;

(ඌ) නැවක් හෝ ගුවන් යානාවක් පිළිබඳ හෝ නැවක හෝ ගුවන් යානාවක අයිතියේ කොටසක් පිළිබඳ සෘණ භාරයක් ;

(එ) කීර්ති නාමය පිළිබඳ හෝ 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පිළිබඳ නීති සංග්‍රහය පනතේ අර්ථානුකූලව බුද්ධිමය දේපළ පිළිබඳ සෘණ භාරයක් ;

(ඒ) (86 වන අධිකාරිය වූ) භාර ලදුපත් ආඥාපනතේ 4 වන වගන්තිය අදාළ වන භාර ලදුපතක් හෝ 1990 අංක 14 දරන දේශීය භාර ලදුපත් පනතේ අර්ථානුකූලව දේශීය භාර ලදු පතක්.

(3) මේ වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම අවශ්‍ය වන සාධන පත්‍රයක්—

(අ) ශ්‍රී ලංකාවේ දී ලියා අත්සන් කරන ලද සාධන පත්‍රයක් වන විට, ඒ සාධන පත්‍රය ලියා අත්සන් කළ දින සිට වැඩ කරන දවස් විසි එකක් ඇතුළත ලියාපදිංචි කළ යුතු ය ;

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත දී ලියා අත්සන් කරන ලද සාධන පත්‍රයක් වන විට, ඒ සාධන පත්‍රය ලියා අත්සන් කළ දින සිට මාස තුනක් ඇතුළත ලියාපදිංචි කළ යුතු ය.

(4) සෘණ භාරයක් ශ්‍රී ලංකාවේ දී ඇති කරනු ලැබූ නමුත් ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටි දේපළ ඊට අඩංගුව ඇති අවස්ථාවක, ඒ සෘණ භාරය ඇති කරන ලද්දේ යම් සාධන පත්‍රයකින් ද නැතහොත් ඒ සෘණ භාරය යම් සාධන පත්‍රයකින් ඇති කරනු ලැබූ ලෙස අදහස් කරනු ලබන්නේ ද ඒ සාධන පත්‍රය, දේපළ පිහිටා ඇති රටේ නීතිය අනුව සෘණ භාරය වලංගු කිරීම හෝ බලසහිත කිරීම පිණිස තවදුරටත් නීතිකෘත්‍ය අවශය විය හැකි වුව ද ඒ නොතකා, මේ වගන්තියේ විධිවිධාන යටතේ ලියාපදිංචි කිරීම සඳහා යවනු ලැබිය හැකි ය.

(5) සමාගමක පොත් ණය කිසිවක් ගෙවීම සුරක්ෂිත කිරීම පිණිස, ගණුදෙනු කළ හැකි සාධන පත්‍රයක් දී ඇති අවස්ථාවක, සමාගමට දුන් අත්තිකාරමක් සුරක්ෂිත කිරීමේ කාර්යය සඳහා සාධන පත්‍රය තැන්පත් කිරීම, මේ වගන්තියේ කාර්ය සඳහා ඒ පොත් ණය පිළිබඳ සෘණ භාරයක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

(6) ඉඩමක් විෂයෙහි වූ සෑණ භාරයකට හිමිකම සෑණ පත්‍ර දරන්නාට ලබා දෙන සෑණ පත්‍ර දැරීම, මේ වගන්තියේ කාර්ය සඳහා, ඉඩම පිළබඳ සම්බන්ධතාවක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

(7) වෙනත් යම් සාධන පත්‍රයකට කැරෙන යොමු කිරීමක් මගින් යම් සෑණ පත්‍ර පද්ධතියක සෑණ පත්‍ර දරන්නන්ට විශේෂ නොවන ප්‍රතිලාභ හිමිවන සෑණ භාරයක් අඩංගු වන හෝ දෙන සෑණ පත්‍ර පද්ධතියක්, සමාගමක් විසින් ඇති කරන ලද අවස්ථාවක දී, ඒ සෑණ භාරය අඩංගු වන ඔප්පුව ලියා අත්සන් කරනු ලැබූ දින සිට වැඩ කරන දින පහළොව ඇතුළත දී හෝ එවැනි ඔප්පුවක් නොමැති නම් සෑණ පත්‍ර පද්ධතියේ යම් සෑණ පත්‍රයක් ලියා අත්සන් කරන ලද දින සිට වැඩ කරන දින පහළොවක් ඇතුළත දී පහත දැක්වෙන විස්තර, එනම් :—

(අ) සම්පූර්ණ පද්ධතිය මගින් සුරක්ෂිත කරන ලද මුළු මුදල ;

(ආ) ඒ පද්ධතිය නිකුත් කිරීමට බලය දෙන ලද යෝජනා සම්මතවල දින සහ ඇපය ඇති කළ හෝ නිර්වචනය කළ ආවරණ ඔප්පුවක් තිබේ නම් ඒ ඔප්පුවේ දිනය ;

(ඇ) සෑණ භාරයට යටත් වූ දේපළ පිළිබඳ සාමාන්‍ය විස්තරයක් ; සහ

(ඈ) සෑණ පත්‍ර දරන්නන් වෙනුවෙන් භාරකරුවන් වේ නම්, ඒ භාරකරුවන්ගේ නම්,

සමග ඒ සෑණ භාරය අඩංගු ඔප්පුවේ නියමිත ආකාරයෙන් සත්‍යායනය කළ පිටපතක් හෝ එවැනි ඔප්පුවක් නොමැති නම්, ඒ පද්ධතියේ සෑණ පත්‍රවලින් එකක් හෝ රෙජිස්ට්‍රාර්වරයා වෙත භාර දෙනු ලැබුවහොත් හෝ ඔහුට ලැබුණහොත්, මේ වගන්තියේ කාර්ය සඳහා එය ප්‍රමාණවත් වන්නේ ය :

එසේ වුව ද, පද්ධතියේ සෑණ පත්‍ර නිකුත් කිරීම එක් වරකට වඩා කරනු ලැබූ අවස්ථාවක, ඒ එක් එක් නිකුතුව කළ දිනය හා ප්‍රමාණය පිළිබඳ විස්තර, ලේඛනයේ ඇතුළත් කිරීම සඳහා රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතු ය. එවැනි විස්තර යැවීම පැහැර හැරීම හේතුකොට ගෙන නිකුත් කරනු ලැබූ කොටස්වල වලංගු භාවය කෙරෙහි බලපෑමක් නොවිය යුතු ය.

(8) යම් තැනැත්තකු විසින්—

(අ) නියත වශයෙන් වුව ද කොන්දේසි සහිතව වුව ද සමාගමක සෑණ පත්‍ර කිසිවකට සහභාගි වීම හෝ සහභාගි වීමට එකඟ වීම සලකා ; හෝ

(ආ) එවැනි සෑණ පත්‍ර කිසිවකට නියත වශයෙන් වුව ද කොන්දේසි සහිතව වුව ද සහභාග ලබා දීම හෝ ලබා දීමට එකඟ වීම සලකා,

ප්‍රතිෂ්ඨාවක් වශයෙන් ඒ සමාගම විසින් කෙළින් ම හෝ අන්‍යාකාරයකින් හෝ ඔහුට යම් කොමිස් මුදලක්, දීමනාවක් හෝ වට්ටමක් ගෙවනු ලැබ හෝ දෙනු ලැබ ඇති අවස්ථාවක ලියාපදිංචි කිරීම සඳහා මේ වගන්තියේ විධිවිධාන යටතේ යැවීමට නියම කර ඇති තොරතුරුවලට එසේ ගෙවන ලද හෝ දෙන ලද කොමිස් මුදලේ, වට්ටමේ හෝ දීමනාවේ මුදල හෝ ප්‍රතිශත අනුපාතිකය ද ඇතුළත් විය යුතු ය. එවැනි විස්තර යැවීම නොකර හැරීම හේතුකොටගෙන, නිකුත් කරනු ලැබූ සෑණ පත්‍රවල වලංගු භාවය කෙරෙහි බලපෑමක් නොවිය යුතු ය.

(9) සමාගමේ යම් ණයක් සඳහා ඇප වශයෙන් සෑණ පත්‍ර කිසිවක් තැන්පත් කිරීම, වට්ටමක් මත සෑණ පත්‍ර නිකුත් කිරීමක් ලෙස (8) වන උපවගන්තියේ කාර්ය සඳහා සලකනු නොලැබිය යුතු ය.

(10) මේ වගන්තිය යටතේ සෑණ භාරයක් ලියාපදිංචි කිරීම, ඒ සෑණ භාරය කෙරෙහි සම්බන්ධතාවක් ඇති යම් තැනැත්තකුගේ ඉල්ලීම මත සිදු කරනු ලැබිය හැකි ය. සමාගම හැර, වෙනත් යම් තැනැත්තකු විසින් කරන ලද ඉල්ලීමක් මත ලියාපදිංචි කිරීම සිදු කරනු ලැබූ අවස්ථාවක, ඔහු විසින් රෙජිස්ට්‍රාර්වරයා වෙත ගෙවනු ලැබූ ගාස්තුවක මුදල, සමාගමෙන් ලබා ගැනීමට ඒ තැනැත්තා හිමිකම් ලැබිය යුතු ය.

(11) මේ වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම නියම කර ඇති, යම් සමාගමක් විසින් ඇති කරනු ලැබූ යම් සෑණ භාරයක් පිළිබඳව හෝ සෑණ පත්‍ර පද්ධතියකට අයත් සෑණ පත්‍ර නිකුත් කිරීමක් පිළිබඳ හෝ විස්තර ලියාපදිංචි කිරීම සඳහා රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවීම යම් සමාගමක් විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක, ඒ ලියාපදිංචි කිරීම වෙනත් යම් තැනැත්තකුගේ ඉල්ලීම පිට සිදු කරනු ලැබ ඇත්නම් මිස—

(අ) සමාගම වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් පණස් දහසක් නොඉක්මවන දඩයකින් දඬුවම් කරනු ලැබීමට යටත් වන්නේ ය ; තව ද

(ආ) සමාගමේ පැහැර හැරීම සිදුකර ඇති සෑම නිලධරයකු ම, වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පණස් දහසක් නොඉක්මවන දඩයකින් දඬුවම් කරනු ලැබීමට යටත් වන්නේ ය.

(12) මේ වගන්තියේ විධිවිධාන, චංචල හෝ නිශ්චල හෝ යම් දේපළක් කෙරෙහි සෘණ භාරයක් ඇති කරන හෝ ඇති කරන බැව් උද්දේශිත යම් ලේඛනයක් හෝ සාධන පත්‍රයක් ලියාපදිංචි කිරීමට අදාළ වෙනත් යම් ලිඛිත නීතියකට අතිරේකව මිස, ඊට ආදේශ වශයෙන් නොවිය යුතු ය.

(13) මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා, "සෘණ භාරය" යන්නට උකසක් ද ඇතුළත් වේ.

ලියාපදිංචි නොකළ සෘණ භාර ඇතැම් අවස්ථාවල බලරහිත බව.

**103**. (1) මේ කොටසේ විධිවිධානවලට යටත්ව සෑම සෘණ භාරයක් ම, අවස්ථාවෝචිත පරිදි, මේ පනතේ 102 වන වගන්තියෙන් හෝ 1982 අංක 17 දරන සමාගම් පනතේ 91 වන වගන්තියෙන් හෝ නිශ්චිතව සඳහන් කර ඇති ආකාරයට හා එසේ නිශ්චිතව සඳහන් කර ඇති කාලසීමාව ඇතුළත ලියාපදිංචි කර ඇත්නම් නැතහොත් ලියාපදිංචි කිරීමේ කාලසීමාව මේ පනතේ 108 වන වගන්තිය යටතේ හෝ 1982 අංක 17 දරන සමාගම් පනතේ 97 වන වගන්තිය යටතේ හෝ දීර්ඝ කර ඇත්නම් එසේ දීර්ඝ කරනු ලැබූ කාලසීමාව ඇතුළත ලියාපදිංචි කර ඇත්නම් මිස, එමගින් සමාගමේ දේපළ හෝ ව්‍යාපාරය කෙරෙහි යම් ඇපවීමක් පැවරෙන තාක් දුරට, ඈවරකරුවකුට හා යම් ණයකරුවකුට ප්‍රතිපක්ෂව බලරහිත විය යුතු ය.

(2) සෘණ භාරයක් මගින් සුරක්ෂිත කර තිබෙන යම් මුදලක් ආපසු ගෙවීම සඳහා වූ යම් ගිවිසුමක් හෝ බැඳීමක් කෙරෙහි මේ වගන්තියෙහි ඇතුළත් කිසිවකින් බලපෑමක් නොවිය යුතු ය. සෘණ භාරයක් මේ වගන්තිය යටතේ බලරහිත වුවහොත්, එමගින් සුරක්ෂිත කරන ලද මුදල වහාම ගෙවිය යුතු වන්නේ ය.

(3) මේ වගන්තියේ කාර්යය සඳහා, "සෘණ භාරය" යන්නෙන්, 1982 අංක 17 දරන සමාගම් පනතේ 91 වන වගන්තිය යටතේ හෝ මේ පනතේ 102 වන වගන්තිය යටතේ හෝ ලියාපදිංචි කිරීම නියම කර ඇති, 1982 ජූලි මස 2 වන දින හෝ ඉන් පසුව ඇති කරන ලද්දා වූ සෘණ භාරයක් අදහස් වේ.

අත්කර ගන්නා ලද දේපළ විෂයයෙහි පවත්නා සෘණ භාර ලියාපදිංචි කිරීම, සමාගමේ කාර්යයක් බව.

**104**. (1) සමාගම විසින් දේපළ අත්කර ගැනීමෙන් පසුව ඇති කරන ලද සෘණ භාරයක් වූයේ නම් මේ කොටස යටතේ ලියාපදිංචි කිරීම අවශ්‍ය වන සෘණ භාරයකට යටත් යම් දේපළක්, ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද සමාගමක් විසින් අත්කර ගනු ලබන අවස්ථාවක, (2) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කාලසීමාව ඇතුළත, සමාගම විසින්—

(අ) ඒ සෘණ භාරය පිළිබඳ නියමිත විස්තර ;

(ආ) ඒ සෘණ භාරය ඇති කරන්නා වූ හෝ ඒ බවට සාක්ෂි දරන්නා වූ යම් සාධන පත්‍රයක් ඇත්නම්, ඒ සාධන පත්‍රයේ (නිවැරදි පිටපතක් බවට නියමිත ආකාරයට සහතික කරන ලද) පිටපතක්,

ලියාපදිංචි කිරීම සඳහා රෙජිස්ට්‍රාර්වරයා වෙත භාර දෙනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි කිරීම නියම කර ඇති සෘණ භාරයක් පිළිබඳ විස්තර—

(අ) අදාළ දේපළ පිහිටා ඇත්තේ සහ සෘණ භාරය ඇති කරන ලද්දේ ශ්‍රී ලංකාවෙන් පිටත නම්, ඒ අත්කර ගැනීම සම්පූර්ණ කරනු ලැබූ දින සිට මාස තුනක් ඇතුළත ; හෝ

(ආ) අන් සෑම අවස්ථාවක දී ම, ඒ අත්කර ගැනීම සම්පූර්ණ කරනු ලැබූ දින සිට වැඩ කරන දින විසි එකක් ඇතුළත,

රෙජිස්ට්‍රාර්වරයා වෙත භාර දෙනු ලැබිය යුතු ය.

(3) සමාගමක් විසින් මේ වගන්තියට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක—

(අ) සමාගම වරදකට වරදකරුවන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පණස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය ; තව ද

(ආ) පැහැර හැරීම කරන ලද සමාගමේ සෑම නිලධරයකු ම වරදකට වරදකරුවන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පණස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

සෘණ භාර ලේඛනය රෙජිස්ට්‍රාර්වරයා විසින් තබා ගත යුතු බව.

**105.** (1) මේ කොටස යටතේ ලියාපදිංචි කිරීම නියම කර ඇති සියලු ම සෘණ භාර පිළිබඳ, නියමිත ආකෘතියෙහි වූ ලේඛනයක් එක් එක් සමාගම සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයා විසින්, තබා ගත යුතු අතර, නියමිත ගාස්තුව ගෙවන ලද විට, ඒ සෘණ භාර සම්බන්ධයෙන් ඒ ලේඛනයෙහි පහත සඳහන් විස්තර ඇතුළත් කළ යුතු ය :—

(අ) යම් සෘණ භාරයකින් ලැබෙන ප්‍රතිලාභය සඳහා සෘණ පත්‍ර පද්ධතියක් දරන්නන්ට හිමිකම ඇති සෘණ භාරයක් සම්බන්ධයෙන් වන විට, 102 වන වගන්තියේ (8) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් විස්තර ;

(ආ) වෙනත් යම් සෘණ භාරයක් සම්බන්ධයෙන් වන විට—

(i) එය සමාගමක් විසින් ඇති කරන ලද සෘණ භාරයක් නම්, එය ඇති කරනු ලැබූ දිනය, සහ එය සමාගම විසින් අත්කරගන්නා ලද දේපළක් විෂයයෙහි පැවති සෘණ භාරයක් නම්, දේපළ අත්කර ගන්නා ලද දිනය ;

(ii) සෘණ භාරයෙන් සුරක්ෂිත වන මුදල් ප්‍රමාණය ;

(iii) සෘණ භාරයට යටත් දේපළ පිළිබඳ කෙටි විස්තරයක් ; සහ

(iv) සෘණ භාරයට හිමිකම ඇති තැනැත්තන්.

(2) මේ කොටස යටතේ යම් සෘණ භාරයක් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් ඒ සෘණ භාරයෙන් සුරක්ෂිත කරන ලද මුදල් ප්‍රමාණය සඳහන් කරමින් රෙජිස්ට්‍රාර්වරයා විසින් නියමිත ආකෘතියෙහි සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය. ලියාපදිංචි කිරීම පිළිබඳව මේ කොටසේ නියමයන් අනුව ක්‍රියා කර ඇති බවට, ඒ සහතිකය තීරණාත්මක සාක්ෂියක් වන්නේ ය.

(3) මේ කොටස යටතේ සෘණ භාරයක් ලියාපදිංචි කිරීමෙන්, මේ වගන්තිය යටතේ සෘණ භාර ලේඛනයෙහි ඇතුළත් කර තිබෙන සෘණ භාරයේ විස්තර පිළිබඳව සියලු තැනැත්තන්ට දැනුම් දීමක් සංයුක්ත වන නමුත්, එය සෘණ භාරය ඇති කරන්නා වූ සාධන පත්‍රයේ ඇතුළත් කරුණු හෝ සෘණ භාරයට සාක්ෂි දරන කරුණු පිළිබඳ දැන්වීමක් නොවන්නේ ය.

ලියාපදිංචි කිරීමේ සහතිකය සෘණ පත්‍රවල පිටසන් කිරීම.

**106.** (1) 105 වන වගන්තියේ විධිවිධාන යටතේ දෙනු ලැබූ සෑම ලියාපදිංචි කිරීමේ සහතිකයක පිටපතක්, සමාගම විසින් නිකුත් කරනු ලැබුවා වූ ද එසේ ලියාපදිංචි කරනු ලැබූ සෘණ භාරය මගින් ගෙවීම සුරක්ෂිත කරනු ලැබුවා වූ ද සෑම සෘණ පත්‍රයක ම හෝ සෘණ ස්කන්ධ සහතිකයක ම පිටසන් කිරීමට සමාගම විසින් සලස්වනු ලැබිය යුතු ය.

(2) යම් සෘණ භාරයක් ලියාපදිංචි කිරීමේ සහතිකය, ඒ සෘණ භාරය ඇති කරනු ලැබීමට පෙර, සමාගම විසින් නිකුත් කරනු ලැබූ යම් සෘණ පත්‍රයක් හෝ සෘණ ස්කන්ධ සහතිකයක පිටසන් කිරීමට සලස්වන ලෙස සමාගමට නියම කිරීමක් සේ (1) වන උපවගන්තියෙහි ඇතුළත් කිසිවක් තේරුම් ගනු නොලැබිය යුතු ය.

(3) ලියාපදිංචි කිරීමේ සහතිකයක පිටපතක් පිටසන් කරනු ලැබිය යුතු බව මේ වගන්තියේ විධිවිධාන මෙසේ නියම කර ඇති යම් සෘණ පත්‍රයක් හෝ සෘණ ස්කන්ධ සහතිකයක් එහි එසේ පිටසන් නොකොට බාර දීමට යම් තැනැත්තකු විසින් දැන දැනම හා සිතාමතාම බලය දෙනු ලැබූ හෝ අවසරය දෙනු ලැබූ අවස්ථාවක වෙනත් යම් වගකීමකට හානියක් නොමැතිව, ඒ තැනැත්තා වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ දෙකක් නොඉක්මවන දඩයකින් දඬුවම් කරනු ලැබීමට යටත් වන්නේ ය.

තෘප්තිය හෝ මුදා හැරීම පිළිබඳ සටහන්.

**107.** (අ) යම් ලියාපදිංචි සෘණ භාරයක් දෙනු ලැබ ඇත්තේ යම් ණයක් සඳහා ද ඒ ණය හෝ ඉන් කොටසක් හෝ ගෙවා හෝ පියවා ඇති බවට ; හෝ

(ආ) සෘණ භාරයකට යටත් යම් දේපළක් හෝ ව්‍යාවසායක යම් කොටසක් ඒ සෘණ භාරයෙන් මුදා හැර ඇති බවට හෝ ඒ සමාගමේ දේපළෙහි හෝ ව්‍යාවසායෙන් කොටසක්ව පැවතීම අවසන් වී ඇති බවට,

රෙජිස්ට්‍රාර්වරයා සෑහීමකට පත් වූ අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, පූර්ණ හෝ අර්ධ තෘප්ති සටහනක් හෝ ඒ දේපළෙහි හෝ ව්‍යාවසායෙහි කොටසක් සෘණ භාරයෙන් මුදා හරිනු ලැබූ බවට හෝ ඒ දේපළ හෝ ව්‍යාවසාය සමාගමේ දේපළෙහි හෝ ව්‍යාවසායෙහි කොටසක්ව පැවතීම අවසන් වී ඇති බවට සටහනක් ඔහු විසින් ලේඛනයෙහි ඇතුළත් කළ හැකි ය.

108. (අ) මේ පනතින් නියම කර ඇති කාලසීමාව ඇතුළත ණය භාරයක් ලියාපදිංචි නොකර හැරීම ; හෝ

ණය භාර ලේඛනය නිවැරදි කිරීම.

(ආ) එවැනි යම් ණය භාරයක හෝ තෘප්ති සටහනක යම් කරුණක් සඳහන් නොකර හැරීම හෝ වැරදි ලෙස සඳහන් කිරීම,

අහඹු සිදුවීමක් බවට හෝ ප්‍රමාද දෝෂයක් හෝ වෙනත් යම් ප්‍රමාණවත් හේතුවක් නිසා සිදු වූ බවට හෝ සමාගමේ ණයහිමියන්ගේ හෝ කොටස් හිමියන්ගේ තත්ත්වයට හානිකර නොවන ස්වභාවයක් බවට හෝ සහනය ලබා දීම අන්‍යාකාරයෙන් සාධාරණ හා යුක්තිසහගත බවට අධිකරණය සෑහීමට පත්වන්නේ නම්, සමාගම විසින් හෝ සම්බන්ධතාවක් ඇති යම් තැනැත්තකු විසින් කරනු ලබන ඉල්ලීම මත, සාධාරණ යයි හා යෝග්‍ය යයි අධිකරණයට පෙනී යන යම් නියම හා කොන්දේසි මත, අවස්ථාවෝචිත පරිදි, ලියාපදිංචි කිරීම සඳහා වූ කාලය දීර්ඝ කළ යුතු බවට නැතහොත් ඒ නොකර හැරීම හෝ වැරදි ලෙස සඳහන් කිරීම නිවැරදි කළ යුතු බවට අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි ය.

## සමාගමේ ණය භාර ලේඛන හා ණය භාර ඇති කෙරෙන සාධන පත්‍ර පිටපත් පිළිබඳ විධිවිධාන

109. මේ කොටස යටතේ ලියාපදිංචි කිරීමට නියම කර ඇති යම් ණය භාරයක් ඇති කෙරෙන සෑම සාධන පත්‍රයක ම පිටපතක්, සෑම සමාගමක් විසින් ම එහි ලියාපදිංචි කාර්යාලයේ හෝ 116 වන වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා වෙත දැනුම් දිය හැකි වෙනත් යම් ස්ථානයක හෝ තබාගත යුතු ය. ඒකාකාරී ණය පත්‍ර පද්ධතියක් සම්බන්ධයෙන් වන විට, එම පද්ධතියේ එක් ණය පත්‍රයක පිටපතක් තබා ගැනීම ප්‍රමාණවත් වන්නේ ය.

ණය භාර ඇති කෙරෙන සාධන පත්‍ර පිටපත්, සමාගම විසින් තබා ගත යුතු බව.

110. (1) සෑම සීමාසහිත සමාගමක් විසින්—

සමාගමේ ණය භාර ලේඛනය.

(අ) එහි ලියාපදිංචි කාර්යාලයෙහි හෝ 116 වන වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා වෙත දැනුම් දෙනු ලබන වෙනත් යම් ස්ථානයක ණය භාර ලේඛනයක් තබා ගත යුතු ය ; තව ද

(ආ) සමාගමේ දේපළ කෙරෙහි නිශ්චිතව බලපාන්නා වූ සියලු ණය භාර පිළිබඳව සහ සමාගමේ ව්‍යවසාය හෝ දේපළ කිසිවක්

කෙරෙහි වූ සියලු චල සෘණ භාර පිළිබඳව ඒ එක් එක් කාරණයේ දී—

(i) සෘණ භාරයට යටත් දේපළ පිළිබඳ කෙටි විස්තරයක් ;

(ii) සෘණ භාරයේ මුදල් ප්‍රමාණය ;

(iii) භාරක සඳහා වූ සුරැකුම් පත් සම්බන්ධයෙන් වූ විට හැර ඒ සෘණ භාරවලට හිමිකම ඇති තැනැත්තන්ගේ නම්,

නිශ්චිතව සඳහන් කරමින්, ඒ ලේඛනයෙහි ඇතුළත් කළ යුතු ය.

(2) මේ වගන්තියේ විධිවිධාන යටතේ ඇතුළත් කිරීමට නියම කර ඇති යම් සටහනක් නොකර හැරීමට දැන දැනම හා හිතාමතාම බලය දෙන හෝ අවසර දෙන සමාගමේ යම් නිලධරයෙක් වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ දෙකක් නොඉක්මවන දඩයකින් දඬුවම් කරනු ලැබීමට යටත් වන්නේ ය.

### සෘණ භාර ලේඛනය නැවත පරීක්ෂා කිරීම

සෘණ භාර ලේඛනය නැවත පරීක්ෂා කිරීම.

**111.** (1) රෙජිස්ට්‍රාර්වරයා විසින් සමාගමක් වෙත කලින් කල නිකුත් කරනු ලබන දැන්වීමක් මගින්, ඒ දැන්වීම ලැබුණු දින සිට වැඩ කරන දවස් පහළොවක් ඇතුළත—

(අ) සමාගමේ දේපළවලට හෝ ව්‍යවසායට අදාළව මේ කොටස යටතේ හෝ 1982 අංක 17 දරන සමාගම් පනතේ III වන කොටස යටතේ හෝ (145 වන අධිකාරිය වූ) සමාගම් ආඥාපනතේ III වන කොටස යටතේ හෝ ලියාපදිංචි කර ඇත්තා වූ සහ සම්පූර්ණයෙන් පියවා නොමැති නැතහොත් සමාගමේ යම් දේපළක් කෙරෙහි අදාළ වීම නතර වී ඇත්තා වූ සියලු සෘණ භාර සම්බන්ධයෙන් 102 වන වගන්තිය යටතේ සැපයීමට නියම කර ඇති විස්තර ;

(ආ) ඒ එක් එක් සෘණ භාරය ඇති කරනු ලැබන හෝ ඊට සාක්ෂි දරන සාධන පත්‍රයක් ඇත්තේ නම් එම සාධන පත්‍රයේ සහතික කළ පිටපතක් ;

(ඇ) ඒ එක් එක් සෘණ භාරය ලියාපදිංචි කිරීම පිළිබඳව රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරන ලද සහතිකයේ පිටපතක් ;

(ඈ) මේ වගන්තිය යටතේ සපයා ඇති තොරතුරු තමාගේ උපරිම දැනීම අනුව සෑම විස්තරයකින් ම සම්පූර්ණ හා නිවැරදි බව සත්‍යායනය කරමින් සමාගමේ අධ්‍යක්ෂවරයකු විසින් හෝ ලේකම්වරයා විසින් හෝ දිවුරන ලද හෝ ප්‍රතිඥා මත දෙන ලද දිවුරුම් පත්‍රයක්,

තමා වෙත භාර දෙන ලෙසට සමාගමට නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සපයන ලෙස නියම කර ඇති ලේඛන සමාගමෙන් ලැබුණු පසු තමා විසින් තබාගෙන ඇති සෘණ භාර ලේඛනය රෙජිස්ට්‍රාර්වරයා විසින් නැවත පරීක්ෂා කර, එම ලේඛනයේ නිරවද්‍යතාව සහතික කිරීම පිණිස අවශ්‍ය විය හැකි සටහන් එහි ඇතුළත් කළ යුතු ය.

(3) මේ වගන්තිය යටතේ නැවත පරීක්ෂා කිරීමක් අනුව, සෘණ භාරයක් පූර්ණ හෝ අර්ධ වශයෙන් පියවා ඇති බවට හෝ දේපළෙහි හෝ ව්‍යවසායේ කොටසක් සෘණ භාරයකින් මුදා හැර ඇති බවට හෝ සමාගමේ දේපළෙහි හෝ ව්‍යවසායේ කොටසක්ව පැවතීම අවසන් වී ඇති බවට රෙජිස්ට්‍රාර්වරයා විසින් තෘප්ති සටහනක් ඇතුළත් නොකළ යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ යවන ලද දැන්වීමක් අනුව ක්‍රියා කිරීම සමාගමක් විසින් පැහැර හරිනු ලැබුවහොත්—

(අ) සමාගම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය ; තව ද

(ආ) පැහැර හැරීම කරන ලද සමාගමේ සෑම නිලධරයකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

### ශ්‍රී ලංකාවෙන් පිටත සමාගම්වලට මේ කොටස අදාළ කිරීම

**112**. ශ්‍රී ලංකාවෙන් පිටත සමාගමක් විසින් ශ්‍රී ලංකාව තුළ ඇති දේපළ මත ඇති කරන ලද සෘණ භාර සම්බන්ධයෙන් සහ ශ්‍රී ලංකාවෙන් පිටත සමාගමක් විසින් අත්කර ගන්නා ලද දේපළවලට අදාළ සෘණ භාර සම්බන්ධයෙන් මේ පනතේ මේ කොටසේ විධිවිධාන අදාළ විය යුතු ය.

ශ්‍රී ලංකාවෙන් පිටත සමාගමක් විසින්, ඇති කරන ලද සෘණ භාරවලට හා අත්කර ගන්නා ලද සෘණ භාරයකට යටත් දේපළවලට මේ කොටස අදාළ කිරීම.

## VII වන කොටස

## පරිපාලනය හා කළමනාකරණය

### ලියාපදිංචි කාර්යාලය

සමාගමේ ලියාපදිංචි කාර්යාලය.

**113**. (1) සෑම සමාගමකට ම, සියලු ලියකියවිලි හා දැන්වීම් යැවිය හැකි ලියාපදිංචි කාර්යාලයක් ශ්‍රී ලංකාවෙහි තිබිය යුතු ය.

(2) 114 වන වගන්තියට යටත්ව, එක්තරා අවස්ථාවක සමාගමක ලියාපදිංචි කාර්යාලය, ඒ අවස්ථාවේ දී සමාගමේ ලියාපදිංචි කාර්යාලය ලෙස ලේඛනයෙහි විස්තර කර ඇති ස්ථානය වන්නේ ය.

(3) සමාගමක ලියාපදිංචි කාර්යාලය, යම් වරළත් ගණකාධිකාරිවරයකුගේ, නීතිඥවරයකුගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ කාර්යාලයේ පිහිටා ඇත්නම්, ලියාපදිංචි කාර්යාලය පිළිබඳ විස්තරයෙහි—

(අ) සමාගමේ ලියාපදිංචි කාර්යාලය, ඒ වරළත් ගණකාධිකාරිවරයාගේ, නීතිඥවරයාගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ කාර්යාලයෙහි පිහිටා ඇති බව ; සහ

(ආ) ඒ කාර්යාලවල පිහිටීම පිළිබඳ තොරතුරු,

ප්‍රකාශ විය යුතු ය.

ලියාපදිංචි කාර්යාලය වෙනස් කිරීම.

**114**. (1) සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියට සහ (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගමේ ලියාපදිංචි කාර්යාලය කවර හෝ අවස්ථාවක වෙනස් කරනු ලැබිය හැකි ය.

(2) එසේ වෙනස් කිරීම ලියාපදිංචි කිරීම සඳහා ඒ පිළිබඳව නියමිත ආකෘතියෙහි වූ දැන්වීමක් රෙජිස්ට්‍රාර්වරයා වෙත දිය යුතු අතර, ඒ දැන්වීම රෙජිස්ට්‍රාර්වරයා වෙත ලැබීමෙන් පසු වැඩ කරන දවස් පහකට පසුව හෝ ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් යම් පසු දිනයක හෝ ඒ වෙනස් කිරීම බලාත්මක විය යුතු ය.

ලියාපදිංචි කාර්යාලය වෙනස් කිරීමට නියම කිරීම.

**115**. (1) සමාගමක ලියාපදිංචි කාර්යාලය වෙනස් කරන ලෙස රෙජිස්ට්‍රාර්වරයා විසින්—

(අ) සමාගම නමට එහි ලියාපදිංචි කාර්යාලය වෙත ; සහ

(ආ) රෙජිස්ට්‍රාර්වරයා වෙත භාර දෙන ලද ලියකියවිලිවලින් සමාගමේ අධ්‍යක්ෂවරයකු බව පෙනී යන එක් එක් තැනැත්තා වෙත, ඒ ලියකියවිලිවලින් දැක්වෙන ඒ ඒ තැනැත්තාගේ අලුත්ම ලිපිනයට,

භාර දෙනු ලබන හෝ යවනු ලබන ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, නියම කරනු ලැබිය හැකි ය.

(2) රෙජිස්ට්‍රාර්වරයා විසින් දිනය යොදා අත්සන් කළ යුතු ඒ දැන්වීමෙහි—

(අ) ඒ දැන්වීම ලැබුණු දිනයෙන් පසු වැඩකරන දින විස්සකට කලින් වූ දිනයක් නොවන ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනයක් වන විට සමාගමේ ලියාපදිංචි කාර්යාලය වෙනස් කළ යුතු බව සඳහන් විය යුතු ය ;

(ආ) එසේ වෙනස් කිරීමට අවශ්‍ය හේතු සඳහන් විය යුතු ය ; සහ

(ඇ) ඒ නියමයට එරෙහිව 472 වන වගන්තිය යටතේ අධිකරණය වෙත අභියාචනය කිරීමට සමාගමට අයිතිවාසිකම ඇති බව සඳහන් විය යුතු ය.

(3) සමාගම විසින්—

(අ) දැන්වීමේ සඳහන් දිනය වන විට ; හෝ

(ආ) සමාගම විසින් අධිකරණය වෙත අභියාචනය කරනු ලැබුවහොත් සහ ඒ අභියාචනය නිශ්ප්‍රභ කරනු ලැබුවහොත්, අධිකරණ තීරණයෙන් පසු වැඩ කරන දින පහක් ඇතුළත,

එහි ලියාපදිංචි කාර්යාලය වෙනස් කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තිය අනුව ක්‍රියා කිරීම සමාගම විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක—

(අ) සමාගම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් පණස් දහසක් නො ඉක්මවන දඩයකට යටත් විය යුතු ය ; තව ද

(ආ) පැහැර හැරීම කරන ලද සමාගමේ සෑම නිලධරයකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පණස් දහසක් නො ඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

## සමාගම් වාර්තා

සමාගමේ වාර්තා තබාගතයුතු ස්ථානය.

**116.** (1) සමාගමක් විසින් (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, පහත සඳහන් ලියකියවිලි එහි ලියාපදිංචි කාර්යාලයෙහි තබා ගනු ලැබිය යුතු ය :—

(අ) සමාගම සංස්ථාගත කිරීමේ සහතිකය සහ සමාගමේ ව්‍යවස්ථාවලිය ;

(ආ) ඉකුත් අවුරුදු දහය ඇතුළත පවත්වන ලද කොටස්කරුවන්ගේ සියලු රැස්වීම්වල වාර්තා සහ සම්මත කරන ලද කොටස්කරුවන්ගේ යෝජනා ;

(ඇ) සමාගම පොලී ලේඛනයක් තබා ගැනීමේ අවශ්‍යතාවෙන් නිදහස් පෞද්ගලික සමාගමක් නම් මිස, පොලී ලේඛනයක් ;

(ඈ) ඉකුත් අවුරුදු දහය ඇතුළත පවත්වන ලද අධ්‍යක්ෂවරයන්ගේ සියලු රැස්වීම්වල වාර්තා සහ සම්මත කරන ලද අධ්‍යක්ෂවරයන්ගේ යෝජනා හා පවත්වන ලද අධ්‍යක්ෂ කමිටු ;

(ඉ) ඉකුත් අවුරුදු දහය ඇතුළත, මේ පනත යටතේ අධ්‍යක්ෂවරයා විසින් දිය යුතු යයි නියම කර ඇති සහතික ;

(ඊ) 223 වන වගන්තිය යටතේ තබා ගැනීමට නියම කර ඇති අධ්‍යක්ෂවරයන්ගේ සහ ලේකම්වරයාගේ නාම ලේඛනය ;

(උ) 166 වන වගන්තිය යටතේ පිළියෙල කරන ලද වාර්ෂික වාර්තා ද ඇතුළුව, ඉකුත් අවුරුදු දහය ඇතුළත සියලු කොටස්හිමියන් වෙත, හෝ එකම පන්තියේ ම කොටස් දරන සියලු තැනැත්තන් වෙත යවන ලද සියලු ලිඛිත සංදේශනවල පිටපත් ;

(ඌ) සමාගමේ ඉකුත් සම්පූර්ණ කළ ගිණුම් කාලසීමා දහය සඳහා මේ පනත යටතේ සම්පූර්ණ කිරීමට නියම කර ඇති සියලු මූල්‍ය ප්‍රකාශවල සහ සමූහ මූල්‍ය ප්‍රකාශවල පිටපත් ;

(එ) සෘණභාර ඇති කෙරෙන හෝ සෘණ භාරවලට සාක්ෂි දරන සාධන පත්‍රවල පිටපත් සහ 109 වන හා 110 වන වගන්ති යටතේ තබා ගැනීමට නියම කර ඇති සෘණ භාර ලේඛනය ;

(ඒ) 123 වන වගන්තිය යටතේ තබා ගැනීමට නියම කර ඇති කොටස් ලේඛනය ; සහ

(ඔ) වර්තන ගිණුම් කාලසීමාව සඳහා සහ සමාගමේ සම්පූර්ණ කළ ගිණුම් කාලසීමා දහය සඳහා 148 වන වගන්තිය යටතේ තබාගැනීමට නියම කර ඇති ගිණුම් වාර්තා.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන කෙසේ සඳහන් වුව ද, අවුරුදු දහයක කාලසීමාව පිළිබඳව (1) වන උපවගන්තියේ (ආ), (ඇ), (ඉ) සහ (උ) ඡේදවල සහ සම්පූර්ණ කළ ගිණුම් කාලසීමා දහය පිළිබඳව ඒ උපවගන්තියේ (ඌ) සහ (ඔ) ඡේදවල සඳහන් සම්පූර්ණ කළ ගිණුම් කාලසීමා දහය ඊට වඩා අඩු කාලසීමාවක් දක්වා අඩු කිරීම අවශ්‍ය යයි හා යෝග්‍ය යයි රෙජිස්ට්‍රාර්වරයා අදහස් කරන්නේ නම්, ඔහු විසින් එය එසේ අඩු කරනු ලැබිය හැකි ය.

(3) (අ) (1) වන උපවගන්තියේ (අ) සිට (එ) තෙක් වූ ඡේදවල සඳහන් ලියකියවිලි, සමාගමේ ලියාපදිංචි කාර්යාලය නොවන ශ්‍රී ලංකාවේ වෙනත් ස්ථානයක තබාගත හැකි අතර, ඒ පිළිබඳව (4) වන උපවගන්තියට අනුකූලව රෙජිස්ට්‍රාර්වරයා වෙත දැනුම් දීමක් කළ යුතු ය ;

(ආ) (1) වන උපවගන්තියේ (ඒ) ඡේදයේ සඳහන් ලියකියවිලි, 124 වන වගන්තියට අනුකූලව, ලියාපදිංචි කාර්යාලය නොවන වෙනත් ස්ථානයක තබා ගත හැකි ය ;

(ඇ) (1) වන උපවගන්තියේ (ඔ) ඡේදයේ සඳහන් ලියකියවිලි, 149 වන වගන්තියට අනුකූලව, ලියාපදිංචි කාර්යාල නොවන වෙනත් ස්ථානයක තබාගත හැකි ය.

(4) වාර්තා කිසිවක් සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ තබා නොමැති නම් හෝ ඒවා තබා ඇති ස්ථානය වෙනස් කරනු ලැබුවහොත්, අවස්ථාවෝචිත පරිදි, ඒවා අන් ස්ථානයක තබනු ලැබූ හෝ ස්ථානය වෙනස් කරනු ලැබූ පළමුවන දිනයේ සිට වැඩ කරන දින දහයක් ඇතුළත, ඒ වාර්තා තබා ඇති ස්ථානය හෝ ස්ථාන රෙජිස්ට්‍රාර්වරයා වෙත දැනුම් දෙනු ලබන බවට සමාගම වග බලාගත යුතු ය.

(5) (1) වන උපවගන්තියේ හෝ (4) වන උපවගන්තියේ හෝ විධිවිධාන අනුව ක්‍රියා කිරීම සමාගමක් විසින් පැහැර හරිනු ලැබුවහොත්—

(අ) සමාගම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ දෙකක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය ; තව ද

(ආ) පැහැර හැරීම කරන ලද සමාගමේ සෑම නිලධරයකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් ලක්ෂයක් නො ඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

වාර්තාවල ආකෘතිය.

**117**. (1) සමාගමක වාර්තා ලිඛිතව හෝ එම වාර්තා සංයුක්ත වන ලේඛන සහ තොරතුරු පහසුවෙන් ලබාගතහැකි සහ ලියවිල්ලක් බවට හැරවීමට හැකි අන්දමකින් හෝ ආකාරයකින් තබා ගනු ලැබිය යුතු ය.

(2) වාර්තා අසත්‍ය ලෙස දැක්වීම වැළැක්වීමට සහ ඒවායේ අසත්‍ය ලෙස දැක්වීම් කිසිවක් සොයා ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන තිබෙන බවට සමාගමක් විසින් වගබලාගත යුතු ය.

(3) සමාගමක් (2) වන උපවගන්තියේ නියම අනුව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක—

(අ) සමාගම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ දෙකක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය ; තව ද

(ආ) පැහර හැරීම කරන ලද සමාගමේ සෑම නිලධරයකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් ලක්ෂයක් නො ඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

## සමාගමේ වාර්තා පරීක්ෂා කිරීම

අධ්‍යක්ෂවරයන් විසින් වාර්තා පරීක්ෂා කිරීම.

**118**. (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, සමාගමක සෑම අධ්‍යක්ෂවරයකු ම සාධාරණ දැනුම් දීමක් කිරීමෙන්, අධ්‍යක්ෂවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන යුක්ති සහගත වේලාවක දී අය කිරීමකින් තොරව සමාගමේ ලිඛිත වාර්තා පරීක්ෂා කිරීමට හිමිකම් ලබන්නේ ය.

(2) සමාගම විසින් තත් කාර්යය සඳහා කරනු ලබන ඉල්ලීමක් මත—

(අ) අධ්‍යක්ෂවරයකු විසින් වාර්තා පරීක්ෂා කිරීම සමාගමේ යහපත පිණිස නොවනු ඇති බවට ; හෝ

(ආ) යෝජිත පරීක්ෂා කිරීම අධ්‍යක්ෂවරයාගේ කාර්යවලට නිසි සම්බන්ධයක් නොමැති කාර්යයක් සඳහා බවට,

අධිකරණයක් සෑහීමකට පත් වන්නේ නම්, ඒ අධිකරණය විසින් පරීක්ෂා කිරීම සඳහා ඒ වාර්තා නොසපයන ලෙස හෝ සුදුසු යයි අධිකරණය කල්පනා කරන යම් ආකාරයකට ඒ වාර්තා පරීක්ෂා කිරීම සීමා කරන ලෙස විධාන කරනු ලැබිය හැකි ය.

**119**. (1) මහජනයා විසින් පරීක්ෂා කරනු ලැබීම සඳහා 120 වන වගන්තිය යටතේ ලේඛන සැපයීමට අමතරව, සමාගමේ වාර්තා පරීක්ෂා කිරීමේ අපේක්ෂාව පිළිබඳව ලිඛිත දැනුම්දීමක් සමාගම වෙත භාරදෙන, සමාගමේ කොටස් හිමියකු හෝ කොටස් හිමියකු විසින් තත් කාර්යය සඳහා ලියවිල්ලක් මගින් බලය දෙන ලද තැනැත්තකු විසින් පරීක්ෂා කරනු ලැබීම සඳහා, 121 වන වගන්තියේ නියම කර තිබෙන ආකාරයට සමාගමක් විසින් මෙහි පහත සඳහන් වාර්තා සපයා තැබිය යුතු ය :— කොටස් හිමියන් විසින් සමාගමේ ලේඛන පරීක්ෂා කිරීම.

(අ) සියලු රැස්වීම්වල වාර්තා සහ කොටස් හිමියන්ගේ යෝජනා සම්මත ;

(ආ) වාර්ෂික වාර්තා, මූල්‍ය ප්‍රකාශ සහ සමූහ මූල්‍ය ප්‍රකාශ ඇතුළුව, ඉකුත් අවුරුදු දහය ඇතුළත සියලු කොටස් හිමියන් වෙත හෝ එකම පන්තියේ ම කොටස් දරන සියලු තැනැත්තන් වෙත යවන ලද සියලු ලිඛිත සංදේශනවල පිටපත් ;

(ඇ) මේ පනත යටතේ අධ්‍යක්ෂවරයන් විසින් නිකුත් කරන ලද සහතික ; සහ

(ඈ) සමාගමේ පොලී ලේඛනය ;

(2) සමාගමක් විසින් (1) වන උපවගන්තියේ නියමයන් අනුව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක—

(අ) සමාගම වරකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ දෙකක් නො ඉක්මවන දඩයකට යටත් විය යුතු ය ; තව ද

(ආ) පැහැර හැරීම සිදු කරන ලද සමාගමේ සෑම නිලධරයකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් ලක්ෂයක් නො ඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

**120**. (1) සමාගමේ වාර්තා පරීක්ෂා කිරීමේ අපේක්ෂාව පිළිබඳව ලිඛිත දැනුම් දීමක් සමාගම වෙත භාර දෙන යම් තැනැත්තකු විසින් පරීක්ෂා කරනු ලැබීම සඳහා, 121 වන වගන්තියේ විස්තර කර තිබෙන ආකාරයට, පහත සඳහන් වාර්තා, සමාගමක් විසින් සපයා තැබිය යුතු ය :— සමාගමේ වාර්තා මහජනයා විසින් පරීක්ෂා කරනු ලැබීම.

(අ) සමාගම සංස්ථාගත කිරීමේ සහතිකය ;

(ආ) සමාගමේ ව්‍යවස්ථාවලිය ආදර්ශ ව්‍යවස්ථාවලිය නොවේ නම්, සමාගමේ ව්‍යවස්ථාවලිය ;

(ඇ) කොටස් ලේඛනය ;

(ඈ) අධ්‍යක්ෂවරයන්ගේ හා ලේකම්වරයන්ගේ නාම ලේඛනය ;

(ඉ) සමාගමේ ලියාපදිංචි කාර්යාලය පිළිබඳ විස්තර ;

(ඊ) සෘණ භාර ඇති කරන හෝ සෘණ භාරවලට සාක්ෂි දරන සාධන පත්‍රවල පිටපත් සහ 109 සහ 110 වන වගන්ති යටතේ තබාගෙන ඇති සෘණ භාර ලේඛනය.

(2) සමාගමක් විසින්, (1) වන උපවගන්තියේ නියම අනුව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක—

(අ) සමාගම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ දෙකක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය ;

(ආ) පැහැර හැරීම කරන ලද සමාගමේ සෑම නිලධරයකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

පරීක්ෂා කිරීමේ ආකාරය.

**121**. (1) 119 වන වගන්තිය හෝ 120 වන වගන්තිය යටතේ පරීක්ෂා කරනු ලැබිය හැකි ලේඛන සමාගමේ වාර්තා තබා ගනු ලබන ස්ථානයේ දී පරීක්ෂා කිරීමේ කාලය තුළ එක් එක් වැඩ කරන දිනයේ දී පෙ. ව. 9.00 සහ ප. ව. 4.00 අතර කාලය තුළ පරීක්ෂා කිරීම සඳහා ලබා ගැනීමට තැබිය යුතු ය.

(2) අදාළ තැනැත්තාට හෝ කොටස් හිමියාට, ලේඛනයේ සහතික පිටපතක් අය කිරීමකින් තොරව සපයා ඇත්නම්, (1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් ආකාරයට ඒ ලේඛනය පරීක්ෂා කිරීම සඳහා තැබීම අවශ්‍ය නොවිය යුතු ය.

(3) මේ වගන්තියේ "පරීක්ෂා කිරීමේ කාලය" යන යෙදුමෙන්, අදාළ තැනැත්තා හෝ කොටස් හිමියා විසින් පරීක්ෂා කිරීමේ අපේක්ෂාව පිළිබඳව දැන්වීමක් සමාගම වෙත භාර දෙන ලද දිනයෙන් පසුව එළඹෙන වැඩ කරන තුන්වන දිනයෙන් ආරම්භව, එකී භාර දෙන ලද දිනයෙන් පසු වැඩ කරන අටවන දිනයෙන් අවසන් වන කාලය අදහස් වේ.

**122**. (1) යම් තැනැත්තකුට පරීක්ෂා කිරීම සඳහා 119 වන වගන්තිය හෝ 120 වන වගන්තිය යටතේ සපයන ලද ලේඛනයක පිටපතක් හෝ උද්ධෘතයක් සඳහා, ඒ තැනැත්තා විසින් ලියවිල්ලකින් ඉල්ලීමක් කරනු ලැබූ පසු සමාගම විසින් නිශ්චය කරනු ලැබිය හැකි සාධාරණ පිටපත් කිරීමේ හා පරිපාලන ගාස්තුවක් ගෙවීමෙන් පසුව, ඒ පිටපත හෝ උද්ධෘතය වැඩ කරන දින පහක් ඇතුළත තමා වෙත එවන ලෙස ඒ තැනැත්තා විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය. ලේඛනවල පිටපත්.

(2) යම් තැනැත්තකු විසින් (1) වන උපවගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් අනුව ක්‍රියා කිරීමෙහි ලා ලේඛනයක පිටපතක් හෝ උද්ධෘතයක් සැපයීම සමාගමක් විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක—

(අ) සමාගම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය ; තව ද

(ආ) පැහැර හැරීම කරන ලද සමාගමේ සෑම නිලධරයකු ම වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

### කොටස් ලේඛනය

**123**. (1) කොටස් නිකුත් කර ඇති සෑම සමාගමක් විසින් ම, සමාගම විසින් නිකුත් කරන ලද කොටස් පිළිබඳව වාර්තා කර ඇති, සහ— සමාගම විසින් කොටස් ලේඛනය පවත්වා ගෙන යා යුතු බව.

(අ) කොටස්හිමියකු වන්නා වූ හෝ ඉකුත් අවුරුදු දහයක කාලය ඇතුළත කොටස් හිමියකුව සිටි එක් එක් තැනැත්තාගේ නම සහ අවසන්වරට දැන සිටි ලිපිනය ;

(ආ) එක් එක් කොටස්හිමියා විසින් ඉකුත් අවුරුදු දහයක කාලය ඇතුළත දරන ලද එක් එක් පංතියේ කොටස් ප්‍රමාණය ; සහ

(ඇ) ඉකුත් අවුරුදු දහයක කාලය ඇතුළත—

(i) එක් එක් කොටස්හිමියා වෙත කොටස් කිසිවක් නිකුත් කරන ලද දිනය ; හෝ

(ii) එක් එක් කොටස් හිමියාගෙන් කොටස් නැවත මිල දී ගන්නා ලද හෝ නිදහස් කර ගන්නා ලද දිනය ; හෝ

(iii) එක් එක් කොටස්හිමියා විසින් හෝ කොටස්හිමියා වෙත කොටස් පවරන ලද දිනය,

සහ පැවරීම සම්බන්ධයෙන් වන විට, කොටස් පවරන ලද්දේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තාගේ නම නැතහොත් කොටස් පවරා ගනු ලැබුවේ යම් තැනැත්තකුගෙන් ද, ඒ තැනැත්තාගේ නම,

ඇතුළත් වන කොටස් ලේඛනයක් පවත්වා ගෙන යනු ලැබිය යුතු ය.

(2) සමාගමක් විසින්, (1) වන උපවගන්තියේ නියම අනුව ක්‍රියා කිරීම හැහැර හරිනු ලැබූ අවස්ථාවක—

(අ) සමාගම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ දෙකක් නොඉක්මවන දඩයකට යටත්විය යුතු ය ; තව ද

(ආ) පැහැර හැරීම කරන ලද සමාගමේ සෑම නිලධරයකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

කොටස් ලේඛනයේ ස්ථානය.

**124**. (1) සාංගමික ව්‍යවස්ථාවලියෙන්, ප්‍රකාශිතව අවසර දී ඇත්නම්, සමාගමක කොටස් ලේඛනය, වෙන් වෙන් ස්ථානවල තබාගන්නා ලේඛන දෙකක් වශයෙන් හෝ ඊට වැඩි සංඛ්‍යාවකට හෝ බෙදා වෙන්කර තබා ගත හැකි ය.

(2) ප්‍රධාන ලේඛනය ශ්‍රී ලංකාවෙහි තබා ගත යුතු ය.

(3) කොටස් ලේඛනය, වෙන් වෙන් ස්ථානවල තබාගන්නා ලේඛන දෙකකට හෝ වැඩි සංඛ්‍යාවකට බෙදා ඇති අවස්ථාවක—

(අ) කොටස් ලේඛනය එසේ බෙදා වෙන් කරනු ලැබූ හෝ එය තබන ස්ථානය වෙනස් කරනු ලැබූ පසු වැඩ කරන දවස් දහයක් ඇතුළත, ඒ එක් එක් ලේඛනය තබා ඇති ස්ථානය පිළිබඳ දැන්වීමක් රෙජිස්ට්‍රාර්වරයා වෙත භාර දිය යුතු ය ;

(ආ) සෑම ලේඛනයක ම පිටපතක්, ප්‍රධාන ලේඛනය තබා ඇති ස්ථානයෙහි තබා ගත යුතු ය ; තව ද

(ඇ) ප්‍රධාන ලේඛනය නොවන වෙනත් ලේඛනයක සටහනක් කරනු ලැබ ඇත්නම් ඊට අනුරූප සටහනක් වැඩ කරන දවස් දහයක් ඇතුළත ප්‍රධාන ලේඛනය සමග තබා ඇති ඒ ලේඛනයේ පිටපතෙහි සටහන් කරනු ලැබිය යුතු ය.

(4) කොටස් ලේඛනය බෙදා වෙන් කරනු නොලැබූ සහ ප්‍රධාන ලේඛනය සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ තබා නොමැති අවස්ථාවක, එය එසේ ලියාපදිංචි කාර්යාලයේ තැබීම නතර වීමෙන් හෝ එය තබන ස්ථානය වෙනස් කිරීමෙන් පසු වැඩ කරන දවස් දහයක් ඇතුළත, එය තබා ඇති ස්ථානය පිළිබඳව රෙජිස්ට්‍රාර්වරයා වෙත දැන්වීමක් භාර දිය යුතු ය.

(5) මේ වගන්තියෙහි, සමාගමක් හා සම්බන්ධව, "ප්‍රධාන රෙජිස්ටරය" යන්නෙන්—

(අ) කොටස් ලේඛනය කොටස් දෙකකට හෝ වැඩි ගණනකට බෙදා නොමැති නම්, කොටස් ලේඛනය ;

(ආ) කොටස් ලේඛනය කොටස් දෙකකට හෝ වැඩි ගණනකට බෙදා ඇත්නම්, රෙජිස්ට්‍රාර්වරයා වෙත අවසන් වරට යවන ලද දැන්වීමෙහි ප්‍රධාන ලේඛනය ලෙස විස්තර කර තිබෙන ලේඛනය,

අදහස් වේ.

(6) සමාගමක් විසින්, (3) වන උපවගන්තියේ හෝ (4) වන උපවගන්තියේ නියම අනුව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක—

(අ) සමාගම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය ; තව ද

(ආ) පැහැර හැරීම කරන ලද සමාගමේ සෑම නිලධරයකු ම වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

**125**. ශ්‍රී ලංකාවෙන් පිටත තබා ඇති ලේඛනයක ලියාපදිංචි කරන ලද කොටසක් පැවරීමේ සාධන පත්‍රයක්, ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටි දේපළක් පැවරීමක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එය ශ්‍රී ලංකාවෙහි දී ලියා අත්සන් කරනු ලැබ ඇත්නම් මිස, ශ්‍රී ලංකාවෙහි අය කළ යුතු මුද්දර ගාස්තුවෙන් නිදහස් විය යුතු ය.

ශ්‍රී ලංකාවෙන් පිටත ලේඛනයක ලියාපදිංචි කරනු ලබන කොටස් සම්බන්ධයෙන් මුද්දර ගාස්තු.

කොටස් හිමියන්ගේ සුචිය.

**126**. (1) කොටස් හිමියන් පනස් දෙනකුට වඩා සිටින සෑම සමාගමක් විසින් ම (සමාගමේ කොටස් ලේඛනය, එයට සුචියක් වන ආකාරයෙන් පවත්වාගෙන යන්නේ නම් මිස) සමාගමේ කොටස් හිමියන්ගේ නම්වල සුචියක් තබා ගත යුතු අතර, කොටස් ලේඛනයේ යම් වෙනස් කිරීමක් සිදු කරනු ලැබූ දිනයේ සිට, වැඩ කරන දවස් දහයක් ඇතුළත සුචියෙහි ද අවශ්‍ය යම් වෙනස් කිරීම සිදු කළ යුතු ය.

(2) ලේඛනයෙහි, එක් එක් කොටස් හිමියාගේ ගිණුම පහසුවෙන් සොයා ගත හැකි වනු පිණිස, ඒ ඒ කොටස්හිමියා සම්බන්ධයෙන් ප්‍රමාණවත් වූ දර්ශකයක් සුචියෙහි ඇතුළත් විය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ තබා ගනු ලබන සුචියක, 129 වන වගන්තියේ (2) වන උපවගන්තිය අදාළ වන සමාගමක නම ඇතුළත් වන අවස්ථාවක, ඒ සමාගමේ නමින් ලියාපදිංචි වී තිබෙන කොටස් භාරයක් වශයෙන් දරනු ලබන්නේ යම් තැනැත්තකුගේ හෝ තැනැත්තන්ගේ ප්‍රතිලාභය පිණිස ද, ඒ තැනැත්තාට හෝ තැනැත්තන්ට අදාළව ඒ සමාගම විසින් දී ඇති සියලු දැන්වීම්, සුචියට අමුණා තිබිය යුතු ය.

(4) සමාගමක් විසින් (1) වන උපවගන්තියේ, (2) වන උපවගන්තියේ හෝ (3) වන උපවගන්තියේ විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක—

(අ) සමාගම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය ; තව ද

(ආ) පැහැර හැරීම කරන ලද සමාගමේ සෑම නිලධරයකු ම වරදකට වරදකරු වන අතර වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

ලේඛනය වසා තැබීමේ බලය.

**127**. සමාගමක් විසින් ගැසට් පත්‍රයේ සහ සමාගමේ ලියාපදිංචි කාර්යාලය පිහිටි හා කොටස් ලේඛනය තබා ඇති දිස්ත්‍රික්කයේ බෙදා හරින යම් ප්‍රවෘත්ති පත්‍රයක දැන්වීමක් පළ කිරීමෙන් පසුව, එක් එක් වර්ෂයේ සමස්තය වැඩ කරන දවස් තිහක් නොඉක්මවන යම් කාලයක් හෝ කාලයන් තුළ කොටස් ලේඛනය වසා තබනු ලැබිය හැකි ය.

ලේඛනය නිවැරදි කිරීමට අධිකරණය සතු බලය.

**128**. (1) (අ) ප්‍රමාණවත් හේතුවක් නොමැතිව යම් තැනැත්තකුගේ නම සමාගමක කොටස් ලේඛනයේ ඇතුළත් කිරීම හෝ නොකර හැරීම කරනු ලැබූ අවසථාවක දී ; හෝ

(ආ) යම් තැනැත්තකු කොටස් හිමියකුව සිටීම අවසාන වීම, ලේඛනයෙහි ඇතුළත් කිරීමෙහි ලා පැහැර හැරීමක් හෝ අනවශ්‍ය ප්‍රමාදයක් හෝ සිදු වූ අවස්ථාවක,

අතෘප්තියට පත් තැනැත්තා විසින් හෝ සමාගම විසින් හෝ සමාගමේ යම් කොටස් හිමියකු විසින් හෝ ලේඛනය නිවැරදි කරවා ගැනීම සඳහා අධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක, ලේඛනය නිවැරදි කරන ලෙස යම් අතෘප්තියට පත් තැනැත්තකුට දැරීමට සිදු වී ඇති යම් අලාභයක් ගෙවන ලෙස සමාගමට නියම කරන ආඥාවක් අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලැබූ ඉල්ලීමක් මත, අධිකරණය විසින් -

(අ) තමන්ගේ නම ලේඛනයෙහි ඇතුළත් කරවා ගැනීම හෝ ලේඛනයෙන් ඉවත් කරවා ගැනීම සඳහා, ඉහත කී ඉල්ලීමට පාර්ශ්වකරුවකු වූ යම් තැනැත්තකුගේ හිමිකම හා සම්බන්ධ යම් ප්‍රශ්නයක්, කොටස් හිමියන් අතර හෝ කොටස් හිමියන් යයි කියනු ලබන තැනැත්තන් අතර නැතහොත් එක් පක්ෂයකට කොටස් හිමියන් හෝ කොටස් හිමියන් යයි කියනු ලබන තැනැත්තන් සහ අනෙක් පක්ෂයට සමාගම අතර උද්ගත වුව ද, ඒ ප්‍රශ්නය ; සහ

(ආ) ලේඛනය නිවැරදි කිරීම පිණිස තීරණය කිරීම අවශ්‍ය හෝ අවස්ථානුකූල වෙනත් යම් ප්‍රශ්නයක්,

තීරණය කරනු ලැබිය හැකි ය.

(4) ලේඛනය නිවැරදි කරන ලෙස විධාන කරන ආඥාවක් අධිකරණය විසින් කරනු ලැබුවහොත්, ඒ ආඥාව කරනු ලැබීමෙන් වැඩකරන දවස් දහයක් ඇතුළත, ඒ ආඥාවේ පිටපතක් සමාගම විසින් රෙජිස්ට්‍රාර්වරයා වෙත භාර දෙනු ලැබිය යුතු ය.

(5) සමාගමක් විසින් (4) වන උපවගන්තියේ විධිවිධාන අනුව ක්‍රියා කිරීම, පැහැර හරිනු ලැබූ අවස්ථාවක—

(අ) සමාගම වරදකට වරදකරු වන අතර වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය ; තව ද

(ආ) පැහැර හැරීම කරන ලද සමාගමේ සෑම නිලධරයකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

භාර කොටස් ලේඛනයේ ඇතුළත් නොකළ යුතු බව.

**129**. (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරනු ලැබූ සමාගම් සම්බන්ධයෙන් වන විට, යම් ප්‍රකාශිත, ව්‍යංජිත හෝ අනුමිත භාරයක් පිළිබඳ කිසිම දැන්වීමක්, කොටස් ලේඛනයේ ඇතුළත් කරනු නොලැබිය යුතු ය ; නැතහොත් රෙජිස්ට්‍රාර්වරයා විසින් භාර ගැනීම කළ නොහැකි විය යුතු ය.

(2) (අ) 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය මධ්‍යම තැන්පතුධාරී ලෙස ක්‍රියා කිරීම ප්‍රධාන ව්‍යාපාරය වන ; සහ

(ආ) ඒ පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විමසා අමාත්‍යවරයා විසින් අනුමත කර තිබෙන,

සමාගමක් භාරකරුවන යම් භාරයක්, සමාගමක් විසින් එහි ලේඛනයේ ඇතුළත් කළ යුතු අතර, එවැනි භාරයක් පිළිබඳව රෙජිස්ට්‍රාර්වරයා වෙත දැන්වීමක් කරනු ලැබිය යුතු ය.

කොටස් ලේඛනය සාක්ෂියක් වන බව.

**130**. (1) කොටස් ලේඛනයෙහි තැනැත්තකුගේ නම, කොටසක් දරන්නා ලෙස ඇතුළත් කිරීම, ඒ කොටසේ හිමිකම ඒ තැනැත්තා සතුව ඇති බවට, බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

(2) 86 වන වගන්තියේ (2) වන හා (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, කොටසක ලියාපදිංචිය දරන්නා—

(අ) ඒ කොටස හා සම්බන්ධව ඡන්දය දීමේ අයිතිවාසිකම ක්‍රියාත්මක කිරීමට ;

(ආ) දැන්වීම් ලැබීමට ;

(ඇ) ඒ කොටස වෙනුවෙන් බෙදා හැරීමක් ලැබීමට ; සහ

(ඈ) ඒ කොටස හා සම්බන්ධව වෙනත් අයිතිවාසිකම් හා බලතල කිසිවක් ක්‍රියාත්මක කිරීමට,

හිමිකම ඇති එකම තැනැත්තා ලෙස සමාගමක් විසින් සලකනු ලැබිය හැකි ය.

## වාර්ෂික වාර්තාව

**131**. (1) සෑම සමාගමක් විසින් ම, (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, මෙහි පස්වන උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් කාරණා ඇතුළත් වාර්ෂික වාර්තාවක්, යටත් පිරිසෙයින් සෑම වර්ෂයකට වරක් නියමිත ආකෘතියෙහි රෙජිස්ට්‍රාර්වරයා වෙත භාර දෙනු ලැබිය යුතු ය. වාර්ෂික වාර්තාව.

(2) වර්ෂය සඳහා වූ වාර්ෂික රැස්වීම ඒ වර්ෂයෙහි කොටස් හිමියන්ගේ ප්‍රථම හෝ එකම රැස්වීම වුව ද, ඒ රැස්වීමේ දින සිට වැඩ කරන දවස් තිහක් ඇතුළත වාර්ෂික වාර්තාව සම්පූර්ණ කළ යුතු ය. සමාගමේ අධ්‍යක්ෂවරයකු සහ ලේකම්වරයා යන දෙදෙනා ම විසින් අත්සන් කළ ඒ වාර්තාවේ පිටපතක් සමාගම විසින් වහාම රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) සමාගමක් සංස්ථාගත කරනු ලැබූ වර්ෂයේ දී, මේ වගන්තියේ විධිවිධාන සමාගමකට අදාළ නොවිය යුතු ය.

(4) සමාගමක් විසින්, (1) වන උපවගන්තියේ හෝ (2) වන උපවගන්තියේ විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක —

(අ) සමාගම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය ; තව ද

(ආ) පැහැර හැරීම සිදුකරන ලද සමාගමේ සෑම නිලධරයකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

**132**. සෑම පෞද්ගලික සමාගමක් විසින් ම, එහි වාර්ෂික වාර්තාව සමග – පෞද්ගලික සමාගමක් විසින් වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශය සහ සහතිකය යැවිය යුතු බව.

(අ) සමාගමේ අධ්‍යක්ෂවරයන් විසින් කළ යුතු යයි මේ පනතින් හෝ මේ පනත යටතේ නියම කර ඇති සියලු දේ තමන්ගේ දැනුම හා විශ්වාසය අනුව කර තිබෙන බවට අධ්‍යක්ෂවරයන් විසින් අත්සන් කරන ලද ප්‍රකාශයක් ;

(ආ) (i) සමාගම විසින්, අවසාන වාර්ෂික වාර්තාවෙන් පසුව හෝ ප්‍රථම වාර්තාවක් සම්බන්ධයෙන් වන විට, සමාගම

සංස්ථාගත කරනු ලැබූ දිනයෙන් පසුව සමාගමේ කොටස් හෝ ණය පත්‍ර කිසිවකට සහභාගි වන ලෙස මහජනයා වෙත යම් ඇරයුමක් නිකුත් කරනු නොලැබූ බවට ;

(ii) සමාගමේ කොටස් හිමියන්ගේ සංඛ්‍යාව පනහකට වැඩි බව වාර්ෂික වාර්තාවෙන් හෙළි වන අවස්ථාවක, අතිරික්තය, සම්පූර්ණයෙන් ම 27 වන වගන්තිය යටතේ එකී සීමාව හා සම්බන්ධයෙන් ගණන් ගනු නොලැබිය යුතු තැනැත්තන්ගෙන් යුක්තව ඇති බවට,

අධ්‍යක්ෂවරයකු සහ සමාගමේ ලේකම්වරයා විසින් අත්සන් කරන ලද සහතිකයක්,

රෙජිස්ට්‍රාර්වරයා වෙත යවනු ලැබිය යුතු ය.

## රැස්වීම් හා රැස්වීම්වල කටයුතු

වාර්ෂික මහා සභා රැස්වීම.

**133**. (1) (2) වන උපවගන්තියේ සහ 144 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, එක් එක් ලිත් වර්ෂයකට වරක් සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලය විසින් -

(අ) සමාගමේ ශේෂ පත්‍ර දිනයේ සිට මාස හයකට වඩා පසු නොවන ; සහ

(ආ) පූර්ව වාර්ෂික රැස්වීමෙන් පසු මාස පහළොවකට වඩා පසු නොවන,

දිනයක දී පැවැත්වීම සඳහා කොටස් හිමියන්ගේ වාර්ෂික රැස්වීමක් කැඳවනු ලැබිය යුතු ය.

(2) සමාගමක් සංස්ථාගත කරනු ලැබූ ලිත් වර්ෂයේ දී එහි ප්‍රථම වාර්ෂික රැස්වීම පැවැත්වීම අවශ්‍ය නොවන නමුත්, ඒ රැස්වීම සමාගම සංස්ථාගත කරනු ලැබීමෙන් පසු මාස දහඅටක් ඇතුළත පවත්වනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ විධිවිධානවලට අනුකූලව සමාගමක රැස්වීමක් පැවැත්වීමෙහි ලා පැහැර හැරීමක් සිදු කරනු ලැබුවහොත්, රෙජිස්ට්‍රාර්වරයා විසින් සමාගමේ යම් කොටස්කරුවකුගේ ඉල්ලීම මත සමාගමේ මහා සභා රැස්වීමක් කැඳවීම හෝ කැඳවන ලෙස විධාන කිරීම හෝ කරනු ලැබිය හැකි අතර, අවස්ථානුකූල යයි රෙජිස්ට්‍රාර්වරයා අදහස් කරනු ලබන පරිදි, රැස්වීම කැඳවීමට,

පැවැත්වීමට හෝ හැසිරවීමට අදාළව සමාගමේ ව්‍යවස්ථාවලිය ක්‍රියාත්මක වීම සුළු වශයෙන් වෙනස් කරන හෝ පරිපූරණය කරන විධාන ද, පෞද්ගලිකව ම පැමිණ සිටින හෝ ප්‍රතියුක්තයකු මගින් පෙනී සිටින සමාගමේ එක් කොටස් හිමියකුගෙන් සමාගමේ රැස්වීමක් සංස්ථාපනය වන ලෙස සලකනු ලැබිය යුතු බවට විධානයක් ද ඇතුළුව යම් අනුයාත හෝ ආනුෂංගික විධාන දෙනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර පවත්වනු ලබන මහා සභා රැස්වීමක්, රෙජිස්ට්‍රාර්වරයාගේ යම් විධානයකට යටත්ව, සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීමක් ලෙස සලකනු ලැබිය යුතු ය; එහෙත් එසේ පවත්වනු ලබන රැස්වීමක් සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වීම පැහැර හැරීම සිදු වූ වර්ෂයේ දී පවත්වනු නොලැබූ අවස්ථාවක, එසේ පවත්වන රැස්වීමේ දී එය වාර්ෂික මහා සභා රැස්වීම ලෙස සැලකිය යුතු බවට සමාගම විසින් යෝජනා සම්මත කරනු ලැබුවහොත් මිස, ඒ රැස්වීම ඒ වර්ෂය සඳහා වූ මහා සභා රැස්වීම ලෙස සලකනු නොලැබිය යුතු ය.

(5) රැස්වීමක් (4) වන උපවගන්තියේ සඳහන් ආකාරයට සැලකිය යුතු බවට සමාගමක් විසින් යෝජනා සම්මත කරනු ලැබූ අවස්ථාවක, ඒ යෝජනා සම්මතය සම්මත කරන ලද දින සිට වැඩ කරන දවස් දහයක් ඇතුළත එහි පිටපතක්, රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඔහු විසින් එය වාර්තාගත කරනු ලැබිය යුතු ය.

(6) (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව සමාගමේ රැස්වීමක් පැවැත්වීමෙහි ලා හෝ (3) වන උපවගන්ති යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් කරන ලද විධාන කිසිවක් අනුව ක්‍රියා කිරීමෙහි ලා හෝ (4) වන උපවගන්තියේ විධිවිධාන අනුව ක්‍රියා කිරීමෙහි ලා පැහැර හැරීමක් සිදු කරනු ලැබූ අවස්ථාවක—

(අ) සමාගම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය ; තව ද

(ආ) පැහැර හැරීම කරන ලද සමාගමේ සෑම නිලධරයකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

අධියාචනයක් මත අති විශේෂ මහා සභා රැස්වීමක් කැඳවීම.

**134**. (1) ව්‍යවස්ථාවලියේ කුමක් සඳහන්ව ඇත ද අධියාචනයක් තැන්පත් කිරීමේ දිනය වන විට යම් ප්‍රශ්නයක් පිළිබඳව දෙනු ලැබිය හැකි ඡන්ද සංඛ්‍යාවෙන් සියයට දහයකට නොඅඩු ඡන්ද හිමිකම තිබෙන කොටස් ප්‍රමාණයක් දරන කොටස් හිමියන් විසින් අධියාචනයක් කරනු ලැබූ විට, එම ප්‍රශ්නය සලකා බැලීම සහ ඒ පිළිබඳව ඡන්ද විමසීම සඳහා සමාගමක අධ්‍යක්ෂවරයන් විසින් විධිමත් ලෙස සමාගමේ අති විශේෂ මහ සභා රැස්වීමක් කැඳවීමට නොපමාව කටයුතු කළ යුතු ය. ඒ රැස්වීම එකී අධියාචනය භාර කරනු ලැබීමෙන් පසු වැඩ කරන දවස් පහළොවක් ඇතුළත කැඳවනු ලැබ, අධියාචනය භාර කරනු ලැබීමෙන් පසු වැඩ කරන දවස් තිහක් ඇතුළත පවත්වනු ලැබිය යුතු ය.

(2) රැස්වීමේ දී සලකා බැලීමට සහ සලකා බලා ඡන්දය විමසීමට තිබෙන ප්‍රශ්නය හෝ ප්‍රශ්න අධියාචනයෙහි ප්‍රකාශ විය යුතු සහ අධියාචකයන් විසින් එහි අත්සන් කර තිබිය යුතු අතර, එය සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ තැන්පත් කරනු ලැබිය යුතු ය. තව ද ඒ අධියාචනය අධියාචකයන් එක් කෙනකු හෝ වැඩි සංඛ්‍යාවක් විසින් අත්සන් කරන ලද සමාන ආකෘතියෙහි වූ ලේඛන කිහිපයකින් සමන්විත විය හැකි ය.

(3) අධියාචනයක් තැන්පත් කරන ලද දිනයේ සිට වැඩ කරන දින පහළොවක් ඇතුළත අධ්‍යක්ෂවරයන් විසින් රැස්වීමක් කැඳවීම සඳහා විධිමත් ලෙස කටයුතු කරනු නොලැබූ අවස්ථාවක, අධියාචකයන් විසින් ම හෝ ඔවුන් සියල්ලන් සතු මුළු ඡන්ද හිමිකමෙන් හරි අඩකට වැඩි ප්‍රමාණයක් නියෝජනය කරන ඔවුන් අතුරෙන් යම් අධියාචකයන් විසින් ඔවුන් ම රැස්වීමක් කැඳවනු ලැබිය හැකි ය. එහෙත් එසේ කැඳවනු ලබන යම් රැස්වීමක් එකී දිනයේ සිට මාස තුනක් ඉකුත් වීමෙන් පසු පවත්වනු නොලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ විධිවිධාන යටතේ අධියාචකයන් විසින් කැඳවනු ලබන රැස්වීමක්, අධ්‍යක්ෂවරයන් විසින් රැස්වීම් කැඳවිය යුතු ආකාරයට හැකි තාක් ආසන්න ලෙසින් කැඳවනු ලැබිය යුතු ය.

(5) විධිමත් ලෙස රැස්වීමක් කැඳවීම අධ්‍යක්ෂවරයන් විසින් පැහැර හැරීම හේතුකොට ගෙන, අධියාචකයන් විසින් දරන ලද යුක්තිසහගත වියදම් කිසිවක්, සමාගම විසින් අධියාචකයන්ට ආපසු ගෙවනු ලැබිය යුතු අතර, එසේ ආපසු ගෙවන ලද යම් මුදලක්, අධ්‍යක්ෂවරයන්ට ලැබිය යුතු හෝ ඔවුන්ගේ සේවය සඳහා ගාස්තු වශයෙන් හෝ වෙනත් පාරිශ්‍රමික වශයෙන් හෝ සමාගමෙන් ලැබීමට ඇති මුදල් කිසිවකින් පැහැර හැරීමක් සිදු කළ ලෙස නොගෙවා රඳවා තබා ගනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තියේ කාර්ය සඳහා, විශේෂ යෝජනා සම්මතයක් ලෙස යෝජනා සම්මතයක් සම්මත කර ගැනීමට ඇති රැස්වීමක් සම්බන්ධයෙන් වන විට, 145 වන වගන්තියේ විධිවිධානවලින් නියම කර ඇති පරිදි ඒ පිළිබඳ දැන්වීමක් අධ්‍යක්ෂවරයන් විසින් කරනු නොලැබුවහොත්, ඒ රැස්වීම ඔවුන් විසින් විධිමත් ලෙස කැඳවනු නොලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

රැස්වීම් කැඳවීම සඳහා දැන්වීම් කළ යුතු කාලසීමා.

**135**. (1) සමාගමක (කල් තැබූ රැස්වීමක් නොවන) රැස්වීමක්, පහත සඳහන් කාලසීමාවලට වඩා අඩු කාලසීමාවක දැනුම් දීමකින් පසු කැඳවීම සඳහා විධිවිධාන සලසා ඇති තාක් දුරට, ඒ සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියෙහි ඇති යම් විධිවිධානයක් බලරහිත විය යුතු ය :—

(අ) වාර්ෂික මහා සභා රැස්වීම සම්බන්ධයෙන් වන විට, වැඩ කරන දවස් පහළොවක ලිඛිත දැන්වීමක් ; සහ

(ආ) වාර්ෂික මහා සභා රැස්වීමක් හෝ විශේෂ යෝජනා සම්මතයක් සම්මත කර ගැනීම සඳහා වූ රැස්වීමක් නොවන රැස්වීමක් සම්බන්ධයෙන් වන විට, පෞද්ගලික හෝ සීමාරහිත සමාගමක් නොවන සමාගමක් සම්බන්ධයෙන් නම්, වැඩ කරන දවස් දහයක දැන්වීමක් සහ පෞද්ගලික හෝ සීමාරහිත සමාගමක් සම්බන්ධයෙන් නම්, වැඩ කරන දවස් පහක දැන්වීමක්.

(2) සමාගමේ (අඩාලව කල් තැබූ රැස්වීමක් නොවන) රැස්වීමක් කැඳවීම, සමාගමේ ව්‍යවස්ථාවලියෙන් වෙනත් විධිවිධාන ඒ වෙනුවෙන් සලසා ඇති තාක් දුරට හැර, (1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, පහත සඳහන් පරිදි, එනම් :—

(අ) වාර්ෂික මහා සභා රැස්වීම සම්බන්ධයෙන් වන විට, වැඩ කරන දවස් පහළොවක ලිඛිත දැන්වීමක් ; සහ

(ආ) වාර්ෂික මහා සභා රැස්වීමක් හෝ විශේෂ යෝජනා සම්මතයක් සම්මත කර ගැනීම සඳහා වූ රැස්වීමක් නොවන රැස්වීමක් සම්බන්ධයෙන් වූ විට, පෞද්ගලික හෝ සීමාසහිත සමාගමක් නොවන සමාගමක් වූ විට, වැඩ කරන දවස් දහයක ලිඛිත දැන්වීමක් ද, පෞද්ගලික හෝ සීමාරහිත සමාගමක් නම්, වැඩ කරන දවස් පහක ලිඛිත දැන්වීමක්,

කිරීමෙන් කැඳවනු ලැබිය හැකි ය.

(3) අවස්ථාවෝචිත පරිදි, ඉහත අන්තිම උපවගන්තියේ හෝ සමාගමේ ව්‍යවස්ථාවලියෙහි හෝ නිශ්චිතව සඳහන් කාලසීමාවට

වඩා අඩු කාලයක දැන්වීමකින් කැඳවනු ලැබුව ද, සමාගමේ රැස්වීමක් විධිමත් ලෙස කැඳවනු ලැබූ බවට—

(අ) වාර්ෂික මහා සභා රැස්වීමක් වශයෙන් කැඳවන ලද රැස්වීමක් සම්බන්ධයෙන් වන විට, ඒ රැස්වීමේ දී පැමිණ ඡන්දය දීමට හිමිකම ඇති සියලු ම සාමාජිකයන් ; සහ

(ආ) වෙනත් යම් රැස්වීමක් සම්බන්ධයෙන් වන විට ඒ රැස්වීමේ දී සලකා බැලීමට හා ඡන්දය විමසීමට ඇති එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන්, ඡන්දය දීමේ අයිතිවාසිකම ලැබෙන සියයට අනූපහකට නොඅඩු හිමිකම සහිත කොටස් එක්ව දරන කොටස් හිමියන් වන්නා වූ, රැස්වීමට පැමිණ ඡන්දය දීමට අයිතිවාසිකමක් ඇති කොටස් හිමියන්,

විසින් එසේ එකඟවනු ලැබුවහොත්, ඒ රැස්වීම විධිමත් ලෙස කැඳවනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

රැස්වීම් හා ඡන්ද පිළිබඳ විධිවිධාන.

**136**. (1) සමාගම් ව්‍යවස්ථාවලියෙන් රැස්වීම් හා ඡන්ද පිළිබඳව වෙනත් විධිවිධාන සලස්වනු නොලබන තාක් දුරට, පහත සඳහන් විධිවිධාන බලාත්මක විය යුතු ය :—

(අ) ආදර්ශ ව්‍යවස්ථාවලියෙහි විධිවිධාන යටතේ දැනුම් දීමට නියම කර ඇති ආකාරයෙන්, සමාගමක රැස්වීම් පිළිබඳ දැන්වීම, සමාගමේ සෑම කොටස් හිමියකු වෙතම යැවිය යුතු ය ;

(ආ) ප්‍රශ්නයක් සම්බන්ධයෙන් දෙනු ලැබිය හැකි ඡන්ද ප්‍රමාණයෙන් සියයට දහයකට නොඅඩු ප්‍රමාණයක් සඳහා හිමිකම ඇති කොටස් දරන කොටස් හිමියන් දෙදෙනකු හෝ වැඩි සංඛ්‍යාවක් විසින්, ඒ ප්‍රශ්නය සලකා බලා ඡන්දය දීම සඳහා රැස්වීමක් කැඳවනු ලැබිය හැකි ය ;

(ඇ) පෞද්ගලික සමාගමක් සම්බන්ධයෙන් වන විට, කොටස්හිමියන් දෙදෙනකු ද, වෙනත් යම් සමාගමක් සම්බන්ධයෙන් වන විට කොටස් හිමියන් තිදෙනකු ද පෞද්ගලිකව ම හෝ 138 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ විධිවිධාන යටතේ බලය දෙනු ලැබූ නියෝජිතයකු මගින් හෝ පැමිණ සිටීමෙන් ඒ රැස්වීමේ ගණපූර්ණය සංයුක්ත විය යුතු ය ;

(ඈ) රැස්වීමකට පැමිණ සිටින කොටස්හිමියන් විසින් තෝරා පත් කරනු ලැබූ කොටස්හිමියකුට එහි සභාපතිවරයා විය හැකි ය ;

(ඉ) සමාගමේ කොටස් වෙනුවෙන් තමා විසින් එවකට ගෙවිය යුතුව ඇති සියලු ඇරයුම්වල මුදල් සහ වෙනත් සියලු මුදල් ගෙවා ඇත්නම් මිස, කිසිම කොටස් හිමියකු යම් මහා සභා රැස්වීමක දී ඡන්දය දීමට හිමිකම් නොලැබිය යුතු ය ;

(ඊ) ඡන්දය දීම අත් එසවීමෙන් කරනු ලබන අවස්ථාවක, එක් එක් සමාජිකයකුට එක් ඡන්දයක් බැගින් තිබිය යුතු අතර, ඡන්ද විමසීමක දී සෑම සාමාජිකයකුට ම ඔහු දරන එක් එක් කොටස වෙනුවෙන් එක් ඡන්දය බැගින් තිබිය යුතු ය.

රැස්වීමක් පවත්වන ලෙස ආඥා කිරීමට අධිකරණයට බලය ඇති බව.

**137**. (1) සමාගමක සභා රැස්වීමක්, ඒ සමාගමේ සභා රැස්වීම් කැඳවිය හැකි යම් ආකාරයකින් කැඳවීම හෝ ව්‍යවස්ථාවලියෙන් හෝ මේ පනතින් නියම කර ඇති ආකාරයෙන් සමාගමේ සභා රැස්වීම් හැසිරවීම යම් හේතුවක් නිසා කළ නොහැකි වන අවස්ථාවක, අධිකරණය විසින් සිය මෙහෙයීමෙන් ම හෝ සමාගමේ යම් අධ්‍යක්ෂවරයකු හෝ රැස්වීමේ දී ඡන්දය දීමට හිමිකම් ඇති සමාගමේ යම් කොටස්හිමියකු විසින් ඉල්ලීමක් කරනු ලැබූ කල්හි, අධිකරණය යෝග්‍ය යයි සිතනු ලබන ආකාරයෙන් සමාගමේ සභා රැස්වීමක් කැඳවීමට, පැවැත්වීමට හා හැසිරවීමට ආඥා කළ හැකි අතර, එබඳු යම් ආඥාවක් කරනු ලැබූ විටක, අවස්ථානුකූල යයි අධිකරණය සිතනු ලබන ආකාරයෙන් අනුයාත හෝ ආනුෂංගික විධාන කළ හැකි ය. තව ද එබඳු යම් ආඥාවක් අනුව කැඳවනු ලැබූ, පවත්වනු ලැබූ හා හසුරුවනු ලැබූ යම් සභා රැස්වීමක් සමාගමේ, විධිමත් ලෙස කැඳ වූ, පැවැත් වූ හා හැසිර වූ සභා රැස්වීමක් ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය. තව ද තමන්ම හෝ ප්‍රතියුක්තයකු මගින් හෝ පැමිණ සිටින සමාගමේ එක් සාමාජිකයකුගෙන් රැස්වීමක් සංස්ථාපනය වූ ලෙස සලකනු ලැබිය යුතු බවට වූ විධානයක් ද මීට ඇතුළත් විය හැකි ය.

(2) මේ වගන්තියේ විධිවිධාන යටතේ කැඳවනු ලබන රැස්වීමක් පිළිබඳ එක් එක් දැන්වීමේ පිටපතක්, ඒ දැන්වීම කොටස්හිමියන් වෙත යැවීමට නියම කරනු ලැබූ වේලාවේ දී ම රෙජිස්ට්‍රාර්වරයා වෙත ද යවනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ විධිවිධාන අනුව ක්‍රියා කිරීමෙහි ලා පැහැර හැරීමක් කරනු ලැබූ අවස්ථාවක—

(අ) සමාගම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය ; තව ද

(ආ) පැහැර හැරීම කරන ලද සමාගමේ සෑම නිලධරයකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

වෙනත් සමාගම්වල හා ණය හිමියන්ගේ රැස්වීම්වල දී සමාගම නියෝජනය කිරීම.

**138**. (1) මේ පනතේ අර්ථානුකූලව සමාගමක් වුව ද නොවුව ද සංස්ථාවක් විසින්—

(අ) එය, මේ පනතේ අර්ථානුකූලව සමාගමක් වූ වෙනත් සංස්ථාවක කොටස් හිමියකු වන අවස්ථාවක, සමාගමේ යම් රැස්වීමක දී හෝ සමාගමේ යම් පන්තියකට අයත් කොටස් හිමියන්ගේ රැස්වීමක දී, එහි නියෝජිතයා ලෙස ක්‍රියා කිරීම සඳහා යෝග්‍ය යයි කල්පනා කරන තැනැත්තකුට, එහි අධ්‍යක්ෂවරයන්ගේ හෝ වෙනත් පාලක මණ්ඩලයක හෝ යෝජනා සම්මතයක් මගින් බලය දීම ;

(ආ) එය, මේ පනතේ අර්ථානුකූලව සමාගමක් වූ වෙනත් සංස්ථාවක් (සෑණ පත්‍ර දරන්නකු ද ඇතුළුව) ණය හිමියකු වූ අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, මේ පනතට හෝ පනත යටතේ සාදනු ලැබූ රීති කිසිවකට හෝ අනුකූලව නැතහොත් යම් සෑණ පත්‍රයක හෝ භාර ඔප්පුවකට ඇතුළත් විධිවිධානවලට අනුකූලව පවත්වනු ලබන සමාගමේ ණය හිමියන් කිසිවකුගේ යම් රැස්වීමක දී එහි නියෝජිතයා ලෙස ක්‍රියා කිරීමට යෝග්‍ය යයි කල්පනා කරන තැනැත්තකුට එහි අධ්‍යක්ෂවරයන්ගේ හෝ වෙනත් පාලක මණ්ඩලයක යෝජනා සම්මතයක් මගින් බලය දීම,

කළ හැකි ය.

(2) ඉහත කී පරිදි බලය දෙනු ලැබූ තැනැත්තකු විසින් නියෝජනය කරනු ලබන සංස්ථාව වෙනුවෙන්, ඒ සංස්ථාව, ඒ අනෙක් සමාගමේ තනි කොටස්හිමියකු, ණයහිමියකු හෝ සෑණ පත්‍ර දරන්නකු වූයේ නම් ක්‍රියාත්මක කළ හැකිව තිබූ බලතල ම ක්‍රියාත්මක කිරීමට ඔහුට හිමිකම තිබිය යුතු ය.

ප්‍රතියුක්තයෝ.

**139**. (1) සමාගමේ රැස්වීමක දී පැමිණ සිට ඡන්දය දීමට හිමිකම් ඇත්තා වූ සමාගමක යම් කොටස් හිමියකුට, ඔහු වෙනුවෙන් ඔහුගේ ප්‍රතියුක්තයා වශයෙන් පැමිණ ඡන්දය දීමට (කොටස් හිමියකු වුව ද, නොවුව ද) වෙනත් තැනැත්තකු පත් කිරීමට හිමිකම තිබිය යුතු ය. එසේ පත් කරනු ලැබූ ප්‍රතියුක්තයකුට අත් ඔසවා ඡන්දය දීමක දී හෝ ඡන්දය විමසීමක දී හෝ ඡන්දය දීමට සහ ඒ රැස්වීමේ දී කථා කිරීමට කොටස් හිමියා හා සමාන අයිතිවාසිකම තිබිය යුතු ය :

එසේ වුවද, ව්‍යවස්ථාවලියෙහි අන්‍යාකාරයෙන් විධිවිධාන සලසා ඇත්නම් මිස, එකම අවස්ථාවේ දී පැමිණ සිටීමට එක් ප්‍රතියුක්තයකුට වඩා පත් කිරීමට කොටස් හිමියකුට හිමිකම නොතිබිය යුතු ය.

(2) මෙම පනතේ කුමක් සඳහන් වුව ද භාණ්ඩාගාරයේ ලේකම්වරයා කොටස්වලින් සියයට දහයකට වඩා දරන්නකු වූ විට, භාණ්ඩාගාරයේ ලේකම්වරයා දරන ලද සෑම සියයට දහයකටම හෝ ඉන් කොටසකට ප්‍රතියුක්තයකු වශයෙන් වෙනත් තැනැත්තකු පත් කිරීමට හිමිකම ඇත්තේ ය :

එසේ වුව ද, භාණ්ඩාගාරයේ ලේකම්වරයා සමාගමක සංස්ථාවලිය අනුව සමාගමක ස්වර්ණමය කොටස් දරන්නකු වූ විට මෙම පනතේ කුමක් සඳහන් වුව ද එකම අවස්ථාවේ සහභාගී වීම සඳහා ස්වර්ණමය කොටස්කරුවකු වශයෙන් භාණ්ඩාගාරයේ ලේකම්වරයාට ප්‍රතියුක්තයන් තිදෙනකුට වඩා වැඩි නොවන වෙනත් තැනැත්තන් පත් කිරීමට හිමිකම ඇත්තේ ය.

(3) සමාගමක රැස්වීමක් කැඳවන සෑම දැන්වීමකම රැස්වීමට පැමිණ ඡන්දය දීමට හිමිකම ඇති සෑම කොටස් හිමියකුට ම, ඔහු වෙනුවෙන් රැස්වීමට පැමිණ ඡන්දය දීම සඳහා ප්‍රතියුක්තයකු පත් කිරීමට හිමිකම ඇති බවට සහ ප්‍රතියුක්තයා ද කොටස් හිමියකු වීම අවශ්‍ය නොවන බවට වූ ප්‍රකාශයක් සාධාරණ ප්‍රකට භාවයකින් යුක්තව දක්වා තිබිය යුතු ය. යම් රැස්වීමක් සම්බන්ධයෙන් මේ උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරිනු ලබන අවස්ථාවක, පැහැර හැරීම කරන ලද සමාගමේ සෑම නිලධරයකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(4) ප්‍රතියුක්තයකු පත් කිරීමේ සාධන පත්‍රයක් හෝ ප්‍රතියුක්තයකු පත් කිරීමේ වලංගු භාවය දැක්වීමට අවශ්‍ය නැතහොත් ප්‍රතියුක්තයකු පත් කිරීමට අන්‍යාකාරයකින් අදාළ වෙනත් යම් ලේඛනයක්, ඒ පත්වීම රැස්වීමේ දී බලසහිත බවට පත් කරනු පිණිස, ඒ රැස්වීමට හෝ අඩාළව කල් තබන ලද රැස්වීමට පැය හතලිස් අටකට වැඩි කාලයකට කලින් සමාගමක හෝ වෙනත් තැනැත්තකුට හෝ ලැබිය යුතු බව නියම කිරීමේ බලපෑම ඇතිතාක් දුරට, සමාගමේ ව්‍යවස්ථාවලියේ ඇතුළත් යම් විධානයක් බලරහිත වන්නේ ය.

(5) සමාගමේ යම් රැස්වීමක කාර්ය සඳහා ආරාධනා පත්‍රවල නිශ්චිතව සඳහන් තැනැත්තකු හෝ තැනැත්තන් සංඛ්‍යාවකින් එක් තැනැත්තකු

ප්‍රතියුක්තයකු වශයෙන් පත් කරන ලෙස, රැස්වීම පිළිබඳව දැන්වීමක් යවනු ලැබීමටත් එහි දී ප්‍රතියුක්තයකු මගින් ඡන්දය දීමටත් හිමිකම් ඇති කොටස් හිමියන්ගෙන් කීප දෙනකුට පමණක් සමාගමේ වියදමින් ආරාධනා පත්‍ර නිකුත් කරනු ලැබ ඇති අවස්ථාවක, ඉහත කී පරිදි ඒවා නිකුත් කිරීමට දැන දැනම හෝ ඕනෑකමින් ම බලය දෙන හෝ අවසර දෙන, සමාගමේ සෑම නිලධරයකු ම වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂ දෙකක් නොඉක්මවන දඩයකින් දඬුවම් කරනු ලැබීමට යටත් විය යුතු ය :

එසේ වුව ද, රැස්වීමේ දී ප්‍රතියුක්තයකු මගින් ඡන්දය දීමට හිමිකම ඇති සෑම කොටස් හිමියකු විසින් ම ලිඛිත ඉල්ලීමක් මත, ප්‍රතියුක්තයකු නම් කෙරෙන පත්කිරීමේ ආකෘති පත්‍රයක් හෝ ප්‍රතියුක්තයකු වශයෙන් ක්‍රියා කිරීමට කැමති තැනැත්තන්ගේ ලැයිස්තුවක් ලබාගත හැකි වන්නේ නම්, ඒ ආකෘති පත්‍රයක් හෝ ලැයිස්තුවක් කොටස් හිමියකුට ඔහුගේ ඉල්ලීම මත නිකුත් කිරීමේ හේතුව නිසා ම පමණක්, යම් නිලධරයකු, මේ උපවගන්තියේ විධිවිධාන යටතේ වගකීමට යටත් නොවිය යුතු ය.

(6) මේ වගන්තියේ විධිවිධාන, සමාගමක මහා සභා රැස්වීම්වලට අදාළ වන ආකාරයෙන් ම, සමාගමේ කවර හෝ පන්තියකට අයත් කොටස් හිමියන්ගේ රැස්වීම්වලට ද අදාළ විය යුතු ය.

(7) මේ වගන්තියේ විධිවිධාන යටතේ ලැබුණු ප්‍රතියුක්ත පත්‍ර පාවිච්චි කරනු ලබන්නේ යම් රැස්වීමක දී ද නැතහොත් අඩාළව කල් තබනු ලැබූ රැස්වීමක දී ද, ඒ රැස්වීම ආරම්භ කිරීමට යටත් පිරිසෙයින් පැය තුනකට කලින්, ඒ ප්‍රතියුක්ත පත්‍ර පරීක්ෂා කිරීමට, සමාගමේ සෑම කොටස් හිමියකුට ම හෝ ප්‍රතියුක්තයකුට ම හිමිකම තිබිය යුතු ය.

ඡන්ද විමසීමක් ඉල්ලා සිටීමට අයිතිය ඇති බව.

**140.** (1) (අ) මහා සභා රැස්වීමක දී රැස්වීමෙහි සභාපතිවරයා තෝරා පත්කර ගැනීම හෝ රැස්වීම අඩාළව කල්තැබීම සම්බන්ධයෙන් හැර, යම් ප්‍රශ්නයක් පිළිබඳව ඡන්ද විමසීමක් ඉල්ලා සිටීමට ඇති අයිතිය බැහැර කිරීමේ ; නැතහොත්

(ආ) (i) රැස්වීමක දී ඡන්දය දීමට අයිතිය ඇති කොටස් හිමියන් පස් දෙනකුට නොඅඩු සංඛ්‍යාවක් විසින් ; හෝ

(ii) රැස්වීමක දී ඡන්දය දීමට අයිතිය ඇති කොටස් හිමියන් සියලුදෙනාගේ ම සම්පූර්ණ ඡන්ද

අයිතිවාසිකම්වලින් දහයෙන් එකකට නොඅඩු සංඛ්‍යාවක් නියෝජනය කරන කොටස් හිමියකු හෝ කොටස් හිමියන් සංඛ්‍යාවක් විසින් ; හෝ එවැනි යම් ප්‍රශ්නයක් පිළිබඳව ඡන්ද විමසීමක් සඳහා කරන ලද ඉල්ලීමක් බලරහිත කිරීමේ,

ප්‍රතිඵලය ගෙන දෙන තාක් දුරට, සමාගමක ව්‍යවස්ථාවලියෙහි ඇතුළත් යම් විධිවිධානයක් බලරහිත විය යුතු ය.

(2) සමාගමක රැස්වීමක දී ඡන්දය දීමට ප්‍රතියුක්තයකු පත් කරන සාධන පත්‍රය, ඡන්දයක් ඉල්ලා සිටීමට හෝ ඡන්දයක් සඳහා කරනු ලබන ඉල්ලීමකට එක්වීමට බලය පවරන්නක් ලෙස ද සලකනු ලැබිය යුතු අතර, (1) වන උපවගන්තියේ විධිවිධානවල කාර්ය සඳහා, කොටස් හිමියකු වෙනුවෙන් ප්‍රතියුක්තයකු වශයෙන් තැනැත්තකු විසින් කරනු ලබන ඉල්ලීමක්, කොටස් හිමියා විසින් කරනු ලබන ඉල්ලීමක් හා සමාන විය යුතු ය.

ඡන්ද විමසීමක දී ඡන්දය දීම.

**141**. සමාගමක රැස්වීමක දී හෝ සමාගමක යම් පන්තියක කොටස් හිමියන්ගේ රැස්වීමක දී පවත්වනු ලබන ඡන්ද විමසීමක දී, එක් ඡන්දයකට වඩා වැඩි ඡන්ද සංඛ්‍යාවකට හිමිකම තිබෙන කොටස් හිමියකු ඡන්දය දෙන්නේ නම්, ඔහුගේ සියලු ඡන්ද එකම ආකාරයෙන් පාවිච්චි කිරීම හෝ දීම අවශ්‍ය නොවන්නේ ය.

කොටස් හිමියන්ගේ අධියාචන මත වූ යෝජනා සම්මත සංසරණය කිරීම.

**142**. (1) මෙහි මින් මතු නිශ්චිතව සඳහන් කරනු ලබන පරිදි, කොටස් හිමියන්ගෙන් යම් සංඛ්‍යාවකගේ ලිඛිත අධියාචනය මත සහ ( සමාගම අන්‍යාකාරයකින් යෝජනා සම්මත කරන්නේ නම් මිස) අධියාචකයන්ගේ වියදමින්—

(අ) ඊළඟ වාර්ෂික මහා සභාවේ දැන්වීම ලැබීමට හිමිකම ඇත්තා වූ සමාගමේ කොටස් හිමියන්ට ඒ රැස්වීමේ දී නියම ආකාරයෙන් ඉදිරිපත් කළ හැකි සහ ඉදිරිපත් කිරීමට අදහස් කර ඇති යම් යෝජනා සම්මතයක් පිළිබඳව දැනුම් දීම ;

(ආ) යම් මහා සභා රැස්වීමක දැන්වීමක් ලැබීමට හිමිකම ඇත්තා වූ සමාගමේ කොටස් හිමියන් අතර, ඉදිරිපත් කිරීමට යෝජනා කර ඇති යෝජනා සම්මතයක සඳහන් කාරණා සම්බන්ධයෙන් හෝ ඒ රැස්වීමේ දී කිරීමට තිබෙන කටයුතු සම්බන්ධයෙන් යම් ප්‍රකාශයක් සංසරණය කිරීම,

සමාගමක කාර්යය විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ අධියාචනයක් සඳහා අවශ්‍ය කොටස් හිමියන් සංඛ්‍යාව,—

(අ) අධියාචනය අදාළ වන්නා වූ රැස්වීමේ දී ඡන්දය දීමට අධියාචනයේ දිනයේ දී අයිතිය තිබුණු සියලු කොටස් හිමියන්ගේ සම්පූර්ණ ඡන්දය දීමේ අයිතියෙන් විස්සෙන් එකකට නොඅඩු ප්‍රමාණයක් නියෝජනය කරන යම් කොටස් හිමියන් සංඛ්‍යාවක් ; හෝ

(ආ) කොටස් හිමියන් පනස් දෙනකුට නොඅඩු සංඛ්‍යාවක්,

විය යුතු ය.

(3) රැස්වීම පිළිබඳ දැන්වීම තමන් වෙත යවනු ලැබීමට හිමිකම් ලබන සමාගමේ කොටස් හිමියන්ට, එවැනි යම් යෝජනා සම්මතයක් පිළිබඳ දැන්වීම් දීම සහ ඔවුන් අතර එවැනි යම් ප්‍රකාශයක් සංසරණය කිරීම, රැස්වීම පිළිබඳ දැන්වීම භාරදීමට අවසර තිබෙන යම් ආකාරයකින් ඒ එක් එක් කොටස් හිමියා වෙත යෝජනා සම්මතයේ හෝ ප්‍රකාශයේ පිටපතක් භාරදීමෙන් කළ යුතු අතර, සමාගමේ වෙනත් යම් කොටස් හිමියකු වෙත එවැනි යම් යෝජනා සම්මතයක් පිළිබඳ දැන්වීමක් දීම, සමාගමේ රැස්වීම පිළිබඳ දැන්වීම භාරදීමට අවසර තිබෙන යම් ආකාරයකින්, යෝජනා සම්මතයේ සාමාන්‍ය බලපෑම පිළිබඳව දැන්වීමක් කිරීමෙන් සිදු කළ යුතු ය :

එසේ වුවද, අවස්ථාවෝචිත පරිදි, පිටපත භාර දීම හෝ යෝජනා සම්මතයේ බලපෑම පිළිබඳ දැන්වීම දීම, රැස්වීම පිළිබඳ දැන්වීම භාර දෙන ආකාරයෙන් ම හා ක්‍රියාත්මක කළ හැකි තාක් දුරට, ඒ වේලාවට ම කළ යුතු අතර, ඒ වේලාවේ දී එය භාර දීම හෝ දැන්වීම ප්‍රායෝගිකව කළ නොහැකි වන අවස්ථාවක, ඊට පසු හැකි තාක් ඉක්මණින් එය භාර දීම හෝ දැන්වීම දීම කළ යුතු ය.

(4) (අ) (i) යෝජනා සම්මතයක් පිළිබඳ දැන්වීමක් යවන ලෙස ඉල්ලා සිටින අධියාචනයක් සම්බන්ධයෙන් වූ විට, රැස්වීමේ දිනයට සති හයකට නොඅඩු කාලයකට පෙර ; සහ

(ii) වෙනත් යම් අධියාචනයක් සම්බන්ධයෙන් වූ විට, රැස්වීමට එක් සතියකට නොඅඩු කාලයකට පෙර,

අධියාචකයන් විසින් අත්සන් කරනු ලැබූ අධියාචනයේ පිටපතක් (හෝ එක්ව ගත් විට සියලු ම අධියාචකයන්ගේ

අත්සන් ඇතුළත් වන පිටපත් දෙකක් හෝ ඊට වැඩි ගණනක්) සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ තැන්පත් කරනු ලැබුවහොත් ; හා

(ආ) අධියාචනය ක්‍රියාත්මක කිරීම සඳහා සමාගමට දරන්නට සිදුවන වියදම් දැරීමට ප්‍රමාණවත් මුදලක් ඒ සමග තැන්පත් කරනු ලැබුවහොත් හෝ ඉදිරිපත් කරනු ලැබුවහොත්,

මිස, යම් යෝජනා සම්මතයක් සම්බන්ධයෙන් දැන්වීමක් දීමට හෝ යම් ප්‍රකාශයක් සංසරණය කිරීමට මේ වගන්තියේ විධිවිධාන යටතේ සමාගමක බැඳීමක් නොමැති විය යුතු ය:

එසේ වුවද, යෝජනා සම්මතයක් පිළිබඳ දැන්වීමක් යවන ලෙස ඉල්ලා සිටින අධියාචනයක පිටපතක් සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ තැන්පත් කරනු ලැබීමෙන් පසු, ඒ පිටපත තැන්පත් කළ දින සිට සති හයක් ඇතුළත හෝ ඊට අඩු කාලයක් ඇතුළත වූ දිනයක දී පැවැත්වීමට, වාර්ෂික මහා සභා රැස්වීමක් කැඳවනු ලැබූ අවස්ථාවක දී, මේ උපවගන්තිය මගින් නියම කර ඇති කාලසීමාව ඇතුළත පිටපත තැන්පත් කරනු නොලැබුව ද, ඒ උපවගන්තියේ කාර්ය සඳහා එය නිසි පරිදි තැන්පත් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තියේ විධිවිධානවලින් පවරා ඇති අයිතිවාසිකම් අපකීර්තිකර කාරණයක් සම්බන්ධයෙන් අනවශ්‍ය ප්‍රචාරයක් ලබා ගැනීම පිණිස අනිසි ලෙස යොදා ගන්නා ලද බවට, සමාගමේ හෝ අතෘප්තියට පත් වූයේ යයි කියා සිටින වෙනත් යම් තැනැත්තකුගේ හෝ ඉල්ලීම මත අධිකරණය සෑහීමට පත්වන්නේ නම්, කිසිම ප්‍රකාශයක් සංසරණය කිරීමට මේ වගන්තියේ විධිවිධාන යටතේ සමාගමක බැඳීමක් නොමැති විය යුතු ය; තව ද අධියාචකයන් ඒ ඉල්ලීමට පාර්ශ්වකරුවන් නොවූව ද, මේ වගන්තියේ විධිවිධාන යටතේ කරනු ලැබූ ඉල්ලීමක් මත සමාගම දරන සම්පූර්ණ වියදම හෝ ඉන් කොටසක් අධියාචකයන් විසින් ගෙවිය යුතු බවට, අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි ය.

(6) සමාගමේ ව්‍යවස්ථාවලියෙහි කුමක් සඳහන්ව ඇත ද, මේ වගන්තියේ විධිවිධානවලට අනුකූලව දැන්වීමක් කරනු ලැබූ යම් යෝජනා සම්මතයක්, වාර්ෂික මහා සභා රැස්වීමක කටයුතුවලට ඇතුළත් කළ යුතු අතර, එවැනි දැන්වීමක් කිරීමේ දී, කොටස් හිමියන් එක් කෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් අහඹුවෙන් අත්හැරුණ ද මේ උපවගන්තියේ කාර්ය සඳහා ඒ දැන්වීම කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(7) මේ වගන්තියේ විධිවිධානවලට අනුව ක්‍රියා කිරීමේ දී යම් පැහැර හැරීමක් කරනු ලැබූ අවස්ථාවක, ඒ පැහැර හැරීම කරන ලද සමාගමේ සෑම නිලධරයකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

විශේෂ යෝජනා සම්මත.

**143**. (1) යෝජනා සම්මතයක්—

(අ) ඡන්දය දීමට හිමිකම ඇත්තා වූ සහ ප්‍රශ්නය පිළිබඳව ඡන්දය දෙන්නා වූ කොටස් හිමියන්ගේ ඡන්දවලින් සියයට හැත්තෑපහක බහුතරයකින් සම්මත කර ඇති අවස්ථාවක;

(ආ) විශේෂ යෝජනා සම්මතයක් ලෙස යෝජනා කිරීමේ අදහස නිශ්චිතව සඳහන් කරමින්, වැඩ කරන දවස් පහළොවකට නො අඩු කාලයක දැන්වීමක් යථා පරිදි දෙනු ලැබූ මහා සභා රැස්වීමක දී සම්මත කර ඇති අවස්ථාවක,

ඒ යෝජනා සම්මතය විශේෂ යෝජනා සම්මතයක් වන්නේ ය :

එසේ වුවද, එවැනි යම් රැස්වීමක දී පැමිණ ඡන්දය දීමට අයිතිය ඇත්තා වූ ද, ඒ රැස්වීමේ දී ඡන්දය දීමට ඇති සම්පූර්ණ අයිතිවාසිකම්වලින් එක්ව සියයට අසූපහකට නොඅඩු ප්‍රමාණයක් නියෝජනය කරන්නා වූ ද, කොටස් හිමියන් ප්‍රමාණයක් එකඟ වනු ලැබුවහොත්, වැඩ කරන දවස් පහළොවකට අඩු දැන්වීමක් හෝ කරනු ලැබ ඇති රැස්වීමක දී යෝජනා සම්මතයක් විශේෂ යෝජනා සම්මතයක් ලෙස යෝජනා කර සම්මත කරගනු ලැබිය හැකි ය.

(2) සම්මත කර ගැනීම සඳහා විශේෂ යෝජනා සම්මතයක් ඉදිරිපත් කරනු ලැබූ යම් රැස්වීමක දී ඡන්ද විමසීමක් ඉල්ලුම් කරනු ලැබ ඇත්නම් මිස, යෝජනා සම්මතය සම්මත වූ බවට සභාපතිවරයා විසින් කරනු ලබන ප්‍රකාශයක්, යෝජනා සම්මතයට පක්ෂව හෝ විපක්ෂව සටහන් කරනු ලැබූ බවට තීරණාත්මක සාක්ෂියක් විය යුතු ය.

(3) විශේෂ යෝජනා සම්මතයක් සම්මත කළ යුතු ය යන ප්‍රශ්නය මත ඉල්ලා සිටිනු ලැබූ ඡන්ද විමසීමක බහුතරය ගණන් බැලීමේ දී යෝජනා සම්මතයට පක්ෂව සහ විපක්ෂව දෙනු ලැබූ ඡන්ද සංඛ්‍යාව සැලකිල්ලට ගෙන එය ගණන් බැලිය යුතු ය.

(4) සාංගමික ව්‍යවස්ථාවලියෙන් හෝ මේ පනතින් හෝ විධිවිධාන සලස්වනු ලබන ආකාරයෙන් දැන්වීමක් දී රැස්වීමක් පවත්වනු ලැබූ විට, ඒ රැස්වීම පිළිබඳ දැන්වීම විධිමත්ව කරනු ලැබ ඇති ලෙස සහ සභා රැස්වීම විධිමත්ව පවත්වනු ලැබූ ලෙස මේ වගන්තියේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

144. (1) කොටස් හිමියන්ගේ රැස්වීමක දී යෝජනා සම්මතයක් පිළිබඳව ඡන්දය දීමට හිමිකම ඇති කොටස් හිමියන්ගෙන් සියයට අසූපහකට නොඅඩු සංඛ්‍යාවක් වන සහ ඒ යෝජනා සම්මතය සම්බන්ධයෙන් දෙනු ලැබිය හැකි ඡන්ද සංඛ්‍යාවෙන් සියයට අසූපහකට නොඅඩු ප්‍රමාණයක් එක්ව දරන කොටස් හිමියන් විසින් අත්සන් තබන ලද ලිඛිත යෝජනා සම්මතයක් සමාගමේ ව්‍යවස්ථාවලියේ ඇතුළත් විධිවිධානවලට යටත්ව ඒ කොටස් හිමියන්ගේ රැස්වීමක දී ඒ යෝජනා සම්මතය සම්මත කරනු ලැබූවාක් මෙන් බලසහිත වන්නේ ය. රැස්වීමක් වෙනුවට යෝජනා සම්මතය.

(2) සමාගමේ ව්‍යවස්ථාවලියේ ඇතුළත් විධිවිධානවලට යටත්ව—

(අ) සමාගමක කොටස් හිමියන්ගේ රැස්වීමක දී තීරණය කරනු ලැබිය යුතු බවට මේ පනතින් හෝ ව්‍යවස්ථාවලියෙන් හෝ නියම කර ඇති කාරණයකට අදාළ ; සහ

(ආ) (1) වන උපවගන්තියෙහි නිශ්චිතව සඳහන් කොටස් හිමියන් විසින් අත්සන් තබන ලද,

ලියවිල්ලකින් වූ යෝජනා සම්මතයක් මේ පනතේ විධිවිධානවලට හෝ සමාගමේ ව්‍යවස්ථාවලියේ විධිවිධානවලට අනුකූලව සම්මත කරනු ලැබූ ලෙස සලකනු ලබන්නේ ය.

(3) 133 වන වගන්තිය යටතේ පැවැත්වෙන වාර්ෂික සභා රැස්වීමක දී (යෝජනා සම්මතයෙන් හෝ අන්‍යාකාරයෙන් ) කිරීමට නියම කර ඇති සියලු දේ මේ වගන්තියට අනුකූලව යෝජනා සම්මතයක් මගින් කරනු ලැබුවහොත්, සමාගම විසින් 133 වන වගන්තිය යටතේ වාර්ෂික සභා රැස්වීමක් පැවැත්වීම අවශ්‍ය නොවන්නේ ය.

(4) මේ වගන්තිය යටතේ යෝජනා සම්මතයක් සම්මත කරනු ලැබීමෙන් පසු, වැඩ කරන දවස් පහක් ඇතුළත, ඒ යෝජනා සම්මතයේ පිටපතක්, ඊට අත්සන් නොතැබූ සෑම කොටස් හිමියකු වෙත ම සමාගම විසින් යවනු ලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ වූ යෝජනා සම්මතයක්, කොටස් හිමියන් වෙත යම් පූර්ව දැනුම් දීමකින් තොරව, අත්සන් කරනු ලැබිය හැකි ය.

(6) සමාගමක් විසින් (4) වන උපවගන්තියේ නියමයක් අනුව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක—

(අ) සමාගම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය ; තව ද

(ආ) පැහැර හැරීම කරන ලද සමාගමේ සෑම නිලධරයකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස්දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(7) එකිනෙකට වෙනස් අර්ථලාභී අයිතිකරුවන් සඳහා කොටස් ගොන්නක් දරන්නකු ලෙස ලියාපදිංචිකර ඇති තැනැත්තකු විසින් මේ වගන්තිය යටතේ වූ යෝජනා සම්මතයකට, එක් අර්ථලාභී අයිතිකරුවකු ඇති කොටස් සම්බන්ධයෙන් ප්‍රකාශිතව අත්සන් තැබිය හැකි අතර, වෙනත් අර්ථලාභී අයිතිකරුවකු ඇති කොටස් සම්බන්ධයෙන් අත්සන් තැබීමෙන් වැළකී සිටිය හැකි ය.

(8) මෙම පනතේ කුමක් සඳහන් වුවද, භාණ්ඩාගාරයේ ලේකම්වරයා සමාගමක කොටස් දරන්නකු වූ විට එම කොටස දරන්නා වශයෙන් එම යෝජනා සම්මතයට එකඟත්වය ද ලිඛිතව ලබාගන්නේ නම් මිස මෙම වගන්තියේ සඳහන් යම් යෝජනා සම්මතයක් වලංගු නොවන්නේ ය.

විශේෂ දැන්වීමක් අවශ්‍ය යෝජනා සම්මත.

**145**. මේ පනතේ මින් ඉදිරියට ඇති යම් විධිවිධානයක් මගින්, යෝජනා සම්මතයක් සඳහා විශේෂ දැන්වීමක් නියම කර ඇති අවස්ථාවක එය ඉදිරිපත් කරනු ලබන රැස්වීම් දිනට දවස් විසිඅටකට නොඅඩු කාලයකට පෙර, එය ඉදිරිපත් කිරීමේ අදහස පිළිබඳ දැන්වීමක් සමාගමට දෙනු ලැබුවහොත් මිස, යෝජනා සම්මතය බලරහිත වන අතර, සමාගම විසින් රැස්වීම පිළිබඳ දැන්වීම කරන වේලාවේ දී ම සහ ඒ ආකාරයෙන් කොටස් හිමියන් වෙත එවැනි යම් යෝජනා සම්මතයක් පිළිබඳ දැන්වීම කළ යුතු ය ; නැතහොත් ප්‍රායෝගිකව එසේ කළ නොහැකි නම්, රැස්වීමට පෙර වැඩ කරන දවස් පහළොවකට කලින් නිසි සංස්කරණයක් ඇති ප්‍රවෘත්ති පත්‍රයක පළ කරනු ලබන ප්‍රචාරක දැන්වීමක් මගින් හෝ සංස්ථාවේ ව්‍යවස්ථාවලියේ ඉඩ දී ඇති වෙනත් යම් ආකාරයකට හෝ ඔවුන්ට ඒ පිළිබඳ දැන්වීම කළ යුතු ය :

එසේ වුවද, එවැනි යෝජනා සම්මතයක් ඉදිරිපත් කිරීමේ අදහස සමාගමට දැනුම් දීමේ දින සිට දවස් විසිඅටක දී හෝ ඊට පෙර දිනයක දී රැස්වීමක් කැඳවනු ලැබූ අවස්ථාවක, මේ වගන්තියෙන් නියම කර ඇති කාලය ඇතුළත දැන්වීම දෙනු නොලැබුව ද, ඒ දැන්වීම නිසි පරිදි දෙන ලද සේ සලකනු ලැබිය යුතු ය.

අඩාළව කල් තබනු ලැබූ රැස්වීම්වල දී සම්මත කරන ලද යෝජනා සම්මත.

**146**. නියම කරන ලද දිනයෙන් පසුව—

(අ) සමාගමක;

(ආ) සමාගමක යම් පන්තියක කොටස් දරන්නන්ගේ;

(ඇ) සමාගමක අධ්‍යක්ෂවරයන්ගේ,

අඩාළව කල් තබන ලද රැස්වීමක දී යෝජනා සම්මතයක් සම්මත කරනු ලැබූ අවස්ථාවක, ඒ යෝජනා සම්මතය ඇත්ත වශයෙන් ම සම්මත කරනු ලැබූ දිනයේ දී සම්මත වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු අතර, ඊට කලින් දිනයක දී සම්මත වූ ලෙස සලකනු නොලැබිය යුතු ය.

කොටස් හිමියන්ගේ සහ අධ්‍යක්ෂවරයන්ගේ රැස්වීම්වල කටයුතු පිළිබඳ වාර්තා.

**147**. (1) සෑම සමාගමක් විසින් ම, එහි මහා සභා රැස්වීම්වල සහ අධ්‍යක්ෂවරයන්ගේ රැස්වීම්වල කටයුතු පිළිබඳ වාර්තා, තත් කාර්යය සඳහා තබාගන්නා පොත්වල සටහන් කිරීමට සලස්වනු ලැබිය යුතු ය.

(2) ඒ කටයුතු කරනු ලැබූ රැස්වීමේ සභාපතිවරයා විසින් හෝ ඊළඟට පැවැත්වෙන රැස්වීමේ සභාපතිවරයා විසින් හෝ අත්සන් තබන ලද බවට උද්දේශිත එවැනි යම් වාර්තා ඒ කටයුතු පිළිබඳ සාක්ෂියක් විය යුතු ය.

(3) අවස්ථාවෝචිත පරිදි, සමාගමේ යම් මහා සභා රැස්වීමක හෝ අධ්‍යක්ෂවරයන්ගේ රැස්වීමක කටයුතු පිළිබඳව මේ වගන්තියේ විධිවිධානවලට අනුකූලව වාර්තා තබා ඇති අවස්ථාවක, පටහැනිව කරුණු ඔප්පු කරනු ලබන තෙක් ඒ රැස්වීම යථා පරිදි පවත්වන ලද හා කැඳවන ලද බවට, සලකනු ලැබිය යුතු අතර, ඒ රැස්වීමේ දී කරන ලද අධ්‍යක්ෂවරයන්ගේ, කළමනාකරුවන්ගේ හෝ ඈවරකරුවන්ගේ සියලු පත් කිරීම්, වලංගු සේ සලකනු ලැබිය යුතු ය.

(4) සමාගමක සෑම අධ්‍යක්ෂවරයකුට සහ කලින් සිටි අධ්‍යක්ෂවරයකුට, තමා එම සමාගමේ අධ්‍යක්ෂවරයකු වශයෙන් සිටින හෝ සිටි කාලය තුළ දී පවත්වන ලද එම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලු රැස්වීම්වල වාර්තාවල සහතික පිටපත්, එම සමාගමේ ලේකම්වරයාගෙන් ලබා ගැනීමට හිමිකමක් ඇත.

(5) සමාගමක් විසින්, (1) වන උපවගන්තියේ විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර හරිනු ලබන අවස්ථාවක—

(අ) සමාගම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය ; තව ද

(ආ) පැහැර හැරීම කරන ලද සමාගමේ සෑම නිලධරයකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

## ගිණුම් වාර්තා

ගිණුම් වාර්තා තබා ගැනීමට ඇති යුතුකම.

**148.** (1) සමාගමේ ගණුදෙනු නිවැරදි ලෙස වාර්තා කරන හා පැහැදිළි කරන සහ—

(අ) සාධාරණ නිරවද්‍යතාවකින් යුතුව කවර හෝ අවස්ථාවක සමාගමේ මූල්‍ය තත්ත්වය තීරණය කිරීමට හැකි කරන;

(ආ) මේ පනත අනුව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට අධ්‍යක්ෂවරයන්ට හැකි කරන; සහ

(ඇ) සමාගමේ මූල්‍ය ප්‍රකාශ පහසුවෙන් හා නිසි ලෙස විගණනය කිරීමට හැකි කරන,

ගිණුම් වාර්තා සෑම සමාගමක් විසින් ම තබා ගනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි ඇතුළත් විධිවිධාන සීමා නොකර, ගිණුම් වාර්තාවල—

(අ) සමාගමට එක් එක් දිනයේ ලැබුණු සහ සමාගම විසින් එක් එක් දිනයේ දී වියදම් කරන ලද මුදල් සහ ඒ මුදල් වියදම් කරන ලද්දේ යම් කාරණා සම්බන්ධයෙන් ද ඒ කාරණා පිළිබඳ සටහන් ;

(ආ) සමාගමේ වත්කම් හා බැරකම් පිළිබඳ වාර්තාවක් ;

(ඇ) සමාගමේ ව්‍යාපාර කටයුතුවලට භාණ්ඩ හා සම්බන්ධ වෙළෙඳ කටයුතු අයත් වන්නේ නම්—

(i) සිල්ලර ව්‍යාපාර කටයුත්තක් කරගෙන යාමේ සාමාන්‍ය ක්‍රියාවලියේ දී මුදලට විකුණන ලද භාණ්ඩ හැර, භාණ්ඩ සහ ගැනුම්කරුවන් හා විකුණුම්කරුවන් ද අදාළ ඉන්වොයිස් බලපත්‍ර හඳුන්වන, මිල දී ගන්නා ලද හා විකුණන ලද භාණ්ඩ පිළිබඳ වාර්තාවක් ;

(ii) යම් මුදල් වර්ෂයක් තුළ කරන ලද භාණ්ඩ, තොග ගණන් බැලීම් කිසිවක් පිළිබඳ වාර්තා ද සමග, ඒ මුදල් වර්ෂය අවසානයේ දී පැවැති භාණ්ඩ තොග පිළිබඳ වාර්තාවක් ;

(ඇ) සමාගමේ ව්‍යාපාර කටයුතුවලට සේවා සැලසීම අයත් වන්නේ නම්, සලසන ලද සේවා පිළිබඳ වාර්තාවක් සහ අදාළ ඉන්වොයිස් බලපත්‍ර,

ඇතුළත් විය යුතු ය.

(3) සමාගමක් විසින් මේ වගන්තියේ නියම අනුව ක්‍රියා කිරීම පැහැර හරිනු ලබන අවස්ථාවක—

(අ) සමාගම වරදකට වරදකරුවන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ දෙකක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය ; තව ද

(ආ) පැහැර හැරීම කරන ලද සමාගමේ සෑම නිලධරයකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ දෙකක් නො ඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

ගිණුම් වාර්තා තබාගත යුතු ස්ථානය.

**149**. (1) සමාගමක ගිණුම් වාර්තා ශ්‍රී ලංකාවෙහි තබාගත යුතු වන්නේ ය. එසේ වුවද ජාතික ආර්ථිකයේ යහපත සඳහා හෝ සමාගමේ කොටස් හිමියන්ගේ යහපත සඳහා උචිත නොවන බව රෙජිස්ට්‍රාර්වරයා විසින් සලකනු ලබන්නේ නම් මිස, සමාගමක් විසින් එහි ගිණුම් වාර්තා ශ්‍රී ලංකාවෙන් පිටත තබා ගැනීම සඳහා රෙජිස්ට්‍රාර්වරයා විසින් අවසර දිය හැකි ය.

(2) වාර්තා ශ්‍රී ලංකාවෙහි තබා ගනු නොලබන්නේ නම්—

(අ) (i) මාස හයක් නොඉක්මවන අන්තර කාලවල දී සමාගමේ මූල්‍ය තත්ත්වය සාධාරණ නිරවද්‍යතාවකින් යුතුව හෙළි කරන ; සහ

(ii) සමාගමේ මූල්‍ය ප්‍රකාශ හා යම් සමූහ මූල්‍ය ප්‍රකාශ සහ මේ පනත යටතේ තබා ගැනීමට නියම කර ඇති වෙනත් යම් ලේඛනයක් මේ පනත අනුව පිළියෙල කිරීමට හැකි වන,

සමාගමේ මෙහෙයුම් සඳහා වූ ගිණුම් සහ වාර්තා ශ්‍රී ලංකාවේ ස්ථානයකට එවා, ඒ ගිණුම් සහ වාර්තා ඒ ස්ථානයෙහි තබා ගන්නා බවට සමාගම වගබලා ගත යුතු ය ; තව ද

(ආ) ගිණුම් වාර්තා සහ (අ) ඡේදය යටතේ නියම කර ඇති ගිණුම් සහ වාර්තා තබා ඇති ස්ථානය පිළිබඳ දැන්වීමක් රෙජිස්ට්‍රාර්වරයාට දෙනු ලැබිය යුතු ය.

(3) සමාගමක් විසින් (2) වන උපවගන්තියේ නියම අනුව ක්‍රියා කිරීම පැහැර හරිනු ලබන අවස්ථාවක—-

(අ) සමාගම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ දෙකක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය ; තව ද

(ආ) පැහැර හැරීම කරන ලද සමාගමේ සෑම නිලධරයකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ දෙකක් නොඉක්මන දඩයකට යටත් විය යුතු ය.

### මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට ඇති යුතුකම

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට ඇති බැඳීම.

**150**. (1) සමාගමේ ශේෂ පත්‍ර දිනයෙන් පසුව මාස හයක් ඇතුළත හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි දීර්ඝ කරන ලද යම් කාලයක් ඇතුළත 151 වන වගන්තියේ නියම අනුව මූල්‍ය ප්‍රකාශ—-

(අ) සමාගමට සහ එකී ශේෂ පත්‍රයේ දිනයට අදාළව සම්පූර්ණ කර ඇති බවට ;

(ආ) මූල්‍ය ප්‍රකාශය සැකසීමට වගකිව යුතු පුද්ගලයකු විසින් එය පනතේ නියමයන්ට අනුකූල වන බව සහතික කර ඇති බවට ;

(ඇ) අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් සමාගමේ අධ්‍යක්ෂවරයන් දෙදෙනකු විසින් දින යොදා අත්සන් කර ඇති බවට හෝ සමාගමෙහි ඇත්තේ එක් අධ්‍යක්ෂවරයකු පමණක් නම් ඒ අධ්‍යක්ෂවරයා විසින් දින යොදා අත්සන් කර ඇති බවට,

සෑම සමාගමක ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වගබලා ගත යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි නිශ්චිතව සඳහන් නියම අනුව ක්‍රියා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක, පැහැර හැරීම සිදු කරන ලද සමාගමේ සෑම අධ්‍යක්ෂවරයකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් විය යුතු කරුණු සහ ආකෘතිය.

**151**. (1) සමාගමක මූල්‍ය ප්‍රකාශවලින්—

(අ) ශේෂ පත්‍රයේ දිනය වන විට සමාගමේ කටයුතුවල තත්ත්වය ;

(ආ) ඒ ශේෂ පත්‍ර දිනයේ දී අවසාන වන ගිණුම් කාල පරිච්ඡේදය සඳහා, අවස්ථාවෝචිත පරිදි, සමාගමේ ලාභ හෝ අලාභ හෝ ආදායම සහ වියදම,

පිළිබඳව සත්‍ය හා සාධාරණ දර්ශනයක් පෙන්නුම් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි ඇතුළත් විධිවිධාන සීමා නොකර, සමාගමක මූල්‍ය ප්‍රකාශ—

(අ) මූල්‍ය ප්‍රකාශවල ආකෘතිය සහ ඇතුළත් විය යුතු කරුණු නිශ්චිතව සඳහන් කරන, මේ පනත යටතේ සාදන ලද යම් නියෝගවලට ; සහ

(ආ) වෙනත් යම් නීතියක් යටතේ සමාගමේ මූල්‍ය ප්‍රකාශවලට අදාළ යම් නියමයන්ට,

අනුකූල විය යුතු ය.

සමූහ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට ඇති බැඳීම.

**152**. (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, සමාගමේ ශේෂ පත්‍ර දිනයේ දී පාලිත සමාගම් එකක් හෝ වැඩි ගණනක් ඇති සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, 150 වන වගන්තියට අනුකූලව ක්‍රියා කිරීමට අමතරව, ඒ වගන්තියේ නිශ්චිතව සඳහන් කාලය ඇතුළත 153 වන වගන්තියට අනුකූලව වූ සමූහ මූල්‍ය ප්‍රකාශ—

(අ) ඒ සමූහයට සහ ඒම ශේෂ පත්‍රයේ දිනට අදාළව සම්පූර්ණ කර ඇති බවට ;

(ආ) මූල්‍ය ප්‍රකාශය සැකසීමට වගකිවයුතු පුද්ගලයෙකු විසින් එය මෙම පනතේ නියමයන්ට අනුකූලවන බවට ;

(ඇ) අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් සමාගමේ අධ්‍යක්ෂවරයන් දෙදෙනකු විසින් දින යොදා අත්සන් කර ඇති බවට හෝ සමාගමට ඇත්තේ එක් අධ්‍යක්ෂවරයකු පමණක් නම් ඒ අධ්‍යක්ෂවරයා විසින් දින යොදා අත්සන් කර ඇති බවට,

වගබලා ගත යුතු ය.

(2) සමාගම ඒ ශේෂ පත්‍ර දිනයේ දී වෙනත් සමාගමකට සම්පූර්ණයෙන් ම අයත් පාලිත සමාගමක් නම්, ඒ සමාගමට සහ ශේෂ පත්‍රයේ දිනයට අදාළව සමූහ මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය නොවන්නේ ය.

(3) අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, (1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් නියම අනුව ක්‍රියා කිරීම පැහැර හරිනු ලබන අවස්ථාවක, සමාගමේ පැහැර හැරීම සිදු කරන ලද සෑම අධ්‍යක්ෂවරයකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබුවිට රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

සමූහ මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් විය යුතු කරුණු සහ ඒ ප්‍රකාශවල ආකෘතිය.

**153**. (1) සමූහ මූල්‍ය ප්‍රකාශවලින්—

(අ) ශේෂ පත්‍රයේ දිනය වන විට සමාගමේ සහ එහි පාලිත සමාගම්වල කටයුතුවල තත්ත්වය ;

(ආ) ඒ ශේෂ පත්‍ර දිනයේ දී අවසාන වන ගිණුම් කාලපරිච්ඡේදය සඳහා, අවස්ථාවෝචිත පරිදි, සමාගමේ සහ එහි පාලිත සමාගම්වල ලාභ හෝ පාඩු හෝ ආදායම සහ වියදම,

පිළිබඳව සත්‍ය හා සාධාරණ දර්ශනයක් පෙන්නුම් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි ඇතුළත් විධිවිධාන සීමා නොකර, සමූහ මූල්‍ය ප්‍රකාශ—

(අ) සමූහ මූල්‍ය ප්‍රකාශවල ආකෘතිය සහ ඇතුළත් විය යුතු කරුණු නිශ්චිතව සඳහන් කරන මේ පනත යටතේ සාදන ලද යම් නියෝගවලට ; සහ

(ආ) වෙනත් යම් නීතියක් යටතේ සමූහ මූල්‍ය ප්‍රකාශවලට අදාළ වන යම් නියමයන්ට,

අනුකූල විය යුතු ය.

(3) පාලිත සමාගමක්, සමූහ මූල්‍ය ප්‍රකාශ අදාළ වන ගිණුම් කාල පරිච්ඡේදය තුළ සමාගමක පාලිත සමාගමක් බවට පත් වූ අවස්ථාවක, සමූහය සඳහා වූ ඒකාබද්ධ ලාභාලාභ ප්‍රකාශය හෝ ඒකාබද්ධ ආදායම් සහ වියදම් ප්‍රකාශය එය පාලිත සමාගමක්ව පැවති ගිණුම් කාලපරිච්ඡේදයේ එක් එක් කොටස සඳහා වූ ලාභවලට හෝ අලාභවලට මිස, ඒ ගිණුම් කාලපරිච්ඡේදය වෙනත් යම් කොටසකට අදාළ නොවිය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, සමාගමක පාලිත සමාගමක ශේෂ පත්‍රයේ දිනය සමාගමේ ශේෂ පත්‍රයේ දිනය නොවන අවස්ථාවක, සමූහ මූල්‍ය ප්‍රකාශවල—

(අ) පාලිත සමාගමේ ශේෂ පත්‍රයේ දිනය සමාගමේ ශේෂ පත්‍රයේ දිනයට මාස තුනකට වඩා කලින් නොවන්නේ නම්, ඒ දිනයෙන් අවසාන වන ගිණුම් කාලපරිච්ඡේදය සඳහා වූ පාලිත සමාගමෙහි මූල්‍ය ප්‍රකාශ ඇතුළත් විය යුතු ය ; නැතහොත් සමාගමේ ගිණුම් කාලපරිච්ඡේදය ම වන සම්පූර්ණ කරන ලද කාලපරිච්ඡේදයක් සම්බන්ධයෙන් පාලිත සමාගමේ අතුරු මූල්‍ය ඇතුළත් විය යුතු ය ; නැතහොත්

(ආ) වෙනත් යම් අවස්ථාවක, සමාගමේ ගිණුම් කාලපරිච්ඡේදය ම වන කාල පරිච්ඡේදයක් සම්බන්ධයෙන් සම්පූර්ණ කරන ලද පාලිත සමාගමේ අතුරු මූල්‍ය ප්‍රකාශ ඇතුළත් විය යුතු ය.

(5) (3) වන සහ (6) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, සමූහ මූල්‍ය ප්‍රකාශවල සමාගමේ සෑම පාලිත සමාගමකම 151 වන වගන්තිය අනුව පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශ ඇතුළත් විය යුතු ය.

(6) (7) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, සමාගමක් විසින් පිළියෙල කරනු ලබන ඒ සමාගමේ මූල්‍ය ප්‍රකාශවල ඒ සමාගමේ පාලිත සමාගමක මූල්‍ය ප්‍රකාශ ඇතුළත් කිරීම—

(අ) අදාළ අඩු වැදගත්කමකින් යුත් මුදල් ප්‍රමාණයන් හේතුකොට ප්‍රායෝගික නොවන බව හෝ සමාගමේ කොටස් හිමියන්ට එහි සැබෑ වටිනාකමක් නොමැති බව හෝ වටිනාකමට සමානුපාතික පරිදි කොටස් හිමියන්ට වියදම් හෝ ප්‍රමාද එයින් ඇතිවිය හැකි බව ;

(ආ) එයින් ඇතිවන ප්‍රතිඵලය නොමග යවන සුළු බව හෝ සමාගමේ හෝ එහි යම් පාලිත සමාගමක ව්‍යාපාර කටයුතුවලට හානිකර වන බව ; හෝ

(ඇ) සමාගමේ සහ පාලිත සමාගමේ ව්‍යාපාර කටයුතු කොතරම් වෙනස් ද යත්, ඒවා තනි ව්‍යවසායක් වශයෙන් සාධාරණ ලෙස සලකනු නොලැබිය හැකි බව,

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වන්නේ නම්, එසේ සමාගමේ මූල්‍ය ප්‍රකාශවල, ඒ සමාගමේ පාලිත සමාගමේ මූල්‍ය ප්‍රකාශ ඇතුළත් කිරීම අවශ්‍ය නොවන්නේ ය.

(7) සමාගමක් විසින් පිළියෙල කරනු ලබන සමූහ මූල්‍ය ප්‍රකාශවල, (6) වන උපවගන්තිය යටතේ ඒ සමාගමේ පාලිත සමාගමක මූල්‍ය ප්‍රකාශ, සුදුසු යයි රෙජිස්ට්‍රාර්වරයා කල්පනා කරන නියම හා කොන්දේසි මත දෙනු ලබන රෙජිස්ට්‍රාර්වරයාගේ ලියවිල්ලකින් වූ පූර්ව අනුමතය නොමැතිව අත් හැරිය නොහැක්කේ ය.

## විගණකවරයන්

විගණකවරයා පත් කිරීම.

**154**. (1) සමාගමක් විසින්, එක් එක් වාර්ෂික මහා සභා රැස්වීමේ දී—

(අ) ඒ රැස්වීම අවසානයේ සිට ඊළඟ වාර්ෂික මහා සභා රැස්වීමේ අවසානය තෙක් ධුරය දැරීම ; සහ

(ආ) ඒ ශේෂ පත්‍ර දිනයට පසුව එළඹෙන ඊළඟ විගණන කාල පරිච්ඡේදය සඳහා වූ විගණනය කරන ලද සමාගමේ මූල්‍ය ප්‍රකාශ සහ සමූහ මූල්‍ය ප්‍රකාශ සම්පූර්ණ කිරීමට සමාගමට නියම කර ඇත්නම් ඒ සමූහ මුදල් ප්‍රකාශ, විගණනය කිරීම,

සඳහා විගණකවරයකු පත් කරනු ලැබිය යුතු ය.

(2) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, විගණකවරයකුගේ ධුරයෙහි ඇතිවන යම් අනියම් පුරප්පාඩුවක් පුරවනු ලැබිය හැකි ය. එහෙත් පුරප්පාඩු පවත්නා අතරතුර ජීවත්ව සිටින හෝ කටයුතු කර ගෙන යන යම් විගණකවරයකු සිටී නම්, ඔහුට විගණකවරයකු වශයෙන් දිගට ම කටයුතු කළ හැකි ය.

(3) (අ) සමාගමක වාර්ෂික මහා සභා රැස්වීමේ දී විගණකවරයකු පත් කරනු හෝ නැවත පත් කරනු නොලැබූ සහ (2) වන උපවගන්තිය යටතේ යෝජනා සම්මතයක් සම්මත කර නොමැති අවස්ථාවක ; හෝ

(ආ) විගණකවරයාගේ ධුරයෙහි අනියම් පුරප්පාඩුවක්, ඒ පුරප්පාඩුව ඇතිවී එක් මාසයක් ඇතුළත පුරවා නොමැති අවස්ථාවක,

රෙජිස්ට්‍රාර්වරයා විසින් විගණකවරයකු පත් කරනු ලැබිය හැකි ය.

(4) බලය ක්‍රියාත්මක කළ හැකි වීමෙන් වැඩ කරන දවස් පහක් ඇතුළත සමාගමක් විසින්, (3) වන උපවගන්තිය යටතේ විගණකවරයකු පත් කිරීමට රෙජිස්ට්‍රාර්වරයා හිමිකම් ලබන බවට ලිඛිත දැන්වීමක් රෙජිස්ට්‍රාර්වරයා වෙත දෙනු ලැබිය යුතු ය.

(5) සමාගමක් විසින්, (4) වන උපවගන්තියේ නියම අනුව ක්‍රියා කිරීම පැහැර හරිනු ලබන අවස්ථාවක—

(අ) සමාගම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ දෙකක් නො ඉක්මවන දඩයකට යටත් විය යුතු ය ; තව ද

(ආ) පැහැර හැරීම කරන ලද සමාගමේ සෑම නිලධරයකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයක් නො ඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

**155**. සමාගමක විගණකවරයකුගේ ගාස්තු සහ වියදම්— විගණකවරයාගේ ගාස්තු හා වියදම්.

(අ) විගණකවරයා සමාගමේ රැස්වීමක දී පත් කරනු ලබන්නේ නම්, සමාගම විසින් ඒ රැස්වීමේ දී හෝ සමාගම විසින් රැස්වීමේ දී නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් ;

(ආ) විගණකවරයා අධ්‍යක්ෂවරයන් විසින් පත් කරනු ලබන්නේ නම්, අධ්‍යක්ෂවරයන් විසින් ; හෝ

(ඇ) විගණකවරයා රෙජිස්ට්‍රාර්වරයා විසින් පත් කරනු ලබන්නේ නම්, රෙජිස්ට්‍රාර්වරයා විසින්,

නියම කරනු ලැබිය යුතු ය.

**156**. (1) (4) වන උපවගන්තියට යටත්ව, හවුල් ව්‍යාපාරයක් එහි හවුල්කරුවන් සමාගමේ විගණකවරයන් වශයෙන් පත් කරනු ලැබීමට සුදුසුකම් ලබන තැනැත්තන් නම්, ඒ හවුල් ව්‍යාපාරය එහි හවුල් ව්‍යාපාර නාමයෙන් ඒ සමාගමේ විගණකවරයා වීම සඳහා පත් කරනු ලැබිය හැකි ය. හවුල් ව්‍යාපාරයක් විගණකවරයා ලෙස පත් කිරීම.

(2) 157 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව සමාගමක විගණකවරයා වීමට ව්‍යාපාර ආයතන නාමයෙන් හවුල් ව්‍යාපාරයක් පත් කිරීම, ව්‍යාපාර ආයතනයේ කලින් කල හවුල්කරුවන් වන සියලු තැනැත්තන් පත් කිරීමක් ලෙස සලකනු ලබන්නේ ය.

විගණකවරයන්ගේ සුදුසුකම්.

**157**. (1) යම් තැනැත්තකු—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයකු වන්නේ නම් ; හෝ

(ආ) ලියාපදිංචි විගණකවරයකු වන්නේ නම්,

මිස, ඒ තැනැත්තා සමාගමක විගණකවරයකු වශයෙන් පත් කිරීම හෝ එලෙස ක්‍රියා කිරීම හෝ නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන කෙසේ වුවද, යම් තැනැත්තකු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයකු වන්නේ නම් මිස, ඒ තැනැත්තා පෞද්ගලික සමාගමක් හෝ ඇපයෙන් සීමිත සමාගමක් නොවන වෙනත් සමාගමක විගණකවරයකු වශයෙන් පත් කිරීම හෝ එලෙස ක්‍රියා කිරීම නොකළ යුතු ය.

(3) පහත දැක්වෙන තැනැත්තන් කිසිවකු සමාගමක විගණකවරයකු වශයෙන් පත් කිරීම හෝ එලෙස ක්‍රියා කිරීම නොකළ යුතු ය :—

(අ) සමාගමේ අධ්‍යක්ෂවරයකු හෝ සේවා නියුක්තයකු ;

(ආ) හවුල්කරුවකු වන හෝ සමාගමේ අධ්‍යක්ෂවරයකුගේ සේවා නියුක්තියේ සිටින හෝ සමාගමේ සේවා නියුක්තයකු වන තැනැත්තකු ;

(ඇ) ඇවරකරුවකු හෝ අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ සමාගමේ දේපළ සම්බන්ධයෙන් දේපළ භාර ගැණුම්කරුවකු වන තැනැත්තකු ;

(ඈ) සංස්ථාපිත මණ්ඩලයක් ;

(ඉ) (අ), (ආ) හෝ (ඇ) ඡේද ප්‍රකාර අදාළ සමාගමක විගණකවරයකු වශයෙන් පත් කළ නොහැකි හෝ ක්‍රියා කළ නොහැකි තැනැත්තකු.

(4) (3) වන උපවගන්තියේ (අ), (ආ) හෝ (ඇ) ඡේදවල සඳහන් යම් ධුරයක් දරන තැනැත්තකු, එම ධුරය දැරීම අවසන් වීමෙන් පසු අවුරුදු දෙකක කාලයක් සඳහා සමාගමක විගණකවරයකු ලෙස පත් කිරීම හෝ වැඩ බැලීම හෝ නොකළ හැකි ය.

(5) පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සලස්වමින් නියෝග සාදනු ලැබිය හැකි ය :—

(අ) ලියාපදිංචි විගණකවරයකු වීමට අවශ්‍ය සුදුසුකම් ;

(ආ) විගණකවරයන් ලියාපදිංචි කිරීමේ කාර්ය පටිපාටිය ;

(ඇ) ඒ ලියාපදිංචි කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තු.

ස්වයංක්‍රීය නැවත පත්වීම.

**158**. (1) 159 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද විගණකවරයකු නොවන, සමාගමක විගණකවරයකු—

(අ) ඔහු නැවත පත් කරනු ලැබීමට සුදුසුකම් ලැබ නොමැති නම් ;

(ආ) විගණකවරයකු වශයෙන් ඔහු ප්‍රතියෝජනය කිරීම පිණිස වෙනත් තැනැත්තකු පත් කරමින් යෝජනා සම්මතයක් සමාගම විසින් රැස්වීමේ දී සම්මත කරනු ලැබුවහොත් ; නැතහොත්

(ඇ) නැවත පත් කරනු ලැබීමට තමන් බලාපොරොත්තු නොවන බවට විගණකවරයා විසින් සමාගමට දැනුම් දීමක් කර ඇත්නම්,

මිස, සමාගමේ වාර්ෂික රැස්වීමක දී නැවත පත් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) විගණකවරයකු ප්‍රතියෝජනය කිරීමට යෝජිත තැනැත්තා මියගියහොත් හෝ එසේ පත් කළ නොහැකි වන්නේ නම් හෝ පත් කළ නොහැකි තත්වයකට පත්ව ඇත්නම්, පත්වන්නේ නම් නැතහොත් නුසුදුසු වන්නේ නම් හෝ නුසුදුසු බවට පත්වන්නේ නම් ඒ විගණකවරයා ස්වයංක්‍රීයව නැවත පත් නොවන්නේ ය.

ප්‍රථම විගණකවරයා පත් කිරීම.

**159**. (1) සමාගමක ප්‍රථම විගණකවරයා පළමුවන වාර්ෂික රැස්වීමට ප්‍රථම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරනු ලැබිය හැකි අතර, එසේ පත් කරනු ලැබුවහොත් ඔහු ඒ රැස්වීම අවසාන වන තෙක් ධුරය දැරිය යුතු ය.

(2) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් (1) වන උපවගන්තිය යටතේ විගණකවරයකු පත් කරනු නොලබන්නේ නම්, සමාගම විසින් සමාගමේ රැස්වීමක දී ප්‍රථම විගණකවරයා පත් කරනු ලැබිය යුතු ය.

(3) විගණකවරයකු පත් නොකළ යුතු බවට කොටස් හිමියන් විසින් යෝජනා සම්මතයක් ඒකච්ඡන්දයෙන් සම්මත කර ඇත්නම්, මේ වගන්තියේ විධිවිධානවලට අනුකූලව විගණකවරයකු පත් කරන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලයට හෝ සමාගමට හෝ නියම කරනු නොලැබිය යුතු ය. පළමුවන වාර්ෂික රැස්වීම ආරම්භයේ දී එවැනි යෝජනා සම්මතයක බලපෑම නතර වන්නේ ය.

විගණකවරයා ප්‍රතියෝජනය කිරීම.

**160**. (1) නැවත පත් කරනු ලැබීම සඳහා සුදුසුකම් ඇති විගණකවරයකු වෙනුවට සමාගමක් විසින් අලුත් විගණකවරයකු පත් කිරීම—

(අ) එසේ කිරීමට ඇති යෝජනාවක් පිළිබඳව යටත් පිරිසෙයින් වැඩ කරන දවස් විස්සක ලිඛිත දැන්වීමක් විගණකවරයාට දී ඇත්නම් ; සහ

(ආ) වෙනත් තැනැත්තකු පත් කිරීම පිළිබඳව කොටස් හිමියන්ට ලිඛිතව හෝ කොටස් හිමියන්ගේ රැස්වීමක කථාකරමින් විගණකවරයා (විගණකවරයා විසින් තෝරා ගත හැකි කවරක් වුව ද) හෝ ඔහුගේ නියෝජිතයා විසින් කරුණු දක්වා සිටීමට සාධාරණ අවස්ථාවක් විගණකවරයාට දී ඇත්නම්,

මිස, නොකළ යුතු ය.

(2) මේ වගන්තිය යටතේ කොටස් හිමියන්ට කරුණු දක්වා සිටීම වෙනුවෙන්, සමාගම විසින් සාධාරණ ගාස්තු හා වියදම් ගෙවනු ලැබීමට විගණකවරයකු හිමිකම් ලබන්නේ ය.

විගණකවරයකු වශයෙන් ධුර දැරීම නතර වන තැනැත්තා විසින් කරනු ලබන ප්‍රකාශය.

**161**. (1) විගණකවරයකු ඉල්ලා අස්වන්නේ නම් හෝ වෙනත් යම් හේතුවක් නිසා ඔහු ධුරය දැරීම නතර වන්නේ නම්, සමාගමේ කොටස් හිමියන්ගේ හෝ ණයහිමියන්ගේ අවධානයට යොමු කළ යුතු යයි ඔහු සලකන ධුරය දැරීම නතරවීම සම්බන්ධයෙන් වූ යම් අවස්ථා ගත කරුණු

පිළිබඳ ප්‍රකාශයක් ඔහු විසින් සමාගමට භාර දිය යුතු ය ; නැතහොත් එවැනි අවස්ථාගත කරුණු කිසිවක් නොමැති යයි ඔහු සලකන්නේ නම්, එවැනි අවස්ථාගත කරුණු නොමැති බවට වූ ප්‍රකාශයක් සමාගමට භාර දිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නියම කර ඇති ප්‍රකාශය, විගණකවරයා විසින්—

(අ) ඔහු ඉල්ලා අස්වන්නේ නම්, ඉල්ලා අස්වීමේ දැන්වීම සමග ;

(ආ) ඔහු නැවත පත් කරනු ලැබීමට බලාපොරොත්තු නොවන බවට දැන්වීමක් දෙන්නේ නම්, ඒ දැන්වීම සමග ;

(ඇ) වෙනත් හේතුවක් නිසා ඔහුගේ ධුරය දැරීම නතර වන්නේ නම්, ධුරය දැරීම නතරවීමෙන් වැඩ කරන දවස් දහයක් ඇතුළත,

භාර දෙනු ලැබිය යුතු ය.

(3) කොටස් හිමියන්ගේ හෝ ණය හිමියන්ගේ අවධානයට යොමු කළ යුතු බවට විගණකවරයා විශ්වාස කරන අවස්ථාගත කරුණු විගණකවරයා විසින් ප්‍රකාශ කර ඇත්නම්, සමාගම විසින්—

(අ) ප්‍රකාශයේ පිටපතක් එක් එක් කොටස් හිමියා වෙත යවනු ලැබිය යුතු ය ; තව ද

(ආ) ප්‍රකාශයේ පිටපතක් රෙජිස්ට්‍රාර්වරයා වෙත යවනු ලැබිය යුතු ය :

එසේ වුව ද, සමාගම විසින් (විගණකවරයා විසින් ගාස්තු ගෙවිය යුතු ආඥාවක් මගින් ලබා ගන්නා ලද) අධිකරණයේ අවසරය ඇතිව, කොටස් හිමියන් වෙත පිටපත් යැවීමෙන් හෝ එසේ කැඳවන ලද රැස්වීමේ දී කරුණු දැක්වීම් කියවීමෙන් වැළකී සිටිය හැකි ය.

(4) (1) වන උපවගන්තියේ නියමයන්ට අනුව ක්‍රියා කිරීම විගණකවරයා විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක, ඔහු වරදකට වරදකරු වන අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂ දෙකක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(5) සමාගමක් විසින් (3) වන උපවගන්තියේ නියමයන්ට අනුව ක්‍රියා කිරීම පැහැර හරිනු ලබන අවස්ථාවක—

(අ) සමාගම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ දෙකක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය ; තව ද

(ආ) පැහැර හැරීම කරන ලද සමාගමේ සෑම නිලධරයකු ම වරදකට වරදකරු අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් එක්ලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

විගණකවරයා බැඳීම් ගැටලුවලින් වැළකී සිටිය යුතු බව.

**162**. මේ පනත යටතේ විගණකවරයකුගේ කාර්යය ඉටු කිරීමේ දී සමාගමක විගණකවරයකු විසින්, සමාගම හෝ එහි යම් පාලිත සමාගමක් හෝ සමග ඇති යම් බැඳීමක් හෝ සම්බන්ධතාවක් හේතු කොට ගෙන තම විනිශ්චයට හානියක් නොවන බවට වගබලාගත යුතු ය.

විගණකවරයාගේ වාර්තාව.

**163**. (1) සමාගමක විගණකවරයා විසින් තමා විසින් විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ පිළිබඳව වාර්තාවක් කොටස් හිමියන්ට දිය යුතු ය.

(2) විගණකවරයාගේ වාර්තාවේ—

(අ) විගණකවරයාගේ මතයට වූ හේතූන් ;

(ආ) විගණනයේ විෂය පථය හා පරිසීමා ;

(ඇ) අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් විගණකවරයා විසින් ලබාගෙන ඇද්ද යන වග ;

(ඈ) විගණකවරයාගේ මතය අනුව, ඒවා පරීක්ෂා කිරීමේ දී පෙනීයන තාක් දුරට සමාගම විසින් නිසි ගිණුම් වාර්තා තබා ගෙන ඇද්ද යන වග ;

(ඉ) විගණකවරයාගේ මතය අනුව, මූල්‍ය ප්‍රකාශවලින් සහ යම් සමූහ මූල්‍ය ප්‍රකාශවලින්, ඒවා අදාළ කාරණා පිළිබඳව සත්‍ය සහ සාධාරණ අදහසක් පෙන්නුම් කරන්නේ ද යන වග සහ ඒවායින් එවැනි අදහසක් පෙන්නුම් නොවන්නේ නම් අඩුපාඩු ඇත්තේ කවර කාරණා සම්බන්ධයෙන් ද යන වග ;

(ඊ) විගණකවරයාගේ මතය අනුව, මූල්‍ය ප්‍රකාශ සහ යම් සමූහ මූල්‍ය ප්‍රකාශ, අවස්ථාවෝචිත පරිදි, 151 වන වගන්තිය හෝ 153 වන වගන්තියේ නියම අනුව ක්‍රියා කර තිබේ ද යන වග සහ එසේ ක්‍රියා කර නොමැති නම්, අඩුපාඩු ඇත්තේ කවර කාරණා සම්බන්ධයෙන් ද යන වග,

ප්‍රකාශ විය යුතු ය.

(3) සමාගමක විගණකවරයා විසින්, ඔහුගේ වාර්තාව සමාගමට භාර දෙන වේලාවේ දී ම—

(අ) (විගණකවරයකු වශයෙන් හැර) විගණකවරයාට සමාගම හෝ එහි යම් පාලිත සමාගමක් සමග පවත්නා යම් බැඳීමක් හෝ සමාගමෙහි හෝ එහි යම් පාලිත සමාගමක පවත්නා සම්බන්ධතා කිසිවක් ; සහ

(ආ) සමාගමේ විගණකවරයා වශයෙන් ධුරය දරන තැනැත්තාට හෝ ව්‍යාපාර ආයතනයට විගණක ගාස්තු හා වියදම් වශයෙන් සමාගම විසින් ගෙවිය යුතු මුදල් සහ වෙනම විෂයාංකයක් වශයෙන්, සහ ඒ තැනැත්තා හෝ ව්‍යාපාර ආයතනය විසින් සලසන ලද වෙනත් සේවා සඳහා සමාගම විසින් ගෙවිය යුතු ගාස්තු හා වියදම් කිසිවක්,

පිළිබඳ ප්‍රකාශයක් ද සමාගමට භාර දිය යුතු ය.

තොරතුරුවලට විගණකවරයාගේ ප්‍රවේශය.

**164**. (1) සමාගමේ විගණකවරයකුට සමාගමේ ගිණුම් වාර්තාවලට හා වෙනත් ලේඛනවලට සියලු අවස්ථාවල දී ප්‍රවේශයක් සැලසෙන බවට සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වගබලා ගත යුතු ය.

(2) සමාගමක විගණකවරයා වශයෙන් ස්වකීය කාර්ය ඉටුකිරීම සඳහා අවශ්‍ය යයි විගණකවරයා කල්පනා කරන යම් තොරතුරු හා පැහැදිලි කිරීම්, සමාගමේ අධ්‍යක්ෂවරයකුගෙන් හෝ සේවානියුක්තයකුගෙන් ඉල්ලා සිටීමට ඒ විගණකවරයා හිමිකම් ලබන්නේ ය.

(3) (1) වන උපවගන්තියේ නියමයන් අනුව ක්‍රියා කිරීම සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක, පැහැර හැරීම කරන ලද සමාගමේ සෑම අධ්‍යක්ෂවරයකු ම වරදකට වරදකරු වන අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(4) (2) වන උපවගන්තියේ නියමයන් අනුව ක්‍රියා කිරීම පැහැර හරින හෝ අසත්‍ය තොරතුරු සපයන අධ්‍යක්ෂවරයකු හෝ සේවා නියුක්තයකු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(5) (4) වන උපවගන්තිය යටතේ වූ වරදක් පිළිබඳව චෝදනා ලබා ඇති සේවානියුක්තයකු විසින්—

(අ) අවශ්‍ය වූ තොරතුරු තම සන්තකයෙහි හෝ තම පාලනය යටතේ නොතිබුණු බව ; හෝ

(ආ) තමා විසින් දරන ලද තත්ත්වය හෝ තමාට වෙන් කර දෙන ලද කාර්ය හේතුකොට ගෙන අවශ්‍ය පැහැදිලි කිරීම් දීමට තමාට නොහැකි වූ බව,

ඔප්පු කරනු ලැබුවහොත්, එය ඒ සේවානියුක්තයාට විත්තිවාචකයක් වන්නේ ය.

කොටස් හිමියන්ගේ රැස්වීමට විගණකවරයා පැමිණ සිටීම.

**165**. (1) සමාගමේ විගණකවරයාට—

(අ) සමාගමේ කොටස් හිමියන්ගේ සෑම රැස්වීමකට ම පැමිණ සිටීමට අවසර ලැබී ඇති බවට ;

(ආ) කොටස් හිමියන්ගේ රැස්වීමකට අදාළව කොටස් හිමියකු හිමිකම් ලබන දැන්වීම් හා නිවේදන ලැබී ඇති බවට ; සහ

(ඇ) තමා පැමිණ සිටින කොටස් හිමියන්ගේ රැස්වීමක දී විගණකවරයා වශයෙන් තමාට අදාළ රැස්වීමේ කටයුතුවල යම් කොටසක් සම්බන්ධයෙන් කරුණු දක්වා සිටිය හැකි බවට,

සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වගබලා ගත යුතු ය.

(2) සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලය විසින් (1) වන උපවගන්තිය අනුව ක්‍රියා කිරීම පැහැර හරිනු ලබන්නේ නම්, පැහැර හැරීම කරන ලද සමාගමේ සෑම අධ්‍යක්ෂවරයකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් එක්ලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

## කොටස් හිමියන්ගේ වාර්ෂික වාර්තාව

**166**. (1) සෑම සමාගමක ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, සමාගමේ ශේෂ පත්‍රයේ දිනයට පසුව මාස හයක් ඇතුළත ඒ දිනයෙන් අවසන් වන ගිණුම් කාලපරිච්ඡේදය තුළ සමාගමේ කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තාවක් පිළියෙල කරනු ලැබිය යුතු ය. වාර්ෂික වාර්තාව පිළියෙල කිරීමට ඇති බැඳීම.

(2) සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලය විසින් (1) වන උපවගන්තියේ නියමයන් අනුව ක්‍රියා කිරීම පැහැර හරිනු ලබන අවස්ථාවක, පැහැර හැරීම කරන ලද සමාගමේ සෑම අධ්‍යක්ෂවරයකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

**167**. (1) කොටස් හිමියන්ගේ වාර්ෂික රැස්වීම පැවැත්වීම සඳහා නියම කර ඇති දිනයෙන් වැඩ කරන දවස් පහළොවකට නොඅඩු ගණනකට පෙර, සමාගමේ සෑම කොටස් හිමියකුට ම වාර්ෂික වාර්තාවේ පිටපතක් යැවීමට සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලස්වනු ලැබිය යුතු ය : වාර්ෂික වාර්තාව කොටස් හිමියන්ට යැවීම.

එසේ වුව ද, සමාගමක් විසින් පළමු අවස්ථාවේ දී ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විමසා, නියමිත ආකාරයක සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශයක් සෑම කොටස් හිමියකුට ම වාර්ෂික වාර්තාව සමග යැවිය යුතු ය :

එසේම තවදුරටත් කොටස් හිමියකුට අවශ්‍ය වන්නේ නම්, නියම කර ඇති කාලයක් ඇතුළත සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශයක් ලැබීමට ඔහු හිමිකම් ලබන බව සමාගම විසින් එක් එක් කොටස් හිමියාට දැනුම් දිය යුතු ය.

(2) සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලය විසින් (1) වන උපවගන්තියේ නියමයන් අනුව ක්‍රියා කිරීම පැහැර හරිනු ලබන අවස්ථාවක, සමාගමේ සෑම අධ්‍යක්ෂවරයකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

**168**. (1) අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ලිඛිතව විය යුතු අතර, එයට දිනය යොදා තිබිය යුතු ය. තව ද, (2) වන උපවගන්තියට යටත්ව— වාර්ෂික වාර්තාවෙහි ඇතුළත් විය යුතු දේ.

(අ) ඒ වාර්ෂික වාර්තාවෙහි—

(i) සමාගමේ හෝ එහි යම් පාලිත සමාගමක ව්‍යාපාර කටයුතුවල ස්වභාවය ; හෝ

(ii) වෙනත් සමාගමක කොටස් හිමියකු වශයෙන් හෝ නො එසේව සමාගමට සම්බන්ධතාවක් ඇති ව්‍යාපාර පංති,

පිළිබඳ ගිණුම් කාල පරිච්ඡේදය තුළ ඇති වූ යම් වෙනස්කමක්, සමාගමේ කටයුතුවල තත්ත්වය සම්බන්ධයෙන් කොටස් හිමියන්ට හරිහැටි වටහා ගැනීම පිණිස වැදගත් වන්නේ යයි සහ සමාගමේ හෝ එහි යම් පාලිත සමාගමක ව්‍යාපාර කටයුතුවලට හානිකර නොවන්නේ යයි අධ්‍යක්ෂ මණ්ඩලය විශ්වාස කරන තාක් දුරට විස්තර කර තිබිය යුතු ය.

(ආ) 151 වන වගන්තියට අනුකූලව සම්පූර්ණ කර අත්සන් කරන ලද ගිණුම් කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ සහ 152 වන වගන්තියට අනුකූලව සම්පූර්ණ කර අත්සන් කරන ලද ගිණුම් කාල පරිච්ඡේදය සඳහා වූ යම් සමූහ මූල්‍ය ප්‍රකාශ ඇතුළත් විය යුතු ය ;

(ඇ) සමාගම විසින් විගණකවරයකු පත්කර ඇති අවස්ථාවක, මූල්‍ය ප්‍රකාශ සහ යම් සමූහ මූල්‍ය ප්‍රකාශ පිළිබඳව ඒ විගණකවරයාගේ වාර්තාවෙහි ඇතුළත් විය යුතු ය ;

(ඈ) ගිණුම් කාල පරිච්ඡේදය තුළ සිදු කරන ලද ගිණුම් ප්‍රතිපත්තිවල යම් වෙනසක් විස්තර කර තිබිය යුතු ය ;

(ඉ) ගිණුම් කාල පරිච්ඡේදය තුළ සම්බන්ධතා ලේඛනයේ කරන ලද සටහන්වල විස්තර සඳහන් කර තිබිය යුතු ය ;

(ඊ) ගිණුම් කාල පරිච්ඡේදය ඇතුළත අධ්‍යක්ෂවරයන් විසින් ලබා ගන්නා ලද පාරිශ්‍රමික හා වෙනත් යම් ප්‍රතිලාභ සඳහන් කර තිබිය යුතු ය ;

(උ) ගිණුම් කාල පරිච්ඡේදය තුළ සමාගම විසින් කරන ලද ප්‍රදානවල මුළු මුදල සඳහන් කර තිබිය යුතු ය ;

(ඌ) ගිණුම් කාල පරිච්ඡේදය අවසානයේ දී සමාගමේ අධ්‍යක්ෂවරයන් වශයෙන් ධුර දරන තැනැත්තන්ගේ නම් සහ ගිණුම් කාල පරිච්ඡේදය තුළ සමාගමේ අධ්‍යක්ෂවරයන් වශයෙන් ධුර දැරීම නතර කළ යම් තැනැත්තන්ගේ නම් සඳහන් කර තිබිය යුතු ය ;

(එ) සමාගම විසින් සමාගමේ විගණකවරයා වශයෙන් ධූරය දරන තැනැත්තාට හෝ ව්‍යාපාර ආයතනයට විගණක ගාස්තු වශයෙන් ගෙවිය යුතු මුදල් සහ ඒ තැනැත්තා හෝ ව්‍යාපාර ආයතනය විසින් සපයන ලද වෙනත් සේවා සඳහා ගෙවිය යුතු ගාස්තු වෙනම විෂයයක් වශයෙන් ද සඳහන් කර තිබිය යුතු ය ;

(ඒ) විගණකවරයාට සමාගම හෝ එහි යම් පාලිත සමාගමක් සමග (විගණකවරයකු වශයෙන් හැර) සම්බන්ධතා හෝ ඒ සමාගමෙහි හෝ එහි පාලිත සමාගමෙහි ඇති සම්බන්ධතා කිසිවක් පිළිබඳ විස්තර සඳහන් කර තිබිය යුතු ය ;

(ඔ) අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්—

(i) සමාගමේ අධ්‍යක්ෂවරයන් දෙදෙනකු හෝ සමාගමට ඇත්තේ එක් අධ්‍යක්ෂවරයකු නම් ඒ අධ්‍යක්ෂවරයා ; සහ

(ii) සමාගමේ ලේකම්වරයා,

විසින් අත්සන් කර තිබිය යුතු ය.

(2) ස්වකීය වාර්ෂික වාර්තාවෙහි සමූහ මූල්‍ය ප්‍රකාශ ඇතුළත් කිරීමට නියම කර ඇති සමාගමක් විසින්, එහි පාලිත සමාගම් සම්බන්ධයෙන් (1) වන උපවගන්තියේ (ඇ) සිට (ඒ) තෙක් වූ ඡේදවල නිශ්චිතව සඳහන් තොරතුරු ඇතුළත් කළ යුතු ය.

(3) සමාගමක වාර්ෂික වාර්තාව (1) වන උපවගන්තියේ (අ) සහ (ඇ) සිට (ඒ) තෙක් වූ ඡේදවල විධිවිධාන කිසිවක් අනුව ක්‍රියා කිරීම අවශ්‍ය නොවන්නේ යයි සියලු කොටස් හිමියන් ලියවිල්ලක් මගින් එකඟ වුවහොත්, ඒ වාර්ෂික වාර්තාව එකී විධිවිධාන අනුව ක්‍රියා කිරීම අවශ්‍ය නොවිය යුතු ය. එවැනි යම් එකඟවීමක් වාර්ෂික වාර්තාවෙහි සටහන් කරනු ලැබිය යුතු ය.

වාර්තාව යැවීම පැහැර හැරීම ආදිය.

**169**. සමාගමක ව්‍යවස්ථාවලියේ ඇතුළත් විධිවිධානවලට යටත්ව, මේ පනත යටතේ කර ඇති යම් නියම කිරීමක් අනුව කොටස් හිමියකුට වාර්ෂික වාර්තාවක්, දැන්වීමක් හෝ වෙනත් ලේඛනයක් යැවීම පැහැර හැරීම අහම්බෙන් සිදුවූවක් නම්, ඒ පැහැර හැරීම සමාගමේ කොටස්හිමියන්ගේ රැස්වීමක කටයුතුවල වලංගු භාවය කෙරෙහි බල නොපෑ යුතු ය.

## මූල්‍ය ප්‍රකාශ ලියාපදිංචි කිරීම

මූල්‍ය ප්‍රකාශ ලියාපදිංචි කිරීම.

**170.** (1) පෞද්ගලික සමාගමක් නොවන සෑම සමාගමක් ම, සමාගමේ මූල්‍ය ප්‍රකාශ සහ යම් සමූහ මූල්‍ය ප්‍රකාශ අත්සන් කිරීමට නියම කිරීමෙන් පසු වැඩ කරන දවස් විස්සක් ඇතුළත, ඒ ප්‍රකාශවල පිටපත්, ඒ ප්‍රකාශ පිළිබඳව විගණකවරයාගේ වාර්තාවක් ද සමග රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි කිරීම සඳහා භාර දීමට වගබලා ගත යුතු ය.

(2) රෙජිස්ට්‍රාර්වරයා විසින් ලිඛිත දැන්වීමක් මගින්, ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් යම් ගිණුම් කාලපරිච්ඡේද සම්බන්ධයෙන් වූ සමාගමේ මූල්‍ය ප්‍රකාශ සහ යම් සමූහ මූල්‍ය ප්‍රකාශ සහ ප්‍රකාශ ගැන විගණකවරයාගේ යම් වාර්තාවක පිටපත් ද සමග වැඩ කරන දින විස්සක් ඇතුළත තමා වෙත භාරදෙන ලෙස පෞද්ගලික සමාගමකට නියම කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා වෙත භාර දෙනු ලබන පිටපත්, සමාගමේ අධ්‍යක්ෂවරයන් දෙදෙනකු විසින් හෝ සමාගමට ඇත්තේ එක් අධ්‍යක්ෂවරයකු පමණක් නම් ඒ අධ්‍යක්ෂවරයා විසින් නිවැරදි පිටපත් බවට සහතික කරනු ලැබිය යුතු ය.

## අර්ථකතනය

ශේෂ පත්‍රයේ දිනය.

**171.** (1) (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, සමාගමකට එක් එක් ලිත් වර්ෂයෙහි ශේෂ පත්‍ර දිනයක් තිබිය යුතු ය.

(2) සමාගමක පළමුවන ශේෂ පත්‍ර දිනය ඒ සමාගම සංස්ථාගත කරන ලද ලිත් වර්ෂයෙන් පසුව එළඹෙන ලිත් වර්ෂයේ දිනයක් වන්නේ නම් සහ ඒ දිනය සමාගම පිහිටුවීමේ හෝ සංස්ථාගත කිරීමේ දිනයෙන් මාස පහළොවකට පසු නොවන දිනයක් වන්නේ නම්, ඒ සමාගමට සංස්ථාගත කරන ලද ලිත් වර්ෂයේ දී ශේෂ පත්‍ර දිනයක් තිබිය යුතු බවට නියම කරනු නොලැබිය යුතු ය.

(3) සමාගමක් විසින් එහි ශේෂ පත්‍ර දිනය වෙනස් කරනු ලබන අවස්ථාවක—

(අ) යම් ශේෂ පත්‍ර දින දෙකක් අතර කාලය මාස පහළොවක් නොඉක්මවන්නේ නම් ; සහ

(ආ) ශේෂ පත්‍රය පිළියෙල කිරීමට පෙර ඒ ශේෂ පත්‍රයේ දිනය වෙනස් කිරීම රෙජිස්ට්‍රාර්වරයා විසින් අනුමත කරනු ලබන්නේ නම්,

මිස, ලිත් වර්ෂයක දී ශේෂ පත්‍ර දිනයක් තිබිය යුතු බවට සමාගමට නියම කරනු ලැබිය යුතු ය.

(4) රෙජිස්ට්‍රාර්වරයා විසින් (3) වන උපවගන්තියේ කාර්යය සඳහා, ශේෂ පත්‍ර දිනයෙහි වෙනස් කිරීමක්, කොන්දේසි සහිතව හෝ රහිතව අනුමත කරනු ලැබිය හැකි ය.

(5) සමාගමක් විසින් එහි ශේෂ පත්‍රයේ දිනය වෙනස් කරනු ලැබූ අවස්ථාවක, යම් ශේෂ පත්‍ර දින දෙකක් අතර කාලය මාස පහළොවක් නොඉක්මවිය යුතු ය.

(6) ශේෂ පත්‍ර දිනයක් පිළිගැනීම හෝ වෙනස් කිරීම, ඒ බවට වූ රෙජිස්ට්‍රාර්වරයාගෙන් දැන්වීමක් ලැබුණු විට බලාත්මක විය යුතු ය.

(7) අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය අනුව, සමාගමක යම් පාලිත සමාගමක ශේෂ පත්‍ර දිනය සමාගමේ ශේෂ පත්‍ර දිනය ම නොවීමට යහපත් හේතු ඇත්නම් මිස, සමාගමේ එක් එක් පාලිත සමාගමක ශේෂ පත්‍ර දිනය සමාගමේ ශේෂ පත්‍රයේ දිනය ම වන බවට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වගබලා ගත යුතු ය.

(8) සමාගමක පාලිත සමාගමක ශේෂ පත්‍ර දිනය සමාගමේ ශේෂ පත්‍ර දිනය ම නොවන අවස්ථාවක, යම් නිශ්චිත සමූහ මූල්‍ය ප්‍රකාශවල කාර්ය සඳහා, පාලිත සමාගමේ ශේෂ පත්‍ර දිනය සමාගමේ ශේෂ පත්‍ර දිනයට ඉහතින් වූ ශේෂ පත්‍ර දිනය විය යුතු ය.

## සමාගමක කටයුතු විමර්ශනය

සමාගමේ කටයුතු, කොටස් හිමියන් විසින් කරනු ලබන ඉල්ලීමක් මත, විමර්ශනය කිරීම.

**172**. (1) සමාගමක කටයුතු විමර්ශනය කිරීම සහ රෙජිස්ට්‍රාර්වරයා විසින් විධාන කරනු ලබන යම් ආකාරයකින් ඒ කටයුතු පිළිබඳව වාර්තා කිරීම පිණිස රෙජිස්ට්‍රාර්වරයා විසින්—

(අ) විශේෂ යෝජනා සම්මතයක් මගින් අනුමත කරන ලද සමාගමේ ඉල්ලුම්පත්‍රය මත ;

(ආ) කොටස් නිකුත් කර ඇති සමාගමක් සම්බන්ධයෙන් වන විට, කොටස් හිමියන් පනස් දෙනකුට නො අඩු සංඛ්‍යාවක් හෝ

නිකුත් කරන ලද කොටස්වලින් කොටස් පහෙන් එකකට නොඅඩු සංඛ්‍යාවක් දරන කොටස් හිමියන් විසින් කරන ලද ඉල්ලීමක් මත ;

(ඇ) කොටස් නිකුත් කර නොමැති සමාගමක් සම්බන්ධයෙන් වන විට, සමාගමේ සාමාජික නාම ලේඛනයේ නම් ඇතුළත් තැනැත්තන් සංඛ්‍යාවෙන් පහෙන් එකකට නොඅඩු සංඛ්‍යාවක් විසින් කරන ලද ඉල්ලීමක් මත,

නිසි පරීක්ෂකවරුන් එක් කෙනකු හෝ ඊට වැඩි ගණනක් පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ ඉල්ලීම් පත්‍රයක්, විමර්ශනය ඉල්ලා සිටීමට ඉල්ලුම්කරුට හෝ ඉල්ලුම්කරුවන්ට මනා හේතු ඇති බව පෙන්වීමේ කාර්යය සඳහා රෙජිස්ට්‍රාර්වරයා විසින් නියම කරනු ලබන යම් සාක්ෂිවලින් සනාථ කරනු ලැබිය යුතු ය.

(3) රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ පරීක්ෂකවරයා පත් කිරීමට පෙර සහ අවශ්‍ය යයි ඔහු සලකන පරිදි කලින් කල, විමර්ශනයේ ගාස්තු ගෙවීම සඳහා ඇප තබන ලෙස ඉල්ලුම්කරුට හෝ ඉල්ලුම්කරුවන්ට නියම කරනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ ඇප සපයන ලෙස නියම කරනු ලබන පරිදි සහ නියම කරනු ලැබූ විට, ඇප වශයෙන් යම් මුදලක් සැපයීම යම් තැනැත්තකු විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක, රෙජිස්ට්‍රාර්වරයා විසින් ඔහුගේ පරම අභිමතය පරිදි දැනටමත් ගෙවා ඇති යම් ඇපයක් රාජසන්තක කරන ලෙස විධාන කර විමර්ශනය අවසාන කළ හැකි ය.

වෙනත් අවස්ථාවල දී සමාගමේ කටයුතු විමර්ශනය කිරීම.

**173**. (1) 172 වන වගන්තියේ විධිවිධානවලට හානියක් නො මැතිව, රෙජිස්ට්‍රාර්වරයා විසින්—

(අ) සමාගමක කටයුතු රෙජිස්ට්‍රාර්වරයා විසින් පත් කරන ලද තැනැත්තකු විසින් විමර්ශනය කළ යුතු බවට අධිකරණය විසින් ආඥාවක් මගින් ප්‍රකාශ කරනු ලබන අවස්ථාවක, සමාගමේ කටයුතු පිළිබඳව විමර්ශනය කර රෙජිස්ට්‍රාර්වරයා විධාන කරන යම් ආකාරයකින් ඒ කටයුතු පිළිබඳව වාර්තා කිරීම පිණිස නිසි පරීක්ෂකවරයන් එක් කෙනකු හෝ ඊට වැඩි ගණනක් පත් කරනු ලැබිය යුතු ය ;

(ආ) (i) සමාගමක ව්‍යාපාර කටයුතු එහි ණය හිමියන්ට හෝ වෙනත් යම් තැනැත්තකුගේ ණය හිමියන්ට හෝ වංචා කිරීමේ අදහසින් හෝ වෙනත් ආකාරයක වංචනික හෝ නීති විරෝධී කාර්යයක් සඳහා හෝ සමාගමේ කොටස් හිමියන්ගෙන් යම් කොටසකට අසාධාරණ ලෙස හානිකර වන ආකාරයකින් පවත්වා ගෙන යන බවට ;

(ii) සමාගම යම් වංචනික හෝ නීති විරෝධී කාර්යයක් සඳහා පිහිටුවනු ලැබූ බවට ;

(iii) සමාගම පිහිටුවීම හෝ එහි කටයුතු කළමනාකරණය කෙරෙහි සම්බන්ධතාවක් ඇති තැනැත්තන් ඒ හා සම්බන්ධයෙන් සමාගම වෙත එහි කොටස් හිමියන් විෂයයෙහි වංචාවට, ව්‍යතික්‍රමයට හෝ වෙනත් විෂමාචාරයට වරදකරුවන් වන බවට ;

(iv) සමාගමේ කොටස්හිමියන්ට සාධාරණ ලෙස බලාපොරොත්තු විය හැකි, එහි කටයුතු පිළිබඳව සියලු තොරතුරු ඔවුන්ට ලබා දී නොමැති බවට ; නැතහොත්

(v) මේ පනතේ යම් කාර්යයක් සඳහා එසේ කිරීම අවශ්‍ය බවට,

අවස්ථාගත කරුණු ඇති බව රෙජිස්ට්‍රාර්වරයාට පෙනී යන්නේ නම්, සමාගමේ කටයුතු විමර්ශනය කිරීම සහ ඒ කටයුතු පිළිබඳව වාර්තා කිරීම පිණිස රෙජිස්ට්‍රාර්වරයා විසින් නිසි පරීක්ෂකවරයන් එක් කෙනකු හෝ ඊට වැඩි ගණනක් පත් කරනු ලැබිය හැකි ය.

(2) පරීක්ෂකවරයකු විසින් කරනු ලබන යම් වාර්තාවක් පළ කිරීම සඳහා නොවන බවට වූ කොන්දේසිය මත මේ වගන්තිය යටතේ පරීක්ෂකවරයකු පත් කරනු ලැබිය හැකි අතර, එවැනි යම් අවස්ථාවක 176 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන ඒ වාර්තාවට අදාළ නොවිය යුතු ය.

සම්බන්ධිත සමාගම්වල කටයුතු පිළිබඳව විමර්ශන පැවැත්වීමට පරීක්ෂකවරුන්ට ඇති බලය.

174. සමාගමක කටයුතු විමර්ශනය කිරීමට 172 වන වගන්තියේ හෝ 173 වන වගන්තියේ විධිවිධාන යටතේ පත් කරන ලද පරීක්ෂකවරයකු සමාගමේ පාලිත සමාගම හෝ පාලක සමාගම හෝ එහි පාලක සමාගමේ පාලිත සමාගමක් වන හෝ යම් අදාළ කාලයක දී එසේ සමාගමක්ව පැවති වෙනත් යම් සංස්ථාවක කටයුතු ද විමර්ශනය

කිරීම, තමාගේ විමර්ශනවල කාර්යය සඳහා අවශ්‍ය යයි පරීක්ෂකවරයා සලකන්නේ නම්, රෙජිස්ට්‍රාර්වරයාගේ පූර්ව ලිඛිත අනුමතය ඇතිව එසේ කිරීමට පරීක්ෂකවරයාට බලය ඇති අතර, එහි කටයුතු පිළිබඳ තමාගේ විමර්ශනයේ ප්‍රතිඵල පළමුවෙන් සඳහන් කළ සමාගමේ කටයුතු විමර්ශනය කිරීමෙහි ලා අදාළ වන්නේ යයි ඔහු කල්පනා කරන තාක් ප්‍රමාණයකට ඒ වෙනත් සංස්ථාවේ කටයුතු පිළිබඳව ඔහු විසින් වාර්තා කරනු ලැබිය යුතු ය.

විමර්ශනයේ දී ලේඛන සහ සාක්ෂි ඉදිරිපත් කිරීම.

**175**. (1) 172 වන වගන්තිය හෝ 173 වන වගන්තිය යටතේ පරීක්ෂකරවරයකු පත් කරනු ලැබූ අවස්ථාවක—

(අ) අවස්ථාවෝචිත පරිදි, සමාගමේ හෝ වෙනත් සංස්ථාවේ නැතහොත් සමාගමට හෝ ඒ වෙනත් සංස්ථාවට අදාළව ස්වකීය භාරයේ හෝ බලය යටතේ ඇති සියලු පොත් හා ලේඛන පරීක්ෂකවරයා වෙත ඉදිරිපත් කිරීම ;

(ආ) පෙනී සිටීමට නියම කරනු ලැබූ විට පරීක්ෂකවරයා ඉදිරියෙහි පෙනී සිටීම ; සහ

(ඇ) ඔවුන් විසින් සාධාරණ ලෙස දෙනු ලැබිය හැකි වූ ද විමර්ශනය සම්බන්ධයෙන් වූ සියලු සහාය පරීක්ෂකවරයන්ට ලබාදීම,

සමාගමේ සියලු අධ්‍යක්ෂකවරයන්ගේ, නිලධරයන්ගේ සහ අනුයෝජිතයන්ගේ සහ 174 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ස්වකීය කටයුතු විමර්ශනය කරනු ලබන වෙනත් යම් සංස්ථාවක සියලු අධ්‍යක්ෂවරයන්ගේ, නිලධරයන්ගේ හා අනුයෝජිතයන්ගේ යුතුකම විය යුතු ය.

(2) සමාගමේ හෝ වෙනත් සංස්ථාවේ ව්‍යාපාර කටයුතුවලට අදාළව ඒ සමාගමේ හෝ වෙනත් සංස්ථාවේ නිලධරයන් හා අනුයෝජිතයන්ගෙන් දිවුරුම් පිට හෝ ප්‍රතිඥා පිට සාක්ෂි ගැනීම සහ එවැනි යම් තැනැත්තකු දිවුරවීම හෝ එවැනි යම් තැනැත්තකුගේ ප්‍රතිඥා ගැනීම පරීක්ෂකවරයකු විසින් කළ හැකි ය.

(3) සමාගමේ හෝ වෙනත් සංස්ථාවේ යම් නිලධරයකු හෝ අනුයෝජිතයකු විසින්, අවස්ථාවෝචිත පරිදි, මේ වගන්තිය යටතේ ඉදිරිපත් කිරීම තමාගේ යුතුකම වන යම් පොතක් හෝ ලේඛනයක් පරීක්ෂකවරයා වෙත ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කරන හෝ සමාගමේ හෝ වෙනත් සංස්ථාවේ කටයුතු පිළිබඳව තමාගෙන් අසනු ලබන

යම් ප්‍රශ්නයකට පිළිතුරු සැපයීම ප්‍රතික්ෂේප කරන අවස්ථාවක, පරීක්ෂකවරයා විසින් ඒ ප්‍රතික්ෂේප කිරීම ලියවිල්ලක් මගින් අධිකරණය වෙත සහතික කරනු ලැබිය හැකි ය. අධිකරණය විසින් ඒ කාරණය පිළිබඳව විභාග කර, උද්දේශිත වරදකරුට විරුද්ධව ඔහු වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන යම් සාක්ෂිකරුවන් විසින් දෙනු ලබන සාක්ෂි ඇසීමෙන් සහ විත්තිවාචකයෙහි ලා ඉදිරිපත් කරනු ලබන යම් ප්‍රකාශයකට සවන්දීමෙන් පසුව, ඔහු අධිකරණයට අපහාස කිරීමේ වරදට වරදකරු වූවාක් මෙන් ඔහුට දඬුවම් කරනු ලැබිය හැකි ය.

(4) දිවුරුම් පිට හෝ ප්‍රතිඥා පිට සාක්ෂි ගැනීමට තමාට බලය නොමැති තැනැත්තකුගෙන් තමාගේ විමර්ශනයේ කාර්යය සඳහා එසේ දිවුරුම් පිට හෝ ප්‍රතිඥා පිට සාක්ෂි අවශ්‍ය බව පරීක්ෂකවරයකු කල්පනා කරන අවස්ථාවක, ඔහු විසින් අධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, අධිකරණය විසින් සුදුසු යයි කල්පනා කරන්නේ නම්, අධිකරණය ඉදිරියෙහි පැමිණ සිටින ලෙස සහ විමර්ශනයට අදාළ යම් කාරණයක් පිළිබඳව දිවුරුම් පිට හෝ ප්‍රතිඥා පිට ඒ තැනැත්තාගෙන් සාක්ෂි ගන්නා ලෙස අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි ය. එවැනි යම් සාක්ෂි ගැනීමක දී—

(අ) පරීක්ෂකවරයාට පෞද්ගලිකව පෙනී සිටිය හැකි ය ; නැතහොත් නීතිඥවරයකු මගින් නියෝජනය කරනු ලැබිය හැකි ය ;

(ආ) සුදුසු යයි අධිකරණය විසින් කල්පනා කරනු ලබන යම් ප්‍රශ්න අධිකරණය විසින් සාක්ෂි ගනු ලබන තැනැත්තන්ගෙන් අසනු ලැබිය හැකි ය ;

(ඇ) සාක්ෂි ගනු ලබන තැනැත්තා, අධිකරණය විසින් ඒ තැනැත්තාගෙන් අසනු ලබන හෝ ඒ තැනැත්තාගෙන් ඇසීමට අවසර දෙන සියලු ප්‍රශ්නවලට පිළිතුරු දිය යුතු ය ;

(ඈ) සාක්ෂි දෙනු ලබන තැනැත්තා ඔහුගේ වියදමින් නීතිඥවරයකු විසින් නියෝජනය කරනු ලැබිය හැකි අතර, ඒ තැනැත්තා විසින් දෙනු ලබන යම් පිළිතුරු ඔහු විසින් පැහැදිලි කළ හැකිවීමේ හෝ ඒ පිළිතුරු නියාමනය කළ හැකි වීමේ කාර්යය සඳහා නීතිඥවරයා විසින් ඔහුගෙන් ප්‍රශ්න අසනු ලැබිය හැකි ය ;

(ඉ) සාක්ෂි ගැනීම ලිඛිතව වාර්තාගත කරනු ලැබිය යුතු අතර, සාක්ෂි දෙනු ලබන තැනැත්තා විසින් වාර්තාව අත්සන් කරනු ලැබිය යුතු ය ; තව ද

(ඊ) අධිකරණය විසින් දෙනු ලබන විධාන කිසිවකට යටත්ව, මේ වගන්තිය යටතේ වූ සාක්ෂි දීමේ වාර්තාව මේ පනත යටතේ යම් කටයුත්තක දී සාක්ෂියේ දී ආවේශ්‍ය විය යුතු ය.

(5) (4) වන උපවගන්තියේ (ඈ) ඡේදයේ කුමක් සඳහන්ව ඇත ද, සුදුසු යයි අධිකරණය කල්පනා කරන ගාස්තු ලබා ගැනීමට අධිකරණය විසින් සාක්ෂි දෙනු ලබන තැනැත්තාට ඉඩ දෙනු ලැබිය හැකි ය. එසේ ඉඩ දෙනු ලබන ගාස්තු කිසිවක්, විමර්ශනයේ වියදම්වල කොටසක් වශයෙන් ගෙවනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තියෙහි, නිලධරයන් හෝ අනුයෝජිතයන් සම්බන්ධයෙන් ඇති යම් සඳහන් කිරීමකට, අවස්ථාවෝචිත පරිදි, කලින් සිටි හා වර්තමානයේ සිටින නිලධරයන් හෝ අනුයෝජිතයන් ඇතුළත් විය යුතු අතර, "අනුයෝජිතයන්" යන යෙදුම සමාගමක් හෝ වෙනත් සංස්ථාවක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ සමාගමේ හෝ වෙනත් සංස්ථාවේ බැංකුකරුවන්, නීතිඥවරයන් සහ සමාගම හෝ සංස්ථාව විසින් සේවයෙහි නියුක්ත කර ඇති විගණකවරයන්, සමාගමේ හෝ සංස්ථාවේ නිලධරයන් වුවද, නොවූව ද ඒ බැංකුකරුවන්, නීතිඥවරයන් හා විගණකවරයන් ද එයට ඇතුළත් විය යුතු ය.

පරීක්ෂකවරයාගේ වාර්තාව.

**176.** (1) පරීක්ෂකවරයකු විසින්—

(අ) විමර්ශනයක් පවත්වනු ලබන අතරතුර දී අතුරු වාර්තා රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර රෙජිස්ට්‍රාර්වරයා විසින් විධාන කරනු ලැබුවහොත්, එසේ අතුරු වාර්තා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය ;

(ආ) විමර්ශනයක් අවසන් කරනු ලැබූ විට, රෙජිස්ට්‍රාර්වරයා වෙත අවසාන වාර්තාවක් ලිඛිතව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) අධිකරණයේ ආඥාවක් අනුව 173 වන වගන්තිය යටතේ පරීක්ෂකවරයකු පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ පරීක්ෂකවරයා විසින් ඉදිරිපත් කරන ලද යම් වාර්තාවක පිටපතක් රෙජිස්ට්‍රාර්වරයා විසින් අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) රෙජිස්ට්‍රාර්වරයා විසින් සුදුසු යයි ඔහු කල්පනා කරන්නේ නම්—

(අ) පරීක්ෂකවරයා විසින් ඉදිරිපත් කරන ලද යම් වාර්තාවක පිටපතක් සමාගමේ ලියාපදිංචි කාර්යාලයට යවනු ලැබිය හැකි ය ;

(ආ) ඉල්ලා සිටිනු ලැබීමේ දී හා නියමිත ගාස්තුව ගෙවනු ලැබීමේ දී යම් වාර්තාවක පිටපතක්—

(i) සමාගමේ යම් කොටස් හිමියකු හෝ 174 වන වගන්තිය ප්‍රකාරව වාර්තාවෙහි සඳහන් කර ඇති වෙනත් යම් සංස්ථාවක යම් කොටස් හිමියකු ;

(ii) ස්වකීය ක්‍රියා කලාපය පිළිබඳව වාර්තාවෙහි සඳහන් කර ඇති යම් තැනැත්තකු ;

(iii) සමාගමේ හෝ සංස්ථාවේ විගණකවරයන් ;

(iv) විමර්ශනයක් කරන ලෙස ඉල්ලා සිටි ඉල්ලුම්කරුවන් ;

(v) සමාගමේ හෝ සංස්ථාවේ ණය හිමියකු වශයෙන් හෝ අන්‍යාකාරයකින් වාර්තාවෙහි සඳහන් කර ඇති කාරණාවලින් ස්වකීය මූල්‍ය සම්බන්ධතාවලට බලපෑමක් ඇති වන්නේ යයි රෙජිස්ට්‍රාර්වරයාට පෙනී යන වෙනත් යම් තැනැත්තකු,

වෙත සපයනු ලැබිය හැකි ය ;

(ඇ) වාර්තාව මුද්‍රණය කර පළ කිරීමට සලස්වනු ලැබිය හැකි ය.

**177**. (1) 174 වන වගන්තිය යටතේ විමර්ශනය කරන ලද සමාගමට හෝ වෙනත් යම් සංස්ථාවට අදාළව යම් තැනැත්තකු සාපරාධී වශයෙන් වගකිවයුතු යම් වරදකට වරදකරු වී ඇති බව 176 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද යම් වාර්තාවකින් රෙජිස්ට්‍රාර්වරයාට පෙනී යන අවස්ථාවක, ඒ කාරණය පිළිබඳ නඩු පැවරීම නීතිපතිවරයා විසින් භාරගත යුතු කාරණයක් බව රෙජිස්ට්‍රාර්වයාට පෙනී යන්නේ නම් රෙජිස්ට්‍රාර්වරයා විසින්, ඒ කාරණය නීතිපතිවරයා වෙත යොමු කරනු ලැබිය යුතු ය.

පරීක්ෂකවරයාගේ වාර්තාව මත නඩු කටයුතු.

(2) නීතිපතිවරයා වෙත (1) වන උපවගන්තිය යටතේ යොමු කරන ලද යම් කාරණයක දී ඒ කාරණය නඩු පැවරීමක් කළ යුතු කාරණයක් බව නීතිපතිවරයා සලකන අවස්ථාවක දී, ඔහු විසින්, ඒ අනුව නඩු කටයුතු පවරනු ලැබිය යුතු අතර නඩු පැවරීම සම්බන්ධයෙන් තමන්ට සාධාරණ ලෙස දිය හැකි සියලු සහාය නීතිපතිවරයාට දීම ( නඩු කටයුතුවල විත්තිකරු හැර) අවස්ථාවෝචිත පරිදි, සමාගමේ හෝ

වෙනත් සංස්ථාවේ සියලු නිලධරයන්ගේ හා අනුයෝජිතයන්ගේ යුතුකම විය යුතු ය. 175 වන වගන්තියේ (6) වන උපවගන්තියේ විධිවිධාන ඒ වගන්තියේ කාර්ය සඳහා අදාළ වන පරිදි ම මේ උපවගන්තියේ කාර්ය සඳහා ද අදාළ විය යුතු ය.

(3) ස්වකීය ඈවරකරු මේ පනත යටතේ පත් කරනු ලැබිය හැකි යම් සංස්ථාවක් සම්බන්ධයෙන් වූ විට, ඈවරකරුවකු පත් කිරීම 173 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (i) වන අනුඡේදයේ හෝ (ii) වන අනුඡේදයේ සඳහන් පරිදි වූ යම් අවස්ථාගත කරුණුවල හේතුවෙන් සුදුසු වේ යයි 176 වන වගන්තියේ විධිවිධාන යටතේ ඉදිරිපත් කරන ලද යම් වාර්තාවකින් රෙජිස්ට්‍රාර්වරයාට පෙනී යන අවස්ථාවක, ඈවරකරුවකු පත් කරන ලෙස රෙජිස්ට්‍රාර්වරයා විසින් අධිකරණයෙන් ඉල්ලා සිටිය හැකි ය.

(4) යම් සංස්ථාවක් විසින් මහජන යහපත සඳහා නඩු කටයුතු පැවරීම කළ යුතු යයි 176 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද යම් වාර්තාවකින් රෙජිස්ට්‍රාර්වරයාට පෙනී යන අවස්ථාවක, ඔහු විසින් සංස්ථාවේ නමින් සහ සංස්ථාව වෙනුවෙන් ඒ නඩු කටයුතු ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(5) (4) වන උපවගන්තිය යටතේ සංස්ථාව විසින් ඉදිරිපත් කරන ලද යම් කටයුත්තක දී හෝ ඒ සම්බන්ධයෙන් සංස්ථාව විසින් කරන ලද යම් ගාස්තු හෝ වියදම් සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයා විසින් සංස්ථාව හානිපූරණය කරනු ලැබිය යුතු ය.

සමාගමේ කටයුතු විමර්ශනය කිරීම හා සම්බන්ධ වියදම්.

**178**. (1) රෙජිස්ට්‍රාර්වරයා විසින් 172 වන වගන්තිය හෝ 173 වන වගන්තිය යටතේ පත් කරන ලද පරීක්ෂකවරයකු විසින් පවත්වන ලද විමර්ශනයක් සම්බන්ධයෙන් වූ හෝ ඊට ආනුෂංගික වූ වියදම් ප්‍රථම අවස්ථාවේ දී රෙජිස්ට්‍රාර්වරයා විසින් ගෙවනු ලැබිය යුතු ය.

(2) පහත සඳහන් තැනැත්තන් විසින්, නිශ්චිතව සඳහන් ප්‍රමාණයට, වියදම් රෙජිස්ට්‍රාර්වරයාට ආපසු ගෙවීමට යටත් විය යුතු ය :—

(අ) නීතිපතිවරයා විසින් පවත්වන ලද විමර්ශනයේ ප්‍රතිඵලයක් වශයෙන් පවරන ලද අපරාධ නඩුවක් මත වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකුට හෝ 177 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ පවරන ලද නඩු කටයුතුවල ගාස්තු මුළුමනින්ම හෝ එහි යම් කොටසක් හෝ ගෙවීමට ආඥා කරනු ලැබූ යම් තැනැත්තකුට, ආඥාවේ නිශ්චිතව සඳහන් කරනු ලබන යම් ප්‍රමාණයකට එකී වියදම් ඒ නඩු කටයුතුවල දී ම ගෙවීමට ආඥා කරනු ලැබිය හැකි ය ;

(ආ) 177 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ එහි නාමයෙන් නඩු කටයුතු පවරන ලද යම් සංස්ථාවක්, ඒ නඩු කටයුතුවල ප්‍රතිඵලයක් වශයෙන් එය විසින් අය කර ගනු ලබන යම් මුදලක හෝ දේපළක ප්‍රමාණය හෝ වටිනාකම දක්වා යටත් විය යුතු අතර, සංස්ථාව ගෙවීමට යටත් වන ප්‍රමාණය අය කර ගනු ලැබූ මුදල හෝ දේපළ විෂයයෙහි ප්‍රථම වැය බරක් විය යුතු ය ; සහ

(ඇ) විමර්ශනයේ ප්‍රතිඵලයක් වශයෙන් නීතිපතිවරයා විසින් අපරාධ නඩුවක් පවරනු ලැබුවහොත් මිස—

(i) පරීක්ෂකවරයා රෙජිස්ට්‍රාර්වරයාගේ මෙහෙයවීමෙන් ම හැර අන්‍යාකාරයකින් පත් කරනු ලැබූ අවස්ථාවක, වාර්තාවේ සඳහන් කර ඇති යම් සංස්ථාවක්, රෙජිස්ට්‍රාර්වරයා විසින් අන්‍යාකාරයෙන් විධාන කරන තාක් දුරට හැර යටත් විය යුතු ය ; තව ද

(ii) පරීක්ෂකවරයා 172 වන වගන්තියේ විධිවිධාන යටතේ පත් කරන ලද අවස්ථාවක, විමර්ශනය සඳහා ඉල්ලීමක් කරන යම් තැනැත්තකු රෙජිස්ට්‍රාර්වරයා විසින් විධාන කරනු ලබන යම් ප්‍රමාණයක් ඇත් ද, ඒ ප්‍රමාණයට යටත් විය යුතු ය.

(3) රෙජිස්ට්‍රාර්වරයාගේ මෙහෙයවීමෙන් ම හැර අන්‍යාකාරයකින් පත් කරන ලද පරීක්ෂකවරයකුගේ වාර්තාව සුදුසු යයි ඔහු කල්පනා කරන්නේ නම් (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධාන යටතේ කිරීම උචිත යයි පරීක්ෂකවරයා කල්පනා කරන විධාන (කිසිවක් වේ නම්) ඒ විධාන පිළිබඳව නිර්දේශයක් ඇතුළත් විය හැකි ය ; තව ද රෙජිස්ට්‍රාර්වරයා එසේ විධාන කරන්නේ නම් එවැනි නිර්දේශයක් ඇතුළත් කළ යුතු ය.

(4) (177 වන වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ දරන ලද වියදම් ද ඇතුළුව) ඒ වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ පවරන ලද නඩු කටයුතුවල දී හෝ ඒ සම්බන්ධයෙන් හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් දරන ලද යම් ගාස්තු හෝ වියදම් නඩු කටයුතුවලට හේතු වූ විමර්ශනයේ වියදම් ලෙස, මේ වගන්තියේ කාර්යය සඳහා සලකනු ලැබිය යුතු ය.

(5) (2) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදවල විධිවිධානවලින් නියම කරන ලද රෙජිස්ට්‍රාර්වරයා වෙත ආපසු ගෙවීම සඳහා වූ යම් වගකීමක් ආපසු ගෙවීම සඳහා රෙජිස්ට්‍රාර්වරයා සතු අයිතිවාසිකම සෑහීමට පත් කිරීමට යටත්ව, (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධාන යටතේ වූ වගකීම සම්බන්ධයෙන් සියලු තැනැත්තන්ට හානිපූරණය කිරීම සඳහා වූ වගකීමක් ද විය යුතු අතර, (අ) ඡේදයේ විධිවිධාන මගින් නියම කරන ලද එවැනි යම් වගකීමක්, ඉහත කී පරිදි වූ වගකීමට යටත්ව, (ආ) ඡේදයේ විධිවිධාන යටතේ සියලු තැනැත්තන්ගේ වගකීම සම්බන්ධයෙන් ඔවුන් හානිපූරණය කිරීමේ වගකීමක් ද විය යුතු ය.

(6) (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ හෝ (ආ) ඡේදයේ හෝ (ඇ) ඡේදයේ (i) වන අනුඡේදයේ හෝ (ii) වන අනුඡේදයේ විධිවිධාන යටතේ වගකීමට යටත් යම් තැනැත්තකු, අවස්ථාවෝචිත පරිදි, ඒ ඡේදය හෝ අනුඡේදය යටතේ වගකීමට යටත් යම් තැනැත්තකුගෙන් ඒ යටතේ තම තමන්ගේ පිළිවෙලින් වගකීම්වල ප්‍රමාණයට දායක කර ගැනීමට හිමිකම් ලැබිය යුතු ය.

(7) මේ වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් දැරිය යුතු වියදම්, ඒ යටතේ ඔහු විසින් අයකරගෙන නොමැති තාක් දුරට, තත් කාර්ය සඳහා පාර්ලිමේන්තුව විසින් ප්‍රතිපාදනය කරන ලද මුදල්වලින් ගෙවනු ලැබිය යුතු ය.

පරීක්ෂකවරයාගේ වාර්තාව සාක්ෂි විය යුතු බව.

**179**. 172 වන වගන්තිය හෝ 173 වන වගන්තිය යටතේ පත් කරන ලද යම් පරීක්ෂකවරයකුගේ යම් වාර්තාවක පිටපතක්, වාර්තාවේ ඇතුළත් යම් කාරණයක් සම්බන්ධයෙන් පරීක්ෂකවරයාගේ මතය පිළිබඳව සාක්ෂි වශයෙන් යම් නඩු කටයුත්තක දී ආවේශ්‍ය විය යුතු ය.

සමාගමේ අයිතිය විමර්ශනය කිරීම සඳහා පරීක්ෂකවරයන් පත් කිරීම සහ ඔවුන්ගේ බලතල.

**180**. (1) යම් සමාගමක කොටස්වල අයිතිය පිළිබඳව විමර්ශනය කොට වාර්තා කිරීම සහ සමාගම සම්බන්ධයෙන් අන්‍යාකාරයකින්, සමාගමේ (තථ්‍ය හෝ දෘශ්‍යමාන) සාර්ථකත්වයට හෝ අසාර්ථකත්වයට මූල්‍යමය වශයෙන් සම්බන්ධතාවක් ඇති හෝ ඇතිව සිටි නැතහොත් ප්‍රතිපත්තිය පාලනය කිරීමට හෝ සැලකිය යුතු ආකාරයෙන් ඒ ප්‍රතිපත්තිය කෙරෙහි බලපෑමක් ඇති කළ හැකි නියම තැනැත්තන් නිශ්චය කිරීමේ කාර්යය සඳහා, එක් පරීක්ෂකවරයකු හෝ පරීක්ෂකවරයන් වැඩි සංඛ්‍යාවක් පත්කිරීමට සාධාරණ හේතු ඇති බව රෙජිස්ට්‍රාර්වරයාට පෙනී යන අවස්ථාවක, රෙජිස්ට්‍රාර්වරයා විසින් එසේ පත් කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ පරීක්ෂකවරයකුගේ පත් කිරීමක්, එම පත් කිරීම ව්‍යාප්ත විය යුතු කාරණා හෝ ව්‍යාප්ත විය යුතු කාලසීමාව හෝ වෙනත් කාරණා සම්බන්ධයෙන් ඔහුගේ විමර්ශනයේ විෂය පථය තීරණය කළ හැකි අතර, විශේෂයෙන් විමර්ශනය යම් නිශ්චිත කොටස් හෝ ණය පත්‍ර හා සම්බන්ධ කාරණාවලට සීමා කළ හැකි ය.

(3) පරීක්ෂකවරයකුගේ පත්වීමේ නියමයන්ට යටත්ව, නීතියෙහි ලා අනුගම්‍ය නොවුව ද, ප්‍රායෝගික වශයෙන් අනුගමනය කරනු ලැබූ හෝ අනුගමනය කරනු ලැබීමට ඉඩ ඇති ඔහුගේ විමර්ශනයේ කාර්ය සඳහා අදාළ වුව ද, යම් වැඩ පිළිවෙළක් හෝ එකඟතාවකට එළඹීමක් හඟවන යම් අවස්ථානුගත කරුණු විමර්ශනය කිරීම සඳහා ඔහුගේ බලතල ව්‍යාප්ත විය යුතු ය.

(4) සමාගමක නිශ්චිත කොටස් හෝ සෘණ පත්‍ර සම්බන්ධයෙන් මේ වගන්තියේ විධිවිධාන යටතේ විමර්ශනයන් සඳහා වූ ඉල්ලීමක් සමාගමේ කොටස් හිමියන් විසින් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරන ලද්දා වූ ද, ඉල්ලුම්කරුවන්ගේ සංඛ්‍යාව හෝ ඔවුන් විසින් දරන ලද කොටස් ප්‍රමාණය 172 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) හෝ (ඇ) අනු ඡේදය යටතේ පරීක්ෂකවරයකු පත් කිරීම සඳහා වූ ඉල්ලීමකට අවශ්‍ය ඉල්ලුම්කරුවන් සංඛ්‍යාවට හෝ කොටස් ප්‍රමාණයට අඩු නොවන්නා වූ ද අවස්ථාවක, රෙජිස්ට්‍රාර්වරයා විසින්, (5) සහ (6) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, විමර්ශනය පැවැත්වීම සඳහා පරීක්ෂකවරයකු පත් කළ යුතු ය. පරීක්ෂකවරයකු පත් කරනු ලැබූ අවස්ථාවක ඔහුගේ පත්වීමේ නියමයන්ගෙන්, විමර්ශනය කරනු ලැබීම යුක්ති සහගත නොවන බවට රෙජිස්ට්‍රාර්වරයා සෑහීමට පත්වී ඇති යම් කාරණයක් බැහැර කරනු ලැබිය යුතු ය.

(5) ඉල්ලීම පීඩාකාරී බව රෙජිස්ට්‍රාර්වරයා සලකන්නේ නම්, රෙජිස්ට්‍රාර්වරයා විසින් (4) වන උපවගන්තිය යටතේ පරීක්ෂකවරයකු පත් කරනු නොලැබිය යුතු ය.

(6) (4) වන උපවගන්තිය යටතේ වූ ඉල්ලීමක් මත, එයින් විමර්ශනය කරනු ලැබීමට අපේක්ෂිත කාරණා විමර්ශනය කිරීමේ කාර්යය සඳහා 181 වන වගන්තියෙන් පවරා ඇති බලතල ප්‍රමාණවත් බව රෙජිස්ට්‍රාර්වරයාට පෙනී යන අවස්ථාවක, රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ වෙනුවට ඒ වගන්තිය යටතේ විමර්ශනය පවත්වනු ලැබිය හැකි ය.

(7) මේ වගන්තියේ විධිවිධාන යටතේ වූ යම් විමර්ශනයක කාර්ය සඳහා, සමාගමේ කටයුතු හෝ වෙනත් යම් සංස්ථාවක කටයුතු කෙරෙහි ඇති සඳහන් කිරීම් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව සහ (8) වන සහ (9) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, 174 වන, 175 වන සහ 176 වන වගන්තිවල විධිවිධාන අදාළ විය යුතු ය.

(8) 174 වන, 175 වන සහ 176 වන වගන්ති, අවස්ථාවෝචිත පරිදි, සමාගමේ හෝ වෙනත් සංස්ථාවේ නිලධරයන්ට හා

අනුයෝජිතයන්ට අදාළ වන ආකාරයට ම වෙනත් තැනැත්තන් වෙනුවෙන් පමණක් සම්බන්ධතාවක් දක්වන තැනැත්තන් ද ඇතුළුව, සමාගමේ හෝ සමාගමේ අයිතිය සමග අයිතිය විමර්ශනය කරනු ලබන වෙනත් යම් සංස්ථාවක සාර්ථකත්වයෙහි හෝ අසාර්ථකත්වයෙහි හෝ දෘශ්‍යමාන සාර්ථකත්වය හෝ අසාර්ථකත්වය කෙරෙහි මූල්‍යමය වශයෙන් සම්බන්ධතාවක් ඇති හෝ ඇතිව සිටි හෝ එහි ප්‍රතිපත්තිය පාලනය කිරීමට හෝ එය කෙරෙහි සැලකිය යුතු ආකාරයෙන් බලපෑමක් ඇති කිරීමට හැකි බව විශ්වාස කිරීමට පරීක්ෂකවරයාට සාධාරණ හේතු ඇති සියලු තැනැත්තන්ට අදාළ විය යුතු ය.

(9) මේ වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද වාර්තාවක යම් කොටසක් අනාවරණය නොකිරීමට මනා හේතු ඇති බව රෙජිස්ට්‍රාර්වරයා සලකන්නේ නම්, රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ කොටස අත්හැර 176 වන වගන්තිය යටතේ වාර්තාව අනාවරණය කරනු ලැබිය හැකි ය.

(10) මේ වගන්තියේ විධිවිධාන යටතේ කරන ලද යම් විමර්ශනයක වියදම් තත් කාර්ය සඳහා පාර්ලිමේන්තුව විසින් ප්‍රතිපාදනය කරනු ලබන මුදල්වලින් රෙජිස්ට්‍රාර්වරයා විසින් දරනු ලැබිය යුතු ය.

කොටස් හෝ සෑම පත්‍ර සම්බන්ධයෙන් සම්බන්ධතාවක් දක්වන තැනැත්තන් පිළිබඳව තොරතුරු ඉල්ලා සිටීමට ඇති බලය.

181. (1) සමාගමක යම් කොටස්වල හෝ සෑම පත්‍රවල අයිතිය පිළිබඳව විමර්ශනය කිරීම සඳහා සෑහෙන හේතු ඇති බව සහ ඒ කාර්යය සඳහා පරීක්ෂකයකු පත්කිරීම අනවශ්‍ය බව රෙජිස්ට්‍රාර්වරයාට පෙනී යන අවස්ථාවක, රෙජිස්ට්‍රාර්වරයා විසින්—

(අ) ඒ කොටස්වල හෝ සෑම පත්‍රවල සම්බන්ධතාවක් ඇති බව හෝ ඇතිව සිටි බව; හෝ

(ආ) ඒ කොටස්වල හෝ සෑම පත්‍රවල සම්බන්ධතාවක් ඇති යම් තැනැත්තකුගේ ඇටෝර්නි බලකරු හෝ අනුයෝජිත වශයෙන් ඒ කොටස් හෝ සෑම පත්‍ර සම්බන්ධයෙන් ක්‍රියා කරන බව හෝ ක්‍රියා කර තිබූ බව,

විශ්වාස කිරීමට යුක්ති සහගත හේතු ඇති යම් තැනැත්තකුගෙන්, ඒ කොටස්වල හෝ සෑම පත්‍රවල වර්තමාන හෝ අතීත සම්බන්ධතාවන් පිළිබඳව ඒ තැනැත්තා විසින් ලබාගෙන ඇති හෝ ඒ තැනැත්තා විසින් ලබා ගැනීම යුක්ති සහගත ලෙස බලාපොරොත්තු විය හැකි තොරතුරු කිසිවක් සහ සම්බන්ධතාවක් ඇති තැනැත්තන් හෝ සහ කොටස් හෝ සෑම පත්‍ර සම්බන්ධයෙන් ඔවුන් වෙනුවෙන් ක්‍රියා කරන හෝ ක්‍රියා කර තිබූ තැනැත්තන්ගේ නම් සහ ලිපිනයන් රෙජිස්ට්‍රාර්වරයා වෙත සපයන ලෙස ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

(2) යම් තැනැත්තකුට කොටසක් හෝ සෘණ පත්‍රයක් හෝ එහි යම් සම්බන්ධතාවක් අත්කර ගැනීමට හෝ බැහැර කිරීමට හෝ ඒ සම්බන්ධයෙන් ඡන්දය දීමට හෝ යම් අයිතිවාසිකමක් ඇත්නම්, හෝ එහි ලා සම්බන්ධතාවක් ඇති වෙනත් තැනැත්තන්ගේ අයිතිවාසිකම් කිසිවක් ක්‍රියාත්මක කිරීමට ඒ තැනැත්තාට කැමැත්ත අවශ්‍ය වන්නේ නම්, නැතහොත් ඒ තැනැත්තාගේ උපදෙස්වලට අනුකූලව එහි ලා සම්බන්ධතාවක් ඇති වෙනත් තැනැත්තන්ගේ අයිතිවාසිකම් ක්‍රියාත්මක කරන ලෙස ඒ වෙනත් තැනැත්තන්ගෙන් ඉල්ලා සිටිය හැකි නම් හෝ එසේ ක්‍රියාත්මක කිරීමට ඒ වෙනත් තැනැත්තන් පුරුදුව සිටී නම් ඒ තැනැත්තා ඒ කොටස්වල හෝ සෘණ පත්‍රවල සම්බන්ධතාවක් ඇති තැනැත්තකු ලෙස, මේ වගන්තියේ කාර්ය සඳහා, සලකනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ තමාගෙන් ඉල්ලා සිටිනු ලබන තොරතුරු සැපයීම පැහැර හරින හෝ එවැනි යම් තොරතුරක් සැපයීමේ දී යම් වැදගත් තොරතුරක් සම්බන්ධයෙන් අසත්‍ය බව තමා දන්නා යම් ප්‍රකාශයක් කරන හෝ නොසැලකිලිමත් ලෙස යම් වැදගත් තොරතුරක් සම්බන්ධයෙන් අසත්‍ය වන යම් ප්‍රකාශයක් කරන යම් තැනැත්තකු වරදක් කරන අතර, වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දස ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු පහක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

**182**. (1) 180 වන වගන්තියේ හෝ 181 වන වගන්තියේ විධිවිධාන යටතේ වූ විමර්ශනයක් සම්බන්ධයෙන්, (නිකුත් කරන ලද හෝ නිකුත් කිරීමට ඇති හෝ වුවද) යම් කොටස් පිළිබඳ අදාළ කරුණු සොයා ගැනීමෙහි ලා, දුෂ්කරතාවක් ඇති බව ද, ඒ දුෂ්කරතාව මුළුමනින් ම හෝ ප්‍රධාන වශයෙන්, අදාළ තැනැත්තන් හෝ ඔවුන් අතුරෙන් යම් තැනැත්තකු විසින් රෙජිස්ට්‍රාර්වරයා විසින්, නියම කරන ලද ආකාරයට විමර්ශනයෙහි ලා සහාය වීමට දක්වන නොකැමැත්ත නිසා බව ද රෙජිස්ට්‍රාර්වරයාට පෙනී යන අවස්ථාවක රෙජිස්ට්‍රාර්වරයා විසින් නියමයක් කිරීමෙන්, ඒ කොටස් වැඩිදුරටත් නියමයක් කරන තෙක් මේ වගන්තියෙන් නියම කර ඇති පරිසීමාවලට යටත් විය යුතු යයි විධාන කරනු ලැබිය හැකි ය.

කොටස් හෝ සෘණ පත්‍ර මත පරිසීමා නියම කිරීමට ඇති බලය.

(2) කොටස් කිසිවක් මේ වගන්තියෙන් නියම කර ඇති පරිසීමාවලට යටත් විය යුතු යයි විධාන කර ඇති තාක් කල්—

(අ) ඒ කොටස්වල පැවරීමක් හෝ නිකුත් නොකරන ලද කොටස් සම්බන්ධයෙන් වන විට, ඒ කොටස් සමඟ නිකුත් කිරීමට ඇති අයිතිවාසිකම පිළිබඳ යම් පැවරීමක් හෝ ඒ කොටස් නිකුත් කිරීමක් ශූන්‍ය විය යුතු ය ;

(ආ) ඒ කොටස් සම්බන්ධයෙන් ඡන්දය දීමේ අයිතිවාසිකම් ක්‍රියාත්මක කළ නොහැකි විය යුතු ය;

(ඇ) ඒ කොටස්වල අයිතිවාසිකම් වෙනුවෙන් හෝ ඒ කොටස් දරන්නාට කරන ලද යම් අර්පණයක් අනුව හෝ වැඩිදුර කොටස් නිකුත් කරනු නොලැබිය යුතු ය;

(ඈ) ඈවරකිරීමක දී හැර, ඒ කොටස් සම්බන්ධයෙන්, ප්‍රාග්ධනය වෙනුවෙන් හෝ අන්‍යාකාරයකින් හෝ සමාගමෙන් අයවීමට ඇති යම් මුදල් මත කිසිම ගෙවීමක් කරනු නොලැබිය යුතු ය.

(3) රෙජිස්ට්‍රාර්වරයා විසින් (2) වන උපවගන්තියේ දක්වා ඇති පරිසීමාකිරීම්වලට කොටස් යටත් විය යුතු බවට විධාන කරමින් නියමයක් කරන හෝ කොටස ඒ පරිසීමාවලට යටත්වීම අවසාන විය යුතු බවට නියමයක් කිරීම ප්‍රතික්ෂේප කරන අවස්ථාවක, ඒ නියමයෙන් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් 472 වන වගන්තිය යටතේ ඒ නියමයට විරුද්ධව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. කොටස් ඒ සීමාකිරීම්වලට යටත් වීම අවසාන විය යුතු බවට විධාන කිරීම සුදුසු යයි අභියාචනාධිකරණය කල්පනා කරන්නේ නම්, අභියාචනාධිකරණය විසින් එසේ විධාන කළ හැකි ය.

(4) කොටස් (2) වන උපවගන්තියෙහි දක්වා ඇති සීමාකිරීම්වලට යටත්වීම නතර විය යුතු බවට විධාන කරමින් ඒ කොටස් පැවරීමකට අවසරදීමේ අදහස ඇතිව ප්‍රකාශිත වූ රෙජිස්ට්‍රාර්වරයා හෝ අභියාචනාධිකරණය විසින් කරනු ලබන යම් නියමයකින්, (2) වන උපවගන්තියේ (ඇ) සහ (ඈ) ඡේදවල නිශ්චිතව සඳහන් පරිසීමා, ඒ පැවරීමට පෙර අත්කර ගන්නා ලද යම් අයිතිවාසිකමකට හෝ ඉදිරිපත් කරන ලද අර්පණයකට අදාළ වනතාක් දුරට, මුළුමණින් ම හෝ කොටසක් වශයෙන් එකී ඡේදවල සඳහන් සීමාකිරීම් දිගට ම පවත්වා ගෙන යනු ලැබිය හැකි ය.

(5) (අ) තමාගේ දැනුම අනුව තත් කාලයෙහි (2) වන උපවගන්තියෙහි නිශ්චිත සීමාකිරීම්වලට යටත් යම් කොටස් හෝ එවැනි යම් කොටස් සමග නිකුත් කිරීමට ඇති යම් අයිතිවාසිකමක් බැහැර කිරීම පිණිස යම් අයිතිවාසිකමක් ක්‍රියාත්මක කරන හෝ එසේ ක්‍රියාත්මක කරන බවට උද්දේශිත ; හෝ

(ආ) එවැනි යම් කොටස් සම්බන්ධයෙන්, කොටස් දරන්නා හෝ ප්‍රතියුක්තයකු වශයෙන් ඡන්දය දෙන හෝ ඒ වෙනුවෙන් ඡන්දය දීමට ප්‍රතියුක්තකයකු පත් කරන ; හෝ

(ඇ) එවැනි යම් කොටස් දරන්නකුව සිටිමින්, ඒ කොටස් පරිසීමාවලට යටත් යයි දන්නා බව තමා නොදන්නා, එහෙත් ඒ සීමාකිරීම්වලින් තොරව ඒ කොටස් දරන්නා වශයෙන් වුව ද නැතහොත් ප්‍රතියුක්තකයකු වශයෙන් වුව ද ඒ කොටස් සම්බන්ධයෙන් ඡන්දය දීමට අයිතිවාසිකම් ඇති බව දන්නා යම් තැනැත්තකුට දැන්වීම පැහැර හරින,

යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

(6) යම් සමාගමක කොටස් (2) වන උපවගන්තියෙහි සඳහන් පරිසීමා කඩ කරමින් නිකුත් කරනු ලැබූ අවස්ථාවක—

(අ) සමාගම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූවිට රුපියල් දෙලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය ; තව ද

(ආ) පැහැර හැරීම කරන ලද සමාගමේ සෑම නිලධරයකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(7) රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ ඔහුගේ කැමැත්ත ඇතිව හෝ හැර, මේ වගන්තිය යටතේ නඩු පැවරීමක් කරනු නොලැබිය යුතු ය.

(8) මේ වගන්තියේ විධිවිධාන, කොටස් සම්බන්ධයෙන් අදාළ වන ආකාරයට ම, සෑණ පත්‍ර සම්බන්ධයෙන් ද අදාළ විය යුතු ය.

**183**. යම් සමාගමක වත්කම් හා බැරකම් සත්‍යායනය කිරීමට රෙජිස්ට්‍රාර්වරයාට බලය තිබිය යුතු ය. වත්කම් හා බැරකම් සත්‍යායනය කිරීමට රෙජිස්ට්‍රාර්වරයාට ඇති බලය.

## කළමනාකරණය පිළිබඳ බලතල

සමාගම කළමනාකරණය කිරීම.

**184**. සමාගමක ව්‍යවස්ථාවලියේ අන්තර්ගත විධිවිධානවලට යටත්ව—

(අ) සමාගමක ව්‍යාපාර කටයුතු සහ කටයුතු, සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හෝ එහි විධානය හෝ අධීක්ෂණය යටතේ කළමනාකරණය කළ යුතු ය ;

(ආ) සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලයට සමාගමේ ව්‍යාපාර කටයුතු සහ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ එම කටයුතු කළමනාකරණය කිරීම සඳහා විධානය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය බලතල තිබිය යුතු ය.

ප්‍රධාන ගණුදෙනු.

**185**. (1) යම් ප්‍රධාන ගණුදෙනුවක්—

(අ) විශේෂ යෝජනා සම්මතයක් මගින් අනුමත කරනු ලැබ ඇත්නම් මිස ;

(ආ) යෝජනා සම්මතයක් මගින් අනුමත කිරීම සම්භාව්‍ය වී ඇත්නම් මිස ;

(ඇ) සමාගමේ කොටස් හිමියන් සියලු දෙනා ම විසින් ලිඛිතව අනුමත කරනු ලැබ ඇත්නම් මිස ; හෝ

(ඈ) සමාගම සංස්ථාගත කරනු ලැබූ අවස්ථාවේ දී සමාගමේ ව්‍යවස්ථාවලියෙහි වූ විධිවිධානයක් මගින් ඒ ව්‍යවස්ථාවලියෙහි ඇතුළත් කරනු ලැබූ සමාගමට ඇතුළත් වීමට ප්‍රකාශිතව ම බලය දෙන ලද ගණුදෙනුවක් නම් මිස,

සමාගමක් විසින් යම් ප්‍රධාන ගණුදෙනුවකට ඇතුළත් නොවිය යුතු ය.

(2) මේ වගන්තියෙහි—

“වත්කම්” යන යෙදුමට, ද්‍රව්‍යමය වුව ද, අද්‍රව්‍යමය වුව ද කවර හෝ වර්ගයක දේපළ ඇතුළත් වේ ;

"ප්‍රධාන ගණුදෙනුවක්" යන යෙදුමෙන්—

(අ) අත්කර ගැනීමට පෙර සමාගමේ වත්කම්වල වටිනාකමින් භාගයකට වඩා වැඩි වටිනාකමකින් යුත් සම්භාව්‍ය හෝ සම්භාව්‍ය නොවූ වත්කම්, අත්කර ගැනීම හෝ අත්කර ගැනීම සඳහා වූ ගිවිසුමක් ;

(ආ) සම්භාව්‍ය වූ හෝ සම්භාව්‍ය නොවූ සමාගමේ වත්කම් සියල්ලම හෝ වටිනාකමින් භාගයකට වඩා වූ වත්කම් බැහැර කිරීම හෝ බැහැර කිරීම සඳහා වූ ගිවිසුමක් ;

(ඇ) අත්කර ගැනීමට පෙර සමාගමේ වත්කම්වල වටිනාකමින් භාගයකට වඩා වැඩි වටිනාකමකින් යුත් අයිතිවාසිකම් හෝ සම්බන්ධතා සමාගම විසින් අත්කර ගැනීමේ නැතහොත් සමාගම විසින් බැඳීම් හෝ වගකීම් දැරීමේ බලපෑම ඇති හෝ බලපෑම ඇති වීමට ඉඩ ඇති ගණුදෙනුවක් : හෝ

(ඈ) සමාගම විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර කටයුතුවල ස්වභාවය සාරානුකූලව වෙනස් කිරීමේ අරමුණ හෝ බලපෑම ඇති ගණුදෙනුවක් හෝ සම්බන්ධ ගණුදෙනු මාලාවක්,

අදහස් වේ.

(3) මේ වගන්තියෙහි ඇතුළත් කිසිවක්—

(අ) සමාගමේ දේපළ සියල්ල ම හෝ එහි යම් කොටසක් විෂයෙහි සමාගමක් විසින් අස්ථිර බැඳීමක් දෙන්නේ හෝ දීමට එකඟ වන්නේ යම් ගණුදෙනුවක් යටතේ ද ඒ ගණුදෙනුව ;

(ආ) සමාගමේ දේපළ සියල්ල ම හෝ එහි කොටසක් විෂයෙහි අස්ථිර බැඳීමක් ඇති කරන සාධන පත්‍රයක් ප්‍රකාරව පත් කරනු ලැබූ දේපළ භාරගන්නකු විසින් ඇතුළත් වන ලද ගණුදෙනුවක් ;

(ඇ) සමාගමක අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ ඈවරකරුවකු විසින් ඇතුළත් වන කරන ලද ගණුදෙනුවක්,

සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

බලතල පවරා දීම.

**186**. (1) සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ විධිවිධානවල ඇතුළත් යම් යම් සීමාකිරීම්වලට යටත්ව, හයවන උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති මේ පනතේ වගන්තිවලින් යම් වගන්තියක් යටතේ වූ සමාගමේ බලතල හැර, සමාගමේ බලතලවලින් යම් බලයක් හෝ බලතල වැඩි ගණනක් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂවරයන් කමිටුවකට, සමාගමේ අධ්‍යක්ෂවරයකුට හෝ සේවා නියුක්තයකුට හෝ වෙනත් යම් තැනැත්තකුට පවරා දෙනු ලැබිය හැකි ය.

(2) (අ) බලතල පවරාදීමට පෙර ඒ බලතල, මේ පනතින් හා සමාගමේ ව්‍යවස්ථාවලියෙන් අධ්‍යක්ෂවරයන් වෙත නියම කරන ලද කාර්යයන්ට අනුකූලව පවරාදෙන ලද තැනැත්තා විසින් ක්‍රියාත්මක නොකරනු ඇතැයි විශ්වාස කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට හේතු ඇති ; හෝ

(ආ) පවරා දෙන ලද තැනැත්තා විසින් ඒ බලතල ක්‍රියාත්මක කිරීම නිසි පරිදි භාවිත කරනු ලැබූ යුක්තිසහගත ක්‍රම මගින් නියාමනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අපොහොසත් වී ඇති,

අවස්ථාවක, (1) වන උපවගන්තිය යටතේ බලතල පවරන අධ්‍යක්ෂ මණ්ඩලයක්, ඒ බලතල අධ්‍යක්ෂ මණ්ඩලය විසින්ම ක්‍රියාත්මක කරන බලතල වුවාක් මෙන් ඒ පවරා දෙන ලෙස තැනැත්තා විසින් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වග කිව යුතු ය.

## අධ්‍යක්ෂවරයන්ගේ කාර්යය

සද්භාවයෙන් සහ සමාගමේ සම්බන්ධතා උදෙසා ක්‍රියා කිරීම අධ්‍යක්ෂවරයන්ගේ යුතුකම් බව.

**187**. (1) සමාගමක අධ්‍යක්ෂවරයකු වශයෙන් බලතල ක්‍රියාත්මක කරන හෝ කාර්ය ඉටු කරන තැනැත්තකු සද්භාවයෙන් ද, සහ (2) වන උපවගන්තියට යටත්ව, සමාගමේ සම්බන්ධතා උදෙසා යයි ඒ තැනැත්තා විශ්වාස කරන ආකාරයට ද, ක්‍රියා කළ යුතු ය.

(2) වෙනත් සමාගමකට සම්පූර්ණයෙන් ම අයත් පාලිත සමාගමක් වන සමාගමක අධ්‍යක්ෂවරයකු විසින්, ඒ වෙනත් සමාගමේ සම්බන්ධතා උදෙසා යයි තමා විශ්වාස කරන ආකාරයකින් ක්‍රියා කිරීමට සමාගමේ ව්‍යවස්ථාවලිය මගින් ප්‍රකාශිතව ම ඒ අධ්‍යක්ෂවරයාට අවසර දෙනු ලැබ ඇත්නම්, ඒ ක්‍රියාව තමා අධ්‍යක්ෂවරයකු වන සමාගමේ සම්බන්ධතා උදෙසා නොවුව ද, එසේ ක්‍රියා කළ හැකි ය.

**188**. මේ පනතේ යම් විධිවිධානයක් හෝ සමාගමේ ව්‍යවස්ථාවලියේ ඇතුළත් යම් විධිවිධානයක් උල්ලංඝනය වන ආකාරයකින් සමාගමක අධ්‍යක්ෂවරයකු ක්‍රියා නොකළ යුතු ය ; නැතහොත් සමාගම විසින් එසේ ක්‍රියා කිරීමෙහි ලා එකඟ නොවිය යුතු ය.

අධ්‍යක්ෂවරයන් විසින් පනත සහ සමාගමේ ව්‍යවස්ථාවලිය අනුව ක්‍රියා කළ යුතු බව.

**189**. සමාගමක අධ්‍යක්ෂවරයකු වශයෙන් බලතල ක්‍රියාත්මක කරන හෝ කාර්යය ඉටු කරන තැනැත්තකු විසින්—

අධ්‍යක්ෂවරයකුගේ සැලකිලිමත් වීමේ ප්‍රමිතිය.

(අ) අනවධානයෙන් හෝ බරපතල ලෙස නොසැලකිලිමත් අන්දමින් ක්‍රියා නොකළ යුතු ය ; සහ

(ආ) ස්වකීය දැනුම හා පළපුරුද්ද ඇති තැනැත්තකුගෙන් යුක්තිසහගත ලෙස බලාපොරොත්තු විය හැකි නිපුනතාවේ හා සැලකිලිමත් භාවයේ ප්‍රමාණය විදහා දැක්විය යුතු ය.

**190**. (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව පහත දැක්වෙන තැනැත්තන් අතුරෙන් යම් තැනැත්තකු, එනම් :—

තොරතුරු හා උපදෙස් ප්‍රයෝජනයට ගැනීම.

(අ) සමාගමේ සේවානියුක්තයකු ;

(ආ) ඒ තැනැත්තාගේ වෘත්තීයමය හෝ විශේෂඥ නිපුනත්වය පිළිබඳ ක්ෂේත්‍රය ඇතුළත පවත්නා බවට අධ්‍යක්ෂවරයා විශ්වාස කරන කාරණයකට අදාළව, වෘත්තීයමය උපදේශකයකු හෝ විශේෂඥයකු ;

(ඇ) යම් අධ්‍යක්ෂවරයකු හෝ අධ්‍යක්ෂ කමිටුවක් විසින් ඒ අධ්‍යක්ෂවරයාගේ හෝ අධ්‍යක්ෂ කමිටුවේ නිර්දිෂ්ට බලය ඇතුළත වූ කාරණාවලට අදාළව සේවය නොකරන ලද්දේ ද, එවැනි වෙනත් යම් අධ්‍යක්ෂවරයකු හෝ අධ්‍යක්ෂ කමිටුවක්,

විසින් සකස් කරන ලද හෝ සපයන ලද වාර්තා, ප්‍රකාශ සහ මූල්‍යමය දත්ත හා වෙනත් තොරතුරු මත සහ දෙන ලද වෘත්තීයමය හෝ විශේෂඥ උපදෙස් මත විශ්වාසය තබනු ලැබිය හැකි ය.

(2) යම් අධ්‍යක්ෂවරයෙක්—

(අ) සද්භාවයෙන් ක්‍රියා කරන්නේ නම් ;

(ආ) අවස්ථාගත කරුණු අනුව, පරීක්ෂණයක අවශ්‍යතාව පෙන්නුම් කරන අවස්ථාවක, නිසි පරිදි වූ පරීක්ෂණයක් පවත්වන්නේ නම් ; සහ

(ඇ) එවැනි විශ්වාසයක් තැබීම අවශ්‍ය නොවන බව දැන නොසිටියේ නම්,

හා එසේ නම් පමණක්, (1) වන උපවගන්තියේ විධිවිධාන ඒ අධ්‍යක්ෂවරයාට අදාළ නොවිය යුතු ය.

3. මේ පනතේ අන්තර්ගත විධිවිධාන, සමාගමක අධ්‍යක්ෂවරුන්ගේ හෝ නිලධරයන්ගේ කාර්ය භාරයට හෝ වගකීමට අදාළ වෙනත් යම් නීතියක අන්තර්ගත විධිවිධානවලට අමතරව වන අතර ඒවා මගින් එකී නීතියේ අන්තර්ගත විධිවිධානවල බලය අඩු කිරීමක් නොවන්නේ ය.

### අධ්‍යක්ෂවරයකුට සම්බන්ධතාවක් ඇති ගණුදෙනු

"සම්බන්ධතාවක්" යන්නෙහි අර්ථය.

**191.** (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව මේ පනතේ කාර්යය සඳහා, සමාගමක අධ්‍යක්ෂවරයකු—

(අ) යම් ගණුදෙනුවකට පාර්ශ්වකරුවකු වන්නේ නම් හෝ ඒ ගණුදෙනුවෙන් අදාළ මූල්‍ය ප්‍රතිලාභයන් ලබන්නේ නම් හෝ ලැබිය හැකි නම් ;

(ආ) ඒ ගණුදෙනුවේ වෙනත් පාර්ශ්වකරුවකු සමග අදාළ මූල්‍ය සම්බන්ධතාවක් ඒ අධ්‍යක්ෂවරයාට ඇත්නම් ;

(ඇ) ගණුදෙනුවේ වෙනත් පාර්ශ්වකරුවකුගේ අධ්‍යක්ෂවරයකු, නිලධරයකු හෝ භාරකරුවකු වන්නේ නම් නැතහොත් ගණුදෙනුවෙන් අදාළ මූල්‍ය ප්‍රතිලාභයක් ලැබිය හැකි තැනැත්තකු වන්නේ නම්, එහෙත්—

(i) සමාගමේ පාලක සමාගම, සමාගම මුළුමනින් ම අයත් පාලිත සමාගමක පාලක සමාගමක් වන සමාගමේ පාලක සමාගමක් ;

(ii) සමාගමට මුළුමනින් ම අයත් පාලිත සමාගමක් ; හෝ

(iii) සමාගමක් පාලක සමාගමක මුළුමනින් ම අයත් පාලිත සමාගමක් ද වන, පාලක සමාගමේ මුළුමනින් ම අයත් පාලිත සමාගමක්ම,

නොවන, පාර්ශ්වකරුවකු හෝ තැනැත්තකු වන්නේ නම් :

(ඈ) ගණුදෙනුවේ වෙනත් පාර්ශ්වකරුවකුගේ දෙමව්පියන්ගෙන් කෙනකු, දරුවකු හෝ කලත්‍රයකු වන්නේ නම් නැතහොත් ගණුදෙනුවෙන් අදාළ මූල්‍ය ප්‍රතිලාභ ලබන හෝ ලැබිය හැකි තැනැත්තකු වන්නේ නම් ; හෝ

(ඉ) ගණුදෙනුව හා සෘජුව හෝ වක්‍රාකාරයකින් ඒ අධ්‍යක්ෂවරයාට සෑහෙන පමණින් සම්බන්ධතාවක් ඇත්නම්,

සහ ඇත්නම් පමණක්, සමාගම පාර්ශ්වකරුවකු වන එවැනි ගණුදෙනුවකට ඒ අධ්‍යක්ෂවරයාගේ සම්බන්ධතාවක් ඇත්තේ ය.

(2) සමාගම පාර්ශ්වකරුවකු වන්නා වූ ගණුදෙනුවක්, ඒ ගණුදෙනුව, ඇපකරයක්, හානිපූරණයක් හෝ ඇපයක් තැන්පත් කිරීමෙන් හෝ වගකීම සම්පූර්ණයෙන්ම හෝ කොටසක් සඳහා අධ්‍යක්ෂවරයා හෝ වෙනත් තැනැත්තකු විසින් පෞද්ගලිකව භාර ගෙන ඇති සමාගමේ ණයක් හෝ බැඳීමක් සම්බන්ධයෙන් තුන්වන පාර්ශ්වකරුවකුගේ ඉල්ලීම පිට අධ්‍යක්ෂවරයාගේ කිසිම සම්බන්ධතාවක් නොමැතිව තුන්වන පාර්ශ්වකරුවකුට සමාගම විසින් ඇපයක් ලබා දීමෙන් පමණක් සංයුක්ත වන්නේ නම්, සමාගමේ අධ්‍යක්ෂවරයකු ඒ ගණුදෙනුව විෂයයෙහි සම්බන්ධතාවක් නොමැති ලෙස සලකනු ලැබිය යුතු ය.

**192**. (1) යම් සමාගමක් සමග කරනු ලබන හෝ කරනු ලැබීමට යෝජිත හෝ ගණුදෙනුවක් සම්බන්ධයෙන් තමාට සම්බන්ධතාවක් ඇති බව ඒ සමාගමේ අධ්‍යක්ෂවරයකුට දැන ගැනීමට ලැබුණු වහාම, ඔහු විසින් ඒ බව සම්බන්ධතා පිළිබඳ ලේඛනයේ ඇතුළත් කිරීමට කටයුතු සැලැස්විය යුතු අතර, ඒ සමාගමේ එක් අධ්‍යක්ෂවරයකුට වැඩි අධ්‍යක්ෂවරයන් සංඛ්‍යාවක් සිටිත් නම්, තම සම්බන්ධතාවේ ස්වභාවය සහ ප්‍රමාණය ඒ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අනාවරණය කළ යුතු ය. සම්බන්ධතා අනාවරණය කිරීම.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා, යම් අධ්‍යක්ෂවරයකු, වෙනත් නම් කළ සමාගමක හෝ වෙනත් තැනැත්තකුගේ හෝ කොටස් හිමියකු, අධ්‍යක්ෂවරයකු, නිලධරයකු හෝ භාරකරුවකු බවට නැතහොත් එසේ නම් කළ සමාගමක් හෝ තැනැත්තකු හෝ සමහ අන්‍යාකාරයෙන් සම්බන්ධතා දරන බවට සහ, ඇතුළත් කරන ලද හෝ අනාවරණය කරන ලද දිනයට පසු ඒ වෙනත් සමාගම හෝ තැනැත්තා හෝ සමග ඇතුළත් වනු ලැබිය හැකි යම් ගණුදෙනුවකට සම්බන්ධතාවක් ඇතැයි සලකනු ලැබිය යුතු බව සඳහන් කරමින් සම්බන්ධතා පිළිබඳ ලේඛනයේ ඇතුළත් කරන ලද සාමාන්‍ය දැන්වීමක් හෝ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කරන ලද අනාවරණය කිරීමක්, ඒ සමාගම හෝ තැනැත්තා හෝ සමග ඇති යම් ගණුදෙනුවක් සම්බන්ධයෙන් වූ සම්බන්ධතාව ප්‍රමාණවත් ලෙස අනාවරණය කිරීමක් වන්නේ ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් අවශ්‍යතා අනුව ක්‍රියා කිරීම අධ්‍යක්ෂවරයකු විසින් පැහැර හැරීම, සමාගම හෝ අධ්‍යක්ෂවරයා හෝ විසින් එළඹෙන ලද යම් ගණුදෙනුවක වලංගු භාවය කෙරෙහි බල නොපැවැත්විය යුතු ය.

(4)(1) වන උපවගන්තියේ අවශ්‍යතා අනුව ක්‍රියා කිරීම පැහැර හරින සෑම අධ්‍යක්ෂවරයකු ම, වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙලක්ෂයක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

ගණුදෙනු වැළැක්වීම.

**193**. (1) සමාගමේ අධ්‍යක්ෂවරයකුට සම්බන්ධතාවක් ඇති යම් ගණුදෙනුවකට ඒ සමාගම ඇතුළත් වී ඇති විටක, ඒ ගණුදෙනුවට ඇතුළත් වීමෙන් පසු සහ ඒ ගණුදෙනුව සම්බන්ධයෙන් ඒ අධ්‍යක්ෂවරයාගේ සම්බන්ධතාව (සමාගමේ වාර්ෂික වාර්තාව මගින් හෝ අන්‍යාකාරයකින්) සියලු ම කොටස් හිමියන්ට අනාවරණය කිරීමෙන් පසු මාස හයක් ඉකුත්වීමට පෙර ඒ ගණුදෙනුව ඒ සමාගම විසින් වළක්වාලනු ලැබිය හැකි ය.

(2) යම් ගණුදෙනුවක් යටතේ සාධාරණ වටිනාකම සමාගමට ලැබී තිබේ නම්, මේ වගන්තිය යටතේ ඒ ගණුදෙනුව වළක්වාලනු නොලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ කාර්යය සඳහා යම් ගණුදෙනුවක් යටතේ සමාගමකට සාධාරණ වටිනාකම ලැබුනේ ද යන ප්‍රශ්නය, ඒ ගණුදෙනුවට ඇතුළත් වන අවස්ථාවේ දී ඒ සමාගමට සහ සම්බන්ධතාවක් ඇති අධ්‍යක්ෂවරයාට දැනගැනීමට ලැබී තිබුණු තොරතුරු පදනම් කර ගෙන නිශ්චය කරනු ලැබිය යුතු ය.

(4) සමාගමක සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු කරගෙන යාමේ දී සහ සමාගම විසින් සාමාන්‍යයෙන් අනුගමනය කරනු ලබන නියම හා කොන්දේසි මත යම් ගණුදෙනුවකට සමාගම ඇතුළත් වී ඇත්නම්, ඒ ගණුදෙනුව යටතේ සාධාරණ වටිනාකම ඒ සමාගමට ලැබී ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තියේ කාර්යය සඳහා—

(අ) සාධාරණ වටිනාකම ඔප්පු කිරීමේ කාර්යය ගණුදෙනුවක් අනුමත කිරීමට අපේක්ෂා කරන්නා වූ ද, ගණුදෙනුවට ඇතුළත් වන අවස්ථාවේ දී අධ්‍යක්ෂවරයාගේ සම්බන්ධතාව පිළිබඳව දැන සිටියා වූ හෝ දැන සිටිය යුතු වූ ද, තැනැත්තකු වෙත පැවරෙන්නේ ය ; තව ද

(ආ) වෙනත් කවර වුව ද අවස්ථාවක දී, සාධාරණ වටිනාකම එයට නොලැබුනු බව ඔප්පු කිරීමේ භාරය සමාගම වෙත පැවරෙන්නේ ය.

(6) අධ්‍යක්ෂවරයකුගේ සම්බන්ධතාවක් ඇති ගණුදෙනුවක්, මේ වගන්තිය ප්‍රකාර හෝ සමාගමේ ව්‍යවස්ථාවලියට අනුකූලව හෝ හැර ඒ අධ්‍යක්ෂවරයාගේ සම්බන්ධතා ව මත නොවැළැක්විය යුතු ය.

**194**. යම් තැනැත්තකු විසින්— පාර්ශ්වකරුවන් කෙරෙහි බලපෑම.

(අ) සමාගම නොවන යම් තැනැත්තකුගෙන් ;

(ආ) අගනා ප්‍රතිෂ්ඨාවක් මත ; සහ

(ඇ) ගණුදෙනුව අවලංගු කළ හැකි පරිවේෂණ පිළිබඳව දැනුම් දීම නොමැතිව, සද්භාවයෙන්,

යම් දේපළක් අත් කර ගෙන තිබේ නම්, 193 වන වගන්තිය යටතේ ගණුදෙනුවක් නොවැළැක්වීම ඒ දේපළ සම්බන්ධයෙන් හෝ ඒ දේපළ විෂයයෙහි හෝ ඒ තැනැත්තා සතු හිමිකම හෝ සම්බන්ධතාව හෝ කෙරෙහි, බල නොපැවැත්විය යුතු ය.

**195**. 192 වන සහ 193 වන වගන්තිවල ඇතුළත් කිසිවක්— ඇතැම් අවස්ථාවල දී 192 සහ 193 වන වගන්ති අදාළ නොවන බව.

(අ) 216 වන වගන්තියට අනුකූලව අධ්‍යක්ෂවරයකුට දෙන ලද පාරිශ්‍රමික හෝ වෙනත් යම් ප්‍රතිලාභයක් ; හෝ

(ආ) 218 වන වගන්තියට අනුකූලව දෙනු ලැබූ වන්දියක් හෝ සපයනු ලැබූ රක්ෂණයක්,

සම්බන්ධයෙන් අදාළ නොවන්නේ ය.

**196**. සමාගම ඇතුළත් වී ඇති හෝ ඇතුළත්වීමට සමාගම බලාපොරොත්තු වන හෝ ගණුදෙනුවකට සම්බන්ධතාවක් ඇති ඒ සමාගමේ අධ්‍යක්ෂවරයකු විසින්, ඒ සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ ඇතුළත් විධිවිධානවලට යටත්ව, තමා ඒ ගණුදෙනුවට සම්බන්ධතාවක් නොමැති පාර්ශ්වකරුවකු පරිද්දෙන්,— සම්බන්ධතාවක් ඇති අධ්‍යක්ෂවරයකු විසින් ඡන්දය පාවිච්චි කරනු ලැබිය හැකි බව.

(අ) ඒ ගණුදෙනුවට අදාළ යම් කාරණයක දී ඡන්දය පාවිච්චි කරනු ලැබිය හැකි ය ;

(ආ) ඒ ගණුදෙනුවට අදාළ කාරණයක් උද්ගත වන්නා වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකට පැමිණ සිටිය හැකි අතර ගණපූරණයක් කිරීමේ කාර්යය සඳහා රැස්වීමට පැමිණ සිටි අධ්‍යක්ෂවරයන් අතරට, තම නම ඇතුළත් කරනු ලැබිය හැකි ය ;

(ඇ) ඒ ගණුදෙනුවට අදාළ ලේඛනයකට සමාගම වෙනුවෙන් අත්සන් කරනු ලැබිය හැකි ය ; සහ

(ඈ) අධ්‍යක්ෂවරයකු වශයෙන් ස්වකීය තත්ත්වයෙන් ඒ ගණුදෙනුව සම්බන්ධයෙන් වෙනත් යම් දෙයක් කරනු ලැබිය හැකි ය.

සමාගම සතු තොරතුරු ප්‍රයෝජනයට ගැනීම.

**197**. (1) යම් සමාගමක අධ්‍යක්ෂවරයකු හෝ සේවා නියුක්තයකු හෝ වශයෙන් වූ ස්වකීය තත්ත්වයෙන් තමා සතුව ඇත්තා වූ ද, එසේ නොවන්නට තමන්ට ලබා ගත නො හැකි වූ ද, තොරතුරු තමා සතුව ඇති අධ්‍යක්ෂවරයකු විසින්—

(අ) සමාගමේ කාර්යය සඳහා ;

(ආ) නීතියෙන් නියම කොට ඇති පරිදි ;

(ඇ) (2) වන උපවගන්තියට අනුකූලව ; හෝ

(ඈ) සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියෙන් ඒ අධ්‍යක්ෂකවරයාට බලය දී ඇති වෙනත් යම් පරිවේෂණ යටතේ

හැර, ඒ තොරතුරු වෙනත් යම් තැනැත්තකුට අනාවරණය කිරීම හෝ ඒ තොරතුරු ප්‍රයෝජනයට ගැනීම හෝ ඒ තොරතුරු උපයෝගී කරගෙන ක්‍රියා කිරීම හෝ නොකළ යුතු ය.

(2) සමාගමක යම් අධ්‍යක්ෂවරයකු—

(අ) (3) වන උපවගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පළමු කොට ඒ අධ්‍යක්ෂවරයාට පත් කිරීමට බලය දී ඇත්නම් ; සහ

(ආ) තමාට එසේ දෙන ලද බලය පිළිබඳ විස්තර, සම්බන්ධතා පිළිබඳ ලේඛනයෙහි ඇතුළත් කර ඇත්නම්,

ඒ තොරතුරු ඒ අධ්‍යක්ෂවරයා විසින් අනාවරණය කිරීම හෝ ප්‍රයෝජනයට ගැනීම හෝ ඒ තොරතුරු උපයෝගී කර ගෙන ක්‍රියා කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(3) යම් තොරතුරක් අනාවරණය කිරීම, ප්‍රයෝජනයට ගැනීම හෝ එය උපයෝගී කරගෙන ක්‍රියා කිරීම හෝ මගින් සමාගමට අගතියක් නොවිය හැකි බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමට පත් වන්නේ නම්, එසේ කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂවරයකුට බලය දෙනු ලැබිය හැකි ය.

### කොටස් විෂයයෙහි අධ්‍යක්ෂවරයන්ගේ සම්බන්ධතා අනාවරණය කිරීම

"අදාළ සම්බන්ධතාව" යන්නෙහි අර්ථය.

**198**. (1) සමාගමක අධ්‍යක්ෂවරයකු, සමාගමක් විසින් නිකුත් කරන ලද යම් කොටසක් දරන අවස්ථාවක දී, (ඒ අධ්‍යක්ෂවරයා ඒ කොටස දරන්නා ලෙස කොටස් ලේඛනයේ ලියා පදිංචි කර තිබුණ ද, නොතිබුණ ද)—

(අ) ඒ අධ්‍යක්ෂවරයා ඒ කොටසේ ප්‍රතිලාභී අයිතිකරු වේ නම් ;

(ආ) ඒ කොටසට අයත් ඡන්දය දීමේ යම් අයිතියක් ක්‍රියාත්මක කිරීමේ බලය අධ්‍යක්ෂවරයාට තිබේ නම් ;

(ඇ) ඒ කොටසට අයත් ඡන්දය පාවිච්චි කිරීම යම් අයිතිවාසිකමක් පාලනය කිරීමේ බලය ඒ අධ්‍යක්ෂවරයාට තිබේ නම් ;

(ඈ) ඒ කොටස අත්කර ගැනීමට හෝ ඉවත් කිරීමට බලය ඒ අධ්‍යක්ෂවරයාට තිබේ නම් ;

(ඉ) වෙනත් තැනැත්තකු විසින් ඒ කොටස අත්කර ගැනීම හෝ ඉවත් කිරීම හෝ පාලනය කිරීමේ බලය ඒ අධ්‍යක්ෂවරයාට තිබේ නම් ; හෝ

(ඊ) ඒ කොටස හා සම්බන්ධ යම් භාරයක්, ගිවිසුමක්, සැලසුමක්, පිළිවෙළක් හෝ සම්මුතියක් යටතේ හෝ එවැන්නක් ප්‍රකාර (ඒ තැනැත්තා ඊට පාර්ශ්වකරුවකු වූ ව ද, නොවූව ද)—

(i) ඒ කොටස හා සම්බන්ධ ඡන්දය දීමේ අයිතිවාසිකම ක්‍රියාත්මක කිරීමේ බලය කවර හෝ වේලාවක දී තිබේ නම්;

(ii) ඒ කොටස හා සම්බන්ධ ඡන්දය දීමේ අයිතිවාසිකම ක්‍රියාත්මක කිරීම කවර හෝ වේලාවක දී හෝ පාලනය කිරීමේ බලය තිබේ නම්;

(iii) ඒ කොටස අත්කර ගැනීමේ හෝ ඉවත් කිරීමේ හෝ බලය කවර හෝ වේලාවක දී හෝ තිබේ නම්; හෝ

(iv) ඒ කොටස වෙනත් තැනැත්තකු විසින් අත්කර ගැනීම හෝ ඉවත් කිරීම හෝ පාලනය කිරීමේ බලය කවර හෝ වේලාවක දී හෝ තිබේ නම්,

200 වන වගන්තියේ කාර්යය සඳහා, ඒ කොටස සම්බන්ධයෙන් ඒ අධ්‍යක්ෂවරයාට අදාළ සම්බන්ධතාවක් ඇත්තේ ය.

(2) යම් තැනැත්තකුට (සමාගමේ අධ්‍යක්ෂවරයකු වුව ද, නොවුව ද) (1) වන උපවගන්තිය ප්‍රකාර යම් කොටසකට අදාළ සම්බන්ධතාවක් ඇති අවස්ථාවක, සහ—

(අ) (i) ඒ කොටස සම්බන්ධ ඡන්දය පාවිච්චි කිරීමේ අයිතිවාසිකම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන්;

(ii) ඒ කොටසට සම්බන්ධ ඡන්දය පාවිච්චි කිරීමේ අයිතිවාසිකමක් ක්‍රියාත්මක කිරීම පාලනය කිරීම සම්බන්ධයෙන්;

(iii) ඒ කොටස අත්කර ගැනීමට හෝ ඉවත් කිරීම සම්බන්ධයෙන්; හෝ

(iv) වෙනත් තැනැත්තකු විසින් ඒ කොටස අත්කර ගැනීම හෝ ඉවත් කිරීම හෝ පාලනය කිරීමේ බලය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන්,

ඒ සමාගමේ අධ්‍යක්ෂවරකුගේ විධානවලට, උපදෙස්වලට හෝ අපේක්ෂාවලට අනුකූලව ක්‍රියා කිරීමට යට කී තැනැත්තා හෝ එහි අධ්‍යක්ෂවරයන් පුරුදු වී සිටින නැතහොත් නීත්‍යානුකූලව බලාත්මක කළ හැකි හෝ කළ නොහැකි හෝ බැඳීමකට යටත්ව සිටින්නා වූ අවස්ථාවක;

(ආ) ඒ තැනැත්තාගේ කොටස් අතුරෙන් සියයට විස්සකට හෝ ඊට වැඩි ප්‍රමාණයක කොටස්වලට සම්බන්ධ ඡන්දය පාවිච්චි කිරීමේ අයිතිවාසිකම ක්‍රියාත්මක කිරීමට සමාගමේ අධ්‍යක්ෂවරයකුට බලය ඇති අවස්ථාවක;

(ඇ) ඒ තැනැත්තාගේ කොටස් අතුරෙන් සියයට විස්සක හෝ ඊට වැඩි ප්‍රමාණයක කොටස්වලට සම්බන්ධ ඡන්දය පාවිච්චි කිරීමේ අයිතිවාසිකම ක්‍රියාත්මක කිරීම, පාලනය කිරීමේ බලය සමාගමේ අධ්‍යක්ෂවරයකුට ඇති අවස්ථාවක;

(ඈ) ඒ තැනැත්තාගේ කොටස් අතුරෙන් සියයට විස්සක හෝ ඊට වැඩි ප්‍රමාණයක කොටස් අත්කර ගැනීමේ හෝ ඉවත් කිරීමේ බලය සමාගමේ අධ්‍යක්ෂවරයකුට ඇති අවස්ථාවක; හෝ

(ඉ) ඒ තැනැත්තාගේ කොටස් අතුරෙන් සියයට විස්සක හෝ ඊට වැඩි ප්‍රමාණයක කොටස් අත්කර ගැනීම හෝ සම්බන්ධ කිරීම හෝ පාලනය කිරීමට සමාගමේ අධ්‍යක්ෂවරයකුට බලය ඇති අවස්ථාවක,

ඒ අධ්‍යක්ෂවරයාට ඒ කොටස සම්බන්ධයෙන් අදාළ සම්බන්ධතාවක් ඇත්තේ ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) සිට (ඊ) ඡේද තෙක් වූ ඡේදවල සඳහන් බලයක්—

(අ) ප්‍රකාශිත වූ හෝ ව්‍යංජිත වූ ;

(ආ) ඍජු වූ හෝ වක්‍රාකාරයක වූ ;

(ඇ) නීත්‍යානුකූලව ක්‍රියාවෙහි යොදවනු ලැබිය හැකි වූ හෝ නොලැබිය හැකි වූ ;

(ඈ) යම් නිශ්චිත කොටසකට සම්බන්ධ වූ හෝ එසේ නොවූ ;

(ඉ) තහනම් කිරීමකට හෝ සීමාකිරීමකට යටත් වූ නැතහොත් තහනම් කිරීමකට හෝ සීමාකිරීමකට යටත් කරනු ලැබිය හැකි වූ ;

(ඊ) දැනට හෝ අනාගතයේ දී ක්‍රියාත්මක කරනු ලැබිය හැකි වූ;

(උ) යම් කොන්දේසියක් සපුරාලනු ලැබූ විට පමණක් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි වූ ;

(ඌ) තනිවම හෝ වෙනත් යම් තැනැත්තකු නැතහොත් තැනැත්තන් සමඟ එක්ව ක්‍රියාත්මක කරනු ලැබිය හැකි වූ,

බලයක් වුව ද, නොවුව ද ඒ නොතකා, එවැනි බලයක් ඇති හෝ එවැනි බලයක් තිබිය හැකි තැනැත්තකුට ඒ කොටස සම්බන්ධයෙන් අදාළ සම්බන්ධතාවක් ඇත්තේ ය.

(4) වෙනත් තැනැත්තකු හෝ තැනැත්තන් හෝ සමග එක්ව ක්‍රියාත්මක කළ හැකි (1) වන උපවගන්තියෙහි සඳහන් බලයක් ඒ තැනැත්තන්ගෙන් කවර හෝ තැනැත්තකු විසින් හෝ කිසිවකු විසින් හෝ ක්‍රියාත්මක කරනු ලැබිය හැකි යයි සලකනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තියෙහි බලයක් සම්බන්ධයෙන් කර ඇති සඳහනට, නීත්‍යානුකූලව ක්‍රියාවෙහි යොදවනු ලැබිය හැකි හෝ නොලැබිය හැකි හෝ යම් භාරයක්, ගිවිසුමක්, සැලසුමක් හෝ සම්මුතියක් හෝ එයින් යම් කිසිවක් කඩ කිරීමකින් උද්ගත වන හෝ එවැනි කඩ කිරීමක ප්‍රතිඵලයක් වශයෙන් ක්‍රියාත්මක කරනු ලබන බලයක් සම්බන්ධයෙන් කරනු ලබන සඳහනක්, ඇතුළත් වන්නේ ය.

ඇතැම් අවස්ථාවල දී අදාළ සම්බන්ධතා නොසලකා හැරිය යුතු බව.

**199**. (1) 200 වන වගන්තියේ කාර්යය සඳහා, යම් කොටසක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුගේ අදාළ සම්බන්ධතාව ගණින් ගැනීමේ දී,—

(අ) අදාළ සම්බන්ධතාව ඇති තැනැත්තාගේ සාමාන්‍ය ව්‍යාපාරය මුදල් ණයට දීමෙන් හෝ මූල්‍ය සේවා සැපයීමෙන් සංයුක්ත වේ නම් හෝ මුදල් ණයට දීම හෝ මූල්‍ය සේවා සැපයීම ඒ ව්‍යාපාරයට ඇතුළත් වේ නම් නැතහොත් එසේ සංයුක්ත වීම හා ඇතුළත් වීම යන දෙක ම වේ නම් සහ ඒ තැනැත්තා අදාළ සම්බන්ධතාව දරන්නේ ඒ තැනැත්තාගේ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවල දී ඇතුළත් වන ලද ගණුදෙනුවක කාර්යය සඳහා දෙන ලද ඇපයක් වශයෙන් පමණක් වේ නම්;

(ආ) ඒ තැනැත්තා අදාළ සම්බන්ධතාව දරන්නේ වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් ඒ කොටස අත්කර ගැනීම හෝ ඉවත් කිරීම පිණිස ඒ වෙනත් තැනැත්තා වෙනුවෙන් ක්‍රියා කිරීම හේතු කොට ගෙනම පමණක් වේ නම්;

(ඇ) සමාගමේ සාමාජිකයන්ගේ හෝ යම් පන්තියක සාමාජිකයන්ගේ හෝ යම් නිශ්චිත රැස්වීමක දී ප්‍රතියුක්තයකු වශයෙන් ඡන්දය දීමට හුදෙක් තමා පත්කර තිබීම හේතු කොට ගෙන ම අදාළ සම්බන්ධතා ව ඒ තැනැත්තා දරන්නේ නම්;

(ඈ) ඒ තැනැත්තා—

(i) භාරකාර සංස්ථාවක් හෝ නාමික සමාගමක් වන්නේ නම්; සහ

(ii) යම් භාරකාර සංස්ථාවක හෝ නාමික සමාගමක සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවල දී වෙනත් තැනැත්තකු වෙනුවෙන් ක්‍රියා කිරීම හේතු කොට ගෙන ම පමණක් ඒ අදාළ සම්බන්ධතාව දරන්නේ නම්; හෝ

(ඉ) ඒ තැනැත්තා කොටස යටත් වන්නා වූ යම් භාරයක භාරකාරයකු වීම හේතු කොට ගෙන ම පමණක්, ඒ තැනැත්තා අදාළ සම්බන්ධතාව දරන්නේ නම්,

ඒ කොටස සම්බන්ධයෙන් එවැනි තැනැත්තකුගේ අදාළ සම්බන්ධතාව ගණන් ගනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ කාර්ය සඳහා භාරකරුවකු වශයෙන් භාරයේ ආදායමින් හෝ දේපළින් හෝ පාරිශ්‍රමික ලැබීමට හිමිකම තිබීම ගැන නොතකා යම් තැනැත්තකු භාරකරුවකු විය හැකි ය.

අධ්‍යක්ෂවරයන් විසින් කොටස් ගණුදෙනු අනාවරණය කළ යුතු බව.

**200**. (1) (අ) නියමිත දිනයේ දී සමාගමක අධ්‍යක්ෂවරයකුව සිටින්නා වූ ; හෝ

(ආ) ඒ දිනයෙන් පසුව සමාගමක අධ්‍යක්ෂවරයකු බවට පත් වන්නා වූ ද,

සමාගම විසින් නිකුත් කරන ලද කොටස් කිසිවක් සම්බන්ධයෙන් අදාළ සම්බන්ධතාවක් දරන්නා වූ ද, තැනැත්තකු විසින්,—

(ඇ) තමා අදාළ සම්බන්ධතාව දරන කොටස් සංඛ්‍යාව සහ පන්තිය සහ අදාළ සම්බන්ධතාවේ ස්වභාවය මණ්ඩලය වෙත අනාවරණය කරනු ලැබිය යුතු ය ; තව ද

(ඈ) ඉහත (i) ඡේදය යටතේ මණ්ඩලය වෙත අනාවරණය කරන ලද විස්තර, අදාළ සම්බන්ධතා පිළිබඳ ලේඛනයේ නොපමාව ම ඇතුළත් කරනු ලබන බවට වග බලා ගත යුතු ය.

(2) සමාගමක් විසින් නිකුත් කරන ලද කොටස්වල අදාළ සම්බන්ධතාවක් අත්කර ගන්නා හෝ ඉවත් කරන හෝ ඒ සමාගමේ අධ්‍යක්ෂවරයකු විසින්, එසේ අත්කර ගැනීමෙන් හෝ ඉවත් කිරීමෙන් පසු නොපමාව ම,—

(අ) (i) අවස්ථාවෝචිත පරිදි, අදාළ සම්බන්ධතාව අත්කර ගනු ලැබ ඇති කොටස් සංඛ්‍යාව සහ පන්තිය හෝ අදාළ

සම්බන්ධතාව ඉවත් කරනු ලැබූ කොටස් සංඛ්‍යාව සහ පන්තිය;

(ii) අදාළ සම්බන්ධතාවේ ස්වභාවය;

(iii) ගෙවනු ලැබූ හෝ ලබා ගනු ලැබූ ප්‍රතිඝ්ධාව; සහ

(iv) අත්කර ගන්නා ලද හෝ ඉවත් කරන ලද දිනය මණ්ඩලය වෙත අනාවරණය කරනු ලැබිය යුතු ය ; සහ

(ආ) (අ) ඡේදය යටතේ මණ්ඩලය වෙත අනාවරණය කරන ලද විස්තර, සම්බන්ධතා පිළිබඳ ලේඛනයෙහි ඇතුළත් කරනු ලබන බවට වග බලාගත යුතු ය.

**අධ්‍යක්ෂවරයන් පත් කිරීම සහ ඉවත් කිරීම**

අධ්‍යක්ෂවරයන් සංඛ්‍යාව.

**201**. සමාගමකට යටත් පිරිසෙන් එක් අධ්‍යක්ෂවරයෙක් හෝ සිටිය යුතු අතර, පොදු සමාගමකට යටත් පිරිසෙයින් අධ්‍යක්ෂවරයන් දෙදෙනකුවත් සිටිය යුතු ය.

අධ්‍යක්ෂවරයන්ගේ සුදුසුකම්.

**202**. (1) මේ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ නුසුදුස්සකු කරනු නොලැබූ කවර හෝ තැනැත්තකු සමාගමක අධ්‍යක්ෂවරයකු වශයෙන් පත් කරනු ලැබිය හැකි ය.

(2) පහත දැක්වෙන තැනැත්තෝ සමාගමක අධ්‍යක්ෂවරයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ අධ්‍යක්ෂවරයකු වශයෙන් ධුරය දැරීමට හෝ නුසුදුස්සෝ වෙති :—

(අ) වයස අවුරුදු දහඅටට අඩු තැනැත්තකු ;

(ආ) නිදහස් නොකළ වස්තු භංගත්වයට පත් තැනැත්තකු ;

(ඇ) 1982 අංක 17 දරන සමාගම් පනත ඉවත් කරනු නොලැබුවේ නම් ඒ පනත යටතේ සමාගමක අධ්‍යක්ෂවරයකු වීමට හෝ, සමාගමක් ප්‍රවර්ධනය කිරීම, සංස්ථාපනය කිරීම හෝ කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට හෝ සහභාගිවීමට හෝ තහනම් කරනු ලැබූ හෝ තහනම් කරනු ලැබිය හැකි තැනැත්තකු;

(ඈ) සමාගමක අධ්‍යක්ෂවරයකු හෝ ප්‍රවර්ධකයකු වීම හෝ සමාගමක කළමනාකරණයට සම්බන්ධ වීමට හෝ සහභාගිවීමට මේ පනතේ 213 සහ 214 වන වගන්ති යටතේ තහනම් කර ඇති තැනැත්තකු;

(ඉ) සිහිවිකල තැනැත්තකු බවට තීන්දු කරන ලද තැනැත්තකු ;

(ඊ) ස්වාභාවික තැනැත්තකු නොවන තැනැත්තකු ;

(උ) යම් නිශ්චිත සමාගමක් සම්බන්ධයෙන් වන විට, අධ්‍යක්ෂවරයකු වී ඒ සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ සඳහන් යම් සුදුසුකම්වලට අනුකූල නොවන තැනැත්තකු.

(3) අධ්‍යක්ෂවරයකුව සිටීමට නුසුදුසුව සිටිය දී අධ්‍යක්ෂවරයකු වශයෙන් ක්‍රියා කරන තැනැත්තකු, සමාගමක අධ්‍යක්ෂවරයකු වෙත කාර්ය භාරයක් හෝ බැඳීමක් නියම කරන්නා වූ මේ පනතේ යම් විධිවිධානයක කාර්යය සඳහා, අධ්‍යක්ෂවරයකු වශයෙන් සලකනු ලැබිය යුතු ය.

අධ්‍යක්ෂවරයාගේ කැමැත්ත අවශ්‍ය බව.

**203**. යම් තැනැත්තකු විසින්,—

(අ) අධ්‍යක්ෂවරයකු වීමට ස්වකීය කැමැත්ත; සහ

(ආ) සමාගමක අධ්‍යක්ෂවරයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ ධුරය දැරීමට හෝ තමා නුසුදුස්සකුව නොසිටින බවට සහතිකයක් නියමිත ආකෘතියෙහි ඉදිරිපත් කර ඇත්නම් මිස, ඒ තැනැත්තා අධ්‍යක්ෂවරයකු වශයෙන් පත් කරනු නොලැබිය යුතු ය.

පළමුවන අධ්‍යක්ෂවරයා සහ තදනන්තර අධ්‍යක්ෂවරයන් පත් කිරීම.

**204**. (1) සංස්ථාගත කිරීම සඳහා කරනු ලබන ඉල්ලීමක හෝ ඒකාබද්ධ කිරීම සඳහා වූ යෝජනාවක අධ්‍යක්ෂවරයකු වශයෙන් නම් කර ඇති තැනැත්තකු, අවස්ථාවෝචිත පරිදි, ඒ සංස්ථාගත කරන ලද දිනයෙහි සිට හෝ ඒකාබද්ධ කිරීමේ යෝජනාව බලාත්මක වූ දිනයෙහි සිට, මේ පනතේ විධිවිධානවලට අනුකූලව අධ්‍යක්ෂවරයකු වශයෙන් ධුරය දැරීම අවසන් වන තෙක්, අධ්‍යක්ෂවරයකු වශයෙන් ධුරය දැරිය යුතු ය.

(2) සමාගමක සාංගමික ව්‍යවස්ථාවලියේ අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වා ඇත්නම් මිස, ඒ සමාගමේ සියලු ම තදනන්තර අධ්‍යක්ෂවරයන් සාමාන්‍ය යෝජනා සම්මතයක් මගින් පත් කරනු ලැබිය යුතු ය.

අධ්‍යක්ෂවරයන් පත් කිරීම සඳහා වෙන වෙනම ඡන්දය දිය යුතු බව.

**205**. (1) පෞද්ගලික සමාගමක් නොවන සමාගමක කොටස් හිමියන් විසින්, ඒ සමාගමේ අධ්‍යක්ෂවරයකු පත් කර ගැනීම සඳහා වූ යෝජනා සම්මතයකට ඡන්දය දීමේ දී,—

(අ) ඒ යෝජනා සම්මතය අධ්‍යක්ෂවරයකු පත් කර ගැනීම සඳහා වූවක් වේ නම්; හෝ

(ආ) ඒ යෝජනා සම්මතය සමාගමේ අධ්‍යක්ෂවරයන් වශයෙන් තැනැත්තන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් පත් කර ගැනීම සඳහා වූ එක් යෝජනා සම්මතයක් නම් සහ ඒ යෝජනා සම්මතය සඳහා එසේ ඡන්දය දිය යුතු බවට වූ වෙනම යෝජනා සම්මතයක්, ඊට විරුද්ධව ඡන්දය දීමකින් තොරව පළමුව සම්මත කර ගෙන තිබුණේ නම්,

පමණක්, ඒ සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ ඇතුළත් විධිවිධානවලට යටත්ව, එවැනි යෝජනා සම්මතයක් සඳහා ඡන්දය දෙනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් ඉදිරිපත් කරන ලද යෝජනා සම්මතයක්, එය ඉදිරිපත් කරන ලද අවස්ථාවේ දී ඊට විරෝධය පෑමක් සිදු වී නොතිබුණ ද, අවලංගු වන්නේ ය.

(3) මේ පනතේ 209 වන වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම, (2) වන උපවගන්තියේ විධිවිධාන මගින් සීමා නොවිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය කඩ කෙරෙන යෝජනා සම්මතයක් සම්මත කර ගැනීමෙහි ලා, වෙනත් පත් කර ගැනීමක් නොමැති විට විශ්‍රාම යන අධ්‍යක්ෂවරයන් ස්වයංකාරීව පත්වීම සඳහා වූ කිසිම විධිවිධානයක් අදාළ නොවිය යුතු ය.

(5) රහස් ඡන්දයෙන් හෝ ඡන්දය විමසීමෙන් අධ්‍යක්ෂවරයන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් තෝරා පත් කර ගැනීම, මේ වගන්තියේ ඇතුළත් කිසිවකින් වළක්වනු නොලැබිය යුතු ය.

අධ්‍යක්ෂවරයන් ඉවත් කිරීම.

**206**. (1) තත් කාර්යය සඳහා කැඳවනු ලබන රැස්වීමක දී හෝ අධ්‍යක්ෂවරයකු ධුරයෙන් ඉවත් කිරීම ඇතුළත් කාර්යය සඳහා කැඳවනු ලබන රැස්වීමක දී සම්මත කර ගනු ලබන සාමාන්‍ය යෝජනා සම්මතයක් මගින්, සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ ඇතුළත් විධිවිධානවලට යටත්ව, අධ්‍යක්ෂවරයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(2) රැස්වීම කැඳවීමේ අරමුණ හෝ එක් අරමුණක්, අධ්‍යක්ෂවරයා ධුරයෙන් ඉවත් කිරීම බව, ඒ රැස්වීම කැඳවීමේ දැන්වීමෙහි සඳහන් කර තිබිය යුතු ය.

(3) අධ්‍යක්ෂවරයකු ධුරයෙන් ඉවත් කිරීම අදහස් කර ඇති යෝජනා සම්මතයක් පිළිබඳ දැන්වීමක් කරනු ලැබූ සහ සියලු ම කොටස් හිමියන් වෙත පිටපත් යවන ලෙස ඉල්ලීමක් සහිතව අදාළ අධ්‍යක්ෂවරයා විසින්, එකී දැන්වීමේ දින සිට දින දහ හතරක කාලයක් ඇතුළත කරුණු දක්වා සිටිනු ලැබූ අවස්ථාවක, සමාගම විසින් එකී කරුණු දැන්වීම්වල පිටපත් සියලු කොටස් හිමියන් වෙත යවනු ලැබිය යුතු ය. සමාගම විසින් කරන ලද පැහැරහැරීමක් හේතුකොට ගෙන කොටස් හිමියන් වෙත එකී කරුණු දැක්වීම් යවා නැත්නම්, ඒ කරුණු දැක්වීම් එම රැස්වීමේ දී කියවන ලෙස අදාළ අධ්‍යක්ෂවරයා විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය :

එසේ වුව ද, අපහාසාත්මක කාරණයක් සඳහා අනවශ්‍ය ප්‍රසිද්ධියක් ලබා ගැනීම සඳහා අදාළ අධ්‍යක්ෂවරයා විසින් මේ වගන්තියේ විධිවිධාන අනිසි ලෙස යොදා ගනු ලබන බවට අධිකරණය සෑහීමට පත් කිරීමට සමාගමට හැකි වන අවස්ථාවක, අදාළ අධ්‍යක්ෂවරයා විසින් නඩු ගාස්තු ගෙවිය යුතු බවට වූ ආඥාවක් මත අධිකරණයෙන් ලබා ගත් අවසරය ඇතිව, සමාගම විසින්, ඒ කරුණු දැක්වීම් කොටස් හිමියන් වෙත යැවීමෙන් හෝ ඒ කරුණු දැක්වීම් රැස්වීමේ දී කියවීමෙන් හෝ වැළකී සිටිය හැකි ය.

අධ්‍යක්ෂවරයා ධුරය දැරීම නතර වීම.

**207**. (1) සමාගම අධ්‍යක්ෂවරයකු,—

(අ) (2) වන උපවගන්තියට අනුකූලව ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්වුව හොත් ;

(ආ) මේ පනතේ විධිවිධානවලට හෝ සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියට හෝ අනුකූලව ධුරයෙන් ඉවත් කරනු ලැබුව හොත් ;

(ඇ) 202 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර අධ්‍යක්ෂවරයකුව සිටීමට නුසුදුස්සකු බවට පත් වුව හොත්,

(ඈ) මිය ගිය හොත් ;

(ඉ) 210 වන වගන්තියේ (2) වන උපවගන්තිය ප්‍රකාර ස්වකීය ධුරය හිස් කළ හොත් ; හෝ

(ඊ) සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියට අනුකූලව අන්‍යාකාරයකින් ස්වකීය ධුරය හිස් කළ හොත්,

ඒ අධ්‍යක්ෂවරයාගේ ධුරය හිස් වන්නේ ය.

(2) සමාගමක අධ්‍යක්ෂවරයකු විසින්, ධුරයෙන් ඉල්ලා අස්වීමේ ලියවිල්ලකින් වූ දැන්වීමක් අත්සන් කොට, එය සමාගමේ ලියාපදිංචි කළ කාර්යාලය වෙත භාරදීමෙන් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය. 208 වන වගන්තියට යටත්ව, එවැනි දැන්වීමක් ලියාපදිංචි කළ කාර්යාලය වෙත ලැබුණු විට හෝ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් යම් පසු කාලයක දී හෝ ඒ දැන්වීම බලාත්මක වන්නේ ය.

අන්තිමට ඉතිරිව සිටින අධ්‍යක්ෂවරයා ඉල්ලා අස්වීම.

**208**. (1) යම් සමාගමක තනි අධ්‍යක්ෂවරයකු පමණක් සිටින අවස්ථාවක, ස්වකීය ඉල්ලා අස්වීමේ දැන්වීම භාර ගැනීම සඳහා සහ අලුත් අධ්‍යක්ෂවරයන් එක් අයකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් පත් කර ගැනීම සඳහා කොටස් හිමියන්ගේ රැස්වීමක් ඒ අධ්‍යක්ෂවරයා විසින් කැඳවනු ලබන තෙක්, ඔහුට ස්වකීය ධුරයෙන් ඉල්ලා අස් විය නො හැකි ය.

(2) සමාගමක තනි අධ්‍යක්ෂවරයකු විසින් දෙනු ලැබූ ඉල්ලා අස්වීමේ දැන්වීමක ඇතුළත් කොන්දේසි කෙසේ වුව ද ඒ නොතකා, (1) වන උපවගන්තියට අනුකූලව කැඳවනු ලැබූ කොටස් හිමියන්ගේ රැස්වීමේ දිනය ඉකුත් වන තෙක් ඒ දැන්වීම බලාත්මක නොවිය යුතු ය.

අධ්‍යක්ෂවරයාගේ ක්‍රියාවල වලංගුභාවය.

**209**. අධ්‍යක්ෂවරයකු වශයෙන් යම් තැනැත්තකු සිදු කර ඇති ක්‍රියා—

(අ) ඒ තැනැත්තාගේ පත් කිරීම දෝෂ සහිත වීම ; හෝ

(ආ) ඒ තැනැත්තා ඒ පත් කිරීමට සුදුසුකම් ලබා නොතිබීම,

නොතකා වලංගු විය යුතු ය.

### අධ්‍යක්ෂවරයන්ගේ විශ්‍රාම ගැනීමේ වයස

අධ්‍යක්ෂවරයන් සඳහා වයස් සීමාව.

**210**. (1) 211 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, වයස අවුරුදු හැත්තෑවට එළඹ ඇති කිසිම තැනැත්තකු, පොදු සමාගමක අධ්‍යක්ෂවරයකු වශයෙන් හෝ පොදු සමාගමක පාලිත සමාගමක් වන පෞද්ගලික සමාගමක අධ්‍යක්ෂවරයකු වශයෙන් හෝ පත් කළ නොහැකි වන්නේ ය.

(2) 211 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, පොදු සමාගමක හෝ, පොදු සමාගමක පාලිත සමාගමක් වන පෞද්ගලික සමාගමක හෝ අධ්‍යක්ෂවරයකු,—

(අ) වයස අවුරුදු හැත්තෑවට එළඹීමෙන් පසුව ආරම්භ වන වාර්ෂික මහ සභා රැස්වීම අවසන් වූ විට ; හෝ

(ආ) වයස අවුරුදු හැත්තෑවට එළඹීමෙන් පසුව ඔහු අධ්‍යක්ෂවරයකු වශයෙන් නැවත පත් කරනු ලැබ ඇත්නම් එසේ නැවත පත් කරනු ලැබීමෙන් පසුව පැවැත්වෙන වාර්ෂික මහා සභා රැස්වීමේ දී,

ස්වකීය ධුරයෙන් ඉවත් විය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ විධිවිධාන යටතේ යම් තැනැත්තකු ස්වකීය ධුරයෙන් විශ්‍රාම ගනු ලබන අවස්ථාවක වෙනත් පත් කිරීමක් නොමැති විට විශ්‍රාම අධ්‍යක්ෂවරයන් නිරායාසයෙන් ම නැවත පත් කිරීම සඳහා වූ විධිවිධාන කිසිවක් අදාළ නොවිය යුතු ය ; තව ද ඒ අධ්‍යක්ෂවරයා විශ්‍රාම ගත්තේ යම් රැස්වීමක් අවසානයේ දී ද, ඒ රැස්වීමේ දී ඔහුගේ පුරප්පාඩුව පුරවනු නොලැබුවේ නම්, අනියම් පුරප්පාඩුවක් පුරවන ආකාරයෙන් ඒ පුරප්පාඩුව පුරවනු ලැබිය හැකි ය.

(4) මේ වගන්තියේ "පොදු සමාගම" යන්නෙන් ,පෞද්ගලික සමාගමක් නොවන සීමාසහිත සමාගමක් අදහස් වේ.

වයස් සීමාව අදාළ නොවිය යුතු ලෙස සමාගම සම්මත කර ගතහොත් වයස් සීමාව අදාළ නොවිය යුතු බව.

**211**. (1) 210 වන වගන්තියෙහි සඳහන් වයස් සීමාව යම් අධ්‍යක්ෂවරයකුට අදාළ නොවිය යුතු යයි ප්‍රකාශ කරමින් සමාගමක මහා සභා රැස්වීමක දී සමාගම විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතයකින් එම අධ්‍යක්ෂවරයාගේ පත්වීම කරනු ලබන්නේ නම් හෝ කරනු ලැබ ඇත්නම් නැතහොත් අනුමත කරනු ලබන්නේ නම් හෝ අනුමත කරනු ලැබ ඇත්නම් වයස අවුරුදු හැත්තෑවට එළඹ සිටින අධ්‍යක්ෂවරයකු පත් කිරීම හෝ ඒ වයසට එළඹ සිටින අධ්‍යක්ෂවරයකු විශ්‍රාම ගැන්වීම හෝ 210 වන වගන්තියේ ඇතුළත් විධිවිධාන කිසිවකින් වළක්වනු නොලැබිය යුතු ය. කෙසේ වුව ද, මහා සභා රැස්වීමක දී සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතයක් ඔහුගේ පත්වීමේ දින සිට එක් අවුරුද්දක් සඳහා පමණක් වලංගු විය හැකි ය.

(2) සමාගම වෙත දෙන ලද හෝ සමාගම විසින් එහි කොටස් හිමියන් වෙත දෙන ලද (1) වන උපවගන්තියෙහි සඳහන් යම් යෝජනා සම්මතයක් පිළිබඳ දැන්වීමෙහි එය අදාළ වන තැනැත්තාගේ වයස සඳහන් කර තිබිය යුතු ය.

වයස හෙළිදරව් කිරීම අධ්‍යක්ෂවරුන්ගේ යුතුකම බව.

**212**. (1) සමාගමක අධ්‍යක්ෂවරයකු ලෙස පත් කරනු ලැබ හෝ තමන්ගේ ම දැනීමට අනුව පත් කරනු ලැබීමට යෝජනා කරනු ලැබ ඇති යම් තැනැත්තකු, වයස අවුරුදු හැත්තෑවට හෝ සමාගමේ ව්‍යවස්ථාවලියේ සඳහන් කර ඇති යම් අඩු වයසකට එළඹුණු අවස්ථාවක, තම වයස පිළිබඳව සමාගම වෙත දැනුම්දීමක් කළ යුතු ය.

(2) යම් කලින් අවස්ථාවක දී (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකු විසින් දැනුම් දීමක් කර ඇති අවස්ථාවක, ඒ තැනැත්තා සමාගමේ අධ්‍යක්ෂවරයකු ලෙස කලින් දැරූ පත්වීමක් අවසන්වීමේ දී ඔහු නැවත පත් කරනු ලැබීම සම්බන්ධයෙන් (1) වන උපවගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(3) (අ) (1) වන උපවගන්තියේ විධිවිධාන මගින් නියම කරනු ලැබ ඇති පරිදි තම වයස පිළිබඳව දැනුම්දීම පැහැර හරින්නා වූ ; හෝ

(ආ) තම වයසේ හේතුවෙන් වලංගු නොවන්නා වූ හෝ අවසන්ව ඇත්තා වූ යම් පත්වීමක් යටතේ අධ්‍යක්ෂවරයකු ලෙස ක්‍රියා කරන්නා වූ,

යම් තැනැත්තෙක්, වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(4) (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ කාර්ය සඳහා, අවලංගුව ඇති හෝ අවසන්ව ඇති පත්වීමක් යටතේ අධ්‍යක්ෂවරයකු ලෙස ක්‍රියා කර ඇති යම් තැනැත්තෙක්, අවස්ථාවෝචිත පරිදි, ඒ අවලංගු පත්වීමෙහි දින සිට හෝ ඒ පත්වීම අවසන් වූ දිනයෙහි සිට ඒ තැනැත්තා එසේ ක්‍රියා කළ අවසාන දිනය දක්වා වූ කාලය මුළුල්ලේ ම ක්‍රියා කරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

### අධ්‍යක්ෂවරයන්ගේ නුසුදුසුකම්

සමාගම් කළමනාකරණය කිරීම තහනම් කර ඇති තැනැත්තන්.

**213**. (1) යම් තැනැත්තකු—

(අ) මේ පනත යටතේ බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කරනු ලැබිය හැකි යම් වරදක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබ ඇති ;

(ආ) වංක හෝ වංචනික ක්‍රියාවක් හා සම්බන්ධ වරදකට වරදකරු කරනු ලැබ ඇති ;

(ඇ) (97 වන අධිකාරය වූ) වස්තු භංගත්ව ආඥාපනත යටතේ වස්තු භංගත්වයට පත් තැනැත්තකු බවට විනිශ්චය කරනු ලැබ ඇති ; හෝ

(ඇ) සිහි විකල තැනැත්තකු බවට විනිශ්චය කරනු ලැබ ඇති,

අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, එසේ වරදකරු කරනු ලැබීමෙන් හෝ විනිශ්චය කරනු ලැබීමෙන් හෝ පසුව එළඹෙන අවුරුදු පහක කාල පරිච්ඡේදය තුළ දී, ඒ තැනැත්තා විසින් පළමු කොට අධිකරණයේ අවසරය ලබා ගැනීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත්නම් මිස, යම් සමාගමක අධ්‍යක්ෂවරයකු වීම හෝ ප්‍රවර්ධකයකු වීම නැතහොත් කවර හෝ ආකාරයකින් සෘජුව හෝ වක්‍රාකාරයෙන් හෝ සමාගමක කළමනාකරණයට සම්බන්ධවීම හෝ සහභාගිවීම නොකළ යුතු ය. අධිකරණයේ අවසරය, සුදුසු යයි අධිකරණය කල්පනා කරන නියම හා කොන්දේසි මත දෙනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ අධිකරණයේ අවසරය ඉල්ලා සිටීමට අපේක්ෂා කරන තැනැත්තකු විසින්, එසේ අධිකරණයේ අවසරය ඉල්ලා සිටීමට ඔහුගේ අපේක්ෂාව පිළිබඳ දැන්වීමක්, දින දහයකට නොඅඩු කාලයක් කල් තබා රෙජිස්ට්‍රාර්වරයා වෙත දිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ වූ යම් ඉල්ලීමක් විභාග කිරීමේ දී රෙජිස්ට්‍රාර්වරයාට සහ සුදුසු යයි අධිකරණය කල්පනා කරන වෙනත් යම් තැනැත්තන්ට අධිකරණය වෙත පැමිණ, කරුණු ඉදිරිපත් කළ හැකි ය.

(4) මේ වගන්තිය උල්ලංඝනය කරමින් හෝ මේ වගන්තිය යටතේ කරන ලද යම් ආඥාවක් උල්ලංඝනය කරමින් ක්‍රියා කරන තැනැත්තකු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් දස ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු පහක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

(5) මේ වගන්තියෙහි "සමාගම" යන යෙදුමට, ශ්‍රී ලංකාවේ ව්‍යාපාර කටයුතු කර ගෙන යන විදේශීය සමාගමක් ඇතුළත් වේ.

අධිකරණය විසින් අධ්‍යක්ෂවරයන් නුසුදුස්සන් කරනු ලැබිය හැකි බව.

**214**. (1) යම් තැනැත්තකු,—

(අ) 213 වන වගන්තිය යටතේ සමාගමක අධ්‍යක්ෂවරයකු වීම තහනම් කොට ඇති තැනැත්තකු වන ;

(ආ) සමාගමක අධ්‍යක්ෂවරයකුව සිටිය දී මේ පනතේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම දිගින් දිගට ම පැහැර හැර ඇති ;

(ඇ) ශ්‍රී ලංකාවේ දී නොව වෙනත් යම් රටක දී වංක හෝ වංචනික ක්‍රියා හා සම්බන්ධයෙන් වරදකට වරදකරු කර ඇති ; හෝ

(ඈ) වස්තු භංගත්වයට පත් වූ සමාගමක අධ්‍යක්ෂවරයකු වන සහ ඒ සමාගමේ හෝ වෙනත් යම් සමාගමක හෝ අධ්‍යක්ෂවරයකු වශයෙන් සිටිය දී ඒ තැනැත්තාගේ ක්‍රියා කලාපය සමාගමක අධ්‍යක්ෂවරයකු වීමට ඒ තැනැත්තා නුසුදුසු බවට පත් කරන,

අවස්ථාවක, ඒ තැනැත්තා අධිකරණය විසින් ආඥාවක් කිරීමෙන්, ඒ ආඥාවේ නිශ්චිතව සඳහන් කරනු ලබන අවුරුදු දහයක් නොඉක්මවන යම් කාලයක් සඳහා අධිකරණයේ අවසරය නොමැතිව, සමාගමක අධ්‍යක්ෂවරයකු හෝ ප්‍රවර්ධකයකු හෝ නොවිය යුතු යයි හෝ කවර හෝ ආකාරයකින් කෙළින් ම හෝ අන්‍යාකාරයකින් සමාගමක කළමනාකරණයට සම්බන්ධවීම හෝ සහභාගිවීම නොකළ යුතු යයි ආඥා කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ ආඥාවක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් කිරීමට අපේක්ෂා කරන තැනැත්තකු විසින්, ඒ ආඥාව ලබා ගැනීමට අපේක්ෂා කරනු ලබන්නේ යම් තැනැත්තකුට විරුද්ධව ද ඒ තැනැත්තා වෙත, තම අපේක්ෂාව පිළිබඳ දැන්වීමක්, වැඩ කරන දින දහයකට නොඅඩු කාලයක් කල් තබා දිය යුතු ය. ඒ ආඥාව ඉල්ලා ඇත්තේ යම් තැනැත්තකුට විරුද්ධව ද ඒ තැනැත්තා විසින් එම ඉල්ලීම පිළිබඳ විභාගයට පෙනී සිට සාක්ෂි දීම හෝ සාක්ෂිකරුවන් කැඳවීම හෝ කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ ආඥාවක් ලබා ගැනීම සඳහා වූ ඉල්ලීමක්, රෙජිස්ට්‍රාවරයා විසින් හෝ ඒ ආඥාව ලබා ගැනීමට අපේක්ෂා කරනු ලබන්නේ යම් තැනැත්තකුට විරුද්ධව ද ඒ තැනැත්තා අධ්‍යක්ෂවරයකුව සිටි සමාගමක ඈවරකරු විසින් හෝ අද්මිනිස්ත්‍රාසිකරු විසින් හෝ එවැනි යම් සමාගමක කොටස් හිමියකු හෝ ණය හිමියකුව සිටින හෝ සිටියා වූ හෝ යම් තැනැත්තකු විසින් හෝ ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(4) ආඥාව කරනු ලැබිය යුතුව ඇත්තේ කවර කාරණා පදනම් කොට ගෙන ද ඒ කාරණා සම්බන්ධයෙන් අදාළ තැනැත්තා සාපරාධී වරදකට යටත් විය හැකි වුව ද, මේ වගන්තිය යටතේ ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(5) මේ වගන්තිය යටතේ ආඥාවක් කිරීමෙන් පසුව, අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් ප්‍රායෝගික වශයෙන් හැකි තාක් ඉක්මණින් ආඥාව කර ඇති බවට දැන්වීමක් රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතු අතර—

(අ) ඒ ආඥාව කර ඇත්තේ යම් තැනැත්තකුට විරුද්ධව ද, ඒ තැනැත්තාගේ නම රෙජිස්ට්‍රාර්වරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමට සැලැස්විය යුතු ය ; තව ද

(ආ) ඒ ආඥාව කිරීම සම්බන්ධයෙන් සුදුසු යයි රෙජිස්ට්‍රාර්වරයා කල්පනා කරන පරිදි වැඩිදුරටත් දැනුම්දීමක් කරනු ලැබිය හැකි ය.

(6) මේ වගන්තිය යටතේ කරනු ලැබූ ආඥාවක් උල්ලංඝනය කරමින් ක්‍රියා කරන සෑම තැනැත්තකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු පහක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

(7) මේ වගන්තියේ "සමාගම" යන්නට, ශ්‍රී ලංකාවේ ව්‍යාපාර කටයුතු ගෙන යන විදේශීය සමාගමක් ඇතුළත් වේ.

### අධ්‍යක්ෂවරයන්ට අදාළ විවිධ විධිවිධාන

**215**. සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්ය පටිපාටිය සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියෙන් පාලනය විය යුතු ය. අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්ය පටිපාටිය.

**216**. (1) 217 වන වගන්තියේ විධිවිධානවලට යටත් ව, සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියෙන් හෝ සාමාන්‍ය යෝජනා සම්මතයක් මගින් හෝ බලය දී තිබේ නම් සහ සමාගමේ යහපත සඳහා වේ යයි අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමට පත් වන්නේ නම්, සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්,— පාරිශ්‍රමික සහ වෙනත් ප්‍රතිලාභ.

(අ) අධ්‍යක්ෂවරයකු වශයෙන් හෝ වෙනත් යම් තත්ත්වයකින් හෝ ඉටු කරනු ලබන සේවා වෙනුවෙන් අධ්‍යක්ෂවරයකුට සමාගම විසින් යම් පාරිශ්‍රමිකයක් ගෙවීම හෝ වෙනත් ප්‍රතිලාභ සැලසීම ;

(ආ) ධුරය අහිමිවීම වෙනුවෙන් අධ්‍යක්ෂවරයකුට හෝ හිටපු අධ්‍යක්ෂවරයකුට සමාගම විසින් වන්දි ගෙවීම ;

(ඇ) ඉහත (අ) හෝ (ආ) ඡේදයේ සඳහන් දේවලින් කවරක් වුවද කිරීමට ගිවිසුමකට එළඹීම,

අනුමත කරනු ලැබිය හැකි ය.

(2) අවස්ථාවෝචිත පරිදි, එකී ගෙවීම හෝ ප්‍රතිලාභ සැලසීම හෝ ගිවිසුමකට එළඹීම අනුමත කරනු ලැබූ වහාම, ඒ ගෙවීම, ප්‍රතිලාභ හෝ ගිවිසුම පිළිබඳ විස්තර, සම්බන්ධතා පිළිබඳ ලේඛනයේ ඇතුළත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය වගබලා ගත යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ අනුමත කරන ලද ගිවිසුමකට අනුකූලව අධ්‍යක්ෂවරයකුට පාරිශ්‍රමික ගෙවීම හෝ වෙනත් යම් ප්‍රතිලාභයක් සැලසීම, ඒ උපවගන්තිය යටතේ වෙන වෙනම අනුමත කිරීම අවශ්‍ය නොවිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ යම් ගෙවීමක්, ප්‍රතිලාභයක් හෝ ගිවිසුමක් අනුමත කිරීමට පක්ෂව ඡන්දය දෙන අධ්‍යක්ෂවරයන් විසින්, ඒ ගෙවීම කිරීම හෝ ඒ ප්‍රතිලාභය සැලසීම හෝ ඒ ගිවිසුමට එළඹීම හෝ ස්වකීය මතය අනුව සමාගමේ යහපත පිණිස වන බව සඳහන් කරමින් සහ ඒ මතයට තමන් එළඹීමට හේතු සඳහන් කරමින් සහතිකයක් අත්සන් කළ යුතු ය.

(5) (1) වන උපවගන්තිය අදාළ වන ගෙවීමක් කර ඇති හෝ ප්‍රතිලාභයක් සලස්වා ඇති අවස්ථාවක දී සහ—

(අ) (1) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධාන අනුව ක්‍රියා කර නොමැති නම් ; හෝ

(ආ) (4) වන උපවගන්තිය යටතේ දෙන ලද සහතිකයේ දක්වා ඇති මතය දැරීමට යුක්ති සහගත හේතු නොමැති වී නම්,

ඒ ගෙවීම කරන ලද හෝ ප්‍රතිලාභය සලස්වන ලද හෝ අවස්ථාවේ දී, ඒ ගෙවීම හෝ ප්‍රතිලාභය සැලැස්වීම සමාගමට සාධාරණ වූවක් බව, ඒ ගෙවීම කරනු ලැබූ හෝ ප්‍රතිලාභය සලස්වනු ලැබූ හෝ අධ්‍යක්ෂවරයා නැතහොත් හිටපු අධ්‍යක්ෂවරයා විසින් ඔප්පු කරන ලද ප්‍රමාණයට හැර, එසේ ගෙවන ලද මුදල් ප්‍රමාණය හෝ සලස්වන ලද ප්‍රතිලාභයේ මූල්‍ය වටිනාකම හෝ සම්බන්ධයෙන් ඒ අධ්‍යක්ෂවරයා හෝ හිටපු අධ්‍යක්ෂවරයා සමාගමට පෞද්ගලිකව ම වගකිව යුතු ය.

(6) සමාගමක අධ්‍යක්ෂවරයන්ට පාරිශ්‍රමික ගෙවීමට හෝ වෙනත් ප්‍රතිලාභ සැලැස්වීමට හෝ කොටස් හිමියන් විසින් බලය දෙනු ලැබිය හැකි විධිවිධාන එම සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය මගින් සැලැස්වීම, මේ වගන්තියේ ඇතුළත් කිසිවකින් වළක්වනු නොලබන අතර, සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියෙන් සලස්වා ඇති එවැනි විධිවිධානයකට අනුකූලව කොටස් හිමියන් විසින් අනුමත කරන ලද පාරිශ්‍රමික ගෙවීමකට හෝ වෙනත් ප්‍රතිලාභ සැලැස්වීමකට මේ වගන්තියේ (1) සිට (5) තෙක් වූ උපවගන්තිවල විධිවිධාන අදාළ නොවිය යුතු ය.

**217**. (1) 31 වන වගන්තියේ විධිවිධානවලට සහ මේ වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, සමාගමක් විසින්,— අධ්‍යක්ෂවරයන්ට දෙනු ලබන ණය සීමා කිරීම.

(අ) සමාගමේ හෝ ඊට අනුයාත සමාගමක හෝ අධ්‍යක්ෂවරයකුට ණය මුදලක් දෙනු නොලැබිය යුතු ය ; නැතහොත්

(ආ) යම් තැනැත්තකු විසින් සමාගමේ හෝ ඊට අනුයාත සමාගමක හෝ අධ්‍යක්ෂවරයකුට දෙනු ලැබූ ණයක් සම්බන්ධයෙන් යම් ඇපවීමකට ඇතුළත් වීම හෝ යම් ඇපයක් තැබීම,

නොකළ යුතු ය.

(2) යම් සමාගමක් විසින්,—

(අ) අධ්‍යක්ෂවරයකුට සමාගම විසින් අත්තිකාරම් වශයෙන් දෙනු ලබන මුදල්වල එකතුව රුපියල් විසිපන්දහස නොඉක්මවන ණයක් හෝ මෙම පනතේ xix වන කොටස යටතේ පිහිටුවන ලද උපදේශක කොමිෂන් සභාවේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් කලින් කලට නියම කරනු ලබන ඊට වඩා වැඩි ප්‍රමාණයක් ඒ අධ්‍යක්ෂකවරයාට ගෙවීමෙන් ;

(ආ) අනුයාත සමාගමකට ණයක් දීමෙන් හෝ යම් තැනැත්තකු විසින් අනුයාත සමාගමකට දෙනු ලැබූ ණයක් සම්බන්ධයෙන් ඇපවීමකට ඇතුළත් වීමෙන් හෝ ඇප තැබීමෙන් ;

(ඇ) සමාගමේ කාර්යය සඳහා හෝ සමාගමේ නිලධරයකු වශයෙන් ස්වකීය කාර්යය ඉටු කිරීමට ඔහුට හැකි වන පිණිස හෝ අධ්‍යක්ෂවරයකු විසින් දරන ලද හෝ දැරීමට ඇති වියදම් පියවා ගැනීම සඳහා අධ්‍යක්ෂවරයකුට අරමුදල් සැපයීමෙන් ; හෝ

(ඇ) සමාගම විසින් මුදල් ණයට දීමේ ව්‍යාපාරය කර ගෙන යනු ලබන අවස්ථාවක, මුදල් ණයට දීමේ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවල දී මුදල් ණයට දීමෙන්,

ඒ සමාගම වළක්වාලීමක්, (1) වන උපවගන්තියේ විධිවිධානවලින් සිදු නොවිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් යම් ණයක් දී ඇති අවස්ථාවක, ඒ සමාගමේ අභිමතය පරිදි ඒ ණය බල රහිත කරනු ලැබිය යුතු අතර, ඒ ණය සම්බන්ධයෙන් වූ යම් ගිවිසුමක කොන්දේසි කවරේ වුව ද ඒ නොතකා, සමාගම විසින් එසේ ඒ ණය අවලංගු කරනු ලැබීමේ දී ඒ ණය ආපසු ගෙවනු ලැබිය යුතු ය.

(4) අධ්‍යක්ෂවරයකුට ණයක් දීම හැර වෙනත් ගණුදෙනුවකට (1) වන උපවගන්තිය උල්ලංඝනය කරමින් සමාගමක් ඇතුළත් වී ඇති අවස්ථාවක,—

(අ) ගණුදෙනුව හේතු කොට ගෙන සිදු වන යම් පාඩුවක් හෝ අලාභයක් සම්බන්ධයෙන් සමාගම හානිපූරණය කිරීමට අධ්‍යක්ෂවරයා බැඳී සිටින්නේ ය ; තව ද

(ආ) (i) සමාගමට දරන්නට සිදු වූ යම් පාඩුවක් හෝ අලාභයක් සම්බන්ධයෙන් (අ) ඡේදය යටතේ සමාගම හානිපූරණය කර ඇත්නම් ; හෝ

(ii) මේ වගන්තිය උල්ලංඝනය කිරීමට හේතුකාරක වූ පරිවේෂණ පිළිබඳව සැබවින්ම දැනුම්දීමකින් තොරව, අධ්‍යක්ෂවරයා හැර වෙනත් යම් තැනැත්තකු විසින් සද්භාවයෙන් සහ වටිනාකම දී අත්කර ගනු ලැබූ අයිතිවාසිකම් කිසිවක් කෙරෙහි බලපෑමක් ඒ ගණුදෙනුව අවලංගු කිරීම හේතුකොට ගෙන සිදු වේ නම් මිස,

සමාගමේ අභිමතය පරදි ඒ ගනුදෙනුව බල රහිත කරනු ලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තියේ නියමයන් අනුව ක්‍රියා කිරීම සමාගමක් විසින් පැහැර හැර ඇති අවස්ථාවක,—

(අ) ඒ සමාගම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය ; තව ද

(ආ) අදාළ ගණුදෙනුවට ඇතුළත්වීමට සමාගමට බලය දෙන ලද හෝ අවසර දෙන ලද ඒ සමාගමේ සෑම අධ්‍යක්ෂවරයකු ම, වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් එක්ලක්ෂයක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

**218**. (1) මේ වගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, සමාගමේ හෝ ඊට අනුයාත සමාගමක හෝ අධ්‍යක්ෂවරයකු හෝ සේවා නියුක්තයකු හෝ විසින්,— හානිපූරණය හා රක්ෂණය.

(අ) අධ්‍යක්ෂවරයකුගේ හෝ සේවා නියුක්තයකුගේ හෝ තත්ත්වයෙන් සිදු කරන ලද යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සම්බන්ධයෙන් ; හෝ

(ආ) යම් වගකීමකට අදාළ යම් හිමිකම් පෑමක දී හෝ නඩු කටයුත්තක දී විත්තිවාචක ඉදිරිපත් කිරීම හෝ බේරුම් කිරීම හෝ සඳහා ඒ අධ්‍යක්ෂවරයා නැතහොත් සේවා නියුක්තයා විසින් දරන ලද යම් වියදමක් සම්බන්ධයෙන්,

ඒ අධ්‍යක්ෂවරයා හෝ සේවා නියුක්තයා හෝ හානිපූරණය කිරීම හෝ කෙළින් ම නැතහොත් අන්‍යාකාරයකින් ඔහු සඳහා රක්ෂණ ආවරණ සැපයීම, ඒ සමාගම විසින් නොකළ යුතු ය.

(2) සමාගමක සාංගමික ව්‍යවස්ථාවලියෙන් ප්‍රකාශිතවම බලය දී ඇත්නම්, ඒ සමාගමේ හෝ ඊට අනුයාත සමාගමක හෝ අධ්‍යක්ෂවරයකු හෝ සේවා නියුක්තයකු හෝ විසින්,—

(අ) අධ්‍යක්ෂවරයකුගේ හෝ සේවා නියුක්තයකුගේ හෝ තත්ත්වයෙන් යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සඳහා වූ වගකීමකට සම්බන්ධ යම් නඩු කටයුත්තක දී ; සහ

(ආ) ඔහුගේ වාසියට නඩු තීන්දුව දෙන ලද්දා වූ හෝ ඔහු නිදොස් කරන ලද්දා වූ හෝ අතහැර දමන ලද්දා වූ හෝ 526 වන වගන්තිය යටතේ ඔහුට සහන ප්‍රදානය කරන ලද්දා වූ යම් නඩු කටයුත්තක දී,

දරන ලද වියදම් කිසිවක් සම්බන්ධයෙන් ඒ අධ්‍යක්ෂවරයා හෝ සේවා නියුක්තයා හානිපූරණය කරනු ලැබිය හැකි ය.

(3) සමාගමක් විසින්, එහි සාංගමික ව්‍යවස්ථාවලියෙන් ප්‍රකාශිතව ම බලය දී ඇත්නම්, සමාගමේ හෝ අනුයාත සමාගමක

අධ්‍යක්ෂවරයකු හෝ සේවා නියුක්තයකු, සාපරාධී වගකීමක් නැතහොත් අධ්‍යක්ෂවරයකු සම්බන්ධයෙන් වන විට 187 වන වගන්තියෙහි සඳහන් යුතුකමක් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් වූ වගකීමක් නොවන—

(අ) අධ්‍යක්ෂවරයකුගේ හෝ සේවා නියුක්තයකුගේ හෝ ස්වකීය තත්ත්වයෙන් සිදු කරන ලද යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සඳහා සමාගම හෝ අනුයාත සමාගමක් හෝ නොවන යම් තැනැත්තකුගේ වගකීමක් සම්බන්ධයෙන් ; හෝ

(ආ) එවැනි යම් වගකීමකට අදාළ වූ යම් හිමිකම් පෑමක දී හෝ නඩු කටයුත්තක දී විත්තිවාචක ඉදිරිපත් කිරීමෙහි හෝ එවැන්නක් බේරුම් කිරීමෙහි ලා, ඒ අධ්‍යක්ෂවරයා හෝ සේවා නියුක්තයා විසින් දරන ලද වියදම් සම්බන්ධයෙන්,

ඒ අධ්‍යක්ෂවරයා හෝ සේවා නියුක්තයා හානිපූරණය කරනු ලැබිය හැකි ය.

(4) සමාගමක් විසින්, එහි සාංගමික ව්‍යවස්ථාවලියෙන් ප්‍රකාශිතව ම බලය දී ඇත්නම් හා අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව අනුමතය ඇතිව, සමාගමේ අධ්‍යක්ෂවරයකු හෝ සේවා නියුක්තයකු සඳහා—

(අ) අධ්‍යක්ෂවරයකුගේ හෝ සේවා නියුක්තයකුගේ හෝ ස්වකීය තත්ත්වයෙන් සිදු කරන ලද යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සඳහා, සාපරාධී වගකීමක් නොවන වගකීමක් සම්බන්ධයෙන් ;

(ආ) එවැනි යම් වගකීමකට අදාළ වූ යම් හිමිකම් පෑමක දී, හෝ නඩු කටයුත්තක දී විත්තිවාචක ඉදිරිපත් කිරීමෙහි හෝ එවැන්නක් බේරුම් කිරීමෙහි ලා, ඒ අධ්‍යක්ෂවරයා හෝ සේවා නියුක්තයා විසින් දරන ලද වියදම් සම්බන්ධයෙන් ;

(ඇ) තමා නිදොස් කරන ලද යම් සාපරාධී නඩු කටයුත්තක දී විත්තිවාචක ඉදිරිපත් කිරීමෙහි ලා, ඒ අධ්‍යක්ෂවරයා හෝ සේවා නියුක්තයා විසින් දරන ලද වියදම් සම්බන්ධයෙන්,

රක්ෂණ ආවරණයක් සැපයිය හැකි ය.

(5) යම් සමාගමක හෝ අනුයාත සමාගමක හෝ යම් අධ්‍යක්ෂවරයකුට හෝ සේවා නියුක්තයකුට හෝ දෙන ලද යම් හානිපූරණය කිරීමක් හෝ සපයනු ලැබූ රක්ෂණ ආවරණයක් පිළිබඳ විස්තර, සම්බන්ධතා පිළිබඳ ලේඛනයෙහි නොපමාව ම ඇතුළත් කරනු ලබන බවට ඒ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වගබලා ගත යුතු ය.

(6) මේ වගන්තිය උල්ලංඝනය කරමින් ප්‍රදානය කරනු ලබන හානිපූරණයක් බල රහිත විය යුතු ය.

(7) සමාගමක හෝ අනුයාත සමාගමක හෝ අධ්‍යක්ෂවරයකු හෝ සේවා නියුක්තයකු හෝ සඳහා රක්ෂණ ආවරණයක් සපයා දී ඇත්තා වූ ද, (4) වන උපවගන්තියේ හෝ (5) වන උපවගන්තියේ හෝ විධිවිධාන අනුව ක්‍රියා කර නොමැති වූ ද අවස්ථාවක, ඒ රක්ෂණ ආවරණය සපයන ලද අවස්ථාවේ දී එය සමාගම සඳහා සාධාරණ වූ බව ඒ අධ්‍යක්ෂවරයා හෝ සේවා නියුක්තයා හෝ විසින් ඔප්පු කරනු ලබන ප්‍රමාණයට හැර, ඒ රක්ෂණ ආවරණය සැපයීමේ වියදම සමාගමට ගෙවීමට ඒ අධ්‍යක්ෂවරයා හෝ සේවා නියුක්තයා පෞද්ගලිකව ම යටත් විය යුතු ය.

(8) මේ වගන්තියේ,—

"අධ්‍යක්ෂවරයා" යන්නට, හිටපු අධ්‍යක්ෂවරයකු ද ඇතුළත් වේ ;

"රක්ෂණ ආවරණය සැපයීම" යන්නට, කෙළින් ම හෝ අන්‍යාකාරයකින් හෝ වූ රක්ෂණ ආවරණයේ වියදම ගෙවීම ඇතුළත් වේ ;

"සේවා නියුක්තයා" යන්නට, හිටපු සේවා නියුක්තයකු ද ඇතුළත් වේ ;

"හානිපූරණය කිරීම" යන්නට, වගකීම උද්ගත වීමට පෙර හෝ පසුව හෝ වුව ද, වගකීමෙන් මුදාලීම හෝ නිදහස් කිරීම ඇතුළත් වන අතර, "හානිපූරණය" යන්නෙහි තදානුරූප අර්ථයක් ද ඇත්තේ ය.

වස්තු භංගත්වය පිළිබඳව අධ්‍යක්ෂවරයන් සතු යුතුකම.

**219**. (1) යම් සමාගමක් විසින් ගෙවිය යුතු ණය, එසේ ගෙවිය යුතු වන විට ගෙවීමට සමාගමට හැකියාවක් නොමැති යයි විශ්වාස කරන ඒ සමාගමේ අධ්‍යක්ෂවරයකු විසින්, සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගම සඳහා ඇවරකරුවකු හෝ අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ පත් කළ යුතු ද නැතහොත් සමාගමේ ව්‍යාපාර කටයුතු තවදුරටත් කර ගෙන යා යුතු ද යන්න සලකා බැලීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමක් නොපමාව කැඳවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් අධ්‍යක්ෂවරයකු, ඒ උපවගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ක්‍රියා කිරීම පැහැර හැරියා වූ ද, ඒ පැහැර හැරීම කරන ලද අවස්ථාවේ දී සමාගම විසින් ගෙවිය යුතු ණය එසේ ගෙවිය යුතු වන විට ගෙවීමට සමාගමට හැකියාවක්

නොමැති වූ ද, ඉන් අනතුරුව සමාගම ඈවරකිරීමට පාත්‍ර කොට ඇත්තා වූ ද අවස්ථාවක, සමාගම එහි ව්‍යාපාර කටයුතු දිගට ම කර ගෙන යාමේ ප්‍රතිඵලයක් වශයෙන් සමාගමේ ණය හිමියන්ට දැරීමට සිදු වූ යම් පාඩුවක් සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් හෝ ගෙවීමට ඒ අධ්‍යක්ෂවරයා යටත් වන බවට ආඥාවක්, ඈවරකරුගේ හෝ සමාගමේ ණය හිමියකුගේ හෝ ඉල්ලීම මත අධිකරණය විසින් නියම කරනු ලැබිය හැකි ය.

(3) පහත සඳහන් අවස්ථාවක දී, එනම්,—

(අ) ඈවරකරුවකු හෝ අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ පත් කිරීමට, (1) වන උපවගන්තිය යටතේ කැඳවන ලද රැස්වීමක දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගම ඈවර කිරීමට අධිකරණයට ඉදිරිපත් නොකිරීමට යෝජනා සම්මත කර ගනු නොලැබුවහොත් ;

(ආ) සමාගම විසින් ගෙවිය යුතු ණය, එසේ ගෙවිය යුතු වන විට ගෙවීමට සමාගමට හැකියාවක් නොමැති යයි විශ්වාස කිරීමට යුක්ති සහගත හේතු කිසිවක් එකී රැස්වීම පවත්වන ලද අවස්ථාවේ දී නොතිබුණේ නම් ; සහ

(ඇ) ඉන් අනතුරුව සමාගම ඈවර කිරීමට පාත්‍ර කරන ලද නම්,

සමාගම විසින් එහි ව්‍යාපාර කටයුතු දිගට ම කර ගෙන යාමේ ප්‍රතිඵලයක් වශයෙන් සමාගමේ ණය හිමියන්ට දැරීමට සිදු වූ යම් පාඩුවක් සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් හෝ ගෙවීමට, යට කී රැස්වීමට පැමිණ ඈවරකරුවකු හෝ අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ පත් කිරීමට පක්ෂව ඡන්දය දෙන ලද අධ්‍යක්ෂවරයන් නොවන අධ්‍යක්ෂවරයන් යටත් වන බවට ආඥාවක්, ඈවරකරුගේ හෝ සමාගමේ ණය හිමියකුගේ හෝ ඉල්ලීම මත අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.

තදබල ප්‍රාග්ධන පාඩුවක දී අධ්‍යක්ෂවරයන්ගේ යුතුකම්.

**220**. (1) යම් සමාගමක ශුද්ධ වත්කම් ඒ සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් හරි අඩකට වඩා අඩු බව යම් අවස්ථාවක දී ඒ සමාගමේ අධ්‍යක්ෂවරයකුට පෙනී යන්නේ නම්, ඒ බව ඒ අධ්‍යක්ෂවරයාට දැන ගැනීමට ලැබීමෙන් පසු වැඩ කරන දින විස්සක් ඇතුළත දී, මේ වගන්තියේ කාර්යය සඳහා ඒ සමාගමේ කොටස් හිමියන්ගේ අතිවිශේෂ මහා සභා රැස්වීමක් ඒ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කැඳවනු ලැබිය යුතු අතර, ඒ රැස්වීම, එසේ කැඳවනු ලැබූ දින සිට වැඩ කරන දින හතලිහක් පසුවීමට පෙර පවත්වනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ රැස්වීමක් කැඳවන දැන්වීමක් සමග,—

(අ) සමාගමට දැරීමට සිදු වී ඇති පාඩුවල ස්වභාවය හා ප්‍රමාණය ;

(ආ) සමාගමට දැරීමට සිදු වී ඇති පාඩුවලට හේතුව හෝ හේතු ;

(ඇ) එවැනි පාඩු තවදුරටත් සිදු වීම වැළැක්වීම සඳහා හෝ දැරීමට සිදු වූ පාඩු පිරිමසා ගැනීම සඳහා හෝ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පියවර කිසිවක් ගෙන ඇති නම් ඒ පියවර,

පිළිබඳව කොටස් හිමියන්ට දැනුම් දෙමින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිළියෙල කරන ලද වාර්තාවක් යවනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ කැඳවන ලද රැස්වීමක දී සාකච්ඡා කළ යුතු කටයුතු, අධ්‍යක්ෂවරයන් විසින් පිළියෙල කරන ලද වාර්තාව සහ සමාගමේ මූල්‍ය තත්වය පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා විය යුතු ය. ඒ වාර්තාවට සහ සාමාන්‍යයෙන් සමාගමේ කළමනාකරණයට අදාළ ප්‍රශ්න ඇසීමට සහ ඒ පිළිබඳව සාකච්ඡා කොට එහි ලා තම අදහස් දැක්වීමට යුක්තිසහගත අවස්ථාවක් කොටස් හිමියන්ට ලබා දීමට ඒ රැස්වීමේ මූලාසනය දරන තැනැත්තා වගබලා ගත යුතු ය.

(4) යම් සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලය (1) වන උපවගන්තියට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, දැනදැනම හා ඕනෑකමින් ම ඒ පැහැර හැරීමට බලය දෙන හෝ ඒ පැහැර හැරීම දිගටම කර ගෙන යාමට ඉඩ දෙන සෑම අධ්‍යක්ෂවරයකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙලක්ෂයක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

## ලේකම්වරයන්

**221**. (1) සෑම සමාගමක ම ලේකම්වරයකු සිටිය යුතු ය. ලේකම්වරයා.

(2) නියමිත ආකෘතියට අනුව යම් තැනැත්තකු විසින්,—

(අ) යම් සමාගමක ලේකම්වරයා වීමට ස්වකීය කැමැත්ත පළ කොට ඇත්නම් ; සහ

(ආ) 222 වන වගන්තිය යටතේ ඒ සමාගමට අදාළව නියම කර ඇති සුදුසුකම් තමාට ඇති බව සහතික කොට ඇත්නම්,

මිස, එවැනි තැනැත්තකු සමාගමක ලේකම්වරයා වශයෙන් පත් කරනු නොලැබිය යුතු ය.

(3) යම් සමාගමක් සංස්ථාගත කිරීම සඳහා ඉදිරිපත් කළ ඉල්ලුම් පත්‍රයක හෝ ඒකාබද්ධ කිරීම සඳහා ඉදිරිපත් කළ යෝජනාවක හෝ ඒ සමාගමේ ලේකම්වරයා වශයෙන් යම් තැනැත්තකු නම් කර ඇත්තේ ද ඒ තැනැත්තා අවස්ථාවෝචිත පරිදි, සමාගම සංස්ථාගත කරන ලද දිනයේ සිට හෝ ඒ ඒකාබද්ධ කිරීමේ යෝජනාව බලාත්මක කරනු ලබන දිනයේ සිට, මේ පනතේ යම් විධිවිධානයක් යටතේ හෝ ඒ සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ ඇතුළත් යම් විධිවිධානයක් යටතේ හෝ එම ධුරය දැරීම නතර කරන තෙක්, ඒ සමාගමේ ලේකම්වරයා වශයෙන් ධුරය දැරිය යුතු ය.

(4) සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියෙන් අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වා ඇත්නම් මිස, සමාගමේ ලේකම්වරයකු පත් කිරීමේ හෝ ලේකම්වරයකු ධුරයෙන් ඉවත් කිරීමේ හෝ බලය ඒ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට තිබිය යුතු ය.

ලේකම්වරයාගේ සුදුසුකම් නියම කළ යුතු බව.

**222**. මේ පනත යටතේ නියමිත ප්‍රමාණයක වූ පිරිවැටුමක් හෝ ප්‍රකාශිත ප්‍රාග්ධනයක් හෝ ඇත්තා වූ සෑම සමාගමක ම ලේකම්වරයා විසින් ඉටු කරනු ලැබිය යුතු කාර්යවල ස්වභාවය සැලකිල්ලට ගෙන නියම කරනු ලබන යම් සුදුසුකම් ඒ ලේකම්වරයාට තිබිය යුතු ය.

### අධ්‍යක්ෂවරයන් සහ ලේකම්වරයන් පිළිබඳ ලේඛනය

අධ්‍යක්ෂවරයන් සහ ලේකම්වරයන් පිළිබඳ ලේඛනය.

**223**. (1) සෑම සමාගමක් විසින් ම එහි අධ්‍යක්ෂවරයන් හා ලේකම්වරයන් පිළිබඳ ලේඛනයක් එහි ලියාපදිංචි කාර්යාලයෙහි හෝ 116 වන වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා වෙත දැනුම් දෙනු ලබන වෙනත් යම් ස්ථානයක තැබිය යුතු අතර, ඒ එක් එක් අධ්‍යක්ෂවරයා සහ ලේකම්වරයා සම්බන්ධයෙන් පහත දැක්වෙන විස්තර, ඒ ලේඛනයෙහි ඇතුළත් විය යුතු ය ; එනම්,

(අ) පුද්ගලයකු සම්බන්ධයෙන් වන විට, ඒ පුද්ගලයාගේ වර්තමාන නම සහ පෙළපත් නම, කලින් භාවිත කළ යම් නමක් හෝ පෙළපත් නමක්, සුපුරුදු පදිංචි ස්ථානයේ ලිපිනය සහ ව්‍යාපාර වෘත්තීය ;

(ආ) සංස්ථාවක ලේකම්වරයකු සම්බන්ධයෙන් වන විට, එහි සංස්ථාපිත නාමය සහ ලියාපදිංචි කළ හෝ ප්‍රධාන කාර්යාලය.

(2) පහත දැක්වෙන කාරණා පිළිබඳව, එනම්—

(අ) සමාගමේ අධ්‍යක්ෂවරයන් හෝ ලේකම්වරයා හෝ පිළිබඳ වෙනසක් සිදු වූ විට ඒ වෙනස ;

(ආ) සමාගමේ අධ්‍යක්ෂවරයකු හෝ ලේකම්වරයා හෝ පිළිබඳව ලේඛනයෙහි ඇතුළත් විස්තරවල යම් වෙනසක් සිදු වූ විට ඒ වෙනස,

පිළිබඳව දැන්වීමක්, ඒ වෙනස ලියාපදිංචි කිරීම සඳහා, නියමිත ආකෘතියට අනුව රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවීමට සමාගම වගබලාගත යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක—

(අ) ඒ වෙනස සිදු වූ දිනය නිශ්චිතව ම සඳහන් කර තිබිය යුතු ය ;

(ආ) අලුත් අධ්‍යක්ෂවරයකු හෝ ලේකම්වරයකු පත් කර ඇති අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි, 203 වන වගන්තිය හෝ 211 වන වගන්තියේ (2) වන උපවගන්තිය හෝ යටතේ ඉදිරිපත් කිරීමට නියම කර ඇති කැමැත්ත ප්‍රකාශ කිරීමේ ආකෘති පත්‍රය සහ සහතිකය ඒ දැන්වීමට අමුණා තිබිය යුතු ය ;

(ඇ) (i) අධ්‍යක්ෂවරයකු හෝ ලේකම්වරයා හෝ පත් කිරීමේ නැතහොත් ඉල්ලා අස්වීමේ වෙනසක් සිදුවීමෙන් ; හෝ

(ii) අධ්‍යක්ෂවරයකුගේ හෝ ලේකම්වරයාගේ හෝ මරණය සිදු වූ විටක හෝ අධ්‍යක්ෂවරයකු නැතහොත් රෙජිස්ට්‍රාර්වරයා පිළිබඳව ලේඛනයේ ඇතුළත් තොරතුරුවල වෙනසක් සිදු වූ විටක, ඒ වෙනස පිළිබඳව පළමුවරට සමාගමට දැනගන්නට ලැබීමෙන්,

අනතුරුව, වැඩ කරන දින විස්සක් ඇතුළත රෙජිස්ට්‍රාර්වරයා වෙත භාර දෙනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ නියම අනුව ක්‍රියා කිරීම සමාගමක් විසින් පැහැර හැර ඇති අවස්ථාවක,—

(අ) සමාගම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය ; තව ද

(ආ) පැහැර හැරීම කරන ලද, සමාගමේ සෑම නිලධරයකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

## පීඩාකාරීත්වය සහ අයථා කළමනාකරණය වැළැක්වීම

පීඩාකාරීත්වය.

**224**. (1) යම් සමාගමක කටයුතු යම් කොටස් හිමියකුට හෝ කොටස් හිමියන්ට හෝ පීඩාකාරී ලෙස කර ගෙන යනු ලබන බවට ඒ සමාගමට විරුද්ධව පැමිණිල්ලක් ඇති (යම් පැමිණිල්ලක් කරන කොටස් හිමියා හෝ කොටස් හිමියන් ඇතුළුව) යම් කොටස් හිමියකු හෝ කොටස් හිමියන් විසින් 226 වන වගන්තියේ විධිවිධානවලට යටත් ව, මේ වගන්තියේ විධිවිධාන යටතේ ආඥාවක් ලබා ගැනීම සඳහා අධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ ඉදිරිපත් කරන ලද යම් ඉල්ලීමක් මත, යම් සමාගමක කටයුතු ඒ සමාගමේ යම් කොටස් හිමියකුට හෝ කොටස් හිමියන්ට හෝ පීඩාකාරී ලෙස කර ගෙන යනු ලබන බව අධිකරණයේ මතය වන අවස්ථාවක, චෝදනා කරන ලද කාරණා සඳහා ප්‍රතිකර්ම යෙදීම අරමුණු කොට ගෙන සුදුසු යයි අධිකරණය කල්පනා කරන ආඥාවක් අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.

(3) අධිකරණය විසින් අවසාන ආඥාවක් කරන තුරු නීති කෘත්‍යයට අදාළ පාර්ශ්වයන් විසින් කරනු ලබන ඉල්ලීමක් මත, සාධාරණ හා යුක්ති සහගත බවට අධිකරණයට පෙනී යන නියම හා කොන්දේසි මත සමාගමේ කටයුතු පවත්වාගෙන යාම විධිමත් කිරීම සඳහා අවශ්‍ය යයි අධිකරණය කල්පනා කරන අතුරු ආඥාවක් අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය. මේ යටතේ කරනු ලබන යම් අතුරු ආඥාවකට 521 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

අයථා කළමනාකරණය.

**225**. (1) 226 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව—

(අ) සමාගමේ කටයුතු, සමාගමේ යහපතට අහිතකර වන අන්දමට කරගෙන යනු ලබන බවට ; හෝ

(ආ) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ වෙනස්වීමකින් හෝ එහි අනුනියෝජිතයා හෝ ලේකම්වරයා හෝ වෙනස්වීමකින් හෝ එහි අනුයෝජිතයා හෝ ලේකම්වරයා හෝ වශයෙන් කටයුතු කරන ව්‍යාපාර ආයතනයේ නැතහොත් සංස්ථාවේ සංයුතියේ හෝ පාලනයේ හෝ වෙනස්වීමකින් හෝ සමාගමේ කොටස්වල අයිතියෙහි වෙනස්වීමකින් හෝ වෙනත් කවර හෝ ආකාරයක වෙනස්වීමකින් හෝ (සමාගමේ ණය පත්‍ර දරන්නන් හෝ යම් පන්තියක කොටස් හිමියන් ඇතුළුව ණය හිමියන් කිසිවකු විසින් හෝ ඔවුන්ගේ යහපත පිණිස හෝ ඒ විෂයෙහි සිදු කරන

ලද වෙනස් කිරීමක් නොවන) සමාගමේ කළමනාකරණයෙහි හෝ පාලනයෙහි හෝ සැලකිය යුතු වෙනස් කමක් සිදු වී ඇති බවට සහ ඒ වෙනස්වීමේ හේතුවෙන් සමාගමේ යහපතට අහිතකර වන අන්දමට එහි කටයුතු පවත්වා ගෙන යනු ලැබිය හැකි බවට,

පැමිණිල්ලක් ඇති සමාගමක යම් කොටස් හිමියකු හෝ කොටස් හිමියන් හෝ විසින්, මේ වගන්තියේ විධිවිධාන යටතේ වූ ආඥාවක් කරන ලෙස, අධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ ඉදිරිපත් කරන ලද යම් ඉල්ලීමක් මත, ඒ සමාගමේ කටයුතු (1) වන උපවගන්තියේ සඳහන් පරිදි කරගෙන යන බව හෝ ඒ සමාගමේ කළමනාකරණයෙහි හෝ පාලනයෙහි ඒ උපවගන්තියේ සඳහන් පරිදි යම් වැදගත් වෙනස්වීමක් ඇති වීම හේතු කොට ගෙන ඒ සමාගමේ කටයුතු ඉහත සඳහන් අයුරු කිරීමට ඉඩ ඇති බව අධිකරණයේ මතය වූයේ නම් පැමිණිලි කරනු ලැබූ හෝ සැක කරනු ලැබූ කරුණුවලට ප්‍රතිකර්ම කිරීමේ හෝ ඒවා වළක්වාලීමේ අදහසින් සුදුසු යයි අධිකරණය අදහස් කරන ආඥාවක් අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.

(3) අධිකරණය විසින් අවසාන ආඥාවක් කරන තුරු නීති කෘත්‍යයට අදාළ පාර්ශ්වයන් විසින් කරනු ලබන ඉල්ලීමක් මත, සාධාරණ හා යුක්ති සහගත බවට අධිකරණයට පෙනී යන නියම හා කොන්දේසි මත සමාගමේ කටයුතු පවත්වාගෙන යාම විධිමත් කිරීම සඳහා අවශ්‍ය යයි අධිකරණය කල්පනා කරන අතුරු ආඥාවක් අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය. මේ පනත යටතේ කරනු ලබන යම් අතුරු ආඥාවකට 521 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

අධිකරණය වෙත ඉල්ලීමක් කළ හැක්කේ කවරකු විසින් ද යන වග.

**226**. (1) 224 වන වගන්තිය හෝ 225 වන වගන්තිය හෝ යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට පූර්වයෙන් වූ මාස හයක කාල පරිච්ඡේදය තුළ දී කවර වේලාවක වුව ද,—

(අ) කොටස් හිමියන්ගේ මුළු සංඛ්‍යාවෙන් සියයට පහකට නොඅඩු සංඛ්‍යාවක් සංයුක්ත වූ ; හෝ

(ආ) සමාගමේ මහා සභා රැස්වීමක දී ඡන්ද සියයට පහකට නොඅඩු අයිතිවාසිකම හිමි කොටස් සංඛ්‍යාවක් දැරූ,

කොටස් හිමියකු හෝ කොටස් හිමියන් හෝ විසින් පමණක් එවැනි ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා කොටස් කිසිවක් තැනැත්තන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් විසින් හවුලේ දරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තන් එක් කොටස් හිමියකු ලෙස පමණක් සලකනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට සමාගමක කොටස් හිමියන් කීපදෙනකුට හිමිකම ඇති අවස්ථාවක දී, ඔවුන් අතුරෙන් කවර හෝ කොටස් හිමියකු හෝ කොටස් හිමියන් ඊට වැඩි සංඛ්‍යාවක් හෝ විසින්, ඉතුරු කොටස් හිමියන්ගෙන් ලබාගත් ලිඛිත කැමැත්ත ඇතිව, ඔවුන් සියලුදෙනා ම වෙනුවෙන් සහ ඔවුන් සියලු දෙනාගේ ම ප්‍රතිලාභය සඳහා ඒ ඉල්ලීම ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(4) 224 වන වගන්තියේ හෝ 225 වන වගන්තියේ හෝ විධිවිධාන යටතේ පරීක්ෂණයක් අවසන් කරනු ලැබීමෙන් පසු, ඒ ඉල්ලීම ඉදිරිපත් කළ සමාගමේ කොටස් හිමියා හෝ කොටස් හිමියන් හෝ විසින් ඒ ඉල්ලීම ඉදිරිපත් කොට ඇත්තේ පීඩා කිරීමේ අදහසින් හෝ යුක්තිසහගත හෝ ශක්‍ය හේතුවක් නොමැතිව හෝ බව අධිකරණය විසින් තීරණය කරනු ලබන අවස්ථාවක, නඩු ගාස්තු ගෙවීම සම්බන්ධයෙන් ඒ කොටස් හිමියාට හෝ කොටස් හිමයන්ට හෝ විරුද්ධව කරනු ලබන යම් තීරණයකට අමතරව, ඒ ආඥාව කළ දින සිට අධිකරණය විසින් නියම කරනු ලබන අවුරුදු පහක් නොඉක්මවන කාලයක් තුළ දී ඒ සමාගමේ අධ්‍යක්ෂවරයකු හෝ අනුයෝජිතයකුගේ ලේකම්වරයා හෝ කළමනාකරු හෝ වශයෙන් පත් කරනු ලැබීමට ඒ කොටස් හිමියා හෝ කොටස් හිමියන් හෝ නුසුදුසු බවට අධිකරණය විසින් විධාන කරනු ලැබිය හැකි ය ; නැතහොත් ඉහත සඳහන් කාලය තුළ දී සමාගමේ යම් රැස්වීමක් කැඳවීමේ හෝ කැඳවීමට ඉල්ලා සිටීමේ හෝ අයිතිය හෝ, සමාගමේ යම් රැස්වීමක දී පෞද්ගලිකව පැමිණ සිටීමට හෝ ප්‍රතියුක්තයකු මගින් පෙනී සිටීමට හෝ අත් එසවීමෙන්, ඡන්දය ප්‍රකාශ කිරීමට හෝ ඡන්දය විමසීමක දී පෞද්ගලිකව හෝ ප්‍රතියුක්තයකු මගින් හෝ ඡන්දය දීමට අයිතිය ඒ කොටස් හිමියාට හෝ කොටස් හිමියන්ට නොමැති බවට අධිකරණය විසින් විධාන කරනු ලැබිය හැකි ය.

ගණන් බේරා වසා දැමීමේ නඩු කටයුතු පවතින විට 224 වන වගන්තිය හෝ 225 වන වගන්තිය හෝ යටතේ ක්‍රියා කිරීමට අධිකරණයට ඇති බලය.

**227**. XII වන කොටසේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, සමාගමක් පිළිබඳව ගණන් බේරා වසා දැමීමේ නඩු කටයුතු පවතින කවර හෝ අවස්ථාවක, ඒ සමාගම ගණන් බේරා වසා දැමීම, ඒ සමාගමේ කොටස් හිමියකුගේ සම්බන්ධතාවලට අහිතකර බව අධිකරණයේ මතය වන විටක, 224 වන වගන්තියේ හෝ 225 වන වගන්තියේ හෝ විධිවිධාන යටතේ අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබ තිබුණේ නම්, ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරනු ලබන ආකාරයට ම ඒ වගන්ති දෙකින් කවර හෝ වගන්තියක විධිවිධාන යටතේ ඒ අධිකරණය විසින් ක්‍රියා කරනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය.

**228**. 224 වන වගන්තියෙන් හෝ 225 වන වගන්තියෙන් හෝ අධිකරණය වෙත පවරා දී ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, එකී වගන්ති දෙකින් කවර හෝ වගන්තියක් යටතේ කරනු ලබන ආඥාවකින්,— 224 වන වගන්තිය හෝ 225 වන වගන්තිය හෝ යටතේ වූ ඉල්ලීමක දී අධිකරණයට ඇති බලය.

(අ) අනාගතයේ දී සමාගමේ කටයුතු කර ගෙන යාම විධිමත් කිරීම සඳහා ;

(ආ) සමාගමේ කොටස් හිමියන් කිසිවකුගේ කොටස් හෝ සම්බන්ධතා, සමාගමේ සෙසු කොටස් හිමියන් හෝ සමාගම හෝ විසින් මිලට ගනු ලැබීම සඳහා ;

(ඇ) සමාගම එක් පාර්ශ්වයකට ද පහත දැක්වෙන තැනැත්තන්ගෙන් කිසිවකු, එනම්,—

(i) කළමනාකාර අධ්‍යක්ෂවරයා ;

(ii) වෙනත් යම් අධ්‍යක්ෂවරයකු ;

(iii) අධ්‍යක්ෂ මණ්ඩලය ;

(iv) අනුයෝජිතයා හෝ ලේකම්වරයා ; හෝ

(v) කළමනාකාරවරයා,

අනෙක් පාර්ශ්වයටද බැඳී කවරාකාරයකින් හෝ ඇතුළත් වී තිබුණු යම් ගිවිසුමක්, අවස්ථානුගත සියලු කරුණු අනුව, සාධාරණ යයි හා සාධාරණීය යයි අධිකරණයේ මතය වන යම් නියම හා කොන්දේසි මත, අවසන් කිරීම, අවලංගු කිරීම හෝ සුළු වශයෙන් වෙනස් කිරීම සඳහා ;

(ඈ) සමාගම සහ ඉහත (ඇ) ඡේදයෙහි සඳහන් තැනැත්තකු නොවන යම් තැනැත්තකු අතර ඇති කර ගෙන තිබුණු යම් ගිවිසුමක් අවස්ථානුගත සියලු කරුණු අනුව සාධාරණ යයි හා සාධාරණීය යයි අධිකරණයේ මතය වන යම් නියම හා කොන්දේසි මත අවසන් කිරීම, අවලංගු කිරීම හෝ සුළු වශයෙන් වෙනස් කිරීම සඳහා එහෙත්, එවැනි කිසිම ගිවිසුමක් සෑම විටක දී ම අදාළ පාර්ශ්වයට යථා පරිදි දැනුම්දීමෙන් පසුව සහ කරුණු ඉදිරිපත් කිරීමට ඒ තැනැත්තාට අවස්ථාවක් ලබා දීමෙන් පසුව හැර, අවසන් කිරීම, අවලංගු කිරීම හෝ සුළු වශයෙන් වෙනස් කිරීම හෝ කරනු නොලැබිය යුතු ය ;

(ඉ) අවස්ථාවෝචිත පරිදි, ඉල්ලීම කරන ලද දිනයට හෝ ගණන් බේරා වසා දැමීමේ නඩු කටයුතු ආරම්භ කරන ලද දිනයට හෝ පෙරාතුව ම වූ මාස තුනක කාලය ඇතුළත දේපළවලට අදාළව සමාගම විසින් හෝ සමාගමට එරෙහිව හෝ සිදු කරන ලද්දා වූ යම් පැවරීමක්, භාණ්ඩ ගෙනවුත් භාරදීමක්, ගෙවීමක්, ලියා අත්සන් කිරීමක් හෝ වෙනත් යම් ක්‍රියාවක් අවලංගු කිරීමක් කෙසේ ද යත්, ඒ සිදු කිරීම යම් තැනැත්තකු විසින් හෝ යම් තැනැත්තකුට විරුද්ධව හෝ කරන ලද්දේ නම්, ඔහුගේ වස්තු භංගත්වය පිළිබඳ කාරණයක දී වංචනික වරණීයත්වය ලෙස සලකනු ලබන්නේ නම් එවැනි පැවරීමක්, භාණ්ඩ ගෙනවුත් භාරදීමක්, ගෙවීමක්, ලියා අත්සන් කිරීමක් හෝ වෙනත් යම් ක්‍රියාවක් අවලංගු කිරීම සඳහා ; සහ

(ඊ) අධිකරණයේ මතය අනුව, විධිවිධාන සැලැස්වීම සාධාරණ හා සාධාරණීය වන වෙනත් යම් කාරණයක් සඳහා,

විධිවිධාන සලස්වනු ලැබිය හැකි ය.

224 වන වගන්තිය හෝ 225 වන වගන්තිය හෝ යටතේ වූ ආඥාවකින් සමාගමේ ව්‍යවස්ථාවලිය වෙනස් කිරීමේ බලපෑම.

**229**. (1) 224 වන වගන්තියේ හෝ 225 වන වගන්තියේ හෝ විධිවිධාන යටතේ වූ ආඥාවකින් සමාගමේ ව්‍යවස්ථාවලියට යම් වෙනස් කිරීමක් සිදු කර ඇති අවස්ථාවක, මේ පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද ඒ නොතකා, ඒ ආඥාවෙන් යම් ප්‍රමාණයකට අවසර දී ඇත්නම් ඒ ප්‍රමාණයට හැර, ඒ ආඥාවට අනනුකූල වන කවර හෝ වෙනස් කිරීමක් අධිකරණයේ අවසරය නොමැතිව ව්‍යවස්ථාවලියට කිරීමට සමාගමට බලය නොමැත්තේ ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, එකී ආඥාව මගින් කරන ලද වෙනස් කිරීම්, මේ පනතේ විධිවිධානවලට අනුකූලව සමාගම විසින් යථා පරිදි කරනු ලැබූ පරිද්දෙන් ඒ අකාරයට ම බලපැවැත්විය යුතු අතර, එසේ වෙනස් කරන ලද ව්‍යවස්ථාවලියට එම විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය.

(3) සමාගමක ව්‍යවස්ථාවලිය වෙනස් කරන හෝ වෙනස් කිරීමට අවසර දෙන සෑම ආඥාවක ම සහතික කළ පිටපතක්, ඒ ආඥාව කිරීමෙන් පසු වැඩ කරන දින දහයක් ඇතුළත සමාගම විසින් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, රෙජිස්ට්‍රාර්වරයා විසින් එය ලියා පදිංචි කරනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක,—

(අ) සමාගම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඬයකට යටත් විය යුතු ය ; තව ද

(ආ) පැහැර හැරීම කරන ලද සමාගමේ සෑම නිලධරයකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් පනස් දහසක් නොඉක්මවන දඬයකට යටත් විය යුතු ය.

224 වන වගන්තිය හෝ 225 වන වගන්තිය හෝ යටතේ වූ ඉල්ලීමකට වගඋත්තරකරුවන් එකතු කිරීම.

**230**. 224 වන වගන්තියේ හෝ 225 වන වගන්තියේ හෝ විධිවිධාන යටතේ ඉදිරිපත් කරන ලද යම් ඉල්ලීමකට වගඋත්තරකරුවකු වශයෙන් නම් කර නොමැති සමාගමක කළමනාකාර අධ්‍යක්ෂවරයා, හෝ වෙනත් යම් අධ්‍යක්ෂවරයකු හෝ අනුයෝජිතයා හෝ ලේකම්වරයා හෝ කළමනාකාරවරයා හෝ වෙනත් යම් තැනැත්තකු හෝ විසින් ඒ ඉල්ලීමට තමා වගඋත්තරකරුවකු ලෙස එකතු කරන මෙන් ඉල්ලා සිටින අවස්ථාවක, එසේ කිරීමට ප්‍රමාණවත් හේතු ඇති බවට අධිකරණය සෑහීමට පත් වන්නේ නම්, ඔහු ඒ අනුව, වගඋත්තරකරුවකු ලෙස එකතු කරන මෙන් අධිකරණය විසින් විධාන කරනු ලැබිය හැකි ය.

ඇතැම් ගිවිසුම් අවසන් කිරීමේ හෝ සුළු වශයෙන් වෙනස් කිරීමේ ප්‍රතිඵල.

**231**. (1) 228 වන වගන්තියේ (ඈ) ඡේදයේ හෝ (ඉ) ඡේදයේ සඳහන් කරනු ලැබූ අන්දමේ ගිවිසුමක්, 224 වන වගන්තිය හෝ 225 වන වගන්තිය හෝ යටතේ අධිකරණයක් විසින් කරන ලද ආඥාවක් මගින් අවසන් කරනු ලබන, අවලංගු කරනු ලබන හෝ සුළු වශයෙන් වෙනස් කරනු ලබන අවස්ථාවක,—

(අ) ඒ ගිවිසුම ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් හෝ ධුරය අහිමිවීම වෙනුවෙන් නැතහොත් වෙනත් යම් ආකාරයකින් අලාභහානි හෝ වන්දි ලබා ගැනීම සඳහා යම් තැනැත්තකු විසින් සමාගමට එරෙහිව කවර ආකාරයක හිමිකම් පෑමක් ඉදිරිපත් කිරීමට ඒ ආඥාවෙන් ඉඩ නොතැබිය යුතු ය; තව ද

(ආ) එසේ තම ගිවිසුම අවසාන කරනු ලැබූ හෝ අවලංගු කරනු ලැබූ කළමනාකාර අධ්‍යක්ෂවරයකු හෝ වෙනත් අධ්‍යක්ෂවරයකු හෝ අනුයෝජිතයකු හෝ ලේකම්වරයා හෝ කළමනාකාරවරයා සහ ගිවිසුම අවසාන කිරීමේ හෝ අවලංගු කිරීමේ හෝ ආඥාව කරන ලද දිනයේ දී ඒ අනුයෝජිතයාගේ හෝ ලේකම්වරයාගේ හෝ ආශ්‍රිතයකුව සිටියා වූ හෝ අනතුරුව

ආශ්‍රිතයකු වන්නා වූ තැනැත්තකු, ගිවිසුම අවසන් කිරීමේ ආඥාවේ දින සිට අවුරුදු පහක කාලයක් තුළ, අධිකරණයේ අවසරය ඇතිව මිස, ඒ සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂවරයා හෝ වෙනත් අධ්‍යක්ෂවරයකු හෝ අනුයෝජිතයකු හෝ ලේකම්වරයා හෝ කළමනාකාරවරයා වශයෙන් පත් කිරීම හෝ එලෙස ක්‍රියා කිරීම හෝ නොකළ යුතු ය.

(2) (අ) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන උල්ලංඝනය කරමින් යම් සමාගමක කළමනාකාර අධ්‍යක්ෂවරයා හෝ වෙනත් අධ්‍යක්ෂවරයකු හෝ අනුයෝජිතයකු හෝ ලේකම්වරයා හෝ කළමනාකාරවරයා හෝ ලෙස දැන දැනම ක්‍රියා කරන කවර හෝ තැනැත්තකු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් මිලියනයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(ආ) මේ වගන්තියේ විධිවිධාන යටතේ වූ වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබූ අවස්ථාවක—

(i) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකු ම සහ නිලධරයකු ම ;

(ii) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් නම්, ඒ ව්‍යාපාර ආයතනයේ සෑම හවුල් කරුවකුම,

ඒ වරද සඳහා වරදකරුවකු ලෙස සලකනු ලැබිය යුතු ය :

එසේ වුවද ඒ යම් තැනැත්තකු විසින් වරද සිදු කරන ලද්දේ තම දැනුම නොමැතිව බව හෝ ඒ වරද සිදු කිරීම වැළැක්වීම සඳහා තමා නිසි සියලු උද්යෝගයෙන් ක්‍රියා කළ බව, ඔප්පු කරනු ලැබුවහොත්, ඒ තැනැත්තා ඒ වරද සම්බන්ධයෙන් වරදකරු යයි සලකනු නොලැබිය යුතු ය.

"කොටස් හිමියා" යන්නෙහි ව්‍යාප්ත අර්ථය.

**232**. 224 වන වගන්තියේ සිට 228 වන වගන්තිය තෙක් වූ වගන්තිවල **"කොටස් හිමියකු"** සම්බන්ධයෙන් කර ඇති සඳහන් කිරීමකට—

(අ) කොටස් හිමියකු මිය යාමෙන් කොටස්වල අයිතිය පැවරුණු තැනැත්තෙක් ;

(ආ) මියගිය කොටස් හිමියකුගේ පොල්මෑකරු හෝ අද්මිනිස්ත්‍රාසිකරු; හෝ

(ඇ) 224 වන වගන්තිය හෝ 225 වන වගන්තිය හෝ යටතේ ඉල්ලීමක් කරනු ලැබීමට පෙරාතුව වූ මාස හයක කාලය තුළ කවර හෝ අවස්ථාවක කොටස් හිමියකුව සිටියා වූ තැනැත්තෙක්,

සම්බන්ධයෙන් කරන ලද සඳහන් කිරීමක් ද ඇතුළත් විය යුතු ය.

### වැළැක්වීමේ ආඥා

**233**. (1) මේ වගන්තිය යටතේ කරනු ලබන ඉල්ලීමක් මත, අධිකරණය විසින්, සමාගමක සාංගමික ව්‍යවස්ථාවලිය හෝ මේ පනතේ යම් විධිවිධානයක් හෝ උල්ලංඝනය වන ආකාරයේ ක්‍රියා කලාපයක නිරතවීමට බලාපොරොත්තු වන යම් සමාගමක් හෝ සමාගමක අධ්‍යක්ෂවරයකු හෝ එම ක්‍රියා කලාපයේ නිරතවීමෙන් වළක්වාලමින් ආඥාවක්, කරනු ලැබිය හැකි ය. වැළැක්වීමේ ආඥා.

(2) එවැනි ඉල්ලීමක්,—

(අ) සමාගම විසින්; හෝ

(ආ) සමාගමේ අධ්‍යක්ෂවරයකු හෝ කොටස් හිමියකු හෝ විසින්,

කරනු ලැබිය යුතු ය.

(3) අධිකරණය විසින් (1) වන උපවගන්තිය යටතේ ආඥාවක් කරනු ලබන විට, සුදුසු යයි අධිකරණය කල්පනා කරන යම් ආනුෂංගික සහන ද අධිකරණය විසින් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(4) එවකටත් සිදු කොට සම්පූර්ණ කර ඇති ක්‍රියා කලාපයක් හෝ ක්‍රියා කලාප පටිපාටියක් සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ ආඥාවක් කරනු නොලැබිය යුතු ය.

(5) අධිකරණය විසින් (1) වන උපවගන්තිය යටතේ වූ ඉල්ලීමක් පිළිබඳව අවසාන වශයෙන් තීරණය කිරීමට පෙර කවර හෝ අවස්ථාවක, ඒ උපවගන්තිය යටතේ කිරීමට අධිකරණයට බලය පවරා ඇති යම් ආඥාවක් අතුරු ආඥාවක් වශයෙන් කරනු ලැබිය හැකි ය. එවැනි ආඥාවක් අධිකරණයේ මතය පරිදි ඒකපාක්ෂිකව වගඋත්තරකරුට දැනුම් දීමක් කිරීමෙන් පසුව හෝ කරනු ලැබිය හැකි ය. ඒකපාක්ෂිකව කරන ලද

ආඥාවක් ප්‍රත්‍යාදිෂ්ට කරන ලෙස හෝ වෙනස් කරන ලෙස හෝ ඉල්ලීමක්, පෙත්සම්කරුට දැනුම් දීමක් කිරීමෙන් වගඋත්තරකරු විසින් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(6) මේ වගන්තිය යටතේ කරනු ලබන අතුරු ආඥාවකට 521 වන වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

## ව්‍යුත්පන්න නඩු

ව්‍යුත්පන්න නඩු.

**234**. (1) මේ වගන්තියේ (3) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, සමාගමක කොටස් හිමියකුගේ හෝ අධ්‍යක්ෂවරයකුගේ හෝ ඉල්ලීම පිට,—

(අ) සමාගමේ නාමයෙන් සහ සමාගම වෙනුවෙන් හෝ ඒ සමාගමේ යම් පාලිත සමාගමක නාමයෙන් සහ ඒ පාලිත සමාගම වෙනුවෙන් හෝ නඩු කටයුතු පැවරීමට ; හෝ

(ආ) සමාගම හෝ යම් පාලිත සමාගමක් හෝ පාර්ශ්වකරුවකු වන නඩු කටයුතුවල දී, අවස්ථාවෝචිත පරිදි, සමාගම හෝ පාලිත සමාගම හෝ වෙනුවෙන් ඒ නඩු කටයුතු පවත්වා ගෙන යාමේ, විත්තිවාචක ඉදිරිපත් කිරීමේ නඩු කටයුතු අත්හිටුවීමේ කාර්යය සඳහා ඒ නඩු කටයුතුවලට මැදිහත්වීමට,

අවසරය ඒ කොටස් හිමියාට හෝ අධ්‍යක්ෂවරයාට අධිකරණය විසින් දෙනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අධිකරණයක් වෙත පවරා දෙන ලද බලතල සීමා නොකොට, ඒ උපවගන්තිය යටතේ අවසර දිය යුතු ද, නොදිය යුතු ද යන වග තීරණය කිරීමේ දී—

(අ) නඩු කටයුතු සාර්ථකවීමට ඇති හැකියාව ;

(ආ) ලබා ගැනීමට හැකි විය හැකි සහනවලට සාපේක්ෂව නඩු කටයුතු සඳහා දැරිය යුතු වන වියදම ;

(ඇ) සහන ලබා ගැනීම සඳහා සමාගම හෝ පාලිත සමාගම හෝ විසින් එවකටත් ගෙන ඇති යම් පියවර ;

(ඈ) අවස්ථාවෝචිත පරිදි, නඩු කටයුතු ආරම්භ කිරීම, පවත්වා ගෙන යාම, විත්තිවාචක ඉදිරිපත් කිරීම හෝ නඩු කටයුතු අත්හිටුවීම සම්බන්ධයෙන් සමාගමට හෝ පාලිත සමාගමට ඇති සම්බන්ධතාව,

අධිකරණය විසින් සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

(3) පහත සඳහන් කරුණු සම්බන්ධයෙන්, එනම්,—

(අ) අවස්ථාවෝචිත පරිදි, නඩු කටයුතු පැවරීමට, උද්යෝගිමත් ලෙස පවත්වාගෙන යාමට, විත්ති වාචක ඉදිරිපත් කිරීමට හෝ නඩු කටයුතු අත්හිටුවීමට සමාගම හෝ පාලිත සමාගම හෝ අදහස් නොකරන බවට ; හෝ

(ආ) සමස්තයක් වශයෙන් අධ්‍යක්ෂවරයන්ට හෝ කොටස් හිමියන්ගේ තීරණයකට නඩු කටයුතු පවත්වා ගෙන යාමට ඉඩ නොදීම සමාගමේ හෝ පාලිත සමාගමේ හෝ යහපත පිණිස වන බවට,

අධිකරණය සෑහීමට පත් වේ නම් සමහරක් (1) වන උපවගන්තිය යටතේ නඩු කටයුතු පැවරීමට හෝ නඩුකටයුතුවලට මැදිහත්වීමට හෝ අවසර දෙනු ලැබිය හැකි ය.

(4) ඉල්ලීම පිළිබඳ දැන්වීම, අවස්ථාවෝචිත පරිදි, සමාගම හෝ පාලිත සමාගම හෝ වෙත භාර දෙනු ලැබිය යුතු ය.

(5)සමාගමට හෝ පාලිත සමාගමට හෝ අධිකරණයෙහි පෙනී සිට කරුණු ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, අවස්ථාවෝචිත පරිදි, නඩු කටයුතු පැවරීමට, පවත්වා ගෙන යාමට, විත්තිවාචක ඉදිරිපත් කිරීමට හෝ නඩු කටයුතු අත්හිටුවීමට එය අදහස් කරන්නේ ද, නොකරන්නේ ද යන වග අධිකරණය වෙත දැනුම් දිය යුතු ය.

(6) මේ වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, සමාගමේ හෝ පාලිත සමාගමේ නාමයෙන් හෝ එය වෙනුවෙන් හෝ යම් නඩු කටයුතු පැවරීමට හෝ නඩු කටයුතුවලට මැදිහත්වීමට සමාගමක කොටස් හිමියකුට හෝ අධ්‍යක්ෂවරයකුට හෝ හිමිකම නොමැත්තේ ය.

*ව්‍යුත්පන්න නඩුවකට අදාළ නඩු ගාස්තු සමාගම විසින් දැරිය යුතු බව.*

**235**. නඩු කටයුතු පැවරීමට හෝ නඩු කටයුතුවලට මැදිහත්වීමට හෝ 234 වන වගන්තිය යටතේ අවසරය දෙනු ලැබ ඇති කොටස් හිමියකු හෝ අධ්‍යක්ෂවරයකු හෝ විසින් කරනු ලබන ඉල්ලීමක් මත, අධිකරණය විසින් 237 වන වගන්තිය යටතේ අනුමත කරනු ලැබූ යම් බේරුම් කර ගැනීමකට, සමථයකට පත්කර ගැනීමකට හෝ නතර කිරීමකට අදාළ නඩු ගාස්තු ද ඇතුළුව නඩු කටයුතු පැවරීමෙහි ලා හෝ නඩු කටයුතු පැවරීමෙහි මැදිහත්වීමෙහි ලා දරන ලද යුක්ති සහගත නඩු ගාස්තු සම්පූර්ණයෙන් ම හෝ ඉන් යම් කොටසක් හෝ සමාගම විසින් දැරිය යුතු යයි අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි ය.

අවසර දී ඇති අවස්ථාවක අධිකරණය සතු බලය.

**236**. අවස්ථාවෝචිත පරිදි, කොටස් හිමියකු හෝ අධ්‍යක්ෂවරයකු හෝ විසින් **234** වන වගන්තිය යටතේ අධිකරණයේ අවසරය ඇතිව පවරන ලද හෝ මැදිහත් වන ලද නඩු කටයුතුවලට අදාළව සුදුසු යයි අධිකරණය කල්පනා කරන කවර හෝ ආඥාවක් කවර හෝ වේලාවක අධිකරණය විසින් කරනු ලැබිය හැකි අතර, මේ වගන්තිය යටතේ පවරා දී ඇති බලතලවල ව්‍යාප්තියට හානියකින් තොරව, අධිකරණය විසින්,—

(අ) නඩු කටයුතු පවත්වා ගෙන යාම පාලනය කිරීමට කොටස් හිමියකුට හෝ වෙනත් යම් තැනැත්තකුට හෝ බලය දෙමින් ආඥාවක් කළ හැකි ය ;

(ආ) නඩු කටයුතු පවත්වාගෙන යාම සම්බන්ධයෙන් විධාන නිකුත් කළ හැකි ය ;

(ඇ) නඩු කටයුතුවලට අදාළව තොරතුරු සපයන ලෙස හෝ සහාය ලබාදෙන ලෙස සමාගමට හෝ අධ්‍යක්ෂවරයන්ට හෝ නියම කරමින් ආඥාවක් කළ හැකි ය ;

(ඈ) විත්තිකරුවකු විසින් ගෙවිය යුතු බවට නඩු කටයුතුවල දී ආඥා කරන ලද යම් මුදල් ප්‍රමාණයක්, සම්පූර්ණයෙන් ම, හෝ ඉන් යම් කොටසක් අවස්ථාවෝචිත පරිදි, සමාගමට හෝ එහි පාලිත සමාගමට හෝ ගෙවනු වෙනුවට, සමාගමේ හෝ එහි පාලිත සමාගමේ හිටපු කොටස් හිමියන්ට හෝ වර්තමාන කොටස් හිමියන්ට හෝ ගෙවන ලෙස විධාන කරමින් ආඥාවක් කළ හැකි ය.

ව්‍යුත්පන්න නඩුවක් සමථයකට පත් කර ගැනීම, බේරුම් කර ගැනීම හෝ නතර කිරීම.

**237**. 234 වන වගන්තිය යටතේ අධිකරණයේ අවසරය ඇතිව, අවස්ථාවෝචිත පරිදි, කොටස් හිමියකු හෝ අධ්‍යක්ෂවරයකු හෝ විසින් පවරන ලද හෝ මැදිහත් වන ලද නඩු කටයුතු, අධිකරණයේ අනුමතය නොමැතිව බේරුම් කර ගැනීම, සමථයකට පත් කර ගැනීම හෝ නතර කිරීම කරනු නොලැබිය යුතු ය.

## ස්ථිර කිරීම

අධ්‍යක්ෂවරයන්ගේ ඇතැම් ක්‍රියා ස්ථිර කිරීම.

**238**. (1) කොටස් හිමියන් වෙත හෝ වෙනත් යම් තැනැත්තකු වෙත සතුව ඇති බලයක් විෂයයෙහි ලා සමාගමක අධ්‍යක්ෂවරයකු හෝ අධ්‍යක්ෂ මණ්ඩලය හෝ විසින් සිදු කරන ලද උද්දේශිත ක්‍රියාත්මක කිරීමක්, ඒ කොටස් හිමියන් හෝ ඒ තැනැත්තා විසින්, ඒ බලය ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ආකාරයෙන් ම ස්ථිර කිරීම හෝ අනුමත කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ස්ථිර කරනු ලැබූ යම් බලයක් විෂයයෙහි ලා සිදු කරන ලද උද්දේශිත ක්‍රියාත්මක කිරීමක්, ඒ බලය නිසියාකාරව සහ වලංගු ලෙස ක්‍රියාත්මක කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු අතර, සැමවිට ම එසේ ක්‍රියාත්මක කරනු ලැබී යයි සලකනු ලැබිය යුතු ය.

(3) අධ්‍යක්ෂවරයකු හෝ අධ්‍යක්ෂ මණ්ඩලය හෝ විසින් යම් බලයක් විෂයයෙහි ලා සිදු කරනු ලැබූ යම් උද්දේශිත ක්‍රියාත්මක කිරීමක්, මේ වගන්තිය යටතේ ස්ථිර කිරීම හෝ අනුමත කිරීම හෝ හේතුකොට ගෙන, ඒ අධ්‍යක්ෂවරයාගේ හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ ඒ ක්‍රියාව සම්බන්ධයෙන් එකී ස්ථිර කිරීමට හෝ අනුමත කිරීමට හෝ අමතරව ක්‍රියාත්මක කරනු ලැබිය හැකි යම් බලයක් ක්‍රියාත්මක කිරීමෙන් අධිකරණය වළක්වාලනු නොලබන්නේ ය.

VIII වන කොටස

## ඒකාබද්ධ කිරීම්

**239**. සමාගම් දෙකක් හෝ ඊට වැඩි ගණනක් හෝ ඒකාබද්ධ වී එක් සමාගමක් ලෙස පවත්වා ගෙන යනු ලැබිය හැකි ය. එසේ පවත්වා ගෙන යනු ලබන සමාගම ඒකාබද්ධ වූ සමාගම්වලින් එකක් හෝ අලුත් සමාගමක් හෝ වශයෙන් පවත්වා ගෙන යනු ලැබිය හැකි ය. එවැනි ඒකාබද්ධ කිරීමක් පිළිබඳව ප්‍රසිද්ධ දැන්වීමක් මේ පනතේ විධිවිධාන අනුව කරනු ලැබිය යුතු ය. ඒකාබද්ධ කිරීම්.

**240**. (1) ඒකාබද්ධ කිරීමට යෝජනා කරනු ලබන සෑම සමාගමක් ම විසින්, එසේ ඒකාබද්ධ කිරීමේ නියම සහ, විශේෂයෙන් ම,— ඒකාබද්ධ කිරීමේ යෝජනාව.

(අ) ඒකාබද්ධිත සමාගමේ නාමය, ඒකාබද්ධ කරන ලද සමාගම් වලින් එකක නාමය ම වන්නේ නම්, ඒ නාමය;

(ආ) ඒකාබද්ධ සමාගමේ ලියාපදිංචි කළ කාර්යාලය;

(ඇ) ඒකාබද්ධිත සමාගමේ එක් එක් අධ්‍යක්ෂවරයාගේ සම්පූර්ණ නම සහ පදිංචිය දරන ලිපිනය;

(ඈ) ඒකාබද්ධිත සමාගමේ ලේකම්වරයාගේ සම්පූර්ණ නම සහ ලිපිනය;

(ඉ) පහත දැක්වෙන විස්තර, එනම්,—

(i) ඒකාබද්ධිත සමාගමේ කොටස් සංඛ්‍යාව ;

(ii) ඒකාබද්ධිත සමාගමේ එක් එක් කොටසකට සම්බන්ධ අයිතිවාසිකම්, වරප්‍රසාද, සීමාකිරීම් සහ කොන්දේසි, 49 වන වගන්තියේ (2) වන උපවගන්තියේ දක්වා ඇති ඒවාට වඩා වෙනස් නම්, ඒ අයිතිවාසිකම්, වරප්‍රසාද, සීමාකිරීම් සහ කොන්දේසි නිශ්චිතව සඳහන් කරමින් ඒකාබද්ධිත සමාගමේ කොටස් ව්‍යුහය ;

(ඊ) ඒකාබද්ධ කරනු ලබන එක් එක් සමාගමේ කොටස් ඒකාබද්ධිත සමාගමේ කොටස් බවට පරිවර්තනය කරනු ලබන ආකාරය ;

(උ) ඒකාබද්ධ කරනු ලබන සමාගමක කොටස් ඒකාබද්ධිත සමාගමේ කොටස් බවට පරිවර්තනය කරනු නොලබන්නේ නම්, ඒ කොටස් දරන්නන්ට, ඒකාබද්ධිත සමාගමේ කොටස් වෙනුවට ලැබිය යුතු යම් ප්‍රතිෂ්ඨාවක් ;

(ඌ) ඒකාබද්ධ කරනු ලබන සමාගමක කොටස් හිමියකුට හෝ අධ්‍යක්ෂවරයකුට හෝ ගෙවීමට ඇති, (උ) ඡේදයේ විස්තර කොට ඇති ආකාරයේ ගෙවීමක් නොවන, යම් ගෙවීමක් ;

(එ) ඒකාබද්ධ කිරීම සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය වන සහ ඉන්පසු ඒකාබද්ධිත සමාගම කළමනාකරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා සැලැස්විය යුතු වැඩ පිළිවෙල පිළිබඳ විස්තර ;

(ඒ) ඒකාබද්ධ කිරීම බලාත්මක කිරීමට අපේක්ෂා කරනු ලබන දිනය,

දක්වමින් ඒකාබද්ධ කිරීමේ යෝජනාවක් 241 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව අනුමත කරනු ලැබිය යුතු ය.

(2) ඒකාබද්ධිත සමාගමේ යෝජිත සාංගමික ව්‍යවස්ථාවලිය, ආදර්ශ සාංගමික ව්‍යවස්ථාවලියට වඩා වෙනස් වේ නම්, එසේ යෝජිත සාංගමික ව්‍යවස්ථාවලියේ පිටපතක් ඒකාබද්ධ කිරීමේ යෝජනාවට ඇමිණිය යුතු අතර, ඒ ව්‍යවස්ථාවලිය ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ කොටසක්

බවට පත් වන්නේ ය.

(3) ඒකාබද්ධ කරනු ලබන එක් සමාගමක කොටස් ඒකාබද්ධ කරනු ලබන වෙනත් සමාගමක් විසින් හෝ ඒ වෙනුවෙන් හෝ දරනු ලබන අවස්ථාවක, ඒකාබද්ධ කිරීමේ යෝජනාව මගින්,—

(අ) ගෙවීමකින් තොරව ඒ කොටස් අවලංගු කිරීම සඳහා හෝ ඒකාබද්ධ කිරීම බලාත්මක වූ පසු වෙනත් ප්‍රතිෂ්ඨාවක් සඳහා හෝ විධිවිධාන සැලැස්විය යුතු ය ;

(ආ) ඒ කොටස් ඒකාබද්ධිත සමාගමේ කොටස් බවට පරිවර්තනය කිරීම සඳහා විධිවිධාන සලස්වනු නොලැබිය යුතු ය.

ඒකාබද්ධ කිරීමේ යෝජනාව අනුමත කිරීම.

**241**. (1) ඒකාබද්ධ කිරීමේ යෝජනාවක් කොටස් හිමියන් වෙත ඉදිරිපත් කිරීමට පෙර, ඒකාබද්ධ කරනු ලබන සමාගමක අධ්‍යක්ෂක මණ්ඩලය විසින්,—

(අ) අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය අනුව, ඒකාබද්ධ කිරීම සමාගමේ උපරිම යහපත සඳහා වන බවට ; සහ

(ආ) ඒකාබද්ධ කිරීම බලාත්මක වීමෙන් ඉක්බිතිව ම ඒකාබද්ධිත සමාගම මූල්‍ය ස්ථායිත්වය පිළිබඳ පරීක්ෂණයෙන් සමත් වන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමට පත් වන බවට,

යෝජනා ස්ථිර කර ගනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නියම කර ඇති යෝජනා සම්මතයකට පක්ෂව ඡන්දය දෙන අධ්‍යක්ෂවරයන් විසින්, තමන්ගේ මතය අනුව, ඒ උපවගන්තියේ දක්වා ඇති කොන්දේසි සපුරා ඇති බව සඳහන් කරමින් සහ ඒ මතයට එළඹීමට තුඩු දුන් හේතු කවරේදැයි සඳහන් කරමින් සහතිකයක් අත්සන් කළ යුතු ය.

(3) ඒකාබද්ධ කරනු ලබන එක් එක් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්—

(අ) ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ පිටපතක් ;

(ආ) එක් එක් අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයන් විසින් දෙන ලද සහතිකවල පිටපත් ;

(ඇ) 93 වන වගන්තිය යටතේ කොටස් හිමියන්ගේ අයිතිවාසිකම් දැක්වෙන ප්‍රකාශයක් ;

(ඈ) අධ්‍යක්ෂවරයකුගේ තත්ත්වයෙන් හෝ වෙනත් තත්ත්වයකින් හෝ යෝජනාව විෂයයෙහි යම් අධ්‍යක්ෂවරයකු දරන සැලකිය යුතු සම්බන්ධතා කිසිවක් පිළිබඳ ප්‍රකාශයක් ;

(ඉ) යෝජිත ඒකාබද්ධ කිරීමේ ස්වභාවය හා ඒ ඒකාබද්ධ කිරීමෙන් සමාගමට හා එහි කොටස් හිමියන්ට ඇති වන බලපෑම් කවරේදැයි වටහා ගැනීමට යුක්ති යුක්ත කොටස් හිමියකුට හැකි කිරීමෙහි ලා අවශ්‍ය වන වැඩිදුර තොරතුරු සහ කරුණු පැහැදිලි කිරීම්,

යෝජිත ඒකාබද්ධ කිරීම බලාත්මක වන දිනයට පූර්වයෙන් වූ වැඩ කරන දින විස්සකට නොඅඩු කාලයකට පෙර, සමාගමේ එක් එක් කොටස් හිමියා වෙත යවනු ලැබිය යුතු ය.

(4) ඒකාබද්ධ කිරීම බලාත්මක කිරීමට අදහස් කරන දිනයට පූර්වයෙන් වූ වැඩ කරන දින විස්සකට නොඅඩු කාලයකට පෙර, ඒකාබද්ධ කරනු ලබන එක් එක් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්,—

(අ) ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ පිටපතක් සමාගමේ සුරක්ෂිත කළ සෑම ණය හිමියකු වෙතම යවනු ලැබිය යුතු ය ; තව ද

(ආ) පහත දැක්වෙන පරිදි වූ, එනම්,—

(i) ඒකාබද්ධ කරනු ලබන සමාගමක යම් කොටස් හිමියකු හෝ ණය හිමියකු හෝ ඒකාබද්ධ කරනු ලබන සමාගමක් බැඳීමකට යටත් වී ඇති යම් තැනැත්තකු හෝ විසින්, සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු කරන වේලාවල දී පරීක්ෂා කර බැලීම සඳහා ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ පිටපත් ඒකාබද්ධ කරනු ලබන සමාගම්වල ලියාපදිංචි කළ කාර්යාලවල දී සහ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි වෙනත් ස්ථානවල දී ලබාගත හැකි බව ; සහ

(ii) ඒකාබද්ධ කරනු ලබන සමාගමක් වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ පිටපතක් ගෙවීමකින් තොරව ලබා ගැනීමේ හිමිකම,

ඒකාබද්ධ කරනු ලබන සමාගමක කොටස් හිමියකුට හෝ ණය හිමියකුට හෝ ඒකාබද්ධ කරනු ලබන සමාගම බැඳීමකට යටත් වී ඇති යම් තැනැත්තකුට ඇති බව,

සඳහන් කෙරෙන ප්‍රකාශයක් ඇතුළුව, ඒකාබද්ධ කිරීමේ යෝජනාව පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමක් පළ කළ යුතු ය.

(5) ඒකාබද්ධ කිරීමේ යෝජනාව,—

(අ) ඒකාබද්ධ කරනු ලබන එක් එක් සමාගමේ කොටස් හිමියන් විසින්, 92 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව සම්මත කර ගනු ලබන විශේෂ යෝජනා සම්මතයක් මගින් අනුමත කරනු ලැබුවහොත් ; සහ

(ආ) ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ ඇතුළත් යම් විධිවිධානයක්, ඒකාබද්ධ කරනු ලබන සමාගමක සාංගමික ව්‍යවස්ථාවලියට කරනු ලබන සංශෝධනයක් ඇතුළත් වන විටක හෝ වෙනත් ආකාරයකින් ඒ සමාගමට අදාළව යෝජනා කරනු ලබන්නක් වන විට, සම්බන්ධතාවක් ඇති කණ්ඩායමක අනුමතය ඊට අවශ්‍ය වන්නේ නම්, ඒ සම්බන්ධතාව ඇති කණ්ඩායම විසින් විශේෂ යෝජනා සම්මතයක් මගින් අනුමත කරනු ලැබුවහොත්,

එය බලාත්මක කරනු ලැබිය හැකි ය.

(6) මේ වගන්තියේ කාර්යය සඳහා, ඒකාබද්ධිත සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය ගණන් නොගෙන මුල්‍ය ස්ථායිත්වය පිළිබඳ පරීක්ෂණය අදාළ කරනු ලැබිය යුතු ය.

(7) (2) වන උපවගන්තියේ නියමයන් අනුව ක්‍රියා කිරීම පැහැර හරින අධ්‍යක්ෂවරයකු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂ දෙකක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

(8) ඒකාබද්ධ කිරීමේ යෝජනාවක් බලාත්මක කිරීම හේතු කොට ගෙන, ඒකාබද්ධ කරනු ලබන සමාගමක ණය හිමියකුට හෝ ඒකාබද්ධ කරනු ලබන සමාගමක් යම් තැනැත්තකු සමඟ බැඳීමකට යටත් වී සිටී ද, එවැනි තැනැත්තකුට අසාධාරණ ලෙස හානියක් සිදුවන බවට අධිකරණයක් සෑහීමට පත්වුවහොත්, ඒ තැනැත්තා විසින් කරනු ලබන ඉල්ලීමක් මත, අධිකරණය විසින් ඒ ඒකාබද්ධ කිරීම බලාත්මක වන

දිනයට පෙර කවර හෝ වේලාවක ඒ යෝජනාව සම්බන්ධයෙන් සුදුසු යයි අධිකරණය කල්පනා කරන යම් ආඥාවක් කරනු ලැබිය හැකි අතර, මේ උපවගන්තියේ ව්‍යාප්තිය සීමා කිරීමක් නොමැතිව,—

(අ) ඒ යෝජනාව බලාත්මක නොවිය යුතු යයි විධාන කරමින් ;

(ආ) ඒ යෝජනාව හෝ එහි යම් කොටසක් හෝ නැවත සලකා බලන ලෙස සමාගමට හෝ එහි අධ්‍යක්ෂ මණ්ඩලයට විධාන කරමින්,

ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(9) (8) වන උපවගන්තිය යටතේ වූ ආඥාවක්, සුදුසු යයි අධිකරණය කල්පනා කරන නියම හා කොන්දේසිවලට යටත් කොට කරනු ලැබිය හැකි ය.

කෙටි ක්‍රමයට ඒකාබද්ධ කිරීම.

**242**. (1) යම් සමාගමක් සහ, කෙළින් ම හෝ වක්‍රාකාරයකින් හෝ සම්පූර්ණයෙන් ම ඒ සමාගමට අයත් වෙනත් සමාගම් එකක් හෝ ඊට වැඩි ගණනක් ඒකාබද්ධ කිරීමේ දී,—

(අ) ඒකාබද්ධ කරනු ලබන එක් එක් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලබන යෝජනා සම්මතයක් මගින් ඒ ඒකාබද්ධ කිරීම අනුමත කරනු ලබන්නේ නම් ; සහ

(ආ) ඒ එක් එක් යෝජනා සම්මතය මගින්—

(i) ඒකාබද්ධිත සමාගමේ කොටස් හැර, ඒකාබද්ධ කරනු ලබන එක් එක් සමාගමේ කොටස්, ගෙවීමකින් හෝ වෙනත් ප්‍රතිෂ්ඨාවකින් හෝ තොරව අවලංගු කරනු ලබන බවට විධිවිධාන සලස්වනු ලබන්නේ නම් ;

(ii) ඒකාබද්ධිත සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය ඉහත පළමුව සඳහන් කළ සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය ම වන බවට විධිවිධාන සලස්වනු ලබන්නේ නම් ;

(iii) ඒකාබද්ධ කිරීම බලාත්මක කිරීමෙන් ඉක්බිතිව ම, ඒකාබද්ධිත සමාගම මූල්‍ය ස්ථායිත්වය පිළිබඳ පරීක්ෂණයෙන් සමත් වන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමට පත් වන බවට විධිවිධාන සලස්වනු ලබන්නේ නම් ; සහ

(iv) අළුත් සමාගමේ අධ්‍යක්ෂවරයකු හෝ අධ්‍යක්ෂවරයන් විය හැක්කේ යෝජනා සම්මතයේ නම සඳහන් තැනැත්තකු හෝ තැනැත්තන් වන්නේ නම්,

240 වන වගන්තියේ සහ 241 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා නොකර, එකී සමාගම් ඒකාබද්ධ කොට (පළමුව සඳහන් සමාගම වන) එක් සමාගමක් වශයෙන් පවත්වා ගෙන යනු ලැබිය හැකි ය.

(2) කෙළින් ම හෝ අන්‍යාකාරයකින් හෝ එක ම සමාගමකට අයත් වන සමාගම් දෙකක් හෝ ඊට වැඩි ගණනක් ඒකාබද්ධ කිරීමක දී,—

(අ) ඒකාබද්ධ කරනු ලබන එක් එක් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලබන යෝජනා සම්මතයක් මගින් ඒ ඒකාබද්ධ කිරීම අනුමත කරනු ලබන්නේ නම් ; සහ

(ආ) ඒ එක් එක් යෝජනා සම්මතය මගින්—

(i) ඒකාබද්ධ කරනු ලබන සමාගම් අතුරෙන් එකක හැර අන් සියලු ම සමාගම්වල කොටස්, ගෙවීමකින් තොරව සහ වෙනත් ප්‍රතිෂ්ඨාවකින් තොරව අවලංගු කරනු ලබන බවට විධිවිධාන සලස්වනු ලබන්නේ නම් ;

(ii) ඒකාබද්ධිත සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය, ඉහත පළමුව සඳහන් කළ සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය ම වන බවට විධිවිධාන සලස්වනු ලබන්නේ නම් ;

(iii) ඒකාබද්ධ කිරීම බලාත්මක කිරීමෙන් ඉක්බිතිව ම ඒකාබද්ධිත සමාගම මූල්‍ය ස්ථායිත්වය පිළිබඳ පරීක්ෂණයෙන් සමත් වන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමට පත් වන බවට විධිවිධාන සලස්වනු ලබන්නේ නම් ; සහ

(iv) අළුත් සමාගමේ අධ්‍යක්ෂවරයකු හෝ අධ්‍යක්ෂවරයන් විය හැක්කේ යෝජනා සම්මතයේ නම සඳහන් තැනැත්තකු හෝ තැනැත්තන් වන්නේ නම්,

240 වන වගන්තියේ හෝ 241 වන වගන්තියේ හෝ විධිවිධානවලට අනුව ක්‍රියා නොකර ඒකාබද්ධ කොට එසේ සමාගමක් වශයෙන් පවත්වා ගෙන යනු ලැබිය හැක්කේ ය.

(3) ඒකාබද්ධ කිරීම බලාත්මක කිරීමට අදහස් කරන දිනයට පූර්වයෙන් වූ වැඩ කරන දවස් විස්සකට නොඅඩු කාලයකට පෙර, ඒකාබද්ධ කරනු ලබන එක් එක් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්,—

(අ) යෝජිත ඒකාබද්ධ කිරීම පිළිබඳ ලිඛිත දැන්වීමක් ඒ සමාගමේ සෑම සුරක්ෂිත ණය හිමියකු වෙත ම යැවිය යුතු ය ; තව ද

(ආ) යෝජිත ඒකාබද්ධ කිරීම පිළිබඳව ප්‍රසිද්ධ දැන්වීමක් පළ කළ යුතු ය.

(4) මේ වගන්තිය යටතේ ඒකාබද්ධ කිරීමක් අනුමත කරන යෝජනා සම්මුති එක්ව ගත් කළ, අනුමත කරන ලද ඒකාබද්ධ කිරීමේ යෝජනාවක් ඉන් සජ්ජිත වන්නේ යයි සලකනු ලැබිය යුතු ය.

(5) අවස්ථාවෝචිත පරිදි, (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය හෝ යටතේ නියම කර ඇති පරිදි යෝජනා සම්මතයකට පක්ෂව ඡන්දය දෙන අධ්‍යක්ෂවරයන් විසින්, තමන්ගේ මතය අනුව, (1) වන උපවගන්තියේ හෝ (2) වන උපවගන්තියේ හෝ දක්වා ඇති කොන්දේසි සපුරා ඇති බව සඳහන් කරමින් සහ ඒ මතයට එළඹීමට තුඩු දුන් හේතු කවරේ දැයි සඳහන් කරමින් සහතිකයක් අත්සන් කළ යුතු ය.

(6) මේ වගන්තියේ කාර්යය සඳහා, ඒකාබද්ධිත සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය ගණන් නොගෙන මූල්‍ය ස්ථායිත්වය පිළිබඳ පරීක්ෂණය අදාළ කරනු ලැබිය යුතු ය.

(7) (5) වන උපවගන්තියේ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින අධ්‍යක්ෂවරයකු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙලක්ෂයක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

ඒකාබද්ධ කිරීමේ යෝජනාව ලියාපදිංචි කිරීම.

**243**. ඒකාබද්ධ කිරීමක් බලාත්මක කිරීමේ කාර්යය සඳහා පහත දැක්වෙන ලේඛන ලියාපදිංචි කිරීම පිණිස රෙජිස්ට්‍රාර්වරයා වෙත භාර දෙනු ලැබිය යුතු ය :—

(අ) අනුමත කරන ලද ඒකාබද්ධ කිරීමේ යෝජනාව ;

(ආ) 241 වන වගන්තියේ (2) වන උපවගන්තියේ හෝ 242 වන වගන්තියේ (5) වන උපවගන්තිය හෝ යටතේ නියම කර ඇති සහතික කිසිවක් ;

(ඈ) ඒකාබද්ධ කිරීම, මේ පනතේ විධිවිධානවලට සහ සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියට අනුකූලව අනුමත කර ඇති බව ප්‍රකාශ කරමින්, ඒකාබද්ධ කරනු ලබන එක් එක් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අත්සන් කරන ලද සහතිකයක් ;

(ඈ) 203 වන වගන්තියෙන් නියම කර ඇති පරිදි, ඒකාබද්ධිත සමාගමේ අධ්‍යක්ෂවරයකු වශයෙන් ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ නම් කොට ඇති තැනැත්තා විසින් ඒ ඒකාබද්ධ සමාගමේ අධ්‍යක්ෂවරයකු එක් එක් ලෙස ක්‍රියා කිරීමට දෙන ලද කැමැත්ත ; සහ

(ඉ) 221 වන වගන්තියේ (2) වන උපවගන්තියේ නියම කර ඇති පරිදි, ඒකාබද්ධිත සමාගමේ ලේකම්වරයා වශයෙන් ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ නම් කොට ඇති තැනැත්තා විසින් ඒ ඒකාබද්ධිත සමාගමේ ලේකම්වරයා වශයෙන් ක්‍රියා කිරීමට දෙන ලද කැමැත්ත.

**244**. (1) 243 වන වගන්තිය යටතේ නියම කර ඇති ලේඛන ලැබුණු වහාම, රෙජිස්ට්‍රාර්වරයා විසින්,— ඒකාබද්ධ කිරීමේ සහතිකය.

(අ) ඒකාබද්ධිත සමාගම, ඒකාබද්ධ කරනු ලැබූ සමාගම්වලින් එකක් වන්නේ නම්, නියමිත ආකෘති පත්‍රයෙහි වූ, ඒකාබද්ධ කිරීමේ සහතිකයක් නිකුත් කළ යුතු ය ;

(ආ) ඒකාබද්ධිත සමාගම අලුත් සමාගමක් වන්නේ නම්—

(i) ඒ සමාගම පිළිබඳ විස්තර රෙජිස්ටරයෙහි ඇතුළත් කළ යුතු ය ; තව ද

(ii) නියමිත ආකෘති පත්‍රයෙහි වූ සංස්ථාගත කිරීමේ සහතිකයක් ද සමග නියමිත ආකෘති පත්‍රයෙහි වූ ඒකාබද්ධ කිරීමේ සහතිකයක් නිකුත් කළ යුතු ය.

(2) ඒකාබද්ධ කිරීම බලාත්මක කිරීමට අදහස් කරනු ලබන දිනය ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ නිශ්චිතව සඳහන් කර ඇත්නම් සහ, ඒ දිනය, අදාළ ලේඛන, ඒකාබද්ධ කිරීමේ සහතිකය සහ සංස්ථාගත කිරීමේ යම් සහතිකයක් රෙජිස්ට්‍රාර්වරයාට ලැබුණු දිනය හෝ ඊට පසු දිනයක් හෝ වේ නම්, ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ නිශ්චිතව සඳහන් දිනයේ දී ඒකාබද්ධ කිරීම බලාත්මක වන ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) ඒකාබද්ධ කිරීම පිළිබඳ දැන්වීම, මේ පනතේ විධිවිධානවලට අනුකූලව සමාගම විසින් මහජනයා වෙත දෙනු ලැබිය යුතු ය.

ඒකාබද්ධ කිරීමේ සහතිකයේ බලපෑම.

**245**. ඒකාබද්ධ කිරීමේ සහතිකයේ දක්වා ඇති දිනයේ දී,—

(අ) ඒකාබද්ධ කිරීම බලාත්මක වන්නේ ය ;

(ආ) ඒකාබද්ධ කරනු ලබන සමාගම්වලින් එකක නම එම සහතිකයේ තිබේ නම්, ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ නිශ්චිතව සඳහන් නම, ඒකාබද්ධිත සමාගමේ නම වන්නේ ය ;

(ඇ) ඒකාබද්ධිත සමාගමේ හැර, ඒකාබද්ධ කරනු ලබන සෙසු සමාගම්වලට අදාළ සියලු ම විස්තර රෙජිස්ට්‍රාර්වරයා විසින් රෙජිස්ටරයෙන් ඉවත් කළ යුතු ය ;

(ඈ) ඒකාබද්ධ කරනු ලබන එක් එක් සමාගමේ දේපළවලට, අයිතිවාසිකම්වලට, බලතලවලට සහ වරප්‍රසාදවලට ඒකාබද්ධිත සමාගම අනුප්‍රාප්තිය ලබන්නේ ය ;

(ඉ) ඒකාබද්ධ කරනු ලබන එක් එක් සමාගමේ සියලු ම වගකීම්වලට සහ බැඳීම්වලට ඒකාබද්ධිත සමාගම අනුප්‍රාප්තිය ලබන්නේ ය ;

(ඊ) ඒකාබද්ධ කරනු ලබන සමාගමක් විසින් හෝ ඊට විරුද්ධව හෝ පවරා විනිශ්චයට භාජනයව පවත්නා නඩු කටයුතු ඒකාබද්ධිත සමාගම විසින් හෝ ඊට විරුද්ධව හෝ පවත්වා ගෙන යනු ලැබිය හැකි ය ;

(උ) ඒකාබද්ධ කරනු ලබන සමාගමක වාසියට හෝ ඊට විරුද්ධව හෝ කරනු ලැබූ වරදකරු කිරීමක්, තීරණයක්, ආඥාවක් හෝ නඩු තීන්දුවක්, ඒකාබද්ධිත සමාගම විසින් හෝ ඊට විරුද්ධව හෝ බලාත්මක කරනු ලැබිය හැකි ය ;

(ඌ) ඒකාබද්ධිත සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය, ඒකාබද්ධ කරනු ලබන එක් එක් සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනවල එකතුව වන්නේ ය ; තව ද

(එ) ඒකාබද්ධ කරනු ලබන සමාගම්වල කොටස් හිමියන්ගේ කොටස් හෝ අයිතිවාසිකම් පරිවර්තනය කිරීමට විධිවිධාන සලස්වන ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ ඇතුළත් විධිවිධාන කිසිවක් ඒවායේ භාවය අනුව බලපැවැත්විය යුතු ය.

**246**. (1) සමාගමක ඡන්දය දීමේ අයිතිය ඇති තැනැත්තන් වෙත කරන ලද අර්පණයක ප්‍රතිඵලයක් වශයෙන් යම් තැනැත්තකු විසින් එම සමාගමේ ඡන්දය දීමේ අයිතිවාසිකම්වලින් සියයට අනූවකට අඩු නොවන ප්‍රමාණයක් මිල දී ගන්නා අවස්ථාවක, එම කොටස් මිල දී ගැනීමට තමා අදහස් කරන බවට, ඡන්දය දීමේ අයිතිවාසිකම් සහිතව කොටස් වැඩි ප්‍රමාණයක් දරන සියලුම කොටස් හිමියන් වෙත, එසේ මිල දී ගැනීමේ සිට මාස තුනක් ඇතුළත නියමිත ආකාරයට දැනුම් දිය යුතු අතර, අන්‍යාකාරයකට ආඥා කිරීමට අධිකරණය කල්පනා කරන්නේ නම් මිස, තමාගේ කොටස් මිල දී ගැනීම සඳහා වූ එම දැන්වීම ලැබී දින දාහතරක් ඇතුළත යම් කොටස් හිමියකු වි සින් අධිකරණය වෙත කරනු ලබන ඉල්ලීමක් මත ඉහත කී අර්පණය යටතේ කරන ලද නියමවලට වඩා අවාසිදායක නොවන නියමයන් මත එම කොටස් මිල දී ගැනීමට හිමිකමක් තිබිය යුතු ය.

වැඩිදෙනකු විසින් අනුමත කරන ලද යෝජනා ක්‍රමයකට හෝ ගිවිසුමකට අකමැති කොටස් හිමියන්ගේ කොටස් මිල දී ගැනීමේ බලය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් මිල දී ගැනීමට අදාළ දැන්වීමේ පිටපතක් කොටස් මිල දී ගැනීමට අදහස් කරනු ලබන සමාගම වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) යම් දැන්වීමක් දෙනු ලැබූ දින සිට එක් මාසයක් අවසන් වීමෙන් පසු (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ යම් තැනැත්තකු විසින් දැන්වීමක් කරනු ලැබූ අවස්ථාවක, එම තැනැත්තා විසින් කොටස් අත්කර ගැනීමට යන සමාගම වෙත යථා පරිදි වූ ප්‍රතිෂ්ඨාව ඉදිරිපත් කළ යුතු අතර, එම සමාගමේ ලේකම්වරයා විසින් එසේ මිල දී ගත් තැනැත්තා එම කොටස් දරන්නා ලෙස ලියාපදිංචි කළ යුතු ය.

(4) යම් මුදලක් හෝ යම් ප්‍රතිෂ්ඨාවක් ලබා ගන්නේ යම් කොටස් සම්බන්ධයෙන් ද එම කොටස්වලට හිමිකම් ඇති තැනැත්තා හෝ තැනැත්තන් සඳහා වූ භාරයක් වෙත සමාගම වෙත ලැබුන යම් ප්‍රතිෂ්ඨාවක් සමාගම විසින් දරනු ලැබිය යුතු ය. සමාගමේ ලේකම්වරයා විසින් අයවිය යුතු එම ප්‍රතිෂ්ඨාව අනිසි ප්‍රමාදයකින් තොරව සියලුම කොටස් හිමියන්ට ඉදිරිපත් කළ යුතු ය.

(5) කලින් කල පවත්වන ලද සාධාරණ පරීක්ෂණවලින් පසුව සහ දිනපතා පුවත්පත්වල භාෂා තුනෙන්ම දැන්වීම් පළ කිරීමෙන් පසුව, ප්‍රතිෂ්ඨාව හිමි තැනැත්තා සොයා ගත නොහැකි නම් සහ ප්‍රතිෂ්ඨාව ලැබී හෝ සමාගම ගණන් බේරා වසා දමා අවුරුදු හයක් ගතවී ඇත්නම්, සමාගම විසින් ප්‍රතිෂ්ඨාව සහ ඊට උපචිත වූ පොලිය, ලාභාංශ හෝ වෙනත් ප්‍රතිලාභ මහා භාරකාරවරයා වෙත ගෙවනු ලැබිය යුතු ය.

(6) සමාගම ගණන් බේරා වසා දැමූ අවස්ථාවක—

(අ) භාරය අවසන් විය යුතු ය ;

(ආ) අවස්ථාවෝචිත පරිදි සමාගම හෝ ඇවරකරු මුදල් හැර වෙනත් ප්‍රතිෂ්ඨාවක් සහ ප්‍රතිෂ්ඨාවෙන් උපචිත වූ මුදල් හැර වෙනත් ප්‍රතිලාභයක් විකිණිය යුතු ය ; සහ

(ඇ) (i) මුදල් වශයෙන් ඇතිතාක් දුරට යම් ප්‍රතිෂ්ඨාවක් ;

(ii) ඉහත ii වන ඡේදය යටතේ වූ යම් විකිණීමකින් ලැබුන මුදල් ; සහ

(iii) ප්‍රතිෂ්ඨාවෙන් උපචිත වූ යම් පොලියක්, ලාභාංශ හෝ වෙනත් ප්‍රතිලාභ,

මහාභාරකාරවරයාගේ නමින් තැන්පත් කළ යුතු ය.

(7) එවැනි යම් පරීක්ෂණයකට අදාළ හෝ ඉහත සඳහන් පුවත්පත් දැන්වීමකට අදාළ වියදම් ඉහත (4) වන උපවගන්තියේ සඳහන් භාරයෙහි දරනු ලබන මුදල් හෝ වෙනත් දේපළවලින් ගෙවනු ලැබිය යුතු ය.

IX වන කොටස

**ණය හිමියන් සමග සමථයකට එළඹීම**

අර්ථ නිරූපණය.

**247**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ කොටසෙහි,—

“සමථයකට එළඹීම” යන්නෙන්, සමාගමක් සහ එහි ණය හිමියන් අතර එළඹෙන ලද සමථයක් අදහස් වන අතර,—

(අ) සමාගමේ යම් ණය සියල්ල ම හෝ ඉන් යම් කොටසක් හෝ අවලංගු කිරීම;

(ආ) සමාගමේ ණය හිමියන්ගේ අයිතිවාසිකම් හෝ ණයකට අදාළ නියමයන් හෝ වෙනස් කිරීම;

(ඇ) ණයක් ගෙවීම සඳහා සමාගමට තිබිය හැකි හැකියාව කෙරෙහි බලපාන සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියට අදාළ යම් වෙනස් කිරීමක්,

ඊට ඇතුළත් වේ;

"ණයහිමියා" යන්නට, ඈවර කිරීමක දී සමාගමෙන් තමාට ණයක් අයවිය යුතුව ඇති බවට 257 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව හිමිකම් කියා සිටීමට හිමිකම ඇති තැනැත්තකු ඇතුළත් වේ;

"යෝජනා" යන්නෙන්, මේ පනතේ මේ කොටසේ විධිවිධානවලට අනුකූලව සමථයට එළඹීමක් යෝජනා කරන්නා වූ 248 වන වගන්තියේ සඳහන් තැනැත්තෙක් අදහස් වේ.

සමථයට එළඹීමේ යෝජනාව.

**248**. (1) සමාගමක ණය ගෙවිය යුතුව ඇති විටක, ඒ ණය ගෙවීමට ඒ සමාගමකට නොහැකි බව හෝ නොහැකි වීමට ඉඩ ඇති බව විශ්වාස කිරීමට පහත දැක්වෙන කවර හෝ තැනැත්තකුට හේතු ඇත්නම් ඒ තැනැත්තා විසින් මේ කොටස යටතේ සමථයට එළඹීමේ යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය :—

(අ) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය;

(ආ) සමාගමේ දේපළ සහ ව්‍යාවසාය සම්බන්ධයෙන් පත් කරන ලද දේපළ භාරකරුවකු;

(ඇ) XIII වන කොටස යටතේ පත්කරන ලද සමාගමේ අද්මිනිස්ත්‍රාසිකරුවකු;

(ඈ) සමාගමේ ඈවරකරුවකු;

(ඉ) අධිකරණයෙහි අවසරය ඇතිව, සමාගමේ යම් ණය හිමියකු හෝ කොටස් හිමියකු.

(2) (1) වන උපවගන්තියේ (ඈ) ඡේදය යටතේ ණය හිමියකුට හෝ කොටස් හිමියකුට හෝ අධිකරණය විසින් අවසර දෙනු ලබන අවස්ථාවක, සමථකට එළඹීමේ යෝජනාවක් ඉදිරිපත් කිරීමට ඒ ණය හිමියාට හෝ කොටස් හිමියාට හැකි වන පරිදි, සමාගමේ ණය හිමියන්ගේ නම් සහ ලිපිනයන් සඳහන් ලැයිස්තුවක්, ඒ එක් එක් ණය හිමියාට ගෙවීමට ඇති මුදල් ප්‍රමාණය සහ නිශ්චිතව සඳහන් කරනු ලබන වෙනත් යම් තොරතුරු ද දක්වමින් අධිකරණය විසින් නියම කරනු ලබන යම් කාලයක් ඇතුළත ඒ ණය හිමියා හෝ කොටස් හිමියා හෝ වෙත සපයන ලෙස සමාගමට විධාන කරමින්, ආඥාවක් අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.

යෝජිත සමථයට එළඹීම පිළිබඳ දැන්වීම.

**249**. (1) සමාගමේ එක් එක් පන්තියේ ණය හිමියන් සම්බන්ධයෙන්, යෝජිත සමථයට එළඹීමට බලපානු ලැබිය හැකි ණය හිමියන් ලෙස යෝජක දන්නා ණය හිමියන්ගේ ලැයිස්තුවක්, යෝජක විසින් පිළියෙල කරනු ලැබිය හැකි අතර, ඒ ලැයිස්තුවෙහි—

(අ) ඒ එක් එක් ණය හිමියාට ගෙවීමට ඇති හෝ ගෙවීමට ඇතැයි ගණන් බලනු ලැබූ මුදල් ප්‍රමාණය; සහ

(ආ) සමථයට එළඹීම අනුමත කරන යෝජනා සම්මතයක් මත ඡන්ද විමසීමක දී ඒ එක් එක් ණය හිමියා හිමිකම් ලබන ඡන්ද සංඛ්‍යාව,

දක්වනු ලැබිය යුතු ය.

(2) යෝජක විසින්—

(අ) යෝජනා සම්මතය මත ඡන්දය දීමේ කාර්යය සඳහා, ණය හිමියන්ගේ හෝ කවර වුව ද පන්ති දෙකක හෝ ඊට වැඩි ගණනක හෝ ණය හිමියන්ගේ රැස්වීමක් පැවැත්වීමේ අධ්‍යාශය පිළිබඳව මෙහි සත්වන උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් කර ඇති නියමයට අනුකූල වූ දැන්වීමක්; සහ

(ආ) පහත සඳහන් පරිදි වූ, එනම්,—

(i) යෝජකගේ නම සහ ලිපිනය සහ යෝජක ක්‍රියා කරන්නේ කවර තත්ත්වයකින් ද යන්න ඇතුළත් කරමින්;

(ii) සාමාන්‍ය ව්‍යාපාර කටයුතු කරන වේලා තුළ දී විමසීම් කරනු ලැබිය හැකි ලිපිනය හා දුරකථන අංකය ඇතුළත් කරමින්;

(iii) යෝජිත සමථයට එළඹීමේ කොන්දේසි හා ඊට හේතු දක්වමින් ;

(iv) සමථයට එළඹීම අනුමත කරනු ලැබුවහොත්, සමාගමේ ණය හිමියන්ට සිදු වේ යයි යුක්ති සහගත ලෙස බලාපොරොත්තු විය හැකි ප්‍රතිඵල දක්වමින්;

(v) යෝජිත සමථයෙහි දී අධ්‍යක්ෂවරයකුගේ යම් සම්බන්ධතාවක ප්‍රමාණය දක්වමින්;

(vi) යෝජිත සමථයට එළඹීම සහ ණය හිමියන්ගේ නැතහොත් ණය හිමියන් යම් පන්තියක රැස්වීමක දී ඒ සමථයට යෝජනා කරනු ලබන සංශෝධන කිසිවක් හෝ 250 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව අනුමත කරනු ලැබුවහොත් ඒ සමථය හෝ ඊට කරනු ලැබූ සංශෝධන හෝ මගින් සියලු ම ණය හිමියන් හෝ එකී පන්තියේ සියලු ම ණය හිමියන් හෝ විෂයයෙහි බැඳීමක් ඇති කරන බව පැහැදිලි කරමින්; සහ

(vii) යෝජිත සමථයට එළඹීම අනුමත කරනු ලැබීමෙන් පසු ඒ සමථයට එළඹීම වෙනස් කිරීම සඳහා ඒ සමථයට එළඹීමේ ම කොටසක් ලෙස යෝජනා කරනු ලැබූ කාර්ය පටිපාටියක් පිළිබඳ විස්තර ඇතුළත් කරමින්,

ප්‍රකාශයක් ; සහ

(ඇ) (1) වන උපවගන්තියෙහි සඳහන් ණය හිමියන්ගේ ලැයිස්තුවේ හෝ ලැයිස්තුවල පිටපතක්,

දැනගැනීමට ලැබී ඇති පිළිවෙළින්, එක් එක් ණය හිමියා වෙත, සමාගම වෙත, යම් දේපළ භාර ගන්නකු හෝ අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ ඈවරකරුවකු වෙත ද, රෙජිස්ට්‍රාර්වරයා වෙත ද, භාර දෙනු ලැබිය යුතු ය.

සමථයකට එළඹීමේ බලපෑම.

**250**. (1) මෙහි වූ හත්වන උපලේඛනයේ සඳහන් නියමයට අනුකූලව පවත්වනු ලබන ණය හිමියන්ගේ රැස්වීමක දී හෝ යම් පන්තියක ණයහිමියන්ගේ රැස්වීමක දී හෝ ඒ ණයහිමියන් විසින් හෝ ඒ පන්තියේ ණය හිමියන් විසින් හෝ යට කී උපලේඛනයේ 5 වන ඡේදයට අනුකූලව, යම් සමථයට එළඹීමක්, ඊට එම රැස්වීමේ දී කරනු ලබන යම් සංශෝධනයක් ද ඇතුළුව, පිළිගනු ලැබ ඇත්නම්, ඒ සමථයට එළඹීම එකී සංශෝධනය ද ඇතුළුව, ඒ ණය හිමියන් විසින් හෝ ඒ පන්තියේ ණයහිමියන් විසින් හෝ අනුමත කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) මේ කොටසේ විධිවිධානවලට අනුකූලව යම් සමාගමක ණය හිමියන් විසින් හෝ යම් පන්තියක ණයහිමියන් විසින් හෝ අනුමත කරන ලද යම් සමථයට එළඹීමකට කරනු ලැබ ඇති යම් සංශෝධනයක් ද ඇතුළුව ඒ සමථයට එළඹීම මගින් ඒ සමාගම සහ යෝජනාව පිළිබඳව 249 වන වගන්තිය යටතේ දැන්වීමක් කර ඇති—

(අ) සියලු ම ණය හිමියන් ; හෝ

(ආ) එක් පන්තියකට වැඩි පන්ති සංඛ්‍යාවකට අයත් ණය හිමියන් ඇත්නම්, ඒ පන්තිවල සියලු ම ණයහිමියන්,

බැඳී සිටිය යුතු ය.

(3) සමථයට එළඹීමක් කරනු ලබන යම් සංශෝධනයක් ද ඇතුළුව යම් සමථයට එළඹීමක් යෝජනා කරන යෝජනා සම්මතයක් එක් පන්තියකට වඩා වැඩි පන්ති සංඛ්‍යාවක ණය හිමියන්ගේ ඡන්දයට ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක පටහැනි කිසිවක් ඒ යෝජනා සම්මතයෙන් ප්‍රකාශිතව ම සඳහන් කර ඇත්නම් මිස, ඒ සමථයට එළඹීම, ඊට කරන ලද යම් සංශෝධනයක් ද ඇතුළුව ඒ එක් එක් පන්තිය විසින් අනුමත කරනු ලැබීම, ඒ යෝජනා සම්මතයට ඡන්දය දෙන වෙනත් සියලු ම පන්තිවල ණය හිමියන් විසින් ඒ සමථයට එළඹීම, ඊට කරන ලද යම් සංශෝධනයක් ද සමග අනුමත කරනු ලැබීමේ කොන්දේසියට යටත්ව විය යුතු බවට, පූර්ව නිගමනය කරනු ලැබිය යුතු ය.

(4) ඡන්දය විමසීමේ ප්‍රතිඵලය ඒ යෝජනාව ඉදිරිපත් කළ යෝජක විසින්, පිළිවෙලින් දැන සිටින එක් එක් ණය හිමියා වෙත ද, සමාගම වෙත ද, යම් දේපළ භාරගන්නකු හෝ අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ ඈවරකරුවකු හෝ වෙත ද, රෙජිස්ට්‍රාර්වරයා වෙත ද, ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු ය.

සමථයට එළඹීම සුළු වශයෙන් වෙනස් කිරීම.

**251**. (1) 250 වන වගන්තිය යටතේ අනුමත කරන ලද සමථයට එළඹීමක්,—

(අ) අනුමත කරන ලද පරිදි වූ ඒ සමථයට එළඹීමෙහි අන්තර්ගත කරන ලද සුළු වශයෙන් වෙනස් කිරීම සඳහා වූ යම් කාර්ය පටිපාටියකට අනුකූලව; හෝ

(ආ) යෝජිත යම් සුළු වශයෙන් වෙනස් කිරීමක් යෝජිත සමථයට එළඹීමක් වූවාක් මෙන් සලකා අවශ්‍ය යම් සුළු වශයෙන් වෙනස් කිරීම් ද සහිතව, සමථයට එළඹීමක් වෙනස් කිරීම සඳහා මේ කොටසේ විධිවිධාන සලසා ඇති නියමයට අනුකූලව එවැනි සමථයට එළඹීමක් වෙනස් කිරීමක් මගින්,

වෙනස් කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තියට අනුකූලව වෙනස් කරන ලද යම් සමථයට එළඹීමකට මේ කොටසේ විධිවිධාන අදාළ විය යුතු ය.

**252**. (1) යෝජක විසින් හෝ සමාගම විසින් හෝ කරනු ලබන ඉල්ලීමක් මත, අධිකරණය විසින්— අධිකරණය සතු බලතල.

(අ) මේ කොටසේ විධිවිධාන යටතේ නියම කරන ලද කාර්ය පටිපාටිය නියමයක් සම්බන්ධයෙන් විධාන නිකුත් කිරීම හෝ එවැනි යම් නියමයක් අත්හැරීම හෝ වෙනස් කිරීම සාධාරණ යයි අධිකරණය සෑහීමට පත්වන්නේ නම් එවැනි යම් නියමයක් අත්හැරීම හෝ වෙනස් කිරීම හෝ කරනු ලැබිය හැකි ය; නැතහොත්

(ආ) යෝජිත සමථයට එළඹීම පිළිබඳ දැන්වීම දෙනු ලැබූ දිනයට කලින් නොවූ දිනයකින් ආරම්භව ඒ යෝජිත සමථයට එළඹීම සම්බන්ධයෙන් විමසන ලද ඡන්දයේ ප්‍රතිඵලය පිළිබඳ දැන්වීම දෙනු ලැබූ දිනයට පසුව එළඹෙන වැඩ කරන දින දහයකට පසුව නොවන දිනයකින් අවසන් වන කාල පරිච්ඡේදයක් වශයෙන් එහි ආඥාවෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන කාල පරිච්ඡේදයක් තුළ දී—

(i) සමාගම විසින් ගෙවිය යුතු ණයක් සම්බන්ධයෙන් පවත්නා නඩු කටයුතු නතර කරන ලෙස ; හෝ

(ii) සමාගම විසින් ගෙවිය යුතු ණයක් ගෙවීම බලාත්මක කිරීම සඳහා වූ වෙනත් යම් පියවරක් ගැනීමෙන් ණය හිමියකු වැළකී සිටිය යුතු බවට,

ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(2) එකී කාල පරිච්ඡේදය තුළ දී, සුරක්ෂිත ණය හිමියකුට ඒ සමාගමේ ආරෝපණයක් ඇති දේපළ තහනමට ගැනීමට, විකුණා මුදල් ලබාගැනීමට, ඒ දේපළ සඳහා දේපළ භාරකරුවකු පත් කිරීමට හෝ වෙනත් ආකාරයකින් ඒ දේපළ සම්බන්ධයෙන් කටයුතු කිරීමට, එවැනි සුරක්ෂිත ණය හිමියකුට ඇති අයිතිය කෙරෙහි (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ ඇතුළත් කිසිවකින් බලපෑමක් ඇති නොවන්නේ ය.

(3) සමථයකට එළඹීමක් මත ඡන්දය දීමට හිමිකම ඇති යම් සමාගමක ණය හිමියකුගේ ඉල්ලීම මත—

(අ) රැස්වීම පිළිබඳව හෝ දැනුම් දිය යුතු බවට නියම කර ඇති කාරණා පිළිබඳව හෝ ප්‍රමාණවත් කාලයක් කල් තබා දැනුම් දීමක් 249 වන වගන්තිය යටතේ ඒ ණය හිමියාට දී නොමැති බවට ;

(ආ) සමථයට එළඹීම සඳහා අනුමතය ලබා ගැනීමේ දී වෙනත් වැදගත් අක්‍රමිකතාවක් සිදු වී ඇති බවට; හෝ

(ඇ) සමථයට එළඹීමට විරුද්ධව ඡන්දය දෙන ලද ණය හිමියකු සම්බන්ධයෙන් වන විට, ඒ සමථයට එළඹීම ඒ ණය හිමියාට හෝ ඒ ණය හිමියා අයත් වන ණය හිමියන් පන්තියට හෝ අසාධාරණ ලෙස අගතිකර බවට,

අධිකරණය සෑහීමට පත්වන අවස්ථාවක, ඒ ණය හිමියා ඒ සමථයට එළඹීමෙන් බැඳී නොසිටින බවට ආඥාවක් හෝ සුදුසු යයි අධිකරණය කල්පනා කරන වෙනත් යම් ආඥාවක් හෝ, අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ කරනු ලබන ඉල්ලීමක්, ඡන්ද විමසීමේ ප්‍රතිඵලය පිළිබඳ දැන්වීම ණය හිමියාට දෙන ලද දින සිට වැඩ කරන දින දහයක් පසුනොවී ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

සමාගමක් ඈවර කරනු ලැබීමේ දී සමථයකට එළඹීමේ බලපෑම.

**253**. (1) 250 වන වගන්තිය යටතේ සමථයකට එළඹීමක් අනුමත කර ඇති අවස්ථාවක,—

(අ) සමාගම විසින්;

(ආ) සමාගමේ දේපළ සම්බන්ධයෙන් පත් කරනු ලැබූ භාරගැනුම්කරුවකු විසින්;

(ඇ) අද්මිනිස්ත්‍රාසිකරුවකු විසින්; හෝ

(ඈ) අධිකරණයේ අවසරය ඇතිව, සමාගමේ යම් ණය හිමියකු හෝ කොටස් හිමියකු විසින්,

ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් මත, ඒ සමාගම ඈවර කරනු ලැබුවහොත් ඒ සමථයට එළඹීමේ බලපෑම කොතරම් දුරට දිගට ම පැවතිය යුතු ද සහ ඒ සමාගමේ ඈවරකරු කොතරම් දුරට ඉන් බැඳී සිටිය යුතු ද යන්න සම්බන්ධයෙන් සුදුසු යයි අධිකරණය කල්පනා කරන ආඥාවක් අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.

(2) 250 වන වගන්තිය යටතේ සමථයට එළඹීමක් අනුමත කර ඇත්තා වූ ද, තදනන්තරව සමාගම ඈවර කරනු ලබන්නා වූ ද අවස්ථාවක,—

(අ) ඈවරකරු විසින් ;

(ආ) සමාගමේ දේපළ සම්බන්ධයෙන් පත් කරන ලද භාරගැනුම්කරුවකු විසින්; හෝ

(ඇ) අධිකරණයේ අවසරය ඇතිව ඒ සමාගමේ ණය හිමියකු හෝ කොටස් හිමියකු විසින්,

ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් මත, ඒ සමථයට එළඹීමේ බලපෑම කොතරම් දුරට දිගට ම පැවතිය යුතු ද සහ සමාගමේ ඇවරකරු කොතරම් දුරට ඉන් බැඳී සිටිය යුතු ද යන්න සම්බන්ධයෙන් සුදුසු යයි අධිකරණය කල්පනා කරන ආඥාවක් අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.

**254**. අධිකරණය විසින් අන්‍යාකාරයෙන් ආඥාවක් කරනු ලබන්නේ නම් මිස, යෝජිත සමථයකට එළඹීමක් සම්බන්ධයෙන් ඡන්දය විමසීමේ කාර්යය සඳහා ණය හිමියන්ගේ රැස්වීමක් සංවිධානය කිරීම සහ පැවැත්වීම සඳහා දරන ලද වියදම— සමථයට එළඹීමෙහි ලා වියදම.

(අ) සමාගම විසින් දරනු ලැබිය යුතු ය;

(ආ) දේපළ භාරගැනුම්කරුවකු හෝ ඇවරකරුවකු හෝ විසින් ඒ වියදම් දරනු ලැබී නම්, ඒ දේපළවල භාරගැනුම්කාරත්වය දැරීමේ හෝ ඇවර කිරීමේ හෝ වියදමක් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඇ) අද්මිනිස්ත්‍රාසිකරුවකු විසින් දරනු ලැබී නම්, ඒ අද්මිනිස්ත්‍රාසිකරණයේ වියදමක් ලෙස සලකනු ලැබිය යුතු ය; නැතහොත්

(ඈ) වෙනත් යම් තැනැත්තකු විසින් දරනු ලැබී නම්, සමාගමෙන් ඒ තැනැත්තාට අය විය යුතු ණයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, සමාගම ඇවර කිරීමට පාත්‍ර කොට ඇත් නම් නවවන උපලේඛනයෙහි දක්වා ඇති ප්‍රමුඛත්ව අනුපිළිවෙල අනුව ගෙවනු ලැබිය යුතු ය.

## X වන කොටස

## වැඩ පිළිවෙලවල්, ඒකාබද්ධ කිරීම් සහ සමථයට එළඹීම්, අධිකරණය විසින් අනුමත කිරීම

අර්ථ නිරූපණය.

**255**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ කොටසේ—

"වැඩ පිළිවෙල" යන්නට, සමාගමක කොටස් සහ/ සමාගමක ප්‍රකාශිත ප්‍රාග්ධනය ප්‍රතිසංවිධානය කිරීම හෝ සමාගමක කොටස් හෝ සමාගමක ප්‍රකාශිත ප්‍රාග්ධනය ප්‍රතිසංවිධානය කිරීමක් ඇතුළත් වේ ;

"සමාගම" යන්නට, ලියාපදිංචි කළ විදේශීය සමාගමක් ඇතුළත් වේ ; සහ

"ණයහිමියා" යන්නට, සමාගමක් ඈවර කිරීමේ දී 357 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර ඒ සමාගමෙන් ණයක් තමන්ට අයවිය යුතු යයි හිමිකම්පෑමට හිමිකම් ලබන තැනැත්තකු ඇතුළත් වේ.

වැඩපිළිවෙලවල්, ඒකාබද්ධ කිරීම්, සහ සමථයට එළඹීම් අධිකරණය විසින් අනුමත කිරීම.

**256**.(1) මේ පනතේ විධිවිධාන හෝ සමාගමක සාංගමික ව්‍යවස්ථාවලියෙහි ඇතුළත් විධිවිධාන හෝ නොතකා—

(අ) සමාගමක් විසින් ;

(ආ) XIII වන කොටස යටතේ පත් කරන ලද අද්මිනිස්ත්‍රාසිකරුවකු විසින් ; හෝ

(ඇ) අධිකරණයේ අවසරය ඇතිව, සමාගමක යම් කොටස් හිමියකු හෝ ණය හිමියකු විසින්,

කරනු ලබන ඉල්ලීමක් මත, යම් වැඩ පිළිවෙලක් හෝ ඒකාබද්ධ කිරීමක් හෝ සමථයට එළඹීමක් මගින් ඒ සමාගම ද අධිකරණය විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන වෙනත් යම් තැනැත්තන් හෝ තැනැත්තන් පන්ති හෝ බැඳී සිටිය යුතු බවට අධිකරණයක් වි සින් ආඥා කරනු ලැබිය හැකි ය. එවැනි යම් ආඥාවක්, සුදුසු යයි අධිකරණය කල්පනා කරන යම් නියම හා කොන්දේසි මත කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ආඥාවක් කිරීමට පෙර, සමාගම හෝ අද්මිනිස්ත්‍රාසිකරු හෝ කොටස් හිමියකු හෝ ණය හිමියකු හෝ සම්බන්ධතාවක් ඇතැයි අධිකරණයට පෙනී යන වෙනත් යම් තැනැත්තකු හෝ විසින් කරනු ලබන ඉල්ලීමක් මත නැතහොත් අධිකරණයේ ම ඕනෑකම මත පහත දැක්වෙන ආඥා අතුරෙන් එක් ආඥාවක් හෝ ඊට වැඩි ආඥා ගණනක් අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය :—

(අ) ඉල්ලීම පිළිබඳ දැන්වීම, සුදුසු යයි අධිකරණය කල්පනා කරන ඊට අදාළ යම් තොරතුරු ද සමග, අධිකරණය විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන යම් ආකෘතියකට අනුව සහ එසේ නිශ්චිතව සඳහන් කරනු ලබන යම් ආකාරයකින් හා එසේ නිශ්චිතව සඳහන් කරනු ලබන තැනැත්තන්ට හෝ තැනැත්තන් පන්තිවලට භාර දිය යුතු බවට ආඥාවක් ;

(ආ) යෝජිත වැඩ පිළිවෙල හෝ ඒකාබද්ධ කිරීම හෝ සමථයට එළඹීම සලකා බැලීම සඳහා සහ සුදුසු යයි අධිකරණය නිශ්චය කරන්නේ නම් අධිකරණය විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන යම් ආකාරයකින් ඒ වැඩ පිළිවෙල හෝ ඒකාබද්ධ කිරීම හෝ සමථයට එළඹීම අනුමත කිරීම සඳහා, සමාගමක කොටස් හිමියන්ගේ හෝ යම් පන්තියකට අයත් කොටස් හිමියන්ගේ හෝ ණය හිමියන්ගේ හෝ යම් පන්තියකට අයත් ණය හිමියන්ගේ හෝ රැස්වීමක් හෝ රැස්වීම් හෝ පවත්වන ලෙස විධාන කරන ආඥාවක් අධිකරණය විසින්, තත් කාර්යය සඳහා, සමාගමක කොටස් හිමියන් පන්තියක් හෝ ණය හිමියන් පන්තියක් හෝ සංයුක්ත වන්නේ කවර කොටස් හිමියන්ගෙන් ද නැතහොත් කවර ණය හිමියන්ගෙන් ද යන්න නිශ්චය කරනු ලැබිය හැකි ය ;

(ඇ) යෝජිත වැඩ පිළිවෙල හෝ ඒකාබද්ධ කිරීම හෝ සමථයට එළඹීම පිළිබඳ වාර්තාවක්, අධිකරණය විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන තැනැත්තකු විසින් අධිකරණය සඳහා පිළියෙල කරන ලෙස සහ සුදුසු යයි අධිකරණය කල්පනා කරන්නේ නම්, සමාගමක කොටස් හිමියන් හෝ යම් පන්තියකට අයත් කොටස් හිමියන් හෝ ණය හිමියන් හෝ යම් පන්තියකට අයත් ණය හිමියන් හෝ සම්බන්ධතාවක් ඇතැයි අධිකරණයට පෙනී යන වෙනත් යම් තැනැත්තකු හෝ වෙත ඒ වාර්තාව සපයන ලෙස නියම කරන ආඥාවක් ;

(ඈ) එවැනි යම් වාර්තාවක් පිළියෙල කිරීමෙහි ලා දරන ලද ගාස්තු ගෙවීම පිළිබඳව ආඥාවක් ;

(ඉ) වැඩ පිළිවෙල හෝ ඒකාබද්ධ කිරීම හෝ සමථයට එළඹීම අනුමත කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් පෙනී සිට කරුණු ඉදිරිපත් කිරීමට හිමිකම් ලබන තැනැත්තන් කවුරුන් දැයි නිශ්චිතව සඳහන් කරන ආඥාවක්.

(3) මේ වගන්තිය යටතේ කරනු ලැබූ ආඥාවක්, ඒ ආඥාවේ නිශ්චිතව සඳහන් දිනයේ දී සහ එදින සිට බලපවත්වන්නේ ය.

(4) මේ වගන්තිය යටතේ අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබූ දින සිට වැඩ කරන දින දහයක් තුළ දී, ඒ ආඥාවේ පිටපතක් රෙජිස්ට්‍රාර්වරයා වෙත යවනු ලබන බවට සමාගම වගබලාගත යුතු ය.

(5) (4) වන උපවගන්තියේ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම සමාගමක් විසින් පැහැර හැර ඇති අවස්ථාවක,–

(අ) සමාගම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය ; තව ද

(ආ) පැහැර හැරීම කරන ලද සමාගමේ සෑම නිලධරයකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් පනස්දහසක් නොඉක්මවන දඩයකට ඒ නිලධරයා යටත් විය යුතු ය.

අධිකරණය විසින් අතිරේක ආඥා කරනු ලැබිය හැකි බව.

**257**. (1) 256 වන වගන්තිය යටතේ අනුමත කරන ලද යම් වැඩ පිළිවෙලක් හෝ ඒකාබද්ධ කිරීමක් හෝ සමථයට එළඹීමක් බලාත්මක කිරීමේ කාර්යය සඳහා, ඒ වගන්තිය යටතේ පවරනු ලැබූ බලතල සීමා නොකොට, ඒ වැඩ පිළිවෙල හෝ ඒකාබද්ධ කිරීම හෝ සමථයට එළඹීම අනුමත කරනු ලබන ආඥාව මගින් නැතහොත් තදනන්තර යම් ආඥාවක් මගින්, අධිකරණය විසින් පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සහ ඒ කාරණාවලට අදාළ නියම හා කොන්දේසි නියම කිරීම කරනු ලැබිය හැකි ය :—

(අ) චංචල හෝ නිශ්චල දේපළ, වත්කම්, අයිතිවාසිකම්, බලතල, සම්බන්ධතා, බැරකම්, සහ යෙදී සිටි කටයුතු පැවරීම හෝ සතු කිරීම ;

(ආ) කවර වර්ගයක වුව ද කොටස්, සුරැකුම්පත් හෝ සහතික නිකුත් කිරීම ;

(ඇ) නඩු කටයුතු දිගට ම කර ගෙන යාම ;

(ඈ) ඇවර කිරීම හෝ, ඇවර නොකොට යම් සමාගමක නම සහ විස්තර රෙජිස්ටරයෙන් ඉවත් කිරීම ;

(ඉ) 256 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ කරනු ලැබූ ආඥාවක් ප්‍රකාර කැඳවනු ලැබූ යම් රැස්වීමක දී අදාළ වැඩ පිළිවෙලට හෝ ඒකාබද්ධ කිරීමට හෝ සමථයට එළඹීමට විරුද්ධව ඡන්දය දුන් තැනැත්තන් සම්බන්ධයෙන් හෝ ඒ වැඩපිළිවෙල හෝ ඒකාබද්ධ කිරීම හෝ සමථයට එළඹීම අනුමත කරවා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද ඉල්ලීමට විරුද්ධව අධිකරණය ඉදිරියෙහි පෙනී සිටි තැනැත්තන් සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම ;

(ඊ) ඒ වැඩ පිළිවෙළ හෝ ඒකාබද්ධ කිරීම හෝ සමථයට එළඹීම බලාත්මක කිරීමට අවශ්‍ය හෝ යෝග්‍ය වෙනත් යම් කාරණා.

(2) (1) වන උපවගන්තිය යටතේ අධිකරණය විසින් කරනු ලැබූ යම් ආඥාවක්, ඒ ආඥාවේ භාවයට අනුකූලව බලාත්මක විය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබූ දින සිට වැඩ කරන දින දහයක් තුළ දී ඒ ආඥාවේ පිටපතක් රෙජිස්ට්‍රාර්වරයා වෙත යවනු ලබන බවට සමාගම වගබලා ගත යුතු ය.

(4) (3) වන උපවගන්තියේ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම සමාගමක් විසින් පැහැර හැර ඇති අවස්ථාවක දී,—

(අ) සමාගම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය ; තව ද

(ආ) පැහැර හැරීම කරන ලද සමාගමේ සෑම නිලධරයකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් පනස්දහසක් නොඉක්මවන දඩයකට ඒ නිලධරයා යටත් විය යුතු ය.

VIII වන කොටස අදාළ කිරීම.

**258**. යම් වැඩ පිළිවෙළක් හෝ ඒකාබද්ධ කිරීමක් හෝ සමථයට එළඹීමක් මේ පනතේ VIII වන කොටස හෝ මේ කොටසේ හෝ වෙනත් යම් විධිවිධානයක් හෝ යටතේ බලාත්මක කළ හැකි වේ නම්, එසේ කිරීම යුක්ති සහගත ලෙස ප්‍රායෝගික නොවන බවට අධිකරණය සෑහීමට පත් වන්නේ නම් මිස, එවැනි යම් වැඩ පිළිවෙලක්, ඒකාබද්ධ කිරීමක් හෝ සමථයට එළඹීමක් අධිකරණය විසින් 256 වන වගන්තිය යටතේ අනුමත කරනු නොලැබිය යුතු ය.

මේ කොටස යටතේ අනුමත කරන ලද සමථයට එළඹීමට 256 වන වගන්තිය අදාළ කිරීම.

**259**. 256 වන වගන්තිය යටතේ අනුමත කරන ලද යම් සමථයට එළඹීමක් සම්බන්ධයෙන්, අවශ්‍ය වන සුළු වශයෙන් වූ වෙනස් කිරීම් සහිතව, 253 වන වගන්තියේ විධිවිධාන අදාළ කරනු ලැබිය යුතු ය.

## XI වන කොටස

## අක් වෙරළ සමාගම්වලට අදාළ විධිවිධාන

මේ කොටසේ අර්ථ නිරූපණය.

**260**. මේ කොටසෙහි "සමාගම" යන්නට, යම් විදේශීය රටක නීති යටතේ සංස්ථාගත කරන ලද සමාගමක් හෝ සංස්ථාගත මණ්ඩලයක් ඇතුළත් වේ.

ශ්‍රී ලංකාවෙන් පිටත ව්‍යාපාර කටයුතු සඳහා සංස්ථාගත කරන ලද සමාගම්.

**261**. (1) යම් සමාගමක් අක් වෙරළ සමාගමක් ලෙස ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරනු ලැබීමට ද, එසේ හඳුන්වනු ලැබීමට ද, ඒ සමාගම විදේශයක දී සංස්ථාගත සමාගමක් සම්බන්ධයෙන් වන විට, එය මේ පනතේ විධිවිධාන යටතේ සංස්ථාගත කරනු ලැබූ සමාගමක් වූවාක් මෙන් ශ්‍රී ලංකාවෙහි සංස්ථාගත කරනු ලැබූ ලෙස සලකනු ලැබීමට ද ඒ සමාගම විසින් මේ පනතේ මේ කොටසේ විධිවි ධානවලට අනුකූලව, රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි කිරීම සඳහා කරනු ලබන ඉල්ලීමකට පහත සඳහන් ලේඛන යාකර තිබිය යුතු ය :—

(අ) සමාගමේ අධිකාර පත්‍රයේ, ව්‍යවස්ථාවේ හෝ සාංගමික සංස්ථා පත්‍රයේ සහ සාංගමික ව්‍යවස්ථාවලියේ හෝ සමාගම සංස්ථාපනය කරනු ලැබූ හෝ සමාගමේ සංස්ථාපනය විස්තර කරන වෙනත් යම් සාධන පත්‍රයක සහතික කළ පිටපතක්, සහ ඒ සාධන පත්‍රය රාජ්‍ය භාෂාවකින් හෝ ඉංග්‍රීසි භාෂාවෙන් හෝ නොවන අවස්ථාවක, රෙජිස්ට්‍රාර්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන යම් භාෂාවකින් වූ ඒ සාධන පත්‍රයේ පරිවර්තනයක් ;

(ආ) අධ්‍යක්ෂවරයන්ගේ හෝ සමාගමේ කටයුතු කළමනාකරණය කරන තැනැත්තන්ගේ සම්පූර්ණ නම්, ලිපිනයන්, රක්ෂා සහ සමාගමේ ඔවුන් දරන ධුර ඇතුළත් ඔවුන්ගේ ලැයිස්තුවක් ;

(ඇ) ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින්නා වූ ද සහ ශ්‍රී ලංකාවේ පුරවැසියන් වන සමාගම නියෝජනය කිරීමට බලය දෙන ලද්දා වූ එක් තැනැත්තකුගේ හෝ ඊට වැඩි තැනැත්තන් සංඛ්‍යාවකගේ නම් සහ ලිපිනයන් ;

(ඈ) (i) සමාගම සංස්ථාගත කරන ලද රටේ පිහිටි එම සමාගමේ ලියාපදිංචි හෝ ප්‍රධාන කාර්යාලයේ ; සහ

(ii) ශ්‍රී ලංකාවේ පිහිටි ඒ සමාගමේ කාර්යාලයේ,

සම්පූර්ණ ලිපිනය ඇතුළත් ප්‍රකාශයක්.

(ඉ) මෑත දිනයක දී සහතික කරන ලද, සමාගම සංස්ථාගත කිරීමේ සහතික පිටපතක් ;

(3) සමාගම විසින් පූර්වයෙන් වූ යම් විස්තරයක් සම්බන්ධයෙන් කරන ලද සංශෝධන හෝ වෙනස් කිරීම් පිළිබඳව නියමිත කාලසීමාව තුළ සහ නියමිත ආකෘතිය අනුව රෙජිස්ට්‍රාර්වරයා වෙත දැන්විය යුතු ය.

අක්වෙරළ සමාගමකට ලියාපදිංචි කිරීමේ සහතිකය ප්‍රදානය කිරීම.

**262**. (1) යම් අක් වෙරළ සමාගමක් විසින්,—

(අ) නියමිත ගාස්තුව ගෙවන ; සහ

(ආ) ඒ සමාගමේ ශ්‍රී ලංකාවේ කාර්යාලයේ කාර්යය සඳහා වූ ඒ සමාගමේ වියදම පියවීම සඳහා නියමිත මුදල් ප්‍රමාණය ඒ අක් වෙරළ නමින් වූ බැංකු ගිණුමක බැරට තැන්පත් කර ඇති බවට බැංකුවකින් ලබාගත් සහතිකයක් රෙජිස්ට්‍රාර්වරයාට ඉදිරිපත් කරන,

අවස්ථාවක ශ්‍රී ලංකාවේ පිටත එම සමාගමේ ව්‍යාපාර කටයුතු කර ගෙන යාම සඳහා ලියාපදිංචි කිරීමේ සහතිකයක් ජාතියේ යහපත හෝ ජාතික ආර්ථිකයේ යහපත ගැන සැලකිල්ල දක්වමින් රෙජිස්ට්‍රාර්වරයා විසින්, (3) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) මේ පනතේ මේ කොටස යටතේ අක් වෙරළ සමාගමක් වෙත නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයක් මගින්, මේ පනතේ වෙනත් යම් විධිවිධානයක් අනුව ක්‍රියා කිරීමෙන් ඒ සමාගම නිදහස් කරනු ලැබිය යුතු ය.

(3) යම් සමාගමක් සම්බන්ධයෙන්, පහත දැක්වෙන අවස්ථාවක දී, එනම්—

(අ) ඒ සමාගම ගණුන් බේරා වසා දැමීම හෝ ඈවර කිරීම හෝ ආරම්භ කර ඇති අවස්ථාවක දී ;

(ආ) ඒ සමාගමේ දේපළ සම්බන්ධයෙන් භාර ගැනුම්කරුවකු පත් කර ඇති අවස්ථාවක දී ;

(ඇ) ණය හිමියන්ගේ අයිතිවාසිකම් අත් හිටුවීමේ හෝ සීමා කිරීමේ හෝ යම් වැඩ පිළිවෙළක් නැතහොත් නියමයක් ඒ සමාගමට අදාළව බල පවත්නා අවස්ථාවක දී,

මේ වගන්තිය යටතේ ලියාපදිංචි කිරීමේ සහතිකයක් ඒ සමාගම වෙත ප්‍රදානය කරනු නොලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ විධිවිධාන යටතේ අක් වෙරළ සමාගමට ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කිරීමට පෙර රෙජිස්ට්‍රාර්වරයා—

(අ) විදේශයක දී සංස්ථාගත කරන ලද සමාගමක් සම්බන්ධයෙන් වූ විට, ඒ සමාගම විසින් අක් වෙරළ සමාගමක ව්‍යාපාර කටයුතුවල නිරතවීමට, සංස්ථාගත කරනු ලැබූ රටෙහි නීතිමය බාධකයන් නොමැති බවට ;

(ආ) ඒ සමාගම විසින් හෝ සමාගමට විරුද්ධව ආරම්භ කරන ලද හෝ ආරම්භ කිරීමට ඇති යම් නීතිමය හෝ වෙනත් කටයුත්තක්, ඒ සහතිකය නිකුත් කිරීම නිසා දෝෂ සහිත බවට පත් නොවන බවට,

සෑහීමට පත්විය යුතු අතර, ජාතියේ යහපත සඳහා අවශ්‍ය යයි ඔහු විසින් සලකනු ලබන කොන්දේසි ඒ සහතිකයෙහි ඇතුළත් කරනු ලැබිය යුතු ය.

(5) අක් වෙරළ සමාගමක ලියාපදිංචි කිරීම, මනා හේතු මත රෙජිස්ට්‍රාර්වරයා විසින් මේ පනතේ මේ කොටස යටතේ අවලංගු කරනු ලැබිය හැකි ය. එසේ අවලංගු කරනු ලැබූ විට, මේ පනතේ මේ කොටස

යටතේ හෝ අක් වෙරළ සමාගම්වලට අදාළ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ ප්‍රදානය කරන ලද වරප්‍රසාද හා ප්‍රතිලාභ භුක්ති විඳීම ඒ අක් වෙරළ සමාගම විසින් නතර කළ යුතු ය.

අක් වෙරළ සමාගමක ව්‍යාපාර කටයුතු දිගටම පවත්වාගෙන යාම.

**263**. මේ පනත යටතේ අක් වෙරළ සමාගමක් ලෙස ස්වකීය ව්‍යාපාර කටයුතු දිගට ම කර ගෙන යාමට අදහස් කරන අක් වෙරළ සමාගමක් විසින්, සෑම ලිත් වර්ෂයක දී ම,—

(අ) නියමිත ආකාරයට නියමිත ගාස්තුව ගෙවන ලද බවට සාක්ෂි, ඒ වර්ෂයේ ආරම්භයේ දී, එනම්, ඒ වර්ෂයේ ජනවාරි මස තිස් එක් වන දින පසුවීමට පෙර රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය ; තව ද

(ආ) ඒ වර්ෂයේ අක් වෙරළ සමාගමේ වියදම් දැරීම සම්බන්ධයෙන් 262 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ නියම කර ඇති පරිදි බැංකු සහතිකයක්, ඒ වර්ෂයේ ජනවාරි මස තිස් එක් වන දින පසුවීමට පෙර හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් අනුමත කරනු ලබන යම් පසු දිනයකට පෙර රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

ශ්‍රී ලංකාවේ ව්‍යාපාර කටයුතු කර ගෙන යාම තහනම් කිරීම.

**264**. (1) යම් ව්‍යාපාරයක් ශ්‍රී ලංකාවෙන් පිටත කරගෙන යාමේ බලය අක් වෙරළ සමාගමකට ඇති අතර, ශ්‍රී ලංකාව ඇතුළත යම් ව්‍යාපාරයක් කරගෙන යාමට හිමිකම ඊට නොමැත්තේ ය.

(2) අක් වෙරළ සමාගමකට අදාළ කළ හැකි යම් ලිඛිත නීතියක් යටතේ ශ්‍රී ලංකාවේ දී ලබාගත හැකි යම් ප්‍රතිලාභයක් හෝ වාසියක් අත් කර ගැනීමට (1) වන උපවගන්තියෙහි සඳහන් කිසිවක් නිසා, සමාගමට බාධාවක් නොවිය යුතු ය.

අක් වෙරළ සමාගමක් වශයෙන් ව්‍යාපාර කටයුතු කර ගෙන යාම නතර කිරීම.

**265**. අක්වෙරළ සමාගමක් වශයෙන් ව්‍යාපාර කටයුතු කර ගෙන යාම නතර කිරීම පිළිබඳ ස්වකීය අධ්‍යාශය පිළිබඳව දැන්වීමක් නියමිත ආකෘතිය මගින් රෙජිස්ට්‍රාර්වරයාට දීමෙන්, අක්වෙරළ සමාගමක් විසින් එසේ අක්වෙරළ සමාගමක් වශයෙන් ව්‍යාපාරය කර ගෙන යාම නතර කරනු ලැබිය හැකි ය.

## XII වන කොටස

## ගණන් බේරා වසා දැමීම

### (1) මූලික

### ගණන් බේරා වසාදැමීමේ ක්‍රම

"සහදායක" යන්නෙහි අර්ථ කථනය.

**266**. මේ පනතේ මේ කොටසෙහි "සහදායක" යන යෙදුමෙන් සමාගමේ සෑම කොටස් හිමියකු ද සමාගමක් වසා දැමීමක දී සමාගමේ වත්කම්වලට දායක වීමට බැඳී සිටින වෙනත් සෑම තැනැත්තකු ද, සහදායකයන් වශයෙන් සැලකිය යුතු වන්නේ කවර තැනැත්තන් ද යන වග නිශ්චය කිරීම සඳහා වූ සියලු නඩු කටයුතුවල සහ එසේ අවසාන වශයෙන් නිශ්චය කිරීම සඳහා වූ සියලු නඩු කටයුතුවල කාර්යය සඳහා සහදායක වශයෙන් සලකනු ලබන තැනැත්තන් ද අදහස් වන අතර, සහදායකයකු යයි සලකනු ලබන තැනැත්තෙක් ද ඊට ඇතුළත් වේ.

ගණන් බේරා වසා දැමීමේ ක්‍රම.

**267**. (1) සමාගමක් ගණන් බේරා වසා දැමීම,—

(අ) අධිකරණය විසින් ;

(ආ) ස්වේච්ඡාවෙන් ; හෝ

(ඇ) අධිකරණයේ අධීක්ෂණයට යටත්ව,

කළ හැකි ය.

(2) පටහැනි තත්වයක් ඇති බව පෙනී ගියහොත් මිස, ගණන් බේරා වසා දැමීම සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන (1) වන උපවගන්තියෙහි දක්වා ඇති කවර වූ හෝ ආකාරයකට සමාගමක් ගණන් බේරා වසා දැමීමෙහි ලා අදාළ විය යුතු ය.

### සහදායකයෝ

වර්තමාන සහ ආදි කොටස් හිමියන්ගේ වගකීම බලාත්මක කිරීමට ඈවරකරු සතු බලය.

**268**. (1) ඈවරකරු විසින්—

(අ) කොටස් හිමියකු ඇරයුම්වලට යටත්ව සිටී නම්, ඒ කොටස් හිමියා දරන කොටස් විෂයෙහි ඇරයුම් කරනු ලැබිය හැකි ය ;

(ආ) වර්තමාන කොටස් හිමියකු හෝ ආදි කොටස් හිමියකු හෝ අන්‍යාකරයකින් සමාගමට වගකීමට බැඳී සිටීනම්, ඒ වගකීම බලාත්මක කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ කරනු ලබන ඇරැයුමක් ලිඛිතව විය යුතු ය.

**269**. (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, ඇවර කිරීමට පාත්‍ර කොට ඇති සමාගමක කොටස් හිමියකු විසින් කොටසක් සම්බන්ධයෙන් අයවීමට ඇති මුදල් ගෙවීම පැහැර හරිනු ලබන්නේ නම්,— ගෙවා නොමැති ඇරැයුම් සම්බන්ධයෙන් ආදි කොටස් හිමියන්ගේ වගකීම.

(අ) ඇවර කිරීම ආරම්භ කිරීමට කලින් එක් අවුරුද්දක කාල පරිච්ඡේදය තුළ දී ; හෝ

(ආ) අධිකරණය විසින් ඇවර කිරීම නියම කර ඇති සමාගමක් සම්බන්ධයෙන් වන විට, ඇවර කිරීම සඳහා වූ ඉල්ලීම අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද දිනයෙන් ආරම්භව, අධිකරණයේ ආඥාව කරන ලද දිනයෙන් අවසාන වන කාල පරිච්ඡේදය ද සමග ඒ ඉල්ලීම අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට කලින් වූ එක් අවුරුද්දක කාල පරිච්ඡේදය තුළ දී,

යම් අවස්ථාවක ඒ කොටසේ අයිතිකරු ලෙස ලියාපදිංචි කර තිබුණු යම් තැනැත්තකු විසින් ඒ මුදල ගෙවිය යුතු වන අතර, ඇවරකරු විසින් ඒ මුදල ඒ තැනැත්තාගෙන් අය කර ගනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් කාල පරිච්ඡේදය තුළ සමාගමේ කොටස් හිමියකු ලෙස යම් ආදි කොටස් හිමියකු ලියාපදිංචි කොට තිබුණු සියලු කාලවල දී සමාගමේ ණයතුරුස් ගෙවිය යුතු වූ විට ඒවා ගෙවීමට සමාගමට හැකියාව තිබුණේ නම්, එවැනි ආදි කොටස් හිමියෙක් (1) වන උපවගන්තිය යටතේ වගකීමට යටත් නොවන්නේ ය.

(3) යම් කොටසකට අදාළ වගකීම, ඒ කොටස දරන්නා ලෙස ආදි කොටස් හිමියකු ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු වැඩි වී ඇති අවස්ථාවක, ඒ කොටස ඔහු විසින් දරන ලද කාලයේ දී ඒ කොටසට අදාළ යම් වගකීමක මුදල පමණක් ගෙවීමට ඔහු යටත් වන්නේ ය.

### (II) අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම

**අධිකරණය විසින් සමාගමක් ගණන් බේරා වසා දැමිය හැකි අවස්ථා**

**270**. යම් සමාගමක් සම්බන්ධයෙන් වන විට,— අධිකරණය විසින් සමාගමක් ගණන් බේරා වසා දැමිය හැකි අවස්ථා.

(අ) ඒ සමාගම අධිකරණය විසින් ගණන් බේරා වසා දැමිය යුතු යයි විශේෂ යෝජනා සම්මතයක් මගින් සම්මත කර ඇත්නම් ;

(ආ) ඒ සමාගම සංස්ථාගත කරනු ලැබූ දින සිට එක් වර්ෂයක් තුළ දී එහි ව්‍යාපාරික කටයුතු ආරම්භ නොකළහොත් හෝ එහි ව්‍යාපාරික කටයුතු එක් වර්ෂයකට අත්හිටුවනු ලැබුවහොත් ;

(ඇ) ඒ සමාගමේ සාමාජික සංඛ්‍යාව මේ පනතේ 4 වන වගන්තියේ (2) වන උපවගන්තියෙන් නියම කර ඇති අවම සාමාජික සංඛ්‍යාවට වඩා අඩුවේ නම් ;

(ඈ) ඒ සමාගමේ අධ්‍යක්ෂවරයන් කිසිවකු නොසිටිත් නම් ;

(ඉ) ඒ සමාගමට එහි ණය ගෙවීමට නොහැකි වේ නම් ; හෝ

(ඊ) ඒ සමාගම ගණන් බේරා වසා දැමීම සාධාරණ සහ යුක්ති සහගත බව අධිකරණයේ මතය වේ නම්,

එවැනි සමාගමක් අධිකරණය විසින් ගණන් බේරා වසා දමනු ලැබිය හැකි ය.

ණය ගෙවීමට නොහැකි වීම යන්නෙහි අර්ථ කථනය.

**271**. සමාගමක් විසින්—

(අ) එවකට ලැබිය යුතු රුපියල් පන්දහසක් ඉක්මවන මුදලක් පැවරීමකින් හෝ අන්‍යාකාරයකින් හෝ සමාගම ණය වී ඇති ණයහිමියකු විසින් එසේ ලැබිය යුතුව ඇති මුදල ගෙවන ලෙස සමාගමට නියම කොට තම අත්සනින් යුත් ඉල්ලීමක් ඒ සමාගමේ ලියාපදිංචි කළ කාර්යාලය වෙත භාර දෙනු ලැබ, ඒ මුදල ගෙවීම හෝ ඒ ණය හිමියා සාධාරණ ලෙස සෑහීමට පත් වන පරිදි ඒ මුදල සුරක්ෂිත කිරීම හෝ ඒ සඳහා සමථයකට පැමිණවීම, ඒ ඉල්ලීම භාර දෙන ලද දින සිට සති තුනක් යන තෙක් පැහැර හැර ඇති අවස්ථාවක ඒ සමාගමට එහි ණය ගෙවීමට නොහැකි යයි සලකනු ලැබිය යුතු ය ;

(ආ) සමාගමේ ණය හිමියකුගේ වාසියට යම් අධිකරණයක් විසින් ප්‍රකාශ කරන ලද නඩු තීන්දුවක්, තීන්දු ප්‍රකාශයක් හෝ ආඥාවක් මත නිකුත් කරන ලද ක්‍රියාවෙහි යෙදවීමේ හෝ වෙනත් අධිකරණ විධානයක්, සම්පූර්ණයෙන් ම හෝ අඩක් හෝ ඉටු නොකර ආපසු එවනු ලැබූ අවස්ථාවක, ඒ සමාගම විසින් එහි ණය ගෙවීමට නොහැකි යයි සලකනු ලැබිය යුතු ය ; නැතහොත්

(ඇ) ඒ සමාගමට ණය ගෙවීමට නොහැකි බව අධිකරණය සෑහීමට පත් වන පරිදි ඔප්පු කරනු ලැබූ අවස්ථාවක, සමාගමකට එහි ණය ගෙවීම නොහැකි යයි සලකනු ලැබිය යුතු අතර, සමාගමට එසේ එහි ණය ගෙවීමට නොහැකි ද යන වග නිශ්චය කිරීමේ දී ඒ සමාගමේ සම්භාව්‍ය හා සක්‍ය බැරකම් අධිකරණය විසින් සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

## ගණන් බේරා වසාදැමීම සඳහා වූ පෙත්සම සහ එහි ප්‍රතිඵල

ගණන් බේරා වසා දැමීම සඳහා වූ ඉල්ලීම.

**272**. (1) සමාගමක් ගණන් බේරා වසා දැමීම සඳහා අධිකරණය වෙත කරනු ලබන ඉල්ලීමක්, මේ වගන්තියේ විධිවිධානවලට යටත්ව, සමාගම විසින් හෝ (සම්භාව්‍ය හෝ සක්‍ය හෝ යම් ණය හිමියකු හෝ ණය හිමියන් හෝ ඇතුළුව) යම් ණය හිමියකු හෝ ණය හිමියන් හෝ විසින් නැතහොත් සහදායකයකු හෝ සහදායකයන් විසින් හෝ ඒ පාර්ශ්වකරුවන් සියලුදෙනා ම විසින් හෝ ඔවුනතුරෙන් කවරකු වි සින් හෝ, එක්ව හෝ වෙන් වෙන්ව හෝ, ඉදිරිපත් කරනු ලබන පෙත්සමක් මගින් විය යුතු ය :

එසේ වුවද—

(අ) සහදායකයකු විසින් ගණන් බේරා වසා දැමීම සඳහා වූ පෙත්සමක්—

(i) සාමාජික සංඛ්‍යාව, මේ පනතේ 4 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ නියම කර ඇති අවම සාමාජික සංඛ්‍යාවට වඩා අඩු කරනු ලැබූවහොත් ; හෝ

(ii) ඔහු සහදායකයකු වන්නේ යම් කොටස් සම්බන්ධයෙන් ද ඒ කොටස් හෝ ඉන් සමහරක් හෝ, මුලින් ඔහු වෙත වෙන් කර දෙන ලද්දා වූ හෝ ගණන් බේරා වසා දැමීම ආරම්භ කරන ලද දිනයට ඉහතින් ම වූ මාස දහඅටක කාලය තුළ යටත් පිරිසෙයින් මාස හයක කාලයක් ඔහු විසින් දරන ලද්දා වූ සහ ඔහුගේ නමින් ලියාපදිංචි කරන ලද්දා වූ හෝ කලින් සිටි කොටස් දරන්නකුගේ මරණය හේතු කොටගෙන ඔහු වෙත උරුම වූ හෝ කොටස් වන්නේ නම්,

මිස, ඉදිරිපත් කිරීමට හිමිකම් නොලැබිය යුතු ය ;

(ආ) ශාස්තු සම්බන්ධයෙන් සාධාරණ යයි අධිකරණය කල්පනා කරන යම් ඇපයක් තබන තෙක් සහ, අධිකරණය සෑහීමට පත් වන පරිදි, ගණන් බේරා වසා දැමීම සඳහා බැලූ බැල්මට පෙනෙන නඩුවක් ඇති බව ප්‍රතිෂ්ඨාපනය කරනු ලබන තෙක්, සම්භාව්‍ය හෝ සක්‍ය ණය හිමියකු විසින් ඉදිරිපත් කරන ලද, ගණන් බේරා වසා දැමීම සඳහා වූ පෙත්සමක් අධිකරණය විසින් විභාග කරනු නොලැබිය යුතු ය ; තව ද

(ඇ) 177 වන වගන්තියේ (3) වන උපවගන්තියේ සඳහන් සමාගමක් සම්බන්ධයෙන් වන විට, ගණන් බේරා වසා දැමීම සඳහා වූ පෙත්සමක් රෙජිස්ට්‍රාර්වරයා විසින් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) ස්වේච්ඡාවෙන් හෝ අධිකරණයට යටත්ව හෝ සමාගමක් ගණන් බේරා වසා දමනු ලබන අවස්ථාවක, තත් කාර්යය සඳහා මේ වගන්තියේ විධිවිධාන යටතේ බලය දෙනු ලැබූ වෙනත් යම් තැනැත්තකු විසින් මෙන්ම අධිකරණයට අනුයුක්ත නිල භාර ගැනුම්කරු විසින් ගණන් බේරා වසා දැමීම සඳහා වූ පෙත්සමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. එහෙත්, ණය හිමියන්ගේ හෝ සහදායකයන්ගේ හෝ සම්බන්ධතා කෙරෙහි නිසි සැලකිල්ල ඇතිව ස්වේච්ඡාවෙන් හෝ අධීක්ෂණයට යටත්ව හෝ ගණන් බේරා වසා දැමීම තවදුරටත් කර ගෙන යා නොහැකි බවට අධිකරණය සෑහීමට පත්වන්නේ නම් මිස, පෙත්සම් සම්බන්ධයෙන් ගණන් බේරා වසා දැමීමේ ආඥාවක් අධිකරණය විසින් නොකළ යුතු ය.

පෙත්සම විභාග කිරීමේ දී අධිකරණය සතු බලතල.

**273**. (1) ගණන් බේරා වසා දැමීම සඳහා වූ පෙත්සමක් විභාග කරන විට, අධිකරණය විසින් එය නිෂ්ප්‍රභ කරනු ලැබිය හැකි ය ; නැතහොත් කොන්දේසි සහිතව හෝ කොන්දේසි රහිතව හෝ විභාගය අඩාළව කල් තැබීම හෝ යම් අතුරු ආඥාවක් හෝ සුදුසු යයි අධිකරණය කල්පනා කරන වෙනත් යම් ආඥාවක් හෝ කරනු ලැබිය හැකි ය. එහෙත් සමාගමේ වත්කම්වලට සමාන ප්‍රමාණයකට හෝ ඊට වැඩි ප්‍රමාණයකට ඒ වත්කම් උකස් කර තිබීම හෝ සමාගම සතුව වත්කම් නොතිබීම හෝ හේතු කොට ගෙන, ගණන් බේරා වසා දැමීමේ ආඥාවක් කිරීම අධිකරණය විසින් ප්‍රතික්ෂේප නොකළ යුතු ය.

(2) සමාගම ගණන් බේරා වසා දැමීම සාධාරණය සහ යුක්ති සහගතය යන හේතුව මත සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා වූ පෙත්සමක්, සහදායකයන් වශයෙන් සමාගමේ කොටස් හිමියන් විසින් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක, පෙත්සම්කරුවන්ට වෙනත් යම් ප්‍රතිකර්මයක් ලබා ගත හැකි බව සහ ඒ වෙනත් ප්‍රතිකර්මය ලබා ගැනීමට ක්‍රියා කිරීම

වෙනුවට සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා ඔවුන් අයුක්ති සහගත ලෙස ක්‍රියා කරන බව අධිකරණයේ මතය වන්නේ නම් මිස,—

(අ) සමාගම ගණන් බේරා වසා දැමීමෙන් හෝ වෙනත් යම් ක්‍රමයකින් සහන ලබා ගැනීමට පෙත්සම්කරුවන්ට හිමිකම ඇති බව ; සහ

(ආ) වෙනත් යම් සහනයක් නොමැති විට, සමාගම ගණන් බේරා වසා දැමීම යුක්ති සහගත සහ සාධාරණ බව,

අධිකරණයේ මතය වන විට, අධිකරණය විසින්, සමාගම ගණන් බේරා වසා දැමීමේ ආඥාවක් කරනු ලැබිය යුතු ය.

සමාගමට විරුද්ධව පවත්නා නඩු කටයුතු නතර කිරීමේ හෝ තහනම් කිරීමේ බලය.

**274**. ගණන් බේරා වසා දැමීම සඳහා වූ පෙත්සමක් ඉදිරිපත් කිරීමෙන් පසු හා ගණන් බේරා වසා දැමීමේ ආඥාවක් කිරීමට පෙර කවර හෝ වේලාවක සමාගම හෝ එහි යම් ණය හිමියකු හෝ සහදායකයකු හෝ විසින්—

(අ) සමාගමට විරුද්ධව යම් නඩුවක් හෝ නඩු කටයුත්තක් ශ්‍රී ලංකාවේ යම් අධිකරණයක විනිශ්චයට භාජනයව පවත්නා අවස්ථාවක, ඒ නඩුව හෝ නඩු කටයුත්ත පවත්වා ගෙන යාම නතර කරන ලෙස එය පවත්නා අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය ; තව ද

(ආ) සමාගමට විරුද්ධව වෙනත් යම් නඩුවක් හෝ නඩු කටයුක්තක් විනිශ්චයට භාජනයව පවත්නා අවස්ථාවක, සමාගම ගණන් බේරා වසා දැමීමට අධිකරණ බලය ඇති අධිකරණය වෙත, ඒ නඩුව හෝ නඩු කටයුත්ත පිළිබඳ වැඩිදුර නඩු කටයුතු තහනම් කරන ලෙස ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය :

තව ද, එසේ ඉල්ලුම් කරනු ලැබුවේ යම් අධිකරණයක් වෙත ද ඒ අධිකරණය විසින් ඒ අනුව යෝග්‍ය යයි අධිකරණය කල්පනා කරන යම් නියම මත ඒ නඩු කටයුතු අවස්ථාවෝචිත පරිදි නතර කිරීම හෝ තහනම් කිරීම ඒ අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.

ගණන් බේරා වසා දැමීම ආරම්භ කිරීමෙන් පසු දේපළ ආදිය නියාදනය කිරීම වැළැක්වීම.

**275**. අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීමක දී, අධිකරණය විසින් අන්‍යාකාරයකින් ආඥා කරන්නේ නම් මිස, එසේ ගණන් බේරා වසා දැමීම ආරම්භ කිරීමෙන් පසු කරනු ලැබූ නඩුවට විෂය වී ඇති දේ ද ඇතුළුව සමාගමේ යම් දේපළක් නියාදනය කිරීමක් සහ කොටස් පැවරීමක් හෝ සමාගමේ සාමාජිකයන් දරන තත්ත්වයෙහි කරනු ලැබූ යම් වෙනස් කිරීමක් ශූන්‍ය විය යුතු ය.

තහනම් කිරීම් ආදිය ශූන්‍ය කිරීම.

**276**. (1) යම් සමාගමක්, (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, අධිකරණය විසින් ගණන් බේරා වසා දමනු ලබන අවස්ථාවක, ගණන් බේරා වසා දැමීම සඳහා වූ පෙත්සම ඉදිරිපත් කරන ලද කාලයෙන් පසු සමාගමේ බූදලයට හෝ බඩුබාහිරාදියට එරෙහිව බලාත්මක කරනු ලබන යම් තහනමට ගැනීමක්, තහනම් කිරීමක් හෝ විනිග්‍රහණයක් සියලු කාර්යය සඳහා ශූන්‍ය විය යුතු ය.

(2) යම් දේපළක් සම්බන්ධයෙන් වූ බැඳීමකට හිමිකම ඇති ණය හිමියකු විසින් හෝ ඔහුගේ ප්‍රතිලාභය සඳහා හෝ ඒ දේපළට විරුද්ධව ඇති යම් විනිග්‍රහණ ක්‍රියාවලියකට හෝ තහනමට ගැනීමකට හෝ මේ වගන්තියේ ඇතුළත් කිසිවක් අදාළ නොවිය යුතු ය.

### ගණන් බේරා වසා දැමීම ආරම්භ කිරීම

අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම ආරම්භ කිරීම.

**277**. (1) අධිකරණය විසින් සමාගමක් ගණන් බේරා වසා දමනු ලැබීම සඳහා වූ පෙත්සමක් ඉදිරිපත් ඉදිරිපත් කිරීමට පෙර, ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම සඳහා සමාගම විසින් යෝජනා සම්මතයක් සම්මත කර ගෙන ඇති අවස්ථාවක, ඒ සමාගම ගණන් බේරා වසා දැමීම ඒ යෝජනා සම්මතය සම්මත කරනු ලැබූ වේලාවේ දී ආරම්භ වූ ලෙස සලකනු ලැබිය යුතු අතර, වංචාවක් හෝ වැරදීමක් හෝ සිදු වී ඇතැයි ඔප්පු කරනු ලැබීම මත අන්‍යාකාරයක විධානයක් කිරීම සුදුසු යයි අධිකරණය කල්පනා කරන්නේ නම් මිස, ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමේ දී ගනු ලැබූ සියලු ක්‍රියා මාර්ග වලංගු ලෙස ගනු ලැබූ ක්‍රියා මාර්ග ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) වෙනත් කවර වුවද අවස්ථාවක දී, අධිකරණය විසින් සමාගමක් ගණන් බේරා වසා දමනු ලැබීම, ගණන් බේරා වසා දැමීමේ පෙත්සම ඉදිරිපත් කරනු ලැබූ වේලාවෙහි ආරම්භ වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

## ගණන් බේරා වසා දැමීම පිළිබඳ ආඥාවක ප්‍රතිඵල

**278**. ගණන් බේරා වසා දැමීමේ ආඥාවක් කරනු ලැබූ විට ඒ ආඥාවේ පිටපතක් නොපමාවම සමාගම විසින් හෝ නියමිත වෙනත් ආකාරයකින් රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතු අතර, ඒ සමාගමට අදාළව රෙජිස්ට්‍රාර්වරයා සතුව ඇති පොත්වල ඒ පිළිබඳව සටහනක් ඔහු විසින් කරනු ලැබිය යුතු ය. ආඥාවේ පිටපතක් රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතු බව.

**279**. (1) ගණන් බේරා වසා දැමීමේ ආඥාවක් කරනු ලැබූ විට හෝ (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව තාවකාලික ඈවරකරුවකු පත් කරනු ලැබූ විට, අධිකරණයේ අවසරය ඇතිව මිස සහ අධිකරණය විසින් පනවනු ලබන යම් නියමයන්ට යටත්ව මිස, සමාගමට විරුද්ධව නඩුවක් හෝ නඩු කටයුත්තක් හෝ තවදුරටත් පවත්වා ගෙන යාම හෝ ආරම්භ කිරීම හෝ කරනු නොලැබිය යුතු ය. ගණන් බේරා වසා දැමීමේ දී නඩු නතර කළ යුතු බව.

(2) යම් දේපළක් සම්බන්ධයෙන් වූ බැඳීමකට හිමිකම් ඇති ණය හිමියකු විසින් හෝ ඔහුගේ ප්‍රතිලාභය සඳහා හෝ ඒ දේපළට විරුද්ධව ඇති යම් විනිග්‍රහණ ක්‍රියාවලියකට හෝ තහනමට ගැනීමකට මේ වගන්තියේ ඇතුළත් කිසිවක් අදාළ නොවිය යුතු ය.

**280**. සමාගමක් ගණන් බේරා වසා දැමීම සඳහා වූ ආඥාවක් ණය හිමියකුගේ සහ සහදායකයකුගේ ඒකාබද්ධ පෙත්සමක් මත කරන ලද විටක මෙන්, ඒ සමාගමේ සියලු ම ණය හිමියන්ගේ සහ සියලුම සහදායකයන්ගේ වාසියට ක්‍රියාත්මක විය යුතු ය. ගණන් බේරා වසා දැමීමේ ආඥාවක බලපෑම.

## ගණන් බේරා වසා දැමීමේ දී නිල භාර ගැනුම්කරු

**281**. මේ පනතේ කාර්ය සඳහා "නිල භාර ගැනුම්කරු" යන යෙදුම, අධිකරණය විසින් සමාගමක් ගණන් බේරා වසා දැමීමට අදාළ වන තාක් දුරට, ඒ යෙදුමෙන් වස්තු භංගත්ව කාර්ය සඳහා අධිකරණයට අනුයුක්ත කර ඇති නිල භාර ගැනුම්කරුවකු සිටී නම්, ඒ නිල භාර ගැනුම්කරු හෝ එසේ අනුයුක්ත කර ඇති නිල භාර ගැනුම්කරුවකු නොමැති නම්, එවිට නිල භාර ගැනුම්කරු ලෙස ඒ අධිකරණයට අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන තැනැත්තෙක් හෝ අදහස් වේ. නිල භාර ගැනුම්කරු.

**282**. අධිකරණය විසින් යම් සමාගමක් ගණන් බේරා වසා දමනු ලබන අවස්ථාවක, ඒ ගණන් බේරා වසා දැමීම වඩාත් පහසු හා සකසුරුවම් ලෙස කර ගෙන යාමේ අදහසින් 281 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර නිල භාර ගැනුම්කරු වන තැනැත්තා හැර, වෙනත් යම් ඇතැම් අවස්ථාවල දී නිල භාර ගැනුම්කරුවකු අධිකරණය විසින් පත් කරනු ලැබීම.

නිලධරයකු ඒ ගණන් බේරා වසා දැමීමේ කාර්යය සඳහා නිල භාර ගැනුම්කරු ලෙස ක්‍රියා කිරීම යෝග්‍ය යයි අධිකරණයට පෙනී ගිය හොත්, අධිකරණය විසින්, ඒ ගණන් බේරා වසා දැමීමේ දී නිල භාර ගැනුම්කරු ලෙස ක්‍රියා කිරීම පිණිස ඒ වෙනත් නිලධරයා පත් කරනු ලැබිය හැකි අතර, එසේ පත් කරනු ලැබූ තැනැත්තා ඒ ගණන් බේරා වසා දැමීමේ දී මේ පනතේ සියලු කාර්ය සඳහා නිල භාර ගැනුම්කරු ලෙස සලකනු ලැබිය යුතු ය.

සමාගමේ කටයුතු පිළිබඳ ප්‍රකාශය නිල භාර ගැනුම්කරු වෙත ඉදිරිපත් කළ යුතු බව.

**283**. (1) අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීමේ ආඥාවක් කරනු ලැබූ හෝ තාවකාලික ඈවරකරුවකු පත් කරනු ලැබූ හෝ අවස්ථාවක, අන්‍යාකාර ආඥාවක් කිරීම සුදුසු යයි අධිකරණය කල්පනා කර එවැනි ආඥාවක් කරනු ලැබුවහොත් මිස, සමාගමේ කටයුතු පිළිබඳව නියමිත ආකෘතිය අනුසාරයෙන් වූ ද, දිවුරුම් පත්‍රයක් මගින් සත්‍යායනය කරනු ලැබුවා වූ ද සමාගමේ වත්කම්, ණය සහ බැරකම් පිළිබඳ විස්තර ද එකී ණය හිමියන්ගේ නම්, පදිංචිය හා රක්ෂා ද, පිළිවෙලින් ඔවුන් දරන සුරැකුම් පත් ද, පිළිවෙලින් ඒ සුරැකුම්පත් දෙනු ලැබූ දින හා නියමිත හෝ, නිල භාර ගැනුම්කරු විසින් නියම කරන ලද තවත් හෝ වෙනත් තොරතුරු ද, දැක්වෙන ප්‍රකාශයක් පිළියෙල කර, නිල භාර ගැනුම්කරු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් ප්‍රකාශය, අදාල දිනයේ දී සමාගමේ අධ්‍යක්ෂවරයන්ව සිටි තැනැත්තන්ගෙන් එක් අයකු හෝ වැඩි දෙනකු හෝ විසින් ද, එදිනට සමාගමේ ලේකම්වරයාව සිටි තැනැත්තා හෝ නිල භාර ගැනුම්කරු වශයෙන් අධිකරණය විසින් පත් කරනු ලබන පහත සඳහන් තැනැත්තන් අතුරෙන් කිසිවකු විසින් ද, අධිකරණයේ විධානයට යටත්ව, ඉදිරිපත් කොට සත්‍යායනය කරනු ලැබිය යුතු ය :—

(අ) සමාගමේ නිලධරයන් වන හෝ සමාගමේ නිලධරයන් වී සිටි තැනැත්තන් ;

(ආ) සමාගම පිහිටුවීමෙහි ලා, අදාළ දිනයට පෙර අවුරුද්දක් ඇතුළත කවර හෝ විටක, හවුල්වූවන් ;

(ඇ) ඒ සමාගමේ සේවයෙහි නියුක්තව සිටින හෝ එකී අවුරුද්ද ඇතුළත සමාගමේ සේවයෙහි නියුක්තව සිටියා වූ ද, නිල භාර ගැනුම්කරුගේ මතය අනුව, අවශ්‍ය තොරතුරු ලබාදිය හැකි වන්නා වූ ද තැනැත්තන් ;

(ඈ) ප්‍රකාශය අදාළ වන සමාගමේ නිලධරයකු වන හෝ එකී අවුරුද්ද ඇතුළත නිලධරයකුව සිටි සහ සමාගමේ නිලධරයන් වන හෝ එකී අවුරුද්ද ඇතුළත ඒ සමාගමේ නිලධරයන්ව සිටි නැතහොත් එහි සේවයෙහි නියුක්තව සිටි තැනැත්තන්.

(3) අදාළ දිනයේ සිට දින දහහතරක් ඇතුළත හෝ නිල භාර ගැනුම්කරු හෝ අධිකරණය හෝ විසින්, විශේෂ හේතු මත නියම කරනු ලැබිය හැකි යම් දීර්ඝ කළ කාලයක් ඇතුළත (1) වන උපවගන්තියේ සඳහන් ප්‍රකාශය ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ විධිවිධානවලින් නියම කර ඇති ප්‍රකාශය සහ දිවුරුම් ප්‍රකාශය පිළියෙල කරන හෝ පිළියෙල කිරීමෙහි ලා සම්බන්ධ වන තැනැත්තකු විසින් ඒ ප්‍රකාශය හා දිවුරුම් ප්‍රකාශය පිළියෙල කිරීම සහ සකස් කිරීම සඳහා සහ ඒ සම්බන්ධයෙන් දරනු ලැබූ ද, යුක්ති සහගත යයි නිල භාර ගැනුම්කරු විසින් සලකනු ලබන්නා වූ ද, ගාස්තු හා වියදම්, අධිකරණය වෙත අභියාචනය කිරීමකට යටත්ව, අවස්ථාවෝචිත පරිදි, නිල භාර ගැනුම්කරු විසින් හෝ තාවකාලික ඈවරකරු විසින් හෝ ඒ සමාගමේ වත්කම්වලින් ගෙවනු ලැබිය යුතු ය.

(5) යුක්ති සහගත හේතුවක් නොමැතිව, මේ වගන්තියේ නියමයන් අනුව ක්‍රියා කිරීම යම් තැනැත්තකු විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂ දෙකක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

(6) මේ වගන්තියේ විධිවිධාන ප්‍රකාර ඉදිරිපත් කරන ලද ප්‍රකාශය, නියමිත ගාස්තුව ගෙවා සාධාරණ සියලු වේලාවල දී, තමා විසින් ම හෝ තමාගේ අනුයෝජිතයා මගින් හෝ පරීක්ෂා කර බැලීමට සහ එහි පිටපතක් හෝ උධෘතයක් ලබා ගැනීමට සමාගමේ ණය හිමියකු හෝ සහදායකයකු හෝ බවට ලියවිල්ලකින් හිමිකම් පා සිටින යම් තැනැත්තකු හිමිකම් ලැබිය යුතු ය.

(7) අසත්‍ය බව දැනදැනම තමා ණය හිමියකු හෝ සහදායකයකු බවට හිමිකම් පා සිටින යම් තැනැත්තකු අධිකරණයට අපහාස කිරීමේ වරදට වරදකරු වන අතර, ඈවරකරු විසින් හෝ නිල භාර ගැනුම්කරු විසින් හෝ ඉල්ලා සිටිනු ලැබූ විට, ඒ අපහාස කිරීමේ වරද සඳහා ඒ තැනැත්තාට දඬුවම් කරනු ලැබිය යුතු ය.

(8) මේ වගන්තියේ "අදාළ දිනය" යන යෙදුමෙන්, තාවකාලික ඈවරකරුවකු පත් කරනු ලැබූ අවස්ථාවක් සම්බන්ධයෙන් වන විට, ඔහු පත් කරනු ලැබූ දිනය ද, එවැනි පත්වීමක් කර නොමැති අවස්ථාවක් සම්බන්ධයෙන් වන ගණන් බේරා වසා දැමීමේ ආඥාව කරන ලද දිනය ද අදහස් වේ.

නිල භාර ගැනුම්කරුගේ වාර්තාව.

**284**. (1) ගණන් බේරා වසා දැමීමේ ආඥාවක් කරනු ලැබූ යම් අවස්ථාවක, 283 වන වගන්තියේ විධිවිධාන යටතේ ඉදිරිපත් කළ යුතු ප්‍රකාශය ලැබීමෙන් පසු හැකි තාක් ඉක්මණින් ද, එවැනි ප්‍රකාශයක් ඉදිරිපත් නොකළ යුතු බවට අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබූ අවස්ථාවක, ඒ ආඥාවේ දිනයෙන් පසු හැකි තාක් ඉක්මණින් ද, නිල භාර ගැනුම්කරු විසින්, පහත දැක්වෙන කරුණු පිළිබඳව මූලික වාර්තාවක් අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු ය:—

(අ) නිකුත් කරන ලද කොටස් සංඛ්‍යාව සහ වර්ගය, ප්‍රකාශිත ප්‍රාග්ධනය සහ වත්කම්වල හා බැරකම්වල ඇස්තමේන්තු කළ මුදල ;

(ආ) සමාගම ව්‍යර්ථ වී ඇති අවස්ථාවක, එසේ ව්‍යර්ථ වීමට හේතු ;

(ඇ) සමාගම ප්‍රවර්ධනය කිරීමට, පිහිටුවීමට හෝ ව්‍යර්ථ වීමට නැත හොත් එහි ව්‍යාපාරය කරගෙන යාමට අදාළ යම් කරුණක් පිළිබඳව තවදුරටත් පරීක්ෂා කිරීම, ඔහුගේ මතය අනුව, යෝග්‍ය ද යන බව.

(2) සමාගම පිහිටුවනු ලැබූ ආකාරය ද, තම මතය අනුව, සමාගම ප්‍රවර්ධනය කිරීමෙහි ලා හෝ පිහිටුවීමෙහි ලා හෝ යම් තැනැත්තකු විසින් නැතහොත් සමාගම පිහිටුවීමෙන් පසු, එහි යම් නිලධරයකු විසින් ඒ සමාගම සම්බන්ධයෙන් යම් වංචාවක් කර තිබේ ද යන්න හා, තම මතය අනුව, අධිකරණය වෙත දැනුම් දීමට යෝග්‍ය වූ වෙනත් යම් කාරණා දැක්වෙන වැඩිදුර වාර්තාවක් හෝ වාර්තා ද, සකස් කිරීම යෝග්‍ය යයි නිල භාර ගැනුම්කරු අදහස් කළහොත්, ඔහු විසින් එසේ කළ හැකි ය.

(3) තම මතය අනුව, ඉහත කී පරිදි වංචාවක් සිදු කර ඇති බව, නිල භාර ගැනුම්කරු විසින් (2) වන උපවගන්තියේ සඳහන් පරිදි වූ යම් වැඩිදුර වාර්තාවක සඳහන් කර ඇති අවස්ථාවක, ඒ වාර්තාව සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී 311 වන වගන්තියෙන් දක්වා ඇති බලතල අධිකරණය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

## ඈවරකරුවෝ

ඈවරකරුවන් පත් කිරීමට අධිකරණයට ඇති බලය.

**285**. සමාගමක් ගණන් බේරා වසා දැමීමෙහි ලා නඩු පවත්වා ගෙන යාමේ සහ ඒ සම්බන්ධයෙන් අධිකරණය විසින් නියම කරනු ලබන යම් කාර්යය කිරීම සඳහා, ඈවරකරුවකු හෝ ඈවරකරුවන් අධිකරණය විසින් පත් කරනු ලැබිය හැකි ය.

තාවකාලික ඇවරකරුවකු පත් කිරීම හා ඔහු සතු බලතල.

**286**. (1) ගණන් බේරා වසා දැමීමේ පෙත්සම ඉදිරිපත් කිරීමෙන් පසු, කවර වූ හෝ අවස්ථාවක දී ගණන් බේරා වසා දැමීමේ ආඥාව කිරීමට පෙර අධිකරණය විසින් තාවකාලික වශයෙන් ඇවරකරුවකු පත් කරනු ලැබිය හැකි අතර, නිල භාර ගැනුම්කරු හෝ වෙනත් යම් සුදුසු තැනැත්තකු එසේ පත් කරනු ලැබිය හැකි ය.

(2) අධිකරණය විසින් තාවකාලික වශයෙන් ඇවරකරුවකු පත් කරනු ලැබූ අවස්ථාවක, ඔහු පත් කෙරෙන ආඥාව මගින් ඔහුගේ බලතල සීමා කිරීම හා පරිසීමා කිරීම අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.

ඇවරකරුවන් පත් කිරීම හා ඔවුන්ගේ අභිධාන ආදිය.

**287**. ගණන් බේරා වසා දැමීමේ ආඥාවක් කරනු ලබන විට, ඇවරකරුවන් සම්බන්ධයෙන් පහත දැක්වෙන විධිවිධාන බලපැවැත් විය යුතු ය :—

(අ) නිල භාර ගැනුම්කරු තම නිල බලයෙන් ම තාවකාලික ඇවරකරු විය යුතු අතර, ඔහු හෝ වෙනත් තැනැත්තකු ඇවරකරු වී එලෙස ක්‍රියා කළ හැකි වනතෙක්, ඔහු විසින් එලෙස දිගට ම ක්‍රියා කරගෙන යා යුතු ය ;

(ආ) නිල භාර ගැනුම්කරු වෙනුවට ඇවරකරුවකු පත් කිරීම සඳහා අධිකරණය වෙත ඉල්ලුම් කළ යුතු ද නැද්ද යන්න තීරණය කිරීමේ කාර්යය සඳහා නිල ගැණුම්කරු විසින් වෙන වෙනම සමාගමේ ණය හිමියන්ගේ සහ ආධාරකරුවන්ගේ රැස්වීම් කැඳවිය යුතු ය ;

(ඇ) එවැනි යම් තීරණයක් බලාත්මක කිරීම සඳහා අවශ්‍ය යම් පත් කිරීමක් සහ ආඥාවක් අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය. තව ද, ඉහත කී කාරණය සම්බන්ධයෙන් ණය හිමියන්ගේ සහ සහදායකයන්ගේ රැස්වීම්වල දී ගනු ලැබූ තීරණ අතර වෙනසක් ඇතිවුවහොත්, අධිකරණය විසින් ඒ වෙනස ගැන තීරණයක් කළ යුතු අතර, ඒ පිළිබඳව සුදුසු යයි අධිකරණය අදහස් කරන ආඥාවක් ද කළ යුතු ය ;

(ඈ) අධිකරණය විසින් ඇවරකරු පත් කරනු නොලැබූ අවස්ථාවක, නිල භාර ගැනුම්කරු සමාගමේ ඇවරකරු විය යුතු ය ;

(ඉ) ඇවරකරුගේ ධුරයෙහි යම් පුරප්පාඩුවක් ඇති වූ කාලයක් තුළ, නිල භාර ගැනුම්කරු තම නිල බලයෙන් ඇවරකරු වන්නේ ය ;

(ඊ) නිල භාර ගැනුම්කරු නොවන තැනැත්තකු ඇවරකරු වන අවස්ථාවක දී "ඇවරකරු" යන අභිධානයෙන් ද නිල භාර ගැනුම්කරු ඇවරකරු වන අවස්ථාවක දී, ඔහුගේ පුද්ගල නාමයෙන් නොව, ඔහු පත් කරන ලද්දේ යම් විශේෂිත සමාගමක් සම්බන්ධයෙන් ද ඒ සමාගමේ "නිල භාර ගැනුම්කරු" හා "ඇවරකරු" යන අභිධානයෙන් ද ඇවරකරුවකු විය යුතු ය.

නිල භාර ගැනුම්කරු නොවන තැනැත්තකු ඇවරකරු වශයෙන් පත් කරනු ලැබූ අවස්ථාවක අදාළ වන විධිවිධාන.

**288**. අධිකරණය විසින් සමාගමක් ගණන් බේරා වසා දමනු ලබන අවස්ථාවක, නිල භාර ගැනුම්කරු නොවන තැනැත්තකු ඇවරකරු ලෙස පත් කරනු ලැබූ අවස්ථාවක—

(අ) ඒ තැනැත්තා විසින් ඒ පත්වීම රෙජිස්ට්‍රාර්වරයා වෙත දැනුම් දී නියමිත ආකාරයෙන් ඇප තබනු ලබන තෙක් ඇවරකරු ලෙස ක්‍රියා කිරීමට ඒ තැනැත්තාට හැකි නොවිය යුතු ය ;

(ආ) මේ පනත යටතේ නිල භාර ගැනුම්කරුට තම කාර්යය කළ හැකි වනු පිණිස අවශ්‍ය වන තොරතුරු ද සමාගමේ පොත් හා ලේඛන පරීක්ෂා කිරීමේ අවකාශය හා පහසුකම් ද සාමාන්‍ය සහාය ද ඒ තැනැත්තා විසින් ඒ නිලධරයාට දිය යුතු ය.

ඇවරකරුවන් පිළිබඳ සාමාන්‍ය විධිවිධාන.

**289**. (1) අධිකරණය විසින් පත් කරනු ලබන ඇවරකරුවකුට ඉල්ලා අස් විය හැකි ය ; තවද හේතු දක්වා අධිකරණය විසින්, ඔහු අස් කළ හැකි ය.

(2) නිල භාර ගැනුම්කරු නොවන තැනැත්තකු ඇවරකරුවකු ලෙස පත් කරනු ලැබූ අවස්ථාවක, අධිකරණය විසින් විධාන කරනු ලබන පරිදි යම් වැටුපක් හෝ ප්‍රතිශතයක් වශයෙන් හෝ අන්‍යාකාර පාරිශ්‍රමිකයන් ඔහු විසින් ලැබිය යුතු ය. එවැනි එක් තැනැත්තකුට වැඩි ගණනක් ඇවරකරුවන් ලෙස පත් කරනු ලැබූ අවස්ථාවක, ඔවුන්ගේ පාරිශ්‍රමික අධිකරණය විසින් විධාන කරනු ලබන සමානුපාතයන් අනුව ඔවුන් අතර බෙදනු ලැබිය යුතු ය.

(3) අධිකරණය විසින් පත් කරන ලද ඇවරකරුවකුගේ ධුරයේ පුරප්පාඩුවක් ඇති වූ විට, එය අධිකරණය විසින් පිරවිය යුතු ය.

(4) අධිකරණය විසින් එක් ඇවරකරුවකුට වැඩි ගණනක් පත් කරනු ලැබුවහොත් ඇවරකරු විසින් කළ යුතු ලෙස මේ පනතේ විධිවිධාන යටතේ නියම කෙරෙන හෝ බලය පැවරෙන යම් ක්‍රියාවක්, පත් කරනු ලැබූ සියලුම තැනැත්තන් විසින් කළ යුතු ද නැතහොත් ඔවුන්ගෙන් යම් කෙනකු හෝ වැඩි දෙනකු විසින් කළ යුතු ද යන බව අධිකරණය විසින් ප්‍රකාශ කරනු ලැබිය යුතු ය.

(5) ඈවරකරුවකුගේ කිසිම ක්‍රියාවක්, ඒ ඈවරකරුගේ පත් කිරීමේ හෝ සුදුසුකමේ යම් දෝෂයක් පිළිබඳ හේතුව නිසා පමණක් අවලංගු නොවිය යුතු ය ; නැතහොත් අවලංගු වන ලෙස සලකනු නොලැබිය යුතු ය.

**290**. ගණන් බේරා වසා දැමීමේ ආඥාවක් කරනු ලැබූ අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඈවරකරු හෝ තාවකාලික ඈවරකරු හෝ විසින්, සමාගම හිමිකම් ලබා ඇති හෝ හිමිකම් ලබා ඇතැයි පෙනී යන සියලු ම දේපළ සහ නඩු පැවරීමේ අයිතිවාසිකම් ස්වකීය භාරයට හෝ ස්වකීය පාලනය යටතට ගත යුතු ය.

සමාගම් දේපළ පිළිබඳ භාරකාරත්වය.

**291**. අධිකරණය විසින් සමාගමක් ගණන් බේරා වසා දමනු ලබන අවස්ථාවක, ඈවරකරු විසින් ඉල්ලුම් කරනු ලැබූ විට, සමාගමට අයිති හෝ සමාගම වෙනුවෙන් භාරකරුවන් විසින් දරනු ලබන කවර හෝ ආකාරයක සියලු ම දේපළ හෝ ඉන් යම් කොටසක් හෝ ස්වකීය නිල නාමයෙන් ඈවරකරු සතු කළ යුතු යයි ආඥාවක් මගින් අධිකරණය විසින් විධාන කරනු ලැබිය හැකි අතර එවිට, ඒ ආඥාව අදාළ වන දේපළ ඒ අනුව ඈවරකරු සතු විය යුතු ය. තව ද, කළ යුතුව ඇත්නම් අධිකරණය විසින් විධාන කරනු ලැබිය හැකි යම් හානි පූරණයක් වුවහොත් එය දීමෙන් පසු,ඒ දේපළට අදාළ වූ හෝ සාර්ථක අන්දමින් සමාගම ගණන් බේරා වසා දැමීමේ හා එහි දේපළ ආපසු ලබා ගැනීමේ කාර්යය සඳහා පැවරීමට හෝ විත්තිවාචක ඉදිරිපත් කිරීමට අවශ්‍ය යම් නඩුවක් හෝ වෙනත් නඩු කටයුතු ස්වකීය නිල නාමයෙන් පැවරීම හෝ විත්තිවාචක ඉදිරිපත් කිරීම හෝ ඒ ඈවරකරු විසින් කරනු ලැබිය හැකි ය.

සමාගමේ දේපළ ඈවරකරු සතු කිරීම.

**292**. (1) අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීමක දී, අධිකරණයේ හෝ පරීක්ෂණ කමිටුවේ අනුඥාව ඇතිව ඈවරකරුට පහත දැක්වෙන බලතල තිබිය යුතු ය :—

ඈවරකරුගේ බලතල.

(අ) සමාගමේ නමින් සහ සමාගම වෙනුවෙන් යම් නඩුවක් හෝ වෙනත් නඩු කටයුත්තක් පැවරීම හෝ විත්තිවාචක ඉදිරිපත් කිරීම ;

(ආ) සමාගම වැඩදායී ලෙස ගණන් බේරා වසා දැමීම සඳහා අවශ්‍ය වන තාක් දුරට, ඒ ව්‍යාපාරය කරගෙන යාම ;

(ඇ) ස්වකීය කාර්යය ඉටුකිරීමෙහි ලා තමාට සහාය දීම සඳහා නීතිඥවරයකු පත් කිරීම ;

(ඇ) කවර හෝ පන්තිවල ණයහිමියන්ගේ ණය සම්පූර්ණයෙන් ගෙවීම ;

(ඉ) ණය හිමියන් සමඟ හෝ ණය හිමියන් වීමට හිමිකම්පාන තැනැත්තන් සමඟ හෝ වර්තමාන හෝ අනාගත, නිශ්චිත හෝ අවිනිශ්චිත, නිසැකව දැනගත් හෝ සමාගමට එරෙහිව අලාභ පිළිබඳ පමණක් සම්බන්ධ හෝ සමාගම බැඳීමකට යටත් කළ හැකි අලාභ පිළිබඳ පමණක් සම්බන්ධ යම් හිමිකම් තිබෙන හෝ යම් හිමිකම් ඇතැයි කියන තැනැත්තන් සමඟ යම් සමථයකට පැමිණීම හෝ වැඩපිළිවෙළක් යොදා ගැනීම ;

(ඊ) සමාගම හා සහදායකයකු හෝ සහදායකයකු යයි කියනු ලබන තැනැත්තකු හෝ වෙනත් ණයකරුවකු හෝ සමාගම සමඟ බැඳීමක් ඇති වෙතැයි සැකකරන තැනැත්තකු ද, අතර පවත්නා හෝ පවත්නා බව හැඟෙන සියලුම ඇරයුම් ද ඇරයුම් පිළිබඳ බැඳීම් ද, ණය ද, ණය ඇතිකර විය හැකි බැඳීම් ද වර්තමාන හෝ අනාගත, නිශ්චිත හෝ අවිනිශ්චිත, නිසැකව දැනගත් හෝ අලාභවලට සම්බන්ධ වූ සියලුම හිමිකම් පෑම් ද සමාගමේ වත්කම් පිළිබඳව හෝ සමාගම ගණන් බේරා වසා දැමීම පිළිබඳව යම් ආකාරයකින් අදාළ වන්නා වූ හෝ බලපවත්නා වූ සියලුම ප්‍රශ්න, එකඟ වන නියමයන් මත සමථයකට පත් කිරීම සහ එවැනි යම් ඇරයුමක්, ණයක්, බැඳීමක් හෝ හිමිකම් පෑමක් නිදහස් කිරීම සඳහා යම් ඇපයක් ගෙන, එය සම්පූර්ණයෙන් නිදහස් කිරීම.

(2) අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීමක දී ඈවරකරුට පහත දැක්වෙන බලතල තිබිය යුතු ය:—

(අ) සමාගමේ චංචල හා නිශ්චල දේපළ සහ නඩු පැවරීමේ අයිතිවාසිකම සම්පූර්ණයෙන්ම යම් තැනැත්තකුට හෝ සමාගමකට හෝ පැවරීමේ හෝ එය කොටස් වශයෙන් විකිණීමේ බලය ඇතිව, ඒවා ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ පෞද්ගලික ගිවිසුමක් මගින් විකිණීම ;

(ආ) සමාගමේ නමින් සහ සමාගම වෙනුවෙන් සියලුම ක්‍රියා කිරීම සහ සියලු ඔප්පු, ලදුපත් හා වෙනත් ලේඛන ලියා අත්සන් කර දීම සහ ඒ කාර්යය සඳහා අවශ්‍ය වූ විටක, සමාගමේ මුද්‍රාව භාවිත කිරීම ;

(ඈ) යම් සහදායකයකු වස්තු භංගත්වයට පත්වීමේ දී, බුන්වත් වීමේ දී හෝ ඔහුගේ දේපළ තහනමට ගැනීමක දී ඔහුගේ බූදලයෙන් යම් ශේෂයක් සඳහා ඔප්පු කිරීම, හිමිකම් ලැයිස්තුවට ඇතුළත්වීම හා හිමිකම්පෑම හා වස්තු භංගත්වයට පත්වීමේ දී හෝ බුන්වත් වීමේ දී හෝ දේපළ තහනමට ගැනීමේ දී වස්තු භංගත්වයට පත් වූ හෝ බුන්වත් වූ තැනැත්තන්ගෙන් ලැබිය යුතු වෙනම ණයක් ලෙසත් වෙනමම වූ සෙසු ණය හිමියන් සමඟ අනුපාතිකව, එකී ශේෂය සම්බන්ධයෙන් ලාභාංශ ලැබීම ;

(ඇ) සමාගමේ ව්‍යාපාර කටයුතු කරගෙන යාමේ දී සමාගම විසින් හෝ සමාගම වෙනුවෙන් යම් විනිමය බිල්පත්‍රයක් හෝ පොරොන්දු නෝට්ටුවක් ලිවීම, භාර ගැනීම, සකස් කිරීම හෝ පිටසන් කිරීම කරනු ලැබූ විටක ඇතිවන සමාගමේ බැඳීමට සමාන බැඳීමක් ඇතිව විනිමය බිල්පත් හෝ පොරොන්දු නෝට්ටුවක් සමාගම නමින් සහ වෙනුවෙන් ලිවීම, භාරගැනීම, සකස් කිරීම හෝ පිටසන් කිරීම ;

(ඉ) සමාගමේ වත්කම් ඇපයට තබා, අවශ්‍ය යම් මුදලක් ලබාගැනීම ;

(ඊ) යම් මියගිය සහදායකයකුගේ බූදලය සම්බන්ධයෙන් අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය තම නිල නාමයෙන් ලබා ගැනීම, යම් සහදායකයකුගේ හෝ ඔහුගේ බූදලයෙන් ලැබිය යුතුව ඇත්තා වූ ද, සමාගමේ නමින් පහසුවෙන් ලබාගත නොහැකි වූ ද, යම් මුදලක් අය කර ගැනීම සඳහා අවශ්‍ය වන වෙනත් යම් ක්‍රියාවක් තම නිල නාමයෙන් කිරීම සහ එවැනි සෑම අවස්ථාවක දී ම, එසේ ලැබිය යුතු මුදල්, අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය ලබාගැනීමට හෝ මුදල් අය කර ගැනීමට ඇවරකරුට හැකිවනු පිණිස ඇවරකරුට ම ලැබිය යුතු මුදලක් ලෙස සලකනු ලැබිය යුතු ය :

එසේ වුව ද, මෙහි පවරන ලද කිසිම බලයකින් මහාභාරකාර ආඥාපනත (88 වන පරිච්ඡේදය) යටතේ පත් කරන ලද මහාභාරකාරවරයා සතු අයිතිවාසිකම්වලට, කාර්යවලට හා වරප්‍රසාදවලට බලපෑමක් වන්නේ යයි සලකනු නොලැබිය යුතු ය ;

(උ) ඒ ඇවරකරු වෙනුවෙන් යම් ව්‍යාපාර කටයුත්තක් කිරීම සඳහා අනුයෝජිතයකු පත් කිරීම ;

(ඖ) සමාගමේ කටයුතු ගණන් බේරා වසා දැමීම සහ එහි වත්කම් බෙදීම සඳහා අවශ්‍ය වෙනත් සියලු දේ කිරීම.

(3) අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීමක දී, මේ වගන්තියේ විධිවිධාන මගින් ඈවරකරුවකු වෙත පවරා ඇති බලතල ඈවරකරු විසින් ක්‍රියාත්මක කිරීම අධිකරණයේ පාලනයට යටත්ව විය යුතු අතර, ඒ බලතල කිසිවක් ක්‍රියාත්මක කිරීම හෝ යෝජිත ක්‍රියාත්මක කිරීමක් හෝ සඳහා යම් ණයහිමියකු හෝ සහදායකයකු හෝ විසින් අධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

ඈවරකරුගේ බලතල ක්‍රියාත්මක කිරීම හා පාලනය කිරීම.

**293**. (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, අධිකරණය විසින් ගණන් බේරා වසා දමනු ලබන සමාගමක ඈවරකරු විසින්, සමාගමේ වත්කම් පරිපාලනය කිරීමෙහි ලා හා එහි ණය හිමියන් අතර ඒවා බෙදා දීමෙහි ලා යම් මහා සභා රැස්වීමක දී ණය හිමියන් ගේ හෝ සහදායකයන්ගේ යෝජනා සම්මතයක් මගින් හෝ පරීක්ෂණ කමිටුව විසින් හෝ කරනු ලබන යම් විධානවලට සැලකිල්ලක් දැක්විය යුතු ය. ගැටීමක් ඇති වූ අවස්ථාවක දී ණය හිමියන් විසින් හෝ සහදායකයින් විසින් යම් මහා සභා රැස්වීමක දී කරනු ලැබූ යම් විධාන පරීක්ෂණ කමිටුව විසින් දෙන ලද යම් විධාන අභිබවා යන ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) ණය හිමියන්ගේ හෝ සහදායකයින්ගේ අදහස් දැනගැනීමේ කාර්යය සඳහා ඔවුන්ගේ මහා සභා රැස්වීම් ඈවරකරු විසින් කැඳවනු ලැබිය හැකි අතර, අවස්ථාවෝචිත පරිදි, ඈවරකරු පත් කරනු ලැබූ රැස්වීමේ දී හෝ වෙනත් අවස්ථාවක දී ණය හිමියන් විසින් හෝ සහදායකයින් විසින් යෝජනා සම්මතයක් මගින් විධාන කරනු ලැබූ වේලාවන්හි දී හෝ ණය හිමියන්ගේ හෝ සහදායකයින්ගේ මුළු සංඛ්‍යාවෙන් දහයෙන් එකක් විසින් රැස්වීමක් කැඳවන ලෙස ලියවිල්ලකින් ඉල්ලුම් කරනු ලැබූ විටක හෝ රැස්වීම කැඳවීම ඔහුගේ කාර්යය විය යුතු ය.

(3) ගණන් බේරා වසා දැමීම යටතේ උද්ගතවන යම් විශේෂ කරුණකට අදාළව විධාන ලබා ගැනීම සඳහා ඈවරකරු විසින් අධිකරණය වෙත නියමිත ආකාරයෙන් ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(4) මේ පනතේ විධිවිධානවලට යටත්ව, බූදලය කළමනාකරණය කිරීමෙහි ලා හා ණය හිමියන් අතර එය බෙදා දීමෙහි ලා ඈවරකරු විසින් තමාගේ ම අභිමතය ක්‍රියාත්මක කළ යුතු ය.

(5) ඈවරකරුගේ යම් ක්‍රියාවකින් හෝ තීරණයකින් යම් තැනැත්තකු අතෘප්තියට පත් වූ අවස්ථාවක, ඒ තැනැත්තා විසින්, ඒ ක්‍රියාවට හෝ තීරණයට විරුද්ධව අධිකරණය වෙත අභියාචනා කරනු

ලැබිය හැකි අතර, පැමිණිලි කරන ලද ක්‍රියාව හෝ තීරණය අධිකරණය විසින් ස්ථිර කොට, ප්‍රතිවර්තනය කොට හෝ සුළු වශයෙන් වෙනස් කොට, සාධාරණ යයි අධිකරණය අදහස් කරන ආඥාවක් කරනු ලැබිය හැකි ය.

ඇවරකරු විසින් තබාගත යුතු පොත්.

**294**. අධිකරණය විසින් ගණන් බේරා වසා දමනු ලබන සමාගමක සෑම ඇවරකරුවකු විසින් ම, රැස්වීම්වල කටයුතු පිළිබඳ වූ ද, නියමිත වෙනත් කරුණු පිළිබඳ වූ ද සටහන් හෝ වාර්තා තමා විසින් ඇතුළත් කරවිය යුතු නිසියාකාර පොත් නියමිත ආකාරයෙන් තබා ගත යුතු අතර, අධිකරණයේ පාලනයට යටත්ව, යම් ණය හිමියකු හෝ සහදායකයකු විසින් පෞද්ගලිකව ම හෝ ස්වකීය අනුයෝජිතයා මගින් ඒ යම් පොත් පරීක්ෂා කර බලනු ලැබිය හැකි ය.

ඇවරකරු විසින් බැංකුවට කරනු ලබන ගෙවීම්.

**295**. (1) අධිකරණය විසින් ගණන් බේරා වසා දමනු ලබන සමාගමක සෑම ඇවරකරුවකු විසින් ම, තමා ලැබූ මුදල්, බලපත්‍ර ලත් වාණිජ බැංකු එකක හෝ වැඩි ගණනක තත් කාර්යය සඳහා පිහිටුවන ලද ගිණුමකට හෝ ගිණුම්වලට ගෙවනු ලැබිය යුතු ය.

(2) අධිකරණය විසින් ගණන් බේරා වසා දමනු ලබන සමාගමක ඇවරකරුවකු විසින්, ඇවරකරුවකු වශයෙන් තමා ලැබූ මුදල් කිසිවක් තම පෞද්ගලික බැංකු ගිණුමට ගෙවනු නොලැබිය යුතු ය.

ඇවරකරුගේ ගිණුම් විගණනය කිරීම.

**296**. (1) අධිකරණය විසින් ගණන් බේරා වසා දමනු ලබන සමාගමක සෑම ඇවරකරුවකු විසින් ම නියමිත කාලවල දී එහෙත්, තම ධුර කාලය තුළ දී එක් එක් වර්ෂයේ දෙවරකට නොඅඩු වාර ගණන් ඇවරකරු වශයෙන් තම ලැබීම් හා ගෙවීම් පිළිබඳ ගිණුමක් රෙජිස්ට්‍රාර්වරයා වෙත යවනු ලැබිය යුතු ය.

(2) ගිණුම නියමිත ආකෘතියෙහි වියයුතු අතර, එය පිටපත් දෙකකින් සකස්කර නියමිත ආකෘතියෙහි වූ ව්‍යවස්ථාපිත ප්‍රකාශයකින් සහතික කරනු ලැබිය යුතු ය.

(3) රෙජිස්ට්‍රාර්වරයා විසින් ගිණුම විගණනය කිරීමට සලස්වනු ලැබිය යුතු අතර, විගණනය කිරීමේ කාර්යය සඳහා රෙජිස්ට්‍රාර්වරයාට අවශ්‍යවන යම්තාක් වූ වවුචර හා තොරතුරු ද ඇවරකරු විසින් රෙජිස්ට්‍රාර්වරයා වෙත සපයනු ලැබිය යුතු ය. තව ද. ඇවරකරු විසින් තබාගෙන ඇති පොත් හෝ ගිණුම් කිසිවක් යම් විටක ඉදිරිපත් කරන ලෙස රෙජිස්ට්‍රාර්වරයා විසින් නියම කරනු ලැබිය හැකි අතර, ඒවා ඔහු විසින් පරීක්ෂා කරනු ලැබීම ද කළ හැකි ය.

(4) ගිණුම විගණනය කරනු ලැබූ විට, එහි එක් පිටපතක් රෙජිස්ට්‍රාර්වරයා විසින් ගොනු කොට තබා ගත යුතු අතර, අනෙක් පිටපත ගොනු කිරීම සඳහා අධිකරණය වෙත භාරදිය යුතු ය. තවද, නියමිත ගාස්තුව ගෙවා යම් තැනැත්තකු විසින් එක් එක් පිටපත පරීක්ෂා කරනු ලැබීම සඳහා අවකාශය දිය යුතු ය.

(5) ගිණුමේ හෝ සාරාංශයේ පිටපතක් සෑම ණය හිමියකු සහ සහදායකයකු වෙතම තැපැල් මගින් යැවීම, එසේ යැවීමේ වියදම සහ සමාගම් වත්කම්වල වටිනාකම සැලකිල්ලට ගනිමින් ප්‍රායෝගික නොවන බැව් තමා සලකන්නේ නම් මිස, ඈවරකරු විසින් කරනු ලැබිය යුතු ය.

රෙජිස්ට්‍රාර්වරයා විසින් ඈවරකරු පාලනය කිරීම.

**297**. (1) අධිකරණය විසින් ගණන් බේරා වසා දමනු ලබන සමාගම්වල ඈවරකරුවන්ගේ චර්යාව කෙරෙහි රෙජිස්ට්‍රාර්වරයා විසින් සැලකිල්ලක් දැක්විය යුතු අතර, ඈවරකරුවකු විසින් සිය කාර්ය විශ්වාසවන්ත ලෙස ඉටුකරනු නොලබන්නා වූ සහ සිය කාර්යය ඉටු කිරීම සම්බන්ධයෙන් යම් ලිඛිත නීතියකින් හෝ අන්‍යාකාරයකින් ඔහු වෙත පනවනු ලැබ ඇති සියලු නියමයන් ඔහු විසින් නිසි පරිදි නොපිළිපදින්නා වූ අවස්ථාවක, නැතහොත්, යම් ණය හිමියකු හෝ සහදායකයකු විසින් ඒ සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයා වෙත යම් පැමිණිල්ලක් කරනු ලැබූ අවස්ථාවක රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ කාරණය පිළිබඳව විමසා බලා අවශ්‍ය වේ නම් ඒ පිළිබඳව අධිකරණය වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.

(2) අධිකරණය විසින් ගණන් බේරා වසා දමනු ලබන සමාගමක යම් ඈවරකරුවකුට තමා නියුක්ත වූ යම් ගණන් බේරා වසා දැමීමක් සම්බන්ධයෙන් කරනු ලබන යම් විමසීමකට අදාළව උත්තරදෙන ලෙස රෙජිස්ට්‍රාර්වරයා විසින් යම් විටෙක නියම කරනු ලැබිය හැකි අතර, ගණන් බේරා වසා දැමීමට සම්බන්ධ කවර හෝ කරුණක් පිළිබඳව ඔහුගෙන් හෝ වෙනත් යම් තැනැත්තකුගෙන් දිවුරුම් පිට විභාග කරන ලෙස අධිකරණය වෙත ඉල්ලීමක් කිරීම සුදුසු යයි රෙජිස්ට්‍රාර්වරයා අදහස් කරන අවස්ථාවක, ඔහු විසින් එසේ කරනු ලැබිය හැකි ය.

(3) ඈවරකරුගේ පොත් හා වවුචර පිළිබඳව ස්ථානීක විමර්ශනයක් කරන ලෙස ද රෙජිස්ට්‍රාර්වරයා විසින් නියම කරනු ලැබිය හැකි ය.

ඈවරකරුවන් මුදා හැරීම.

**298**. (1) අධිකරණය විසින් ගණන් බේරා වසා දමනු ලබන සමාගමක ඈවරකරු විසින්, සමාගමේ සියලු දේපළ හෝ ස්වකීය මතය අනුව ඈවරකිරීම අනවශ්‍ය අන්දමින් දික් ගැස්සීමක් නොමැතිව, ඉන් මුදල් කළහැකි ප්‍රමාණයක් හෝ මුදල් කරනු ලැබූ කල්හි ද යම් අවසාන ලාභාංශයක් වී නම් ඒ ලාභාංශය ණය හිමියන් අතර බෙදාදීම සහ සහදායකයන්ගේ අයිතිවාසිකම් ඔවුනොවුන් අතර යථාවත් කර,

සහදායකයන් වෙත කළ යුතු වූ යම් අවසාන වාර්තාවක් වේ නම්, ඒ අවසාන වාර්තාව ඔවුන් වෙත කරනු ලැබූ කල්හි ද නැතහොත්, ස්වකීය ධුරයෙන් ඉල්ලා අස් වූ කල්හි, එසේත් නැතහොත් ධුරයෙන් ඉවත් කරනු ලැබූ කල්හි ද ඈවරකාර ධුරයෙන් තමා මුදා හරින ලෙසට ඔහු විසින් ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක, ගිණුම් පිළිබඳ වාර්තාවක් අධිකරණය විසින් සකස් කරවනු ලැබිය යුතු අතර, අධිකරණයේ සියලු නියමවලට අනුකූලව ඔහු විසින් ක්‍රියා කරනු ලැබීමෙන් පසුව, ඒ වාර්තාව ද ඈවරකරු මුදා හැරීමට විරුද්ධව යම් ණය හිමියකු විසින් හෝ යම් සහදායකයකු විසින්, නැතහොත්, සම්බන්ධතාවක් ඇති තැනැත්තකු විසින් දක්වනු ලබන යම් විරෝධතාවක් ද සැලකිල්ලට ගෙන, ඒ අනුව අධිකරණය විසින් මුදාහැරීම හෝ මුදාහැරීම අත්හිටුවීම හෝ කරනු ලැබිය යුතු ය.

(2) ඈවරකරුවකු මුදාහැරීම අත්හිටුවනු ලැබූ අවස්ථාවක, යම් ණය හිමියකු විසින් හෝ සහදායකයකු විසින් හෝ සම්බන්ධතාවක් ඇති තැනැත්තකු විසින් ඉල්ලුම් කරනු ලැබූ විට, ඈවරකරු විසින් සමාගමේ කටයුතු පරිපාලනයේ දී කරනු ලැබූ යම් ක්‍රියාවක හෝ පැහැර හැරීමක ප්‍රතිවිපාක ඔහු මත පැවරෙන ලෙස සාධාරණ යයි අධිකරණය අදහස් කරන ආඥාවක්, අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.

(3) ඈවරකරු මුදාහරින, අධිකරණයේ ආඥාවක් මගින්, සමාගමේ කටයුතු පරිපාලනය කිරීමේ දී ඔහු විසින් කරනු ලැබූ යම් ක්‍රියාවක් හෝ පැහැර හැරීමක් සම්බන්ධයෙන් හෝ ඈවරකරුවකු වශයෙන් ඔහුගේ පැවැත්මට සම්බන්ධ සියලු බැඳීම්වලින් ඔහු නිදහස් කරනු ලැබිය යුතු ය. එහෙත්, වංචාවෙන් හෝ යම් වැදගත් කරුණක් යටපත් කිරීමෙන් හෝ සැඟවීමෙන් ඒ ආඥාව ලබාගත් බව ඔප්පු කරනු ලැබූ විට, එය ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි ය.

(4) ඈවරකරු කලින් ධුරයෙන් ඉල්ලා අස් නොවූ හෝ ධුරයෙන් ඉවත් කරනු නොලැබූ අවස්ථාවක, ඔහු මුදාහැරීම ඈවරකරුවකු ධුරයෙන් ඉවත් කිරීමක් ලෙස ක්‍රියාත්මක විය යුතු ය.

## පරීක්ෂණ කමිටුව

**299**. (1) අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීමේ ආඥාවක් කරනු ලැබූ විට, ඈවරකරු සමඟ කටයුතු කිරීමට පරීක්ෂණ කමිටුවක් පත් කරන ලෙස අධිකරණය වෙත ඉල්ලීමක් කළ යුතු ද නැද්ද යන බව හා කමිටුවක් පත් කරනු ලැබුවහොත්, ඒ කමිටුවේ සාමාජිකයන් විය යුත්තේ කවුරුන්ද යන බව වැඩිදුරටත් නිශ්චය කිරීම, භාර ගැනුම්කරු වෙනුවට ඈවරකරුවකු පත්කරන ලෙස අධිකරණය වෙත

පරීක්ෂණ කමිටුවක් පත්කළ යුතු ද නැද්ද යන්න නිශ්චය කිරීම සඳහා වූ ණය හිමියන්ගේ හා සහදායකයින්ගේ රැස්වීම්.

ඉල්ලීමක් කළ යුතු ද නැද්ද යන්න නිශ්චය කිරීමේ කාර්යය සඳහා වෙන් වශයෙන් කැඳවන ලද ණය හිමියන් ගේ සහ සහදායකයින්ගේ රැස්වීම්වල කාර්යය විය යුතු ය.

(2) එවැනි යම් නිශ්චය කිරීමක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය යම් පත්කිරීමක් හෝ ආඥාවක් අධිකරණය විසින් කරනු ලැබිය හැකි අතර, (1) වන උපවගන්තියේ සඳහන් කරුණු සම්බන්ධයෙන් ණය හිමියන්ගේ හා සහදායකයින්ගේ රැස්වීම්වල දී එළඹුණු නිශ්චය කිරීම් අතර යම් වෙනසක් පවත්නා අවස්ථාවක, අධිකරණය විසින් ඒ වෙනස ගැන තීරණයක් ගත යුතු අතර, ඒ සම්බන්ධයෙන් සුදුසු යයි අදහස් කරන ආඥාවක් ද කළ යුතු ය.

පරීක්ෂණ කමිටුවේ සංයුතිය හා කාර්ය පටිපාටිය.

**300**. (1) මේ පනතේ විධිවිධාන ප්‍රකාර පත්කරනු ලැබූ පරීක්ෂණ කමිටුවක් සමාගමේ ණය හිමියන්ගෙන් සහ සහදායකයින්ගේ හෝ සමාගමේ ණය හිමියන්ගේ හා සහදායකයින්ගේ රැස්වීමේ දී එකඟවන අනුපාතවලට අනුව හෝ ඒ අනුපාතවල යම් වෙනසක් සම්බන්ධයෙන් වන විට, අධිකරණය විසින් නිශ්චය කරනු ලබන අනුපාතවලට අනුව හෝ ණය හිමියන්ගෙන් හෝ සහදායකයින්ගෙන් ලැබුණු සාමාන්‍ය ඇටර්නි බලතල දරන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(2) යටත් පිරිසෙයින් සෑම මසකම එක් වරක්වත් රැස්වීමක් පැවැත්වෙන ආකාරයෙන් කමිටුව විසින් කලින් කල නියම කරගනු ලබන වේලාවන්හි ද, කමිටුව රැස්විය යුතු ය. තව ද, අවස්ථාවෝචිත පරිදි, ඇවරකරු විසින් හෝ කමිටුවේ යම් සාමාජිකයකු විසින් හෝ අවශ්‍ය යයි ඔහු අදහස් කරන පරිදි, සහ අවශ්‍ය විටෙක, කමිටුවේ රැස්වීමක් කැඳවනු ලැබිය හැකි ය.

(3) කමිටුව විසින්, රැස්වීමකට පැමිණ සිටින කමිටුවේ සාමාජිකයන්ගෙන් බහුතරයක් ඒ රැස්වීමට පැමිණියහොත් මිස, කමිටුව විසින් ක්‍රියාකරනු නොලැබිය යුතු ය.

(4) කමිටුවේ සාමාජිකයකුට, තමා විසින් අත්සන් කරනු ලැබ, ඇවරකරු වෙත භාරදෙනු ලබන ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් ඉල්ලා අස්විය හැකි ය.

(5) කමිටුවේ සාමාජිකයකු වස්තු භංගත්වයට පත්වීම හෝ බුන්වත්වීම හෝ ස්වකීය ණය හිමියන් සමඟ සමථයකට පත්වීම හෝ යම් වැඩ පිළිවෙලක් යොදා ගැනීම හෝ අවස්ථාවෝචිත පරිදි, තමන් සමඟ ණය හිමියන් හෝ සහදායකයින් නියෝජනය කරන සාමාජිකයන්ගේ අවසරය නොමැතිව කමිටුවේ අනුක්‍රමික රැස්වීම් පහකට නොපැමිණීම හෝ සිදු වූ අවස්ථාවක දී ඔහුගේ ධුරය හිස් විය යුතු ය.

(6) කමිටුවේ සාමාජිකයකු ණය හිමියා නියෝජනය කරන්නේ නම්, රැස්වීමේ අරමුණු සඳහන් කෙරෙන දින හතක් දැන්වීමක් කර පවත්වනු ලබන ණය හිමියන්ගේ රැස්වීමක දී හෝ ඔහු සහදායකයින් නියෝජනය කරන්නේ නම්, රැස්වීමේ අරමුණු සඳහන් කෙරෙන දින හතක් දැන්වීමක් කර පවත්වනු ලබන සහදායකයින්ගේ රැස්වීමක දී සාමාන්‍ය යෝජනා සම්මතයක් මගින් ඔහු ඉවත්කරනු ලැබිය හැකි ය.

(7) කමිටුවේ පුරප්පාඩුවක් ඇති වූ විට, පුරප්පාඩුව පිරවීම සඳහා ඈවරකරු විසින්, අවස්ථාවෝචිත පරිදි, ණය හිමියන්ගේ හෝ සහදායකයින්ගේ රැස්වීමක් වහාම කැඳවිය යුතු අතර, පුරප්පාඩුව පිරවීම සඳහා රැස්වීමේ දී සම්මතයක් මගින් එම ණය හිමියා ම හෝ ආධාරකරුම නැවත පත්කිරීම, හෝ වෙනත් ණය හිමියකු හෝ සහදායකයකු පත්කිරීම හෝ කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද, ගණන් බේරා වසාදැමීමේ තත්ත්වය කෙරෙහි සැලකිල්ලක් දක්වමින්, පුරප්පාඩු පිරවීම අනවශ්‍ය යයි ඈවරකරුගේ මතය වූ අවස්ථාවක, ඒ පුරප්පාඩුව නොපිරවිය යුතු බවට ආඥාවක් ලබා ගැනීම සඳහා වූ ඉල්ලීමක් ඔහු විසින් අධිකරණය වෙත කරනු ලැබිය හැකි අතර, එවිට එවැනි ආඥාවක් හෝ ආඥාවෙහි සඳහන් වන අවස්ථානුගත කරුණු යටතේ හැර, එය නොපිරවිය යුතු බවට වූ ආඥාවක් හෝ අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.

**301**. ගණන් බේරා වසා දැමීමක දී පරීක්ෂණ කමිටුවක් නොමැති අවස්ථාවක, ඈවරකරුගේ ඉල්ලීම මත, කමිටුව විසින් කිරීමට හෝ දීමට මේ පනතින් බලය පැවරෙන හෝ නියම කෙරෙන යම් ක්‍රියාවක් කිරීම, නැතහොත් යම් විධානයක් හෝ අවසරයක් දීම අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය. පරීක්ෂණ කමිටුවක් නොමැති අවස්ථාවක අධිකරණය සතු බලතල.

## අධිකරණය විසින් ගණන් බේරා වසා දමනු ලබන අවස්ථාවක දී අධිකරණයේ සාමාන්‍ය බලතල

**302**. (1) ගණන් බේරා වසා දැමීම සඳහා ආඥාවක් කිරීමෙන් පසු යම් අවස්ථාවක, ඈවරකරුගේ හෝ නිල භාර ගැනුම්කරුගේ හෝ යම් ණය හිමියකුගේ හෝ සහදායකයකුගේ ඉල්ලීම මත හා ගණන් බේරා වසා දැමීමට අදාළ සියලු කාර්යය පටිපාටිය නතර කළ යුතු බවට අධිකරණය සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලැබූ විට, අධිකරණය විසින් සම්පූර්ණයෙන් ම හෝ සීමිත කාලයක් සඳහා හෝ සුදුසු යයි අධිකරණය සඳහන් කරන නියම හා කොන්දේසි මත කාර්ය පටිපාටිය නතර කිරීමේ ආඥාවක් කරනු ලැබිය හැකි ය. ගණන් බේරා වසා දැමීම නතර කිරීමට ඇති බලය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ කරනු ලැබූ යම් ඉල්ලීමක් මත, අධිකරණය විසින් ආඥාවක් කිරීමට පෙර, තම මතය අනුව ඉල්ලීමට අදාළ සිද්ධි හෝ කරුණු කිසිවක් සම්බන්ධයෙන් වූ වාර්තාවක් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලෙස නිල භාර ගැනුම්කරුට නියම කළ හැකි ය.

(3) මේ වගන්තියේ විධිවිධාන යටතේ කරන ලද සෑම ආඥාවකම පිටපතක් සමාගම විසින් හෝ නියම කරනු ලැබිය හැකි අන්‍යාකාරයකින් හෝ රෙජිස්ට්‍රාර්වරයා වෙත වහාම ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඔහු විසින් සමාගමට අදාළ තම පොත්වල ආඥාව පිළිබඳ සටහනක් නොපමාව කරනු ලැබිය යුතු ය.

සහදායකයන් පිළිබඳ ලැයිස්තු බේරුම්කිරීම හා වත්කම් යෙදීම.

**303**. (1) ගණන් බේරා වසා දැමීමේ ආඥාවට පසු හැකි ඉක්මනින් මේ පනතට අනුකූලව නිවැරදි කිරීම අවශ්‍ය වන්නා වූ අවස්ථාවක, සියලු කරුණු සම්බන්ධයෙන් කොටස් ලේඛනය නිවැරදි කිරීමේ බලය ඇතිව සහදායකයින් පිළිබඳ ලැයිස්තුවක් අධිකරණය විසින් බේරුම් කරනු ලැබිය යුතු ය. තව ද, සමාගමේ වත්කම්, එකතු කරනු ලැබීමට හා එහි බැරකම් පියවීමෙහි ලා අදාළ කිරීමට සලස්වනු ලැබිය යුතු ය :

එසේ වුව ද, සහදායකයින් සම්බන්ධයෙන් ඇරයුම් කිරීමට හෝ ඔවුන්ගේ අයිතිවාසිකම් යථාවත් කිරීම අවශ්‍ය නොවන්නේ යයි අධිකරණයට පෙනී යන අවස්ථාවක, සහදායකයන් පිළිබඳ ලැයිස්තුවක් බේරුම්කිරීම, අධිකරණය විසින් අත්හැරිය හැකි ය.

(2) සහදායකයින් පිළිබඳ ලැයිස්තුව බේරුම් කිරීමේ දී, තමන්ගේම අයිතියෙන් ආධාරකරුවන් වූ තැනැත්තන් හා අන්‍යයන් සඳහා නියෝජිතයන් වන්නා වූ හෝ අන්‍යයන්ගේ ණය සම්බන්ධයෙන් යටත් වන්නා වූ තැනැත්තන් අතර, අධිකරණය විසින් විශේෂයක් කොට දැක්විය යුතු ය.

ඇවරකරු වෙත දේපළ භාරදීම.

**304**. ගණන් බේරා වසා දැමීමේ ආඥාවක් කිරීමෙන් පසු යම් විටෙක, අධිකරණය විසින් සහදායකයින් පිළිබඳ ලැයිස්තුවේ තත් කාලයෙහි සිටින යම් සහදායකයකුට හා යම් භාරකරුවකුට, භාර ගැනුම්කරුවකුට, බැංකු කරුවකුට, සමාගමේ යම් අනුයෝජිතයකුට හෝ නිලධරයකුට නොපමාව හෝ අධිකරණය විසින් විධාන කරනු ලබන යම් කාලයක් ඇතුළත තමාගේ අතේ ඇති, බැලූ බැල්මට සමාගමට හිමිකමක් ඇත්තා වූ මුදල්, දේපළ හෝ පොත් සහ පත් කිසිවක් ඇවරකරු වෙත ගෙවීමට, භාරදීමට, හිමිකරදීමට, පවාරණය කිරීමට හෝ පැවරීමට නියම කළ හැකි ය.

සහදායකයකු ගෙන් සමාගමට අයවිය යුතු ණය ගෙවීම හා හිලව් කිරීමට අවසර දෙනු ලබන ප්‍රමාණය.

**305**. (1) ගණන් බේරා වසා දැමීමේ ආඥාවක් කිරීමෙන් පසු යම් විටෙක, අධිකරණය විසින්, සහදායකයින් පිළිබඳ ලැයිස්තුවේ තත් කාලයෙහි සිටින යම් සහදායකයකුට ආඥාව මගින් විධාන කරන ලද ආකාරයට ඔහුගෙන් හෝ ඔහු නියෝජනය කරනු ලබන්නේ යම් තැනැත්තකු ද ඒ තැනැත්තාගේ බූදලයෙන් ලැබිය යුතු මුදල්, මේ පනතට අනුකූලව යම් ඇරයුමක් ප්‍රකාර ඔහු විසින් හෝ එවැනි බූදලයකින් ගෙවිය යුතු යම් මුදලක් ඊට ඇතුළත් නොකර, ගෙවන ලෙස ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(2) අධිකරණය විසින් එවැනි යම් ආඥාවක් කිරීමේ දී, සීමාරහිත සමාගමක් සම්බන්ධයෙන් වන විට, සහදායකයකුට, නැතහොත්, ඔහු නියෝජනය වන්නේ යම් බූදලයක් වෙනුවෙන් ද ඒ බූදලයට සමාගම සමග වූ යම් ස්වාධීන කටයුත්තක් හෝ ගිවිසුමක් මත සමාගමෙන් ලැබිය යුතු යම් මුදලක් හිලව් කිරීමක ආකාරයෙන් සහදායකයකුට ලැබීමට අවකාශ දිය හැකි ය. එහෙත්, එය යම් ලාභාංශයක් හෝ ලාභයක් සම්බන්ධයෙන් සමාගමේ සාමාජිකයකු වශයෙන් ඔහුට ලැබිය යුතු යම් මුදලක් නොවිය යුතු ය.

(3) සීමාසහිත වුව ද, නැතහොත්, සීමා රහිත වුව ද යම් සමාගමක් සම්බන්ධයෙන් සියලු ණය හිමියන්ට සම්පූර්ණයෙන් ගෙවීම් කරනු ලැබ ඇති විට, කවර වූ හෝ හේතුවක් මත සහදායකයකුට සමාගමෙන් ලැබිය යුතු යම් මුදලක්, යම් තදනන්තර ඇරයුමකට එරෙහිව හිලව් කිරීමක ආකාරයෙන් ඔහුට ලබාගැනීමට අවකාශ දෙනු ලැබිය හැකි ය.

සමාගමට ලැබිය යුතු මුදල් බැංකුවට ගෙවීම.

**306**. (1) සමාගමට මුදල් ලැබිය යුත්තේ යම් සහදායකයකුගෙන් ද ගැනුම්කරුවකුගෙන් ද නැතහොත්, වෙනත් තැනැත්තකුගෙන් ද එසේ ලැබිය යුතු ඒ මුදල් ප්‍රමාණය ඈවරකරුට ගෙවීම වෙනුවට, නිශ්චිත බැංකුවක හෝ එහි යම් ශාඛාවක වූ ඈවරකරුගේ ගිණුමට ගෙවීමට අධිකරණය විසින් ඒ සහදායකයාට, ගැනුම්කරුට හෝ වෙනත් තැනැත්තාට ආඥාවක් කරනු ලැබිය හැකි අතර, ඈවරකරු වෙත ගෙවීම කරනු පිණිස විධාන කරනු ලැබූ ලෙස ඒ ආකාරයෙන් ම එවැනි යම් ආඥාවක් බලාත්මක කරනු ලැබිය හැකි ය.

(2) අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීමක දී, නිශ්චිත බැංකුවකට හෝ එහි යම් ශාඛාවකට ගෙවන ලද හෝ භාර දෙන ලද සියලු මුදල් හා ඇප, සියලු කරුණු සම්බන්ධයෙන් අධිකරණයේ අඥාවලට යටත් විය යුතු ය.

විශේෂ කළමනාකරු පත් කිරීම.

**307**. (1) තාවකාලික වශයෙන් හෝ අන්‍යාකාරයකින් හෝ නිල භාර ගැනුම්කරු සමාගමක ඈවරකරු වන අවස්ථාවක, සමාගමේ බූදලයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය හෝ, පොදුවේ ණය හිමියන්ගේ හෝ සහදායකයින්ගේ සම්බන්ධතා හේතුකොටගෙන තමා හැර සමාගමේ බූදලයේ හෝ ව්‍යාපාරයේ විශේෂ කළමනාකරුවකු පත් කිරීම අවශ්‍ය යයි ඔහු සෑහීමට පත් වුවහොත්, සමාගමේ බූදලයේ හෝ ව්‍යාපාරයේ විශේෂ කළමනාකරුවකු පත් කිරීම සඳහා අධිකරණය වෙත ඉල්ලීමක් කළ හැකි අතර, ඒ ඉල්ලීම මත අධිකරණය විසින් ඔහු වෙත පවරනු ලබන දේපළ භාරගන්නාගේ හෝ කළමනාකරුවකුගේ බලතල අතුරෙන් කිසිවක් ඇතුළු යම්තාක් වූ බලතල ඇතිව, අධිකරණය විසින් විධාන කරනු ලබන යම් කාලයක් තුළ ක්‍රියාකිරීම පිණිස එකී බූදලයේ හෝ ව්‍යාපාරයේ විශේෂ කළමනාකරුවකු අධිකරණය විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ පත් කරන ලද විශේෂ කළමනාකරු විසින් අධිකරණය විධාන කරන ආකාරයට ඇප තැබිය යුතු අතර, එසේ නියම කරන ආකාරයට වගකිව යුතු ය.

(3) අධිකරණය විසින් නියම කරනු ලබන පාරිශ්‍රමිකයන්, (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ පත් කරන ලද විශේෂ කළමනාකරු ලැබිය යුතු ය.

ණය හිමියන් හා සහදායකයින් විසින් පොත් පරීක්ෂා කිරීම.

**308**. ගණන් බේරා වසා දැමීමේ ආඥාවක් කිරීමෙන් පසු යම් විටක, ණය හිමියන් හා සහදායකයින් විසින් සමාගමේ පොත් හා පත් පරීක්ෂා කිරීම සඳහා සාධාරණ යයි අධිකරණය කල්පනා කරනු ලබන යම් ආඥාවක් අධිකරණය විසින් කළ හැකි ය. තව ද ඒ අනුව සමාගම සන්තකයෙහි ඇති පොත් හා පත් කිසිවක් ණය හිමියන් සහ සහදායකයින් විසින් පරීක්ෂා කරනු ලැබිය හැකි ය.

ගණන් බේරා වසා දැමීමේ වියදම් වත්කම්වලින් ගෙවීමට ආඥා කිරීමේ බලය.

**309**. බැරකම් පියවීම පිණිස වත්කම් ප්‍රමාණවත් නොවන විටක දී, සාධාරණ යයි අධිකරණය කල්පනා කරනු ලබන යම් පුමුඛතා පිළිවෙලක් අනුව, ගණන් බේරා වසා දැමීමේ දී දරන ලද ගාස්තු, අයකිරීම් සහ වියදම් වත්කම්වලින් ගෙවීමට ආඥාවක් කරනු ලැබිය හැකි ය.

සමාගමේ දේපළ ඇති බවට සැකකළ තැනැත්තන් කැඳවීමට ඇති බලය.

**310**. (1) තාවකාලික ඈවරකරුවකු පත් කිරීමෙන් පසුව හෝ ගණන් බේරා වසා දැමීමේ ආඥාවක් කිරීමෙන් පසුව යම් විටක, සමාගමේ යම් නිලධරයකු හෝ සමාගමේ දේපළ තම සන්තකයේ ඇති බවට දන්නා වූ හෝ සැකකරන හෝ සමාගමට ණය ගැති යයි කියනු ලබන තැනැත්තකු හෝ සමාගමේ ප්‍රවර්ධනය, පිහිටුවීම, වෙළෙඳාම, ගණුදෙනු, කටයුතු හෝ දේපළ සම්බන්ධයෙන් තොරතුරු දීමේ හැකියාව ඇතැයි අධිකරණය විසින් සලකනු ලබන යම් තැනැත්තකු අධිකරණය ඉදිරියේ පෙනී සිටීමට අධිකරණය විසින් කැඳවනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ කැඳවන ලද යම් නිලධරයකු හෝ තැනැත්තකු ඒ උපවගන්තියේ සඳහන් යම් කරුණක් පිළිබඳව වාචික හෝ ලිඛිත ප්‍රශ්න මගින් දිවුරුම් මත අධිකරණය විසින් විභාග කරනු ලැබිය හැකි අතර, ඒ විභාග කිරීම වාචිකව කරනු ලැබූ අවස්ථාවක, උත්තර ලියවිල්ලක් මගින් සකස් කර, ඒවා අත්සන් කිරීමට ඒ නිලධරයාට හෝ තැනැත්තාට නියම කරනු ලැබිය හැකි ය.

(3) සමාගමට අදාළව, තම ආරක්ෂා භාරයේ හෝ බලයෙහි ඇති පොත් සහ පත් කිසිවක් ඉදිරිපත් කරන ලෙස අධිකරණය විසින්, (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ කැඳවන ලද යම් නිලධරයකුට හෝ තැනැත්තකුට නියම කරනු ලැබිය හැකි ය. එහෙත්, ඒ නිලධරයා හෝ තැනැත්තා විසින් ඉදිරිපත් කරන ලද ඒ පොත් හෝ පත් පිළිබඳව ඒ නිලධරයා හෝ තැනැත්තා යම් කැප අයිතියකට හිමිකම පාන්නා වූ අවස්ථාවක, ඒවා ඉදිරිපත් කිරීම ඒ කැප අයිතියට හානියක් නොමැතිව කරනු ලැබිය යුතු ය. තව ද, ඒ කැප අයිතියට අදාළ සියලු ප්‍රශ්න නිශ්චය කිරීමට ගණන් බේරා වසා දැමීමේ දී අධිකරණයට අධිකරණ බලය තිබිය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ කැඳවන ලද යම් නිලධරයෙක් හෝ තැනැත්තෙක් යම් සාධාරණ හේතුවක් නොමැතිව සිතාසියේ සඳහන් වේලාවට හා දිනයේ දී අධිකරණය ඉදිරියේ පෙනී සිටීම හෝ තමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට නියමිත යම් පොත් හෝ පත් කිසිවක් ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කරයි නම් හෝ පැහැර හරියි නම් හෝ ඔහු අත්අඩංගුවට ගෙන විභාග කිරීම සඳහා අධිකරණය ඉදිරියට ඉදිරිපත් කරනු ලැබීමට ඔහු යටත් විය යුතු ය.

ප්‍රවර්ධකයන්, අධ්‍යක්ෂවරුන් ආදීන් ප්‍රසිද්ධියේ විභාග කිරීමට ආඥා කිරීමේ බලය.

**311**. (1) සමාගමක් ගණන් බේරා වසා දැමීම සඳහා අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබ ඇත්තා වූ සහ සමාගම ප්‍රවර්ධනය කිරීමේ දී හෝ පිහිටුවීමේ දී යම් තැනැත්තකු විසින් හෝ එය පිහිට වූ තැන් පටන් සමාගම සම්බන්ධයෙන් සමාගමේ යම් නිලධරයකු විසින් හෝ තම මතය අනුව වංචාවක් සිදුකර ඇති බව ප්‍රකාශ කරමින් මේ පනතේ විධිවිධාන යටතේ නිල භාර ගැනුම්කරු විසින් වැඩිදුර වාර්තාවක් කරනු ලැබ ඇත්තා වූ ද අවස්ථාවක, අධිකරණය විසින් ඒ වාර්තාව සලකා බැලීමෙන් පසුව, ඒ තැනැත්තා හෝ නිලධරයා ඒ කාර්යය සඳහා අධිකරණය විසින් නියම කරන ලද දිනයක අධිකරණය ඉදිරියෙහි පෙනී සිට, සමාගම ප්‍රවර්ධනය කිරීම, පිහිටුවීම හෝ එහි ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සම්බන්ධයෙන් හෝ එහි නිලධරයකු වශයෙන් තම පැවැත්ම හා කටයුතු සම්බන්ධයෙන් ප්‍රසිද්ධියේ විභාග කළ යුතු යයි අධිකරණය විසින් විධාන කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් විභාගයේ දී නිල භාර ගැනුම්කරු විසින් කරුණු ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, තත් කාර්යය සඳහා නීතිඥවරයකු මගින් පෙනී සිටිනු ලැබිය හැකි ය.

(3) නිල භාර ගැනුම්කරු ඇවරකරු නොවන අවස්ථාවක, ඇවරකරු සහ යම් ණය හිමියකු හෝ සහදායකයකු ද පෞද්ගලිකව හෝ නීතිඥවරයකු මගින් විභාගයට සහභාගි විය හැකි ය.

(4) මේ වගන්තියේ විධිවිධාන යටතේ විභාග කරනු ලබන තැනැත්තා හෝ නිලධරයා දිවුරුම් මත හෝ ප්‍රතිඥාව මත විභාග කරනු ලැබිය යුතු අතර, අධිකරණය විසින් ඉදිරිපත් කරනු ලබන හෝ තමා වෙත ඉදිරිපත් කිරීමට අවකාශ දෙනු ලබන යම්තාක් වූ සියලු ප්‍රශ්නවලට උත්තර දිය යුතු ය.

විභාග කරනු ලැබීමට විධාන කරනු ලැබූ තැනැත්තකුට හෝ නිලධරයකුට නීතිඥවරයකු මගින් නියෝජනය කිරීමට හැකිබව යනාදිය.

**312**. (1) 311 වන වගන්තියේ විධිවිධාන යටතේ විභාග කරනු ලැබීමට විධාන කරනු ලැබූ තැනැත්තකුට හෝ නිලධරයකුට තමාගේම වියදමින්, එසේ විභාග කරනු ලැබීමට පෙර, නිල භාර ගැනුම්කරුගේ වාර්තාවේ පිටපතක් සපයා දෙනු ලැබිය යුතු අතර, තමාගේ ම වියදමින් නීතිඥවරයකු මගින් තමා නියෝජනය කළ හැකි ය. තමා විසින් දෙන ලද උත්තර කිසිවක් පැහැදිලි කිරීමට හෝ යෝග්‍ය කිරීමට හැකි කරවීමේ කාර්යය සඳහා සාධාරණ යයි අධිකරණය සලකන ප්‍රශ්න ඒ තැනැත්තා හෝ නිලධරයා වෙත ඉදිරිපත් කිරීමට නීතිඥවරයාට නිදහස තිබිය යුතු ය :

එසේ වුව ද, තමාට විරුද්ධව කරන ලද හෝ කියන ලද චෝදනා කිසිවකින් නිදහස් කිරීම පිණිස එවැනි යම් තැනැත්තකු හෝ නිලධරයකු විසින් අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක, ඒ ඉල්ලීම විභාග කිරීමේ දී පෙනී සිට, අදාළ යයි නිල භාර ගැනුම්කරුට පෙනී යන කරුණු කිසිවකට අධිකරණයේ අවධානය යොමු කිරීම නිල භාර ගැනුම්කරුගේ කාර්යය විය යුතු ය. තව ද, නිල භාර ගැනුම්කරු විසින් දෙන ලද යම් සාක්ෂියක් හෝ කැඳවන ලද සාක්ෂිකරුවන් විභාගකිරීමෙන් පසුව, අධිකරණය විසින් ඉල්ලීමට අවසර දෙනු ලැබූ අවස්ථාවක, සිය අභිමතය පරිදි සුදුසු යයි අධිකරණය සලකනු ලැබිය හැකි ගාස්තු කිසිවක් ලබා ගැනීමට ඉල්ලුම්කරුට අවකාශ දෙනු ලැබිය හැකි ය.

(2) 311 වන වගන්තිය යටතේ පවත්වනු ලැබූ විභාගයේ සටහන් ලියවිල්ලකට පත් කරනු ලැබිය යුතු අතර, විභාග කරන ලද තැනැත්තාට හෝ නිලධරයාට කියවා දෙනු ලැබිය යුතු ය. නැතහොත් ඔහු විසින් කියවනු ලැබිය යුතු අතර අත්සන් කරනු ලැබිය යුතු ය. ඉන් පසු ඒවා

ඔහුට විරුද්ධව සාක්ෂි වශයෙන් පාවිච්චි කරනු ලැබිය හැකි ය. තවද සියලු යුක්ති සහගත වේලාවන්හි දී යම් ණය හිමියකු හෝ සහදායකයකු විසින් පරීක්ෂා කරනු ලැබීම සඳහා එය විවෘතව තිබිය යුතු ය.

(3) සුදුසු යයි අධිකරණය විසින් කල්පනා කරතහොත්, කලින් කල විභාගය අඩාලව කල් තබනු ලැබිය හැකි ය.

පැනගොස් සැඟවී ඇති සහදායකයකු සිරභාරයට ගැනීමේ බලය.

**313**. ගණන් බේරා වසා දැමීමේ ආඥාවක් කිරීමට පෙර හෝ පසු යම් අවස්ථාවක, ශ්‍රී ලංකාව හැර යාමට හෝ අන්‍යාකාරයකින් පැනගොස් සැඟවීමට හෝ ඇරයුම් ගෙවීම පැහැර හැරීමේ හෝ සමාගමේ කටයුතු සම්බන්ධයෙන් විභාග කිරීම වැළැක්වීමේ කාර්යය සඳහා, තමාගේ යම් දේපළක් ඉවත් කිරීමට හෝ සඟවා තැබීමට ආසන්න බව විශ්වාස කිරීමට තරම් සාධාරණ හේතු ඉදිරිපත් කිරීම මත, සහදායකයකු සිරභාරයට ගැනීමට සහ ඔහුගේ පොත් හා පත් සහ චංචල පෞද්ගලික දේපළ තහනමට ගැනීමට ද ඔහු සහ ඒවා අධිකරණය විසින් නිශ්චය කරනු ලබන යම් කාලයක් ගතවන තුරු ආරක්ෂිත භාරයේ තබා ගැනීමට ද, සලස්වනු ලැබිය හැකි ය.

සමුච්චිත අධිකරණ බලතල.

**314**. මේ පනතින් අධිකරණය වෙත පවරන ලද යම් බලතල යම් ඇරයුමක් හෝ වෙනත් මුදල් අයකර ගැනීම සඳහා සමාගමේ යම් සහදායකයකුට හෝ ණය කරුවකුට හෝ යම් සහදායකයකුගේ හෝ ණයකරුවකුගේ බූදලයට විරුද්ධව නඩු කටයුතු පැවරීම සම්බන්ධයෙන් දැනට පවත්නා බලතල කිසිවක් සීමා කිරීමක් වශයෙන් නොව, ඊට අතිරේකව විය යුතු ය.

අධිකරණයේ ඇතැම් බලතල ඈවරකරුට පවරාදීම.

**315**. මේ පනතින් අධිකරණය වෙත පවරන ලද හා නියම කරන ලද පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් වූ සියලු බලතල හා කාර්ය හෝ ඉන් යම් බලයක් හෝ කාර්යයක් අධිකරණයේ නිලධරයකු වශයෙන් අධිකරණයේ පාලනයට යටත්ව ඈවරකරු විසින් කිරීමට හෝ ඉටුකිරීමට හැකිකරවීම හෝ නියම කිරීම සඳහා අමාත්‍යවරයා විසින් රීති සාදනු ලැබිය හැකි ය :—

(අ) ණය හිමියන්ගේ හා සහදායකයින්ගේ අපේක්ෂාවන් නිසැකව දැනගැනීම සඳහා රැස්වීම් පැවැත්වීම හා ඒවා මෙහෙයවීම ;

(ආ) සහදායකයින් පිළිබඳ ලැයිස්තු බේරුම්කිරීම හා අවශ්‍ය අවස්ථාවල දී සාමාජික ලේඛනය නිවැරදි කිරීම හා වත්කම් එකතු කිරීම සහ ඒවා යෙදවීම ;

(ඇ) ඇවරකරුට මුදල්, දේපළ, පොත් හෝ පත් ගෙවීම, භාරදීම, හිමිකරදීම, පවාරණය කිරීම හෝ පැවරීම ;

(ඈ) ණය හා හිමිකම් පෑම් ඔප්පු කරනු ලැබිය යුතු කාලයක් නියම කිරීම :

එසේ වුව ද, අධිකරණයේ විශේෂ අවසරය නොමැතිව, ඇවරකරු විසින් සාමාජික ලේඛනය නිවැරදි නොකළ යුතු අතර, අධිකරණයේ විශේෂ අවසරය හෝ පරීක්ෂණ කමිටුවේ අනුඥාව නො මැතිව යම් ඇරයුමක් කරනු නොලැබිය යුතු ය.

සමාගමක් විසුරුවා හැරීම.

**316**. (1) සමාගමක කටයුතු සම්පූර්ණයෙන්ම ගණන් බේරා අවසන් කරනු ලැබූ අවස්ථාවක, සමාගම විසුරුවා හැරිය යුතු යයි ඇවරකරු ඉල්ලීමක් කිරීමෙන් අනතුරුව, කරනු ලබන ආඥාවේ දින පටන් සමාගම විසුරුවා හරිනු ලබන බවට වූ ආඥාවක් අධිකරණය විසින් කළ යුතු ය. තව ද ඒ අනුව සමාගම විසුරුවා හරිනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ කරන ලද ආඥාවේ පිටපතක්, ඒ ආඥාවේ දින සිට දින දාහතරක් ඇතුළත ඇවරකරු විසින් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, සමාගම විසුරුවා හැරීම පිළිබඳ ලඝු සටහනක් ඔහුගේ පොත්වල ඔහු විසින් කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ නියමවලට අනුව ක්‍රියාකිරීම ඇවරකරු විසින් පැහැර හරිනු ලැබ ඇති අවස්ථාවක, ඔහු වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

අධිකරණ ආඥා බලාත්මක කරන ආකාරය.

**317**. මේ පනත යටතේ අධිකරණයක් විසින් කරන ලද යම් අඥාවක, ඒ අධිකරණයේ විනිශ්චයට භාජනව පැවති යම් සිවිල් නඩුවක තීන්දු ප්‍රකාශයක් බලාත්මක කරනු ලබන ආකාරයෙන් ම බලාත්මක කරනු ලැබිය හැකි ය.

වෙනත් අධිකරණයක ගණන් බේරා වසා දැමීමේ ආඥාවක් බලාත්මක කිරීම.

**318**. එක් අධිකරණයක් විසින් කරන ලද යම් ආඥාවක් වෙනත් යම් අධිකරණයක් විසින් බලාත්මක කිරීම අවශ්‍ය වන්නා වූ අවස්ථාවක, එය බලාත්මක කිරීමට අවශ්‍ය අධිකරණය වෙත ආඥාවේ සහතික පිටපතක් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, සහතික පිටපතක් ඉදිරිපත් කිරීම ආඥාව පිළිබඳ ප්‍රමාණවත් සාක්ෂියක් විය යුතු ය. තව ද, එවිට ඒ ආඥාව ඒ වෙනත් අධිකරණය විසින් කරනු ලැබූ ලෙස ඒ ආකාරයෙන් ම බලාත්මක කිරීම සඳහා ඒ අධිකරණය විසින් ඒ කාරණය සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු ය.

## (III) ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම

### ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම සඳහා වූ යෝජනා සම්මතය හා ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම ආරම්භ කිරීම

සමාගම ස්වේච්ඡාවෙන් ගනත් බේරා වසා දැමිය හැකි අවස්ථා.

**319**. (1) (අ) සමාගමේ ව්‍යවස්ථාවලිය මගින් සමාගමේ පැවැත්ම සඳහා නියම කරන ලද යම් කාලසීමාවක් වෙතොත්, ඒ කාලසීමාව ඉකුත් වූ විට, නැතහොත්, යම් සිද්ධියක් සිදුවීමේ දී, සමාගම විසුරුවා හරිනු ලැබිය යුතු බවට ව්‍යවස්ථාවලිය මගින් විධිවිධාන සලස්වා ඇති විට, ඒ සිද්ධිය සිදුවුවහොත් සහ මහා සභා රැස්වීමක දී සමාගම ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමට නියම කෙරෙන යෝජනා සම්මතයක් සම්මත කරනු ලැබූ විට ;

(ආ) සමාගම ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දමනු ලැබිය යුතු බව විශේෂ යෝජනා සම්මතයක් මගින් සමාගම විසින් සම්මත කරනු ලැබූ අවස්ථාවක ;

(ඇ) ස්වකීය බැරකම්වල හේතුවෙන් තවදුරටත් ව්‍යාපාරය කරගෙන යාමට නොහැකි බවට සහ ගණන් බේරා වසාදැමීම නුවණට හුරු බවට වූ විශේෂ යෝජනා සම්මතයක් සමාගම විසින් සම්මත කරනු ලැබූ අවස්ථාවක,

සමාගමක් ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමිය හැකි ය.

(2) මේ පනතෙහි "ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම සඳහා වූ යෝජනා සම්මතයක් " යන යෙදුමෙන් (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ සම්මත කරන ලද යෝජනා සම්මතයක් අදහස් වේ.

ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම සඳහා වූ යෝජනා සම්මතයක් පිළිබඳ දැන්වීම.

**320**. (1) ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම සඳහා වූ යෝජනා සම්මතයක්, සමාගමක් විසින් සම්මත කරනු ලැබ ඇති අවස්ථාවක, යෝජනා සම්මතය සම්මත කිරීමේ දින සිට දින දාහතරක් ඇතුළත ගැසට් පත්‍රයෙහි පළකිරීමෙන් යෝජනා සම්මතය පිළිබඳව දැනුම් දිය යුතු ය.

(2) මේ වගන්තියේ විධිවිධානවලට අනුව ක්‍රියා කිරීම සමාගම විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක,—

(අ) සමාගම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය ; තව ද

(ආ) පැහැර හැරීම කරනු ලබන, සමාගමේ සෑම නිලධරයකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා සමාගමේ ඈවරකරු සමාගමේ නිලධරයකු ලෙස සලකනු ලැබිය යුතු ය.

ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම ආරම්භ කිරීම.

**321**. ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසාදැමීමක්, ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම සඳහා වූ යෝජනා සම්මතය සම්මත වූ අවස්ථාවේ දී ආරම්භ වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

## ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමේ ප්‍රතිඵල

ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමෙන් සමාගමේ ව්‍යාපාරය සහ තත්ත්වය කෙරෙහි ඇතිවන බලපෑම.

**322**. ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමක දී, ඵලදායී ලෙස ගණන් බේරා වසා දැමීම සඳහා අවශ්‍ය වන තාක් දුරට හැර, ගණන් බේරා වසා දැමීම ආරම්භ කිරීමේ දින සිට සමාගම ස්වකීය ව්‍යාපාර කටයුතු කරගෙන යාම නතර විය යුතු ය :

එසේ වුව ද, එහි ව්‍යවස්ථාවලියේ පටහැනිව කුමක් සඳහන් වුව ද, ඒ සමාගමේ සංස්ථාගත තත්ත්වය සහ සංස්ථාගත බලතල ඒ සමාගම විසුරුවා හරිනු ලබන තෙක් නොකඩවා පැවතිය යුතු ය.

ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම ආරම්භ කිරීමෙන් පසු පැවරීම් ආදිය බලරහිත විය යුතු බව.

**323**. ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසාදැමීම ආරම්භ කිරීමේ දිනයෙන් පසුව කරන ලද, ඈවරකරු වෙත හෝ ඈවරකරුගේ අනුඥාව ඇතිව කරන ලද පැවරීමක් නොවන්නා වූ යම් කොටස් පැවරීමක් සහ සමාගමේ කොටස් හිමියන්ගේ තත්ත්වය සම්බන්ධයෙන් වූ යම් වෙනස් කිරීමක් බලරහිත විය යුතු ය.

## වස්තු භංගත්වයට පත් නොවීම පිළිබඳ ප්‍රකාශය

**324**. (1) සමාගමක් ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමට යෝජනා කරනු ලැබූ අවස්ථාවක, සමාගමේ අධ්‍යක්ෂවරයා විසින් ද නැතහොත් අධ්‍යක්ෂවරයන් දෙදෙනෙකුට වැඩි අධ්‍යක්ෂවරයන් ගණනක් ඇති සමාගමක් සම්බන්ධයෙන් වන විට, අධ්‍යක්ෂවරයන්ගේ බහුතරය විසින් ද තමන් විසින් සමාගමේ කටයුතු පිළිබඳව සම්පූර්ණ පරීක්ෂණයක් කරන ලද බවට ද ප්‍රකාශයෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන, ගණන් බේරා වසා දැමීම ආරම්භ කිරීමේ දින සිට මාස දොළහක් නොඉක්මවන කාලසීමාවක් ඇතුළත සමාගමේ ණය සම්පූර්ණයෙන් ම ගෙවීමට හැකිවනු ඇතැයි තම මතය වන බවට ද ව්‍යවස්ථාපිත ප්‍රකාශයක් අධ්‍යක්ෂවරයන්ගේ රැස්වීමක දී කරනු ලැබිය හැකි ය.

ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම සඳහා වූ යෝජනාවක් ඇති අවස්ථාවක, වස්තු භංගත්වයට පත් නොවීම පිළිබඳ ව්‍යවස්ථාපිත ප්‍රකාශය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ කරන ලද ප්‍රකාශයක්,—

(අ) සමාගමේ ගණන් බේරා වසා දැමීම සඳහා වූ යෝජනා සම්මතය සම්මත කිරීමේ දිනට ඉහතින් ම වූ සති පහ ඇතුළත කරනු ලැබ, ඒ දිනය වන විට ලියාපදිංචි කිරීම සඳහා රෙජිස්ට්‍රාර්වරයා වෙත භාර දෙනු ලැබ ඇත්නම් මිස ; සහ

(ආ) ඒ ප්‍රකාශය කිරීමට පෙර, හැකි ඉක්මන් දිනයේ සමාගමේ වත්කම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයක් ඇතුළත් වන්නේ නම් මිස,

එය මේ පනතේ කාර්යය සඳහා බලාත්මක නොවිය යුතු ය.

(3) මේ වගන්තියේ විධිවිධානවලට අනුකූලව ප්‍රකාශයක් කරනු ලැබ භාරදී ඇති ගණන් බේරා වසා දැමීමක්, මේ පනතෙහි “කොටස් හිමියන්ගේ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමක්” වශයෙන් සඳහන් කරනු ලබන අතර, ප්‍රකාශයක් එසේ කරනු නොලැබ හා භාර දී නොමැති ගණන් බේරා වසා දැමීමක් මේ පනතෙහි “ණය හිමියන්ගේ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමක්” ලෙස සඳහන් කරනු ලැබේ.

## කොටස් හිමියන්ගේ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමකට අදාළ විධිවිධාන

**325**. 326 වන වගන්තියේ සිට 332 වන වගන්තිය දක්වා වූ (වගන්ති දෙකම ඇතුළුව) වගන්තිවල විධිවිධාන, 326 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, කොටස් හිමියන්ගේ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමක් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

කොටස් හිමියන්ගේ ගණන් බේරා වසා දැමීමකට අදාළ විධිවිධාන.

ඇවරකරුවන් පත්කිරීමට හා ඔවුන්ගේ පාරිශ්‍රමික නියම කිරීමට සමාගම සතු බලය.

**326**. (1) සමාගමේ කටයුතු ගණන් බේරා වසාදැමීමේ හා වත්කම් බෙදාහැරීමේ කාර්යය සඳහා සමාගමේ මහා සභා රැස්වීමක දී එක් ඇවරකරුවකු හෝ ඇවරකරුවන් වැඩි දෙනකු පත්කරනු ලැබිය යුතු අතර, ඒ එක් එක් ඇවරකරුවකුට ගෙවිය යුතු පාරිශ්‍රමික නියම කරනු ලැබිය හැකි ය.

(2) ඇවරකරුවකු පත්කරනු ලැබූ විට, මහා සභා රැස්වීමේ දී සමාගම විසින් හෝ ඇවරකරු විසින්, අධ්‍යක්ෂවරයන්ට ඔවුන්ගේ බලතල ක්‍රියාත්මක කිරීමට අවකාශ දී ඇති තාක් දුරට හැර, අධ්‍යක්ෂවරයන්ගේ සියලු බලතල අවසන් විය යුතු ය.

ඇවරකරුගේ ධුරයෙහි පුරප්පාඩු පිරවීමට ඇති බලය.

**327**. (1) සමාගම විසින් පත්කරන ලද ඇවරකරුගේ ධුරයෙහි මරණය සිදුවීමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ අන්‍යාකාරයකින් පුරප්පාඩුවක් ඇති වූ අවස්ථාවක සමාගම විසින් මහා සභා රැස්වීමක දී ණය හිමියන් සමග වූ යම් වැඩ පිළිවෙලකට යටත්ව, පුරප්පාඩුව පිරවිය හැකි ය.

(2) ඇවරකරුගේ ධුරයෙහි පුරප්පාඩුවක් පිරවීමේ කාර්යය සඳහා යම් සහදායකයකු විසින් හෝ එක් ඇවරකරුවකුට වඩා වැඩි ඇවරකරුවන් ගණනක් ඇති අවස්ථාවක, යෙදී සිටින ඇවරකරුවන් විසින් හෝ සමාගමේ මහා සභා රැස්වීමක් කැඳවනු ලැබිය හැකි ය.

(3) මේ පනතින් හෝ ව්‍යවස්ථාවලියෙන් විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයෙන් නැතහොත්, යම් සහදායකයකු විසින් හෝ යෙදී සිටින ඇවරකරුවන් විසින් හෝ කරන ලද ඉල්ලීම මත, අධිකරණය විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් (2) වන උපවගන්තියේ සඳහන් රැස්වීම පවත්වනු ලැබිය යුතු ය.

සමාගමේ දේපළ විකිණීම සඳහා ප්‍රතිෂ්ඨාව වශයෙන් කොටස් ආදිය පිළිගැනීමට ඇවරකරුවන් සතු බලය.

**328**. (1) සමාගමක් ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමට යෝජනා කරනු ලබන හෝ එසේ වසා දමමින් පවත්නා අතරතුර, එහි සම්පූර්ණ ව්‍යාපාරය හෝ දේපළ හෝ එහි කොටසක්, මේ පනතේ අර්ථානුකූලව සමාගමක් වන හෝ නොවන (මේ වගන්තියෙහි "පැවරුම්ලාභී සමාගම" යනුවෙන් හඳුන්වනු ලබන) වෙනත් සමාගමකට පැවරීමට හෝ විකිණීමට යෝජනා කරනු ලබන අවස්ථාවක, (මේ වගන්තියෙහි "පැවරුම්කාර

සමාගම" යනුවෙන් හඳුන්වනු ලබන) පළමු සඳහන් සමාගමේ ඈවරකරු විසින්, ඈවරකරු වෙත පොදු අධිකාරයක් හෝ යම් විශේෂ වැඩ පිළිවෙලක් පිළිබඳ අධිකාරයක් පැවරෙන, එම සමාගමේ විශේෂ යෝජනා සම්මතයක අනුභාව ඇතිව පැවරුම්කාර සමාගමේ කොටස් හිමියන් අතර බෙදාදීම පිණිස, පැවරීම හෝ විකිණීම සඳහා වන්දි හෝ වන්දිවල කොටසක් ලෙස කොටස් ඔප්පු හෝ පැවරුම්ලාභී සමාගමේ වෙනත් සමාන සම්බන්ධතා භාරගත හැකි ය. නැතහොත් මුදල්, කොටස්, ඔප්පු හෝ වෙනත් සමාන සම්බන්ධතා වෙනුවට හෝ ඒවාට අමතරව පැවරුම්කාර සමාගමේ කොටස් හිමියන්ට පැවරුම්ලාභී සමාගමේ ලාභවලට සහභාගි වන්නා වූ හෝ වෙනත් යම් ප්‍රතිලාභ ලැබෙන්නා වූ වෙනත් යම් වැඩ පිළිවෙලකට ඇතුළත් විය හැකි ය.

(2) මේ වගන්තියේ විධිවිධාන අනුව යම් විකිණීමකින් හෝ වැඩ පිළිවෙලකින් පැවරුම්කාර සමාගමේ කොටස් හිමියන් බැඳෙනු ලැබිය යුතු ය.

(3) විශේෂ යෝජනා සම්මතයකට පක්ෂව ඡන්දය නොදුන් පැවරුම්කාර සමාගමේ යම් කොටස් හිමියකු ඈවරකරු අමතා තම අකමැත්ත ලියවිල්ලක් මගින් පළකොට යෝජනා සම්මතය සම්මත වීමේ දින සිට දින හතක් ඇතුළත සමාගමේ ලියාපදිංචි කාර්යාලයෙහි තබනු ලැබූ අවස්ථාවක, යෝජනා සම්මතය ක්‍රියාත්මක කිරීමෙන් ඈවරකරු වැළැක්වීමට, නැතහොත්, එකඟත්වයෙන් හෝ මේ වගන්තිය මගින් විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයෙන් කොටස් හිමියා හෝ ඈවරකරු විසින් අධිකරණය වෙත කරන ලද ඉල්ලීම මත අධිකරණය විසින් නිශ්චය කරනු ලබන මිලකට ඔහුගේ අයිතිය මිලට ගැනීමට හෝ ඈවරකරුට ඔහු විසින් නියම කරනු ලැබිය හැකි ය.

(4) කොටස් හිමියාගේ අයිතිය මිලට ගැනීමට ඈවරකරු විසින් තීරණය කරනු ලැබ ඇති අවස්ථාවක, ගැනුම් මුදල සමාගම විසුරුවා හරිනු ලැබීමට පෙර ගෙවිය යුතු අතර, විශේෂ යෝජනා සම්මතයෙන් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් ආකාරයකින් ඒ මුදල ඈවරකරු විසින් ලබාගත යුතු ය.

(5) ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම සඳහා හෝ ඈවරකරුවන් පත්කිරීම සඳහා වූ යෝජනා සම්මතයකට පෙර හෝ සමගාමීව විශේෂ යෝජනා සම්මතයක් සම්මත කිරීමේ හේතුවෙන්

මේ වගන්තියේ කාර්ය සඳහා ඒ විශේෂ යෝජනා සම්මතය බලරහිත නොවිය යුතු ය. එහෙත්, සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා වූ යෝජනා සම්මතය, සම්මත වීමේ දින සිට අවුරුද්දක් ඇතුළත අධිකරණය විසින් හෝ අධිකරණයේ අධීක්ෂණයට යටත්ව, ආඥාවක් කරන ලද අවස්ථාවක අධිකරණය විසින් අනුඥාව දෙනු ලැබ ඇත්නම් මිස, විශේෂ යෝජනා සම්මතය බල සහිත නොවිය යුතු ය.

වස්තු භංගත්වය සම්බන්ධයෙන් වන විට, ණය හිමියන්ගේ රැස්වීමක් කැඳවීම ඈවරකරුගේ කාර්යය බව.

**329**. (1) 324 වන වගන්තියේ විධිවිධාන යටතේ කරන ලද ප්‍රකාශයෙහි ප්‍රකාශිත කාලසීමාව ඇතුළත ස්වකීය ණය සම්පූර්ණයෙන් ගෙවීමට සමාගමට නොහැකිවන බව යම් විටක දී ඈවරකරුගේ මතය වන අවස්ථාවක, ඔහු විසින් නොපමාව ණය හිමියන්ගේ රැස්වීමක් කැඳවනු ලැබිය යුතු අතර, සමාගමේ වත්කම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයක් රැස්වීම ඉදිරියෙහි තැබිය යුතු ය.

(2) මේ වගන්තියේ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම, ඈවරකරු විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක, ඔහු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

එක් එක් වර්ෂය අවසානයේ දී මහා සභා රැස්වීමක් කැඳවීම ඈවරකරුගේ කාර්යය බව.

**330**. (1) එක් වර්ෂයකට වැඩි කාලයක් සඳහා ගණන් බේරා වසා දැමීම කරගෙන යනු ලබන අවස්ථාවක, 332 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව. ගණන් බේරා වසා දැමීම ආරම්භකිරීමේ සිට පළමුවන වර්ෂය අවසානයේ දී සහ ඊළඟ එක් එක් වර්ෂය අවසානයේ දී හෝ අවුරුද්ද අවසානයේ සිට මාස තුනක් හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් අවසර දෙනු ලැබිය හැකි වැඩි කාලසීමාවක් ඇතුළත ප්‍රථම පහසු දිනයෙහි හෝ ඈවරකරු විසින් සමාගමේ මහා සභා රැස්වීමක් කැඳවනු ලැබිය යුතු අතර, පූර්ව වර්ෂය තුළ තම කටයුතු සහ ගණුදෙනු පිළිබඳව ගිණුමක් හා ගණන් බේරා වසා දැමීම පවත්වාගෙන යාම පිළිබඳව විස්තරයක් රැස්වීම ඉදිරියෙහි තැබිය යුතු ය.

(2) මේ වගන්තියේ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම ඈවරකරුවකු විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක, ඔහු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

අවසාන රැස්වීම හා විසුරුවා හැරීම.

**331**. (1) 332 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, සමාගමේ කටයුතු සම්පූර්ණයෙන් ගණන් බේරා වසා දැමීමෙන් පසු හැකි ඉක්මණින් ගණන් බේරා වසා දැමීම පවත්වන ලද ආකාරය සහ සමාගමේ දේපළ බැහැර කරනු ලැබූ ආකාරය දැක්වෙන, ගණන් බේරා වසා දැමීම පිළිබඳ විස්තරයක් ඈවරකරු විසින් සාදනු ලැබිය යුතු අතර, ඉන් පසු ඒ විස්තරය සමාගම ඉදිරියෙහි තැබීමේ සහ ඒ පිළිබඳව යම් පැහැදිලි කිරීමක් දීමේ කාර්යය සඳහා සමාගමේ මහා සභා රැස්වීමක් කැඳවනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් රැස්වීමේ දිනය, වේලාව, ස්ථානය සහ අරමුණ සඳහන් කෙරෙන දැන්වීමක්, ඒ දිනයට යටත් පිරිසෙයින් මාස එකකට පෙර ගැසට් පත්‍රයෙහි පළකිරීමෙන් ඒ රැස්වීම කැඳවනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් රැස්වීමෙන් පසු සතියක් ඇතුළත, ඈවරකරු විසින් විස්තරයේ පිටපතක් රෙජිස්ට්‍රාර්වරයා වෙත යවනු ලැබිය යුතු අතර, රැස්වීම පැවැත්වීම හා එහි දිනය පිළිබඳ වාර්තාවක් ද ඔහු වෙත යැවීම කරනු ලැබිය යුතු ය. තව ද, මේ උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව පිටපත නොයවනු ලැබූ හෝ වාර්තාව යැවීම නොකරනු ලැබූ හෝ අවස්ථාවක, ඈවරකරු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහස නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය :

එසේ වුව ද, රැස්වීමේ දී ගණපූරණයක් නොමැති අවස්ථාවක, ඈවරකරු විසින් ඉහතින් වූ විධිවිධානවල සඳහන් වාර්තාව වෙනුවට, රැස්වීම යථාපරිදි, කැඳවන ලද බවට සහ එහි දී ගණපූරණයක් නොවූ බවට වාර්තා කරනු ලැබිය යුතු ය. තව ද, එසේ වාර්තා කරනු ලැබූ විට, වාර්තා කිරීම සම්බන්ධයෙන් මේ උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව කටයුතු කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(4) විස්තරය සහ (3) වන උපවගන්තියේ සඳහන් වාර්තා අතුරෙන් කවර වූ හෝ වාර්තාවක් ලැබුණු විට, රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒවා නොපමාව ලියාපදිංචි කරනු ලැබිය යුතු අතර, වාර්තාව ලියාපදිංචි කිරීමේ දින සිට මාස තුනක් ඉකුත් වූ විට, සමාගම විසුරුවා හරින ලද ලෙස සලකනු ලැබිය යුතු ය :

එසේ වුව ද, ඇවරකරුගේ හෝ සම්බන්ධතාවක් ඇතැයි අධිකරණයට පෙනීයන වෙනත් යම් තැනැත්තකුගේ ඉල්ලීම මත සුදුසු යයි අධිකරණය විසින් අදහස් කරන කාලයට සමාගමේ විසුරුවා හැරීම ක්‍රියාත්මක වන දිනය කල් තබමින් අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(5) මේ වගන්තියේ විධිවිධාන යටතතේ ආඥාවක් කිරීමෙන් පසු දින හතක් ඇතුළත ඒ ආඥාවේ සහතික පිටපතක් ලියාපදිංචි කිරීම සඳහා රෙජිස්ට්‍රාර්වරයා වෙත භාරදීම, අධිකරණයේ ආඥාව කරනු ලබන්නේ යම් තැනැත්තකුගේ ඉල්ලීම මත ද ඒ තැනැත්තාගේ කාර්යය විය යුතු අතර, ඒ තැනැත්තා විසින් එසේ කිරීම පැහැර හරිනු ලබන අවස්ථාවක, ඔහු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට. රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(6) මේ වගන්තියේ විධිවිධාන මගින් නියම කරන ලද, සමාගමේ මහා සභා රැස්වීමක් කැඳවීම, ඇවරකරුවකු විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක, ඔහු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

වස්තු භංගත්වය සම්බන්ධයෙන් වන විට වාර්ෂික සහ අවසාන රැස්වීම් පිළිබඳ විකල්ප විධිවිධාන.

**332**. 329 වන වගන්තියේ විධිවිධාන බලාත්මක වන යම් අවස්ථාවක, ගණන් බේරා වසා දැමීම ණය හිමියන්ගේ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමක් ලෙස සහ කොටස් හිමියන්ගේ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමක් නොවන ලෙසට 330 වන සහ 331 වන වගන්තිවල විධිවිධාන බැහැර කරමින් 340 වන හා 341 වන වගන්තිවල විධිවිධාන ගණන් බේරා වසා දැමීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය :

එසේ වුව ද, ඒ වර්ෂය අවසානයට පෙර මාස තුනකට වැඩි කාලයක දී 329 වන වගන්තියේ විධිවිධාන යටතේ පවත්වන ලද රැස්වීම පවත්වන ලද්දේ නම් මිස, ගණන් බේරා වසා දැමීම ආරම්භවීමේ දින සිට පළමු වර්ෂය අවසානයේ දී 340 වන වගන්තියේ විධිවිධාන යටතේ ණය හිමියන්ගේ රැස්වීමක් කැඳවීමට ඇවරකරුට නියම කරනු නොලැබිය යුතු ය.

### ණය හිමියන්ගේ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමකට අදාළ විය යුතු විධිවිධාන

ණය හිමියකුගේ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමකට අදාළ විය යුතු විධිවිධාන.

**333**. 334 වන වගන්තියේ සිට 341 වන වගන්තිය දක්වා වූ වගන්තිවල (වගන්ති දෙකම ඇතුළුව) විධිවිධාන ණය හිමියකුගේ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමක් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

**334**. (1) ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම සඳහා යෝජනා සම්මතය යෝජනා කරනු ලබන රැස්වීම පවත්වනු ලබන දිනයෙහි හෝ එදිනට පසු දිනයෙහි සමාගමේ ණය හිමියන්ගේ රැස්වීමක් කැඳවීමට සමාගම විසින් කටයුතු සැලැස්විය යුතු අතර, සමාගමේ එකී රැස්වීම පිළිබඳ දැන්වීම් යවන විටම, ණය හිමියන්ගේ ඒ රැස්වීම පිළිබඳව ද දැන්වීම් ණය හිමියන් වෙත තැපැල් මගින් යැවීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය. ණය හිමියන්ගේ රැස්වීම.

(2) ණය හිමියන්ගේ රැස්වීම පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයෙහි ද සමාගමේ ලියාපදිංචි කාර්යාලය හෝ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පිහිටි දිස්ත්‍රික්කයෙහි සංසරණය වන යටත් පිරිසෙයින් දේශීය ප්‍රවෘත්ති පත්‍ර දෙකක ද පළ කිරීමට සමාගම විසින් කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(3) සමාගමේ අධ්‍යක්ෂවරයන් විසින්—

(අ) සමාගමේ ණය හිමියන් පිළිබඳ ලැයිස්තුවක් සහ ඔවුන්ගේ හිමිකම්පෑම්වල තක්සේරුකරන ලද මුදල් ප්‍රමාණය සමග සමාගමේ කටයුතුවල තත්ත්වය පිළිබඳ සම්පූර්ණ ප්‍රකාශයක් (1) වන උපවගන්තියේ සඳහන් පරිදි පවත්වනු ලැබිය යුතු ණය හිමියන්ගේ රැස්වීම ඉදිරියේ තැබීමට සලස්වනු ලැබිය යුතු ය; තව ද,

(ආ) ඔවුන්ගෙන් එක් අයකු ඒ රැස්වීමේ මූලාසනය ගැනීමට පත්කරනු ලැබිය යුතු ය.

(4) ණය හිමියන්ගේ රැස්වීමට පැමිණ එහි මූලාසනය ගැනීම ණය හිමියන්ගේ රැස්වීමේ දී මූලාසනය ගැනීමට පත්කරන ලද අධ්‍යක්ෂවරයාගේ කාර්යය විය යුතු ය.

(5) ගණන් බේරා වසා දැමීම සඳහා යෝජනා සම්මතය යෝජනා කරනු ලබන සමාගමේ රැස්වීම අඩාලව කල් තබනු ලැබ, අඩාලව කල්තබන ලද රැස්වීමක දී යෝජනා සම්මතය සම්මත කරනු ලැබූ අවස්ථාවක (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුව පවත්වන ලද ණය හිමියන්ගේ රැස්වීමේ දී සම්මත කරන ලද යම් යෝජනා සම්මතයක්, ගණන් බේරා වසා දැමීම සඳහා වූ යෝජනා සම්මතය වීමට ඉක්බිතිව ම, එය සම්මත කරනු ලැබූ ලෙස බල සහිත විය යුතු ය.

(6) (අ) (1) වන සහ (2) වන උපවගන්තිවල විධිවිධානවලට අනුකූලව කටයුතු කරමින් සමාගම විසින් ;

(ආ) (3) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව කටයුතු කරමින් සමාගමේ අධ්‍යක්ෂවරයන් විසින් ;

(ඇ) (4) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව කටයුතු කරමින් සමාගමේ යම් අධ්‍යක්ෂවරයකු විසින්,

පැහැර හැරීම කරනු ලැබ ඇති අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ සමාගම හෝ අධ්‍යක්ෂවරයා වරදකට වරදකරු වන අතර වරදකරු කරනු ලැබූ විට, රුපියල් දෙලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය. තව ද, සමාගම විසින් කරන ලද පැහැර හැරීමක් සම්බන්ධයෙන් සමාගමේ, පැහැර හැරීම කළ සෑම නිලධයරකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

ඈවරකරු පත්කිරීම.

**335**. සමාගමේ කටයුතු ගණන් බේරා වසා දැමීමේ හා වත්කම් බෙදාහැරීමේ කාර්යය සඳහා, 334 වන වගන්තියෙහි සඳහන් පිළිවෙලින් වූ යම් රැස්වීම්වල දී ණය හිමියන් සහ සමාගම විසින් ඈවරකරු වීමට තැනැත්තකු නම් කරනු ලැබිය හැකි අතර, ණය හිමියන් සහ සමාගම විසින් වෙනස් තැනැත්තන් නම් කරනු ලබන අවස්ථාවක, ණය හිමියන් විසින් පත් කරන ලද තැනැත්තා ඈවරකරු විය යුතු ය. තව ද, ණය හිමියන් විසින් කිසිම තැනැත්තකු නම් කරනු නොලැබූ අවස්ථාවක සමාගම විසින් නම් කරන ලද තැනැත්තකු වෙතොත්, ඒ තැනැත්තා ඈවරකරු විය යුතු ය :

එසේ වුව ද, වෙනස් තැනැත්තන් නම් කරනු ලබන අවස්ථාවක සමාගමේ යම් අධ්‍යක්ෂවරයකු, කොටස් හිමියකු හෝ ණය හිමියකු විසින්, ණය හිමියන් විසින් නම් කිරීම කරන ලද දින පටන් දින හතක් ඇතුළත ණය හිමියන් විසින් නම් කරන ලද තැනැත්තා වෙනුවට හෝ ඒ තැනැත්තා සමග හවුලේ, සමාගම විසින් ඈවරකරු වශයෙන් නම් කරන ලද තැනැත්තා ඈවරකරු විය යුතු බවට විධාන කෙරෙන නැතහොත් ණය හිමියන් විසින් පත්කරන ලද තැනැත්තා වෙනුවට ඈවරකරු වීමට වෙනත් යම් තැනැත්තකු පත් කරන ආඥාවක් සඳහා අධිකරණය වෙත ඉල්ලීමක් කළ හැකි ය.

පරීක්ෂණ කමිටුව පත්කිරීම.

**336**. (1) 334 වන වගන්තියේ විධිවිධානවලට අනුව පවත්වනු ලබන රැස්වීමේ දී හෝ යම් තදනන්තර රැස්වීමක දී ණය හිමියන් විසින් සුදුසු යයි සලකනු ලබන්නේ නම්, තැනැත්තන් පස් දෙනකුට

නොවැඩි සංඛ්‍යාවකගෙන් සමන්විත පරීක්ෂණ කමිටුවක් ඔවුන් විසින් පත්කරනු ලැබිය හැකි ය. තව ද, එවැනි කමිටුවක් පත්කරනු ලබන අවස්ථාවක, ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසාදැමීම සඳහා යෝජනාව සම්මත කරන ලද රැස්වීමේ දී හෝ තදනන්තරව යම් අවස්ථාවක මහා සභා රැස්වීමක දී සමාගම විසින් කමිටුවේ සාමාජිකයන් වශයෙන් ක්‍රියා කිරීමට සුදුසු යයි සලකන පස් දෙනකුට නොවැඩි තැනැත්තන් සංඛ්‍යාවක් පත්කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද, සුදුසු යයි ණය හිමියන් සලකනතාක්, සමාගම විසින් එසේ පත්කරන ලද සියලු තැනැත්තන් හෝ ඔවුන් අතුරෙන් යම් තැනැත්තකු පරීක්ෂණ කමිටුවේ සාමාජිකයන් නොවිය යුතු බවට යෝජනා සම්මත කරනු ලැබිය හැකි ය. ණය හිමියන් විසින් එසේ යෝජනා සම්මත කරනු ලබන අවස්ථාවක, අධිකරණය විසින් අන්‍යාකාරයෙන් විධාන කරනු ලැබුවහොත් මිස යෝජනා සම්මතයේ සඳහන් තැනැත්තන් කමිටුවේ සාමාජිකයන් වශයෙන් ක්‍රියා කිරීමට සුදුස්සන් විය යුතු අතර, මේ වගන්තියේ විධිවිධාන යටතේ අධිකරණය වෙත කරනු ලබන යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් සුදුසු යයි අධිකරණය සලකනොත්, යෝජනා සම්මතයේ සඳහන් තැනැත්තන් වෙනුවට, ඒ සාමාජිකයන් වශයෙන් ලියාපදිංචි කිරීමට වෙනත් තැනැත්තන් පත්කරනු ලැබිය හැකි ය.

(2) මේ පනත යටතේ සාදන ලද යම් රීතියක විධිවිධානවලට යටත්ව 300 වන වගන්තියේ විධිවිධාන ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන හැර, අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීමක දී පත්කරන ලද පරීක්ෂණ කමිටුවක් සම්බන්ධයෙන් අදාළවන ආකාරයෙන් මේ වගන්තියේ විධිවිධාන යටතේ පත්කරන ලද පරීක්ෂණ කමිටුවක් සම්බන්ධයෙන් ද අදාළ විය යුතු ය.

*ඈවරකරුවන්ගේ පාරිශ්‍රමික නියමකිරීම සහ අධ්‍යක්ෂවරයන්ගේ බලතල අවසන්වීම.*

**337**. (1) පරීක්ෂණ කමිටුව විසින් හෝ එවැනි කමිටුවක් නොමැති අවස්ථාවක, ණය හිමියන් විසින් හෝ ඈවරකරුට හෝ ඈවරකරුවන්ට ගෙවනු ලැබිය යුතු පාරිශ්‍රමිකය නියම කරනු ලැබිය හැකි ය.

(2) ඈවරකරුවකු පත්කරනු ලැබූ විට, පරීක්ෂණ කමිටුව විසින් හෝ එවැනි පරීක්ෂණ කමිටුවක් නොමැති විටෙක ණය හිමියන් විසින් හෝ අධ්‍යක්ෂවරයන්ගේ බලතල නොකඩවා ක්‍රියාත්මක කිරීමට අනුඥාව දෙනු ලබන තාක් දුරට හැර, අධ්‍යක්ෂවරයන්ගේ සියලු බලතල අවසන් විය යුතු ය.

ඇවරකරුගේ ධුරයෙහි පුරප්පාඩුව පිරවීමට ඇති බලය.

**338**. අධිකරණය විසින් හෝ අධිකරණයේ විධානයෙන් පත් කරන ලද ඇවරකරුවකු නොවන ඇවරකරුවකුගේ ධුරයෙහි, මරණය, ඉල්ලා අස්වීම නිසා හෝ අන්‍යාකාරයකින් පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවක, ණය හිමියන් විසින් පුරප්පාඩුව පුරවනු ලැබිය හැකි ය.

ණය හිමියන්ගේ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමක් සම්බන්ධයෙන් 328 වන වගන්තිය අදාළ කිරීම.

**339**. අධිකරණයේ හෝ පරීක්ෂණ කමිටුවේ හෝ අනුඥාව ඇතිව හැර 328 වන වගන්තිය යටතේ ඇවරකරුගේ බලතල ක්‍රියාත්මක කරනු නොලැබිය යුතු බවට කරන ලද සුළු වෙනස් කිරීම සහිතව සාමාජිකයන්ගේ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමක දී මෙන් ණය හිමියන්ගේ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමක දී ඒ වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

එක් එක් අවුරුද්ද අවසානයේ සමාගම් සහ ණය හිමියන්ගේ රැස්වීම් කැඳවීම ඇවරකරුගේ කාර්යය බව.

**340**. (1) එක් අවුරුද්දකට වඩා වැඩි කාලයක් ගණන් බේරා වසා දැමීම කරගෙන යනු ලබන අවස්ථාවක, ගණන් බේරා වසාදැමීම ආරම්භ කිරීමේ සිට පළමුවන අවුරුද්ද අවසානයේ දී සහ ඊලඟට එළඹෙන එක් එක් අවුරුද්ද අවසානයේ දී හෝ අවුරුද්ද අවසානයේ සිට මාස තුනක් ඇතුළත පළමු පහසු දිනයේ දී හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් අවකාශ දෙනු ලබන ඊට වැඩි කාල සීමාවක දී සමාගමේ මහා සභා රැස්වීමක් සහ ණය හිමියන්ගේ රැස්වීමක් ඇවරකරු විසින් කැඳවනු ලැබිය යුතු ය. තව ද ඉකුත් අවුරුද්ද තුළ ඔහුගේ ක්‍රියා සහ ගණුදෙනු පිළිබඳව ද ගණන් බේරා වසා දැමීම කරගෙන යාම පිළිබඳව ද විස්තරයක් ඒ රැස්වීම ඉදිරියෙහි තැබිය යුතු ය.

(2) මේ වගන්තියේ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම ඇවරකරු විසින් පැහැරහරිනු ලබන අවස්ථාවක, ඔහු වරදකට කරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත්විය යුතු ය.

අවසාන රැස්වීම සහ විසුරුවා හැරීම.

**341**. (1) සමාගමේ කටයුතු සම්පූර්ණයෙන් ගණන් බේරා වසා දමනු ලැබූ වහාම ඇවරකරු විසින් ගණන් බේරා වසා දැමීම කරන ලද ආකාරය සහ සමාගමේ දේපළ බැහැර කළ ආකාරය දැක්වෙන ගණන් බේරා වසා දැමීම පිළිබඳ විස්තරයක් සකස් කරනු ලැබිය යුතු අතර, ඉනික්බිතිව, විස්තරය රැස්වීම ඉදිරියේ තැබීමේ සහ ඒ පිළිබඳ යම් පැහැදිලි කිරීමක් කිරීමේ කාර්යය සඳහා සමාගමේ මහා සභා රැස්වීමක් සහ ණය හිමියන්ගේ රැස්වීමක් කැඳවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් සෑම රැස්වීමක් ම, රැස්වීමේ දිනය, වේලාව, ස්ථානය සහ එහි අරමුණ සඳහන් කරමින් ඒ දිනයට යටත් පිරිසෙයින් මාස එකකට පෙර ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දැන්වීමක් මගින් කැඳවනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් රැස්වීම් පවත්වන ලද දින පටන් හෝ එකම දිනයේ ඒ රැස්වීම් පවත්වනු නොලැබුවේ නම්, පසුව පවත්වන ලද රැස්වීමේ දින පටන් සතියක් ඇතුළත ඇවරකරු විසින් විස්තරයේ පිටපතක් රෙජිස්ට්‍රාර් වෙත යවනු ලැබිය යුතු අතර, පවත්වන ලද රැස්වීම් සහ ඒවායේ දින පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. තව ද මේ උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව පිටපත යවනු නොලැබූ හෝ වාර්තාව ඉදිරිපත් කරනු නොලැබූ අවස්ථාවක, ඇවරකරු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය :

එසේ වුව ද, ඒ රැස්වීම් දෙකෙන් එකකදීවත් ගණපූරණයක් ඇති නොවූ අවස්ථාවක, ඉහතින්ම වූ විධිවිධානවල සඳහන් වාර්තාව වෙනුවට, රැස්වීම විධිමත් ලෙස කැඳවනු ලැබූ බවත් එහි දී ගණපූරණයක් නොවූ බවත් සඳහන් වාර්තාවක් ඇවරකරු විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එවැනි වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබූ විට, ඒ රැස්වීම සම්බන්ධයෙන් වූ මේ උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව කටයුතු කරන ලද ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) රෙජිස්ට්‍රාර්වරයා විසින් විස්තරය සහ (1) වන උපවගන්තියේ සඳහන් එක් එක් රැස්වීම පිළිබඳව (3) වන උපවගන්තියේ සඳහන් වාර්තා දෙකෙන් එකක් ලැබුණු විට, ඒවා වහාම ලියාපදිංචි කරනු ලැබිය යුතු අතර, ඒවා ලියාපදිංචි කිරීමේ දින පටන් මාස තුනක් ඉකුත් වූ විට සමාගම විසුරුවා හරිනු ලැබූ ලෙස සැලකිය යුතු ය :

එසේ වුව ද, ඇවරකරු විසින් හෝ එයට සම්බන්ධතාවක් ඇති සේ අධිකරණයට පෙනී යන වෙන යම් තැනැත්තකු විසින් හෝ කරනු ලබන ඉල්ලීම මත සමාගමේ විසුරුවා හැරීම ක්‍රියාත්මක වන්නා වූ දිනය අධිකරණය යෝග්‍ය යයි සලකනු ලබන කාලයකින් කල් දැමීමට අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(5) මේ වගන්තියේ විධිවිධාන යටතේ අධිකරණ ආඥාවක් කරනු ලැබුවේ කවර තැනැත්තකුගේ ඉල්ලීමක් මත ද, ඒ තැනැත්තා විසින් ඒ ආඥාවේ සහතික කරන ලද පිටපතක්, ඒ ආඥාවේ දින සිට දින හතක් ඇතුළත ලියාපදිංචි කිරීම සඳහා රෙජිස්ට්‍රාර්වරයා වෙත භාර දෙනු ලැබිය යුතු අතර, එසේ කිරීම, ඒ තැනැත්තා විසින් පැහැරහරිනු ලබන අවස්ථාවක, ඔහු වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(6) මේ වගන්තියේ විධිවිධාන මගින් නියමකර ඇති පරිදි ඇවරකරුවකු විසින් සමාගමේ මහා සභා රැස්වීමක් හෝ ණය හිමියන්ගේ රැස්වීමක් කැඳවීම පැහැර හරිනු ලබන අවස්ථාවක ඔහු වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

## ස්වේච්ඡාවෙන් කරනු ලබන සෑම ගණන් බේරා වසා දැමීමකට ම අදාළ විය යුතු විධිවිධාන

ස්වේච්ඡාවෙන් කරනු ලබන සෑම ගණන් බේරා වසා දැමීමකට ම අදාළ විධිවිධාන.

**342**. කොටස් හිමියන්ගේ හෝ ණය හිමියන්ගේ වුව ද, ස්වේච්ඡාවෙන් කරනු ලබන සෑම ගණන් බේරා වසා දැමීමකට ම 343 වන වගන්තියේ සිට 350 වන වගන්තිය දක්වා වූ ( ඒ වගන්ති දෙක ද ඇතුළුව) වගන්තිවල විධිවිධාන අදාළ විය යුතු ය.

සමාගමේ දේපළ බෙදා හැරීම.

**343**. වරණීය ගෙවීම් පිළිබඳව, මේ පනතේ විධිවිධානවලට යටත්ව, සමාගමක් ගණන් බේරා වසා දමනු ලබන කල්හි, එහි බැරකම් විශේෂයක් නොමැතිව ගෙවා නිදහස් කිරීමෙහි ලා එහි දේපළ යොදා ගත යුතු අතර, එසේ යොදා ගැනීමට යටත්ව, ව්‍යවස්ථාවලියෙන් අන්‍යාකාර විධිවිධාන සලස්වනු ලැබුවහොත් මිස, සමාගමේ කොටස් හිමියන්ගේ අයිතිවාසිකම් හා සම්බන්ධතා අනුව ඒ දේපළ ඔවුන් අතර බෙදා හැරිය යුතු ය.

ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමක දී ඇවරකරු සතු බලතල හා යුතුකම්.

**344**. (1) ඇවරකරු විසින්—

(අ) කොටස් හිමියන්ගේ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමක් සම්බන්ධයෙන් වන විට, සමාගමේ විශේෂ යෝජනා සම්මතයක අනුඥාව ඇතිව සහ ණය හිමියන්ගේ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමක් සම්බන්ධයෙන් වන විට, අධිකරණයේ හෝ පරීක්ෂණ කමිටුවේ අනුඥාව ඇතිව ද (එවැනි කමිටුවක් නොමැති නම්) ණය හිමියන්ගේ රැස්වීමක අනුඥාව ඇතිව ද 292 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ), (ඉ) සහ (ඊ) ඡේදවල විධිවිධානවල සඳහන්, අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීමක දී ඇවරකරුවකුගේ බලතල අතුරින් කිසිවක් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය;

(ආ) (අ) ඡේදයේ සඳහන් බලතල හැර, අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීමක දී මේ පනතින් ඇවරකරු වෙත දෙනු ලබන යම් බලයක් අනුඥාව නොමැතිව ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය;

(ඇ) මේ පනතේ විධිවිධාන යටතේ සහදායකයින්ගේ ලැයිස්තුවක් බේරුම් කිරීමෙහි ලා අධිකරණය සතු බලය ක්‍රියාත්මක කළ හැකි අතර, සහදායකයින්ගේ ලැයිස්තුව, ආධාරකරුවන් ලෙස එහි නම් කරනු ලැබූ තැනැත්තන්ගේ බැඳීමට බැලූ බැල්මට පිළිගතහැකි සාක්ෂියක් විය යුතු ය;

(ඈ) ඇරයුම් කිරීමෙහි ලා අධිකරණය සතු බලය ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය;

(ඉ) විශේෂ යෝජනා සම්මතයක් මගින් සමාගමේ අනුඥාව ලබාගැනීමේ කාර්යය සඳහා හෝ සුදුසු යයි ඈවරකරු සිතන වෙන යම් කාර්යයක් සඳහා සමාගමේ මහා සභා රැස්වීම් කැඳවනු ලැබිය හැකි ය.

(2) ඈවරකරු විසින් සමාගමේ ණය ගෙවනු ලැබිය යුතු අතර, ආධාරකරුවන්ගේ අයිතිවාසිකම් ඔවුනොවුන් අතර යථාවත් කිරීම ද කරනු ලැබිය යුතු ය.

(3) ඈවරකරුවන් කීප දෙනකු පත්කරනු ලැබූ විටක, ඔවුන් පත්කරනු ලැබූ අවස්ථාවේ දී නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ඔවුන් අතුරෙන් එක් කෙනකු හෝ වැඩි දෙනකු විසින්, නැතහොත්, එවැනි නිශ්චිත සඳහන් කිරීමක් නොවූ විට, දෙදෙනකුට අඩු නොවන යම් සංඛ්‍යාවක් විසින්, මේ පනතින් දෙන ලද යම් බලයක් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමේ දී ඈවරකරු පත් කිරීමට හා ඉවත් කිරීමට අධිකරණය සතු බලය.

**345**. (1) කවරාකාර වූ හෝ යම් හේතුවක් නිසා ඈවරකරුවකු ක්‍රියාකාරීව නොමැති අවස්ථාවක, අධිකරණය විසින් ඈවරකරුවකු පත්කරනු ලැබිය හැකි ය.

(2) හේතු දක්වනු ලැබූ විට, ඈවරකරුවකු ඉවත් කිරීම සහ වෙනත් ඈවරකරුවකු පත්කිරීම අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.

ඈවරකරු විසින් තම පත්වීම පිළිබඳව කරනු ලබන දැන්වීම.

**346**. (1) මේ පනතේ කවර හෝ විධිවිධානයක් යටතේ පත්කරන ලද ඈවරකරුවකු විසින්, තම පත්වීම පිළිබඳව නියමිත ආකෘතියෙහි වූ දැන්වීමක් තම පත්වීම් දිනයේ සිට දින දාහතරක් ඇතුළත ගැසට් පත්‍රයෙහි පළකර එය ලියාපදිංචි කිරීම සඳහා රෙජිස්ට්‍රාර්වරයා වෙත භාරදිය යුතු ය.

(2) ඈවරකරු විසින් (1) වන උපවගන්තියේ නියමවලට අනුකූලව ක්‍රියාකිරීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක, ඔහු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

වැඩ පිළිවෙලක් ණය හිමියන් කෙරෙහි අනුගම්‍යවන අවස්ථා.

**347**. (1) ගණන් බේරා වසා දැමීමට ආසන්න වූ හෝ ගණන් බේරා වසා දමනු ලබන්නා වූ සමාගමක් හා එහි ණය හිමියන් අතර ඇති කරගත් යම් වැඩ පිළිවෙලක්, මේ වගන්තියේ විධිවිධාන යටතේ අභියාචනය කිරීමේ අයිතියට යටත්ව, විශේෂ යෝජනා සම්මතයක් මගින් සම්මත කරනු ලැබූ අවස්ථාවක, සමාගම කෙරෙහි ද ණය හිමියන්ගේ සංඛ්‍යාව හා වටිනාකම අනුව ඒ ණය හිමියන් අතුරෙන් හතරෙන් තුනක් එකඟ වුවහොත්, ණය හිමියන් කෙරෙහි ද අනුගම්‍ය විය යුතු ය.

(2) වැඩ පිළිවෙලක් සම්පූර්ණ කළ දින සිට සති තුනක් ඇතුළත යම් ණය හිමියකු හෝ සහදායකයකු විසින් ඒ වැඩ පිළිවෙලට විරුද්ධව අධිකරණය වෙත අභියාචනයක් කරනු ලැබිය හැකි අතර, එවිට සාධාරණ යයි අධිකරණය අදහස් කරන ආකාරයකින් වැඩ පිළිවෙල සංශෝධනය කිරීම වෙනස් කිරීම හෝ ස්ථිර කිරීම අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.

ප්‍රශ්න නිශ්චය කරගැනීම හෝ බලතල ක්‍රියාත්මක කරවීම සඳහා අධිකරණය වෙත ඉල්ලුම් කිරීමේ බලය.

**348**. (1) සමාගමක් ගණන් බේරා වසා දැමීමේ දී උද්ගතවන යම් ප්‍රශ්නයක් නිශ්චය කරන ලෙස හෝ ඇරයුම් බලාත්මක කිරීම හෝ වෙනත් යම් කාරණයක් සම්බන්ධයෙන්, සමාගම අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීමට සිදුවුවහොත්, එවිට, අධිකරණය විසින් ක්‍රියාත්මක කළ හැකි සියලු බලතල හෝ බලතල කිසිවක් හෝ ක්‍රියාත්මක කරන ලෙස ඈවරකරු විසින් හෝ යම් සහදායකයකු විසින් හෝ ණයහිමියකු විසින් හෝ අධිකරණය වෙත ඉල්ලීමක් කළ හැකි ය.

(2) ප්‍රශ්නය නිශ්චය කිරීම හෝ ඉල්ලුම් කරනු ලැබූ බලය ක්‍රියාත්මක කිරීම සාධාරණ හා හිතකර බවට අධිකරණය සෑහීමට පත්වුවහොත් සුදුසු යයි අධිකරණය අදහස් කරන නියම හා කොන්දේසි මත මුළුමණින්ම හෝ අඩ වශයෙන් ඉල්ලීමට එකඟවිය හැකි ය. නැතහොත්, ඉල්ලීම සම්බන්ධයෙන් සාධාරණ යයි අදහස් කරන වෙනත් යම් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(3) ගණන් බේරා වසා දැමීමේ නඩු කටයුතු නතර කරමින් (2) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර කරන ලද ආඥාවක පිටපතක් සමාගම විසින් හෝ අන්‍යාකාරයකින් නියමකරනු ලැබිය හැකි යම් වෙනත් ක්‍රමයකින් හෝ නොපමාව රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, රෙජිස්ට්‍රාර්වරයා විසින් සමාගම සම්බන්ධයෙන් වූ තම පොත්වල, ආඥාව පිළිබඳ වූ සටහනක් කරනු ලැබිය යුතු ය.

ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමේ පිරිවැය.

**349**. ඈවරකරුගේ පාරිශ්‍රමිකය ඇතුළුව, ගණන් බේරා වසා දැමීමේ දී නිසිපරිදි දරනු ලැබූ සියලු පිරිවැය, ගාස්තු හා වියදම් වෙනත් සියලු හිමිකම් පෑම් අභිබවා සමාගමේ වත්කම්වලින් ගෙවනු ලැබිය යුතු ය.

**350**. සමාගමක් ගණන් බේරා වසා දැමීම, ඒ සමාගම අධිකරණය ලවා ගණන් බේරා වසා දැමීම සඳහා යම් ණය හිමියකු හෝ සහදායකයකු සතුව ඇති අයිතිවාසිකමට බාධාවක් නොවිය යුතු ය. එහෙත් ගණන් බේරා වසා දැමීම සඳහා ඉල්ලීම සහදායකයකු විසින් කරනු ලැබූ විටක, සහදායකයින්ගේ අයිතිවාසිකම්වලට, ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමක් හානිකර වනු ඇතැයි අධිකරණය සෑහීමට පත්විය යුතු ය. ණය හිමියන්ගේ හා සහදායකයින්ගේ අයිතිවාසිකම්වලට ඉඩ තැබීම.

## (IV) අධිකරණයේ අධීක්ෂණයට යටත්ව ගණන් බේරා වසා දැමීම

**351**. ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම සඳහා සමාගමක් විසින් යෝජනා සම්මතයක් සම්මත කරගනු ලැබූ විට ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම අධිකරණයේ යම් අධීක්ෂණයකට යටත්ව සහ ණය හිමියන්ට, සහදායකයින්ට හෝ වෙනත් තැනැත්තන්ට අධිකරණය වෙත ඉල්ලුම් කිරීමේ යම් නිදහසක් ඇතිව සාමාන්‍යයෙන් සාධාරණ යයි අධිකරණය විසින් සලකනු ලබන යම් නියම හා කොන්දේසි මත කරගෙන යා යුතු යයි අධිකරණය විසින් ආඥාවක් කළ හැකි ය. අධීක්ෂණයට යටත්ව ගණන් බේරා වසා දමන ලෙස ආඥා කිරීමේ බලය.

**352**. ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමක් අධිකරණයේ අධීක්ෂණයට යටත්ව නොකඩවා කරගෙන යාම සඳහා වූ පෙත්සමක්, ඒ කටයුතු පිළිබඳව අධිකරණය වෙත අධිකරණ බලය පැවරීමේ කාර්යය සඳහා අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම සඳහා වූ පෙත්සමක් ලෙස සලකනු ලැබිය යුතු ය. අධික්ෂණයට යටත් වූ ගණන් බේරා වසා දැමීම සඳහා වූ පෙත්සමේ ප්‍රතිඵලය.

**353**. අධිකරණයේ අධීක්ෂණයට යටත්ව, කරනු ලබන ගණන් බේරා වසා දැමීමක් 275 වන හා 276 වන වගන්තිවල කාර්යය සඳහා අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීමක් ලෙස සලකනු ලැබිය යුතු ය. අධීක්ෂණයට යටත්ව කරනු ලබන ගණන් බේරා වසා දැමීමකට 275 වන සහ276 වන වගන්ති අදාළ කිරීම.

**354**. (1) අධීක්ෂණයට යටත්ව, ගණන් බේරා වසා දැමීමක් සඳහා අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබූ අවස්ථාවක, අධිකරණය විසින්, ඒ ආඥාව මගින් හෝ තදනන්තරව කරනු ලබන යම් ආඥාවක් මගින් හෝ අතිරේක ඈවරකරුවකු පත් කළ හැකි ය. ඈවරකරුවන් පත්කිරීමට හෝ අස්කිරීමට අධිකරණය සතු බලය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ අධිකරණය විසින් පත්කරනු ලැබූ ඈවරකරුවකුට ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමක දී ඈවරකරුවන් පත්කිරීම සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධානවලට

අනුකූලව යථා පරිදි පත්කරනු ලැබූ ලෙස, ඒ බලතලම තිබිය යුතු අතර, ඒ බැඳීම්වලටම ඔහු යටත් විය යුතු ය. තව ද, සියලු ආකාරයෙන් ම ඒ තත්ත්වයෙන් ම සිටිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ පත්කරනු ලැබූ යම් ඈවරකරුවකු හෝ අධිකරණයේ අධීක්ෂණය යටතේ නොකඩවා කරගෙන යනු ලබන ගණන් බේරා වසා දැමීමක දී සිටින යම් ඈවරකරුවකු අධිකරණය විසින් අස්කරනු ලැබිය හැකි අතර, ඒ අස්කිරීම හේතුවෙන් හෝ යම් ඈවරකරුවකුගේ මරණය හෝ ඉල්ලා අස්වීම හේතුවෙන් ඇති වූ යම් පුරප්පාඩුවක් පිරවිය හැකි ය.

අධීක්ෂණ ආඥාවේ ප්‍රතිඵලය.

**355**. (1) අධීක්ෂණයට යටත්ව ගණන් බේරා වසා දැමීමක් සඳහා 351 වන වගන්තියේ විධිවිධාන යටතේ ආඥාවක් කරනු ලැබූ අවස්ථාවක අධිකරණය විසින් පනවනු ලබන සීමා කිසිවකට යටත්ව, ඈවරකරු විසින්, තමාගේ සියලු බලතල, සමාගම ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දමනු ලැබූ විටක මෙන් අධිකරණයේ අනුඥාව හෝ මැදිහත්වීම නොමැතිව ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය :

එසේ වුවද, 292 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඈ), (ඉ) සහ (ඊ) ඡේදයන්හි විධිවිධානවල සඳහන් බලතල, අධිකරණයේ අනුඥාව නොමැතිව හෝ, ගණන් බේරා වසා දැමීම ආඥාවට පෙරාතුව ණය හිමියන් විසින් ස්වේච්ඡාවෙන් කරනු ලබන අවස්ථාවක නම් අධිකරණයේ හෝ පරීක්ෂණ කමිටුවේ හෝ එබඳු කමිටුවක් නොමැති විටක ණය හිමියන්ගේ රැස්වීමක අනුඥාව නොමැතිව, ඈවරකරු විසින් ක්‍රියාත්මක කරනු නොලැබිය යුතු ය.

(2) මේ පනතේ අටවන උපලේඛනයෙහි දැක්වෙන මේ පනතේ විධිවිධානවල කාර්යය සඳහා අධිකරණයේ අධීක්ෂණයට යටත්ව, කරනු ලබන ගණන් බේරා වසා දැමීමක්, අධිකරණය විසින් කරනු ලබන ගණන් බේරා වසා දැමීමක් නොවිය යුතු ය. එහෙත්, ඉහත කී දෙයට යටත්ව, අධීක්ෂණයට යටත්ව, කරනු ලබන ගණන් බේරා වසා දැමීමක් සම්බන්ධයෙන් වූ ආඥාවක්, අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම සඳහා වූ ආඥාවක් ලෙස සියලු කාර්යය සඳහා සැලකිය යුතු ය:

එසේ වුව ද, අධීක්ෂණයට යටත්ව, ගණන් බේරා වසා දැමීම සඳහා වූ ආඥාව, පරීක්ෂණ කමිටුවක් පත් කරනු ලැබ ඇත්තා වූ ණය හිමියන්ගේ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමකට අදාළ වන්නා වූ අවස්ථාවක, ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමක දී මේ පනත යටතේ සාදන ලද රීති මගින් 300 වන වගන්තියේ විධිවිධාන ක්‍රියාවේ යෙදවීම බැහැර

කරනු ලබන තාක් දුරට හා එහි (1) වන උපවගන්තියේ විධිවිධාන ද හැර, ඒ වගන්තියේ කාර්යය සඳහා අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම සඳහා කරනු ලැබූ ආඥාවක් ලෙස සැලකිය යුතු ය.

### හිමිකම් පෑම් ඔප්පු කිරීම හා වර්ග කිරීම.

**356**. වර්තමාන හෝ අනාගත, නිශ්චිත හෝ සම්භාව්‍ය ණයක් හෝ බැරකමක්, එය නිශ්චය කොට දැනගත් ණයක් හෝ බැරකමක් නැතහොත්, අලාභ සම්බන්ධයෙන් වූ බැරකමක් හෝ වේවා, ඈවර කිරීමට යටත් වූ සමාගමකට විරුද්ධ හිමිකම් පෑමක් ලෙස පිළිගනු ලැබිය හැකි ය. පිළිගතහැකි හිමිකම් පෑම්.

**357**. (1) ගණන් බේරා වසා දැමීමක දී සමාගමකට විරුද්ධව සුරක්ෂිත නොවූ ණය හිමියන් විසින් කරනු ලබන හිමිකම් පෑමක් නියමිත ආකෘතියෙහි කරනු ලැබිය යුතු අතර— සුරක්ෂිත නොවූ ණය හිමියන් විසින් කරනු ලබන හිමිකම් පෑම්.

(අ) හිමිකම් පෑමේ සම්පූර්ණ විස්තර එහි ඇතුළත් විය යුතු ය; තව ද

(ආ) හිමිකම් පෑම් සනාථ කෙරෙන, නැතහොත් තහවුරු කෙරෙන ලේඛන කිසිවක් සම්බන්ධයෙන් සඳහනක් තිබිය යුතු ය.

(2) ඈවරකරුවකු විසින්—

(අ) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයෙහි සඳහන් ලේඛනයක් ඉදිරිපත්කිරීමට නියම කරනු ලැබිය හැකි ය; තව ද

(ආ) හිමිකම්පෑමක් දිවුරුම් පත්‍රයක් මගින් සත්‍යායනය කළ යුතු යයි නියම කරනු ලැබිය හැකි ය.

(3) ඈවරකරුවකු විසින් හැකිතාක් ඉක්මනින් හිමිකම් පෑමක් සම්පූර්ණයෙන් හෝ අඩ වශයෙන් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම කරනු ලැබිය යුතු ය. හිමිකම් පෑමක් සම්පූර්ණයෙන් හෝ අඩ වශයෙන් වැරදි ලෙස පිළිගනු ලැබ හෝ ප්‍රතික්ෂේප කරනු ලැබ ඇතැයි ඈවරකරු තදනන්තරව සලකතොත්, ඔහු විසින් ඒ තීරණය ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ සංශෝධනය කිරීම, කරනු ලැබිය හැකි ය.

(4) ඈවරකරුවකු විසින් හිමිකම් පෑමක් සම්පූර්ණ වශයෙන් හෝ අඩ වශයෙන් ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත්, ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව ඔහු විසින් වහාම ණය හිමියා වෙත දැනුම් දිය යුතු යි.

(5) (1) වන උපවගන්තිය යටතේ හිමිකම් පෑමක් කිරීමේ හෝ (2) වන උපවගන්තිය යටතේ ලේඛනයක් ඉදිරිපත් කිරීමේ වියදම්, හිමිකම් පෑම කරනු ලබන ණය හිමියා විසින් දැරිය යුතු ය.

(6) (අ) මේ වගන්තිය යටතේ යම් වැදගත් කරුණක දී ව්‍යාජ හෝ නොමග යවන සුළු බව හෝ දැන දැනම, ව්‍යාජ හෝ නොමග යවන සුළු හිමිකම් පෑමක් කරන හෝ කිරීමට බලය දෙන ; හෝ

(ආ) යම් වැදගත් කරුණක් අතහැරීම මගින් හිමිකම් පෑම ව්‍යාජ බවට පත් කෙරෙන හෝ නොමග යවන සුළු බවට පත් කෙරෙන බව දැන දැනම මේ වගන්තිය යටතේ වූ හිමකම් පෑමකින් යම් කරුණක් අතහරින හෝ අතහැරීමට බලය දෙන,

සෑම තැනැත්තකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් දසලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු පහක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

සුරක්ෂිත ණය හිමියන්ගේ අයිතිවාසිකම් හා කාර්යය.

**358**. (1) සුරක්ෂිත ණය හිමියකු විසින්—

(අ) සෘණ භාරයට යටත් වූ දේපළක් තහනමට ගැනීමේ, තහනමට ගෙන මුදල් කිරීමේ හා ඒ දේපළ විෂයෙහි ලා ක්‍රියාවේ යෙදවීමේ අඥාවක් නිකුත් කිරීමේ හෝ දේපළ භාරගන්නකු පත් කිරීමේ හිමිකම් ලබා ඇත්නම් එසේ කරනු ලැබිය හැකි ය ; නැතහොත්,

(ආ) සෘණ භාරයට යටත් වූ දේපළ තක්සේරු කරනු ලැබිය හැකි අතර,

(i) තම හිමිකම් පෑමේ මුදල වෙනුවෙන් සුරක්ෂිත ණය හිමියකු වශයෙන් ඇපයේ වටිනාකම දක්වා ; සහ

(ii) අයවිය යුතු ශේෂයක් වේනොත්, ඒ වෙනුවෙන්, සුරක්ෂිත නොවූ ණය හිමියකු වශයෙන්,

ඈවරකිරීමේ දී හිමිකම් පෑ හැකි ය ; නැතහොත්,

(ඇ) ණය හිමියන්ගේ පොදු යහපත උදෙසා සෘණ භාරය ඈවරකරු වෙත පවාරණය කිරීම සහ මුළු ණය වෙනුවෙන් සුරක්ෂිත නොවූ ණය හිමියකු වශයෙන් ඈවරකිරීමේ දී හිමිකම් පෑම කරනු ලැබිය හැකි ය.

(2) සුරක්ෂිත ණය හිමියකු විසින් (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් බලය ක්‍රියාත්මක කරනු ලැබුව ද, නොලැබුව ද සුරක්ෂිත ණය හිමියා විසින් (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් බලය ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(3) සෘණ භාරයට යටත් දේපළක් මුදල් කරගන්නා ඇප ලත් ණය හිමියකු විසින්—

(අ) මුදල් කරනු ලැබූ ශුද්ධ මුදල් ප්‍රමාණය අඩු කිරීමෙන් පසුව අයවිය යුතු යම් ශේෂයක් වෙනුවෙන් සුරක්ෂිත නොවූ ණය හිමියකු වශයෙන් හිමකම් පෑමක් කරනු ලැබිය හැකි ය ;

(ආ) ණය පියවීමෙන් පසුව එය පියවනු ලැබූ අවස්ථාව දක්වා ඒ ණය සම්බන්ධයෙන් ගෙවිය යුතු පොළිය ද ඇතුළුව සහ සෘණ භාරයට යටත් වූ දේපළ සම්බන්ධයෙන් වෙනත් යම් සෘණ භාරයත් දරන්නා වෙත නිසි ගෙවීම් කිරීමෙන් පසුව ණය පියවීමෙන් පසු මුදල් කරගත් ශුද්ධ මුදල් ප්‍රමාණයෙන් ශේෂ වූ යම් අතිරික්තයක් සම්බන්ධයෙන් ඈවරකරු වෙත විස්තර කරනු ලැබිය යුතු ය.

(4) සුරක්ෂිත ණය හිමියකු විසින් ඇපය තක්සේරු කරනු ලැබ, සුරක්ෂිත ණය හිමියකු වශයෙන් හිමිකම් පෑමක් කරන්නේ නම්, තක්සේරුව හා හිමිකම් පෑම නියමිත ආකෘතියෙහි කරනු ලැබිය යුතු අතර, එහි—

(අ) තක්සේරුව හා හිමිකම් පෑම පිළිබඳ සම්පූර්ණ විස්තර ඇතුළත් විය යුතු ය ;

(ආ) සෘණ භාරය දෙන ලද දිනය ද ඇතුළුව ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර ඇතුළත් විය යුතු ය ; තව ද,

(ඇ) හිමිකම් පෑම හා සෘණ භාරය තහවුරු කෙරෙන ලේඛන කිසිවක් සඳහන් කළ යුතු ය,

තවද, සුරක්ෂිත ණය හිමියකු වශයෙන් කරනු ලබන යම් හිමිකම් පෑමකට 359 වන, 360 වන සහ 362 වන වගන්තිවල විධිවිධාන අදාළ විය යුතු ය.

(5) ඈවරකරුවකු විසින්—

(අ) (4) වන උපවගනතියේ (ඇ) ඡේදයෙහි සඳහන් යම් ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබිය හැකි ය ; තව ද

(ආ) (4) වන උපවගන්තිය යටතේ වූ හිමිකම් පෑමක් දිවුරුම් පත්‍රයක් මගින් සත්‍යායනය කළ යුතු යයි නියම කරනු ලැබිය හැකි ය.

(6) (4) වන උපවගන්තිය යටතේ ණය හිමියකු විසින් හිමිකම් පෑමක් කරනු ලැබ ඇති අවස්ථාවක, ඈවරකරු විසින්—

(අ) තක්සේරුව හා හිමිකම්පෑම පිළිගනු ලැබිය යුතු ය ; නැතහොත්

(ආ) තක්සේරුව හා හිමිකම් පෑම සම්පූර්ණයෙන් හෝ අඩ වශයෙන් ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය ; එහෙත්—

(i) තක්සේරුවක් සහ ණය හිමිකම් පෑමක් සම්පූර්ණයෙන් හෝ අඩ වශයෙන් ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක, ණය හිමියා විසින්, ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම ලැබීමෙන් වැඩ කරන දින දහයක් ඇතුළත ප්‍රතිශෝධිත තක්සේරුවක් හා හිමිකම් පෑමක් කරනු ලැබිය යුතු ය ; තව ද

(ii) තක්සේරුවක් හා හිමිකම් පෑමක් සම්පූර්ණයෙන් හෝ අඩ වශයෙන් වැරදි ලෙස ප්‍රතික්ෂේප කරනු ලැබ ඇතැයි ඈවරකරු තදනන්තරව සලකන්නේ නම් ඔහු විසින් එම තීරණය ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ සංශෝධනය කිරීම, කරනු ලැබිය හැකි ය.

(7) ඈවරකරු විසින්—

(අ) (6) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ තක්සේරුවක් හා හිමිකම් පෑමක් පිළිගනු ලැබූ ;

(ආ) (6) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (1) වන අනුඡේදය යටතේ ප්‍රතිශෝධිත තක්සේරුවක් හා හිමිකම් පෑමක් පිළිගනු ලැබූ ; හෝ

(ඇ) (6) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (II) වන අනුඡේදය යටතේ, හිමිකම් පෑමක් ප්‍රතික්ෂේප කිරීමේ තීරණයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ දී හෝ සංශෝධනය කිරීමේ දී තක්සේරුවක් හා හිමිකම් පෑමක් පිළිගනු ලැබූ,

අවස්ථාවක සුරක්ෂිත ණය හිමියා විසින් දේපළ උපලබ්ධි කරනු ලැබ ඇත්නම් මිස, හිමිකම් පෑමේ හෝ තක්සේරු කරන ලද වටිනාකමේ මුදල් ප්‍රමාණය යන දෙකෙන් වඩා අඩු මුදල් ප්‍රමාණය ගෙවනු ලැබූ විට ඈවරකරු විසින් ඇපය මුදාහරිනු ලැබිය යුතු ය.

(8) ඇවරකරු විසින්, යම් අවස්ථාවක දී ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, දැන්වීම ලැබීමෙන් පසු වැඩකරන දින විස්සක් ඇතුළත,—

(අ) (1) වන උපවගන්තියේ සඳහන් බලතල අතුරෙන් ණය හිමියා විසින් ක්‍රියාත්මක කිරීමට කැමති බලතල කවරේදැයි තෝරා ගන්නා ලෙස ; සහ

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයෙහි හෝ (ඇ) ඡේදයෙහි සඳහන් බලය ක්‍රියාත්මක කිරීමට ණය හිමියා තෝරාගන්නේ නම්, ඒ කාලය ඇතුළත බලය ක්‍රියාත්මක කරන ලෙස,

සුරක්ෂිත ණය හිමියකුට නියම කරනු ලැබිය හැකි ය.

(9) (8) වන උපවගන්තිය යටතේ දැන්වීම භාර දෙනු ලැබුවා වූ සහ දැන්වීමට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබුවා වූ ද සුරක්ෂිත ණයහිමියකු විසින් ණයහිමියන්ගේ පොදු යහපත සඳහා (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ සෘණ භාරය ඇවරකරු වෙත පවාරණය කරන ලද ලෙස සැලකිය යුතු අතර, මුළු ණය සඳහා සුරක්ෂිත නොවූ ණයහිමියකු වශයෙන් ඇවර කිරීමේ දී හිමිකම් පෑම කරනු ලැබිය හැකි ය.

(10) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ සෘණ භාරයක් පවාරණය කරනු ලැබූ හෝ (9) වන උපවගන්තිය යටතේ සෘණ භාරයක් පවාරණය කරන ලදැයි සලකනු ලැබුවා වූ හෝ සුරක්ෂිත ණයහිමියකු විසින් අධිකරණයේ හෝ ඇවරකරුගේ අවසරය ඇතිව, අධිකරණය හෝ ඇවරකරු සුදුසු යයි සලකන යම් නියම හා කොන්දේසිවලට යටත්ව සෘණ භාරයක් ඇති දේපළ ඇවරකරු විසින් උපලබ්ධි කිරීමට පෙරාතුව යම් අවස්ථාවක —

(අ) පවාරණය ඉල්ලා අස්කරගෙන, සෘණ භාරය මත විශ්වාසය තැබිය හැකි ය ; හෝ

(ආ) මේ වගන්තිය යටතේ අලුත් හිමිකම් පෑමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(11) (අ) (4) වන උපවගන්තිය යටතේ යම් වැදගත් කරුණක දී ව්‍යාජ හෝ නොමග යවන සුළු බව හෝ දැන දැනම, ව්‍යාජ හෝ නොමග යවන සුළු හිමිකම්පෑමක් කරන හෝ කිරීමට බලය දෙන ; හෝ

(ආ) (4) වන උපවගන්තිය යටතේ යම් වැදගත් කරුණක් අතහැරීම මගින් හිමිකම්පෑම ව්‍යාජ බවට පත් කෙරෙන හෝ නොමග යවන සුළු බවට පත් කෙරෙන බව දැන දැනම ඒ උපවගන්තිය යටතේ වූ හිමිකම්පෑමකින් යම් කරුණක් අතහරින හෝ අතහැරීමට බලය දෙන,

සෑම තැනැත්තකු ම, වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් දස ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු පහකට නොවැඩි කාලයක් බන්ධනාගාරගත කිරීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

හිමිකම් පෑමේ මුදල් ප්‍රමාණය නිශ්චය කොට දැනගැනීම.

**359**. (1) හිමිකම් පෑමක මුදල් ප්‍රමාණය, සමාගම ගණන් බේරා වසා දැමීම ආරම්භ වූ දිනයේ තිබූ ආකාරයෙන් නිශ්චය කොට දැන ගත යුතු ය.

(2) ශ්‍රී ලංකා ව්‍යවහාර මුදල් නොවන ව්‍යවහාර මුදලකින් නාමිත ණයක් හෝ බැරකමක් මත පදනම් වූ හිමිකම් පෑමක මුදල් ප්‍රමාණය, ගණන් බේරා වසා දැමීම ආරම්භ වීමේ දින අවසානයේ දී අදාළ වන විනිමය අනුපාතිකය අනුව ශ්‍රී ලංකා ව්‍යවහාර මුදල්වලට පරිවර්තනය කරනු ලැබිය යුතු ය.

නිශ්චය කොට දැනගත් මුදල් ප්‍රමාණයක් නොවන හිමිකම්පෑම.

**360**. (1) හිමිකම්පෑම සම්භාව්‍යතාවකට යටත් නම් හෝ අලාභ සඳහා වූ හෝ වෙනත් යම් හේතුවක් නිසා හිමිකම්පෑමේ මුදල නිශ්චිත නොවේ නම් හෝ, ඈවරකරු විසින් හිමිකම්පෑමේ මුදල් ප්‍රමාණය පිළිබඳව ඇස්තමේන්තුවක් සකස් කර ඒ ඇස්තමේන්තුව පිළිබඳ දැනුම් දීමක් ණය හිමියා වෙත කරනු ලැබිය යුතු ය.

(2) ඈවරකරු විසින් සාදන ලද ඇස්තමේන්තුවකින් අතෘප්තියට පත් හිමිකම් පාන්නකුගේ ඉල්ලීම මත, හිමිකම් පෑමේ මුදල් ප්‍රමාණය අධිකරණය විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

දඩ, දණ්ඩන සහ අයවිය යුතු මුදල්.

**361**. මේ පනතේ මේ කොටස් කිසිවකින්—

(අ) වරදක් කිරීම සම්බන්ධයෙන්, සමාගම ගණන් බේරා වසා දැමීම ආරම්භ කිරීමට පෙර හෝ පසු, සමාගමකට පනවන ලද දඩයක් ; හෝ

(ආ) යම් පැනවීමක් කඩ කිරීම සම්බන්ධයෙන්, සමාගම ගණන් බේරා වසා දැමීම ආරම්භ කිරීමට පෙර හෝ පසු අධිකරණයක් විසින් සමාගමකට පනවන ලදුව, රජය වෙත ගෙවිය යුතු මුදල් දණ්ඩනයක් ;

(ඈ) ඒ වරද හෝ කඩ කිරීම සම්බන්ධයෙන් නීතිකෘත්‍යවලට අදාළව සමාගම විසින් ගෙවනු ලැබිය යුතු යයි ආඥාකරන ලද ගාස්තු ; හෝ

(ඇ) යම් වත්කමක් සුරක්ෂිත කිරීමට පෙර, එම සුරක්ෂිත වත්කමක විකිණීමෙන් ලැබෙන මුදලින් උපචිත වී අයවිය යුතු, සියලු සේවක අර්ථ සාධක අරමුදලින් අය විය යුතු මුදල් සේවා නියුක්තයන්ගේ භාර අරමුදලින් අයවිය යුතු මුදල් සහ පාරිතෝෂික ගෙවීම්,

ආපසු අය කර ගැනීම සීමා කිරීමක් හෝ ඒ කෙරෙහි බලපෑමක් නොවිය යුතු ය.

ගණන් බේරා වසා දැමීම ආරම්භ කිරීමෙන් පසු ගෙවිය යුතු ණයවලට අදාළ හිමිකම් පෑම්.

**362**. (1) ගණන් බේරා වසා දැමීම ආරම්භ කිරීමෙන් පසුව, ගණන් බේරා වසා දැමීමක දී හැර, මාස හයකට වැඩිවන දිනයක් දක්වා ගෙවනු නොලබන ණයක් සම්බන්ධයෙන් වන හිමිකම් පෑමක්, මේ පනතේ මේ කොටසේ කාර්යය සඳහා ණයේ වත්මන් වටිනාකම සම්බන්ධයෙන් වූ හිමිකම් පෑමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා ණයක වත්මන් වටිනාකම, ගණන් බේරා වසාදැමීම ආරම්භ කිරීමේ දින සිට ණය ගෙවිය යුතු දිනය දක්වා වූ කාලය සඳහා නියමිත පොළිය ණය මුදලින් අඩුකර නිශ්චය කරනු ලැබිය යුතු ය.

අන්‍යොන්‍ය බැරකම් සහ හිලව් කිරීම්.

**363**. (1) මේ වගන්තිය ක්‍රියාත්මක නොවන්නට සමාගම ගණන් බේරා වසා දැමීමේ දී හිමිකම් පෑමක් ආවේශ්‍ය කර ගැනීමට අපේක්ෂා කරන හෝ මතුවට එසේ කිරීමට ආපේක්ෂා කරන තැනැත්තකු සහ සමාගම අතර අන්‍යොන්‍ය බැරකම්, අන්‍යොන්‍ය ණය හෝ වෙනත් අන්‍යොන්‍ය ගණුදෙනු තිබුණා වූ අවස්ථාවක—

(අ) ඒ බැරකම්, ණය හෝ ගණුදෙනු සම්බන්ධයෙන් එක් පාර්ශ්වයකින් අනෙක් පාර්ශ්වයකට අය විය යුතු මුදල පිළිබඳ විස්තරයක් ගනු ලැබිය යුතු ය ;

(ආ) එක් පාර්ශ්වයකින් අයවිය යුතු මුදල් ප්‍රමාණයක්, අනෙක් පාර්ශ්වයෙන් අයවිය යුතු මුදල් ප්‍රමාණයකට හිලවු කරනු ලැබිය යුතු ය ; තවද

(ඇ) ගණන් බේරා වසා දැමීමේ දී අවස්ථාවෝචිත පරිදි ගිණුම් ශේෂයට පමණක් හිමිකම් පෑ හැකි ය, නැතහොත් සමාගම වෙත එය ගෙවනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය—

(අ) කොටසක් නිකුත් කිරීම සඳහා ප්‍රතිෂ්ඨාව හෝ ප්‍රතිෂ්ඨාවේ කොටසක් වශයෙන් ; හෝ

(ආ) කොටස් හිමියාගේ නොගෙවූ බැරකමක් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් හෝ ඈවරකරු විසින් කරන ලද ඇරයුමක් සපුරාලීමේ දී,

කොටස් හිමියකු විසින් ගෙවන ලද හෝ ගෙවනු ලබන මුදල් ප්‍රමාණයකට අදාළ නොවිය යුතු ය.

හිමිකම් පැම්වලට පොළිය.

**364**. (1) හිමිකම් පෑමක මුදල් ප්‍රමාණයට ගණන් බේරා වසා දැමීම ආරම්භය දක්වා—

(අ) ඒ මුදල මත පොළිය ගෙවීම සම්බන්ධයෙන් විධිවිධාන සලස්වනු ලැබ ඇති යම් ගිවිසුමක සඳහන් හෝ ඇතුළත් විය හැකි යම් අනුපාතයකට අනුව ; හෝ

(ආ) විනිශ්චිත ණයක් සම්බන්ධයෙන් වන විට, විනිශ්චිත ණය මත ගෙවිය යුතු යම් අනුපාතයකට අනුව,

පොළිය ඇතුළත් කරනු ලැබිය හැකි ය.

(2) පිළිගනු ලැබූ සියලුම හිමිකම් පෑම් ගෙවීමෙන් පසුව අතිරික්ත වත්කම් කිසිවක් ඉතිරි වී ඇත්නම්, ගණන් බේරා වසා දැමීම ආරම්භ වීමේ දින පටන් එක් එක් හිමිකම් පෑම ගෙවන ලබන දින දක්වා නියමිත අනුපාත අනුව වූ පොළිය ඒ හිමිකම් පෑම් සම්බන්ධයෙන් ගෙවනු ලැබිය යුතු ය. සියලු හිමිකම් පෑම්වලට පොළිය සම්පූර්ණයෙන් ගෙවීමට අතිරික්ත වත්කම් ප්‍රමාණය නොසෑහේ නම්, ගෙවීම සියලු හිමිකම් පෑම් අතර ගෙවීම්වලින් ප්‍රමාණානුකූලව අවකරණයක් විය යුතු ය.

(3) (2) වන උපවගන්තියට අනුකූලව පොළිය ගෙවීමෙන් පසුව, අතිරික්ත වත්කම් කිසිවක් ඉතිරිව ඇත්නම්, (1) වන උපවගන්තියේ සඳහන්, පිළිගනු ලැබූ සියලු හිමිකම් පෑම්වලට ගණන් බේරා වසා දැමීම ආරම්භවීමේ දින පටන් හිමිකම් පෑම ගෙවනු ලබන දින දක්වා, අවස්ථාවෝචිත පරිදි, ඒ උපවගන්තියේ (අ) ඡේදයේ හෝ (ආ) ඡේදයේ සඳහන් අනුපාතය හා නියමිත අනුපාතය අතර වෙනස අනුව පොළිය ගෙවනු ලැබිය යුතු ය. සියලු හිමිකම් පෑම්වලට සම්පූර්ණයෙන් පොළිය ගෙවීමට අතිරික්ත වත්කම් ප්‍රමාණය නොසෑහේ නම්, ගෙවීම සියලු හිමිකම් පෑම් අතර ගෙවීම්වලින් ප්‍රමාණානුකූලව අවකරණයක් විය යුතු ය.

වරණීය හිමිකම් පෑම්.

**365**. (1) ඈවරකරු විසින්, සමාගමේ වත්කම්වලින් නව වන උපලේඛනයේ දක්වා ඇති වියදම්, ගාස්තු සහ හිමිකම් පෑම්, ඒ උපලේඛනයේ සඳහන් ප්‍රමාණයට සහ ප්‍රමුඛතා පිළිවෙල අනුව ගෙවනු ලැබිය යුතු අතර, ඒ වියදම්, ගාස්තු හා හිමිකම් පෑම්වලට ඒවායේ භාවය අනුව ඒ උපලේඛනය අදාළ විය යුතු ය .

(2) නව වන උපලේඛනයේ 7 (ආ) ඡේදය සීමා නොකර, (1) වන උපවගන්තියේ 'වත්කම්' යන පදයට, බැඳීමකට යටත් වත්කම්,—

(අ) 358 වන වගන්තිය යටතේ පවාරණය කරනු ලැබ හෝ පවාරණය කිරීමට ගනු ලැබ හෝ නිදහස් කරනු ලැබ ඇත්නම් ; හෝ

(ආ) බැඳීම, ඇති කරනු ලැබූ විට, ඒ වත්කම් සම්බන්ධයෙන් අස්ථිර බැඳීමක් වන්නේ නම්,

මිස, ඇතුළත් නොවිය යුතු ය.

වෙනත් ණය හිමියන්ගේ හිමිකම් පෑම් සහ අතිරික්ත වත්කම් බෙදා හැරීම.

**366**. (1) 365 වන වගන්තියට අනුකූලව වරණීය හිමිකම් පෑම් ගෙවීමෙන් පසුව, ඈවරකරු විසින්, වෙනත් සියලු හිමිකම් පෑම් සපුරාලීමෙහි ලා සමාගමේ වත්කම් යොදා ගනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් හිමිකම් පෑම් ඒවා අතරෙහි සමව වර්ග කළයුතු අතර, ඒවා ගෙවීම සඳහා වත්කම් ප්‍රමාණවත් නොවුවහොත් මිස, සම්පූර්ණයෙන් ගෙවනු ලැබිය යුතු ය ; එසේ ගෙවීම සඳහා වත්කම් ප්‍රමාණවත් නොවුවහොත් සියලු හිමිකම්පෑම් අතර ගෙවීම්වලින් ප්‍රමාණානුකූලව අවකරණයක් විය යුතු ය.

(3) ගණන් බේරා වසා දැමීම ආරම්භ කිරීමට පෙර, ණයක් සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ ඊට ලැබිය හැකිව තිබූ ප්‍රමුඛතාවයකට වඩා අඩු ප්‍රමුඛතාවයක් පිළිගැනීමට ණයහිමියකු එකඟවන අවස්ථාවක ගිවිසුමේ නියමවලට අනුව ඒ ගිවිසුම ක්‍රියාත්මක වීම වළක්වාලීමක් මේ වගන්තියේ කිසිවකින් සිදු නොවිය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ සඳහන් හිමිකම් පෑම් ගෙවීමෙන් පසුව, 364 වන වගන්තියට යටත්ව ඈවරකරු විසින්, සමාගමේ අතිරික්ත වත්කම්—

(අ) සමාගමේ ව්‍යවස්ථාවලියේ ඇතුළත් විධිවිධානවලට අනුකූලව ; හෝ

(ආ) අතිරික්ත වත්කම් බෙදා හැරීම සඳහා සමාගමේ ව්‍යවස්ථාවලියේ විධිවිධාන ඇතුළත් නොවේ නම්, මේ පනතේ විධිවිධානවලට අනුකූලව,

බෙදා හරිනු ලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තියේ සඳහන් හිමිකම් පෑම් ගෙවීම සම්බන්ධයෙන් දහවන උපලේඛනයේ විධිවිධාන අදාළ විය යුතු ය.

### බල රහිත කළ හැකි ගණුදෙනු

වරණීය ප්‍රතිඵලය ඇති ගණුදෙනු.

**367**. (1) සමාගමක් විසින් කරනු ලබන ගණුදෙනුවක්—

(අ) ගනුදෙණුව සිදුවූයේ—

(i) සමාගමේ ණය ගෙවිය යුතු වන දින දී ඒවා ගෙවීමට සමාගමට නොහැකි වූ අවස්ථාවක ; සහ

(ii) නිශ්චිත කාලසීමාවක් ඇතුළත නම් ; සහ

(ආ) ගණුදෙනුව නිසා වෙනත් තැනැත්තකු වෙත, ණයක් ගෙවා නිම කිරීමේ දී අන්‍යාකාරයකින් ලැබිය හැකිව තිබුණු හෝ ඈවරකිරීමේ දී ලැබීමට ඉඩ තිබූ ප්‍රමාණයට වඩා ලබා ගැනීමේ හැකියාව තිබුණේ නම් ඈවරකරුගේ ඉල්ලීම මත බල රහිත කරනු ලැබිය හැකි ය.

(2) පටහැනි තත්වය ඔප්පු කරනු ලැබුවහොත් මිස, (1) වන උපවගන්තියේ කාර්ය සඳහා, සීමිත කාලය ඇතුළත සිදු වූ ගණුදෙනුවක් සමාගමේ ණය ගෙවිය යුතුව තිබූ එහෙත් සමාගමට ඒවා ගෙවිය නොහැකි වූ අවස්ථාවක කරන ලද්දක් ලෙස පූර්වානුමානය කරනු ලැබේ.

(3) යම් තැනැත්තකු සමග කරන ලද ගනුදෙනුවක්, (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් ප්‍රතිඵලය ඒ තැනැත්තා සම්බන්ධයෙන් ඇති කිරීමේ අභිලාෂයේ බලපෑම නිසා ගණුදෙනුවට ඇතුළත් වී ඇත්තේ නම් මිස, මේ වගන්තිය යටතේ ඉවත ලෑම කරනු නොලැබිය යුතු ය.

(4) යම් සම්බන්ධිත තැනැත්තකු සමග ගණුදෙනුවකට ඇතුළත් වූ සමාගමක් සම්බන්ධයෙන් පටහැනි තත්වය ඔප්පු කරනු ලැබුවහොත් මිස, (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් ප්‍රතිඵලය ඒ තැනැත්තා සම්බන්ධයෙන් ඇති කිරීමේ අභිලාෂයේ බලපෑම නිසා ඒ ගණුදෙනුවට ඇතුළත් වූ බව පූර්වානුමානය කරනු ලැබේ.

බල රහිත කළ හැකි සෘණ භාර.

**368**. (1) සමාගමක යම් දේපළක් හෝ ව්‍යාපාරයක් කෙරෙහි පවත්නා සෘණ භාරයන් නිශ්චිත කාලසීමාව ඇතුළත දෙනු ලැබ ඇත්නම්—

(අ) ඒ සෘණ භාරය මගින්—

(i) ඇත්ත වශයෙන් අත්තිකාරම් දෙන ලද නැතහොත් ගෙවන ලද මුදලක් හෝ සමාගමට විකුණනු ලැබූ හෝ සපයනු ලැබූ දේපළක නියම මිල නැතහොත් වටිනාකම හෝ ඒ සෘණ භාරය දෙන අවස්ථාවේ හෝ ඉන් පසු කවර හෝ අවස්ථාවක භාරයේ ප්‍රදානලාභියා විසින් සද්භාවයෙන් දෙන ලද අගනා ප්‍රතිඥාවක් ; සහ

(ii) (1) වන අනුඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයක් මත ගෙවිය යුතු යම් පොලියක්,

සුරක්ෂිත වන්නේ නම් මිස ; හෝ

(ආ) ඒ සෘණ භාරය දෙනු ලැබීමෙන් ඉක්බිතිව ම, සමාගමේ ණය ගෙවිය යුතු වන දින දී ඒවා ගෙවීමට සමාගම අපොහොසත් වුවහොත් මිස ; හෝ

(ඇ) සෘණ භාරය නිශ්චිත කාලසීමාවට ප්‍රථම දෙන ලද බැඳීමක් වෙනුවට වූ ආදේශකයක් නම් මිස,

එය ඇවරකරුගේ ඉල්ලීම මත ශූන්‍ය කරනු ලැබිය හැකි ය.

(2) පරිසීමිත කාලසීමාව ඇතුළත සෘණ භාරයන් දෙන සමාගමක් ඒ සෘණ භාරය දීමෙන් ඉක්බිතිව ම, ගෙවිය යුතු වන දින දී ඒ ණය ගෙවීමට අපොහොසත්ව සිටින බව, ඊට ප්‍රතිවිරුද්ධව තත්වය ඔප්පු කරනු ලැබුවහොත් මිස, පූර්වානුමානය කරනු ලැබේ.

(3) (අ) ආදේශිත සෘණ භාරයෙන් සුරක්ෂිත වන මුදල් ප්‍රමාණය පවත්නා සෘණ භාරයෙන් සුරක්ෂිත කර තිබෙන මුදල ඉක්මවන තාක් දුරට ; හෝ

(ආ) ආදේශ කරන දිනයේ දී, ආදේශිත සෘණ භාරයට යටත් දේපළෙහි වටිනාකම, ඒ දිනයේ දී පැවති සෘණ භාරයට යටත් දේපළෙහි වටිනාකම ඉක්මවන තාක් දුරට,

(1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(4) යම් දේපළක නොගෙවූ ගැණුම් මිල සහ ඒ මත ගෙවිය යුතු යම් පොලියක් සුරක්ෂිත කරන හා ඒ දේපළ මත වුව ද නොවුව ද දී තිබෙන, සමාගමක් විසින් දෙන ලද සෘණ භාරයක් ඇති කරන සාධන පත්‍රය ඒ දේපළ විකිණීමේ දිනෙන් පසු දවස් තිහකට වඩා පසු නොවන දිනයක ලියා අත්සන් කර ඇතිනම් හෝ වත්තක් හෝ ඉඩමක අයිතිවාසිකමක් විකිණීම හා සම්බන්ධ සෘණ භාරයක් වන විට, ඒ විකිණීම අවසාන වශයෙන් නිරාකරණය වීමෙන් පසු දවස් තිහකට වඩා පසු නොවන දිනයක ලියා අත්සන් කර ඇත්නම්, ඒ සෘණ භාරය කෙරෙහි (1) වන උපවගන්තියේ අන්තර්ගත කිසිවක් අදාළ නොවිය යුතු ය.

(5) සමාගම විසින්, (1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කාලසීමාව ඇතුළත යම් සෘණ භාරය දී ඇති අවස්ථාවක, ඒ සෘණ භාරය දෙනු ලැබීමෙන් පසු ප්‍රදානලාභියාට ලැබෙන සියලු ගෙවීම්, අවශ්‍ය වන තාක් දුරට—

(අ) සෘණ භාරය දෙනු ලැබීමේ දී හෝ දෙනු ලැබීමෙන් පසු ප්‍රදානලාභියා විසින් සමාගමට ඇත්තවශයෙන් අත්තිකාරම් දෙන ලද හෝ ගෙවන ලද මුදල් ආපසු ගෙවීම සඳහා ;

(ආ) සෘණ භාරය දෙනු ලැබීමේ දී හෝ දෙනු ලැබීමෙන් පසුව, ප්‍රදානලාභියා විසින් සමාගමට විකුණන ලද දේපළෙහි නියම මිල හෝ වටිනාකම ගෙවීම සඳහා ;

(ඇ) සෘණ භාරය දෙනු ලැබීමේ දී හෝ දෙනු ලැබීමෙන් පසුව, සද්භාවයෙන් දෙන ලද වෙනත් යම් අගනා ප්‍රතිෂ්ඨාවක් වෙනුවෙන් ප්‍රදානලාභියා වෙත සමාගමේ යම් බැරකම් ගෙවීම සඳහා ;

(ඈ) (අ), (ආ) හෝ (ඇ) ඡේදවල සඳහන් යම් මුදල් ප්‍රමාණයක් මත ගෙවිය යුතු පොලී සඳහා,

අනුයෝජනය කරනු ලැබූ ලෙස, (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ සහ (4) වන උපවගන්තියේ කාර්ය සඳහා, සලකනු ලැබිය යුතු ය.

වාණිජමය නොවන ගණුදෙනු.

**369**. සමාගමක ගණුදෙනුවක්—

(අ) නිශ්චිත කාලසීමාව ඇතුළත සිදු වී ඇත්නම් ;

(ආ) වාණිජමය නොවන ගණුදෙනුවක් නම් ;

(ඇ) ඒ ගණුදෙනුව සිදු වූ අවස්ථාවේ දී සමාගම—

(i) ගෙවිය යුතුව තිබෙන ණය ගෙවීමට නොහැකිව සිටියේ නම් ; හෝ

(ii) එහි මූල්‍ය සම්පත් කිසිසේත් ප්‍රමාණවත් නොවන ව්‍යාපාරයක යෙදී සිටීනම් හෝ යෙදීමට ආසන්නව සිටීනම් ; හෝ

(iii) වගකීම් ඉටු කරන ලෙස නියම කරනු ලැබූ විට ඒවා ඉටු කිරීමට සමාගමට නොහැකි විය හැකි බව දැන සිටිය දී, වගකීමකට ඇතුළත්ව ඇත්නම්,

ඈවරකරුගේ ඉල්ලීම පිට, ඒ ගණුදෙනුව බලරහිත කරනු ලැබිය හැකි ය.

(2) සමාගමක පවත්නා අවස්ථාගත තත්වය අනුව, ගණුදෙනුවකට ඇතුළත් වීම පහත සඳහන් කරුණු එනම් :—

(අ) ඒ ගණුදෙනුවට ඇතුළත් වීමෙන් සමාගමට ලැබෙන (ප්‍රතිලාභයක් ඇත්නම්) ප්‍රතිලාභ ;

(ආ) ඒ ගණුදෙනුවට ඇතුළත්වීමෙන් සමාගමට සිදුවන අනර්ථය ;

(ඇ) ගණුදෙනුවේ අනෙකුත් පාර්ශ්වයන්ට පිළිවෙලින් ලැබෙන ප්‍රතිලාභ ;

(ඇ) වෙනත් යම් අදාළ කරුණු

සැලකිල්ලට ගෙන සාධාරණ පුද්ගලයකු ඒ ගණුදෙනුවට ඇතුළත් නොවනු ඇත්නම් සහ ඇතුළත් නොවනු ඇත්නම් පමණක්, සමාගමක් විසින් කරන ලද ගණුදෙනුවක් වාණිජමය නොවන ගණුදෙනුවක් වන්නේ ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා යම් ගණුදෙනුවක්—

(අ) සමාගමේ ණයහිමියකු ඒ ගණුදෙනුවේ පාර්ශ්වකරුවකු වූවත් හෝ නොවූවත් ; සහ

(ආ) අධිකරණයක් විසින් කරන ලද ආඥාවක් නිසා ඒ ගණුදෙනුව ක්‍රියාත්මක කරනු ලැබූ නමුත්, හෝ ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇති නමුත්

වාණිජමය නොවන ගණුදෙනුවක් විය හැකි ය.

(4) පරිසීමිත කාලසීමාව ඇතුළත සිදු කරන ලද ගණුදෙනුවක්, සමාගමක් විසින් ඒ සමාගමේ ණය ගෙවිය යුතු දිනයේ දී ගෙවීමට අපොහොසත්ව සිටි කාලසීමාවක් ඇතුළත සිදුකළ ගණුදෙනුවක් ලෙස, එය එසේ නොවන බව ඔප්පු කරනු ලැබුවහොත් මිස, (1) වන උපවගන්තියේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

බලරහිත කළහැකි ගණුදෙනු හා බැඳීම් ඉවතලීමේ කාර්ය පටිපාටිය.

**370**. (1) 367 වන වගන්තිය යටතේ හෝ 369 වන වගන්තිය යටතේ හෝ බලරහිත වන ගණුදෙනුවක් හෝ 368 වන වගන්තිය යටතේ බලරහිත කළ හැකි සෘණ භාරයක් ඉවත ලීමට බලාපොරොත්තු වන ඇවරකරුවකු විසින්—

(අ) ඒ බවට, ඉවත ලිය යුතු ගණුදෙනුව හෝ සෘණ භාරය නිශ්චිතව සඳහන් වන ගණුදෙනුවක් සම්බන්ධයෙන් වන විට, ආපසු ලබාගැනීමට හෝ අයකර ගැනීමට ඇවරකරු බලාපොරොත්තු වන දේපළ හෝ වටිනාකම සහ (2), (3) හා (4) වන උපවගන්තිවල බලපෑම නිශ්චිතව සඳහන් වන දැන්වීමක්, මෝසමක් වශයෙන් අධිකරණයෙහි ගොනුකළ යුතු ය ; තව ද

(ආ) (අ) ඡේදය යටතේ අධිකරණයෙහි ගොනුකළ දැන්වීමේ පිටපතක් ගණුදෙනුවේ අනෙක් පාර්ශ්වය වෙත හෝ සෘණ භාරයේ ප්‍රදානලාභියා වෙත සහ ඇවරකරු දේපළ හෝ වටිනාකම ආපසු ලබාගැනීමට හෝ අයකර ගැනීමට බලාපොරොත්තු වන්නේ වෙනත් යම් තැනැත්තකුගෙන් ද ඒ තැනැත්තන් වෙත හෝ භාර කළ යුතු ය.

(2) එම ගණුදෙනුව හෝ සෘණ භාරය ඉවත නොදමන ලෙස ආඥාවක් ලබාගැනීම සඳහා—

(අ) ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් ගණුදෙනුව හෝ සෘණ භාරය ඉවතලීමෙන් බලපෑමක් ඇතිවන තැනැත්තකු විසින් ; හෝ

(ආ) ඒ ගණුදෙනුව හෝ සෘණ භාරය බලරහිත කළ නොහැකි ලෙස සලකන තැනැත්තකු විසින්,

අධිකරණයෙන් ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(3) දැන්වීමක් භාර කරනු ලැබූ තැනැත්තකු විසින් (2) වන උපවගන්තිය යටතේ අධිකරණය වෙත ඉල්ලීමක් කර ඇත්නම් මිස, දැන්වීම භාර කරනු ලැබූ දිනයෙන් පසු වැඩකරන විසිවන දිනයේ දී ඒ ගණුදෙනුව හෝ සෘණ භාරය ඉවත ලන ලද සේ සැලකිය යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ එක් තැනැත්තකු හෝ තැනැත්තන් වැඩි සංඛ්‍යාවක් විසින් ඉල්ලීම් කර ඇත්නම්, අධිකරණය විසින් අන්‍යාකාර ආඥාවක් කරනු ලැබුවහොත් මිස, අන්තිමට ලැබුණ ඉල්ලීම පිළිබඳව අවසාන විනිශ්චයක් කරනු ලැබූ දිනයේ දී ඒ ගණුදෙනුව හෝ බැඳීම ඉවතලන ලද සේ සැලකිය යුතු ය.

**371**. ගණුදෙනුවක් හෝ සෘණ භාරයක් 370 වන වගන්තිය යටතේ ඉවතලනු ලැබුවහොත්, අධිකරණය විසින් මෙහි පහත දැක්වෙන ආඥා එකක් හෝ වැඩි ගණනක් කරනු ලැබිය හැකි ය :— වෙනත් ආඥා.

(අ) ගණුදෙනුවේ හෝ සෘණ භාරයේ ප්‍රතිඵලයක් වශයෙන් යම් තැනැත්තකු ලබා ඇති ප්‍රතිලාභ වෙනුවෙන්, සාධාරණව ඒ ප්‍රතිලාභ නියෝජනය වන යම් මුදල් ප්‍රමාණ ඈවරකරුට ගෙවන ලෙස ඒ තැනැත්තාට නියම කරන ආඥාවක් ;

(ආ) ගණුදෙනුවේ කොටසක් වශයෙන් යම් තැනැත්තකු වෙත පවරා තිබෙන දේපළ සමාගම වෙත පුනස්ථාපනය කරන ලෙසට නියම කරන ආඥාවක් ;

(ඇ) එසේ පවරා දෙන ලද දේපළක් විකිණීමෙන් ලත් මුදල් හෝ පවරා දෙන ලද මුදලක් හෝ යම් දේපළක් නියෝජනය වන්නේ නම්, ඒ දේපළ සමාගම වෙත සතු කරන ලෙස නියම කරන ආඥාවක් ;

(ඈ) සමාගම විසින් දෙන ලද ඇපකරයක් හෝ සෘණ භාරයක් හෝ සමාගම විසින් දරන ලද ණයක් සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් හෝ නිදහස් කිරීමේ ආඥාවක් ;

(ඉ) ගණුදෙනුවක් හෝ සෘණ භාරයක් සංයුක්ත වන, ගණුදෙනුවක හෝ සෘණ භාරයක කොටසක් වන හෝ ගණුදෙනුවකට හෝ සෘණ භාරයකට සම්බන්ධ යම් ගිවිසුමක් නැතහොත් ඒ ගිවිසුමක යම් නිශ්චිත කොටසක්, ඒ ගිවිසුමට ඇතුළත් වූ අවස්ථාවේ දී සහ ඉන් පසුව හෝ යම් නිශ්චිත පසු වේලාවක දී හෝ ඉන් පසුව බලරහිත වී ඇති බවට ප්‍රකාශයට පත් කරන ආඥාවක් ;

(ඊ) ආඥාවේ නිශ්චිතව සඳහන් ආකාරයට, ඒ ගිවිසුමක් සුළු වශයෙන් වෙනස් කරන සහ සුදුසු යයි අධිකරණය අදහස් කරන්නේ නම්, ඒ ගිවිසුමට ඇතුළත් වූ අවස්ථාවේ සහ ඉන් පසුව හෝ යම් නිශ්චිත පසු වේලාවක දී සහ ඉන් පසුව, එසේ වෙනස් කරනු ලැබූ ආකාරයට ගිවිසුම බලපවත්වනු ලැබ ඇති ලෙස ප්‍රකාශයට පත් කරන ආඥාවක් ;

(උ) එවැනි ගිවිසුමක් හෝ එවැනි ගිවිසුමක නිශ්චිත විධිවිධාන බලාත්මක කළ නොහැකි බව ප්‍රකාශ කරන ආඥාවක් ;

(ඌ) මේ වගන්තිය යටතේ කරන ලද ආඥාවක් ඉටු කිරීම සඳහා ඇප තබන ලෙස නියම කරන ආඥාවක් ;

(එ) ගණුදෙනුවක් අවලංගු කිරීමෙන් හෝ මේ වගන්තිය යටතේ කරන ලද ආඥාවකින් බලපෑමක් ඇතිවන තැනැත්තකු විසින්, ඇවර කිරීමක දී ණය හිමියකු වශයෙන්, හිමිකම් කියා සිටිය හැකි ප්‍රමාණය නිශ්චය කොට දැක්වෙන ආඥාවක්.

ගණුදෙනු හා සෘණ භාර ඉවතලීම පිළිබඳ අතිරේක විධිවිධාන.

**372**. (1) යම් ගණුදෙනුවක් හෝ 371 වන වගන්තිය යටතේ කරන ලද ආඥාවක් හෝ ඉවතලීමෙන් යම් තැනැත්තකු විසින් —

(අ) සමාගම හැර වෙනත් යම් තැනැත්තකුගෙන් ;

(ආ) අගනා ප්‍රතිෂ්ඨාවක් සඳහා ; සහ

(ඇ) සද්භාවයෙන්,

අත්කරගෙන තිබෙන දේපළක ඒ තැනැත්තාට ඇති හිමිකම කෙරෙහි හෝ ඒ දේපළකට ඒ තැනැත්තාට ඇති සම්බන්ධතාවය කෙරෙහි හෝ බලපෑමක් ඇති නොවිය යුතු ය.

(2) යම් සෘණ භාරයක් හෝ 371 වන වගන්තිය යටතේ කරන ලද ආඥාවක් ඉවතලීමෙන්, යම් තැනැත්තකු විසින් —

(අ) ඒ සෘණ භාරයේ ප්‍රදානලාභියා විසින් විකිණීමේ බලයක් ක්‍රියාවේ යොදනු ලැබීමේ ප්‍රතිඵලයක් වශයෙන් ;

(ආ) අගනා ප්‍රතිෂ්ඨාවක් සඳහා ; සහ

(ඇ) සද්භාවයෙන්,

අත්කරගෙන තිබෙන දේපළක ඒ තැනැත්තාට ඇති හිමිකම කෙරෙහි හෝ ඒ දේපළකට ඒ තැනැත්තාට ඇති සම්බන්ධතාවය කෙරෙහි හෝ බලපෑමක් ඇති නොවිය යුතු ය.

(3) 371 වන වගන්තිය යටතේ හෝ මේ පනතේ වෙනත් යම් වගන්තියක් යටතේ හෝ වෙනත් යම් නීති ප්‍රඥප්තියක් යටතේ හෝ සාධාරණත්වය අනුව හෝ අන්‍යාකාරව, ඇවරකරුවකු විසින් දේපළ හෝ දේපළට සමාන වටිනාකම ආපසු ගැනීම—

(අ) එසේ ආපසු ලබා ගැනීම කරනු ලබන්නේ යම් තැනැත්තකුගෙන් ද ඒ තැනැත්තා විසින් ඒ දේපළ සද්භාවයෙන් ලබාගෙන ඇත්නම් සහ ඒ තැනැත්තා වෙත කරන ලද ඒ දේපළ පැවරීම බලසහිතව කරන ලද්දක් ය යන සාධාරණ විශ්වාසය මත ඒ තැනැත්තාගේ තත්වය වෙනස් කරගෙන ඇත්නම් ; සහ

(ආ) ආපසු ලබාගැනීම හෝ සම්පූර්ණයෙන් ආපසු ලබා ගැනීම, අධිකරණයේ මතය අනුව සාධාරණීය නොවන්නේ නම්,

සම්පූර්ණයෙන් ම හෝ කොටසක් හෝ ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

**373**. (1) 367 වන සහ 369 වන වගන්තිවල සමාගමකට අදාළව "ගණුදෙනුව" යන්නට— වරණ යනාදියට අදාළ අර්ථ නිරූපණය.

(අ) සමාගම විසින් දේපළ සමර්පණය කිරීමක් හෝ පැවරීමක් හෝ වෙනත් යම් ආකාරයක ඉවත් කිරීමක් ;

(ආ) සමාගමේ දේපළ මත ඇපයක් හෝ බැඳීමක් දීම ;

(ඇ) සමාගම විසින් බැඳීමකට ඇතුළත් වීම ;

(ඈ) අධිකරණමය නඩු කටයුත්තක් යටතේ ක්‍රියාවේ යෙදවීමේ ආඥාවක් සමාගම විසින් භාර ගැනීම ;

(ඉ) අධිකරණ තීන්දුවක් හෝ ආඥාවක් යටතේ මුදල් ගෙවීම ඇතුළුව, සමාගම විසින් මුදල් ගෙවීම,

ඇතුළත් වේ.

(2) 367, 368 හා 369 වන වගන්තිවල කාර්ය සඳහා "නිශ්චිත කාලසීමාව" යන්නෙන්—

(අ) සම්බන්ධිත තැනැත්තකු සමග ඇතුළත් වන ලද ගණුදෙනුවක් හෝ සම්බන්ධිත තැනැත්තකුට ප්‍රදානය කරන ලද බැඳීමක් සම්බන්ධයෙන් වන විට—

(i) ගණන් බේරා වසා දැමීම ආරම්භවීමට පූර්ව අවුරුදු දෙකක කාලසීමාව ; සහ

(ii) අධිකරණය විසින් ගණන් බේරා වසා දමනු ලබන සමාගමක් සම්බන්ධයෙන් වන විට, අධිකරණය වෙත පෙත්සම ගොනු කිරීමට පූර්ව අවුරුදු දෙකක කාලසීමාව සහ ඊට එකතුව, එම පෙත්සම ගොනු කළ දිනයෙන් ආරම්භව,

අධිකරණ ආඥාව කරනු ලැබූ දිනයෙන් අවසන් වන කාලසීමාව අදහස් වේ.

(ආ) වෙනත් යම් කාරණයක් සම්බන්ධයෙන් වන විට—

(i) ගණන් බේරා වසා දැමීම ආරම්භවීමට පූර්ව අවුරුදු එකක කාලසීමාව ; සහ

(ii) අධිකරණය විසින් ගණන් බේරා වසා දමනු ලබන සමාගමක් සම්බන්ධයෙන් වන විට, අධිකරණය වෙත පෙත්සම ගොනු කිරීමට පූර්ව අවුරුදු එකක කාලසීමාව සහ ඊට එකතුව, එම පෙත්සම ගොනු කළ දිනයෙන් ආරම්භව, අධිකරණ ආඥාව කරනු ලැබූ දිනයෙන් අවසන් වන කාලසීමාව,

අදහස් වේ.

(3) යම් තැනැත්තෙක්—

(අ) ගණුදෙනුව සිදුවන අවස්ථාවේ සමාගමේ අධ්‍යක්ෂවරයකුව සිටි හෝ සමාගමේ අධ්‍යක්ෂවරයකුගේ නාමිතයකු හෝ ඥාතියකු හෝ අධ්‍යක්ෂවරයකු සඳහා භාරකරුවකු හෝ අධ්‍යක්ෂවරයකුගේ ඥාතියකු සඳහා භාරකරුවකුව සිටියේ නම් ; හෝ

(ආ) ගණුදෙනුව සිදුවන අවස්ථාවේ සමාගමේ පාලනය දැරූ තැනැත්තකු හෝ පාලනය දැරූ තැනැත්තකුගේ ඥාතියකුව සිටියේ නම් ; හෝ

(ඇ) ගණුදෙනුව සිදුවන අවස්ථාවේ සමාගමේ අධ්‍යක්ෂවරයකු විසින් හෝ අධ්‍යක්ෂවරයකුගේ නාමිතයකු හෝ ඥාතියකු හෝ අධ්‍යක්ෂවරයකු සඳහා භාරකරුවකු වූ තැනැත්තකු හෝ අධ්‍යක්ෂවරයකුගේ ඥාතියකු සඳහා භාරකරුවකු වූ තැනැත්තකු විසින් පාලනය කරනු ලැබූ සමාගමක් නම් ; හෝ

(ඇ) ගණුදෙනුව සිදුවන අවස්ථාවේ සම්බන්ධිත සමාගමක් වූ සමාගමක් නම්,

ඒ තැනැත්තා (4) වන උපවගන්තියේ සහ 367 වන වගන්තියේ කාර්යය සඳහා "සම්බන්ධිත තැනැත්තෙක්" යනුවෙන් අදහස් වේ.

(4) 367, 368 සහ 369 වන වගන්තිවල කාර්යය සඳහා "පරිසීමිත කාලසීමාව" යන්නෙන් —

(අ) ගණන් බේරා වසාදැමීමට පූර්ව එක් මාසයක කාලසීමාව ; සහ

(ආ) අධිකරණය විසින් ගණන් බේරා වසා දමනු ලබන සමාගමක් සම්බන්ධයෙන් වන විට, අධිකරණය වෙත පෙත්සම ගොනු කිරීමට පූර්ව එක් මාසයක කාලසීමාව සහ ඊට එකතුව, එම පෙත්සම ගොනු කළ දිනයෙන් ආරම්භව, අධිකරණ ආඥාව කරනු ලැබූ දිනයෙන් අවසන් වන කාලසීමාව,

අදහස් වේ.

## ගණන් බේරා වසා දැමීමට පූර්ම අයථා ක්‍රියා සහ නිලධරයන්ගේ වගකීම්

**374**. (1) සමාගමක් ගණන් බේරා වසා දමනු ලැබූ විට ගණන් බේරා වසා දැමීම ආරම්භ වීමට පූර්ව අවුරුදු දෙක ඇතුළත, සමාගමේ කලින් සිටි හෝ දැනට සිටින නිලධරයකු වන තැනැත්තකු විසින් — ගණන් බේරා වසාදැමීම බලාපොරොත්තුවෙන් කරන වංචා යනාදිය.

(අ) සමාගමේ දේපළවලින් රුපියල් දසදහසක හෝ ඊට වැඩි වටිනාකමක් ඇති කොටසක් වසන් කළහොත් හෝ සමාගමට හෝ සමාගමෙන් අයවිය යුතු යම් ණයක් වසන් කළහොත් ; හෝ

(ආ) සමාගමේ දේපළවලින් රුපියල් දසදහසක හෝ ඊට වැඩි වටිනාකමක් ඇති කොටසක් වංචනිකව ඉවත් කළහොත් ; හෝ

(ඇ) සමාගමේ දේපළවලට හෝ කටයුතුවලට බලපාන හෝ සම්බන්ධ යම් පොතක් හෝ ලේඛනයක් වසන් කළහොත්, විනාශ කළහොත්, විරූප කළහොත් හෝ වරදවා පෙන්වූවහොත් ; හෝ

(ඇ) සමාගමේ දේපළවලට හෝ කටයුතුවලට බලපෑමක් තිබෙන හෝ සම්බන්ධ යම් පොතක හෝ ලේඛනයක යම් අසත්‍ය සටහනක් තැබුවහොත් ; හෝ

(ඉ) සමාගමේ දේපළවලට හෝ කටයුතුවලට බලපෑමක් තිබෙන හෝ සම්බන්ධ යම් පොතක් හෝ ලේඛනයක් වංචනිකව කිසිවකුට දුනහොත් හෝ යම් පොතක හෝ ලේඛනයක වෙනස් කිරීමක් කළහොත් හෝ කිසිවක් අත්හළහොත් ; හෝ

(ඊ) සමාගම විසින් ණයට ලබාගෙන ගෙවීම් කර නොමැති යම් දේපළක් උකස් කිරීම, ඔඩපනය කිරීම හෝ නීයාදනය කිරීම, සමාගමේ සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රියාවලිය ඇතුළත වූයේ නම් මිස, සමාගමේ එවැනි යම් දේපළක් උකස් කළහොත්, ඔඩපනය කළහොත් හෝ නීයාදනය කළහොත් ; හෝ

(උ) සමාගමේ ණයහිමියන්ට වංචා කිරීමේ චේතනාවෙන්, සමාගමේ දේපළ තෑගි කිරීමක් හෝ පැවරීමක් හෝ ඒ දේපළ පිළිබඳ සෘණ භාරයක් කළහොත් හෝ කිරීමට සැලැස්වූවහොත් හෝ සමාගමේ දේපළට එරෙහිව යම් ක්‍රියාවේ යෙදවීමේ ආඥාවක් මත අයකිරීමක් සිදු කළහොත් හෝ සිදු කිරීමෙහි ලා ගුප්තානුකූලතාව දැක්වූවහොත් ; හෝ

(ඌ) මුදල් ගෙවීම සඳහා සමාගමට එරෙහිව ලබාගත් යම් ඉටු නොකළ නඩු තීන්දුවක හෝ ආඥාවක දිනයේ සිට හෝ දිනයට පෙර මාස දෙකක් ඇතුළත සමාගමේ ණයහිමියන්ට වංචා කිරීමේ චේතනාවෙන් සමාගමේ දේපළෙහි යම් කොටසක් වසන් කළහොත් හෝ ඉවත් කළහොත්,

ඒ තැනැත්තා වරදක් කර ඇතැයි සැලකෙන්නේ ය.

(2) (අ) (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ හෝ (ඊ) ඡේදය යටතේ චෝදනා කරනු ලැබ සිටින තැනැත්තකු විසින් ඔහු තුළ වංචාවක් කිරීමේ චේතනාවක් නොතිබුණු බව ඔප්පු කිරීම ;

(ආ) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ හෝ (ඈ) ඡේදය යටතේ හෝ චෝදනා කරනු ලැබ සිටින තැනැත්තකු විසින්, ඔහු තුළ සමාගමේ කටයුතුවල තත්වය වසන් කිරීමේ චේතනාවක් හෝ නීතිය ව්‍යර්ථ කිරීමේ චේතනාවක් නොතිබුණු බව ඔප්පු කිරීම,

විත්ති වාචකයක් විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ වරදක් කරන තැනැත්තකු වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් මිලියනයක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු පහක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

**375**. (1) ගණන් බේරා වසා දමන ලද සමාගමක ව්‍යාපාරය, සමාගමේ ණය හිමියන්ට හෝ වෙනත් යම් තැනැත්තකුගේ ණය හිමියන්ට හෝ වංචා කිරීමේ චේතනාව ඇතිව, නැතහොත් යම් වංචනික කාර්යයක් සඳහා හෝ කරගෙන ගොස් ඇති අවස්ථාවක, ඒ ආකාරයෙන් ව්‍යාපාරය කරගෙන යාමට දැන දැනම පාර්ශ්වකරුවන් වූ සෑම තැනැත්තකුම වරදක් කර ඇත්තා සේ සැලකිය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් මිලියනයක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු පහක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය. වංචනික වෙළෙඳාම.

(2) සමාගමක් ගණන් බේරා වසා දැමීම කරගෙන යන අතරතුර, සමාගමේ ණයහිමියන්ට හෝ වෙනත් යම් තැනැත්තකුගේ ණය හිමියන්ට හෝ වංචා කිරීමේ චේතනාව ඇතිව නැතහොත් යම් වංචනික කාර්යයක් සඳහා හෝ සමාගමේ යම් ව්‍යාපාරයක් කරගෙන ගොස් ඇති බව පෙනී යන්නේ නම්, ඇවරකරු හෝ සමාගමේ යම් ණය හිමියකු විසින් කරනු ලබන ඉල්ලීමක් මත, අධිකරණය විසින් සුදුසු යයි අදහස් කරන පරිදි, ඒ ආකාරයෙන් ව්‍යාපාරය කරගෙන යාමට දැන දැනම පාර්ශ්වකරුවන් වූ කවර හෝ තැනැත්තන් —

(අ) සමාගමේ වත්කම්වලට යම් දායකවීමක් කිරීමට යටත් විය යුතු බවට ; හෝ

(ආ) සමාගමේ එවැනි ණයවලට හෝ බැරකම්වලට පෞද්ගලිකව වගකිව යුතු බවට,

ප්‍රකාශයක් කළ හැකි ය.

**376**. (1) සමාගමක් ගණන් බේරා වසා දැමීම කරගෙන යන අතරතුර, සමාගම පිහිටුවීමට හෝ ප්‍රවර්ධනය කිරීමට සහභාගි වූ තැනැත්තකු විසින් හෝ සමාගමේ යම් ආදි හෝ වර්තමාන අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු හෝ ඇවරකරුවකු නැතහොත් යම් භාර ගැනුම් කරුවකු විසින් සමාගමේ යම් මුදලක් හෝ දේපළක් වැරදි ලෙස යොදා හෝ ළඟ තබාගෙන ඇති බව හෝ ඊට වගකීමට හෝ ගණන් පෙන්වීමට යටත්ව සිටින බව හෝ සමාගම සම්බන්ධයෙන් සිය කාර්ය මුදල් ආපසු ගෙවන ලෙස හෝ දේපළ ආපසු භාර දෙන ලෙස තැනැත්තන්ට නියම කිරීමට අධිකරණයට බලය ඇති බව.

හෝ භාරය පිළිබඳ නොසැලකිල්ල, පැහැර හැරීම හෝ කඩ කිරීම ගැන වරදකරු වී සිටින බව හෝ අධිකරණයට පෙනී ගියහොත්, ඈවරකරුගේ හෝ ණය හිමියකුගේ හෝ කොටස් හිමියකුගේ හෝ ඉල්ලීම පිට අධිකරණය විසින් —

(අ) ඒ ප්‍රවර්ධකගේ, අධ්‍යක්ෂවරයාගේ, කළමනාකරුගේ, ඈවරකරුගේ හෝ භාර ගැනුම් කරුවකුගේ ක්‍රියාකලාපය පිළිබඳ පරීක්ෂණයක් කරනු ලැබිය හැකි ය ; තව ද

(ආ) (i) මුදල හෝ දේපළ හෝ ඉන් මුදලේ හෝ දේපලේ යම් කොටසක් හෝ, යුක්තිසහගත යයි අධිකරණය කල්පනා කරන අනුපාතිකයක් මත පොලිය ද සමඟ ආපසු ගෙවන ලෙස හෝ ආපසු භාර දෙන ලෙස ; හෝ

(ii) වන්දි වශයෙන් යුක්තිසහගත යයි අධිකරණය කල්පනා කරන යම් මුදල් ප්‍රමාණයකින් සමාගමේ වත්කම්වලට දායක වන ලෙස ; හෝ

(ඇ) ඉල්ලීම ණය හිමියකු විසින් කරනු ලැබූ අවස්ථාවක, යුක්තිසහගත යයි අධිකරණය කල්පනා කරන අනුපාතිකයක් මත පොලිය ද සමග එම මුදල හෝ ඉන් යම් කොටසක් ණය හිමියාට ගෙවන ලෙස හෝ එම දේපළ හෝ ඉන් යම් කොටසක් ණයහිමියාට පවරන ලෙස,

ඒ තැනැත්තාට ආඥා කරනු ලැබිය හැකි ය.

(2) ඒ ක්‍රියාකලාපයෙන් මේ පනත යටතේ වරදක් සංයුක්ත වුව ද මේ වගන්තියේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

(3) මුදල් ගෙවන ලෙස මේ වගන්තිය යටතේ ආඥාවක් කරනු ලැබූ අවස්ථාවක, එය, (97 වන අධිකාරය වූ) වස්තුභංගත්ව ආඥාපනතේ කාර්ය සඳහා, ඒ ආඥාපනතේ 12 වන වගන්තියේ සඳහන් ණයක් අයකර ගැනීම හෝ මුදලක් ඉල්ලා සිටීම සඳහා වූ නඩු තීන්දුවක් ලෙස සලකනු ලැබිය යුතු ය.

භාරදූර දේපළ පිළිබඳ අයිතිය අත්හැරීම.

**377**. (1) ගණන් බේරා වසා දමනු ලබන සමාගමක දේපළින් යම් කොටසක්, බර පැවරෙන පොරොන්දුවල වගකීම් සහිතව යම් කාලයකට සතුකොටගත් ඉඩමකින්, සමාගම්වල කොටස්වලින් නොහොත්

ස්කන්ධවලින්, ලාභ නුපදවන ගිවිසුම්වලින් හෝ යම් භාරදූර ක්‍රියාවක් කිරීමට හෝ යම් මුදලක් ගෙවීමට සන්තකය දරන්නා බැඳී සිටීම හේතුකොටගෙන විකිණිය නො හැකි හෝ පහසුවෙන් විකිණිය හැකි නොවූ සෙසු යම් දේපළකින් යුක්ත වූ අවස්ථාවක, සමාගමේ ඈවරකරු දේපළ විකිණීමට උත්සාහ කර තිබීම නැතහොත් එහි සන්තකය ලබාගෙන සිටීම, එසේත් නැතහොත් ඒ සම්බන්ධයෙන් වූ අයිතිය පිළිබඳ යම් ක්‍රියාවක් කර තිබීම ගැන නොසලකා, අධිකරණයේ අවසරය ඇතිව හා මේ වගන්තියේ විධිවිධානවලට යටත්ව ගණන් බේරා වසා දැමීම ආරම්භයේ දින සිට මාස දොළහක් ඇතුළත හෝ අධිකරණය විසින් ඉඩ දෙනු ලැබිය හැකි දීර්ඝ කරන ලද කාලසීමාවක් ඇතුළත යම් විටක ඔහු අත්සන් කරනු ලැබූ ලියවිල්ලක් මගින් දේපළෙහි අයිතිය අත්හැරිය හැකි ය :

එසේ වුව ද, ගණන් බේරා වසා දැමීම ආරම්භ වීමේ දින සිට එක් මසක් ඇතුළත එවැනි යම් දේපළක් ගැන ඈවරකරු නොදැන සිටි අවස්ථාවක, ඔහු ඒ ගැන දැන ගැනීමෙන් පසු මාස දොළහක් හෝ අධිකරණය විසින් ඉඩ දෙනු ලැබිය හැකි දීර්ඝ කරන ලද කාලසීමාවක් ඇතුළත යම් විටක මේ වගන්තියේ විධිවිධාන යටතේ දේපළ අයිතිය අත්හැරීමේ බලය පාවිච්චි කළ හැකි ය.

(2) අයිතිය අත්හරිනු ලැබූ දේපළෙහි හෝ ඒ සම්බන්ධයෙන් සමාගමේ අයිතිවාසිකම්, සම්බන්ධතා හා බැරකම් ද සමාගමේ දේපළ ද අත්හැරීමේ දින සිට අවසන් කෙරෙන සේ අයිතිය අත්හැරීම බල පෑ යුතු ය. එහෙත් සමාගම හා සමාගමේ දේපළ බැරකමින් නිදහස් කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වන යම් ප්‍රමාණයකට හැර එය සෙසු යම් තැනැත්තකුගේ අයිතිවාසිකම් හෝ බැරකම් කෙරෙහි බල නොපෑ යුතු ය.

(3) අයිතිය අත්හැරීම සඳහා අවසර දීමට පෙර හෝ අවසර දෙනු ලබන විට, සම්බන්ධතාවක් දක්වන තැනැත්තන් වෙත, සාධාරණ යයි අධිකරණය කල්පනා කරන පරිදි, දැන්වීම යැවීමට අධිකරණය විසින් නියම කිරීම ද, අවසරදීමේ කොන්දේසියක් වශයෙන් නියමයන් පැනවීම හා ඒ කාරණයේ දී වෙනත් යම් ආඥාවක් කිරීම ද කළ හැකි ය.

(4) දේපළක් විෂයෙහි සම්බන්ධතාවක් ඇති යම් තැනැත්තකු විසින්, අයිතිය ඈවරකරු විසින් අත්හරිනු ලබන්නේ ද නොලබන්නේ ද යන බව තීරණය කරන ලෙස ඈවරකරු වෙත ලිඛිත ඉල්ලීමක් කරනු ලැබ, ඉල්ලීම ලැබීමේ දින සිට දින විසි අටක කාලසීමාවක් හෝ අධිකරණය විසින් ඉඩ දෙනු ලැබිය හැකි යම් වැඩිදුර කාලසීමාවක් හෝ ඇතුළත, ඈවරකරු විසින් අයිතිය අත් හැරීම සඳහා අධිකරණය වෙතින් අවසර ඉල්ලීමට තමා අදහස් කරන බව ඉල්ලුම්කරු වෙත දැනුම් දෙනු නොලැබූ අවස්ථාවක,

මේ වගන්තියේ විධිවිධාන යටතේ යම් දේපළක අයිතිය අත්හැරීමට ඇවරකරුට හිමිකම් නොතිබිය යුතු ය. තව ද, ගිවිසුමක් සම්බන්ධයෙන් වූ විට, ඉහත කී අන්දමේ ඉල්ලීමක් කරනු ලැබ එකී කාලසීමාව හෝ වැඩිදුර කාලසීමාව හෝ ඇතුළත ඇවරකරු විසින්, ගිවිසුම සම්බන්ධයෙන් වූ අයිතිය අත්හරිනු නොලැබූ අවස්ථාවක සමාගම විසින් එය පිළිගනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(5) ඇවරකරු සමග ගත් කළ, සමාගම සමග ඇති කර ගනු ලැබූ ගිවිසුමක ප්‍රතිලාභය සඳහා හිමිකම් ලැබූ හෝ එහි වගකීමට යටත් වූ යම් තැනැත්තකු විසින් ඉල්ලුම් කරනු ලැබූ විටක, අධිකරණය විසින් ගිවිසුම ක්‍රියාවේ නොයෙදවීම සඳහා දෙපක්ෂයෙන් එක් පක්ෂයක් විසින් හෝ දෙපක්ෂයෙන් එක් පක්ෂයක් වෙත අලාභ ගෙවීම පිළිබඳව නියම මත හෝ සාධාරණ යයි අධිකරණය කල්පනා කරන අන්‍යාකාරයකින් හෝ ගිවිසුම පරිච්ඡින්න කෙරෙන ආඥාවක් කළ හැකි ය. තව ද ආඥාව යටතේ එවැනි යම් තැනැත්තකුට ගෙවිය යුතු යම් අලාභයක් ගණන් බේරා වසා දැමීමේ දී ණයක් ලෙස ඔහු විසින් ඔප්පු කළ හැකි ය.

(6) අයිතිය අත්හරිනු ලැබූ යම් දේපළක යම් සම්බන්ධතාවයක් සඳහා හිමිකම් පාන හෝ අයිතිය අත්හරිනු නොලැබූ යම් දේපළක් සම්බන්ධයෙන් මේ පනතින් නිදහස් කරනු නොලැබූ යම් වගකීමකට යටත් හෝ යම් තැනැත්තකු විසින් ඉල්ලුම් කරනු ලැබ, සුදුසු යයි අධිකරණය කල්පනා කරන පරිදි ඒ තැනැත්තාට සවන් දීමෙන් පසු, දේපළට හිමිකම් ලත් යම් තැනැත්තන් වෙත සතු කිරීම හෝ ඉහත කී ඒ වගකීම වෙනුවෙන් වන්දි වශයෙන් දේපළ භාර දිය යුතු බව සාධාරණ යයි පෙනී යන කිසිවකුට හෝ ඔහු වෙනුවෙන් භාරකරුවකු වෙත ඒ දේපළ සතු කිරීම හෝ භාර දීම හෝ සඳහා සාධාරණ යයි අධිකරණය කල්පනා කරන නියමයන් පිට ආඥාවක් අධිකරණය විසින් කළ හැකි ය. තව ද එබඳු යම් සතු කිරීමේ ආඥාවක් කරනු ලැබූ විට, ඒ කාර්යය සඳහා යම් හිමිකර දීමක් හෝ පැවරීමක් නොමැතිව ඒ ආඥාවේ අඩංගු දේපළ ඒ ආඥාවේ නම් කරනු ලැබූ තැනැත්තා වෙත, ඒ අනුව පැවරිය යුතු ය :

එසේ වුව ද, අයිතිය අත්හරිනු ලැබූ දේපළ බදුකරයක ස්වභාවය දරන අවස්ථාවක, අතුරු බදු ගැනුම්කරුවකු ලෙස හෝ උකස් හිමියකු ලෙස හෝ සමාගම යටතේ හිමිකම් කියන යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට,—

(අ) ගණන් බේරා වසා දැමීම ආරම්භ වන දිනයේ දී ඒ දේපළ සම්බන්ධයෙන් පැවති බද්ද යටතේ සමාගම යටත්ව තිබූ වගකීම් හා බැඳීම්වලට ම ; හෝ

(ආ) අධිකරණය සුදුසු යයි කල්පනා කරන අවස්ථාවක, ඒ දිනයේ දී ම ඒ තැනැත්තාට බද්ද පවරනු ලැබූ විටක බලපවත්වන වගකීම්වලට හා බැඳීම්වලට පමණක්, හෝ

ඒ තැනැත්තා යටත් කරන නියමයන් මත විනා ඒ තැනැත්තාගේ වාසියට පැවරුම් ආඥාවක් අධිකරණය විසින් නොකළ යුතු අතර, යට කී සිද්ධි දෙකෙන් කවර හෝ සිද්ධියක් සිදු වූ විට, (අවස්ථාවට අවශ්‍ය වන්නේ නම්) බදුකරයට අඩංගු වී තිබුනේ සතු කිරීමේ ආඥාවට අඩංගු වී තිබූ දේපළ පමණක් වූ ලෙස සලකනු ලැබිය යුතු ය. තව ද ඒ නියමයන් මත සතු කිරීමේ ආඥාවක් භාර ගැනීම ප්‍රතික්ෂේප කරන යම් අතුරු බදු ගැනුම්කරුවකු හෝ උකස් හිමියකු ඒ දේපළ සම්බන්ධ සියලු ම සම්බන්ධතාවලින් හා ඇපයෙන් බැහැර කළ යුතු ය. එසේම ඒ නියමයන් මත ආඥාවක් භාර ගැනීමට කැමති සමාගම යටතේ හිමිකම් කියන තැනැත්තකු නොමැති අවස්ථාවක පෞද්ගලිකව හෝ නියෝජ්‍ය ස්වරූපයෙන් හෝ තමා විසින් ම හෝ සමාගම හා එක්ව හෝ බද්දෙහි, බදු දීමනාකරුගේ ප්‍රතිඥා ක්‍රියාවේ යෙදීමට ද යටත් වන යම් තැනැත්තකු වෙත, ඒ දේපළ සම්බන්ධයෙන් සමාගමේ බුදලය සහ සම්බන්ධතා, සමාගම විසින් ඇති කර තිබුනු සියලු බුදල්, බැඳීම් හා සම්බන්ධතා වලින් නිදහස් කොට, පවරාදීමේ බලය අධිකරණයට ඇත්තේ ය.

(7) මේ වගන්තියේ විධිවිධාන යටතේ අයිතිය අත්හැරීමක් ක්‍රියාත්මක කිරීමෙන් හානි පැමිණි යම් තැනැත්තකු, හානියේ ප්‍රමාණයට සමාගමේ ණය හිමියකු ලෙස සැලකිය යුතු අතර, ගණන් බේරා වසා දැමීමේ දී එපරිද්දෙන් ම, ඔහු විසින්, ඒ ප්‍රමාණය, ණයක් ලෙස ඔප්පු කරනු ලැබිය හැකි ය.

සමාගමක ක්‍රියාවෙහි යෙදවීමක් හෝ තහනමක් පිළිබඳව ණය හිමියකු සතු අයිතිවාසිකම් සීමා කිරීම.

**378**. (1) සමාගමක භාණ්ඩ හෝ ඉඩම් විෂයෙහි ලා ණය හිමියකු විසින් ක්‍රියාවෙහි යෙදවීමේ ආඥාවක් නිකුත් කරනු ලැබ හෝ සමාගමට ලැබිය යුතු යම් ණයක් තහනම් කරනු ලැබ, ඉක්බිති සමාගම ගණන් බේරා වසා දමනු ලැබූ අවස්ථාවක, ගණන් බේරා වසා දැමීම ආරම්භ කිරීමේ දිනට පෙර, ඔහු විසින්, ක්‍රියාවේ යෙදවීමේ ආඥාව හෝ තහනම සම්පූර්ණ කරනු ලැබුවහොත් මිස, සමාගමට විරුද්ධව ක්‍රියාවෙහි යෙදවීමේ ආඥාවේ හෝ තහනමේ වාසිය තබා ගැනීමට ඔහුට හිමිකම් නොතිබිය යුතු ය :

එසේ වුව ද,—

(අ) ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම සඳහා යෝජනා සම්මතයක් යෝජනා කිරීමට ඇති සභා රැස්වීමක් කැඳවනු ලැබූ බව යම් ණය හිමියකු වෙත දැනුම් දෙනු ලැබූ අවස්ථාවක,

ඉහත සඳහන් විධිවිධානවල කාර්යය සඳහා ගණන් බේරා වසා දැමීම ආරම්භ කිරීමේ දිනය වෙනුවට ණය හිමියා එසේ දැන්වීමක් ලැබූ දිනය ආදේශ කළ යුතු ය ;

(ආ) අධිකරණයේ ආඥාව මගින් කරනු ලබන විකිණීමක් යටතේ, සමාගමක ක්‍රියාවෙහි යෙදවීමේ ආඥාවකට යටත් කරනු ලැබූ යම් භාණ්ඩ සද්භාවයෙන් මිල දී ගන්නා තැනැත්තකුට, ඇවරකරුට විරුද්ධව ඒවා පිළිබඳ මනා අයිතියක් සියලුම අවස්ථාවන්හි දී ලැබිය යුතු ය ; තව ද

(ඇ) මේ උපවගන්තියේ විධිවිධානවලින් ඇවරකරු වෙත පවරනු ලැබූ අයිතිවාසිකම්, අධිකරණය විසින් සුදුසු යයි කල්පනා කරන ප්‍රමාණයට සහ එසේ වූ නියමයන්ට යටත්ව, අධිකරණය විසින් ණයහිමියාගේ වාසියට අවලංගු කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තියේ කාර්යය සඳහා, භාණ්ඩවලට එරෙහිව වූ ක්‍රියාවේ යෙදවීමේ ආඥාවක්, ඒ භාණ්ඩ තහනමට ගෙන විකිණීමෙන් සම්පූර්ණ වූ ලෙස ද ණයක් තහනමට අල්ලා ගැනීම, ඒ ණය ලැබීමෙන් සම්පූර්ණ වූ ලෙස ද සලකනු ලැබිය යුතු අතර, ඉඩමකට එරෙහිව වූ ක්‍රියාවේ යෙදවීමේ ආඥාවක් ඒ දේපළ තහනමට ගැනීමෙන් සහ සාධාරණීය සම්බන්ධතාවක් සම්බන්ධයෙන් වන විට, භාර ගැනුම්කරුවකු පත්කිරීමෙන් සම්පූර්ණ වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ “භාණ්ඩ” යන යෙදුමට, සියලු චංචල දේපළ ඇතුළත් වේ.

(4) යම් දේපළක් කෙරෙහි සෘණ භාරයකට හිමිකම් ඇත්තේ කවර ණය හිමියකුට ද ඒ ණය හිමියා විසින් ඒ දේපළට විරුද්ධව ලබාගත් හෝ ඔහුගේ ප්‍රතිලාභය පිණිස වූ හෝ ක්‍රියාවේ යෙදවීමේ ආඥාවක් ක්‍රියාත්මක කිරීමේ අධිකරණ විධානයක් හෝ තහනමක් සම්බන්ධයෙන් මේ වගන්තියේ අන්තර්ගත කිසිවක් අදාළ නොවිය යුතු ය.

ක්‍රියාවෙහි යෙදවීමෙහි ලා ගත් භාණ්ඩ පිළිබඳව පිස්කල් සතු යුතුකම.

**379**. (1) (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, සමාගමක යම් භාණ්ඩ ක්‍රියාවෙහි යෙදවීමෙහි ලා ගෙන ඒවා විකිණීමට පෙර නැතහොත් පැනවීමේ සම්පූර්ණ ප්‍රමාණය භාර ගැනීමෙන් හෝ අයකිරීමෙන් හෝ ක්‍රියාවෙහි යෙදවීමේ ආඥාව සම්පූර්ණ කිරීමට පෙර, තාවකාලික ඇවරකරුවකු පත් කරනු ලැබූ බව හෝ ගණන් බේරා වසා

දැමීමේ ආඥාවක් කරනු ලැබූ බව හෝ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම සඳහා යෝජනා සම්මතයක් සම්මත කරනු ලැබූ බව පිස්කල් වෙත දැනුම් දෙනු ලැබූ විට, තමන් වෙත නියම කරනු ලැබූ කල්හි පිස්කල් විසින් ක්‍රියාවෙහි යෙදවීමේ ආඥාවේ කොටසක් ගෙවීමෙහි ලා තහනමට ගනු ලැබූ හෝ භාර ගනු ලැබූ භාණ්ඩ හා යම් මුදලක් ඈවරකරු වෙත භාර දිය යුතු ය. එහෙත් ක්‍රියාවෙහි යෙදවීමේ ආඥාවේ පිරිවැය එසේ භාර ගනු ලැබූ භාණ්ඩවලට හෝ මුදල කෙරෙහි ප්‍රථම සෘණ භාරයක් විය යුතු අතර, ඒ සෘණ භාරය ගෙවීමේ කාර්යය සඳහා ඈවරකරු විසින් භාණ්ඩ හෝ ඉන් ප්‍රමාණවත් වූ කොටසක් හෝ විකුණනු ලැබිය හැකි ය.

(2) (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, රුපියල් දෙසිය පනහක් ඉක්මවන මුදලක් සඳහා වූ නඩු තීන්දුවක් සම්බන්ධයෙන් ඇති ක්‍රියාවේ යෙදවීමේ ආඥාව යටතේ විකිණීම වැළැක්වීම සඳහා සමාගම විසින් සමාගමේ භාණ්ඩ විකුණනු ලැබූ හෝ මුදල් ගෙවනු ලැබූ හෝ අවස්ථාවක, විකිණීමෙන් ලැබෙන මුදලින් හෝ ගෙවනු ලැබූ මුදලින්, ක්‍රියාවේ යෙදවීමේ ගාස්තු අඩු කොට, ඇතිවන ශේෂය, දින දහහතරක් ළඟ තබා ගත යුතු ය. තව ද, ඒ කාලය ඇතුළත සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා වූ පෙත්සමක් ඉදිරිපත් කොට ඇති බව හෝ සමාගම ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම සඳහා යෝජනා සම්මතයක් යෝජනා කිරීමට ඇති සභා රැස්වීමක් කැඳවනු ලැබූ බව තමන් වෙත දැනුම් දෙනු ලැබුවහොත් හා සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා අවස්ථාවෝචිත පරිදි ආඥාවක් කරනු ලැබුවහොත් හෝ යෝජනා සම්මතයක් සම්මත කරනු ලැබුවහොත් හෝ පිස්කල් විසින් ඒ ශේෂය ඈවරකරු වෙත ගෙවිය යුතු අතර, ක්‍රියාවේ යෙදවීමේ ආඥාවෙහි සඳහන් ණය හිමියාට ලැබිය යුතු මුදලක් ලෙස එය ළඟ තබා ගැනීමට ඈවරකරු හිමිකම් ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ විධිවිධාන වලින් ඈවරකරු වෙත පවරනු ලැබූ අයිතිවාසිකම්, සුදුසු යයි අධිකරණය විසින් කල්පනා කරන යම් ප්‍රමාණයකට හා යම් නියමයන්ට යටත්ව අධිකරණය විසින් ණය හිමියාගේ වාසියට අවලංගු කරනු ලැබිය හැකි ය.

(4) මේ වගන්තියේ “භාණ්ඩ”යන යෙදුමට, සියලු චංචල දේපළ ඇතුළත් වන අතර, “පිස්කල්”යන යෙදුමට, රිට් ආඥාවක් හෝ වෙනත් අධිකරණ විධානයක් ක්‍රියාවෙහි යෙදවීම භාරව සිටින යම් නිලධරයකු ඇතුළත් වේ.

(5) යම් දේපළක් කෙරෙහි සෘණ භාරයකට හිමිකම් ඇත්තේ කවර ණය හිමියකුට ද ඒ ණය හිමියා විසින් ඒ දේපළට විරුද්ධව ලබාගත් හෝ ඔහුගේ ප්‍රතිලාභය පිණිස වූ හෝ ක්‍රියාවේ යෙදවීමේ ආඥාවක් ක්‍රියාත්මක කිරීමේ අධිකරණ විධානයක් හෝ තහනමක් සම්බන්ධයෙන් මේ වගන්තියේ අන්තර්ගත කිසිවක් අදාළ නොවිය යුතු ය.

## ගණන් බේරා වසා දැමීමට පූර්වකව හෝ ගණන් බේරා වසා දැමීම කරන අතරතුර සිදු කරන වැරදි

ඈවර කරනු ලබන සමාගම්වල නිලධරයන් විසින් සිදු කරනු ලබන වැරදි.

**380**. (1) කරන ලැදැයි කියනු ලබන වරද සිදු කරන අවස්ථාවේ දී අධිකරණය විසින් හෝ එහි අධීක්ෂණය යටතේ හෝ ස්වේච්ඡාවෙන් හෝ ගණන් බේරා වසා දමනු ලබන හෝ ගණන් බේරා වසා දමන ලෙස අධිකරණය විසින් පසුව ආඥා කරනු ලැබූ හෝ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම සඳහා යෝජනා සම්මතයක් පසුව සම්මත කර ගත් සමාගමක ආදී හෝ වර්තමාන නිලධරයකු වූ යම් තැනැත්තකු විසින් —

(අ) තම දැනුම හා විශ්වාසය අනුව, සමාගමේ සියලු චංචල හා නිශ්චල දේපළ ද සමාගමේ සාමාන්‍ය කටයුතුවල දී බැහැර කරනු ලැබූ යම් කොටසක් හැර, එහි යම් කොටසක් සමාගම විසින් කවරාකාරයකින් සහ කවරකු වෙත හා කවර ප්‍රතිෂ්ඨාවක් සඳහා කවර දා ඉවත් කරනු ලැබී ද යන වග ද සම්පූර්ණයෙන් හා සැබෑ ලෙස ඈවරකරු වෙත අනාවරණය කරනු නොලැබුවහොත් ;

(ආ) තම භාරයේ හෝ තම පාලනය යටතේ හෝ ඇත්තා වූ ද භාර දෙන ලෙස නීතියෙන් තමාට නියම කරනු ලබන්නා වූ ද සමාගමේ චංචල හා නිශ්චල දේපළෙහි සියලු කොටස් ඈවරකරු වෙත හෝ ඔහු විධානය කරන පරිදි භාර දීම කරනු නොලැබුවහොත් ;

(ඇ) තම භාරයේ හෝ තම පාලනය යටතේ ඇත්තා වූ ද භාර දෙන ලෙස තමාට නීතියෙන් නියම කරනු ලබන්නා වූ ද සමාගමට අයිති සියලු පොත් හා පත් ඈවරකරු වෙත හෝ ඔහු විධානය කරන පරිදි භාර දීම කරනු නොලැබුවහොත් ;

(ඈ) සමාගමේ කටයුතුවලට අදාළ යම් ප්‍රකාශයක සැලකිය යුතු යම් අත්හැරීමක් කරනු ලැබුවහොත් ;

(ඉ) ගණන් බේරා වසා දැමීම යටතේ යම් තැනැත්තකු විසින් ව්‍යාජ ණයක් ඔප්පු කරනු ලැබූ බව දැනගෙන හෝ විශ්වාස කොට, ඒ ගැන ඈවරකරු වෙත දැනුම් දීම එක් මාසයක කාලයක් පැහැර හැරියහොත් ;

(ඊ) ගණන් බේරා වසා දැමීම ආරම්භ කිරීමේ දිනයෙන් පසු සමාගමේ දේපළට හෝ කටයුතුවලට බලපාන හෝ ඊට අදාළ වූ යම් පොතක් හෝ පතක් ඉදිරිපත් කිරීම වළක්වනු ලැබුවහොත් ;

(උ) ගණන් බේරා වසා දැමීම ආරම්භ කිරීමේ දිනයෙන් පසු හෝ ගණන් බේරා වසා දැමීම ආරම්භ කිරීමේ දිනයට පෙරාතුව ම වූ මාස දොළහ ඇතුළත සමාගමේ ණය හිමියන්ගේ යම් රැස්වීමක දී ව්‍යාජ අලාභ හෝ වියදම් මගින් සමාගමේ දේපළෙහි යම් කොටසක් සම්බන්ධයෙන් ගණන් දැක්වීමට තැත් කරනු ලැබුවහොත් ;

(ඌ) ගණන් බේරා වසා දැමීම ආරම්භ කිරීමේ දිනයට පූර්වයෙන් ම වූ මාස දොළහ ඇතුළත හෝ ඉන් පසු යම් කාලයක යම් ව්‍යාජ කරුණු ඉදිරිපත් කිරීමකින් හෝ වෙනත් වංචාවකින්, සමාගම විසින් පසුව ගෙවීම් කරනු නොලබන යම් දේපළක් සමාගම සඳහා හෝ ඒ වෙනුවෙන් ණයට ලබා ගැනීම කරනු ලැබුවහොත් ;

(එ) ගණන් බේරා වසා දැමීම ආරම්භ කිරීමේ දිනයට පූර්වයෙන් ම වූ මාස දොළහ ඇතුළත හෝ ඉන් පසු යම් කාලයක, සමාගම විසින් එහි ව්‍යාපාරය කර ගෙන යතැයි ව්‍යාජ ඇඟවීමක් යටතේ සමාගම විසින් පසුව ගෙවීම් කරනු නොලබන යම් දේපළක් සමාගම සඳහා හෝ ඒ වෙනුවෙන් ණයට ලබා ගැනීම කරනු ලැබුවහොත් ; හෝ

(ඒ) සමාගමේ කටයුතු හෝ ගණන් බේරා වසා දැමීම හෝ සම්බන්ධයෙන් වූ එකඟවීමකට සමාගමේ ණය හිමියන්ගේ හෝ ඔවුන්ගෙන් කිසිවකුගේ කැමැත්ත ලබා ගැනීමේ කාර්යය සඳහා යම් ව්‍යාජ කරුණු ඉදිරිපත් කිරීමකට හෝ වෙනත් වංචාවකට වරදකරු වුවහොත්,

ඔහු වරදක් කරන අතර, වරදකරු කරනු ලැබීමෙන් පසුව (ඌ), (එ) හා (ඒ) යන ඡේදයන්හි පිළිවෙලින් සඳහන් කරනු ලැබූ වැරදි සම්බන්ධයෙන් නම්, රුපියල් එක් මිලියනයක් නො ඉක්මවන දඩයකට හෝ අවුරුදු පහක් නොඉක්මවන්නා වූ කාලයක් සඳහා බන්ධනාගාරගත

කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය. තව ද මේ උපවගන්තියේ විධිවිධාන යටතේ වෙනත් යම් වරදක් සම්බන්ධයෙන් නම් රුපියල් පන් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන්නා වූ කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය :

එසේ වුව ද, වංචා කිරීමේ චේතනාව තමන් තුළ නොවූ බව චූදිතයා විසින් ඔප්පු කරනු ලැබුවහොත්, එය (අ), (ආ), (ඇ), (ඈ) සහ (එ) යන ඡේදවල විධිවිධාන කිසිවක් යටතේ වූ චෝදනාවකට ද සමාගමේ කටයුතුවල තත්ත්වය වසන් කිරීමේ හෝ නීතිය ව්‍යාර්ථ කිරීමේ චේතනාවක් තමන් තුළ නොවූ බව ඔහු විසින් ඔප්පු කරනු ලැබුවහොත්, එය (ඊ) ඡේදයේ විධිවිධාන යටතේ වූ චෝදනාවකට ද මනා විත්තිවාචකයක් විය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා "නිලධරයා" යන යෙදුමට, සමාගමක අධ්‍යක්ෂවරයන් ක්‍රියා කිරීමට පුරුදුව සිටින්නේ යම් තැනැත්තකුගේ විධාන හෝ උපදෙස්වලට අනුකූලව ද ඒ තැනැත්තා ඇතුළත් වන්නේ ය.

නිසි ගිණුම් තබනු නොලැබූ අවස්ථාවක වගකීම.

**381**. (1) සමාගමක් ගණන් බේරා වසා දමනු ලබන අවස්ථාවක, ගණන් බේරා වසා දැමීම, ආරම්භ කිරීමේ දිනයට පෙරාතුව ම වූ අවුරුදු දෙකක කාලසීමාව හෝ සමාගම සංස්ථාගත කිරීම හා ගණන් බේරා වසා දැමීම ආරම්භ කිරීමේ දිනය අතරතුර කාලසීමාව හෝ යන මේ කාලසීමා දෙකෙන් අඩු කාලසීමාව මුළුල්ලේ සමාගම විසින් නිසි ගිණුම් පොත් තබාගනු නොලැබූ බව පෙන්නුම් කරනු ලැබුවහොත්, සමාගමේ පැහැර හැරීම කර ඇති සෑම නිලධරයකු විසින් ම තමා අවංකව ක්‍රියා කළ බව සහ සමාගමේ කටයුතු කරගෙන යනු ලැබූ අවස්ථානුගත කරුණු අනුව පැහැර හැරීම වැළැක්විය නො හැකි බව පෙන්නුම් කරනු ලැබුවහොත් මිස, ඔහු වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

(2) භාරගනු ලැබූ හා ගෙවනු ලැබූ සියලු මුදල් පිළිබඳ ප්‍රමාණවත් විස්තර සහිතව දවසින් දවස කරනු ලබන සටහන් අන්තර්ගත පොත් ද වෙළෙඳාමට හෝ ව්‍යාපාරයට භාණ්ඩ පිළිබඳ ගණුදෙනු ඇතුළත් වූ අවස්ථාවක, (සාමාන්‍ය සිල්ලර වෙළෙඳාමක විකුණනු ලැබූ භාණ්ඩ හැර) විකුණනු ලැබූ සහ මිලයට ගනු ලැබූ සියලු භාණ්ඩ ඒවායේ ගැණුම්කරුවන් හා විකුණුම්කරුවන් හඳුනාගත හැකි වනු පිණිස ඒ භාණ්ඩ ද ඒවායේ ගැණුම්කරුවන් හා විකුණුම්කරුවන් ප්‍රමාණවත් අයුරින් විස්තර කොට දැක්වෙන පරිදි විකුණනු ලැබූ හා මිලයට ගනු ලැබූ සියලු ම භාණ්ඩ

පිළිබඳවත් ප්‍රකාශයක් ද ඇතුළුව, සමාගමේ වෙළෙඳාම හෝ ව්‍යාපාරය පිළිබඳව ගණුදෙනු හා මුදල් තත්ත්වය දැක්වීමට හා පැහැදිලි කිරීමට ද අවශ්‍ය විය හැකි පොත් හෝ ගිණුම් යම් සමාගමක් සම්බන්ධයෙන් තබාගනු නොලැබුවහොත්, මේ වගන්තියේ කාර්ය සඳහා සමාගමක් සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් තබාගනු නොලැබූ සේ සැලකිය යුතු ය.

සමාගමේ වරදකාර නිලධරයන්ට සහ සාමාජිකයන්ට නඩු පැවරීම.

**382**. (1) අධිකරණය විසින් හෝ අධිකරණයේ අධීක්ෂණයට යටත්ව හෝ කරනු ලබන ගණන් බේරා වසා දැමීමක දී සමාගමේ යම් ආදී හෝ වර්තමාන නිලධරයකු නැතහොත් යම් කොටස් හිමියකු සමාගම සම්බන්ධයෙන් අපරාධ වරදකට යටත් වන යම් වරදකට වරදකරු වී සිටින බව අධිකරණයට පෙනී ගිය අවස්ථාවක ගණන් බේරා වසා දැමීමට සම්බන්ධතාවක් ඇති යම් තැනැත්තකු විසින් කරනු ලබන ඉල්ලීමක් මත හෝ සිය මෙහෙයීමෙන් ම හෝ අධිකරණය විසින් වරදකරුට විරුද්ධව තමාම නඩු පවරන ලෙස හෝ කාරණය නීතිපතිවරයා වෙත යොමු කරන ලෙස ඈවරකරුහට නියම කරනු ලැබිය හැකි ය.

(2) ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමක දී සමාගමේ යම් ආදී හෝ වර්තමාන නිලධරයකු නැතහොත් යම් කොටස් හිමියකු සමාගම සම්බන්ධයෙන් අපරාධ වරදකට යටත්වන යම් වරදකට වරදකරු වී සිටින බව ඈවරකරුට පෙනී ගිය අවස්ථාවක, ඈවරකරු විසින් කාරණය ගැන නීතිපතිවරයා වෙත නොපමාව වාර්තා කළ යුතු අතර, නීතිපතිවරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් තොරතුරු සපයා දී සඳහන් කරන ලද කාරණය සම්බන්ධයෙන් ඈවරකරු සන්තකයේ හෝ ඔහුගේ පාලනය යටතේ ඇති තොරතුරු හෝ ලියවිලි වන්නා වූ යම් තොරතුරු හෝ ලියවිලි ඉදිරිපත් කළ යුතු අතර, ඒවා පරීක්ෂා කිරීම හා ඒවායින් පිටපත් ගැනීම ද සඳහා ඒවාට ප්‍රවේශය හා පහසුකම් ලබා දිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ විධිවිධාන යටතේ නීතිපතිවරයා වෙත යම් වාර්තාවක් සපයනු ලැබූ අවස්ථාවක, සුදුසු යයි ඔහු කල්පනා කරන්නේ නම්, විභාග කිරීම සඳහා ඔහු විසින් ඒ කාරණය රෙජිස්ට්‍රාර්වරයා වෙත යොමු කරනු ලැබිය හැකි ය. එවිට, රෙජිස්ට්‍රාර්වරයා විසින් කාරණය විභාග කොට, උචිත යයි ඔහු විසින් කල්පනා කරන්නේ නම්, අදාළ සමාගම සම්බන්ධයෙන් තමන් වෙත හෝ ඒ කාර්යය සඳහා තමන් විසින් නම් කරනු ලැබූ යම් තැනැත්තකු වෙත, සමාගමේ කටයුතු විභාග කිරීම පිළිබඳව අධිකරණය විසින් කරනු ලබන ගණන් බේරා වසා දැමීමක දී මේ පනතින් විධිවිධාන සලස්වා ඇති පරිදි සියලු ම බලතල පැවරීමේ ආඥාවක් අධිකරණයෙන් ඉල්ලිය හැකි ය.

(4) (2) වන උපවගන්තියේ විධිවිධාන යටතේ නීතිපතිවරයා වෙත යවනු ලැබූ යම් වාර්තාවකින්, එය තමන් විසින් නඩු කටයුතු මෙහෙයවිය යුතු කාරණාවක් නොවන බව නීතිපතිවරයාට පෙනී ගියහොත්, ඔහු විසින් ඒ අනුව ඇවරකරු වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය. එවිට අධිකරණයෙන් ලබා ගත් පූර්ව අනුඥාවට යටත්ව, වරදකරුට විරුද්ධව ඇවරකරු විසින් ම නඩු කටයුතු මෙහෙයවනු ලැබිය හැකි ය.

(5) ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමක දී, සමාගමේ යම් ආදී හෝ වර්තමාන නිලධරයකු හෝ යම් කොටස් හිමියකු ඉහත කී ලෙස වරදකරු වී සිටින බව හා (2) වන උපවගන්තියේ විධිවිධාන යටතේ ඇවරකරු විසින් කාරණය පිළිබඳ වාර්තාවක් නීතිපතිවරයා වෙත යවා නැති බවත් අධිකරණයට පෙනී ගිය අවස්ථාවක, ඒ අධිකරණය විසින්, ගණන් බේරා වසා දැමීමට සම්බන්ධ වූ යම් තැනැත්තකු විසින් ඉල්ලුම් කරනු ලැබූ විට නැතහොත් ස්වකීය මෙහෙයීමෙන්ම ඒ වාර්තාව සපයන ලෙස ඇවරකරුට විධාන කළ හැකි ය. තව ද ඒ අනුව වාර්තාවක් සපයනු ලැබූ විට, (2) වන උපවගන්තියේ විධිවිධාන අනුව වාර්තාව සපයනු ලැබූ විටක මෙන්, මේ වගන්තියේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

(6) මේ වගන්තියේ විධිවිධාන යටතේ යම් කාරණයක් නීතිපතිවරයා වෙත වාර්තා කරනු ලැබූ නැතහොත් යොමු කරනු ලැබූ අවස්ථාවක, එය නඩුවක් පැවරිය යුතු කාරණාවක් යයි නීතිපතිවරයා විසින් සලකනු ලැබුවහොත්, ඒ අනුව ඔහු විසින් නඩු කටයුතු මෙහෙයවිය යුතු ය. එවිට පැමිණිල්ල සම්බන්ධයෙන් ඇවරකරු ද (නඩු කටයුතුවල චූදිතයන් හැර) සමාගමේ ආදී හා වර්තමාන සෑම නිලධරයා හා අනුයෝජිතයා විසින් සාධාරණව නීතිපතිවරයාට දිය හැකි නඩු කටයුත්තට සම්බන්ධ සියලු ම සහාය දීම ඔවුන්ගේ යුතුකම වන්නේ ය.

මේ උපවගන්තියේ කාර්යය සඳහා, සමාගමක් සම්බන්ධයෙන් "අනුයෝජිතයා" යන යෙදුමට, සමාගමේ යම් බැංකුකරුවකු හෝ නීතිඥවරයකු ද සමාගමේ නිලධරයකු වුවත් නොවුවත් විගණකවරයා ලෙස සමාගම විසින් සේවයෙහි නියුක්ත කරවනු ලැබූ යම් තැනැත්තකු ද ඇතුළත් වන ලෙස සැලකිය යුතු ය.

(7) (6) වන උපවගන්තියෙන් නියමිත ආකාරයෙන් සහායදීම යම් තැනැත්තකු විසින් පැහැර හරිනු ලැබුවහොත් හෝ අතපසු කරනු ලැබුවහොත්, නීතිපතිවරයා විසින් ඉල්ලුම් කරනු ලැබූ විට, අධිකරණය විසින් එකී උපවගන්තියේ නියම අනුව කටයුතු කරන ලෙස ඒ තැනැත්තාට විධාන කරනු ලැබිය හැකි ය. තව ද ඇවරකරුවකු සම්බන්ධයෙන් එවැනි යම් ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක, නියම අනුව කටයුතු කිරීම පැහැර

හැරියේ හෝ අතපසු වූයේ එසේ නියම අනුව කටයුතු කිරීම කළ හැකි වනු පිණිස සමාගමේ වත්කම් සෑහෙන ප්‍රමාණයක් ඈවරකරු ළඟ නොතිබීම හේතුකොට ගෙන බව පෙනී ගියහොත් මිස, ඉල්ලුම් කිරීමේ පිරිවැය ඈවරකරු විසින් පෞද්ගලිකව ම දැරිය යුතු යයි අධිකරණය විසින් විධාන කළ හැකි ය.

### ගණන් බේරා වසා දැමීම පිළිබඳ පරිපූරක විධිවිධාන

**383**. (1) මෙහි පහත සඳහන් කිසිම තැනැත්තකු සමාගමක ඈවරකරු ලෙස පත් කරනු ලැබීම හෝ ක්‍රියා කිරීම නොකළ යුතු ය :— ඈවරකරුවන්ගේ සුදුසුකම්.

(අ) වයස අවුරුදු දහඅටට අඩු තැනැත්තෙක් ;

(ආ) ගණන් බේරා වසා දමනු ලබන සමාගමේ ණය හිමියෙක් ;

(ඇ) ගණන් බේරා වසා දැමීම ආරම්භවීමට පෙරාතුව ම වර්ෂ දෙක ඇතුළත, සමාගමේ හෝ සම්බන්ධිත සමාගමක හෝ කොටස්හිමියකුව, අධ්‍යක්ෂවරයකුව, විගණකවරයකුව හෝ භාර ගැනුම්කරුවකුව සිටි තැනැත්තෙක් ;

(ඈ) නිදහස් නොකළ බංකොලොත්කරුවෙක් ;

(ඉ) (227 වන අධිකාරය වූ) මානසික රෝග ආඥාපනතේ විධිවිධාන යටතේ සිහි විකල තැනැත්තකු ලෙස තීරණය කරනු ලැබූ තැනැත්තෙක් ;

(ඊ) 468 වන වගන්තිය යටතේ ආඥාවක් කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තෙක් ;

(උ) 1982 අංක 17 දරන සමාගම් පනතේ 186 වන වගන්තිය යටතේ සමාගමක අධ්‍යක්ෂ ධුරයක් දැරීම හෝ ප්‍රවර්ධකයකු ලෙස ක්‍රියා කිරීම හෝ කළමනාකරණයට සම්බන්ධවීම හෝ සහභාගිවීම හෝ තහනම්ව ඇති තැනැත්තකු හෝ ඒ පනත ඉවත් කරනු ලැබීම නිසා නොවේ නම් එසේ තහනම් කරනු ලැබීමට ඉඩ ඇති තැනැත්තකු ;

(ඌ) 213 හෝ 214 වන වගන්ති යටතේ සමාගමක අධ්‍යක්ෂ ධුරයක් දැරීම හෝ ප්‍රවර්ධකයකු වීම හෝ සමාගමක කළමනාකරණයට සම්බන්ධවීම හෝ සහභාගි වීම හෝ තහනම්ව ඇති තැනැත්තකු.

(2) සංස්ථාවක්, ඇවරකරුවකු ලෙස පත් කරනු ලැබීම හෝ ක්‍රියා කිරීම හෝ නොකළ යුතු ය.

(3) (1) වන උපවගන්තියේ හෝ (2) වන උපවගන්තියේ හෝ විධිවිධාන උල්ලංඝනය වන සේ ක්‍රියා කරන සෑම තැනැත්තකු ම වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙලක්ෂයක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

ඇවරකරු වශයෙන් පත් කිරීම කෙරෙහි බලපාන දූෂිත පෙළඹවීම.

**384**. සමාගමක ඇවරකරු ලෙස තමා පත් කරවා හෝ නම් කරවා ගැනීමේ අදහසින් හෝ තමා හැර වෙනත් තැනැත්තකු පත් කිරීම හෝ නම් කිරීම සිදුකරවා ගැනීමේ හෝ වැළැක්වීමේ අදහසින් සමාගමේ යම් කොටස් හිමියකුට හෝ ණය හිමියකුට යම් වටිනා ප්‍රතිෂ්ඨාවක් දෙන හෝ දීමට එකඟවන හෝ ඉදිරිපත් වන යම් තැනැත්තකු වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් දෙලක්ෂයක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

වාර්තා ආදිය පිළියෙල කිරීමට ඇවරකරු සතු කාර්යය ක්‍රියාත්මක කිරීම.

**385**. (1) අවස්ථාවෝචිත පරිදි, යම් ගිණුමක්, ලියවිල්ලක් හෝ වාර්තාවක් ගොනු කිරීමෙහි, භාරදීමෙහි හෝ පිළියෙල කිරීමෙහි ලා නැතහොත් ගොනු කිරීමට, භාරදීමට, පිළියෙල කිරීමට හෝ දීමට තමාට නීතියෙන් නියම කරනු ලබන යම් දැන්වීමක් දීමෙහි ලා යම් පැහැර හැරීමක් කොට ඇති යම් ඇවරකරුවකු විසින් පැහැර හැරීම පියවීමට තමන් වෙත නියම කරනු ලබන දැන්වීමක් භාරදීමේ දින සිට දින දහයක් ඇතුළත එසේ කළ නොහැකි වුවහොත්, සමාගමේ යම් සහදායකයකු හෝ ණය හිමියකු විසින් නැතහොත් රෙජිස්ට්‍රාර්වරයා විසින් අධිකරණය වෙත ඉල්ලුම් කරනු ලැබූ විට, ආඥාවේ නිශ්චය කරනු ලැබිය හැකි කාලයක් ඇතුළත පැහැර හැරීම පියවීමට ඇවරකරුට විධාන කෙරෙන ආඥාවක් අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.

(2) ඉල්ලීම් පිළිබඳ වූ ද ඊට ආනුෂංගික වූ ද සියලුම පිරිවැය ඇවරකරු විසින් දැරිය යුතු යයි (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ කරන ලද යම් ආඥාවකින් විධිවිධාන සලස්වනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් යම් පැහැර හැරීමක් සම්බන්ධයෙන් ඇවරකරුවකුට දණ්ඩන පනවනු ලබන යම් ලිඛිත නීතියක් ක්‍රියාත්මක වීමට හානිකර වන ලෙස මේ වගන්තියේ කිසිවක් වටහා නොගත යුතු ය.

**386**. (1) අධිකරණය විසින් හෝ එහි අධීක්ෂණය යටතේ වුව ද නැතහොත් ස්වේච්ඡාවෙන් වුව ද සමාගමක් ගණන් බේරා වසා දමනු ලබන අවස්ථාවක, සමාගම හෝ සමාගමේ ඈවරකරු හෝ සමාගමේ දේපළ භාරගන්නකු නැතහොත් කළමනාකරුවකු විසින් හෝ වෙනුවෙන් නිකුත් කරනු ලැබ, සමාගමේ නම, මතුපිට හෝ ඇතුළත දැක්වෙන ලියවිල්ලක් වූ සෑම බඩු විස්තර ලේඛනයක, බඩු ඕඩරයක හෝ ව්‍යාපාර ලිපියක ම සමාගම ගණන් බේරා වසා දමනු ලබන බවට ප්‍රකාශයක් අන්තර්ගත විය යුතු ය.

සමාගමක් ඈවරකරනු ලබන බව දැනුම්දීම.

(2) මේ වගන්තියේ විධිවිධාන අනුව ක්‍රියා කිරීමෙහි ලා පැහැර හැරීමක් කරනු ලැබූ අවස්ථාවක, සමාගම සහ පැහැර හැරීමට දැනුවත්ව ම හා ඕනෑකමින් ම බලය දෙන හෝ අවසර දෙන පහත සඳහන් යම් තැනැත්තකු, එනම් සමාගමේ යම් නිලධරයකු, සමාගමේ යම් ඈවරකරුවකු සහ යම් භාර ගැණුම්කරුවකු හෝ කළමනාකරුවකු වරදක් කරන අතර, රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

**387**. සමාගමක් අධිකරණය විසින් ගණන් බේරා වසා දමනු ලබන හෝ ණය හිමියන්ගේ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දමනු ලබන අවස්ථාවක—

සමාගම ගණන් බේරා වසා දැමීමේ දී ඇතැම් ලේඛන මුද්දර ගාස්තුවලින් නිදහස් කිරීම.

(අ) සමාගමේ වත්කම්වල කොටසක් වූ ද ඔප්පුව ලියා අත්සන් කර දීමෙන් පසු සමාගමේ වත්කම්වල කොටසක් වූ හෝ කොටසක්ව පවතින්නා වූ ද, චංචල හෝ නිශ්චල දේපළකට පමණක් අදාළ වූ හෝ ඒ දේපළ මත යම් උකසක්, බැඳීමක් හෝ වෙනත් පිළිබැඳුමක් නැතහොත් එවැනි යම් දේපළක යම් හිමිකමක්, අයිතිවාසිකමක් හෝ සම්බන්ධතාවක් ඇති කරන්නා වූ ද සෑම ඔප්පුවක ම ; සහ

(ආ) එසේ ගණන් බේරා වසා දමනු ලබන යම් සමාගමක දේපළට නැතහොත් එවැනි යම් ගණන් බේරා වසා දැමීමක් යටතේ වූ යම් ක්‍රියා පරිපාටියකට පමණක් අදාළ වූ සෑම ඇටෝර්නි බලයක්, ප්‍රතියුක්ති පත්‍රයක්, රිට් ආඥාවක්, ආඥාවක්, සහතිකයක්, දිවුරුම් පත්‍රයක්, බැඳුම්කරයක් හෝ වෙනත් සාධන පත්‍රයක් නැතහොත් ලියවිල්ලක් ද,

මුද්දර ගාස්තුවලින් නිදහස් විය යුතු ය.

**388**. සමාගමක් ගණන් බේරා වසා දමනු ලබන අවස්ථාවක, සමාගමේ හා ඈවරකරුවන්ගේ සියලු පොත් හා පත්, ඒවායේ සටහන් කොට ඇතැයි හැඟෙන සියලු ම කරුණුවල සත්‍යතාව සම්බන්ධයෙන් සමාගමේ සහදායකයන් අතර බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

සමාගමේ පොත් සාක්ෂි විය යුතු බව.

සමාගමේ පොත් හා පත් බැහැර කිරීම.

**389**. (1) සමාගමක් ගණන් බේරා වසා දමනු ලැබ, විසුරුවා හැරීමට ආසන්නව තිබෙන අවස්ථාවක, සමාගමේ හා ඈවරකරුවන්ගේ පොත් හා පත් පහත දැක්වෙන ආකාරයෙන් බැහැර කළ හැකි ය :—

(අ) අධිකරණය විසින් හෝ එහි අධීක්ෂණයට යටත්ව කරනු ලබන ගණන් බේරා වසා දැමීමක් වූ විටක අධිකරණය විසින් විධාන කරනු ලැබිය හැකි යම් ආකාරයකින් ;

(ආ) සාමාජිකයන්ගේ ස්වේච්ඡාවෙන් කරනු ලබන ගණන් බේරා වසා දැමීමක් වූ විටක සමාගමේ අතිවිශේෂ යෝජනා සම්මතයක් මගින් විධාන කරනු ලැබිය හැකි යම් අයුරින් හා ණය හිමියන්ගේ ස්වේච්ඡාවෙන් කරනු ලබන ගණන් බේරා වසා දැමීමක් නම්, පරීක්ෂණ කමිටුව විසින් හෝ ඒ කමිටුව නොමැතිව නම්, සමාගමේ ණය හිමියන් විසින් විධාන කරනු ලැබිය හැකි යම් ආකාරයකින්.

(2) සමාගම විසුරුවා හරිනු ලැබීමේ දින සිට අවුරුදු පහකට පසු සමාගමට, ඈවරකරුවන්ට හෝ පොත් හා පත් භාර කරනු ලැබූ යම් තැනැත්තකුට, යම් පොතකට හෝ පතකට සම්බන්ධතාවක් ඇතැයි හිමිකම් පාන යම් තැනැත්තකු වෙත එය ඉදිරිපත් නොකිරීම හේතුවෙන් කිසිදු වගකීමක් නො පැවරිය යුතු ය.

(3) ගණන් බේරා වසා දමනු ලැබූ සමාගමක පොත් හා පත් විනාශ කිරීම සුදුසු යයි රෙජිස්ට්‍රාර්වරයා කල්පනා කරන (සමාගම විසුරුවා හරිනු ලැබීමේ දිනයෙන් පසු අවුරුදු පහක් නොඉක්මවන) කාලයක් රෙජිස්ට්‍රාර්වරයා විසින් වැළැක්විය හැකිවනු පිණිසත්, සමාගමේ යම් ණය හිමියකු හෝ ආධාරකරුවකු විසින් රෙජිස්ට්‍රාර්වරයා වෙත කරුණු ඉදිරිපත් කිරීම හා රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ කාරණය පිළිබඳව කරනු ලැබිය හැකි යම් විධානයකට විරුද්ධව අධිකරණ වෙත අභියාචනය කළ හැකි වනු පිණිසත් රීති සාදනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තියේ විධිවිධාන යටතේ සාදනු ලැබූ රීතියක් හෝ ඒ උපවගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් දෙනු ලැබූ යම් විධානයක් කඩ කරමින් යම් තැනැත්තකු ක්‍රියා කළ අවස්ථාවක ඔහු වරදකට වරදකරු වන අතර, රුපියල් දෙලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

**390**. (1) ගණන් බේරා වසා දැමීම ආරම්භ කිරීමේ දින සිට අවුරුද්දක් ඇතුළත එය අවසන් කරනු නොලැබූ අවස්ථාවක, ගණන් බේරා වසා දැමීම අවසන් කරනු ලබන තෙක්, නියම කරනු ලැබිය හැකි අතරවාරවල දී ඈවරකරුවකු විසින් නියමිත ආකෘතියෙහි වූ ද ඈවර කිරීමේ ක්‍රියා පටිපාටිය හා තත්ත්වය සම්බන්ධයෙන් නියමිත විස්තර අන්තර්ගත වූ ද ප්‍රකාශයක් රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතු ය.

නොනිමි ඈවර කිරීම් පිළිබඳ තොරතුරු.

(2) ඈවරකරුවකු විසින් මේ වගන්තියේ විධිවිධාන අනුව කටයුතු කිරීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක ඔහු වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

**391**. සමාගමක ණය හිමියන් හෝ සහදායකයින් කිසිවකුගේ අඩාලව කල් තබන ලද සභා රැස්වීමක දී යෝජනා සම්මතයක් සම්මත කරනු ලැබූ අවස්ථාවක, යෝජනා සම්මතය ඇත්ත වශයෙන් සම්මත කරගනු ලැබූ දිනයේ දී එය සම්මත කරගත් ලෙස සියලු කාර්යය සඳහා සැලකිය යුතු අතර, ඊට කලින් යම් දිනයක සම්මත කරගනු ලැබූ ලෙස සලකනු නොලැබිය යුතු ය.

ණය හිමියන්ගේ හා සහදායකයින්ගේ අඩාලව කල් තැබූ සභා රැස්වීම්වල දී සම්මත වූ යෝජනා සම්මතයන්.

## අධිකරණය සතු අතිරේක බලතල

**392**. (1) සමාගමක් ගණන් බේරා වසා දැමීමට සම්බන්ධ වූ සියලුම කරුණු පිළිබඳව, ප්‍රමාණවත් අන්දමේ යම් සාක්ෂියකින් ඔප්පු කරනු ලැබ ඇති අයුරින්, සමාගමේ ණය හිමියන්ගේ හෝ සහදායකයින්ගේ අභිප්‍රායයන්ට අධිකරණය විසින් සැලකිල්ල දැක්විය හැකි ය. තව ද ඒ අභිප්‍රායයන් නිශ්චය කොට දැන ගැනීමේ කාර්යය සඳහා සුදුසු යයි කල්පනා කරයි නම්, අධිකරණය විසින් නියම කරනු ලබන ආකාරයකින් ණය හිමියන්ගේ හෝ සහදායකයින්ගේ සභා රැස්වීම් කැඳවීම, පැවැත්වීම හා හැසිරවීම කරන ලෙස නියම කළ හැකි අතර, එවැනි යම් සභා රැස්වීමක සභාපති ලෙස ක්‍රියා කිරීමටත් එහි ප්‍රතිඵලය අධිකරණය වෙත වාර්තා කිරීමටත් තැනැත්තකු පත් කළ හැකි ය.

ණය හිමියන්ගේ හෝ සහදායකයන්ගේ ඇතැම් අභිප්‍රාය නිශ්චය කොට දැනගැනීම පිණිස වූ සභා රැස්වීම්.

(2) ණය හිමියන් සම්බන්ධයෙන් වූ විට, එක් එක් ණය හිමියාගේ ණයෙහි වටිනාකම කෙරෙහි සැලකිල්ල දැක්විය යුතු ය.

(3) සහදායකයින් සම්බන්ධයෙන් වූ විට, මේ පනතින් හෝ ව්‍යවස්ථාවලියෙන් එක් එක් සහදායකයා වෙත පවරනු ලබන ඡන්ද සංඛ්‍යාව කෙරෙහි සැලකිල්ල දැක්විය යුතු ය.

## විසුරුවා හැරීම පිළිබඳ විධිවිධාන

සමාගමක් විසුරුවා හැරීම බලරහිත යයි ප්‍රකාශ කිරීමට අධිකරණය සතු බලය.

**393**. (1) සමාගමක් විසුරුවා හරිනු ලැබූ අවස්ථාවක, ඈවරකරු විසින් හෝ සම්බන්ධතාවක් ඇතැයි අධිකරණයට පෙනෙන යම් තැනැත්තකු විසින් හෝ ඒ කාර්යය සඳහා ඉල්ලීමක් කරනු ලැබූ විට, විසුරුවා හැරීමේ දින සිට, අවුරුදු දෙකක් ඇතුළත යම් කාලයක දී විසුරුවා හැරීම බලරහිත යයි ප්‍රකාශ කරනු ලබන ආඥාවක් සුදුසු යයි අධිකරණය කල්පනා කරන නියම අනුව අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය. එවිට සමාගම විසුරුවා හරිනු නොලැබූ විටක කරනු ලැබිය හැකි වූ යම් නඩු කටයුත්තක් කරනු ලැබිය හැකි ය.

(2) ආඥාව කිරීමේ දින සිට දින හතක් හෝ අධිකරණය විසින් ඉඩ දෙනු ලැබිය හැකි වැඩිදුර කාලයක් ඇතුළත, ලියාපදිංචි කිරීම සඳහා ආඥාවේ සහතික කළ පිටපතක්, රෙජිස්ට්‍රාර්වරයා වෙත භාරදීම (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ වූ ආඥාව කරනු ලැබීමට හේතු වූ ඉල්ලීම කළ තැනැත්තාගේ කාර්යය වන්නේ ය. තව ද ඒ තැනැත්තා විසින් එසේ කිරීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක ඔහු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් පනස් දහසක් නොඉක්මවන්නා වූ දඩයකට ඔහු යටත් විය යුතු ය.

ක්‍රියා විරහිත බවට පත්ව ඇති සමාගමක් රෙජිස්ට්‍රාර්වරයා විසින් ලේඛනයෙන් කපා හැරිය හැකි බව.

**394**. (1) සමාගමක් ව්‍යාපාරය කරගෙන නොයන බව හෝ එය ක්‍රියාත්මකව ඇති බව හෝ විශ්වාස කිරීමට රෙජිස්ට්‍රාර්වරයාට සාධාරණ හේතුවක් ඇති අවස්ථාවක, සමාගම ව්‍යාපාරය කරගෙන යන්නේ දැයි හෝ ක්‍රියාත්මකව ඇත්දැයි විමසා ලිපියක් ඔහු විසින් සමාගම වෙත තැපෑලෙන් යවනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් ලිපිය යැවූ දින සිට එක් මාසයක් ඇතුළත, රෙජිස්ට්‍රාර්වරයා වෙත ඒ ලිපියට කිසි පිළිතුරක් නොලැබුණු අවස්ථාවක, එකී එක් මාසයක කාලසීමාව ඉකුත් වූ දින සිට දවස් දහයක් ඇතුළත, ඔහු විසින් සමාගම වෙත, පළමු ලිපිය ගැන සඳහන් කරමින් සහ ඊට පිළිතුරක් නොලැබුණු බව ද සඳහන් කරමින් ලියාපදිංචි තැපෑලෙන් ලිපියක් යවනු ලැබිය යුතු අතර, එම දෙවන ලිපියේ දින සිට එක් මාසයක් ඇතුළත පිළිතුරක් නොලැබුණහොත් සමාගමේ නම රෙජිස්ටරයෙන් කපා හැරීම පිණිස ගැසට්පත්‍රයේ නිවේදනයක් පළ කරන බව ද එමගින් ප්‍රකාශ කළ යුතු ය.

(3) සමාගම විසින් ව්‍යාපාරය කරගෙන නොයන බවට හෝ එය ක්‍රියාත්මකව නොමැති බවට (2) වන උපවගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් පිළිතුරක් ලැබුවහොත් හෝ දෙවන ලිපිය යැවීමෙන්

පසු එක් මාසයක් ඇතුළත, යම් පිළිතුරක් නොලැබුවහොත් හෝ ඔහු විසින්, ගැසට් පත්‍රයේ දැන්වීමක් පළ කොට, ඒ දැන්වීමේ දින සිට මාස තුනක් ගතවීමේ දී, පටහැනිව හේතු නොදැක්වුවහොත්, එහි සඳහන් සමාගමේ නම රෙජිස්ටරයෙන් කපා හැර, විසුරුවා හරිනු ලබන බවට වූ ඒ දැන්වීම සමාගම වෙත තැපෑලෙන් යැවිය හැකි ය.

(4) සමාගමක් ගණන් බේරා වසා දමනු ලබන අවස්ථාවක, ඈවරකරුවකු ක්‍රියා නොකරන බව හෝ සමාගමේ කටයුතු සම්පූර්ණයෙන් ගණන් බේරා වසා දමා ඇති බවත් ඈවරකරු විසින් මේ පනතේ විධිවිධාන යටතේ පිළියෙළ කිරීමට නියමිත වාර්තා පිට පිටම මාස හයක කාල සීමාවක් තුළ පිළියෙළ කොට නොමැති බවත් විශ්වාස කිරීමට යුක්ති සහගත හේතුවක් රෙජිස්ට්‍රාර්වරයාට ඇති වුවහොත්, (3) වන උපවගන්තියේ සඳහන් දැන්වීමක් රෙජිස්ට්‍රාර්වරයා විසින් ගැසට් පත්‍රයේ පළ කොට, එය සමාගම වෙත හෝ යම් ඈවරකරුවකු වුවහොත්, ඔහු වෙත යවනු ලැබිය යුතු ය.

(5) (4) වන උපවගන්තියේ විධිවිධාන යටතේ දෙනු ලබන දැන්වීමේ සඳහන් කරනු ලැබූ කාලය ඉකුත්වීමේ දී සමාගම විසින් පටහැනි හේතුවක් කලින් දක්වා ඇත්නම් මිස, රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ සමාගමේ නම, රෙජිස්ටරයෙන් කපා හරිනු ලැබිය හැකි අතර, ඒ පිළිබඳ දැන්වීමක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය. තවද දැන්වීම ගැසට්පත්‍රයෙහි එසේ පළ කරනු ලැබූ විට, සමාගම විසුරුවා හරිනු ලැබිය යුතු ය :

එසේ වුව ද,—

(අ) සමාගමේ සෑම අධ්‍යක්ෂවරයකුගේ, කළමනාකරුවකුගේ හා කොටස් හිමියකුගේ යම් බැරකමක් වුවහොත්, එය නොකඩවා පැවතිය යුතු අතර, සමාගම විසුරුවා හරිනු නොලැබූ විටක මෙන් බලාත්මක කරනු ලැබිය හැකි ය;

(ආ) ලේඛනයෙන් නම කපා හරිනු ලැබූ සමාගමක් ගණන් බේරා වසා දැමීමට අධිකරණය සතුව ඇති බලය කෙරෙහි මේ උපවගන්තියේ විධිවිධාන කිසිවක් බල නොපෑ යුතු ය.

(6) සමාගමක් ලේඛනයෙන් කපාහරිනු ලැබීම හේතු කොට ගෙන අවස්ථාවෝචිත පරිදි, සමාගම හෝ එහි යම් කොටස්හිමියකු නැතහොත් ණයකරුවකු අතෘප්තියට පත් වුවහොත්, (5) වන උපවගන්තියේ සඳහන් දැන්වීම ගැසට් පත්‍රයෙහි පළ කිරීමේ සිට, අවුරුදු දහයක් ඉකුත්වීමට පෙර සමාගම විසින් හෝ කොටස්හිමියකු නැතහොත් ණයකරු විසින් හෝ ඉල්ලුම් කරනු ලැබූ විට, කපා හරිනු ලැබූ අවස්ථාවේ දී, ව්‍යාපාරය

කර ගෙන යමින් හෝ ක්‍රියාත්මකව තිබූ බව හෝ අන්‍යාකාරයකින් සමාගමේ නම ලේඛනයේ පුනස්ථානයට පත් කිරීම සාධාරණ බව අධිකරණය සෑහීමකට පත් වන්නේ නම් අධිකරණය විසින් සමාගමේ නම ලේඛනයේ පුනස්ථානයට පත් කරන ලෙස ආඥා කරනු ලැබිය හැකි ය. තව ද ආඥාවේ සහතික කළ පිටපතක්, ලියාපදිංචි කිරීම සඳහා රෙජිස්ට්‍රාර්වරයා වෙත භාරදෙනු ලැබූ විට සමාගමේ නම ලේඛනයෙන් කපාහරිනු නොලැබූ විටක මෙන් එය නොකඩවා පැවති ලෙස සැලකිය යුතු ය ; තව ද සමාගමේ නම ලේඛනයෙන් කපාහරිනු නොලැබූ විටක තිබිය හැකි තත්ත්වයට ආසන්නතම තත්ත්වයක සමාගම හා වෙනත් සියලු තැනැත්තන් තැබීම සඳහා සාධාරණ යයි පෙනෙන විධාන දීම හා විධිවිධාන සැලැස්වීම අධිකරණය විසින් ඒ ආඥාවෙන් කරනු ලැබිය හැකි ය.

(7) මේ වගන්තියේ විධිවිධාන යටතේ ඇවරකරුවකු වෙත යැවිය යුතු දැන්වීමක්, ඇවරකරුගේ අන්තිමට දැන සිට ව්‍යාපාර ස්ථානයෙහි දී ලැබෙන පරිදි ඔහු වෙත යවනු ලැබිය හැකි ය. තව ද මේ වගන්තියේ විධිවිධාන යටතේ සමාගමක් වෙත යැවිය යුතු ලිපියක් හෝ දැන්වීමක් සමාගමේ ලියාපදිංචි කළ කාර්යාලය වෙත හෝ කාර්යාලය ලියාපදිංචි කොට නොමැති අවස්ථාවක, සමාගම විසින් රෙජිස්ට්‍රාර්වරයා වෙත එවා ඇති වාර්ෂික වාර්තාවල හෝ වෙනත් යම් ලේඛනවල සමාගමේ යම් නිලධරයකුගේ ඉතාමත් මෑත ලිපිනය ලෙස වාර්තාගත වී තිබෙන ලිපිනයට, ඒ නිලධරයාගේ භාරයට යවනු ලැබිය හැකි ය.

විසුරුවා හරිනු ලැබූ සමාගමක දේපළ රජය සතු විය යුතු බව.

**395**. සමාගමක් විසුරුවා හරිනු ලැබූ අවස්ථාවක, එය විසුරුවා හැරීමේ දිනට පෙරාතුව ම සමාගම වෙත සතු කරනු ලැබූ හෝ සමාගම වෙනුවෙන් ස්වකීය භාරයේ තිබූ කවර වූ හෝ දේපළ හා අයිතිවාසිකම් (වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් සමාගම විසින් ස්වකීය භාරයේ තබාගත් දේපළ හැර බදු ගත් දේපළ ඇතුළුව) සියල්ල, අධිකරණය විසින් 393 වන සහ 394 වන වගන්තිවල විධිවිධාන යටතේ යම් අවස්ථාවක දී කරනු ලැබිය හැකි යම් ආඥාවකට යටත්ව හා හානියක් නොමැතිව රජය වෙත සතු විය යුතු අතර, රජය විසින් ඊට සුදුස්සක් කරනු ලැබිය හැකි විය යුතු ය.

## සමාගම් ඇවරකිරීමේ ගිණුම

සමාගම් ඇවරකිරීමේ ගිණුම පිහිටුවීම.

**396**. (1) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් කලින් කළ අනුමත කරනු ලබන බැංකුවක, සමාගම් ඇවර කිරීමේ ගිණුම යනුවෙන් හැඳින්විය යුතු ගිණුමක් රෙජිස්ට්‍රාර්වරයා විසින් තබා ගත යුතු ය.

(2) සමාගම් ඈවර කිරීමේ ගිණුමේ බැරට ඇති මුදල් ශේෂය 397 වන වගන්තිය යටතේ හිමිකම්පෑම් පිරිමසාලීම සඳහා රෙජිස්ට්‍රාර්වරයාගේ මතය අනුව තත්කාලයෙහි අවශ්‍ය වන ප්‍රමාණය ඉක්මවන කවර අවස්ථාවක වුව ද, රෙජිස්ට්‍රාර්වරයා විසින් අතිරික්තය පිළිබඳව, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා වෙත දැනුම් දෙනු ලැබිය යුතු අතර, ඔහු විසින් නියම කරනු ලැබිය හැකි ගිණුමට ඔහු විසින් ඉල්ලා සිටිය හැකි, ඒ සම්පූර්ණ අතිරික්තය හෝ එහි යම් කොටසක් ඔහු වෙත ගෙවිය යුතු ය. තව ද ගෙවනු ලැබූ මුදල් හෝ ඒවායේ යම් කොටසක් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා විසින් සමාගම් ඈවර කිරීමේ ගිණුමේ බැරට තැබිය යුතු ආණ්ඩුවේ සුරැකුම්පත්වල ආයෝජනය කළ හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා වෙත ගෙවන ලද මුදලින් යම් කොටසක්, 397 වන වගන්තිය යටතේ වූ හිමිකම්පෑම් පියවීම සඳහා, රෙජිස්ට්‍රාර්වරයාගේ මතය අනුව අවශ්‍ය වන විටක, ඒ අවශ්‍යතාව පිළිබඳව රෙජිස්ට්‍රාර්වරයා විසින් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා වෙත දැනුම් දිය යුතු අතර, එසේ අවශ්‍ය මුදල් ප්‍රමාණය, සමාගම් ඈවර කිරීමේ ගිණුමේ බැරට ඔහු විසින් ආපසු ගෙවනු ලැබිය යුතු ය; ඒ කාර්යය සඳහා (2) වන උපවගන්තියේ සඳහන් කවර හෝ සුරැකුම්පත්, ඔහු විසින් විකුණනු ලැබිය හැකි ය.

(4) මේ වගන්තියේ විධිවිධාන යටතේ කරන ලද ආයෝජනවලට ලැබෙන ලාභාංශ සමාගම් ඈවර කිරීමේ ගිණුමට ගෙවිය යුතු ය.

**397**. (1) ඈවරකරුගේ බැරට ඇති, සමාගමක හිමිකම් පානු නොලැබූ වත්කම් වශයෙන් පවත්නා මුදල්, එම සමාගම ගණන් බේරා වසා දැමීම සම්පූර්ණ කිරීමෙන් පසු, ඒ සමාගමේ ඈවර කිරීමේ ගිණුමට බැර කිරීම සඳහා රෙජිස්ට්‍රාර්වරයාට ගෙවනු ලැබිය යුතු ය. සමාගම් ඈවර කිරීමේ ගිණුමට සහ එම ගිණුමෙන් ගෙවීම්.

(2) සමාගමක් ගණන් බේරා වසා දැමීමේ දී යම් මුදලක් හෝ යම් අතිරික්ත වත්කමකින් උපලබ්ධ වී සමාගම් ඈවර කිරීමේ ගිණුමට බැරකොට ඇති මුදල් හෝ ගෙවනු ලැබීමට හෝ බෙදා දෙනු ලැබීමට හිමිකම තිබුණු යම් තැනැත්තකුට සමාගම ගණන් බේරා වසා දැමීමේ ගිණුමේ ඇති මුදල්, ගෙවීම හෝ බෙදාදීම කරනු ලැබිය හැකි ය.

(3) යම් සමාගමක් වෙනුවෙන් සමාගම් ඈවර කිරීමේ ගිණුමට අරමුදල් ගෙවා ඇත්තා වූ සහ ඒ සමාගම පසුව විසුරුවා හරිනු ලැබූ අවස්ථාවක එම අරමුදල් සම්බන්ධයෙන් 395 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

අත්‍යාවශ්‍ය සේවා සැපයීම ප්‍රතික්ෂේප කිරීම තහනම් බව.

**398**. (1) මේ වගන්තියේ කාර්යය සඳහා —

'අත්‍යාවශ්‍ය සේවා' යන්නෙන්,—

(අ) විදුලිබලය සිල්ලරට සැපයීම;

(ආ) ජලය සැපයීම; සහ

(ඇ) විදුලි සංදේශ සේවා සැපයීම,

අදහස් වේ.

(2) යම් ලිඛිත නීතියක හෝ යම් ගිවිසුමක විධිවිධානවල පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, අත්‍යාවශ්‍ය සේවා සපයන්නකු විසින් —

(අ) ඈවර කිරීම ආරම්භ වීමට පූර්ව කාලසීමාවක් වෙනුවෙන් එම සේවා සඳහා ගාස්තු ගෙවීම සමාගමක් විසින් පැහැර හැර තිබීමේ හේතුවෙන්, ඈවරකරුවකුට හෝ ඈවර කරගෙන යනු ලබන සමාගමකට හෝ ඒ සේවා සැපයීම ප්‍රතික්ෂේප කිරීම;

(ආ) ඈවර කිරීම ආරම්භ වීමට පූර්ව කාලසීමාවක් වෙනුවෙන් එම සේවා සඳහා හිඟ ගාස්තු ගෙවිය යුතු ය යන්න, ඈවරකරුවකුට හෝ ඈවර කරගෙන යනු ලබන සමාගමකට ඒ සේවා සැපයීම සඳහා කොන්දේසියක් කර ගැනීම,

නොකළ යුතු ය.

(3) ඈවර කිරීම ආරම්භ කිරීමෙන් පසු යම් කාලසීමාවක් හා සම්බන්ධව සපයන ලද සේවා සඳහා සමාගමක් විසින් ගෙවීම් පැහැර හැර තිබෙන ගාස්තු සම්බන්ධයෙන් යම් ගිවිසුමක් යටතේ හෝ යම් ලිඛිත නීතියක් යටතේ යම් අයිතිවාසිකමක් හෝ බලයක්, අත්‍යාවශ්‍ය සේවයක් සපයන්නකු විසින් ක්‍රියාවේ යෙදීම මේ වගන්තියේ අන්තර්ගත කිසිවකින් නොවැළැක්වෙන බව, සැක දුරු කිරීම සඳහා ප්‍රකාශ කරනු ලැබේ.

(4) අත්‍යාවශ්‍ය සේවයක් සපයා ගැනීම සඳහා ඈවරකරුවකු දරන ගාස්තුවක්, මේ පනතේ නවවන උපලේඛනයේ 1 (අ) ඡේදයේ කාර්යය සඳහා ඈවරකරුවකු විසින් දරන ලද වියදමක් විය යුතු ය.

## රීති සහ ගාස්තු

ගණන් බේරා වසාදැමීම සඳහා ගාස්තු.

**399**. (1) මේ පනතේ පරමාර්ථ සමාගම් ගණන් බේරා වසා දැමීමට අදාළ වන තාක් දුරට ක්‍රියාත්මක කිරීම කරගෙනයාම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස අමාත්‍යවරයා විසින් රීති සාදනු ලැබිය හැකි ය.

(2) සමාගම් ගණන් බේරා වසා දැමීමට අදාළ වන්නා වූ මේ පනත යටතේ වන කාර්යය පටිපාටිය සම්බන්ධයෙන්, අමාත්‍යවරයා විසින් නියෝග මගින් නියම කරනු ලැබිය හැකි සාධාරණ ගාස්තු ගෙවිය යුතු ය.

XIII වන කොටස

## අද්මිනිස්ත්‍රාසිකරුවෝ

අද්මිනිස්ත්‍රාසිකරු පත්කිරීම

**400**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ කොටසෙහි — අර්ථ නිරූපණය.

(අ) "මූලික කාලසීමාව" යන්නෙන්, අද්මිනිස්ත්‍රාසිකරු පත්කිරීමේ දිනයෙන් ආරම්භව —

(i) 404 වන වගන්තිය යටතේ රැස්වීම පවත්වනු ලබන දිනය තෙක්; හෝ

(ii) 402 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව භාර ගැනුම්කරුවකු පත්කරනු ලබන තෙක්; හෝ

(iii) වැඩ කරන දින විස්සක් හෝ අධිකරණය විසින් ඉඩ දෙනු ලබන ඊට වඩා වැඩි කාලයක්,

යන කාලසීමාවලින් පළමුවෙන් සිදුවන කාලසීමාව අදහස් වේ; තව ද

(ආ) කුලී සින්නක්කර ගිවිසුම් සම්බන්ධයෙන් කර ඇති සඳහන් කිරීම්වලට, කොන්දේසිවලට යටත් විකුණුම් ගිවිසුම්, චංචල දේපළ පිළිබඳ වැඩපිළිවෙලවල් හා හිමිකම් රඳවා ගැනීමේ ගිවිසුම් ඇතුළත් වේ.

**401**. (1) මේ වගන්තියේ (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලය — අද්මිනිස්ත්‍රාසිකරු පත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට ඇති බලය.

(අ) සමාගමේ ණය ගෙවිය යුතු වන පරිදි ගෙවීමට එයට නොහැකි වන බව හෝ නොහැකි වීමට ඉඩ ඇති බව; සහ

(ආ) අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කිරීමෙන් (2) වන උපවගන්තියේ සඳහන් කාර්යවලින් එකක් හෝ වැඩි ගණනක් ශාක්ෂාත් කර ගැනීමට ඉඩ තිබෙන බව,

සලකන අවස්ථාවක දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගමක අද්මිනිස්ත්‍රාසිකරුවකු පත්කිරීම පිණිස යෝජනා සම්මත කර ගනු ලැබිය හැකි ය.

(2) අද්මිනිස්ත්‍රාසිකරුවකු පත්කරනු ලැබීමේ අරමුණු වන්නේ —

(අ) සමාගම සහ එහි සම්පූර්ණ ව්‍යාපාරය හෝ යම් කොටසක් ස්වශක්තතා ව්‍යාපාරික කටයුත්තක් ලෙස පැවැත්ම;

(ආ) IX වන කොටස යටතේ සමථයක් හෝ X වන කොටස යටතේ සමථයක් හෝ වැඩපිළිවෙලක් පිළියෙල කිරීම සහ අනුමත කිරීම; හෝ

(ඇ) සමාගමේ වත්කම් ගණන් බේරා වසාදැමීමකින් උපලබ්ධ විය හැකිවාට වඩා වැඩි වාසිදායක උපලබ්ධවීමක් ලබාගැනීම.

(3) අද්මිනිස්ත්‍රාසිකරුවකු පත්කිරීමේ යෝජනා සම්මතයක, ඒ පත්වීම කරනු ලබන්නේ කවර අරමුණ හෝ අරමුණු සඳහා ද ඒ අරමුණ හෝ අරමුණු නිශ්චිතව සඳහන් විය යුතු අතර, ඒ යෝජනා සම්මතය වරක් සම්මත කරගැනීමෙන් පසු අධිකරණයේ අවසරය නොමැතිව පරිච්ඡින්න කරනු නොලැබිය හැකි ය.

(4) මේ වගන්තිය යටතේ වූ යෝජනා සම්මතයක් —

(අ) සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා ආඥාවක් කරනු ලැබ ඇති;

(ආ) භාර ගැනුම්කරුවකු පත් කරනු ලැබුවේ කවර තැනැත්තකු විසින් ද නැතහොත් කවර තැනැත්තකු වෙනුවෙන් ද ඒ තැනැත්තා විසින් ආඥාව කිරීමෙහි ලා කැමැත්ත ප්‍රකාශ කර ඇත්තේ නම් මිස, සමාගමේ මුළු දේපළ සහ ව්‍යාපාරික කටයුතු සම්බන්ධයෙන් භාර ගැනුම්කරුවකු පත්කරනු ලැබ ඇති ; හෝ

(ඇ) තවදුරටත් වූ පත්වීම කිරීමට අධිකරණයේ අවසරය පළමුවෙන් ලබාගෙන ඇත්තේ නම් මිස, සමාගම විසින් කලින් අවස්ථාවක දී අද්මිනිස්ත්‍රාසිකරුවකු පත්කරනු ලැබ ඇති

අවස්ථාවක, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මතයක් සම්මත නොකළ යුතු ය.

(5) (4) වන උපවගන්තිය උල්ලංඝනය කරමින් සම්මත කරගනු ලබන යෝජනා සම්මතයක් බල රහිත සහ බලයෙන් තොර විය යුතු ය.

අද්මිනිස්ත්‍රාසිකරුවකු පත්කිරීම පිළිබඳ දැන්වීම සංණභාරකරුට දිය යුතු බව.

**402**. (1) සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අද්මිනිස්ත්‍රාසිකරුවකු පත්කරන ලද අවස්ථාවක, ඒ පත්වීම පිළිබඳ සහ අද්මිනිස්ත්‍රාසිකරුවකු ලෙස පත්කරන ලද තැනැත්තාගේ අනන්‍යතාවය පිළිබඳ දැන්වීම සමාගම විසින්, සමාගමේ දේපළවල සහ ව්‍යාපාර කටයුතුවල භාර ගැනුම්කරුවකු පත්කිරීම පිණිස හිමිකම් ඇති යම් තැනැත්තකු වෙත වහාම දෙනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ දැන්වීම දෙන ලද දිනයේ සිට වැඩකරන දින දහයක් ඇතුළත ඕනෑම වේලාවක දී සමාගමේ දේපළවල සහ ව්‍යාපාර කටයුතුවල භාර ගැනුම්කරුවකු පත් කිරීමට හිමිකම් ඇති තැනැත්තකු විසින් එවැනි පත්වීමක් කරනු ලැබිය හැකි ය. එවැනි භාර ගැනුම්කරුවකු පත්කරනු ලැබීමෙන් පසු අද්මිනිස්ත්‍රාසිකරු ධූරය දැරීම වහාම අවසන් කළ යුතු ය.

අද්මිනිස්ත්‍රාසිකරු පත්කිරීමේ බලපෑම.

**403**. (1) අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කිරීමේ සිට සහ ඉන් පසුව මුල් කාලසීමාවේ අවසානය තෙක් —

(අ) සමාගම ඈවර කිරීම සඳහා යෝජනා සම්මතයක් සම්මතකර ගැනීම හෝ ආඥාවක් කිරීම නොකළ යුතු ය ;

(ආ) 402 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, සමාගමේ යම් දේපළක් අරභයා වූ යම් ඇපයක් බලාත්මක කිරීම පිණිස හෝ යම් කුලී සින්නක්කර ගිවිසුමක් යටතේ සමාගමේ භාවිතයෙහි පවත්නා හෝ සන්තකයේ ඇති යම් භාණ්ඩ නැවත සන්තකයට ගැනීම පිණිස, අද්මිනිස්ත්‍රාසිකරුගේ එකඟත්වය හෝ අධිකරණයේ අවසරය ඇතිව හැර සහ අධිකරණය විසින් පනවනු ලැබිය හැකි නියමවලට යටත්ව හැර, කිසිදු පියවරක් නොගත යුතු ය ;

(ඇ) අද්මිනිස්ත්‍රාසිකරුගේ එකඟත්වය හෝ අධිකරණයේ අවසරය ඇතිව හැර, සහ අධිකරණය විසින් පනවනු ලැබිය හැකි නියමවලට යටත්ව හැර, සමාගමට හෝ එහි දේපළවලට එරෙහිව වෙනත් යම් නීති කෘත්‍ය සහ ක්‍රියාවේ යෙදවීමේ ආඥාවක් හෝ වෙනත් නෛතික ක්‍රියාවලියක් හෝ ආරම්භ කිරීම හෝ අඛණ්ඩව කරගෙන යාම නොකළ යුතු අතර, තහනමට ගැනීමේ ගාස්තුවක් අයකරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කිසිවකින් —

(අ) සමාගම ගණන් බේරා වසා දැමීම පිණිස වූ පෙත්සමක් ගොනුකිරීම සඳහා ; හෝ

(ආ) සමාගමේ දේපළ මත වූ සෘණ භාරයක් යටතේ හෝ සමාගමේ භාවිතයේ, සන්තකයේ ඇති හෝ පදිංචිය ඇති හෝ දේපළකට අදාළ වූ ගිවිසුමක් යටතේ හෝ පැහැරහැරීමකට අදාළ වන දැන්වීමක් කිරීම සඳහා,

අධිකරණයේ අවසරය ලබාගත යුතු යයි නියම කර නොමැත.

**මුල් රැස්වීම සහ පත්වීම ස්ථිර කිරීම**

මුල් රැස්වීම කැඳවීම අද්මිනිස්ත්‍රාසිකරුගේ කාර්යය විය යුතු බව.

**404**. (1) අද්මිනිස්ත්‍රාසිකරුවකු පත්කිරීමෙන් පසු වැඩකරන දින දහයක් තුළ දී ඔහු විසින් සමාගමේ සියලුම ණයහිමියන් වෙත —

(අ) අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කිරීම ගැන ඔවුන් වෙත දැනුම්දෙමින් ; සහ

(ආ) පත්කිරීම ස්ථිර කළ යුතු දැයි සලකා බැලීම පිණිස ණයහිමියන්ගේ රැස්වීමක් කැඳවමින්,

ලිඛිත දැන්වීමක් අද්මිනිස්ත්‍රාසිකරුට දැනගන්නට ලැබී ඇති තාක් දුරට වූ ඔවුන්ගේ ලිපිනයන් වෙත යැවිය යුතු ය.

(2) මුල් කාලසීමාව ඉකුත්වීමට පෙර ණයහිමියන්ගේ රැස්වීමක් නොපැවැත්වූ අවස්ථාවක, ඒ කාලසීමාව ඉකුත්වීමේ දී අද්මිනිස්ත්‍රාසිකරු ධුරය දැරීම අවසන් විය යුත්තේ ය.

(3) සියලු ණයහිමියන් එකම පන්තියක ණයහිමියන් ලෙස ඡන්දය ප්‍රකාශ කිරීම හැර, මේ වගන්තිය යටතේ කැඳවන ලද ණයහිමියන්ගේ රැස්වීමක් හත්වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කාර්ය පටිපාටියට අනුව පැවැත්විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ ණය හිමියන්ගේ රැස්වීමක දී අද්මිනිස්ත්‍රාසිකරු පත්කිරීම ස්ථිර කරනු නොලැබූ අවස්ථාවක, රැස්වීම අවසන් කිරීමත් සමගම අද්මිනිස්ත්‍රාසිකරු ධුරය දැරීම අවසන් විය යුතු ය.

(5) ණයහිමියන්ගේ මේ වගන්තිය යටතේ වූ රැස්වීමක දී අද්මිනිස්ත්‍රාසිකරුගේ පත්වීම ස්ථිර කරනු ලැබූ අවස්ථාවක, අද්මිනිස්ත්‍රාසිකරු ධුරය අඛණ්ඩව දැරිය යුතු අතර, 406 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව යෝජනා සකස් කළ යුතු ය.

අද්මිනිස්ත්‍රාසිකරුගේ පත්වීම ස්ථිර කිරීමේ ප්‍රතිඵලය.

**405**. (1) මුල් කාලසීමාව ඉකුත්වීමෙන් පසු අද්මිනිස්ත්‍රාසිකරුවකු ධුරය දරන්නේ යම් කාලසීමාවක් සඳහා ද ඒ කාලසීමාව තුළ දී —

(අ) සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා යෝජනා සම්මතයක් සම්මත කර ගැනීම හෝ ආඥාවක් කිරීම නොකළ යුතු ය ;

(ආ) සමාගමේ දේපළ පිළිබඳව භාරගන්නකු පත් කරනු නොලැබිය යුතු ය ;

(ඇ) (i) අද්මිනිස්ත්‍රාසිකරුගේ එකහත්වය ඇතිව හැර ; හෝ

(ii) අධිකරණයේ අවසරය ඇතිව සහ අධිකරණය විසින් පනවනු ලැබිය හැකි නියමවලට යටත්ව හැර,

සමාගමේ යම් දේපළක් අරභයා වූ යම් ඇපයක් බලාත්මක කිරීම පිණිස හෝ යම් කුලී සින්නක්කර ගිවිසුමක් යටතේ සමාගමේ භාවිතයෙහි පවත්නා හෝ සන්තකයේ ඇති හෝ යම් භාණ්ඩ නැවත සන්තකයට ගැනීම පිණිස පියවර නොගත යුතු ය.

(ඇ) (i) අද්මිනිස්ත්‍රාසිකරුගේ එකහත්වය ඇතිව හැර ; හෝ

(ii) අධිකරණයේ අවසරය ඇතිව සහ අධිකරණය විසින් පනවනු ලැබිය හැකි නියමවලට යටත්ව හැර,

වෙනත් නීති කෘත්‍ය සහ ක්‍රියාවේ යෙදවීම හෝ වෙනත් නෛතික ක්‍රියාවලියක් ආරම්භ කිරීම හෝ කරගෙන යාම නොකළ යුතු අතර සමාගමට හෝ එහි දේපළවලට එරෙහිව තහනමට ගැනීමේ ගාස්තුවක් අයකරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කිසිවකින් —

(අ) සමාගම ගණන් බේරා වසා දැමීම පිණිස වූ පෙත්සමක් ගොනු කිරීම සඳහා ; හෝ

(ආ) සමාගමේ දේපළ මත වූ බැඳීමක් යටතේ හෝ සමාගමේ භාවිතයේ, සන්තකයේ ඇති පදිංචිය ඇති දේපළකට අදාළ වූ ගිවිසුමක් යටතේ පැහැර හැරීමකට අදාළ වන දැන්වීමක් තිබීම සඳහා,

අද්මිනිස්ත්‍රාසිකරුගේ එකහත්වය හෝ අධිකරණයේ අවසරය ලබාගැනීම නියම කරනු නොලබන්නේ ය.

## අද්මිනිස්ත්‍රාසිකරුගේ යෝජනා

යෝජනා ප්‍රකාශය.

**406**. (1) මුල් කාලසීමාව අවසන් වීමෙන් පසු මාස දෙකක් ඇතුළත හෝ අධිකරණය විසින් ඉඩ දෙනු ලැබිය හැකි වඩා දීර්ඝ කාලයක් ඇතුළත අද්මිනිස්ත්‍රාසිකරු විසින් —

(අ) ඔහු පත්කරමින් කරනු ලැබූ අණදාවේ නිශ්චිතව සඳහන් අරමුණ හෝ අරමුණු ශාක්ෂාත් කර ගැනීම සඳහා ඔහුගේ යෝජනා පිළිබඳ ප්‍රකාශයක් පිළියෙල කළ යුතු ය ;

(ආ) ප්‍රකාශයේ පිටපතක් රෙජිස්ට්‍රාර්වරයා වෙත භාර දිය යුතු ය ;

(ඇ) ප්‍රකාශයේ පිටපතක් ඔහුට දැනගන්නට ලැබී ඇති තාක් දුරට වූ ණයහිමියන්ගේ ලිපිනයන් වෙත සමාගමේ සියලු ණයහිමියන්ට ලැබෙන ලෙස යැවිය යුතු ය.

(2) ප්‍රකාශයේ පිටපත් ණයහිමියන් වෙත යවනු ලැබූ දිනයෙන් පසු වැඩකරන දින පහකට අඩු නොවූ ද දින දහයකට වැඩි නොවූ ද කාලයක් තුළ දී ප්‍රකාශය සලකා බැලීම සඳහා අද්මිනිස්ත්‍රාසිකරු විසින් ණයහිමියන්ගේ රැස්වීමක් කැඳවිය යුතු ය.

(3) තව ද, අද්මිනිස්ත්‍රාසිකරු විසින්, ඔහුගේ පත්වීමේ දිනයේ සිට මාස දෙකක් ඇතුළත සහ ප්‍රකාශය සලකාබැලීම සඳහා වූ ණයහිමියන්ගේ රැස්වීමේ දිනයට පෙරාතුව —

(අ) ප්‍රකාශයේ පිටපතක් සමාගමේ සියලු කොටස්හිමියන් වෙත යැවීම ; හෝ

(ආ) සමාගමේ කොටස්හිමියන්ට ප්‍රකාශයේ පිටපතක් ගාස්තුවලින් නිදහස්ව ලබාගැනීමට හැකි ලිපිනයන් පිළිබඳව ප්‍රසිද්ධ දැන්වීමක් කිරීම,

යන දෙකින් එකක් කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ නියම අනුව ක්‍රියා කිරීම අද්මිනිස්ත්‍රාසිකරුවකු විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක, ඔහු වරදකට වරදකරු වන අතර වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහස නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

**407**. (1) 406 වන වගන්තියේ විධිවිධාන යටතේ කැඳවන ලද ණයහිමියන්ගේ රැස්වීමක් මගින් අද්මිනිස්ත්‍රාසිකරුගේ යෝජනා අනුමත කළ යුතු දැයි තීරණය කරනු ලැබිය යුතු ය.

ණයහිමියන්ගේ රැස්වීම මගින් යෝජනා සලකා බැලීම.

(2) සුළු වශයෙන් වෙනස් කිරීම් කිරීමට අද්මිනිස්ත්‍රාසිකරු එකඟවන්නේ නම්, රැස්වීම මගින් සුළු වශයෙන් වෙනස් කිරීම් සහිතව යෝජනා අනුමත කරනු ලැබිය හැකි ය.

(3) හත්වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කාර්ය පටිපාටියට අනුකූලව රැස්වීමේ වැඩ කරනු ලැබිය යුතු අතර, ඒ රැස්වීමෙන් වැඩකරන දින දහයක් ඇතුළත දී අද්මිනිස්ත්‍රාසිකරු විසින් රැස්වීමේ ප්‍රතිඵලය පිළිබඳ දැන්වීම රෙජිස්ට්‍රාර්වරයා වෙත දිය යුතු ය.

(4) අද්මිනිස්ත්‍රාසිකරුගේ යෝජනා අනුමත කරනු ලැබූ අවස්ථාවක, යෝජනාවලින් විධිවිධාන සලස්වනු ලබන්නේ නම්, අද්මිනිස්ත්‍රාසිකරු අඛණ්ඩව ධුරයේ සිටිය යුතු ය ; නැතහොත් යෝජනාවල දක්වා ඇති අවස්ථාගත කරුණු නිසා ධුරය දැරීම අවසන් කළ යුතු ය.

(5) අද්මිනිස්ත්‍රාසිකරුගේ යෝජනා අනුමත කරනු නොලැබූ අවස්ථාවක, රැස්වීමේ දිනයෙන් වැඩ කරන දින පහකට පසු අද්මිනිස්ත්‍රාසිකරු ධුරය දැරීම අවසන් විය යුතු ය.

(6) (4) වන උපවගන්තියේ නියම අනුව ක්‍රියා කිරීමට අද්මිනිස්ත්‍රාසිකරු විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක, ඔහු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් පනස් දහස නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

**408**. සමාගමක් හෝ අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ කලින් සිටි අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ විසින් කරන ලද ඉල්ලීමක් මත, අද්මිනිස්ත්‍රාසිකරුවකු නිදහස් කිරීමට ආනුෂංගික වන ආඥා, අධිකරණය විසින් සුදුසු යයි සලකනු ලබන පරිදි, අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.

අද්මිනිස්ත්‍රාසිකරු ධුරය දැරීම අවසන් කළ අවස්ථාවක ආනුෂංගික ආඥා.

**409**. (1) (අ) අද්මිනිස්ත්‍රාසිකරුගේ යෝජනා 407 වන වගන්තිය යටතේ අනුමත කර ඇති අවස්ථාවක ; සහ

යෝජනාවලට හරවත් ප්‍රතිශෝධන පිළිබඳ අනුමතය.

(ආ) එම යෝජනාවලට හරවත් ප්‍රතිශෝධන කිරීමට අද්මිනිස්ත්‍රාසිකරු යෝජනා කරන අවස්ථාවක,

යෝජිත ප්‍රතිශෝධන පිළිබඳ ලිඛිත ප්‍රකාශයක්, අද්මිනිස්ත්‍රාසිකරුට දැනගන්නට ලැබී ඇති තාක් දුරට වූ ණයහිමියන්ගේ ලිපිනයන් වෙත සමාගමේ සියලු ණයහිමියන්ට ලැබෙන ලෙස අද්මිනිස්ත්‍රාසිකරු විසින් යවනු ලැබිය යුතු ය.

(2) ණයහිමියන් වෙත ප්‍රකාශයේ පිටපත් යවන ලද්දේ කවර දිනයක ද ඒ දිනයෙන් පසු වැඩකරන දින පහකට නොඅඩු සහ දින දහයකට නොවැඩි කාලයක් තුළ දී ප්‍රතිශෝධන සලකා බැලීම පිණිස අද්මිනිස්ත්‍රාසිකරු විසින් ණයහිමියන්ගේ රැස්වීමක් කැඳවිය යුතු ය.

(3) තව ද, ප්‍රකාශය සලකා බැලීම පිණිස නියම කර ගන්නා ලද ණයහිමියන්ගේ රැස්වීමේ දිනයට පෙරාතුව අද්මිනිස්ත්‍රාසිකරු විසින් —

(අ) ප්‍රකාශයේ පිටපතක් සමාගමේ සියලු කොටස් හිමියන් වෙත යැවීම ; හෝ

(ආ) සමාගමේ කොටස්හිමියන්ට ප්‍රකාශයේ පිටපතක් ගාස්තුවලින් නිදහස්ව ලබාගැනීමට හැකි ලිපිනයන් පිළිබඳව ප්‍රසිද්ධ දැන්වීමක් කිරීම,

යන දෙකින් එකක් කරනු ලැබිය යුතු ය.

(4) සුළු වශයෙන් වෙනස් කිරීම් කිරීමට අද්මිනිස්ත්‍රාසිකරු එකඟවන්නේ නම්, රැස්වීම විසින් සුළු වශයෙන් වෙනස් කිරීම් සහිතව යෝජිත ප්‍රතිශෝධන අනුමත කරනු ලැබිය හැකි ය.

(5) හත්වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කාර්ය පටිපාටියට අනුකූලව රැස්වීමේ වැඩ කරනු ලැබිය යුතු අතර, ඒ රැස්වීම සමාප්ත කිරීමෙන් පසු අද්මිනිස්ත්‍රාසිකරු විසින් රැස්වීමේ ප්‍රතිඵලය පිළිබඳ දැන්වීම රෙජිස්ට්‍රාර්වරයා වෙත දිය යුතු ය.

### අද්මිනිස්ත්‍රාසි කිරීම පිළිබඳ දැන්වීම

අද්මිනිස්ත්‍රාසිකරුගේ පත්වීම පිළිබඳ දැන්වීම.

**410**. (1) අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කරනු ලැබීමෙන් පසු වහාම ඔහු විසින් —

(අ) (i) ඔහුගේ සම්පූර්ණ නම ;

(ii) ඔහුගේ පත්වීමේ දිනය ;

(iii) ඔහුගේ කාර්යාලීය ලිපිනය ඇතුළත් ඔහුගේ පත්වීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමක් කරනු ලැබිය යුතු ය ; තව ද

(ආ) ප්‍රසිද්ධ දැන්වීමේ පිටපතක් රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතු ය.

(2) මේ වගන්තියේ නියම අනුව ක්‍රියා කිරීමට අද්මිනිස්ත්‍රාසිකරු විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක, ඔහු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

411. (1) සමාගමක් සම්බන්ධයෙන් අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කරනු ලැබූ අවස්ථාවක, සමාගම හෝ අද්මිනිස්ත්‍රාසිකරු විසින් හෝ සමාගම හෝ අද්මිනිස්ත්‍රාසිකරු වෙනුවෙන් ඇතුළත් වන හා නිකුත් කරනු ලබන සහ සමාගමේ නම පෙන්නුම් කරන සෑම ගිවිසුමකම සහ සෑම ලේඛනයකම අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කර ඇති බව පැහැදිළිව සඳහන් කළ යුතු ය. අද්මිනිස්ත්‍රාසි කිරීම පිළිබඳ දැන්වීම.

(2) (1) වන උපවගන්තියේ නියම අනුව ක්‍රියා කිරීම පැහැර හැරීමකින් ගිවිසුමේ හෝ ලේඛනයේ වලංගුභාවයට බලපෑමක් සිදු නොවිය යුතු ය.

(3) (අ) (1) වන උපවගන්තියේ නියම කඩකරන ; හෝ

(ආ) (1) වන උපවගන්තිය කඩකිරීමට දැන දැනම හෝ හිතාමතාම බලය දෙන හෝ අවසර දෙන,

සෑම තැනැත්තකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

## අද්මිනිස්ත්‍රාසිකරු

412. (1) සමාගමක අද්මිනිස්ත්‍රාසිකරු ලෙස පහත සඳහන් තැනැත්තන් පත් කිරීම හෝ ක්‍රියා කිරීම නොකළ යුතු ය :— අද්මිනිස්ත්‍රාසිකරුගේ සුදුසුකම්.

(අ) වයස අවුරුදු දහ අටට අඩු තැනැත්තකු ;

(ආ) සමාගමේ ණයහිමියකු ;

(ඇ) භාර ගැනුම්කාරත්වය ආරම්භවීමට ඉහතින් ම වූ අවුරුදු දෙකක කාලයක් තුළ සමාගමේ නිලධරයකු හෝ සේවානියුක්තිකයකු වන හෝ වී සිටි තැනැත්තකු ;

(ඈ) අද්මිනිස්ත්‍රාසි කිරීම ආරම්භවීමට ඉහතින්ම වූ අවුරුදු දෙකක කාලයක් තුළ, සමාගම විසින් නිකුත් කරන ලද කොටසක් කෙරෙහි කෙළින්ම හෝ අන්‍යාකාරයෙන් වුව ද සම්බන්ධතාවක් ඇත්තා වූ හෝ තිබුනා වූ තැනැත්තකු ;

(ඉ) නිදහස් නොකළ වස්තු භංගත්වයට පත් වූවෙක් වන තැනැත්තකු ;

(ඊ) (227 වන අධිකාරය වන) මානසික රෝග ආඥාපනත යටතේ සිහි විකල් තැනැත්තකු ලෙස විනිශ්චය කරනු ලැබූ තැනැත්තකු;

(උ) 468. වන වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ ආඥාවක් කරනු ලැබුවේ කවර තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා;

(ඌ) 1982 අංක 17 දරන සමාගම් පනතේ 188 වන වගන්තිය යටතේ සමාගමක අධ්‍යක්ෂවරයකු වීම හෝ සමාගමක් ප්‍රවර්ධනය කිරීමේ දී, පිහිටුවීමේ දී හෝ කළමනාකරණය කිරීමේ දී සැලකිල්ලක් දැක්වීම හෝ සහභාගි වීම හෝ තහනම් කරන ලද හෝ ඒ පනත ඉවත් කරනු ලැබීම නිසා නොවේ නම් එසේ තහනම් කරනු ලැබීමට ඉඩ ඇති තැනැත්තකු;

(එ) 213 වන හෝ 214 වන වගන්තිය යටතේ සමාගමක අධ්‍යක්ෂවරයකු හෝ ප්‍රවර්ධකයකු වීම හෝ සමාගමක කළමනාකරණය කිරීමේ දී සැලකිල්ලක් දැක්වීම හෝ සහභාගි වීම හෝ තහනම් කරනු ලැබූ තැනැත්තකු.

(2) සංස්ථාගත මණ්ඩලයක් අද්මිනිස්ත්‍රාසිකරුවකු ලෙස හෝ අද්මිනිස්ත්‍රාසිකරුවකු ලෙස ක්‍රියා කිරීම පිණිස හෝ පත් කරනු නොලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය උල්ලංඝනය කරමින් ක්‍රියා කරන තැනැත්තකු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් දෙලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

**413**. අද්මිනිස්ත්‍රාසිකරුවකු වශයෙන් තැනැත්තකු විසින් කරන ලද යම් ක්‍රියාවක්, ඒ තැනැත්තා අද්මිනිස්ත්‍රාසිකරුවකු ලෙස ක්‍රියා කිරීම පිණිස සුදුසුකම් ඇති තැනැත්තකු නොවූයේ වුව ද, වලංගු විය යුතු ය.

අද්මිනිස්ත්‍රාසිකරුගේ ක්‍රියාවල වලංගුභාවය.

**414**. අද්මිනිස්ත්‍රාසිකරුවකු ලෙස තැනැත්තකු පත් කිරීම, අද්මිනිස්ත්‍රාසිකරුවකු ලෙස පත් කරනු ලැබීමට ඒ තැනැත්තා විසින් ලියවිල්ලකින් එකඟත්වය ප්‍රකාශ කරන්නේ නම් මිස, බලාත්මක නොවන්නේ ය.

පත්වීමට එකඟත්වය.

**415**. (1) අද්මිනිස්ත්‍රාසිකරුගේ ධුරය, ඒ ධුරය දරන තැනැත්තා ධුරයෙන් ඉල්ලා අස්වන්නේ නම්, ඔහු මරණයට පත්වන්නේ නම්, අධිකරණය විසින් ධුරයෙන් ඉවත් කරන්නේ නම් හෝ 412 වන වගන්තිය යටතේ නුසුදුස්සකු වන්නේ නම්, පුරප්පාඩු විය යුතු ය.

අද්මිනිස්ත්‍රාසිකරුගේ ධුරයේ පුරප්පාඩුව.

(2) අද්මිනිස්ත්‍රාසිකරුගේ අනුප්‍රාප්තිකයා ලෙස වෙනත් තැනැත්තකු පත් කිරීමෙන් සහ ඔහුගේ අනුප්‍රාප්තිකයාගේ පත්වීම පිළිබඳව ලියවිල්ලකින් වූ දැන්වීමක් සමාගම සහ රෙජිස්ට්‍රාර්වරයා වෙත භාරදීමෙන් තැනැත්තකුට අද්මිනිස්ත්‍රාසිකරු ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(3) සමාගමේ හෝ සමාගමේ කොටස් හිමියකුගේ හෝ අධ්‍යක්ෂවරයකු ගේ හෝ ණයහිමියකුගේ නැතහොත් රෙජිස්ට්‍රාර්වරයාගේ ඉල්ලීම පිට, අධිකරණය විසින් අද්මිනිස්ත්‍රාසිකරුවකුගේ අනුප්‍රාප්තිකයකුගේ පත්වීම සමාලෝචනය කරනු ලැබිය හැකි අතර, ඊට සුදුසු යයි හැඟෙන්නේ නම්, ඔහු වෙනුවට සමාගමේ අද්මිනිස්ත්‍රාසිකරු ලෙස වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(4) ඉල්ලා අස්වීම හැර වෙනත් යම් හේතුවක් නිසා අද්මිනිස්ත්‍රාසිකරුවකුගේ ධුරයෙහි පුරප්පාඩුවක් ඇති වූ අවස්ථාවක, ධුරය හිස්කරන තැනැත්තා විසින් හෝ ඒ තැනැත්තාට ක්‍රියා කිරීමට නොහැකි නම්, ඔහුගේ පුද්ගලික නියෝජිතයා විසින් පුරප්පාඩුව පිළිබඳ ලිඛිත දැන්වීම වහාම සමාගම සහ රෙජිස්ට්‍රාර්වරයා වෙත භාර දිය යුතු ය.

(5) අද්මිනිස්ත්‍රාසිකරුවකු විසින් ධුරය හිස්කිරීමේ ප්‍රතිඵලය වශයෙන් අද්මිනිස්ත්‍රාසිකරුවකු වශයෙන් කිසිදු තැනැත්තකු පත් කරනු නොලැබුවේ නම්, සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අද්මිනිස්ත්‍රාසිකරු ලෙස ක්‍රියා කිරීම පිණිස තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(6) අවස්ථාවෝචිත පරිදි, අද්මිනිස්ත්‍රාසිකරුගේ ධුරයෙහි පුරප්පාඩුවක් ඇති වූ හෝ (5) වන උපවගන්තිය යටතේ අද්මිනිස්ත්‍රාසිකරුවකු වශයෙන් කටයුතු කිරීමට යම් තැනැත්තකු පත් කරනු ලැබූ හෝ අවස්ථාවක,

සමාගමේ හෝ සමාගමේ කොටස් හිමියකුගේ හෝ අධ්‍යක්ෂවරයකුගේ හෝ ණයහිමියකුගේ නැතහොත් රෙජිස්ට්‍රාර්වරයාගේ ඉල්ලීම පිට, අධිකරණය විසින්, සමාගමේ අද්මිනිස්ත්‍රාසිකරු ලෙස වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(7) (5) වන උපවගන්තිය යටතේ හෝ (6) වන උපවගන්තිය යටතේ පත් කරන ලද අද්මිනිස්ත්‍රාසිකරුවකු විසින් තමා පත් කරනු ලැබීමෙන් වැඩ කරන දින දහයක් තුළ දී, ඔහුගේ පත්වීම පිළිබඳ දැන්වීමක් රෙජිස්ට්‍රාර්වරයා වෙත භාරදිය යුතු ය.

(8) අධිකරණයක් විසින් කවර හෝ අවස්ථාවක, අද්මිනිස්ත්‍රාසිකරුවකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(9) ධුරය හිස් කරනු ලබන තැනැත්තකු විසින්, ප්‍රායෝගික අවස්ථාවක නම්, ඔහුගේ අනුප්‍රාප්තිකයාට, ඒ තැනැත්තාට සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි තොරතුරු සැපයීම සහ අවශ්‍ය සහාය දීම කරනු ලැබිය යුතු ය.

(10) අද්මිනිස්ත්‍රාසිකරුගේ ධුරයේ පුරප්පාඩුවක් පිරවීම පිණිස පත් කරන ලද තැනැත්තකුගේ ඉල්ලීම පිට, අද්මිනිස්ත්‍රාසිකරුගේ කාර්යය ඉටු කිරීම පහසු කරවීම පිණිස අධිකරණය විසින් අවශ්‍ය යයි හෝ අභිමත යයි සලකනු ලබන යම් ආඥාවක් අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.

(11) සාධාරණ හේතුවක් නොමැතිව, (4) වන උපවගන්තියේ නියම අනුව ක්‍රියා කිරීම පැහැර හරිනු ලබන හෝ (7) වන උපවගන්තියේ විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර හරිනු ලබන සෑම තැනැත්තකුම, වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

### අද්මිනිස්ත්‍රාසිකරුගේ බලතල

අද්මිනිස්ත්‍රාසි කරුවන්ගේ බලතල.

**416**. (1) (අ) අද්මිනිස්ත්‍රාසිකරුවකු විසින් සමාගමේ කටයුතු, ව්‍යාපාර හා දේපළ කළමනාකරණය කළ යුතු ය;

(ආ) අද්මිනිස්ත්‍රාසිකරුවකු විසින් සමාගමේ කටයුතු, ව්‍යාපාර හා දේපළ කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය හෝ අභිමත විය හැකි සියලු දේ කරනු ලැබිය හැකි ය;

(ඇ) අද්මිනිස්ත්‍රාසිකරුවකුට (අ) සහ (ආ) ඡේදවල නිශ්චිතව සඳහන් බලතල සීමා කිරීමෙන් තොරව, 443 වන, 445 වන හා 446 වන වගන්ති යටතේ සමාගමේ සමස්ත දේපළවල සහ ව්‍යාපාර කටයුතු වල භාර ගැනුම්කරුවකු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි සියලු බලතල තිබිය යුතු ය.

(2) අද්මිනිස්ත්‍රාසිකරු විසින් ඔහුගේ කර්තව්‍ය ඉටු කිරීමේ දී පැන නගින ඕනෑම කරුණක් සම්බන්ධයෙන්, විධානයක් ලබාගැනීම සඳහා අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(3) මේ පනතින් හෝ සමාගමේ ව්‍යවස්ථාවලියෙන් සමාගම වෙත හෝ එහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත හෝ නිලධරයන් වෙත පවරන ලද යම් බලයක් ක්‍රියාත්මක කිරීම අද්මිනිස්ත්‍රාසිකරු විසින් ඔහුගේ බලතල ක්‍රියාත්මක කිරීම සමග මැදිහත් විය හැකි අවස්ථාවක, සාමාන්‍ය වශයෙන් හෝ විශේෂ කරුණුවලට අදාළව දෙනු ලැබිය හැකි අද්මිනිස්ත්‍රාසිකරුගේ එකඟත්වය ඇතිව හැර, ඒ බලය අවස්ථාවෝචිත පරිදි සමාගම විසින් හෝ එහි අධ්‍යක්ෂ මණ්ඩලය හෝ නිලධරයන් විසින් ක්‍රියාත්මක නොකළ යුතු ය.

(4) (3) වන උපවගන්තියේ ව්‍යාප්තිය සීමා කිරීමක් නොමැතිව, සාමාන්‍ය වශයෙන් හෝ විශේෂ කරුණුවලට අදාළව දෙනු ලබන අද්මිනිස්ත්‍රාසිකරු එකඟත්වය පළමුව ලබාගැනීමෙන් තොරව, සමාගමේ දේපළ සම්බන්ධයෙන් වූ යම් බැහැරකිරීමක් හෝ වෙනත් ගනුදෙනුවක්, අන්‍යාකාර ලෙස අධිකරණය විසින් ආඥාකරන්නේ නම් මිස, බලරහිත විය යුතු ය.

(5) ඔහුගේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී අද්මිනිස්ත්‍රාසිකරු සමාගමේ අනුයෝජිතයකු ලෙසින් ක්‍රියා කරන ලෙස සලකනු ලැබිය යුතු අතර, සද්භාවයෙන් සහ වටිනාකම සඳහා අද්මිනිස්ත්‍රාසිකරු සමග ගනුදෙනු කරන තැනැත්තකු විසින් අද්මිනිස්ත්‍රාසිකරු, ඔහුගේ බලතල ඇතුළත ක්‍රියා කරන්නේ දැයි විමසීම අවශ්‍ය නොවිය යුතු ය.

බැඳීම් ඇති දේපළ ආදිය සමග කටයුතු කිරීමට ඇති බලය.

**417**. (1) සමාගමක අද්මිනිස්ත්‍රාසිකරුවකු විසින්, මේ උපවගන්තිය අදාළ වන සමාගමක ඇපයකට යටත් යම් දේපළක්, ඒ දේපළ ඒ ඇපයට යටත්ව නොපවතින්නාක් මෙන්, බැහැර කිරීම හෝ ඒ දේපළ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් ඔහුගේ බලතල ක්‍රියාත්මක කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(2) යම් ඇපයක් ඇති කරන ලද අවස්ථාවේ දී අස්ථිර බැඳීමක් වූ ඇපයකට (1) වන උපවගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

(3) අද්මිනිස්ත්‍රාසිකරු විසින් කරන ලද ඉල්ලීමක් මත (වෙනත් වත්කම් සහිතව හෝ රහිතව)—

(අ) (1) වන උපවගන්තිය අදාළ නොවන ඇපයකට යටත්, සමාගමේ යම් දේපළක්; හෝ

(ආ) කුලී සින්නක්කර ගිවිසුමක් යටතේ සමාගමේ සන්තකයේ පවත්නා යම් භාණ්ඩ,

බැහැර කිරීම, අද්මිනිස්ත්‍රාසිකරු පත් කිරීමේ නියමයේ අරමුණ හෝ අරමුණු එකක් හෝ වැඩි ගණනක් ප්‍රවර්ධනය කිරීමට හැකි වන බවට අධිකරණය සෑහීමට පත් වූ අවස්ථාවක, අධිකරණය විසින් ආඥාවක් මගින් –

(ඇ) දේපළ ඇපයට යටත් ව නොපවතින්නාක් මෙන් සලකා බැහැර කිරීමට; හෝ

(ඈ) කුලී සින්නක්කර ගිවිසුම යටතේ වූ අයිතිකරුගේ සියලු අයිතිවාසිකම් සමාගම වෙත පවරා දුන්නාක් මෙන් සලකා භාණ්ඩ බැහැර කිරීමට,

අද්මිනිස්ත්‍රාසිකරුට බලය දිය හැකි ය.

(4) (1) වන උපවගන්තිය යටතේ දේපළ බැහැර කරනු ලැබූ අවස්ථාවක, ඇප දරන්නාට ඇපයට යටත්ව ඇති දේපළ සම්බන්ධයෙන් ඔහුට තිබිය හැකිව තිබූ පරිද්දෙන් ම, බැහැර කරන ලද දේපළ කෙලින්ම හෝ අනියම් ලෙස නියෝජනය වන්නා වූ සමාගමේ යම් දේපළක් සම්බන්ධයෙන් එම ප්‍රමුඛත්වයම ඇත්තේ ය.

(5) (3) වන උපවගන්තිය යටතේ කරන ලද ආඥාවක –

(අ) බැහැරකිරීමෙන් ලත් ශුද්ධ මුදල්; සහ

(ආ) එම බැහැරකිරීමෙන් ලත් මුදල්, දේපළ හෝ භාණ්ඩ විවෘත වෙළෙඳපොලේ විකිණීමකින් ලබාගන්නා ශුද්ධ මුදල් ප්‍රමාණය විය යුතු බවට අධිකරණය විසින් තීරණය කරනු ලැබිය හැකි මුදල් ප්‍රමාණයට වඩා අඩු වන අවස්ථාවක, අඩුව පිරවීම සඳහා අවශ්‍ය විය හැකි මුදල්,

ඇපයෙන් සුරක්ෂිත කර ඇති හෝ කුලී සින්නක්කර ගිවිසුම යටතේ ගෙවිය යුතු මුදල් නිදහස් කිරීම උදෙසා අදාළ කර ගත යුතු බව කොන්දේසියක් විය යුතු ය.

(6) (5) වන උපවගන්තිය යටතේ පනවන ලද කොන්දේසියක් ඇප දෙකකට හෝ වැඩි ගණනකට අදාළ වන අවස්ථාවක, බැහැරකිරීමෙන් ලත් ශුද්ධ මුදල් සහ ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් කරන ලද යම් මුදලක්, ඒ ඇප මගින් සුරක්ෂිත කරන ලද මුදල් ප්‍රමාණයන් ඒවායේ ප්‍රමුඛත්ව අනුපිළිවෙළින් නිදහස් කිරීම උදෙසා, අදාළකර ගැනීමට එම කොන්දේසියෙන් නියම කෙරෙන්නේ ය.

(7) (3) වන උපවගන්තිය යටතේ කරන ලද යම් ආඥාවක පිටපතක් ඒ ආඥාව කිරීමෙන් පසු වැඩකරන දින දහයක් ඇතුළත දී අද්මිනිස්ත්‍රාසිකරු විසින් රෙජිස්ට්‍රාර්වරයා වෙත යවනු ලැබිය යුතු ය.

(8) (7) වන උපවගන්තියේ නියම අනුව ක්‍රියා කිරීම අද්මිනිස්ත්‍රාසිකරු විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක, ඔහු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් පණස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

418. (1) අද්මිනිස්ත්‍රාසිකරු පත්කරනු ලැබූ විට, ඔහු විසින් සමාගමට හිමිකම් ඇති සහ හිමිකම් තිබෙන බව පෙනෙන සියලු දේපළ ඔහුගේ භාරයට නැතහොත් පාලනයට ගත යුතු ය. අද්මිනිස්ත්‍රාසිකරුගේ සාමාන්‍ය කාර්යය.

(2) අද්මිනිස්ත්‍රාසිකරු විසින් –

(අ) 407 වන වගන්තිය යටතේ වූ යෝජනාවක් අනුමත කිරීමට පෙරාතුව කවර හෝ වේලාවක අධිකරණයේ යම් විධානවලට අනුකූලව; සහ

(ආ) යෝජනාවක් එලෙස අනුමත කිරීමෙන් පසු, කලින් කල ප්‍රතිශෝධනය කරනු ලබන ඒ යෝජනාව පරිදි සහ අධිකරණයේ යම් විධානවලට අනුකූලව කවර හෝ වේලාවක,

සමාගමේ කටයුතු, ව්‍යාපාර සහ දේපළ කළමනාකරණය කළ යුතු ය.

(3) අද්මිනිස්ත්‍රාසිකරු විසින් –

(අ) ණයහිමියන්ගේ වටිනාකමින් දහයෙන් එකක වටිනාකම සහිත සංඛ්‍යාවක් විසින් ලියවිල්ලකින් ඔහුගෙන් ඉල්ලීමක් කරනු ලැබුවේ නම්; හෝ

(ආ) අධිකරණය විසින් එසේ කරන ලෙස ඔහුට විධාන කරනු ලැබුවේ නම්,

සමාගමේ ණය හිමියන්ගේ රැස්වීමක් කැඳවනු ලැබිය යුතු ය.

අද්මිනිස්ත්‍රාසිකරු නිදහස් කිරීම හෝ අද්මිනිස්ත්‍රාසිකරු පත්කිරීමේ යෝජනා සම්මතය වෙනස් කිරීම.

**419**. (1) (අ) තමා පත් කරමින් කරනු ලැබූ යෝජනා සම්මතයෙහි නිශ්චිතව සඳහන් අරමුණු හෝ එක් එක් අරමුණ මුදුන්පත් කරගෙන ඇති බව නැතහොත් මුදුන්පත් කරගැනීමට නොහැකිව ඇති බව අද්මිනිස්ත්‍රාසිකරුට පෙනී ගිය; හෝ

(ආ) තත් කාර්යය සඳහා කැඳවන ලද සමාගමේ කොටස් හිමියන්ගේ රැස්වීමක් මඟින් අද්මිනිස්ත්‍රාසිකරුට නියම කරන ලද හෝ,

අවස්ථාවක —

(ඇ) අද්මිනිස්ත්‍රාසි කිරීම අවසන් කරනු ලැබීම අවශ්‍ය බව; හෝ

(ඈ) අද්මිනිස්ත්‍රාසිකරු වශයෙන් ඔහු පත්කරමින් කරනු ලැබූ යෝජනා සම්මතය යම් අතිරේක අරමුණක් නිශ්චිතව සඳහන් කිරීම පිණිස වෙනස් කිරීම අවශ්‍ය බව හෝ,

දැනුම්දෙමින් අද්මිනිස්ත්‍රාසිකරු විසින් සමාගම වෙත දැන්වීමක් කවර හෝ වේලාවක කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ දැන්වීමක් දීමෙන් පසු වැඩකරන දින පහක් අවසානයේ දී හෝ දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලබන යම් පසු දිනයක දී නමුත් කවර කරුණක් නිසා වුව ද දැන්වීම දෙන ලද දිනයෙන් පසු වැඩකරන දින දහයක් නොඉක්මවා අද්මිනිස්ත්‍රාසිකරු ධුරය දැරීම අවසන් කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ඈ) ඡේදය යටතේ අද්මිනිස්ත්‍රාසිකරු විසින් දැන්වීම කරන ලද අවස්ථාවක, යෝජනා සම්මතය ඒ අනුව සංශෝධනය කර ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් කර ඇති අවස්ථාවක, දැන්වීම කිරීමෙන් පසු වැඩකරන දින දහයක් තුළ දී අද්මිනිස්ත්‍රාසිකරු විසින් දැන්වීමේ පිටපතක් රෙජිස්ට්‍රාර්වරයා වෙත භාර දිය යුතු ය.

(5) (4) වන උපවගන්තියේ නියම අනුව ක්‍රියා කිරීම අද්මිනිස්ත්‍රාසිකරු විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක ඔහු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් පණස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

**420**. (1) අද්මිනිස්ත්‍රාසිකරුට ගෙවිය යුතු පාරිශ්‍රමිකය සහ ඔහුගේ වියදම් ද, 421 වන වගන්තිය යටතේ ඔහු හිමිකම් ලබන යම් හානිපූරණයක් ද සමාගමේ දේපළවලින් ගෙවනු ලැබිය යුතු අතර, ඊට, ඇති කළ අවස්ථාවේ දී වල සෘණභාරයක් වූ ඇපයක් අභිභවා ප්‍රමුඛත්වය තිබිය යුතු ය.

අද්මිනිස්ත්‍රාසිකරුගේ පාරිශ්‍රමිකය හා වියදම්.

(2) අද්මිනිස්ත්‍රාසිකරුගේ හෝ සමාගමේ හෝ සමාගමේ යම් ණය හිමියකුගේ හෝ ඉල්ලීම මත අධිකරණය විසින් යම් කාලයක් සම්බන්ධයෙන් අද්මිනිස්ත්‍රාසිකරුගේ පාරිශ්‍රමිකය අවස්ථාගත කරුණු අනුව යුක්ති සහගත මට්ටමකට ප්‍රතිශෝධනය කිරීම හෝ නියම කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

**421**. (1), (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත් ව, අද්මිනිස්ත්‍රාසිකරුවකු –

අද්මිනිස්ත්‍රාසිකරුගේ වගකීම.

(අ) අද්මිනිස්ත්‍රාසිකරුගේ බලතල කිසිවක් ක්‍රියාත්මක කිරීමේ දී ඔහු විසින් ඇතුළත් ව ඇති ගිවිසුමක් සම්බන්ධයෙන්; සහ

(ආ) ඔහුගේ පත්වීමට කලින් ඇතුළත් වී ඇති සේවා නියුක්ති ගිවිසුමක් යටතේ, ඔහුගේ පත්වීමේ දිනයෙන් පසු වැඩ කරන දින දහයක් තුළ දී ගිවිසුම අවසන් කිරීමේ දැන්වීම නීත්‍යානුකූල ලෙස දී නැත්නම්, ඔහුගේ අද්මිනිස්ත්‍රාසි කාලය තුළ දී උපචිත වී ඇති වේතන හෝ වැටුප් ගෙවීම සඳහා,

පුද්ගලිකව වගකිව යුතු ය.

(2) අද්මිනිස්ත්‍රාසිකරුවකුගේ ඉල්ලීම මත අධිකරණය විසින් අධිකරණය සුදුසු යයි කල්පනා කරන නියම සහ කොන්දේසි මත, (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ගිවිසුමක් අවසන් කිරීමේ දැන්වීම දීමට නියම කරනු ලැබ ඇත්තේ කවර කාලයක් තුළ දී ද ඒ කාලය, ඒ ඡේදයේ සඳහන් කරන ලද කාලසීමාව ඉකුත්වීමට පෙරාතුව ඒ ඉල්ලීම කරනු ලැබ ඇත්තේ නම්, දීර්ඝ කරනු ලැබිය හැකි ය.

(3) (6) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, අද්මිනිස්ත්‍රාසිකරුවකුගේ පත්වීමේ දිනයේ දී පවත්නා ගිවිසුමක් යටතේ සමාගම විසින් දේපළක් භාවිතය, සන්තකයේ තබා ගැනීම හෝ ඒ දේපළෙහි පදිංචිවීම සම්බන්ධයෙන් අයවිය යුතු වන ගෙවල් කුලී සහ වෙනත් යම් ගෙවීම් සඳහා (4) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් ප්‍රමාණයට අද්මිනිස්ත්‍රාසිකරුවකු පුද්ගලිකව වගකිව යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ වූ අද්මිනිස්ත්‍රාසිකරුවකුගේ වගකීම, අද්මිනිස්ත්‍රාසිකරුගේ පත්වීමේ දිනයට පසු වැඩ කරන දින දහයක දී ආරම්භ වී-

(අ) අද්මිනිස්ත්‍රාසි කිරීම අවසන් වන දිනය ; හෝ

(ආ) දේපළ භාවිතය, සන්තකය හෝ පදිංචිය සමාගම විසින් අවසන් කරන දිනය,

යන දෙකින් කලින් එළඹෙන දිනයේ දී අවසන් වන කාලයට ආරෝපණය කළ හැකි ගෙවල් කුලී හෝ වෙනත් ගෙවීම් වල කොටසට සීමා විය යුතු ය.

(5) අද්මිනිස්ත්‍රාසිකරුවකුගේ ඉල්ලීම මත අධිකරණය විසින්–

(අ) අද්මිනිස්ත්‍රාසිකරුගේ වගකීම (4) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයකට සීමා කරනු ලැබිය හැකි ය ; නැතහොත්

(ආ) (3) වන උපවගන්තිය යටතේ වූ වගකීමෙන් අද්මිනිස්ත්‍රාසිකරු නිදහස් කළ හැකි ය.

(6) (3) වන උපවගන්තියේ හෝ (4) වන උපවගන්තියේ ඇතුළත් කිසිවකින්,–

(අ) (3) වන උපවගන්තියේ සඳහන් කරන ලද ගිවිසුමක් අද්මිනිස්ත්‍රාසිකරුවකු විසින් උපයෝගි කර ගැනීමක් උද්ගත වන ලෙස නොගත යුතු ය ; නැතහොත්

(ආ) එවැනි ගිවිසුමක් යටතේ වෙනත් යම් බැඳීමක් ඉටු කිරීමේ වගකීමට අද්මිනිස්ත්‍රාසිකරු යටත් නොවිය යුතු ය.

(7) මේ වගන්තිය යටතේ වූ ඔහුගේ පුද්ගලික වගකීම සම්බන්ධයෙන් සමාගමේ දේපළවලින් හානිපූරණයක් ලැබීමට අද්මිනිස්ත්‍රාසිකරුවකුට හිමිකම තිබිය යුතු ය.

වගකීමෙන් සහන.

**422**. (1) (අ) වගකීම දරන්නට යෙදුනේ තනිකරම අද්මිනිස්ත්‍රාසිකරුගේ පත්වීමේ හෝ අද්මිනිස්ත්‍රාසිකරු පත්කිරීමට යෙදුනේ කවර අධිකරණ ආඥාවක් යටතේ ද ඒ අධිකරණ ආඥාවේ හෝ දෝෂයක් තිබීමේ හේතුවෙන් බවට ; සහ

(ආ) අද්මිනිස්ත්‍රාසිකරු අවංකවම සහ සාධාරණ ලෙස ක්‍රියාකර ඇති බව සහ අවස්ථාගත කරුණු අනුව ඔහු නිදහස් කළ යුතුව තිබෙන බවට,

අධිකරණය සෑහීමට පත්වන්නේ නම් අධිකරණය විසින්, අද්මිනිස්ත්‍රාසිකරුවකු ලෙස ක්‍රියාකර ඇති තැනැත්තකු, ඔහුගේ අද්මිනිස්ත්‍රාසි කිරීමේ ක්‍රියාවලියේ දී සිදු වූ පුද්ගලික බැඳීම් සියල්ලෙන් හෝ යම් බැඳීමකින් හෝ මුදා හැරිය හැකි ය.

(2) අධිකරණය සුදුසුයයි සිතනු ලබන නියම වලට හා කොන්දේසිවලට යටත්ව අධිකරණය විසින් එහි බලතල (1) වන උපවගන්තිය යටතේ ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය..

### සමාගමේ කටයුතු නිශ්චිතව දැනගැනීම සහ විමර්ශනය

**423**. (1) අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කළ අවස්ථාවක, සමාගම සහ සමාගමේ සෑම අධ්‍යක්ෂවරයකු විසින් ම– තොරතුරු ආදිය සැපයීමට සමාගමේ අධ්‍යක්ෂවරයන්ගේ බැඳීම.

(අ) සමාගමේ සන්තකයෙහි හෝ එහි පාලනය යටතේ ඇති සමාගමේ ව්‍යාපාරයට, කටයුතුවලට හා දේපළට අදාළ සියලු පොත්, ලේඛන සහ තොරතුරු අද්මිනිස්ත්‍රාසිකරුට ලබාදිය යුතු ය ;

(ආ) අද්මිනිස්ත්‍රාසිකරු විසින් නියම කරනු ලැබුවහොත්, පොත්, ලේඛන සහ තොරතුරු සම්පූර්ණ හා නිවැරදි බවට දිවුරුම් ප්‍රකාශයක් මගින් සනාථ කළ යුතු ය ;

(ඇ) අද්මිනිස්ත්‍රාසිකරුට සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි සහාය අද්මිනිස්ත්‍රාසිකරුට දිය යුතු ය ;

(ඈ) සමාගමට පොදු මුද්‍රාවක් තිබේ නම්, ඒ පොදු මුද්‍රාව අද්මිනිස්ත්‍රාසිකරුගේ භාවිතය සඳහා ලබා දිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ නියම අනුව ක්‍රියා කිරීම සමාගම විසින් හෝ අධ්‍යක්ෂවරයකු විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක, අද්මිනිස්ත්‍රාසිකරුගේ ඉල්ලීම මත අධිකරණය විසින් ඒ අනුව ක්‍රියා කරන ලෙස සමාගමට හෝ සමාගමේ අධ්‍යක්ෂවරයකුට නියම කරමින් ආඥාවක් කළ හැකි ය.

## විවිධ කරුණු

ණයහිමියන්ගේ කමිටුව.

**424.** (1) ණයහිමියන්ගේ රැස්වීමක් විසින් අද්මිනිස්ත්‍රාසිකරුගේ යෝජනා අනුමත කරනු ලැබූ අවස්ථාවක, සුදුසු යයි එය කල්පනා කරන්නේ නම්, රැස්වීම විසින්, මේ පනත යටතේ ඊට පවරාදෙනු ලබන කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම පිණිස (මෙහි මින්මතු "ණයහිමියන්ගේ කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) කමිටුවක් පිහිටුවාගනු ලැබිය හැකි ය.

(2) ණයහිමියන්ගේ කමිටුවක් පිහිටුවාගනු ලැබූ අවස්ථාවක, වැඩකරන දින පහකට නො අඩු දින ගණනක දැන්වීමක් දීමෙන්, යම් සාධාරණ වේලාවක එය ඉදිරියට පැමිණෙන ලෙස සහ එය විසින් සපයන ලෙස සාධාරණව නියම කරනු ලැබිය හැකි ඔහුගේ කර්තව්‍ය කරගෙන යාමට අදාළ තොරතුරු සපයන ලෙස එකී කමිටුව විසින් අද්මිනිස්ත්‍රාසිකරුට නියම කරනු ලැබිය හැකි ය.

ණයහිමියන්ගේ හා කොටස් හිමියන්ගේ සම්බන්ධතා ආරක්ෂා කිරීම.

**425.** (1) අද්මිනිස්ත්‍රාසිකරුවකු ධුර දරන කාලය තුළ කවර හෝ වේලාවක සමාගමේ ණයහිමියකු හෝ කොටස්හිමියකු විසින්, මේ වගන්තිය යටතේ පහත දැක්වෙන හේතු මත ආඥාවක් සඳහා ඉල්ලීමක් අධිකරණය වෙත කරනු ලැබිය හැකි ය :—

(අ) ඒ ණයහිමියාගේ හෝ කොටස්හිමියාගේ හෝ සම්බන්ධතාවලට අයුක්ති සහගත ලෙස විශේෂයකට භාජන කරවන හෝ අයුක්ති සහගත ලෙස අගතියක් වන හෝ ආකාරයෙන් සමාගමේ කටයුතු, ව්‍යාපාරය සහ දේපළ, අද්මිනිස්ත්‍රාසිකරු විසින් පාලනය කිරීම හෝ පාලනය කරනු ලැබ තිබීම ;

(ආ) ඒ ණයහිමියාගේ හෝ කොටස්හිමියාගේ සම්බන්ධතාවලට අයුක්ති සහගත ලෙස විශේෂයකට හෝ වෙනසකට භාජන කරවන හෝ අයුක්ති සහගත ලෙස අගතියක් වනු ලබන අද්මිනිස්ත්‍රාසිකරු විසින් සැබැවින්ම කරන ලද හෝ කිරීමට යෝජිත හෝ ක්‍රියාවක් හෝ නො කර හැරීමක්.

(2) මේ වගන්තිය යටතේ අධිකරණය වෙත ඉල්ලීමක් කිරීම මත, එසේ කිරීම යුක්තිසහගත හා සාධාරණ යයි අධිකරණය සලකන අවස්ථාවක සහ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, මෙම උපවගන්තියේ ව්‍යාප්තියට සීමාකිරීමක් නොකර අධිකරණය විසින් –

(අ) සමාගමේ කටයුතු, ව්‍යාපාරය හා දේපළ අද්මිනිස්ත්‍රාසිකරු විසින් මතු කාලයේ දී කළමනාකරණය කිරීම විධිමත් කරමින් ;

(ආ) ඉල්ලුම්කරු විසින් පැමිණිලි කරන ලද ක්‍රියාවක් කිරීමෙන් හෝ දිගටම කරගෙන යාමෙන් වළකින ලෙස හෝ අද්මිනිස්ත්‍රාසිකරු විසින් නොකර හැර ඇති බවට පැමිණිලිකරු විසින් පැමිණිලිකරන ලද ක්‍රියාවක් කරන ලෙස හෝ අද්මිනිස්ත්‍රාසිකරුට නියම කරමින් ;

(ඇ) අධිකරණය විසින් විධානය කරනු ලබන පරිදි වූ කාරණා සලකාබැලීමේ කාර්ය සඳහා ණයහිමියන්ගේ හෝ කොටස්හිමියන්ගේ රැස්වීමක් කැඳවීමට නියම කරමින්,

(ඈ) අද්මිනිස්ත්‍රාසිකරු නිදහස් කරමින් සහ සුදුසු යයි අධිකරණය කල්පනා කරන ආනුෂංගික විධිවිධාන ඇති කරමින්,

කරනු ලබන ආඥාවක් ඇතුළුව, එය විසින් සුදුසු යයි කල්පනා කරන කවර හෝ ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ වූ ආඥාවක්–

(අ) මේ පනතේ IX වන කොටස හෝ X වන කොටස යටතේ අනුමත කරන ලද සමථයක් හෝ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම ;

(ආ) ආඥාව සඳහා වූ ඉල්ලීම, අවස්ථාවෝචිත පරිදි 407 වන වගන්තිය හෝ 409 වන වගන්තිය යටතේ යම් යෝජනා හෝ යම් ප්‍රතිශෝධිත යෝජනා අනුමත කිරීමෙන් පසු වැඩකරන දින විස්සකට වැඩි කාලයක් තුළ කරනු ලැබූ අවස්ථාවක, එකී යෝජනා හෝ ප්‍රතිශෝධිත යෝජනා ක්‍රියාත්මක කිරීම,

කෙරෙහි අගතියක් හෝ වැළැක්වීමක් නොවිය යුතු ය.

දේපළ භාර ගැණුම්කරුවන්ට අදාළ වූ විධිවිධාන අද්මිනිස්ත්‍රාසිකරුට අදාළ කිරීම.

**426**. 453, 454, 460, 468, 469, 470 වන වගන්තිවල අන්තර්ගත විධිවිධාන, අවශ්‍ය සියලු සුළු වශයෙන් වූ වෙනස් කිරීම් සහිතව සහ විශේෂයෙන් ම–

(අ) අද්මිනිස්ත්‍රාසිකරු අධිකරණය විසින් පත්කරන ලද දේපළ භාරගැණුම්කරුවකු වූ පරිද්දෙන් ;

(ආ) දේපළ භාර ගැනුම්කාරත්වයේ දේපළ සම්බන්ධයෙන් කරනු ලබන සඳහන් කිරීම් සමාගමේ දේපළ හා ව්‍යාපාරික කටයුතු කෙරෙහි කරනු ලබන සඳහන් කිරීම් වූ පරිද්දෙන් ; සහ

(ඇ) ප්‍රදානකරු සම්බන්ධයෙන් කරනු ලබන සඳහන් කිරීම් සමාගම කෙරෙහි කරනු ලබන සඳහන් කිරීම් වූ පරිද්දෙන්,

අද්මිනිස්ත්‍රාසිකරුවකුට සහ අද්මිනිස්ත්‍රාසිකරණයට යටත් සමාගමකට අදාළ විය යුතු ය.

XIV වන කොටස

වල සෘණ හාර

සමාගම විසින් වල සෘණ හාර ප්‍රදානය කළ හැකි බව.

**427**. (1) සමාගම හෝ වෙනත් යම් තැනැත්තකු විසින් දරන ලද හෝ දැරීමට ඇති ණයක් හෝ වෙනත් යම් බැඳීමක් සුරක්ෂිත කිරීමේ කාර්ය සඳහා සමාගමක් විසින්, සමාගමේ සමස්ථ දේපළ සහ ව්‍යාපාර කටයුතු හෝ ඒ දේපළ සහ ව්‍යාපාර කටයුතුවල යම් කොටසක් හෝ මත මේ පනතේ මේ කොටස අදාළවන (මේ පනතේ “වල සෘණ හාර” යනුවෙන් සඳහන් කරනු ලබන) සෘණ හාරයක් ප්‍රදානය කළ හැකි ය.

(2) වල සෘණ හාරය ඇති කරන අවස්ථාවෙහි සමාගම විසින් දරනු ලැබුවේ හෝ ඉන්පසුව අත්කරගනු ලැබුවේ වුව ද–

(අ) චංචල සහ නිශ්චල දේපළ ;

(ආ) ඇරයුම් නොකළ ප්‍රාග්ධනය ;

(ඇ) මුදල්, වෙළෙඳ බඩු තොග, අමු ද්‍රව්‍ය, පොත් ණය සහ වෙනත් ලැබිය යුතු දේ ඇතුළත් සංසරණ වත්කම්,

ඇතුළුව සමාගමේ යම් දේපළක් කෙරෙහි වල සෘණ හාරයක් අදාළ විය හැකි ය.

(3) මේ කොටස යටතේ ඇති කරන ලද වල සෘණ හාරයක් වෙනත් යම් නීතියක අන්තර්ගත විධිවිධාන කුමක් වුව ද,—

(අ) අදාළ වන අවස්ථාවක (117 වන අධිකාරය වන) ලේඛන ලියාපදිංචිකිරීමේ ආඥාපනතේ විධිවිධානවලට යටත්ව ; සහ

(ආ) (89 වන අධිකාරය වන) උකස් පනතේ 103 වන වගන්තියට යටත්ව,

එය අදාළ කිරීමට ප්‍රකාශිතව ඇත්තේ කවර සමාගමක දේපළ අරහයා ද ඒ දේපළ අරහයා මේ කොටසේ නිශ්චිතව සඳහන් වන ආකාරයට හා ප්‍රමාණයට ඇපයක් ලෙස ක්‍රියාත්මක විය යුතු ය.

**428**. (1) 19 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ විධිවිධානවලට අනුකූලව සමාගමේ නාමය යටතේ, චල සෑණ භාරයක් ඇති කිරීමට ප්‍රකාශිත වූ සාධන පත්‍රයක් ලියා අත්සන් කිරීම මගින් පමණක්, චල සෑණ භාරයක් ඇති කරනු ලැබිය හැකි ය.

චල සෑණ භාරය ඇති කරන සාධන පත්‍රය.

(2) ඉඩමක් ඇතුළත් වන දේපළ පිළිබඳව චල සෑණ භාරයක් ඇති කරන සාධන පත්‍රයක්, ඒ ඉඩමට බලපාන සාධන පත්‍රයක් වශයෙන් (117 වන අධිකාරය වන) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ ලියාපදිංචි කළ යුතු ය.

(3) චංචල දේපළ ඇතුළත් වන දේපළ පිළිබඳ වූ චල සෑණ භාරයක් ඇති කරන සාධන පත්‍රයක් එය විකුණුම් පත්‍රයක් වූ ලෙස සලකා (117 වන අධිකාරය වන) ලේඛන ලියාපදිංචිකිරීමේ ආඥාපනත යටතේ ලියාපදිංචි කළ යුතු ය. චල සෑණ භාරයට ඉඩම් ද ඇතුළත් වන අවස්ථාවක, (117 වන අධිකාරය වන) ලේඛන ලියාපදිංචිකිරීමේ ආඥාපනතේ 16 සිට 22 දක්වා වූ වගන්තිවල විධිවිධානවලින්, ඒ සාධන පත්‍රය ඉඩමට අදාළවන තාක් දුරට කවරාකාරයකින් හෝ සාධන පත්‍රයට බලපෑමක් නොවිය යුතු ය.

(4) (117 වන අධිකාරය වන) ලේඛන ලියාපදිංචිකිරීමේ ආඥාපනතේ 17 වන හා 20 වන වගන්තිවල විධිවිධාන–

(අ) සමාගමේ ලියාපදිංචි කළ කාර්යාලය පිහිටියේ කවර දිස්ත්‍රික්කයක් තුළ ද ඒ දිස්ත්‍රික්කය තුළ ඒ ආඥාපනතේ IV වන පරිච්ඡේදය යටතේ ; සහ

(ආ) මේ පනතේ VI වන කොටස යටතේ,

ඒ චල සෑණ භාරයේ ලියාපදිංචිකිරීම, ඒ ආඥාපනතේ IV වන පරිච්ඡේදය යටතේ ශ්‍රී ලංකාව තුළ සෑම දිස්ත්‍රික්කයක් තුළම වූ ලියාපදිංචිකිරීමක් ලෙස, චල සෑණ භාරයක් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(5) සැක දුරුකිරීම සඳහා (89 වන අධිකාරය වූ) උකස් පනතේ 63 වන වගන්තියේ සඳහන් කිසිවක් චල සෑණ භාරයක් ඇතිකරන යම් සාධන පත්‍රයකට හෝ ඒ සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

**429**. (1) මෙහි එකොළොස්වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් නියමයන්, චල සෑණ භාරයක් ඇති කරන සෑම සාධන පත්‍රයකම, එවැනි යම් සාධන පත්‍රයක නියමයන් විසින් ව්‍යංගික නියමයන් ප්‍රකාශිතවම බැහැර කරන ප්‍රමාණයට හෝ ඒවාට අනනුකූල වන ප්‍රමාණයට හැර, ව්‍යංගික නියමයන් විය යුතු ය.

චල සෑණ භාරය ඇති කිරීමේ සාධන පත්‍රයේ විධිවිධාන.

(2) චල සෘණ භාරයක් ඇති කරන සාධන පත්‍රයක–

(අ) චල සෘණ භාරයට වඩා වැඩි ප්‍රමුඛත්වයක් ඇත්තා වූ හෝ සමාන ශ්‍රේණියේ පවත්නා වූ හෝ වෙනත් යම් චල සෘණ භාරයක් හෝ යම් ස්ථාවර ඇපයක් හෝ ඇති කිරීම තහනම් කරන්නා වූ හෝ සීමා කරන්නා වූ හෝ විධිවිධාන ; හෝ

(ආ) ඒ දේපළ හෝ එහි යම් කොටසක් මත වූ වෙනත් යම් පවත්නා නැතහොත් අනාගත චල සෘණ භාරයක් හෝ ස්ථාවර ඇප සමග චල සෘණ භාර වර්ග කෙරෙනුයේ කවර අනුපිළිවෙලකට ද ඒ අනුපිළිවෙල විධිමත් කරන්නා වූ විධිවිධාන,

අන්තර්ගත විය හැකි ය.

දේපළ තහනම් කිරීමට පෙරාතුව චල සෘණ භාරයට යටත් දේපළ පිළිබඳව කටයුතු කිරීම.

**430**. (1) චල සෘණ භාරය ඇති කරන ලද සාධන පත්‍රයේ නියමවලට යටත්ව, යම් දේපළක් සම්බන්ධයෙන් චල සෘණ භාරයක් ඇති කිරීම මගින් ඒ දේපළ පිළිබඳව සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රියාවලිය තුළ දී කටයුතු කිරීමට සමාගමට ඇති හැකියාවට බලපෑමක් නොවිය යුතු ය.

(2) (අ) සමාගමක යම් දේපළකට අනුයාත කොට නොතිබුණු චල සෘණ භාරයකට ඒ දේපළ යටත්ව ඇති අවස්ථාවක ; සහ

(ආ) සමාගම විසින් ඒ දේපළ විකුණා හෝ බැහැරකර ඇති අවස්ථාවක,

සමාගමෙන් ඒ දේපළ ලබාගන්නා යම් තැනැත්තකු චල සෘණ භාරයේ ලාභ ප්‍රයෝජනයට හිමිකම් ඇති තැනැත්තා වෙත, (3) වන උපවගන්තියේ හෝ (4) වන උපවගන්තියේ දක්වා ඇති අවස්ථාගත කරුණුවල දී දේපළේ අගය සඳහා ගිණුම් දීමට යටත් විය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකු විසින් ලබාගන්නා ලද දේපළේ අගය සඳහා–

(අ) සමාගමේ සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රියාවලිය තුළ දී දේපළ විකිණීම හෝ බැහැර කිරීම සිදු නොවුයේ නම් ; සහ

(ආ) සමාගමේ සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රියාවලිය තුළ දී දේපළ විකිණීම හෝ බැහැර කිරීම හෝ සිදු නොවුන බව ඒ තැනැත්තා දැනගෙන සිටියේ නම් හෝ සමාගම සමග ඔහුගේ ඇති

සම්බන්ධය හේතු කොට ගෙන ඔහු දැනගෙන සිටිය යුතුව තිබුණේ නම්,

හේතු දැක්වීමට ඒ තැනැත්තා යටත් විය හැකි ය.

(4) (2) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකු විසින් ලබාගන්නා ලද දේපළේ අගය සඳහා–

(අ) දේපළ විකිණීම හෝ බැහැර කිරීම හෝ චල සෘණ භාරය ඇති කරන්නා වූ සාධන පත්‍රය උල්ලංඝනය කිරීමක් වේ නම් ; සහ

(ආ) සාධන පත්‍රයේ නියම සහ එම නියම උල්ලංඝනය කිරීමකට තුඩු දෙන අවස්ථාගත කරුණු ඒ තැනැත්තා දැන සිටියේ නම් හෝ සමාගම සමග ඔහුගේ ඇති සම්බන්ධය හේතු කොට ගෙන ඔහු දැන සිටිය යුතුව තිබුනේ නම්,

හේතු දැක්වීමට ඒ තැනැත්තා යටත් විය හැකි ය.

**431**. (1) සමාගමක යම් දේපළක් චල සෘණ භාරයකට සහ නීතිය ක්‍රියාත්මකවීමෙන් උද්ගත වන ස්ථිර ඇපයකට යන දෙකටම යටත්වන අවස්ථාවක, චල සෘණ භාරය අභිභවා එම ස්ථාවර ඇපයට ප්‍රමුඛත්වය ලැබිය යුතු ය. චල සෘණ භාර වර්ග කිරීම.

(2) සමාගමක යම් දේපළක් චල සෘණ භාරයකට සහ සමාගම විසින් දෙන ලද ස්ථාවර ඇපයකට යන දෙකටම යටත්වන අවස්ථාවක–

(අ) (i) සමාගම විසින් ඒ ස්ථාවර ඇපය දීම, ඒ චල සෘණ භාරය ඇති කළ සාධන පත්‍රය මගින් තහනම් කර ඇත්නම් මිස ; හෝ

(ii) ඒ චල සෘණ භාරය ඇති කළ සාධන පත්‍රය ඒ ස්ථාවර ඇපය සමාගම විසින් දෙනු ලැබූ දිනයට පෙර මේ පනතේ VI වන කොටස යටතේ ලියා පදිංචි කර ඇත්නම් මිස ; හෝ

(ආ) ඒ ස්ථාවර ඇපය අභිභවා ප්‍රමුඛත්වය ඒ චල සෘණ භාරයට දිය යුතු බව, ඒ චල සෘණ භාරය ඇති කරන සාධන පත්‍රයෙහි ප්‍රකාශිතවම සඳහන්කොට ඇත්නම් සහ ස්ථාවර ඇපයේ

ප්‍රතිලාභවලට හිමිකම ඇති තැනැත්තා ඒ ප්‍රමුඛත්වය දීම සම්බන්ධයෙන් තම එකඟත්වය ලිඛිතව ප්‍රකාශ කර ඇත්නම් මිස ; හෝ

(ඇ) සමාගම විසින් ස්ථාවර ඇපය දෙන ලද්දේ කවර දිනයක ද ඒ දිනයට පෙරාතුව 433 වන වගන්තියේ නියම අනුව, චල සෘණ භාරය ඒ දේපළට අදාළ කොට ඇත්නම් සහ–

(i) ඒ දේපළ සම්බන්ධයෙන් දේපළ භාර ගැණුම්කරුවකු පත් කරනු ලැබ සහ ස්ථාවර ඇපය ප්‍රදානය කරන ලද්දේ කවර තැනැත්තකුට ද ඒ තැනැත්තාට ඒ භාර ගැණුම්කරු පත් කිරීම පිළිබඳ දැන්වීම දී ඇත්නම් ; හෝ

(ii) ස්ථාවර ඇපය ප්‍රදානය කරන ලද්දේ කවර තැනැත්තකුට ද ඒ තැනැත්තා–

(අ) ඒ චල සෘණ භාරය ඒ දේපළට අදාළ කොට ඇති බව ;

(ආ) ස්ථාවර ඇපය ප්‍රදානය කිරීම චල සෘණ භාරය ඇති කරන සාධන පත්‍රය උල්ලංඝනය කිරීමක් වූ බව ; හෝ

(ඇ) ඒ ස්ථාවර ඇපය ප්‍රදානය කිරීම සමාගමේ සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රියාවලිය තුළ දී සිදුවූවක් නොවන බව,

දැනගෙන සිටියා වූ හෝ සමාගම සමඟ ඔහුගේ ඇති සම්බන්ධය හේතු කොටගෙන ඔහු දැනගෙන සිටිය යුතු වූ විටක දී මිස,

ස්ථාවර ඇපයට ඒ චල සෘණ භාරය අභිබවා ප්‍රමුඛත්වය තිබිය යුතු ය.

(3) සමාගමක යම් දේපළක් චල සෘණ භාර එකකට වඩා වැඩි සංඛ්‍යාවකට යටත් කොට ඇති අවස්ථාවක දී, චල සෘණ භාරයක් ඇති කරන සාධන පත්‍රයෙහි අඩංගු පටහැනිව වූ යම් විධිවිධානයක් ඇත්නම් සහ ඒ චල සෘණ භාරයේ ප්‍රතිලාභයට හිමිකම ඇති තැනැත්තා ලිඛිතව එකඟත්වය දී ඇත්නම් ද ප්‍රමුඛත්වය දීම එමගින් කල්දමා ඇත්නම් ද ඒවාට යටත්ව ඒ චල සෘණ භාර VI වන කොටස යටතේ ලියාපදිංචි කරන ලද දිනවලට අනුව ඒ චල සෘණ භාර එකිනෙකට ප්‍රමුඛත්වය ලැබිය යුතු ය.

(4) සැක දුරු කිරීම සඳහා සහ චල සෘණ භාරයක් ඇති කරන ලද්දේ කවර සාධන පත්‍රයක් යටතේ ද ඒ සාධන පත්‍රයේ නියමයන්ට යටත්ව, චල සෘණ භාරයෙන් සුරක්ෂිත කරනු ලැබූ ණය හෝ බැඳීම් සියල්ලම හෝ එහි යම් කොටසක්–

(අ) සමාගම විසින් තදනන්තර චල සෘණ භාරයක් ඇති කිරීමෙන් සහ ලියාපදිංචි කිරීමෙන් පසු ; හෝ

(ආ) චල සෘණ භාරය සමන්විත වන මුළු දේපළ හෝ එහි යම් කොටසක් සම්බන්ධයෙන් සමාගම විසින් යම් ස්ථාවර ඇපයක් ප්‍රදානය කිරීමෙන් පසු,

දරා තිබීම හෝ පැන නැගී තිබීම හෝ මගින් චල සෘණ භාරයක ප්‍රමුඛත්වයට බලපෑමක් නොවිය යුතු ය.

(5) (අ) දේපළ භාර ගන්නකු පත්කර සිටින බව යම් තැනැත්තෙක් දන්නේ නම් හෝ සමාගම සමග ඔහුගේ ඇති සම්බන්ධය හේතු කොටගෙන ඒ බව ඒ තැනැත්තා දැනගෙන සිටිය යුත්තේ නම් ; හෝ

(ආ) 440 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයට අනුකූලව දේපළ භාර ගන්නකු පත්වීම පිළිබඳව ප්‍රසිද්ධ දැන්වීමක් දී ඇත්තේ නම්,

(2) වන උපවගන්තියේ කාර්ය සඳහා දේපළ භාර ගැනුම්කරුවකු පත්කිරීම පිළිබඳ දැන්වීම ඒ තැනැත්තාට ලැබී ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) 427 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන සීමා නොකර සමාගමකට අයත් ඉඩමක් චල සෘණ භාරයකට සහ (117 වන අධිකාරය වන) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ ස්ථාවර ඇපයකට යටත් වන අවස්ථාවක, ඒ ස්ථාවර ඇපය ලියාපදිංචි කිරීමට පෙරාතුව (117 වන අධිකාරය වන) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ ඒ ඉඩම සම්බන්ධයෙන් චල සෘණ භාරය ලියාපදිංචි කර ඇත්නම් නම් මිස, ස්ථාවර ඇපයට චල සෘණ භාරය අභිභවා ප්‍රමුඛත්වය ලැබිය යුතු ය.

වල සෘණ භාරය වෙනස් කිරීම හා නිදහස් කිරීම.

**432**. (1) සමාගම විසින් සාධන පත්‍රයක් ලියා අත්සන් කරනු ලබන ආකාරයෙන්ම, වල සෘණ භාරයක් ඇති කරන සාධන නියමයන් වෙනස් කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තියේ (3) වන උපවගන්තියේ අන්තර්ගත සුළු වෙනස්කිරීම්වලට යටත්ව–

(අ) යම් ස්ථාවර ඇපයක් හෝ, වල සෘණ භාරයක් අභිභවා යන හෝ ඊට සමාන හෝ ශ්‍රේණියේ වෙනත් යම් වල සෘණ භාරයක් හෝ ඇති කිරීම තහනම් හෝ සීමා කරන්නා වූ ;

(ආ) වල සෘණ භාරයේ අනුපිළිවෙල සහ වර්ගය ස්ථාවර ඇපවලට හෝ වෙනත් වල සෘණ භාරවලට අදාළව වෙනස් කරන්නා වූ හෝ අන්‍යාකාරයෙන් විධිමත් කරන්නා වූ ;

(ඇ) වල සෘණ භාරයෙන් දේපළ මුදාහරින්නා වූ ; හෝ

(ඈ) වල සෘණ භාරය මගින් නිශ්චිත බැඳීමක් හෝ නිශ්චිත මුදල් ප්‍රමාණයක් හෝ සුරක්ෂිත කරනු ලබන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ බැඳීම වෙනස් කරන්නා වූ හෝ ඒ මුදල් ප්‍රමාණය වැඩි කරන්නා වූ,

මේ වගන්තිය යටතේ වූ වෙනස් කිරීමේ සාධන පත්‍රයක් සම්බන්ධයෙන්, 102 වන වගන්තියේ (1) වන හා (3) වන උපවගන්තිය සහ 103 වන වගන්තිය සහ 108 වන වගන්තිය අදාළ විය යුතු ය.

(3) 102 වන වගන්තියේ (1) වන හා (3) වන උපවගන්තිවල විධිවිධාන හා 103 හා 108 වන වගන්තිවල විධිවිධාන–

(අ) සෘණ භාරයක් සම්බන්ධයෙන් කරනු ලබන සඳහන් කිරීම් වල සෘණ භාරයක වෙනස් කිරීමක් සම්බන්ධයෙන් කරනු ලබන සඳහන් කිරීම් වූවාක් මෙන් ;

(ආ) සෘණ භාරයක් ඇති කිරීම සම්බන්ධයෙන් කරනු ලබන සඳහන් කිරීම් වෙනස් කිරීමේ සාධන පත්‍රයක් ලියා අත්සන් කිරීම සම්බන්ධයෙන් කරනු ලබන සඳහන් කිරීම් වූවාක් මෙන්,

(2) වන උපවගන්තිය අදාළ වන වෙනස් කිරීමේ සාධන පත්‍රයක් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) චල සෘණ භාරයක් ඇති කරන්නා වූ සාධන පත්‍රයක නියමයන් වෙනස් කිරීමක්, චල සෘණ භාරයේ පූර්වයෙන් සමන්විත නොවුනු දේපළ කෙරෙහි ඒ චල සෘණ භාරය ව්‍යාප්ත කිරීමේ බලපෑම ඇති අවස්ථාවක, සංශෝධනය කරනු ලැබුවේ කවර සාධන පත්‍රයක් මගින් ද ඒ සාධන පත්‍රය එම අතිරේක දේපළ සම්බන්ධයෙන් අළුත් චල සෘණ භාරයක් ඇතිකරන සාධන පත්‍රයක් වූවාක්මෙන් අතිරේක දේපළ සම්බන්ධයෙන් වූ චල සෘණ භාරයේ ප්‍රමුඛත්වය තීරණය කරනු ලැබිය යුතු ය.

(5) චල සෘණ භාරයක් එය සමන්විත වන්නා වූ සමස්ත දේපළ හෝ එහි යම් කොටසක් සම්බන්ධයෙන්, ඒ චල සෘණ භාරය, ඇති කරනු ලැබිය හැක්කේ කවර ආකාරයකින් ද ඒ ආකාරයෙන් ම මුදා හරිනු ලැබිය හැකි ය.

චල සෘණ භාරයක් දේපළට බද්ධ වන්නේ කවර අවස්ථාවල දී ද යන වග.

**433**. (1) පහත දක්වනු ලබන කරුණුවලින් යම් කරුණක් සිදු වූ විට, සෘණ භාරය සමන්විත වූ සියලු දේපළ සම්බන්ධයෙන් චල සෘණ භාරයක් බද්ධ විය යුතු අතර, ඉන් ස්ථාවර ඇපයක් සජීත විය යුතු ය :—

(අ) චල සෘණ භාරය ඇති කරන්නා වූ සාධන පත්‍රයේ නියමයන් යටතේ වුව ද නැතහොත් අන්‍යාකාරයෙන් වුව ද සමාගමේ සමස්ත දේපළේ හෝ ව්‍යාපාර කටයුතුවල හෝ ඒවායේ යම් කොටසක දේපළ භාර ගැණුම්කරුවකු පත් කිරීම ;

(ආ) සමාගම ගණන් බේරා වසා දැමීම ආරම්භ වීම ;

(ඇ) සමාගමේ සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රියාවලිය තුළ දී හැරෙන්නට, එහි සමස්ත ව්‍යාපාර කටයුත්ත හෝ ඉන් යම් කොටසක් සමාගම විසින් බැහැර කිරීම ;

(ඈ) සමාගම විසින් ව්‍යාපාරය කරගෙන යාම නතර කිරීම ;

(ඉ) චල සෘණ භාරය ඇති කරන සාධන පත්‍රයෙහි ප්‍රකාශ කර ඇත්තේ වෙනත් යම් කරුණක සිදුවීමක් ද ඒ කරුණ, චල සෘණ භාරය සමන්විත වන දේපළට, ඒ චල සෘණ භාරය අදාළ කිරීමේ බලපෑම ඇති කරනු ලබන කරුණක් වීම ;

(2) (අ) චල සෘණ භාරයක් සමාගමක යම් දේපළකට බද්ධ වී ඇති ; සහ

(ආ) වල සෘණ භාරය බද්ධ වී ඇති යම් දේපළක් සමාගම විසින් විකුණා හෝ අන්‍යාකාරයෙන් බැහැර කරන අවස්ථාවක,

දේපළ විකුණනු ලැබුවේ හෝ අන්‍යාකාරයකින්, බැහැර කරනු ලැබුවේ කවර තැනැත්තකු වෙත ද, එවිට–

(ඇ) දේපළ සම්බන්ධයෙන් දේපළ භාරගැණුම්කරුවකු පත් කරනු ලැබ ඇත්තේ නම් සහ භාර ගැණුම්කරු පත්කිරීම් පිළිබඳ දැන්වීම ඒ තැනැත්තාට ලැබී ඇත්තේ නම් ; හෝ

(ඇ) (i) වල සෘණ භාරය ඒ දේපළට අදාළ වී ඇති බව;

(ii) විකිණීම හෝ බැහැර කිරීම වල සෘණ භාරය ඇති කරන සාධන පත්‍රය උල්ලංඝනය කිරීමක් බව ; හෝ

(iii) විකිණීම හෝ බැහැර කිරීම සමාගමේ සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රියාවලිය තුළ දී සිදු වී නැති බව

ඒ තැනැත්තා දැනගෙන සිටියේ නම් හෝ සමාගම සමග ඒ තැනැත්තාගේ ඇති සම්බන්ධතාව හේතුවෙන් දැනගෙන සිටිය යුතු වූයේ නම්,

වල සෘණ භාරයේ ඵලප්‍රයෝජනය සඳහා හිමිකම් ඇති තැනැත්තාට ඒ දේපළේ අගය පිළිබඳව ගිණුම් දීමට ඒ තැනැත්තා බැඳී සිටිය යුතු ය.

(3) (අ) වල සෘණ භාරයේ ඵලප්‍රයෝජනයට හිමිකම් ඇති තැනැත්තා විසින් දේපළ සම්බන්ධයෙන් පත්කරන ලද දේපළ භාරගන්නකු විසින් හෝ ඒ දේපළ භාරගන්නාගේ අධිකාරය යටතේ හෝ කරන ලද දේපළ විකිණීමකට ;

(ආ) වල සෘණ භාරය ප්‍රකාර හෝ ඒ දේපළ සම්බන්ධයෙන් වල සෘණ භාරයට පූර්වයෙන් වර්ග කෙරෙන, හිමිකම්පෑම් කරන තැනැත්තාට ප්‍රතිලාභ ලැබෙන වෙනත් ඇපයක් ප්‍රකාර හෝ සිදුවන දේපළ විකිණීමකට ; හෝ

(ඇ) අධිකරණය මගින් කරන දේපළ විකිණීමකට,

(2) වන උපවගන්තියේ කිසිවක් අදාළ නොවිය යුතු ය.

(4) සමාගම විසින් බැහැර කරන ලද දේපළේ වටිනාකම සඳහා, චල සෘණ භාරයේ හිමිකරුට ගිණුම් දීමට බැඳී සිටින තැනැත්තකුට, ඒ දේපළ වෙනුවට, චල සෘණ භාරය දරන්නාට ලබාගත හැකිව තිබෙන ඒ දේපළ සඳහා සමාගම වෙත ලබා දුන් යම් ප්‍රතිෂ්ඨාවක වටිනාකම හිලව් කරනු ලැබිය යුතු ය.

(5) (අ) දේපළ භාර ගැනුම්කරුවකු පත්කරනු ලැබ ඇති බව යම් තැනැත්තකු දන්නේ නම් හෝ සමාගම සමග වූ ඔහුගේ සම්බන්ධතාවය හේතුකොටගෙන දැනගත යුතු වූයේ නම් ; හෝ

(ආ) 440 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයට අනුකූලව දේපළ භාර ගැනුම්කරුගේ පත්වීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමක් කර තිබුනේ නම්,

(2) වන උපවගන්තියේ කාර්ය සඳහා දේපළ භාර ගැනුම්කරුගේ පත්වීම පිළිබඳ දැන්වීම ඒ තැනැත්තා වෙත ලැබී ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) සැක දුරු කිරීම සඳහා, මේ වගන්තිය යටතේ චල සෘණ භාරයක්, ස්ථිර සෘණ භාරයක් බවට පත් වූ අවස්ථාවක, ප්‍රදානලාභියා විසින් XV වන කොටස යටතේ දේපළ භාර ගැනුම්කරුවකු පත් කිරීමට ඔහුට ඇති යම් අයිතියකට අගතියක් නොමැතිව, (89 වන අධිකාරය වන) උකස් පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ ස්ථිර සෘණ භාරයක් දරන්නකුට ලබාගත හැකිව ඇති වෙනත් යම් ප්‍රතිකර්මයක් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

## XV වන කොටස

## දේපළ භාර ගැනුම්කරුවන් සහ කළමනාකරුවන්

**434**. මේ පනතේ මේ කොටසේ පද සම්බන්ධය අනුව අන්‍යාකාරයෙන් නියම කරනු ලැබ ඇත්තේ නම් මිස,– අර්ථ නිරූපණය.

"ණය හිමියා" යන්නට, යම් වර්තමාන හෝ අනාගත, නියත හෝ සම්භාව්‍ය ණයක් හෝ වගකීමක් සහ ස්ථිර ලෙස දැනගත් ණයක් හෝ වගකීමක් හෝ අලාභ සඳහා වූ වගකීමක් හෝ ප්‍රදානකරු විසින් ණයව ඇත්තේ හෝ වගකීමකට යටත්ව ඇත්තේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා ඇතුළත් වේ ;

"ප්‍රදානලාභියා" යන්නෙන් චල සෘණ භාරයක් ඇතිකරන්නා වූ සාධන පත්‍රයකට අදාළ වන විට සාධන පත්‍රයේ ප්‍රතිලාභය සඳහා හිමිකම් ලබන තැනැත්තා අදහස් වේ ;

"ප්‍රදානකරු" යන්නෙන්, දේපළ භාර ගැනුම්කරුවකු පත් කරනු ලබන්නේ හෝ පත් කරනු ලැබිය හැක්කේ යම් තැනැත්තකුගේ දේපළ සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තා අදහස් වේ ;

"ඇවරකරු" යන්නෙන්, XII වන කොටස යටතේ පත් කරන ලද ඇවරකරුවකු අදහස් වේ ;

"උකස" යන්නට, මුදලක් හෝ මුදලක විටිනාකම වෙනුවෙන් ඇප වශයෙන් යම් දේපළක් කෙරෙහි වූ සෘණ භාරයක් ඇතුළත් වේ ;

"උකස් ලාභියා" යන්නට, මුල් උකස්ලාභියා යටතේ කලින් කල හිමිකම ලබන තැනැත්තෙක් ඇතුළත් වන නමුත්, දේපළ භාර ගැනුම්කරුවකු ඊට ඇතුළත් නොවේ ;

"වරණීය හිමිකම්පෑම" යන්නෙන්, නවවන උපලේඛනයේ (ඒ උපලේඛනයේ 1 වන ඡේදයේ හැර) සඳහන් හිමිකම් පෑම අදහස් වේ ;

"දේපළ" යන්නට,

(අ) චංචල සහ නිශ්චල දේපළ ;

(ආ) චංචල හෝ නිශ්චල දේපළකට සම්බන්ධතාවක් ;

(ඇ) ණයක් ;

(ඈ) නඩුවකට විෂය වී ඇති කිසිවක් ;

(ඉ) වෙනත් යම් අයිතිවාසිකමක් හෝ සම්බන්ධතාවක්,

ඇතුළත් වේ.

"දේපළ භාර ගැනුම්කාරත්වයට ඇතුළත් දේපළ" යන්නෙන්, දේපළ භාර ගැනුම්කරුවකු පත් කරනු ලැබ ඇත්තේ යම් දේපළක් වෙනුවෙන් ද ඒ දේපළ අදහස් වේ.

"දේපළ ගැනුම්කරු" යන්නෙන්—

(අ) යම් සාධන පත්‍රයක් යටතේ ; හෝ

(ආ) මේ පනතින් අධිකරණයක් වෙත පැවරී ඇති බලයක් ක්‍රියාවේ යෙදවීමෙහි ලා අධිකරණය විසින්,

යම් දේපළක් සඳහා දේපළ භාරගැනුම්කරු හෝ කළමනාකරුවකු හෝ දේපළ භාර ගැනුම්කරු හා කළමනාකරුවකු හෝ වශයෙන් පත් කරන ලද තැනැත්තකු, එසේ පත් කරනු ලැබූ තැනැත්තාට භාර ගැනුම්කාරත්වයට ඇතුළත් යම් දේපළ විකිණීම සඳහා බලය තිබුණද නොතිබුණද අදහස් වන නමුත්, ඊට—

(ඇ) පෞද්ගලිකව තමාම හෝ අනුයෝජිතයකු මගින් හෝ—

(i) උකස් දේපළෙහි ආදායම ලැබීමේ ;

(ii) උකස් දේපළක සන්තකයට ඇතුළුවීමේ හෝ පාලනය අත්කර ගැනීමේ ; හෝ

(iii) උකස් දේපළ විකිණීමේ හෝ අන්‍යාකාරයකින් අන්සතු කිරීමේ

බලයක් ක්‍රියාවේ යොදවන උකස් හිමියකු ; හෝ

(ඇ) එවැනි යම් උකස් ලාභියකුගේ අනුයෝජිතයකු හෝ

ඇතුළත් නොවේ.

**දේපළ භාර ගැනුම්කරුවකු පත් කිරීමේ බලය**

**435**. සමාගමක සම්පූර්ණ දේපළ සහ ව්‍යාපාර කටයුතු වෙනුවෙන් චල සෘණ භාරයක් ඇති කරවන සාධන පත්‍රයක් මගින්, සමාගමේ දේපළ සහ ව්‍යාපාර කටයුතු සඳහා දේපළ භාර ගැනුම්කරුවකු පත් කිරීමේ බලය, ප්‍රදානලාභියා වෙත පවරා දෙනු ලැබිය හැකි ය.

දේපළ භාර ගැනුම්කරුවකු පත් කිරීමට සාධන පත්‍රය මගින් බලය පැවරිය හැකි බව.

## දේපළ භාර ගැනුම්කරුවකුගේ සුදුසුකම්

දේපළ භාර ගැනුම්කරුවකුගේ සුදුසුකම්.

**436**. (1) මෙහි පහත සඳහන් තැනැත්තකු දේපළ භාර ගැනුම්කරුවකු ලෙස පත් කිරීම හෝ දේපළ භාර ගැනුම්කරුවකු ලෙස කටයුතු කිරීම හෝ කරනු නොලැබිය හැකි වන්නේය :—

(අ) වයස අවුරුදු දහඅටට අඩු තැනැත්තකු ;

(ආ) ප්‍රදානකරුගේ ණය හිමියකු ;

(ඇ) (i) ප්‍රදානකරුගේ නිලධරයකු හෝ සේවා නියුක්තයකු වන හෝ දේපළ භාර ගැනුම්කාරත්වය ආරම්භ වීමට පෙරාතුවම අවුරුදු දෙකක කාලසීමාව ඇතුළත නිලධරයකුව හෝ සේවා නියුක්තයකුව සිටි තැනැත්තකු ;

(ii) දේපළ භාර ගැනුම්කාරත්වයට ඇතුළත් දේපළෙහි උකස්ලාභියකුගේ නිලධරයකු හෝ සේවා නියුක්තයකු වන හෝ දේපළ භාර ගැනුම්කාරත්වය ආරම්භ වීමට පෙරාතුවම අවුරුදු දෙකක කාලසීමාව ඇතුළත උකස්ලාභියාගේ නිලධරයකුව හෝ සේවා නියුක්තියකුව සිටි තැනැත්තකු ;

(ඈ) ප්‍රදානකරු විසින් නිකුත් කරන ලද කොටසක් කෙරෙහි සෘජුවම හෝ වක්‍රව සම්බන්ධතාවක් තිබෙන හෝ දේපළ භාර ගැනුම්කාරත්වය ආරම්භ වීමට පූර්ව අවුරුදු දෙකක කාලසීමාව ඇතුළත සම්බන්ධතාවක් තිබුණු තැනැත්තකු ;

(ඉ) නිදහස් කරනු නොලැබූ වස්තුභංගත්වයට පත් වූ තැනැත්තකු ;

(ඊ) සිහිවිකල තැනැත්තකු බවට (227 වන අධිකාරය වූ) මානසික රෝග ආඥාපනත යටතේ, තීන්දු කරන ලද තැනැත්තකු ;

(උ) 468 වන වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ, තමා සම්බන්ධයෙන් නියමයක් කරනු ලැබ ඇති තැනැත්තකු ;

(ඌ) 1982 අංක 17 දරන සමාගම් පනතේ 186 වන වගන්තිය යටතේ, සමාගමක අධ්‍යක්ෂවරයකුව හෝ ප්‍රවර්ධකයකුව සිටීම හෝ සමාගමක කළමනාකරණයට සහභාගි වීම හෝ

සම්බන්ධතාවක් දැරීම හෝ තහනම් කරනු ලැබූ හෝ ඒ පනත ඉවත් කරනු ලැබීම නිසා නොවේ නම් එසේ තහනම් කරනු ලැබීමට තිබුණු තැනැත්තකු ;

(එ) 213 හෝ 214 වන වගන්ති යටතේ සමාගමක අධ්‍යක්ෂවරයකුව සිටීම හෝ ප්‍රවර්ධකයකුව සිටීම හෝ සමාගමක කළමනාකරණයට සහභාගිවීම හෝ සම්බන්ධතාවක් දැරීම හෝ තහනම්ව සිටින තැනැත්තකු ;

(ඒ) දේපළ භාර ගැනුම්කරුවකු පත් කිරීමේ බලය පවරන සාධන පත්‍රය මගින්ම, දේපළ භාර ගැනුම්කරුවකු ලෙස කටයුතු කිරීමට නුසුදුස්සකුව සිටින තැනැත්තකු.

(2) සංස්ථාවක්, දේපළ ගැනුම්කරුවකු ලෙස පත් කරනු ලැබීම හෝ ක්‍රියා කිරීම හෝ නොකළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය හෝ උල්ලංඝනය වන පරිදි ක්‍රියා කරන තැනැත්තෙක් වරදක් කරන අතර, වරදකරු, කරනු ලැබූ විට, රුපියල් දෙලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

### දේපළ භාරගැනුම්කරුවකු පත් කිරීම

**437**. (1) සමාගමක දේපළ සහ ව්‍යාපාර කටයුතු සඳහා දේපළ භාර ගැනුම්කරුවකු පත් කිරීමේ බලය, සාධන පත්‍රයක් මගින් ප්‍රදානලාභියා වෙත පැවරී ඇති අවස්ථාවක, ප්‍රදානලාභියා විසින් හෝ වෙනුවෙන් අත්සන් තබන ලද ලියවිල්ලකින් වූ සාධන පත්‍රයක් මගින්, ප්‍රදානලාභියා විසින් දේපළ භාර ගැනුම්කරුවකු පත් කරනු ලැබිය හැකි ය.

සාධන පත්‍රය යටතේ දේපළ භාර ගැනුම්කරුවකු පත් කිරීම.

(2) සාධන පත්‍රයක් මගින් හෝ සාධන පත්‍රයකින් පවරන ලද බලය යටතේ හෝ පත්කරන ලද දේපළ භාර ගැනුම්කරුවකු ඒ සාධන පත්‍රය මගින් ප්‍රකාශිතවම අන්‍යාකාර විධිවිධාන සලසා ඇත්නම් මිස, ප්‍රදානකරුගේ අනුයෝජිතයා විය යුතු ය.

(3) (අ) වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව තිබුණද ; සහ

(ආ) දේපළ භාර ගැනුම්කරුවකු පත් කරනු ලබන්නේ යම් දේපළක් සඳහා ද ඒ දේපළට නිශ්චල දේපළ ඇතුළත් වුව ද නොවුව ද,

මේ වගන්තිය යටතේ දේපළ භාර ගැනුම්කරුවකු පත් කරනු ලැබිය හැකි ය.

(4) (අ) මේ වගන්තිය යටතේ දේපළ භාර ගැනුම්කරුවකු පත් කිරීම, උකස් නඩුවක් නොවන බව ; සහ

(ආ) (89 වන අධිකාරය වූ) උකස් පනතේ 46 වන වගන්තියේ අන්තර්ගත කිසිවක් මේ වගන්තිය යටතේ දේපළ භාර ගැනුම්කරුවකු පත් කිරීම කෙරෙහි බල නොපාන බව හෝ එසේ පත් කිරීම හා සම්බන්ධයෙන් අදාළ නොවන බව

සැක දුරු කිරීම සඳහා මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

දේපළ භාර ගැනුම්කරුවකු පත් කිරීමේ බලයේ ප්‍රමාණය.

**438**. (1) දේපළ භාර ගැනුම්කරුවකු පත් කිරීම සඳහා සාධන පත්‍රයක් මගින් පවරන ලද බලයට, සාධන පත්‍රයේ අන්‍යාකාර විධිවිධාන සලසා ඇත්නම් මිස,—

(අ) දේපළ භාර ගැනුම්කරුවන් දෙදෙනකු හෝ වැඩි සංඛ්‍යාවක් පත් කිරීමේ ;

(ආ) තත්කාලයෙහි ධුරය දරන දේපළ භාර ගැනුම්කරුවන් එක් කෙනෙකුට හෝ වැඩි සංඛ්‍යාවකට අමතරව දේපළ භාර ගැනුම්කරුවකු පත් කිරීමේ ;

(ඇ) ධුරය පුරප්පාඩු වී තිබෙන දේපළ භාර ගැනුම්කරුවකු වෙනුවට අනුප්‍රාප්ත වීම සඳහා දේපළ භාර ගැනුම්කරුවකු පත් කිරීමේ

බලය ද ඇතුළත් වේ.

(2) එකම බලතල ඇතිතාක් දුරට, දේපළ භාර ගැනුම්කරුවන් දෙදෙනකුට හෝ වැඩි සංඛ්‍යාවකට, ඔවුන් පත් කරන ලද්දේ යම් සාධන පත්‍රයක් යටතේ ද ඒ සාධන පත්‍රයේ හෝ ඔවුන් පත් කරන ලද්දේ යම් අධිකරණ ආඥාවක් යටතේ ද ඒ ආඥාවෙන් හෝ ප්‍රකාශිතවම අන්‍යාකාර විධිවිධාන සලසා ඇත්නම් මිස, එක්ව හෝ වෙන් වෙන්ව ක්‍රියාකළ හැකි ය.

අධිකරණය විසින් දේපළ භාර ගැනුම්කරුවකු පත්කළ හැකි බව.

**439**. (1) සමාගමක් විසින් ප්‍රදානය කරන ලද ස්ථාවර ඇපයකට හෝ චල සෘණ භාරයකට හෝ යටත්ව කවර හෝ දේපළක් සඳහා, ඒ ස්ථාවර ඇපයේ හෝ චල සෘණ භාරයේ ප්‍රදානලාභියාගේ ඉල්ලීම මත-

(අ) ප්‍රදානලාභියාට අයවිය යුතු ණය මුදලක් ගෙවීම සමාගම විසින් පැහැර හැර ඇති බවට හෝ ප්‍රදානලාභියා වෙත ඇති යම් බැඳීමක් ඉටු කිරීම අන්‍යාකාරයකින් පැහැර හැර ඇති බවට ;

(ඇ) ඒ ඇපය හෝ සෘණ භාරය ඇතිකරනු ලැබූ යම් සාධන පත්‍රයක නියමයන් කඩ කරමින්, ඇප දේපළ විකිණීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට සමාගම අදහස් කරන බවට ; හෝ

(ඈ) ප්‍රදානලාභියාගේ ප්‍රතිලාභය පිණිස, ඇප දේපළවල සුරක්ෂිතභාවය පිළිබඳව වගබලා ගැනීම සඳහා දේපළ භාරගන්නකු පත් කිරීම අවශ්‍ය බවට,

අධිකරණය සෑහීමට පත්වූ අවස්ථාවක අධිකරණය විසින්, අධිකරණයට ආවේණික අධිකරණ බලය හෝ වෙනත් යම් ලිඛිත නීතියක් අදාළ වීම හෝ සීමා නොකර, දේපළ භාර ගැනුම්කරුවකු පත් කරනු ලැබිය හැකි ය.

(2) (අ) වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද ; සහ

(ආ) දේපළ භාරගැනුම්කරුවකු පත් කරනු ලබන්නේ යම් දේපළක් සම්බන්ධව ද ඒ දේපළට නිශ්චල දේපළක් ඇතුළත් වුව ද නොවුව ද

මේ වගන්තිය යටතේ දේපළ භාර ගැනුම්කරුවකු පත් කරනු ලැබිය හැකි ය.

(3) (අ) මේ වගන්තිය යටතේ දේපළ භාර ගැනුම්කරුවකු පත් කිරීම උකස් නඩුවක් නොවන බව ; සහ

(ආ) (89 වන අධිකාරය වූ ) උකස් පනතේ 46 වන වගන්තියේ අන්තර්ගත කිසිවක්, මේ වගන්තිය යටතේ දේපළ භාර ගැනුම්කරුවකු පත් කිරීම කෙරෙහි බල නොපාන බව හෝ එසේ පත් කිරීම සම්බන්ධව අදාළ නොවන බව

සැක දුරු කිරීම සඳහා මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

**440**. (1) දේපළ භාර ගැනුම්කරුවකු පත් කරනු ලැබීමෙන් පසු අප්‍රමාදව, කෙසේ වෙතත්, පත් කරනු ලැබීමෙන් පසු වැඩ කරන දින දහයක් පසු නොවී— දේපළ භාර ගැනුම්කරුවකු පත්කිරීම පිළිබඳ දැන්වීම.

(අ) ඔහුගේ හෝ ඇයගේ පත්වීම පිළිබඳව, ප්‍රදානකරු වෙත ලිඛිත දැන්වීමක් කළ යුතු ය ;

(ආ) ඔහුගේ හෝ ඇයගේ පත්වීම පිළිබඳව පහත දැක්වෙන කරුණු ඇතුළත් ප්‍රසිද්ධ නිවේදනයක් කළ යුතු ය :—

(i) දේපළ භාර ගැනුම්කරුගේ සම්පූර්ණ නම ;

(ii) පත්කිරීමේ දිනය ;

(iii) දේපළ භාර ගැනුම්කරුගේ කාර්යාලීය ලිපිනය ; සහ

(iv) දේපළ භාර ගැනුම්කාරත්වයට ඇතුළත් දේපළ පිළිබඳ ලුහුඬු විස්තරයක් ; සහ

(ඇ) ප්‍රසිද්ධ නිවේදනයේ පිටපතක් රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතු ය.

(2) දේපළ භාර ගැනුම්කරුවකු පත්කිරීම, අවස්ථාවෝචිත පරිදි ඒ වනවිටත් ධුරය දරන භාර ගැනුම්කරුවකුට අතිරේකව නම් හෝ දේපළ භාර ගැනුම්කරුවකු ලෙස වූ ධුරය හිස් කළ තැනැත්තකු වෙනුවට නම් හෝ ඒ බව, මේ වගන්තිය යටතේ වූ සෑම දැන්වීමකම සඳහන් විය යුතු ය.

(3) මේ වගන්තිය උල්ලංඝනය වන පරිදි ක්‍රියාකරන සෑම දේපළ භාර ගැනුම්කරුවකුම වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස්දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

දේපළ භාර ගැනුම්කාරත්වය පිළිබඳ දැන්වීම.

441. (1) සමාගමක දේපළ හා ව්‍යාපාර කටයුතු සඳහා දේපළ භාර ගැනුම්කරුවකු පත් කරනු ලැබ ඇති අවස්ථාවක, ප්‍රදානකරු විසින් හෝ දේපළ භාර ගැනුම්කරු විසින් හෝ ප්‍රදානකරු හෝ දේපළ භාර ගැනුම්කරු හෝ වෙනුවෙන් හෝ ඇතුළත් වනු ලබන හෝ නිකුත් කරනු ලබන සහ ප්‍රදානකරුගේ නම සඳහන් වන සෑම ගිවිසුමක සහ ලේඛනයකම දේපළ භාර ගැනුම්කරුවකු පත් කර තිබෙන බව පැහැදිලිව සඳහන් විය යුතු ය.

(2) නිශ්චිත වත්කමක් හෝ වත්කම් හෝ සම්බන්ධව දේපළ භාර ගැනුම්කරුවකු පත් කරනු ලැබ ඇති අවස්ථාවක, ප්‍රදානකරු හෝ දේපළ භාර ගැනුම්කරු විසින් හෝ ප්‍රදානකරු හෝ දේපළ භාර ගැනුම්කරු හෝ වෙනුවෙන් හෝ ඇතුළත්වනු ලබන සහ නිකුත් කරනු ලබන, සහ ප්‍රදානකරුගේ නම සඳහන් වන, ඒ වත්කම හෝ වත්කම් හා සම්බන්ධ සෑම ගිවිසුමක ම සහ ලේඛනයකම, දේපළ භාර ගැනුම්කරුවකු පත් කර තිබෙන බව පැහැදිලිව සඳහන් විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය අනුව ක්‍රියා කිරීම පැහැර හැර තිබීමෙන් අදාළ ගිවිසුමේ හෝ ලේඛනයේ වලංගු භාවය කෙරෙහි බලපෑමක් නොවන්නේ ය.

(4) (අ) (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය උල්ලංඝනය වන පරිදි ක්‍රියා කරන ; හෝ

(ආ) (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය උල්ලංඝනය කිරීමට දැන දැනම හෝ හිතා මතාම බලය දෙන හෝ අවසර දෙන,

සෑම තැනැත්තෙක්ම වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

දේපළ භාර ගැනුම්කරුගේ ධූරයක පුරප්පාඩුව.

**442**. (1) දේපළ භාර ගැනුම්කරු වශයෙන් ධූරය දරන්නකු ඉල්ලා අස් වූ විට, මරණයට පත් වූ විට හෝ 436 වන වගන්තිය යටතේ නුසුදුස්සකු බවට පත් වූ විට, එම භාර ගැනුම්කාර ධූරය හිස් වන්නේ ය.

(2) සාධන පත්‍රයක් මගින් පවරන ලද බලය යටතේ පත් කරනු ලැබූ දේපළ භාර ගැනුම්කරුවකු විසින් තමාගේ පත්වීම කරනු ලැබුවේ යම් තැනැත්තකු විසින් ද ඒ තැනැත්තා වෙත, තමා ඉල්ලා අස්වීමට අදහස් කරන බවට, වැඩ කරන දවස් පහකට නොඅඩු ලිඛිත කල් දීමක් කොට, ධූරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(3) ඉල්ලා අස්වීම නොවන වෙනත් යම් හේතුවක් නිසා දේපල භාර ගැනුම්කරුවකුගේ ධූරයෙහි පුරප්පාඩුවක් ඇති වුවහොත්, ධූරය හිස් කරන තැනැත්තා විසින් හෝ ඒ තැනැත්තාට ක්‍රියා කිරීමට නොහැකි නම් ඔහුගේ නීත්‍යානුකූල නියෝජිතයා විසින් හෝ ඒ පුරප්පාඩුව පිළිබඳව රෙජිස්ට්‍රාර්වරයා වෙත ලිඛිත දැනුම්දීමක් භාර දෙනු ලැබිය යුතු ය.

(4) අධිකරණය විසින් පත් කරනු ලැබූ දේපළ භාර ගැනුම්කරුවකු අධිකරණයේ පූර්ව අවසරය නොමැතිව ධූරයෙන් ඉල්ලා අස් නොවිය යුතු ය.

(5) දේපළ භාර ගැනුම්කරුගේ ධූරය හිස් කරන තැනැත්තකු විසින්, ප්‍රායෝගිකව හැකි අවස්ථාවලදී ඔහුගේ හෝ ඇගේ අනුප්‍රාප්තිකයාට සාධාරණව අවශ්‍ය විය හැකි පරිදි දේපළ භාර ගැනුම්කාරත්වය පවත්වාගෙන යාමෙහි දී අවශ්‍ය විය හැකි යම් තොරතුරු සැපයීම හා සහාය දීම කරනු ලැබිය යුතු ය.

(6) දේපළ භාර ගැනුම්කරුවකුගේ ධූරයක පුරප්පාඩුවක් පිරවීම සඳහා පත් කරනු ලැබූ තැනැත්තකුගේ ඉල්ලීම පිට, දේපළ භාර ගැනුම්කරුවකුගේ කාර්යය ඉටු කිරීම පහසු කරවීම, සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය බවට අධිකරණය සලකන වෙනත් යම් ආඥාවක් අධිකරණය වි සින් කරනු ලැබිය හැකි ය.

(7) (3) වන උපවගන්තියේ නියම අනුව ක්‍රියා කිරීම සාධාරණ හේතුවක් නොමැතිව පැහැර හරින සෑම තැනැත්තෙක්ම වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

දේපළ භාර ගැනුම්කරුවන්ගේ බලතල

දේපළ භාර ගැනුම්කරුවන්ගේ බලතල.

**443**. (1) දේපළ භාර ගැනුම්කරුවකු පත් කිරීම කරන ලද්දේ යම් සාධනපත්‍රයක් හෝ අධිකරණ ආඥාවක් මගින් හෝ යටතේ ද ඒ සාධන පත්‍රය හෝ ආඥාව මගින් ප්‍රකාශිතව හෝ ව්‍යංගිකව පැවරී තිබෙන බලතල හා අධිකාරය දේපළ භාර ගැනුම්කරුවකුට තිබිය යුතු ය.

(2) දේපළ භාර ගැනුම්කරුවකුගේ පත් කිරීම කරන ලද්දේ යම් සාධන පත්‍රයක් හෝ අධිකරණ ආඥාවක් මගින් හෝ යටතේ ද ඒ සාධන පත්‍රයට හෝ අධිකරණ ආඥාවට යටත්ව, දේපළ භාර ගැනුම්කරුවකුට, මෙහි දොළොස්වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන බලතල තිබිය යුතු අතර, දේපළ භාර ගැනුම්කරුවකු විසින් ඒ බලතල ක්‍රියාත්මක කරනු ලැබිය හැකි විය යුතු ය.

දේපළ භාර ගැනුම්කරුවන් අතර ප්‍රමුඛත්වය.

**444**. (1) සමාගමක සියලු දේපළ හෝ ඒ දේපළවලින් යම් කොටසක් කෙරෙහි බලපවත්නා චල සෘණ භාර දෙකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් ඇති අවස්ථාවක, ඒ එක් එක් සෘණ භාරය ප්‍රකාර, මේ කොටස යටතේ, දේපළ භාරගැනුම්කරුවකු පත් කරනු ලැබිය හැකි ය. දේපළ භාර ගැනුම්කරුවකු පත් කොට ඇත්තේ වෙනත් යම් චල සෘණ භාරයක් අභිභවා ප්‍රමුඛත්වය තිබෙන යම් චල සෘණ භාරයන් ප්‍රකාරව ද ඒ සෘණ භාරය දරන තැනැත්තා විසින් හෝ ඔහුගේ ඉල්ලීම මත හෝ පත් කරනු ලැබූ දේපළ භාර ගැනුම්කරුවකුට, වෙනත් යම් දේපළ භාර ගැනුම්කරුවන්ගෙන් අනන්‍යව, මේ පනතින් දේපළ භාර ගැනුම්කරුවකු වෙත පැවරී ඇති බලතල ඇත්තේ ය.

(2) චල සෘණ භාර දෙකක් හෝ වැඩි සංඛ්‍යාවක් එක සමාන තත්ත්වයක් දරන්නා වූ ද ඒ චල සෘණ භාරයන් ප්‍රකාර දේපළ භාර ගැනුම්කරුවන් දෙදෙනකු හෝ වැඩි සංඛ්‍යාවක් පත්කර ඇත්තා වූ ද අවස්ථාවක, පත්කිරීමේ සාධන පත්‍රයෙහි හෝ එක් එක් පත්කිරීමේ සාධන පත්‍රයෙහි හෝ අන්‍යාකාර විධිවිධාන සලසා ඇත්නම් මිස, ඒ දේපළ භාර ගැනුම්කරුවන් හවුල් දේපළ භාර ගැනුම්කරුවන් ලෙස පත්කරනු ලැබ ඇති සේ සැලකෙන අතර, එක්ව ක්‍රියා කළ යුතු ය.

(3) චල සෘණ භාරයක් දරන්නකු විසින් හෝ චල සෘණ භාරයක් දරන්නකුගේ ඉල්ලීම මත හෝ පත් කරන ලද දේපළ භාර ගැනුම්කරුවකු ගේ බලතල, එකී භාරය අභිභවා ප්‍රමුඛත්වය ලබන චල සෘණ භාරයක් දරන්නකු විසින් හෝ දරන්නකුගේ ඉල්ලීම මත දේපළ භාර ගැනුම්කරුවකු පත් කිරීමේ දී සහ දෙවනුව සඳහන් දේපළ භාර ගැනුම්කරුට මේ පනත යටතේ ඔහුගේ බලතල ක්‍රියාවේ යෙදීමට හැකිවනු පිණිස, අවශ්‍ය වනතාක් දුරට, (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, එසේ පත් කරනු ලැබූ දින සිට අත්හිට වේ. එසේ අත්හිටවුණු කවර හෝ බලයක්, ප්‍රමුඛත්වය හිමි චල සෘණ භාරයට යටත් දේපළ කෙරෙහි චල සෘණ භාරය අදාළවීම නතර වූ විට හෝ ප්‍රමුඛත්වය හිමි චල සෘණ භාරය යටතේ ඒ දේපළ සඳහා දේපළ භාර ගැනුම්කරුවකුගේ පත්වීම ඒ දේපළ සම්බන්ධයෙන් නතර වූ විට යන මෙයින් කලින් එළඹෙන දිනයේ සිට, නැවතත් බලාත්මක වන්නේ ය.

(4) දේපළ භාර ගැනුම්කරුවකුගේ බලතල, (3) වන උපවගන්තිය යටතේ අත්හිටුවීම, (ඔහු පත්කරනු ලැබ ඇත්තේ යම් සෘණ භාරයක් ප්‍රකාරව ද දේපළෙන් ඒ සෘණ භාරයට යටත් කොටසේ වටිනාකමේ සීමාවට යටත්ව) දේපළ භාර ගැනුම්කරුවකු වශයෙන් කර්තව්‍ය ඉටුකිරීමේ දී ඔහු විසින් දරනු ලැබ තිබිය හැකි යම් වියදම්, අයභාර සහ බැරකම් වෙනුවෙන් වලංගු වගකීමෙන් නිදහස් කිරීමක් ඔහු අභිභවා යන දේපළ භාර ගැනුම්කරුගෙන් ලැබෙන තෙක් (යම් ලිපි හෝ ලේඛන ද ඇතුළුව) සමාගමේ දේපළවලින් යම් කොටසක් ඔහුගේ පාලනයෙන් මුදාහරින ලෙස නියම කිරීමක් ලෙස බලපවත්වන්නේ නැත.

(5) මේ වගන්තිය යටතේ දේපළ භාර ගැනුම්කරුවකුගේ බලතල අත්හිටුවීමකින්, ඔහු පත්කරනු ලැබ තිබූයේ යම් දේපළක් සම්බන්ධව ද ඒ දේපළ කෙරෙහි, ඔහු පත් කරන ලද්දේ යම් චල සෘණ භාරයක් ප්‍රකාරව ද ඒ සෘණ භාරය අදාළ වීම නතර වීමක් සිදුවන්නේ නැත.

(6) එකම දේපළ භාරගැනුම්කරුවකු චල සෘණ භාර දෙකක් හෝ වැඩි සංඛ්‍යාවක් ප්‍රකාර පත් කරනු ලැබීම, මේ වගන්තියේ අන්තර්ගත කිසිවකින් වැළැක්වෙන්නේ නැත.

**445**. (1) දේපළ භාර ගැනුම්කරුවකු පත් කරනු ලැබ ඇත්තේ යම් සාධන පත්‍රයක් මගින් හෝ යටතේ ද ඒ සාධන පත්‍රය යටතේ බැඳීමක් කර තිබෙන ඇරයුම් නොකළ ප්‍රාග්ධන සම්බන්ධයෙන් සමාගමේ කොටස් හිමියන් වෙත ඇරයුම් කිරීමට ද, ඒ මත පොලී අයකර ගැනීමට සහ ඇරයුම් සඳහා ගෙවීම් බලාත්මක කිරීමට ද සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලය සතු හෝ සමාගම ගණන් බේරා වසා දමමින් පවතී නම්, එය එසේ ගණන් බේරා වසා දමනු නොලැබී නම් එහි අධ්‍යක්ෂ මණ්ඩලය සතුව තිබිය හැකි වූ බලතල ම දේපළ භාර ගැනුම්කරුට ද තිබිය යුතු ය. කොටස් මත ඇරයුම් කිරීමේ බලය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා "ඇරයුම් නොකළ ප්‍රාග්ධනය" යන්නට කොටස් නිකුත් කිරීම වෙනුවෙන් හෝ සමාගමේ ව්‍යවස්ථාවලිය යටතේ හෝ ගෙවිය යුතු යම් මුදල් ප්‍රමාණයක් ඇතුළත් වේ.

(3) (1) වන උපවගන්තිය යටතේ ඇරයුමක් කිරීම හෝ බලයක් ක්‍රියාවේ යෙදවීම හෝ, බලපෑමට ලක්වූ සමාගමේ කොටස් හිමියන් සහ සමාගම අතරෙහි වන විට, සමාගමේ අධ්‍යක්ෂවරයන් විසින් නිසි පරිදි කරන ලද ඇරයුමක් හෝ බලය ක්‍රියාවේ යෙදවීමක් ලෙස සැලකෙන්නේ ය.

ලේඛන ලියා අත්සන් කිරීම.

**446**. (1) දේපළ භාර ගැනුම්කරුවකු විසින් දේපළ භාර ගැනුම්කරුවකුගේ බලතල ක්‍රියාවේ යෙදවීමෙහි දී අවශ්‍ය හෝ ආනුෂංගික සියලු ලේඛන, සමාගමේ නමින් හා සමාගම වෙනුවෙන්, ලියා අත්සන් කරනු ලැබිය හැකි ය.

(2) දේපළ භාර ගැනුම්කරුවකු විසින් සමාගමක් වෙනුවෙන් අත්සන් තබන ලද ලේඛනයක්, සමාගම වෙනුවෙන් නිසි පරිදි අත්සන් තබා ඇති ලෙස, 19 වන වගන්තියේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(3) වෙනත් යම් නීතියක හෝ සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ හෝ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද දේපළ භාර ගැනුම්කරු පත්කරනු ලැබ ඇත්තේ යම් සාධන පත්‍රයක් යටතේ ද ඒ සාධන පත්‍රය මගින්, දේපළ භාර ගැනුම්කරුට ලේඛන ලියා අත්සන් කිරීමට සහ තත්කාර්යය සඳහා සමාගමේ පොදු මුද්‍රාව පාවිච්චි කිරීමට බලය පැවරී ඇත්නම්, ලේඛනවලට සමාගමේ පොදු මුද්‍රාව තබා එම මුද්‍රා තැබීම සහතික කිරීමෙන් සමාගම නමින් හෝ වෙනුවෙන් ලේඛන ලියා අත්සන් කිරීම දේපළ භාර ගැනුම්කරුවකු විසින් කරනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් ආකාරයට ලියා අත්සන් කරන ලද කවර හෝ ලේඛනයක්, සමාගම විසින් නිසි පරිදි ලියා අත්සන් කරනු ලැබ ඇත්තාක් සේ සැලකිය යුතු ය.

සමාගමේ සහ අධ්‍යක්ෂවරුන්ගේ බැඳීම්.

**447**. (1) සමාගමක සම්පූර්ණ දේපළ සම්බන්ධව හෝ ඉන් යම් කොටසක් සම්බන්ධව දේපළ භාර ගැනුම්කරුවකු පත් කරනු ලැබූ අවස්ථාවක, සමාගම සහ සමාගමේ සෑම අධ්‍යක්ෂවරයකු ම—

(අ) සමාගම සන්තකයේ හෝ සමාගමේ පාලනය යටතේ හෝ තිබෙන, දේපළ භාර ගැනුම්කාරත්වයට ඇතුළත් දේපළ හා සම්බන්ධ සියලු පොත්, ලේඛන සහ තොරතුරු, දේපළ භාර ගැනුම්කරුවකු වෙත ලබාදිය යුතු ය ;

(ආ) දේපළ භාර ගැනුම්කරු විසින් නියම කරනු ලැබුවහොත් ඒ පොත්, ලේඛන සහ තොරතුරු සම්පූර්ණ බවට හා නිවැරදි බවට දිවුරුම් පත්‍රයක් මගින් සනාථ කළ යුතු ය ;

(ඇ) දේපළ භාර ගැනුම්කරුට යුක්තිසහගතව අවශ්‍ය විය හැකි සහාය ඔහුට හෝ ඇයට දිය යුතු ය.

(ඈ) සමාගමේ පොදු මුද්‍රාවක් ඇත්නම්, ඒ පොදු මුද්‍රාව, දේපළ භාර ගැනුම්කරුගේ පාවිච්චිය සඳහා ලබාදිය යුතු ය.

(2) දේපළ භාර ගැනුම්කරුගේ ඉල්ලීම මත, අධිකරණය විසින්, (1) වන උපවගන්තියේ නියම අනුව ක්‍රියා කරන ලෙස, සමාගමට හෝ සමාගමේ අධ්‍යක්ෂවරයකුට නියම කරමින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

දේපළ හර ගැනුම්කරුවන්ගේ ක්‍රියාවල වලංගුභාවය.

**448**. (1) (2) වන උපවගන්තියට යටත්ව, හුදෙක් දේපළ භාර ගැනුම්කරුවකු වලංගු ආකාරයෙන් පත්කර නොතිබීම හෝ දේපළ භාර ගැනුම්කරුවකු ලෙස ක්‍රියා කිරීමට නුසුදුස්සකු වීම හෝ යම් ක්‍රියාවක් කිරීම සඳහා බලය පවරා නොතිබීම හෝ හේතුවෙන් පමණක් දේපළ භාර ගැනුම්කරුවකුගේ කිසි ක්‍රියාවක් බලරහිත සේ නොසැලකිය යුතු ය.

(2) දේපළ භාර ගැනුම්කරුවකු ඇතුළත් වී තිබෙන කිසිම ගණුදෙනුවක්, දේපළ භාර ගැනුම්කරු වලංගු ආකාරයෙන් පත්කර නොමැති බව හෝ ඒ ගණුදෙනුවට ඇතුළත් වීම සඳහා දේපළ භාර ගැනුම්කරුට බලය දී නොමැති බව හෝ දේපළ භාර ගැනුම්කරු සමග ඒ ගණුදෙනුව කරන තැනැත්තා දැන සිටියේ නම් හෝ දේපළ භාර ගැනුම්කරු සමග හෝ දේපළ භාර ගැනුම්කරුගේ පත්කිරීම කළ තැනැත්තා සමග ඔහුගේ හෝ ඇගේ සම්බන්ධතාව අනුව ඒ ගණුදෙනුව කළ තැනැත්තා දැන සිටිය යුතු වන්නේ නම් මිස, හුදෙක් දේපළ භාර ගැනුම්කරු වලංගු ආකාරයෙන් පත් කරනු ලැබ නොතිබීමේ හෝ ඒ ගණුදෙනුවට ඇතුළත් වීම සඳහා දේපළ භාර ගැනුම්කරුට බලය දී නොතිබීමේ හෝ හේතුව මත පමණක් බලරහිත වන්නේ යයි නොසැලකිය යුතු ය.

දේපළ විකිණීම සඳහා උකස් ලාභියාගේ එකඟත්වය.

**449**. (1) දේපළ භාර ගැනුම්කාරත්වයට ඇතුළත් දේපළක් විකිණීම සඳහා උකස් ලාභියාගේ එකඟත්වය අවශ්‍ය වන්නා වූ සහ එම එකඟත්වය ලබා ගැනීමට දේපළ භාර ගැනුම්කරුට නොහැකි වූ අවස්ථාවක, ඒ දේපළ පමණක් විකිණීම සඳහා හෝ ඒ දේපළ අනෙකුත් වත්කම් ද සමග විකිණීම සඳහා හෝ ආඥාවක් කරන ලෙස දේපළ භාර ගැනුම්කරු විසින් අධිකරණයෙන් ඉල්ලා සිටිය හැකි ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් මත අධිකරණය—

(අ) උකස් ලාභියාගේ එකඟත්වය ලබාගැනීමට දේපළ භාර ගැනුම්කරු සෑහෙන ප්‍රයත්නයක් දරා ඇති බවට ; සහ

(ආ) විකිණීම–

(i) ප්‍රදානකරුගේ සහ ප්‍රදානකරුගේ ණයහිමියන්ගේ යහපත පිණිස වන බවට ; සහ

(ii) උකස් ලාභියාගේ සම්බන්ධතා කෙරෙහි අනල්ප හානියක් නොවන බවට,

සෑහීමට පත්වන්නේ නම්, අධිකරණය විසින් සුදුසු යයි කල්පනා කරන පරිදි, ඒ දේපළ විකිණීම සඳහා දේපළ භාර ගැනුම්කරුට බලය දෙන ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ වූ ආඥාවක්, සුදුසු යයි අධිකරණය කල්පනා කරන නියමවලට හා කොන්දේසිවලට යටත්ව කරනු ලැබිය හැකි ය.

### දේපළ භාර ගැනුම්කරුවන්ගේ කාර්ය

දේපළ භාර ගැනුම්කරුවන්ගේ පොදු කාර්ය.

**450**. (1) දේපළ භාර ගැනුම්කරුවකු විසින් ඔහුගේ හෝ ඇගේ බලතල සද්භාවයෙන් ක්‍රියාවේ යෙදවිය යුතු ය.

(2) දේපළ භාර ගැනුම්කරුවකු විසින් ඔහුගේ හෝ ඇගේ බලතල, ඔහු හෝ ඇය පත්කරන ලද්දේ යම් තැනැත්තකුගේ සම්බන්ධතා සම්බන්ධයෙන් ද ඒ තැනැත්තාගේ යහපත පිණිස වන්නේ යයි සාධාරණ හේතු මත ඔහු හෝ ඇය විශ්වාස කරන ආකාරයෙන්, ක්‍රියාවේ යෙදවිය යුතු ය.

(3) (1) වන සහ (2) වන උපවගන්තිවල අන්තර්ගත විධිවිධානවලට හානියක් නො මැතිව, දේපළ භාර ගැනුම්කරුවකු විසින්—

(අ) ප්‍රදානකරුගේ ;

(ආ) දේපළ ගැණුම්කාරත්වයට ඇතුළත් දේපළ කෙරෙහි, ප්‍රදානකරු මගින් සම්බන්ධතාවකට හිමිකම් කියා සිටින තැනැත්තන්ගේ ;

(ඈ) ප්‍රදානකරුගේ ඇප රහිත ණයහිමියන්ගේ ; සහ

(ඇ) ප්‍රදානකරුගේ බැඳීම් සපුරාලන ලෙස නියම කරනු ලැබිය හැකි ඇපකරුවන්ගේ

සම්බන්ධතා කෙරෙහි ප්‍රමාණවත් සැලකිල්ලක් ඇතිව, ඔහුගේ හෝ ඇගේ බලතල ක්‍රියාවේ යෙදවිය යුතු ය.

(4) සාධන පත්‍රයක් යටතේ පත් කරන ලද දේපළ භාර ගැනුම්කරුවකු පත් කර ඇත්තේ යම් තැනැත්තකුගේ සම්බන්ධතා වෙනුවෙන් ද ඒ තැනැත්තා විසින් දෙන ලද යම් විධාන අනුව දේපළ භාර ගැනුම්කරු ක්‍රියා කරන හෝ ක්‍රියා කිරීමෙන් වළකින අවස්ථාවක, ඒ දේපළ භාර ගැනුම්කරු (2) වන උපවගන්තියේ සඳහන් කාර්යය කඩකර නොමැති ලෙස සැලකිය යුතු නමුත්, (1) වන උපවගන්තියේ සඳහන් කාර්යය හෝ (3) වන උපවගන්තියේ සඳහන් කාර්යය කඩකිරීම සම්බන්ධයෙන් වගකීමට බැඳී සිටිය යුතු ය.

(5) මේ වගන්තියේ අන්තර්ගත කිසිවකින් 451 වන වගන්තිය අදාළවීම සීමා කිරීමක් හෝ අදාළ වීම කෙරෙහි බලපෑමක් හෝ නොවිය යුතු ය.

දේපළක් විකුණන දේපළ භාර ගැනුම්කරුවකුගේ කාර්යය.

**451**. දේපළ භාර ගැනුම්කාරත්වයට ඇතුළත් දේපළක් විකිණීමේ බලය ක්‍රියාවේ යොදන දේපළ භාර ගැනුම්කරුවකු විසින් විකිණීම සිදුකරන වේලාවේ දී සාධාරණව ලබාගත හැකි හොඳම මිල ලබා ගැනීම, ප්‍රදානකරු විෂයෙහි දේපළ භාර ගැනුම්කරුවකුගේ කාර්යය වන්නේ ය.

විත්තිවාචකයක් හෝ හානිපූරණයක් නොමැති බව.

**452**. වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද නැතහොත් දේපළ භාරගන්නකු පත් කරන ලද්දේ යම් සාධන පත්‍රයක් මගින් හෝ යටතේ ද එහි කුමක් සඳහන්ව තිබුණ ද—

(අ) දේපළ භාරගන්නා ප්‍රදානකරුගේ අනුයෝජිත ලෙස හෝ ප්‍රදානකරුගේ ඇටෝර්නි බලය යටතේ හෝ ක්‍රියා කරන ලදැයි යන්න, 451 වන වගන්තිය මගින් පැවරෙන කාර්යය කඩකිරීම සම්බන්ධයෙන් දේපළ භාරගන්නකුට එරෙහිව නඩු කටයුත්තක දී විත්තිවාචකයක් නො වන්නේ ය ;

(ආ) 451 වන වගන්තියෙන් පැවරෙන කාර්යයක් කඩ කිරීමෙන් උද්ගතව දේපළ භාරගන්නා විසින් දරන ලද යම් බැරකමක් වෙනුවෙන්, දේපළ භාර ගැනුම්කාරත්වයට ඇතුළත් දේපළෙන් හෝ ප්‍රදානකරුගෙන් හෝ වන්දියක් හෝ හානිපූරණයක් හෝ සඳහා දේපළ භාරගන්නාට හිමිකමක් නොමැත්තේ ය.

මුදල් පිළිබඳ කාර්ය.

**453**. දේපළ භාර ගැනුම්කරු විසින්, දේපළ භාර ගැනුම්කාරත්වයට ඇතුළත් දේපළ හා සම්බන්ධ මුදල, දේපළ භාර ගැනුම්කාරත්වයේ කටයුතු කරගෙන යාමේදී ලැබෙන එහෙත් දේපළ භාර ගැනුම්කාරත්වයට සම්බන්ධයක් නොමැති වෙනත් මුදල්වලින් සහ දේපළ භාර ගැනුම්කරු විසින් දරනු ලබන හෝ ඔහුගේ පාලනය යටතේ පවත්නා මුදල්වලින් වෙන්ව තබාගත යුතු ය.

ගිණුම් වාර්තා.

**454**. (1) දේපළ භාර ගැනුම්කරුවකු විසින්, සෑම විටම, දේපළ භාර ගැනුම්කාරත්වයට ඇතුළත් දේපළ සම්බන්ධ සියලු ලැබීම්, වියදම් හා වෙනත් ගනුදෙනු නිවැරදිව වාර්තා ගත වන හා පැහැදිලි කරන ගිණුම් වාර්තා තබාගත යුතු ය.

(2) දේපළ භාර ගැනුම්කරු විසින් ගිණුම් වාර්තා, භාර ගැනුම්කාරත්වය අවසන් වීමෙන් පසු අවුරුදු පහකට නොඅඩු කාලසීමාවක් තුළ තමා වෙත තබාගත යුතු ය.

## දේපළ භාර ගැනුම්කරුවන්ගේ වාර්තා.

දේපළ භාර ගැනුම්කරුවකු ගේ පළමු වාර්තාව.

**455**. (1) දේපළ භාරගැනුම්කරුවකු පත්කරනු ලැබීමේ සිට මාස දෙකකට වඩා පසු නොවී, දේපළ භාර ගැනුම්කාරත්වයට ඇතුළත් දේපළෙහි කටයුතුවල තත්වය සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් කරුණුද ඇතුළත් වාර්තාවක් පිළියෙල කළ යුතු ය :—

(අ) දේපළ භාර ගැනුම්කාරත්වයට ඇතුළත් දේපළ සංයුක්ත වන වත්කම්වල විස්තර ;

(ආ) දේපළ භාරගැනුම්කාරත්වයට ඇතුළත් දේපළවලින් ඉටුකරනු ලැබිය යුතු ණය හා බැරකම්වල විස්තර ;

(ඇ) දේපළ භාර ගැනුම්කාරත්වයට ඇතුළත් දේපළ කෙරෙහි සම්බන්ධතාවක් දරන ණය හිමියන්ගේ නම් හා ලිපින ;

(ඈ) දේපළ භාර ගැනුම්කාරත්වයට ඇතුළත් දේපළ මත යම් ණයහිමියකු විසින් දරනු ලබන බැඳීම් පිළිබඳව, එය ඇතිකරනු ලැබූ දිනය ද ඇතුළුව විස්තර ;

(ඉ) අදාළ තොරතුරු ලබා දීම සම්බන්ධයෙන් ප්‍රදානකරු විසින් කරන ලද යම් පැහැර හැරීම් පිළිබඳ විස්තර ; සහ

(ඊ) නියම කරනු ලැබිය හැකි වෙනත් විස්තර.

(2) (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාවෙහි පහත සඳහන් විස්තර ද ඇතුළත් විය යුතු ය :–

(අ) දේපළ භාරගැනුම්කරු දන්නා තාක් දුරට, භාරගැනුම්කරුවකු පත් කිරීමට හේතුකාරක වූ සිද්ධි ;

(ආ) බැහැර කරන ලද දේපළ සහ දේපළ භාර ගැනුම්කාරත්වයට ඇතුළත් දේපළ බැහැර කිරීම පිළිබඳ ඇති කවර හෝ යෝජනා ;

(ඇ) දේපළ භාර ගැනුම්කරු පත්කරන ලද්දේ යම් තැනැත්තකුගේ සම්බන්ධතා වෙනුවෙන් ද පත් කිරීමේ දිනයේ දී ඒ තැනැත්තාට අයවිය යුතු මුදල් ප්‍රමාණ ;

(ඈ) ප්‍රදානකරුගේ ණයහිමියන් අතුරින් වරණීය හිමිකම් තිබෙන ණය හිමියන්ට, දේපළ භාර ගැනුම්කරු පත් කිරීමේ දිනයේ දී අයවිය යුතුව තිබෙන මුදල් ප්‍රමාණ ;

(ඉ) (ඇ) ඡේදයේ හෝ (ඈ) ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණ හැර, ණය හිමියන්ට ගෙවීම් කිරීම සඳහා තිබීමට ඉඩ ඇති මුදල් ප්‍රමාණ.

(3) දේපළ භාර ගැනුම්කාරත්වයට ඇතුළත් යම් දේපළ බැහැර කිරීම පිළිබඳ යම් යෝජනාවල විස්තර ඇතුළත් කිරීම, දේපළ භාර ගැනුම්කරුගේ කර්තව්‍ය ක්‍රියාවේ යෙදවීම කෙරෙහි බොහෝ සෙයින් හානිකර විය හැකි බව ඔහු සලකන්නේ නම්, ඒ විස්තර, දේපළ භාර ගැනුම්කරු විසින් වාර්තා වෙන් අත් හරිනු ලැබිය හැකි ය.

(4) මේ වගන්තිය අනුව ක්‍රියා කිරීම පැහැර හරින දේපළ භාර ගැනුම්කරුවකු වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

**456**. (1) අවස්ථාවෝචිත පරිදි දේපළ භාරගැනුම්කරුවකු හෝ දේපළ භාර ගැනුම්කාරත්වය අවසානයේ දී දේපළ භාරගැනුම්කරුවකුව සිටි තැනැත්තකු හෝ විසින්- *දේපළ භාර ගැනුම්කරුවකු විසින් සැපයිය යුතු වැඩිදුර වාර්තා.*

(අ) ඔහු දේපළ භාර ගැනුම්කරුවකු ලෙස පත්කරනු ලැබීමෙන් පසු එක් එක් හය මාසයක කාලසීමාව අවසන් වීමෙන් පසු මාස දෙකකට වඩා පසු නොවී ; සහ

(ආ) දේපළ භාරගැනුම්කාරත්වය අවසාන වන දිනයේ සිට මාස දෙකකට වඩා පසුනොවී,

දේපළ භාරගැනුම්කාරත්වයට ඇතුළත් දේපළට අදාළ කටයුතුවල ඒ ඒ දිනට පැවති තත්වය සම්බන්ධයෙන් සහ වාර්තාව අදාළ වන කාලසීමාව ඇතුළත, ලැබුණු හා ගෙවන ලද සියලු මුදල් ප්‍රමාණ ද ඇතුළත්ව, දේපළ භාරගැනුම්කාරත්වයේ කටයුතු කරගෙන යාම සම්බන්ධයෙන් තත්වය සම්පිණ්ඩනය කර දැක්වෙන වැඩිදුර වාර්තාවක් පිළියෙල කළ යුතු ය.

(2) 1 වන උපවගන්තියේ සඳහන් වාර්තාවෙහි—

(අ) ඊට පූර්ව වාර්තාවක දිනයෙන් පසුව බැහැර කරන ලද දේපළ විස්තර සහ දේපළ භාරගැනුම්කාරත්වයට ඇතුළත් දේපළ බැහැර කිරීම පිළිබඳ යම් යෝජනාවල විස්තර ;

(ආ) දේපළ භාරගැනුම්කරු පත් කරන ලද්දේ යම් තැනැත්තකුගේ සම්බන්ධතා වෙනුවෙන් ද ඒ තැනැත්තාට, වාර්තාවේ දිනට අයවිය යුතු මුදල් ප්‍රමාණ පිළිබඳ විස්තර ;

(ඇ) වරණීය හිමිකම්පෑම් තිබෙන, ප්‍රදානකරුගේ ණයහිමියන්ට, වාර්තාවේ දිනට අයවිය යුතු මුදල් ප්‍රමාණ පිළිබඳ විස්තර ;

(ඈ) (ආ) ඡේදයේ හෝ (ඇ) ඡේදයේ සඳහන් අය හැර, ණය හිමියන්ට ගෙවීම සඳහා වාර්තාවේ දිනට, තිබීමට ඉඩ ඇති මුදල් ප්‍රමාණ පිළිබඳ විස්තර,

ඇතුළත් විය යුතු ය.

(3) දේපළ භාරගැනුම්කාරත්වයට ඇතුළත් යම් දේපළ බැහැර කිරීම පිළිබඳ යම් යෝජනාවල විස්තර වාර්තාවෙහි ඇතුළත් කිරීම, දේපළ භාරගැනුම්කරුගේ කර්තව්‍ය ක්‍රියාවේ යෙදවීම කෙරෙහි බොහෝ සෙයින් හානිකර විය හැකි බව ඔහු හෝ ඇය සලකන්නේ නම් එම විස්තර ඔහු හෝ ඇය විසින්, (1) වන උපවගන්තියේ (අ) ඡේදයට අනුකූලව පිළියෙල කළ යුතු වාර්තාවෙන් අත්හරිනු ලැබිය හැකි ය.

(4) මේ වගන්තියේ නියම අනුව ක්‍රියා කිරීම පැහැර හරින සෑම තැනැත්තකුම වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට, රුපියල් පණස්දහසක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

**457** යම් තැනැත්තකු විසින් 455 වන වගන්තිය යටතේ හෝ 456 වන වගන්තිය යටතේ හෝ වාර්තාවක් පිළියෙල කිරීමට නියමිත කාල සීමාව—

වාර්තා පිළියෙළ කිරීම සඳහා කාලය දීර්ඝ කිරීම.

(අ) ඒ තැනැත්තා දේපළ භාරගැනුම්කරුවකු ලෙස අධිකරණය විසින් පත් කරනු ලැබූ අවස්ථාවක, අධිකරණය විසින් ; හෝ

(ආ) ඒ තැනැත්තා දේපළ භාරගැනුම්කරුවකු ලෙස සාධන පත්‍රයක් මගින් හෝ යටතේ හෝ පත් කරනු ලැබූ අවස්ථාවක රෙජිස්ට්‍රාර්වරයා විසින්,

ඒ තැනැත්තාගේ ඉල්ලීම මත දීර්ඝ කරනු ලැබිය හැකි ය.

**458**. (1) 455 වන වගන්තිය යටතේ හෝ 456 වන වගන්තිය යටතේ හෝ පිළියෙල කරන ලද සෑම වාර්තාවකම පිටපතක්, ඒ වාර්තාව පිළියෙල කිරීමට නියමිත තැනැත්තා විසින්—

වාර්තා ලැබීමට හිමිකම් ඇති තැනැත්තන්.

(අ) ප්‍රදානකරු වෙත ; සහ

(ආ) දේපල භාරගැනුම්කරු පත්කරන ලද්දේ යම් තැනැත්තකුගේ සම්බන්ධතා වෙනුවෙන් ද ඒ සෑම තැනැත්තකු වෙත,

යවනු ලැබිය යුතු ය.

(2) දේපළ හරගැනුම්කරුවකු ලෙස අධිකරණය විසින් පත් කරනු ලැබූ තැනැත්තකු විසින්, 455 වන වගන්තිය යටතේ හෝ 456 වන වගන්තිය යටතේ හෝ පිළියෙල කරන ලද සෑම වාර්තාවකම පිටපතක් අධිකරණයේ කාර්යාලයෙහි ගොණු කළ යුතු ය.

(3) 455 වන වගන්තිය යටතේ හෝ 456 වන වගන්තිය යටතේ හෝ පිළියෙල කරන ලද යම් වාර්තාවක පිටපතක් සඳහා-

(අ) ණයහිමියකු, අධ්‍යක්ෂවරයකු හෝ ප්‍රදානකරුගේ ඇපකරුවකුගෙන් ; හෝ

(ආ) දේපළ භාරගැනුම්කාරත්වයට ඇතුළත් යම් දේපළක් කෙරෙහි සම්බන්ධතාවක් ඇති වෙනත් යම් තැනැත්තකුගෙන්

ලිඛිත ඉල්ලීමක් ලැබුණු විට, එම පිටපත සකස් කර යැවීම සඳහා සාධාරණ ගාස්තුවක් ගෙවූ පසු, එහි පිටපතක්, ඒ වාර්තාව පිළියෙල කළ තැනැත්තා විසින් ඒ ලිඛිත ඉල්ලීම ලැබී වැඩ කරන දින පහළොවකට වඩා පසු නොවන දිනයක දී, එය ඉල්ලා සිටි තැනැත්තා වෙත ලැබිය යුතු ය.

(4) 455 වන වගන්තිය යටතේ හෝ 456 වන වගන්තිය යටතේ හෝ පිළියෙල කරන ලද වාර්තාවක් එය පිළියෙල කිරීමෙන් පසු වැඩ කරන දින දහයක් ඇතුළත, ඒ වාර්තාව පිළියෙල කළ තැනැත්තා විසින්, ඒ වාර්තාවේ පිටපතක් රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතු ය ; නැතහොත් භාර දිය යුතු ය.

(5) මේ වගන්තියට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින සෑම තැනැත්තකුම වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට ඒ තැනැත්තා යටත් විය යුතු ය.

වාර්තා පරීක්ෂා කිරීමට හිමිකම් ඇති තැනැත්තන්.

**459**. 458 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව වාර්තාවක් යවනු ලැබිය යුත්තේ යම් තැනැත්තකු වෙතද ඒ තැනැත්තාට, එය යැවීමට නියමිත තැනැත්තාගේ කාර්යාලයේ දී, සාමාන්‍ය කාර්යාල වේලාවන් ඇතුළත ඒ වාර්තාව පරීක්ෂා කිරීමට හිමිකම් ඇත්තේ ය.

මේ පනතේ යම් විධිවිධාන කඩ කිරීමක් දැනුම් දීමේ කාර්යය.

**460**. (1) සමාගමක් විසින් හෝ ඒ සමාගමේ යම් අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකු විසින් හෝ මේ පනත යටතේ හෝ 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ හෝ වරදක් කරනු ලැබ ඇතැයි සලකනු ලබන ඒ සමාගමේ දේපළ භාරගැනුම්කරුවකු විසින් ඒ බව රෙජිස්ට්‍රාර්වරයා වෙත වාර්තා කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් වර්ගයේ වරදක් සිදුකර තිබේද යන වග විමර්ශනය කිරීමේ කාර්යයක්, ඒ උපවගන්තියේ අන්තර්ගත කිසිවකින් දේපළ භාරගැනුම්කරුවකු වෙත නොපැවරෙන්නේ ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර හරින දේපළ භාරගැනුම්කරුවකු වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස්දහසක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

දේපළ භාරගැනුම්කාරත්වය අවසානවීම පිළිබඳ දැන්වීම.

**461**. (1) සමාගමක දේපළ භාරගැනුම්කාරත්වය නතර වීමෙන් පසු වැඩකරන දින දහයකට වඩා පසු නොවී, ඒ දේපළ භාරගැනුම්කාරත්වය අවසානයේදී දේපළ භාරගැනුම්කරුවකු ලෙස ධුරය දැරූ තැනැත්තා විසින්, එම දේපළ භාරගැනුම්කාරත්වය නතර වී ඇති බවට ලියවිල්ලකින් වූ දැන්වීමක්, රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතු ය. නැතහොත් භාරදිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ නියම අනුව ක්‍රියා කිරීම පැහැර හරින සෑම තැනැත්තකුම වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස්දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

දේපළ යෙදවීම සහ සමාගමේ බැඳීම් පිළිබඳව වගකීම්.

**462**. (1) වල සෘණ භාරයක් ඇති කරනු ලැබූ සාධන පත්‍රයක් යටතේ පත් කරන ලද දේපළ භාරගැනුම්කරුවකුහට මේ වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය. වරණීය හිමිකම් පෑම්.

(2) මේ වගන්තිය අදාළ වන දේපළ භාරගැනුම්කරුවකු විසින් ඔහුට ලැබෙන මුදල්, ඒ දේපළ භාරගැනුම්කරු පත් කරනු ලැබ ඇත්තේ යම් වල සෘණ භාරයක් ප්‍රකාරව ද ඒ වල සෘණ භාරයේ ප්‍රදානලාභියාට ඒ වල සෘණ භාරය මගින් ඇප වී තිබෙන ණය මුදල් පියවීම වශයෙන් හෝ පියවීම පිණිස, 449 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව සහ (3) වන උපවගන්තියේ සඳහන් කවර හෝ තැනැත්තන්ගේ අයිතිවාසිකම් වලට යටත්ව, ගෙවනු ලැබිය යුතු ය.

(3) සමාගමක වල සෘණ භාරයකට යටත් දේපළවලින්, ඒ සෘණ භාරයේ ප්‍රදාන ලාභීට පෙර, මෙහි පහත දැක්වෙන ප්‍රමුඛත්ව අනුපිළිවෙල අනුව, මෙහි පහත සඳහන් තැනැත්තන්ට, එනම් :—

(අ) පළමුව, වල සෘණ භාරයට පූර්ව ප්‍රමුඛත්වයක් දරන දේපළෙහි යම් කොටසක් ආවරණය වන යම් ස්ථාවර ඇපයක් දරන්නෙක් ;

(ආ) දෙවනුව, දේපළ භාර ගැනුම්කරුවකුගේ වියදම් හා පාරිශ්‍රමික සඳහා සහ සමාගමේ දේපළවලින් ලැබීමට ඔහුට හිමිකම් තිබෙන හානිපූරණයක් සඳහා දේපළ භාරගැනුම්කරුවකුට;

(ඇ) තෙවනුව, නවවන උපලේඛනයේ ( 1 වන ඡේදය සහ 7 (ආ) ඡේදය හැර) නිශ්චයකොට දැක්වෙන ප්‍රමාණයට හා ප්‍රමුඛත්ව අනුපිළිවෙල අනුව, වරණීය හිමිකම්පෑම් සඳහා හිමිකම් තිබෙන තැනැත්තන්ට,

ගෙවීම් ලැබීමට හිමිකම තිබිය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව, නවවන උපලේඛනයේ විධිවිධාන අදාළ කර ගැනීමේදී –

(අ) "ඈවරකරුවකු" පිළිබඳ සඳහනක්, දේපළ භාරගැනුම්කරුවකු පිළිබඳ සඳහනක් ලෙස කියවිය යුතු ය;

(ආ) "ගණන් බේරා වසා දැමීම ආරම්භ කිරීම" යන්න, දේපළ භාරගැනුම්කරුවකු පත් කිරීම පිළිබඳ සඳහනක් ලෙස කියවිය යුතු ය;

(ඇ) "ගණන් බේරා වසා දමන ලෙස නියම කරනු ලැබූ සමාගමක්" යන්න හෝ "සමාගමක් ගණන් බේරා වසා දැමීම" යන්න පිළිබඳ සඳහනක්, සමාගම දේපළ භාරගැනුම්කාරත්වයකට ඇතුළත් කිරීම හෝ දේපළ භාරගැනුම්කාරත්වයකට පත්ව තිබීම පිළිබඳ සඳහනක් ලෙස කියවිය යුතු ය.

ඈවර කිරීමේදී දේපළ භාරගැනුම්කරුවකුගේ බලතල.

**463**. (1) අධිකරණය විසින් අන්‍යාකාර ආඥාවක් කරනු ලැබුව හොත් මිස, ගණන් බේරා වසා දමමින් පවතින සමාගමක දේපළ සම්බන්ධයෙන්, දේපළ භාරගැනුම්කරුවකු පත් කිරීම හෝ දේපළ භාරගැනුම්කරුවකු ලෙස දිගටම කටයුතු කරගෙන යාම සහ දේපළ භාරගැනුම්කරුවකුගේ සියලු බලතල ක්‍රියාවේ යෙදීම, (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව, කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් දේපළ සම්බන්ධයෙන් ධූරය දරන දේපළ භාරගැනුම්කරුවකු විසින් අධිකරණයේ අනුමතය ඇතිව හෝ ඈවරකරුගේ ලිඛිත කැමැත්ත ඇතිව පමණක් ප්‍රදානකරුගේ අනුයෝජිතයා වශයෙන් ක්‍රියා කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය හේතුවෙන් ප්‍රදානකරුගේ අනුයෝජිතයා වශයෙන් ක්‍රියා කිරීමට නොහැකි දේපළ භාරගැනුම්කරුවකු එම කාරණයේ හේතුව නිසාම පමණක් දේපළ භාරගැනුම්කරු පත් කරන ලද්දේ යම් තැනැත්තකු විසින් ද එසේ නැතහොත් දේපළ භාරගැනුම්කරු පත් කරනු ලැබුවේ යම් තැනැත්තකුගේ යහපත සඳහා ද ඒ තැනැත්තාගේ අනුයෝජිතයා නොවීම නොවිය යුතු ය.

(4) (2) වන උපවගන්තියට අනුකූලව ප්‍රදානකරුවකුගේ අනුයෝජිතයා වශයෙන් ක්‍රියා කරන දේපළ ගැනුම්කරුවකුගේ ක්‍රියා මගින් ප්‍රදානකරුවකු හට උපචිත වූ යම් ණයක් හෝ වගකීමක්, ඈවර කිරීමේ ගාස්තුවක්, අයකිරීමක් හෝ වියදමක් නොවන්නේ ය.

දේපළ භාරගැනුම්කරුවකුගේ වගකීම.

**464**. (1) (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව –

(අ) දේපළ භාරගැනුම්කරුගේ යම් බලතල ක්‍රියාත්මක කිරීමේදී දේපළ භාරගැනුම්කරු විසින් එළඹෙන ලද ගිවිසුමක් මත; සහ

(ආ) දේපළ භාරගැනුම්කාරත්වයේ දේපළවලට අදාළ වන්නා වූ ද ඔහුගේ පත්වීමට පෙර එළඹෙන ලද්දා වූ ද සේවා ගිවිසුමක්

යටතේ දේපළ භාරගැනුම්කාරත්වයේ කාලය ඇතුළත උපචිත වන පඩි හෝ වැටුප්, ගිවිසුම අවසාන කිරීමේ දැන්වීම පත්වීමේ දිනයෙන් වැඩ කරන දින දහයක් ඇතුළත නීත්‍යානුකූලව දී නැත්නම්, එය ගෙවීමට,

දේපළ භාරගැනුම්කරු පෞද්ගලිකව වගකිව යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් ගිවිසුමක නියම මගින් අධිකරණය විසින් පත් කරන ලද භාරගැනුම්කරුවකුගේ හැර, දේපළ භාරගැනුම්කරුවකුගේ පෞද්ගලික වගකීම බැහැර කිරීම හෝ සීමා කිරීම කළ හැකි ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ගිවිසුමක් අවසාන කිරීම පිළිබඳ දැන්වීම දිය යුත්තේ යම් කාලයක් ඇතුළත ද එකී කාලය අධිකරණය විසින් දේපළ භාරගැනුම්කරුවකුගේ ඉල්ලීම මත දීර්ඝ කළ හැකි අතර සුදුසු යයි අධිකරණය අදහස් කරන නියම සහ කොන්දේසි මත එම කාලය දීර්ඝ කළ හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ වූ සෑම ඉල්ලීමක්ම සඳහන් කළ කාලපරිච්ඡේදය ඉකුත්වීමට පෙර කළ යුතු ය.

(5) දේපළ භාරගැණුම්කාරත්වයේ ඇති දේපළ, ප්‍රදානකරු විසින් භාවිතා කිරීම, සන්තකව සිටීම හෝ පදිංචිව සිටීම පිළිබඳව දේපළ භාරගැනුම්කරුවකුගේ පත්වීමේ දිනයේ දී පවතින්නා වූ ගිවිසුමක් යටතේ අයවිය යුතු ගෙවල් කුලී සහ වෙනත් ගෙවීම් සම්බන්ධයෙන් (7) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, (6) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් ප්‍රමාණයට දේපළ භාරගැනුම්කරුවකු පෞද්ගලිකව වගකිව යුතු වන්නේ ය.

(6) (5) වන උපවගන්තිය යටතේ දේපළ භාරගැනුම්කරුවකුගේ වගකීම, දේපළ භාරගැනුම්කරු පත්කිරීමේ දිනයෙන් වැඩ කරන දින දහයකට පසුව ආරම්භ වී දේපළ භාරගැනුම්කාරත්වය අවසාන වන දිනය හෝ ප්‍රදානකරු විසින් දේපළ භාවිතා කිරීම, සන්තකව සිටීම හෝ එහි පදිංචිව සිටීම හෝ අවසාන කරන දිනය යන මේ දින දෙකෙන් වඩා කලින් එළඹෙන දිනය දක්වා වූ කාල සීමාවට ආරෝපණය කළ හැකි ගෙවල් කුලී හෝ වෙනත් ගෙවීම්වල කොටසට සීමා වේ.

(7) අධිකරණය විසින් දේපළ භාරගැනුම්කරුවකුගේ ඉල්ලීම මත –

(අ) දේපළ භාරගැනුම්කරුවකුගේ වගකීම (6) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයකට සීමා කළ හැකි ය; හෝ

(ආ) (5) වන උපවගන්තිය යටතේ වූ වගකීමෙන් දේපළ භාරගැනුම්කරු නිදහස් කළ හැකි ය.

(8) (5) වන උපවගන්තියේ හෝ (6) වන උපවගන්තියේ අඩංගු කිසිවකින් –

(අ) (5) වන උපවගන්තියේ සඳහන් ගිවිසුමක් දේපළ භාරගැනුම්කරු විසින් පිළිගැනීම ඇති කරන ලෙස නොසැළකිය යුතු ය; හෝ

(ආ) ගිවිසුම යටතේ වෙනත් යම් බැඳීමක් ඉටු කිරීමේ වගකීමකට දේපළ භාරගැනුම්කරු යටත් නොවිය යුතු ය.

(9) මේ වගන්තිය යටතේ දේපළ ගැනුම්කරුවකුගේ පෞද්ගලික වගකීම් සම්බන්ධයෙන් දේපළ භාරගැනුම්කාරත්වයේ ඇති දේපළෙන් හානිපූරණයක් ලැබීමට ඒ දේපළ භාරගැනුම්කරුවකුට හිමිකම් ලැබේ.

(10) මේ වගන්තියේ අඩංගු කිසිවකින් –

(අ) දේපළ භාරගැනුම්කරුවකු හිමිකම් ලැබිය හැකි වෙනත් යම් හානිපූරණය කිරීමේ අයිතිවාසිකමක් සීමා නොවිය යුතු ය;

(ආ) අධිකාරය නොමැතිව එළඹෙන ලද ගිවිසුමක් මත වූ දේපළ භාරගැනුම්කරුවකුගේ වගකීම සීමා නොවිය යුතු ය; හෝ

(ඇ) අධිකාරය නොමැතිව එළඹෙන ලද ගිවිසුමක් මත වූ වගකීම සම්බන්ධයෙන් හානිපූරණයක් ලැබීමේ අයිතිවාසිකමක් දේපළ භාරගැනුම්කරුවකුට නොපැවරිය යුතු ය.

වගකීමෙන් නිදහස් කිරීම.

**465**. (1) අධිකරණය විසින් පහත සඳහන් දේ සම්බන්ධයෙන්, එනම් —

(අ) වගකීම ඇතිවී තිබෙන්නේ හුදෙක්ම දේපළ භාරගැනුම්කරු පත්කිරීමේ දෝෂයක් හෝ දේපළ භාරගැනුම්කරු පත්කරන ලද්දේ යම් සාධනපත්‍රයක් හෝ අධිකරණ ආඥාවක් හෝ මගින් හෝ යටතේ හෝ නම් හුදෙක්ම එහි දෝෂයක් තිබීමේ හෝ හේතුවෙන් බවට; සහ

(ආ) දේපළ භාරගැනුම්කරු අවංකව සහ සාධාරණව ක්‍රියා කළ බවට ද අවස්ථාගත කරුණු අනුව ඔහු වගකීමෙන් නිදහස් කළ යුතු බවට ද,

සෑහීමට පත් වේ නම් දේපළ භාරගැනුම්කාරත්ව ක්‍රියාවලියේ දී උපචිත වන ලද සියළු හෝ යම් පෞද්ගලික වගකීම්වලින් දේපළ භාරගැනුම්කරු වශයෙන් ක්‍රියා කර ඇති යම් තැනැත්තකු අධිකරණය විසින් නිදහස් කළ හැකි ය.

(2) අධිකරණය විසින් (1) වන උපවගන්තිය යටතේ එහි බලතල, සුදුසු යයි එය විසින් අදහස් කරනු ලබන නියම සහ කොන්දේසිවලට යටත්ව, ක්‍රියාත්මක කළ හැකි ය.

(3) දේපළ භාරගැනුම්කරු පත්කරන ලද්දේ යම් තැනැත්තකුගේ යහපත සඳහා ද එම තැනැත්තා, සුදුසු යයි අධිකරණය විසින් අදහස් කරනු ලබන නියම සහ කොන්දේසිවලට යටත්ව, (1) වන උපවගන්තිය යටතේ දේපළ භාරගැනුම්කරු වගකීමෙන් නිදහස් කළේ යම් ප්‍රමාණයකට ද එම ප්‍රමාණයට වගකිව යුතු වේ.

### අධිකරණය විසින් දේපළ භාරගැනුම්කරුවන් අධීක්ෂණය කිරීම

**466**. (1) දේපළ භාරගැනුම්කරුවකුගේ ඉල්ලීම මත අධිකරණය විසින් – අධිකරණය විසින් දේපළ භාරගැනුම්කරුවන් අධීක්ෂණය කිරීම.

(අ) දේපළ භාරගැනුම්කරුගේ කර්තව්‍ය ඉටුකිරීම සම්බන්ධයෙන් පැන නගින යම් කාරණයකට අදාළව විධාන දිය හැකි ය;

(ආ) එවැනි යම් විධාන ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම හෝ වෙනස් කිරීම හෝ කළ හැකි ය.

(2) අධිකරණය විසින්, (3) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකුගේ ඉල්ලීම මත –

(අ) යම් කාල සීමාවක් සම්බන්ධයෙන් දේපළ භාරගැනුම්කරුගේ පාරිශ්‍රමිකය සමාලෝචනය කිරීම හෝ අවස්ථානුගත කරුණු අනුව සාධාරණ මට්ටමකට නියම කිරීම හෝ කළ හැකි ය;

(ආ) පාරිශ්‍රමිකය වශයෙන් දේපළ භාරගැනුම්කරු විසින් රඳවාගත් මුදල් ප්‍රමාණයක් අවස්ථානුගත කරුණු අනුව අසාධාරණ බව අධිකරණය විසින් තීරණය කරන ප්‍රමාණයට මුදල ආපසු ගෙවන ලෙස භාරගැනුම්කරුට ආඥා කළ හැකි ය;

(ඇ) යම් දේපළක් සම්බන්ධයෙන් දේපළ භාරගැනුම්කරුවකු වලංගු ලෙස පත් කළේද නැද්ද යන වග හෝ යම් දේපළක සන්තකයට වලංගු ලෙස ඇතුළු වූයේද නැද්ද යන වග හෝ යම් දේපලක පාලනය වලංගු ලෙස භාර ගත්තේ ද නැද්ද යන වග ප්‍රකාශ කළ හැකි ය.

(3) පහත දැක්වෙන තැනැත්තන්ගෙන් යම් තැනැත්තකු විසින් (2) වන උපවගන්තිය යටතේ අධිකරණයට ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි ය:–

(අ) දේපළ භාරගැනුම්කරු;

(ආ) ප්‍රදානකරු;

(ඇ) ප්‍රදානකරුගේ ණය හිමියකු;

(ඈ) දේපළ භාරගැනුම්කාරත්වයේ ඇති දේපළෙහි සම්බන්ධතාවකට ප්‍රදානකරු මගින් හිමිකම් පාන තැනැත්තකු;

(ඉ) ඇවරකරුවකු.

(4) (1) වන සහ (2) වන උපවගන්ති යටතේ පවරන ලද බලතල –

(අ) මේ පනත යටතේ හෝ වෙනත් ප්‍රඥප්තියක් යටතේ හෝ අධිකරණයේ නෛසර්ගික අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමෙහි ලා හෝ අධිකරණය විසින් ක්‍රියාත්මක කළ හැකි වෙනත් යම් බලතලවලට අතිරේකව විය යුතු ය;

(ආ) ඉල්ලීම ඉදිරිපත් කරන අවස්ථාවේ දේපළ භාරගැනුම්කරුවකු, දේපළ භාරගැනුම්කරුවකු වශයෙන් ක්‍රියා කිරීම නතර වී තිබුනත් නැතත් ක්‍රියාත්මක කළ යුතු ය.

(5) අධිකරණය විසින්, (3) වන උපවගන්තියේ සඳහන් තැනැත්තකුගේ ඉල්ලීම මත, (2) වන උපවගන්තිය යටතේ කරන ලද ආඥාවක් ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ වෙනස් කිරීම කළ හැකි ය.

(6) (7) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, දේපළ භාරගැනුම්කරුවකුගේ යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සම්බන්ධයෙන්, භාරගැනුම්කරුවකුට විරුද්ධව වූ හිමිකම් පෑමක දී, ඒ ක්‍රියාව කරන ලද්දේ හෝ නොකර හැරීම සිදුවූයේ (1) වන උපවගන්තිය යටතේ දෙන ලද විධානයක් ප්‍රකාරව ක්‍රියා කිරීමේ දී බව, විත්තිවාචකයක් වන්නේ ය.

(7) (1) වන උපවගන්තිය යටතේ විධානයක් ලබාගත් අවස්ථානුගත කරුණුවල හේතුවෙන් (6) වන උපවගන්තියේ දෙන ලබන ලද ආරක්ෂාවට දේපළ භාරගැනුම්කරුවකුට හිමිකම් නොලැබෙන බව, (3) වන උපවගන්තියේ සඳහන් තැනැත්තකුගේ ඉල්ලීම මත අධිකරණය විසින්, ආඥා කළ හැකි ය.

**467**. (1) අධිකරණය විසින්, (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, ප්‍රදානකරුගේ හෝ ප්‍රදානකරුගේ ඇවරකරුවකුගේ ඉල්ලීම මත –

අධිකරණය විසින් දේපළ භාරගැනුම්කාරත්වය අවසන් කිරීම හෝ සීමාකිරීම කළ හැකි බව.

(අ) නිශ්චිත දිනයක සිට දේපළ භාරගැනුම්කරුවකු වශයෙන් ක්‍රියා කිරීම නතර කළ යුතු බව ආඥාකළ හැකි අතර දේපළ භාරගැනුම්කාරත්වයේ තිබෙන දේපල සම්බන්ධයෙන් වෙනත් යම් දේපළ භාරගැනුම්කරුවකු පත් කිරීම තහනම් කළ හැකි ය;

(ආ) නිශ්චිත දිනයක සිට දේපළ භාරගැනුම්කරුවකු දේපළ භාරගැනුම්කාරත්වයේ ඇති දේපලේ කොටසක් වන්නාවූ යම් නිශ්චිත වත්කම් සම්බන්ධයෙන් පමණක් ක්‍රියා කළ යුතු බවට ආඥා කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ ආඥාවක් –

(අ) දේපළ භාරගැනුම්කාරත්වයේ කාර්යය හැකි පහසු ප්‍රමාණයට කරනු ලැබ ඇති බවට; හෝ

(ආ) එය තවදුරටත් පවත්වාගෙන යාම අවස්ථාගත කරුණු අනුව යුක්ති සහගත නොවන බවට

අධිකරණය සෑහීමට පත්වී ඇති අවස්ථාවක පමණක් කළ හැකි ය.

(3) අධිකරණය විසින් අන්‍යාකාරයෙන් ආඥා කළහොත් මිස, මේ වගන්තිය යටතේ වූ ඉල්ලුම් පත්‍රයක පිටපතක්, ඒ ඉල්ලීම අසනු ලබන දිනට වැඩ කරන දින පහකට නොඅඩු කාලයකට පෙර දේපළ භාරගැනුම්කරුට භාරදිය යුතු ය. භාරගැනුම්කරු විසින් ඉල්ලීම අසනු ලබන දින පෙනී සිටිය හැකි අතර විභාගයේ දී ඔහුට සවන් දෙනු ලැබිය හැකි ය.

(4) (1) වන උපවගන්තිය යටතේ වූ ආඥාවක් සුදුසුයයි අධිකරණය විසින් අදහස් කරනු ලබන නියම සහ කොන්දේසි මත කළ හැකි ය.

(5) මේ වගන්තිය යටතේ වූ ආඥාවක්, ඒ ආඥාවට විෂය වන දේපල පිළිබඳ ඇපයකට හෝ සෘණ භාරයකට බල නොපෑ යුතු ය.

(6) අධිකරණය විසින්, ආඥාව ඉල්ලා සිටි හෝ එයින් බලපෑමට ලක් වූ හෝ යම් තැනැත්තකුගේ ඉල්ලීම මත මේ වගන්තිය යටතේ කරන ලද ආඥාවක් පරිච්ඡින්න කිරීම හෝ සංශෝධනය කිරීම කළ හැකි ය.

දේපළ භාරගැනුම්කරුවකුගේ කාර්යය බලාත්මක කිරීම සඳහා ආඥා.

**468**. (1) මේ වගන්තිය යටතේ වූ ආඥාවක් සඳහා ඉල්ලීමක් පහත සඳහන් තැනැත්තන් විසින් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය:–

(අ) රෙජිස්ට්‍රාර්වරයා;

(ආ) දේපළ භාරගැනුම්කරු;

(ඇ) දේපළ භාරගැනුම්කරුවකු වශයෙන් පත්වීමක් අපේක්ෂා කරන තැනැත්තකු;

(ඈ) ප්‍රදානකරු;

(ඉ) ප්‍රදානලාභී;

(ඊ) දේපළ භාරගැනුම්කාරත්වයේ ඇති දේපළට සම්බන්ධතාවක් ඇති තැනැත්තකු;

(උ) ප්‍රදානකරුගේ ණයහිමියකු;

(ඌ) ප්‍රදානකරුගේ බැඳීමක ඇපකරුවකු;

(එ) ප්‍රදානකරුගේ ඇවරකරුවකු;

(ඒ) ප්‍රදානකරුගේ දේපළ සම්බන්ධයෙන් අනුකූලව ක්‍රියාකිරීම වෙනත් දේපළ භාරගැනුම්කරුවකු විසින් පැහැරහැරීම පිළිබඳව ප්‍රදානකරුවකුගේ දේපළවල භාරගැනුම්කරුවකු.

(2) අනුකූලව කටයුතු කිරීම පැහැර හැරීම පිළිබඳ දැන්වීම ඉල්ලීමේ දිනයට වැඩ කරන දින පහකට නො අඩු කාලයකට පෙර දේපළ භාරගැනුම්කරු වෙත භාරදෙනු ලැබ ඇත්නම් මිස සහ ඉල්ලුම්පත්‍රයේ දිනය වන විට අනුකූලව කටයුතු කිරීම පැහැර හැරීම දිගටම පවතින්නේ නම් ද මිස අනුකූලව කටයුතු කිරීම පැහැර හැරීම සම්බන්ධයෙන් (1) වන උපවගන්තියේ (ඒ) ඡේදය යටතේ අධිකරණයට ඉල්ලීමක් ඉදිරිපත් කළ නො හැකි ය.

(3) අනුකූලව කටයුතු කිරීම පැහැර හැරීමක් තිබෙන බවට හෝ තිබී ඇති බවට අධිකරණය සෑහීමට පත්වී ඇති අවස්ථාවක අධිකරණය විසින් –

(අ) අනුකූලව කටයුතු කිරීමේ කාර්යයෙන් දේපළ භාරගැනුම්කරු සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් නිදහස් කළ හැකි ය; හෝ

(ආ) දේපළ භාරගැනුම්කරු විසින් කාර්යය කඩ කිරීම සම්බන්ධයෙන් ලබාගත හැකි වෙනත් යම් ප්‍රතිකර්මයකට හානියක් නොමැතිව, ආඥාවේ නිශ්චිතව සඳහන් ප්‍රමාණයට කටයුතු කිරීමට දේපළ භාරගැනුම්කරුට ආඥා කළ හැකි ය.

(4) (3) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ කරන ලද ආඥාවකට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින තැනැත්තකු සම්බන්ධයෙන් හෝ දේපළ භාරගන්නකු වීමට හෝ දේපළ භාරගන්නකු වශයෙන් සිටීමට 436 වගන්තිය යටතේ නුසුදුසු වූ හෝ නුසුදුසු වන තැනැත්තකු සම්බන්ධයෙන් හෝ අධිකරණය විසින්–

(අ) දේපළ භාරගැනුම්කරු ධුරයෙන් ඉවත් කළ හැකි ය ; හෝ

(ආ) 436 වන වගන්තියේ විධිවිධාන කුමක් වුව ද, තැනැත්තා, දේපළ භාරගැනුම්කරුවකු වශයෙන් ක්‍රියා කිරීමට පත් කළ හැකි බවට හෝ දේපළ භාරගැනුම්කරුවකු වශයෙන් දිගටම ක්‍රියා කළ හැකි බවට හෝ ආඥා කළ හැකි ය.

(5) පහත සඳහන් හේතු නිසා, එනම් :—

(අ) අනුකූලව කටයුතු කිරීමට නිරතුරුවම පැහැරහැරීම ; හෝ

(ආ) අනුකූලව කටයුතු කිරීම පැහැර හැරීමේ බරපතලකම,

යන හේතු නිසා දේපළ භාරගැනුම්කරුවකු වශයෙන් ක්‍රියා කිරීමට නුසුදුසු බව අධිකරණය සෑහීමට පත්වන පරිදි පෙන්වා දුනහොත්, අධිකරණය විසින් ඒ තැනැත්තා සම්බන්ධයෙන් අවුරුදු පහකට නො වැඩි කාලයක් සඳහා තහනම් ආඥාවක් කළ හැකි ය .

(6) තහනම් ආඥාවක් අදාළ වන තැනැත්තකු–

(අ) කවර හෝ දේපළ භාරගැනුම්කාරත්වයක දී දේපළ භාරගැනුම්කරුවකු වශයෙන් ක්‍රියා නොකළ යුතු ය ;

(ආ) කවර හෝ ගණන් බේරා වසා දැමීමක දී ඈවරකරුවකු වශයෙන් ක්‍රියා නොකළ යුතු ය ;

(ඇ) XIII වන කොටස යටතේ අද්මිනිස්ත්‍රාසිකරුවකු වශයෙන් ක්‍රියා නොකළ යුතු ය.

(7) මේ වගන්තිය යටතේ ආඥාවක් කිරීමේ දී සුදුසු යයි අධිකරණය අදහස් කරන්නේ නම්–

(අ) අනුකූලව කටයුතු කිරීම සඳහා වූ කාලය දීර්ඝ කරමින් ආඥාවක් කළ හැකි ය ;

(ආ) යම් නියමයක් හෝ කොන්දේසියක් පැනවිය හැකි ය ;

(ඇ) වෙනත් යම් අනුයාත ආඥාවක් කළ හැකි ය.

(8) (5) වන උපවගන්තිය යටතේ කරන ලද සෑම ආඥාවකම පිටපතක් ම, ඒ ආඥාව කිරීමෙන් වැඩ කරන දින දහයක් ඇතුළත ඉල්ලුම්කරු විසින් රෙජිස්ට්‍රාර්වරයාට භාරදිය යුතු අතර, රෙජිස්ට්‍රාර්වරයා විසින් එය අදාළ දේපළ භාරගැනුම්කරුගේ නමට යොමු කර සුචිගත කරන ලද පොදු ලිපි ගොනුවක් තුළ තැබිය යුතු ය.

(9) ඊට කලින් වූ අවුරුදු පහ ඇතුළත දෙවරක දී හෝ ඊට වැඩි වාර ගණනක දී–

(අ) එකම පුද්ගලයා සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ අනුකූලව කටයුතු කිරීමට ආඥාවක් අධිකරණය විසින් කරන ඇති බවට ; හෝ

(ආ) එකම පුද්ගලයා සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ අනුකූලව කටයුතු කිරීමට ආඥාවක් සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති බවට සහ ඒ එක් එක් අවස්ථාවේ දී එම තැනැත්තා ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කිරීමට පසුව සහ විභාගයට පළමුව අනුකූලව කටයුතු කර ඇති බවට,

ඇති සාක්ෂි ඊට පටහැනිව විශේෂ හේතු ඇත්තේ නම් මිස මේ වගන්තියේ කාර්යය සඳහා අනුකූලව කටයුතු කිරීම නිරතුරු පැහැර හැරීම පිළිබඳ සාක්ෂි විය යුතු ය.

(10) මේ වගන්තියේ කාර්ය සඳහා දේපළ භාරගැනුම්කරුවකු සම්බන්ධයෙන් "අනුකූලව කටයුතු කිරීම පැහැර හැරීම" යන්නෙන්–

(අ) දේපළ භාරගැනුම්කරු පත් කරන ලද්දේ යම් සාධනපත්‍රයක් හෝ අධිකරණ ආඥාවක් මගින් හෝ යටතේ ද ඒ සාධන පත්‍රය හෝ අධිකරණ ආඥාවක් හෝ යටතේ ; හෝ

(ආ) මේ පනත හෝ වෙනත් යම් පනතක් හෝ නීතියේ රීති හෝ අධිකරණයේ රීති හෝ යටතේ ; හෝ

(ඇ) මේ වගන්තිය යටතේ අනුකූලව කටයුතු කිරීමට කරන ලද අඥාවක් හැර අධිකරණයේ යම් ආඥාවක් හෝ විධානයක් හෝ යටතේ,

පැන නගින අදාළ කාර්යයකට අනුකූලව කටයුතු කිරීමට පැහැර හැරීම අදහස් වන අතර, "අනුකූලව කටයුතු කිරීම" "අනුකූලවීම" සහ "අනුකූලව කටයුතු කිරීම පැහැර හැරීම" යන යෙදුම්වලට අනුරූප තේරුම් තිබිය යුතු ය.

**469**. දේපළ භාරගැනුම්කරුවකු ධුරයෙන් ඉවත් කරන හෝ ධුරයෙන් ඉවත් කිරීමේ ප්‍රතිඵලය ඇති හෝ ආඥාවක් කරන විට දී අධිකරණය විසින් සුදුසු යයි එය කල්පනා කරන පරිදි— දේපළ භාරගැනුම්කාරත්වයේ ඇති දේපළ ආරක්ෂා කරන ආඥා.

(අ) දේපළ භාරගැනුම්කාරත්වයේ ඇති දේපළ ආරක්ෂා කිරීම සඳහා ;

(ආ) ඒ කාර්ය සඳහා දේපළ භාරගැනුම්කරුගේ සන්තකයේ හෝ පාලනය යටතේ හෝ ඇති යම් තොරතුරක් හෝ ලේඛන හෝ ආඥාවේ නිශ්චිතව සඳහන් කරන ලද කවර හෝ තැනැත්තකුට ලබා දෙන ලෙස නියම කරමින්,

ආඥා කළ හැකි ය.

### අත්‍යාවශ්‍ය සේවා සැපයීම ප්‍රතික්ෂේප කිරීම

**470**. (1) මේ වගන්තියේ කාර්ය සඳහා "අත්‍යාවශ්‍ය සේවාවක්" යන්නෙන්– අත්‍යාවශ්‍ය සේවා සැපයීම ප්‍රතික්ෂේප කිරීම තහනම් බව.

(අ) විදුලිබලය සිල්ලර වශයෙන් සැපයීම ;

(ආ) ජලය සැපයීම ; සහ

(ඇ) විදුලි සංදේශ සේවා සැපයීම

අදහස් වේ.

(2) වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද අත්‍යාවශ්‍ය සේවා සපයන්නකු විසින්–

(අ) දේපළ භාරගැනුම්කරුගේ පත්වීමේ දිනයට පෙර කාලසීමාවක් සම්බන්ධයෙන් සපයන ලද සේවාව සඳහා අයවිය යුතු ගාස්තු ගෙවීමෙහි ලා ප්‍රදානකරු පැහැර හැරීමේ හේතුව නිසා දේපළ භාරගැනුම්කරුවකුට හෝ දේපළ භාරගැනුම්කාරත්වයේ ඇති දේපළවල අයිතිකරුට හෝ සේවාව සැපයීම ප්‍රතික්ෂේප නොකළ යුතු ය ;

(ආ) දේපළ භාරගැනුම්කරු ගේ පත්වීමේ දිනයට පෙර කාලසීමාවක් සම්බන්ධයෙන් සපයන ලද සේවාව සඳහා ගෙවීමට ඇති ගාස්තු ගෙවීම දේපළ භාර ගැනුම්කරුට හෝ දේපළ භාරගැනුම්කාරත්වයේ ඇති දේපලක අයිතිකරුට හෝ සේවා වැඩිදුර සැපයීම සඳහා කොන්දේසියක් නොකළ යුතු ය.

(3) සැක දුරු කිරීම සඳහා, ඈවර කිරීම ආරම්භවීමෙන් පසු යම් කාලපරිච්ඡේදයක් සඳහා සේවා සැපයීම පිණිස වූ ගාස්තු ගෙවීමට සමාගමක් පැහැර හැරීම සම්බන්ධයෙන් අත්‍යාවශ්‍ය සේවා සපයන්නකු විසින් යම් ගිවිසුමක් හෝ යම් ලිඛිත නීතියක් යටතේ ඇති යම් අයිතිවාසිකමක් හෝ බලයක් ක්‍රියාත්මක කරනු ලැබීම මේ වගන්තියේ කිසිවක් මගින් නොවැළැක්විය යුතු ය.

## XVI වන කොටස

## සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා සහ ලියාපදිංචි කිරීම

### නිලධරයන් පත් කිරීම

නිලධරයන් පත් කිරීම.

**471.** (1) පහත දැක්වෙන තැනැත්තන් එනම් :—

(අ) සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වශයෙන් හෝ සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා ලෙස ක්‍රියා කිරීමට හෝ නාමයෙන් හෝ ධුරයෙන් තැනැත්තකු ;

(ආ) නියෝජ්‍ය සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයන් වශයෙන් හෝ නියෝජ්‍ය සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයන් ලෙස ක්‍රියා කිරීමට හෝ නාමයෙන් හෝ ධුරයෙන් තැනැත්තන් ;

(ඇ) සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයන් වශයෙන් හෝ සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයන් ලෙස ක්‍රියා කිරීමට හෝ නාමයෙන් හෝ ධුරයෙන් තැනැත්තන් ;

(ඈ) මේ පනතේ කාර්යයන් සඳහා කලින් කල අවශ්‍ය විය හැකි වෙනත් යම් නිලධරයන් සහ සේවකයන්,

පත්කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නියෝජ්‍ය සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයකු හෝ සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයකු වශයෙන් පත් කරන ලද යම් තැනැත්තකු රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ සාමාන්‍ය විධානවලට යටත්ව මේ පනත යටතේ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ සියලුම බලතල ක්‍රියාත්මක කළ හැකි ය ; සියලුම කාර්යය කළ හැකි ය ; සහ සියලුම කර්තව්‍යය ද, ඉටු කළ හැකි ය.

**472**. (1) රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ ක්‍රියාවකින් හෝ තීරණයකින් අතෘප්තියට පත් තැනැත්තකු විසින්, ක්‍රියාව හෝ තීරණය පිළිබඳව දැන්වීම ලැබීමෙන් දින පහළොවක් හෝ අධිකරණය විසින් ඉඩ දෙනු ලබන වැඩිදුර කාලයක් ඇතුළත අභියාචනාධිකරණය වෙත අභියාචනා කළ හැකි ය. රෙජිස්ට්‍රාර්වරයාගේ තීරණවලට විරුද්ධව අභියාචනා.

(2) මේ වගන්තිය යටතේ කරන ලද අභියාචනයක් මත අභියාචනාධිකරණය විසින්, අභියාචනය කරනු ලැබ ඇත්තේ යම් ක්‍රියාවකට හෝ තීරණයකට හෝ විරුද්ධව ද ඒ ක්‍රියාව හෝ තීරණය හෝ ස්ථිර කිරීම, ප්‍රතිශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ අවලංගු කිරීම කළ හැකි අතර යුක්තියේ යහපත අනුව අවශ්‍ය වන ආකාරයේ වෙනත් යම් ආඥාවක් කළ හැකි ය.

### රෙජිස්ටර් සහ ලේඛන ලියාපදිංචි කිරීම

**473**. (1) පහත සඳහන් දේ පිළිබඳ වාර්තාවක් අඩංගු රෙජිස්ටරයක් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් පිහිටුවා පවත්වාගෙන යා යුතු ය :— තබාගත යුතු රෙජිස්ටර.

(අ) මේ පනත යටතේ ලියාපදිංචි කරන ලද හෝ ලියාපදිංචි කරන ලදැයි සැලකෙන සමාගම් ;

(ආ) මේ පනත යටතේ ලියාපදිංචි කරන ලද හෝ ලියාපදිංචි කරන ලදැයි සැලකෙන එතෙර සමාගම් ;

(2) රෙජිස්ටරය—

(අ) ඉලෙක්ට්‍රොනික වශයෙන් හෝ වෙනත් ක්‍රමයකින් තොරතුරු වාර්තා කරන හෝ ගබඩා කරන ; සහ

(ආ) ඒ තොරතුරු පහසුවෙන් පරීක්ෂා කිරීමට හෝ කියවිය හැකි ආකාරයකින් නැවත ඉදිරිපත් කිරීමට ඉඩ ලැබෙන

සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් වූ උපක්‍රමයක් හෝ පහසුකමක් ඇතුළුව සුදුසු යයි රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් අදහස් කරන ආකාරයකින් තබා ගත හැකි ය.

(3) (අ) රෙජිස්ට්‍රාර්වරයා විසින් 4 වන වගන්තිය යටතේ විනාශ කරනු ලැබිය හැකි ලේඛන හඳුනාගනිමින් හෝ වර්ගීකරණය කරමින් ; සහ

(ආ) තොරතුරු වාර්තාගත කිරීම සඳහා රෙජිස්ට්‍රාර්වරයා විසින් (2) වන උපවගන්තිය යටතේ තබා ගනු ලබන යම් උපක්‍රමයක් හෝ පහසුකමක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විය හැකි සියළු කාරණා සඳහා ඉඩ සළසමින්,

අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ නියම කරනු ලබන එකී සියලු ලේඛන විනාශ කිරීමට රෙජිස්ට්‍රාර්වරයාට බලය ඇත්තේ ය.

(5) යම් ලේඛනයක් විනාශ කිරීමට පෙර රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ ලේඛනය ඉලෙක්ට්‍රොනික වශයෙන් හෝ අන්‍යාකාරයකින් නැවත ඉදිරිපත් කිරීම කරනු ලබන අවස්ථාවක එසේ නැවත ඉදිරිපත් කරනු ලැබූ ලේඛනය, යම් නීතියකට පටහැනිව කුමක් සඳහන් වුව ද එය නොතකා සියලු කාර්යයන් සම්බන්ධයෙන් මුල් ලේඛනය ලෙස සලකා ක්‍රියාකළ යුතු ය.

(6) මේ වගන්තියේ ඉහත විධිවිධානයන්ට අගතියක් නොමැතිව රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ගොනු කරන ලද හෝ භාරයේ ඇති යම් ලේඛනයක් නැති වී හෝ කියවනු ලැබීමට නොහැකිවීමේ අන්තරායට භාජනය වී ඇති විටෙක, රෙජිස්ට්‍රාර්වරයා විසින් එසේ කිරීම සුදුසු යයි සළකන්නේ නම් එහි පිටපතක් කිරීමට ද ඔහු විසින් තීරණය කරනු ලබන ආකාරයට පරීක්ෂා කිරීමට හා සහතික කිරීමට ද විධාන කරනු ලැබිය හැකි ය.

තව ද, එකී පිටපත, හානි වූ හෝ කියවනු ලැබීමට නොහැකිවීමේ අන්තරායට භාජන වූ හෝ ලේඛනය වෙනුවට ආදේශ කළ යුතු අතර මේ පනතේ සියලු කාර්යයන් සඳහා එකී හානි වූ හෝ කියවනු ලැබීමට නොහැකිවීමේ අන්තරායට භාජන වූ ලේඛනය ලෙසම සලකනු ලැබිය යුතු ය.

මුද්‍රාව තැබීමෙන් ලේඛන සත්‍යායනය කිරීම.

**474**. සමාගම් ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය හෝ ඊට සම්බන්ධ ලේඛන සත්‍යායනය කිරීම සඳහා මුද්‍රාවක් හෝ මුද්‍රා පිළියෙල කරන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් විධාන කළ හැකි වේ.

ලේඛන, ලේඛනවල පිටපත්, දැන්වීම් ආදිය ලියාපදිංචි කිරීම.

**475**. (1) (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව—

(අ) යම් ලේඛනයක් රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියාපදිංචි කළ යුතු යයි හෝ වාර්තාගත කළ යුතු යයි හෝ රෙජිස්ට්‍රාර්වරයා වෙත ගොනු කළ යුතු යයි හෝ මේ පනතේ යම් විධිවිධානයක් මගින් නියම කරනු ලබන්නේ නම් හෝ බලය පවරනු ලබන්නේ නම් ; සහ

(ආ) කවර හෝ ලේඛනයක් හෝ ලේඛනයක පිටපතක් සහ කවර හෝ වාර වාර්තාවක් හෝ දැන්වීමක් රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතු, ඉදිරිපත් කළ යුතු, දිය යුතු, භාර දිය යුතු හෝ ගෙනහැර පෑ යුතු යයි හෝ නැතහොත් රෙජිස්ට්‍රාර්වරයා වෙත යම් ලෙසකින් දැනුම් දිය යුතු යයි එවැනි යම් විධිවිධානයක් මගින් නියම කරනු ලබන්නේ නම් හෝ බලය දෙනු ලබන්නේ නම්

එවැනි යම් ලේඛන භාර ගැනීම සහ ලියාපදිංචි කිරීම හෝ වාර්තා කිරීම හෝ ගොනු කිරීම රෙජිස්ට්‍රාර්වරයා විසින් කරනු ලැබිය හැකි ය.

(2) මේ පනත යටතේ ලියාපදිංචි කිරීම සඳහා රෙජිස්ට්‍රාර්වරයා වෙත ලේඛනයක් ලැබුන විට—

(අ) ඒ ලේඛනය නියමිත ආකෘතියේ ඉදිරිපත් කළ යුතු යයි නියම කරනු ලැබ ඇති නමුත් එය නියමිත ආකෘතියේ නොමැති නම් ;

(ආ) ඒ ලේඛනය මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගවල හෝ විධිවිධානවලට අනුකූලව නොවන්නේ නම් ;

(ඇ) ඒ ලේඛනය මුද්‍රණය කර හෝ යතුරුලියනය කර නොමැති නම් ;

(ඇ) ඒ ලේඛනය නිසි ලෙස සම්පූර්ණ කර නොමැති නම් ; හෝ

(ඉ) ඒ ලේඛනයේ පැහැදිලිව කියවිය නොහැකි ද්‍රව්‍යයක් අඩංගු වේ නම්,

රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ ලේඛනය ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කළ හැකි අතර එවැනි අවස්ථාවක දී පහත සඳහන් ක්‍රියාවලින් එක් ක්‍රියාවක් එනම් :—

(ඊ) ලේඛනය නිසිලෙස සංශෝධනය කර හෝ සම්පූර්ණකර ලියාපදිංචි කිරීම සඳහා නැවත ඉදිරිපත් කරන ලෙස ; හෝ

(උ) ඒ වෙනුවට අළුත් ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස,

ඉල්ලා සිටිය හැකි ය.

ගොනු කරන ලද ලේඛනවල පරිවර්තන.

**476**. (1) මේ පනත යටතේ රෙජිස්ට්‍රාර්වරයා වෙත භාර දීමට නියමිත යම් ලේඛනයක් රාජ්‍ය භාෂාවකින් හෝ ඉංග්‍රීසි භාෂාවෙන් හෝ නොවන වෙනත් භාෂාවකින් ඇති විට රෙජිස්ට්‍රාර්වරයා විසින් තීරණය කරනු ලබන භාෂාවකින් වූ මුද්‍රිත පරිවර්තනයක්, සත්‍ය පරිවර්තනයක් බවට නියමිත ආකාරයෙන් සහතික කොට ඉදිරිපත් කරන ලෙස රෙජිස්ට්‍රාර්වරයා විසින් ලිඛිතව ඉල්ලා සිටිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ ඉල්ලීමක් අනුව කටයුතු කර නැති අවස්ථාවක රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ ලේඛනය පිළිබඳ වැඩිදුර කටයුතු නොකළ යුතු ය.

ගාස්තු.

**477**. (1) පහත සඳහන් දේ සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයා වෙත ගෙවිය යුතු ගාස්තු නියම කිරීම සඳහා මේ පනත යටතේ නියෝග සෑදිය හැකි ය :—

(අ) සීමිත සමාගමක් ලියාපදිංචි කිරීම ;

(ආ) සීමාරහිත සමාගමක් ලියාපදිංචි කිරීම ;

(ඇ) ඇපයෙන් සීමිත සමාගමක් ලියාපදිංචි කිරීම ;

(ඇ) දේපළ භාරගැනුම්කරුවකු හෝ කළමනාකරුවකු හෝ අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ ඈවරකරුවකු විසින් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට භාර දිය යුතු යයි නියම කරනු ලැබ ඇති දැන්වීම් සහ වාර්තා හැර ලියාපදිංචි කළ යුතු යයි නියම කරන ලද හෝ බලය දෙන ලද හෝ රෙජිස්ට්‍රාර්වරයාට භාර දිය යුතු යයි, යැවිය යුතු යයි, දිය යුතු යයි හෝ ඉදිරිපත් කළ යුතු යයි හෝ රෙජිස්ට්‍රාර්වරයා වෙත ගොනු කළ යුතු යයි හෝ නියම කරන ලද යම් ලේඛනයක් ලියාපදිංචි කිරීම ;

(ඉ) රෙජිස්ට්‍රාර්වරයා විසින් වාර්තාගත කළ යුතු යයි මේ පනතින් නියම කරන ලද හෝ බලය දෙනු ලැබ ඇති යම් කාරණයක් වාර්තාගත කිරීම ;

(ඊ) XI වන කොටස යටතේ අක්වෙරළ සමාගම් ලියාපදිංචි කිරීම ;

(උ) XVIII වන කොටස යටතේ එතෙර සමාගම් ලියාපදිංචි කිරීම.

(2) යම් ලේඛනයක් ලියාපදිංචි කිරීම, වාර්තාගත කිරීම හෝ ගොනු කිරීම සම්බන්ධයෙන් ගාස්තුවක් ගෙවීම සඳහා විශේෂ විධිවිධාන සලස්වා නොමැති අවස්ථාවක ඒ ලියාපදිංචි කිරීම, වාර්තාගත කිරීම හෝ ගොනු කිරීම සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයාට ගෙවිය යුතු ගාස්තුව, යම් කාරණාවක් පිළිබඳව වාර්තාවක් සකස් කිරීම සම්බන්ධයෙන් වූ ගාස්තුවම විය යුතු ය.

(3) රෙජිස්ට්‍රාර්වරයා විසින් යම් බලයක් ක්‍රියාත්මක කිරීම හෝ කර්තව්‍යයක් ඉටු කිරීම, එම කර්තව්‍ය සම්බන්ධයෙන් නියමිත ගාස්තුව ගෙවන තෙක් රෙජිස්ට්‍රාර්වරයා විසින් ප්‍රතික්ෂේප කළ හැකි ය.

වියදම් සහ ගාස්තු අයකර ගැනීම.

**478**. මේ පනත යටතේ රෙජිස්ට්‍රාර්වරයාට ගෙවිය යුතු යම් වියදම් හෝ ගාස්තු ඒවා ඉල්ලූ විට ගෙවීමට බැඳී සිටින තැනැත්තා විසින් ගෙවා නොමැති අවස්ථාවක, එම පැහැර හැරීම පිළිබඳව මහෙස්ත්‍රාත්වරයකුට වාර්තා කළ හැකි අතර, ඒ වියදම් හෝ ගාස්තු හෝ ප්‍රමාණය මහෙස්ත්‍රාත්වරයා විසින් පනවනු ලබන දඩයක් අයකර ගන්නා ආකාරයකින් අය කර ගත යුතු ය. තව ද පැහැර හැර ඇති මුදල් ප්‍රමාණය අරමුදලට බැර කළ යුතු බවට මහෙස්ත්‍රාත්වරයා විසින් විධාන කළ යුතු ය.

## අරමුදල

අරමුදල.

**479**. (1) මේ පනතේ කාර්ය සඳහා, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නියම කරනු ලැබිය හැකි ආකාරයකට පවත්වා ගෙන යා යුතු අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් මේ පනත යටතේ නියම කරනු ලබන, පනවනු ලබන හෝ අය කරනු ලබන සෑම ගාස්තුවකින් ම හෝ අය කිරීමකින් ම තුනෙන් දෙකොටසක් අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(3) රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් මේ පනත යටතේ නියම කරනු ලබන, පනවනු ලබන හෝ අය කරනු ලබන සෑම ගාස්තුවකින් ම හෝ අය කිරීමකින් ම තුනෙන් එක් කොටසක් ඒකාබද්ධ අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(4) මේ පනත යටතේ තම බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමේ දී රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් දරන ලද යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් ප්‍රමාණ සහ අරමුදලින් ගෙවිය යුතු යයි මේ පනතින් හෝ ඒ යටතේ සාදන ලද නියෝගයකින් හෝ මේ පනත හෝ නියෝග යටතේ හෝ නියමිත සියලු මුදල් ප්‍රමාණ එකී අරමුදලින් ගෙවිය යුතු ය.

(5) එක් එක් මුදල් වර්ෂය අවසාන වූ පසු හැකිතාක් ඉක්මණින්, අරමුදලේ පරිපාලනය පිළිබඳ වාර්තාවක් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පිළියෙල කළ යුතු අතර එක් එක් මුදල් වර්ෂය සම්බන්ධයෙන් පූර්ණ හා උචිත ගිණුමක් පවත්වාගෙන යාමට කටයුතු සැලැස්විය යුතු ය.

(6) අරමුදලේ ගිණුම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවට අනුකූලව, විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

## ලේඛන පරීක්ෂා කිරීම සහ ඉදිරිපත් කිරීම, වාර වාර්තා ඉදිරිපත් කිරීමට සමාගම්වලට ඇති කාර්ය බලාත්මක කිරීම සහ පොත් ඉදිරිපත් කිරීම සහ පරීක්ෂා කිරීම

රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් පවත්වාගෙන යනු ලබන ලේඛන පරීක්ෂා කිරීම, ඉදිරිපත් කිරීම හා ඒ පිළිබඳ සාක්ෂි.

**480.** (1) යම් පුද්ගලයකු විසින් නියමිත ගාස්තුව ගෙවීමෙන් පසු—

(අ) රෙජිස්ටරයේ කොටසක් වන ඕනෑම ලේඛනයක් ; හෝ

(ආ) 473 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් කර ඇති කවර හෝ උපක්‍රමයක හෝ පහසුකමක ඇතුළත් කොට ඇති කවර හෝ ලියාපදිංචි ලේඛනයක විස්තර,

පරීක්ෂා කළ හැකි ය.

(2) යම් පුද්ගලයකු විසින් නියමිත ගාස්තුව ගෙවීමෙන් පසුව පහත සඳහන් ලේඛන සපයා සහතික කරන ලෙස රෙජිස්ට්‍රාර්වරයාගෙන් ඉල්ලා සිටිය හැකි ය :—

(අ) සමාගමක් සංස්ථාගත කිරීමේ සහතිකය ;

(ආ) රෙජිස්ටරයේ කොටසක් වන වෙනත් ඕනෑම ලේඛනයක පිටපතක් හෝ උධෘතයක් ;

(ඇ) 473 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් ආකාරයේ යම් උපක්‍රමයක හෝ පහසු කමක ඇතුළත් කර ඇති යම් ලියාපදිංචි ලේඛනයක විස්තර ;

(ඈ) 473 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් ආකාරයේ යම් උපක්‍රමයක හෝ පහසුකමක විස්තර ඇතුළත් කර ඇති යම් ලියාපදිංචි ලේඛනයක පිටපත් හෝ උධෘතයක්.

(3) (1) වන හෝ (2) වන උපවගන්තිවල අඩංගු කිසිවක් —

(අ) රෙජිස්ට්‍රාර්වරයා විසින් අන්‍යාකාර විධානයක් කළ විටක හැර, 172, 173, හෝ 180 වගන්ති යටතේ පත්කර ඇති පරීක්ෂකවරයකුගේ කවර හෝ වාර්තාවකට ;

(ආ) ලේඛන පරීක්ෂා කිරීමට ඉල්ලුම් කරන හෝ එහි පිටපතක් හෝ උධෘතයක් අවශ්‍ය වන තැනැත්තා ඒ සමාගමේ කොටස් හිමියකු හෝ ණය හිමියකු වන්නේ නම් මිස, පුද්ගලික

සමාගමක් විසින් 170 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ හෝ 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ හෝ රෙජිස්ට්‍රාර්වරයාට භාර දෙන ලද යම් මුල්‍ය ප්‍රකාශවලට;

(ඇ) ලේඛනය පරීක්ෂා කිරීමට ඉල්ලුම් කරන හෝ එහි පිටපතක් හෝ උධෘතයක් අවශ්‍ය වන තැනැත්තා ඒ සමාගමේ කොටස් හිමියකු හෝ ණය හිමියකු වන්නේ නම් මිස, සමාගමක දේපළ භාරගැනුම්කරුවකු හෝ අද්මිනිස්ත්‍රාසිකරු විසින් ගොනු කරන ලද වාර්තාවකට,

අදාළ නොවිය යුතු ය.

(4) රෙජිස්ට්‍රාර්වරයා විසින් තබා ගනු ලබන යම් ලේඛනයක් ඉදිරිපත් කිරීමට බල කෙරෙන්නා වූ අධිකරණ විධානයක් අධිකරණයේ අවසරය ඇතිව හැර, කිසිම අධිකරණයක් මගින් නිකුත් කිරීම නොකළ යුතු ය. තවද එවැනි යම් අධිකරණ විධානයක් එම අධිකරණයේ අවසරය ඇතිව නිකුත් කරන ලද බව ප්‍රකාශ කර තිබිය යුතු ය.

(5) ශ්‍රී ලංකාවේ සමාගම් ලියාපදිංචි කිරීමේ කවර හෝ කාර්යාලවල තබා ඇති සහ ලියාපදිංචි කොට ඇති යම් ලේඛනයකින්, රෙජිස්ට්‍රාර් වරයා විසින් සත්‍ය පිටපතක් හෝ උධෘතයක් බවට සහතික කර ඇති, පිටපතක් හෝ උධෘතයක් සියලුම නඩු කටයුතුවල දී මුල් ලේඛනයට සමාන වලංගුතාවයකින් යුත් සාක්ෂියක් ලෙස ආවේශ්‍ය විය යුතු ය.

(6) (3) වන උපවගන්තියේ සඳහන් කාර්ය සඳහා තමා යම් සමාගමක කොටස් හිමියකු හෝ ණය හිමියකු බව අසත්‍ය ලෙස ප්‍රකාශ කරන යම් තැනැත්තකු වරදකට වරදකරුවකු වන අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙලක්ෂයකට වැඩි නොවන දඩයකට යටත් විය යුතු ය.

රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත වාර වාර්තා ඉදිරිපත් කිරීමෙහි ලා සමාගමේ කාර්ය කරන ලෙස බල කිරීම.

**481.** (1) රෙජිස්ට්‍රාර්වරයා වෙත යම් ලේඛනයක් ගොනු කිරීමට, භාරදීමට හෝ යැවීමට නියම කෙරෙන්නා වූ හෝ යම් කරුණක් සම්බන්ධයෙන් ඔහුට දැනුම් දිය යුතු යයි නියම කෙරෙන්නා වූ හෝ මේ පනතේ යම් විධිවිධානයකට අනුකූලව කටයුතු කිරීමට සමාගමක් පැහැර හැර අත්තා වූ ද පැහැර හැරීම නිවරද කරන ලෙසට වූ දැන්වීමක් භාරදුන් දිනයේ සිට වැඩ කරන දින දහයක් ඇතුළත පැහැර හැරීම නිවැරදි කිරීමට ඒ සමාගම අපොහොසත් වන්නා වූ ද අවස්ථාවක, රෙජිස්ට්‍රාර්වරයා හෝ සමාගමේ ණය හිමියකු හෝ විසින් අධිකරණයට කරන ලද ඉල්ලීමක් මත අධිකරණය විසින් සමාගමට සහ සමාගමේ යම් නිලධරයකුට, ආඥාවේ නිශ්චිතව සඳහන් කළ හැකි පරිදි වූ කාල සීමාවක් තුළ වරද නිවැරදි කරන ලෙසට විධාන කරමින්, ආඥාවක් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද ආඥාවක් මගින්, ඉල්ලුම් පත්‍රයෙහි සහ එයට ආනුෂංගික වන සියලු ගාස්තු සමාගම විසින් හෝ වරදට වගකිව යුතු වන සමාගමේ යම් නිලධරයකු විසින් හෝ දැරිය යුතු බවට විධිවිධාන සැලැස්විය හැකි ය.

(3) මෙම වගන්තියේ කිසිවකින් (1) වන උපවගන්තිය අදාළ වන යම් පැහැර හැරීමක් සම්බන්ධයෙන් සමාගමට හෝ එහි නිලධරයන්ට දඬුවම් පනවන යම් ප්‍රඥප්තියක් ක්‍රියාත්මක වීමට අගතියක් නොවිය යුතු ය.

සමාගම සම්බන්ධ තොරතුරු නීති විරෝධී ලෙස අනාවරණය කිරීම.

**482**. රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්තව සිටින හෝ සේවයේ නියුක්තව සිටියා වූ හෝ යම් තැනැත්තකු රෙජිස්ට්‍රාර්වරයාගේ දෙපාර්තමේන්තුව තුළ හෝ ඊට සම්බන්ධ සේවය අතරතුරේ දී ඔහු විසින් ලබාගන්නා ලද, මේ පනතේ විධිවිධාන යටතේ යම් සමාගමක් විසින් රෙජිස්ට්‍රාර්වරයා වෙත ගොනු කර ඇති ලේඛන සම්බන්ධයෙන් වූ හෝ ඒ හා සම්බන්ධ කරුණුවලට අදාළ වූ හෝ යම් තොරතුරක්, එවැනි තොරතුරු ලබාගැනීමට හිමිකමක් නැති හෝ බලය ලබා නැති හෝ තැනැත්තකුට සංනිවේදනය කරන්නා වූ යම් තැනැත්තකු හෝ ඒ තොරතුරු වෙනත් යම් නීති විරෝධී ප්‍රයෝජනයක් සඳහා යොදාගන්නා යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොවැඩි කාල සීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීම හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

වරදක් කරනු ලැබ ඇති බවට සැක කරනු ලබන අවස්ථාවන්හි දී පොත් ඉදිරිපත් කිරීම හා පරීක්ෂා කිරීම.

**483**. (1) යම් තැනැත්තකු සමාගමක නිලධාරියකුව සිටිමින් සමාගමේ කටයුතු කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් වරදක් කළ බව විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇති බව පෙන්නුම් කර ඇති සහ සමාගමේ හෝ සමාගම යටතේ හෝ පවතින පොත් හෝ පත්වල වරද කරනු ලැබූ බවට සාක්ෂි තිබෙන්නා වූ ද අවස්ථාවක නීතිපතිවරයා හෝ රෙජිස්ට්‍රාර්වරයා හෝ සහකාර පොලිස් අධිකාරි තනතුරට වඩා අඩු තනතුරක් දරන නිලධරයකු නොවන යම් පොලිස් නිලධරයකු හෝ විසින් මහෙස්ත්‍රාත්වරයාගේ නිල කාමරයේ දී මහෙස්ත්‍රාත්වරයාට ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් මත—

(අ) වරද විමර්ශනය කිරීමේ සහ වරද පිළිබඳ සාක්ෂි ලබාගැනීමේ කාර්යය සඳහා ඒ පොත් හෝ පත් හෝ ඉන් කවරක් හෝ පරීක්ෂා කිරීමට ආඥාවේ නම් කර ඇති යම් තැනැත්තකුට බලය පවරමින් ; හෝ

(ආ) එම පොත් හෝ පත් හෝ ඉන් කවරක් හෝ ආඥාවේ නම් කර ඇති පුද්ගලයකුට එසේ නම් කරන ලද ස්ථානයක දී ඉදිරිපත් කරන ලෙස සමාගමේ ලේකම්වරයාට හෝ ආඥාවේ නම් කරනු ලබන වෙනත් නිලධාරියකුට හෝ නියම කරමින්,

ආඥාවක් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් වර්ගයේ ආඥාවක් මේ උපවගන්තියේ විධිවිධාන හේතුවෙන් නොකළ යුතුවීම හැර, සමාගම හෝ සමාගමේ පාලනය හෝ යටතේ ඇති පොත් වලට හෝ පත් වලට හෝ (1) වන උපවගන්තියේ විධිවිධාන අදාළ වන ආකාරයෙන්ම බැංකු ව්‍යාපාරය කරගෙන යන තැනැත්තකුගේ පොත් හෝ පත් හෝ සමාගමේ කටයුතුවලට අදාළ වනතාක් දුරට ඒ පොත් හෝ පත් හෝ සම්බන්ධයෙන් ඒ උපවගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

(3) මෙම වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් මත වූ මහෙස්ත්‍රාත්වරයකුගේ තීරණයට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් නොකළ යුතු ය.

තොරතුරු ඉල්ලා සිටීමට සහ පොත්, රෙජිස්ටර සහ ලේඛන පරීක්ෂා කිරීමට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා සතු බලතල.

**484**. (1) රෙජිස්ට්‍රාර්වරයා විසින්, ලිඛිත දැන්වීමක් මගින් දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කර ඇති දිනයකට පෙර—

(අ) මේ පනතේ කාර්ය සඳහා රෙජිස්ට්‍රාර්වරයාට අවශ්‍ය වන, සමාගම සම්බන්ධ තොරතුරු ; හෝ

(ආ) සමාගම විසින් සපයන ලද යම් වාර වාර්තාවක, ප්‍රකාශයක හෝ වෙනත් ලේඛනයක සඳහන් කරන ලද විස්තර සම්බන්ධයෙන් දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයේ හෝ දිනවල පැවති පරිදි වූ රෙජිස්ට්‍රාර්වරයාට අවශ්‍ය වන පහත සඳහන් ආකාරයේ විස්තර හෝ තොරතුරු, එනම්—

(i) සමාගම විසින් ඉදිරිපත් කරන ලද යම් වාර වාර්තාවක, ප්‍රකාශයක හෝ වෙනත් යම් ලේඛනයක ප්‍රකාශ කර ඇති හෝ ප්‍රකාශ කළ යුතුව තිබූ විස්තර හෝ තොරතුරු ; හෝ

(ii) සමාගම විසින් ඉදිරිපත් කළ යුතුව තිබූ නමුත් ඇත්ත වශයෙන් එසේ ඉදිරිපත් කර නොමැති යම් වාර්තාවක හෝ වෙනත් ලේඛනයක ප්‍රකාශ කළ යුතුව තිබූ විස්තර හෝ තොරතුරු ; සහ

(ඇ) සමාගම විසින් එහි ව්‍යාපාර කටයුතු හෝ ගනුදෙනු සම්බන්ධයෙන් තබා ගෙන ඇති හෝ තබා ගැනීමට නියම කරනු ලැබ ඇති යම් පොතක්, රෙජිස්ටරයක් හෝ වෙනත් ලේඛනයක්,

සපයන ලෙස හෝ ඉදිරිපත් කරන ලෙස යම් සමාගමකට විධාන කළ හැකි ය.

(2) රෙජිස්ට්‍රාර්වරයා විසින් (1) වන උපවගන්තිය යටතේ දී ඇති යම් විධානයකට අනුව කටයුතු කිරීමට සමාගමක් පැහැර හරින අවස්ථාවක —

(අ) සමාගම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය ;

(ආ) සමාගමේ පැහැර හැරීම කරන ලද සෑම නිලධාරියකු ම වරදකට වරදකරු වන අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

## XVII වන කොටස

## පවතින සමාගම්වලට පනත අදාළ වීම

**485**. (1) මේ පනතේ විධිවිධාන දැනට පවතින සමාගම්වලට අදාළ වීමේ දී— පවතින සමාගම්වලට පනත අදාළ වීම.

(අ) ඇපයෙන් සීමිත සමාගමක් නොවන සීමිත සමාගමක් සම්බන්ධයෙන් වූ විට සමාගම මේ පනතේ විධිවිධාන යටතේ සීමිත සමාගමක් වශයෙන් පිහිටුවා ලියාපදිංචි කරනු ලැබූ විටක මෙන් ද ;

(ආ) ඇපයෙන් සීමිත සමාගමක් සම්බන්ධයෙන් වූ විට සමාගම ඇපයෙන් සීමිත සමාගමක් වශයෙන් මේ පනතේ විධිවිධාන යටතේ පිහිටුවා ලියාපදිංචි කරනු ලැබූ විටෙක මෙන් ද ;

(ඇ) සීමිත සමාගමක් නොවන සමාගමක් සම්බන්ධයෙන් වූ විට සමාගම සීමාරහිත සමාගමක් වශයෙන් මේ පනතේ විධිවිධාන යටතේ පිහිටුවා ලියාපදිංචි කරනු ලැබූ විටෙක මෙන් ද ;

(ඇ) ජනතා සමාගමක් වන සමාගමක් සම්බන්ධයෙන් වූ විට සමාගම සීමාසහිත සමාගමක් වශයෙන් මේ පනතේ විධිවිධාන යටතේ පිහිටුවා ලියාපදිංචි කරනු ලැබූ විටක මෙන් ද,

අදාළ විය යුතු ය.

(2) පෞද්ගලික සමාගමක් වන දැනට පවත්නා සමාගමක් මේ පනත යටතේ පෞද්ගලික සමාගමක් ලෙස දිගටම පවත්වාගන යා යුතු අතර එම සමාගමට මේ පනතේ II වන කොටස අදාළ වේ.

(3) අක්වෙරළ සමාගමක් වන දැනට පවත්නා සමාගමක් මේ පනත යටතේ අක්වෙරළ සමාගමක් ලෙස දිගටම පවත්වා ගෙන යා යුතු අතර එම සමාගමට මේ පනතේ XI වන කොටස අදාළ වේ.

(4) දැනට පවත්නා සමාගමක් ලියාපදිංචි කිරීමේ දිනය පිළිබඳ ප්‍රකාශිත හෝ ව්‍යංගික යම් සඳහනක්, යම් ලිඛිත නීතියක් යටතේ එම සමාගම පළමුවෙන් සංස්ථාගත කරනු ලැබූ දිනයට කරන ලද සඳහනක් ලෙස තේරුම් ගත යුතු ය.

(5) (අ) 1861 හවුල් ස්කන්ධ සමාගම් ආඥාපනත, 1897 හවුල් ස්කන්ධ බැංකු ආඥාපනත සහ (145 වන අධිකාරය වන) සමාගම් ආඥාපනත යන ආඥාපනත් යටතේ පිහිටුවා ලියාපදිංචි කරන ලද සීමාසහිත පුද්ගලික සමාගමක් වූ දැනට පවත්නා සමාගමක් සීමාසහිත (පුද්ගලික) යන ප්‍රත්‍යය හෝ සී. ස. (පුද්ගලික) යන කෙටි යෙදුම හෝ ඇතුළත් වන ලෙස තම නාමයන් වෙනස් කරනු ලැබ ඇති ලෙස සැලකිය යුතු ය.

(ආ) පොදු ලැයිස්තුගත සමාගමක් මත පවත්නා සමාගමක් "සීමාසහිත පොදු සමාගමක්" යන ප්‍රත්‍යය හෝ "පී. එල්. සී." යන කෙටි යෙදුම හෝ ඇතුළත් වන සේ තම නාමය වෙනස් කරනු ලැබූ ලෙස සළකනු ලැබිය යුතු ය.

(6) (අ) (5) වන උපවගන්තියේ විධිවිධාන යටතේ කරන ලදැයි සැලකෙන වෙනස් කිරීමට ආනුශංගිකව රෙජිස්ට්‍රාර්වරයා විසින් නව නාමය කලින් තිබූ නාමය වෙනුවට රෙජිස්ටරයේ ඇතුළත් කළ යුතු අතර, අවස්ථාවෝචිත පරිදි ඉහත කී ප්‍රත්‍යය හෝ කෙටි යෙදුම ඇතුළත් කරමින් නව සංස්ථාගත කිරීමේ සහතිකයක් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරනු ලැබිය යුතු ය.

(ආ) එකී නව සංස්ථාගත කිරීමේ සහතිකය රෙජිස්ට්‍රාර්වරයා විසින් 487 වන විධිවිධානය යටතේ නව අංකයක් පැවරීමෙන් පසුව, නිකුත් කළ යුතු ය.

දැනට පවත්නා සමාගම්වල ව්‍යවස්ථාවලියට අදාළ විධිවිධාන.

**486**. (1) ආදර්ශ ව්‍යවස්ථාවලිය දැනට පවත්නා සමාගමකට අදාළ වන බවට 15 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ඒ සමාගම විසින් යෝජනා සම්මත කර ගන්නේ නම් මිස, එකී ව්‍යවස්ථාවලිය දැනට පවත්නා ආදර්ශ සමාගමකට අදාළ නොවිය යුතු ය.

(2) දැනට පවත්නා සමාගමක සංගමික සංස්ථා පත්‍රය, සමාගමේ ව්‍යවස්ථාවලියේ කොටසක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ කාර්ය සඳහා දැනට පවත්නා සමාගමක ව්‍යවස්ථාවලිය එම සමාගමේ ව්‍යවස්ථාවලිය ලෙස දිගටම සලකනු ලැබිය යුතු අතර, 1982 අංක 17 දරන සමාගම් පනතේ පළමුවන උපලේඛනයේ 'අ' වගුයේ දක්වා ඇති රීති සියල්ලම හෝ ඉන් යම් රීතියක් සමාගමේ ව්‍යවස්ථාවලියෙන් පිළිගෙන ඇති අවස්ථාවක, එම රීති සමාගමේ ව්‍යවස්ථාවලියට සම්පූර්ණයෙන් ඇතුළත් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

දැනට පවත්නා සමාගම්වල සමාගම් අංකවලට අදාළ වූ විධිවිධාන.

**487**. (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, පරිපාලනමය කාර්ය සඳහා, රෙජිස්ට්‍රාර්වරයා විසින් දැනට පවත්නා සමාගමකට පවරනු ලැබ ඇති අංකය, එම සමාගමේ සමාගම් අංකය විය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මකවනු ලබන දිනයෙන් මාස දොළහක කාලයක් ඇතුළත සෑම පවතින සමාගමක් විසින් ම ස්වකීය සමාගම් අංකය වශයෙන් නව අංකයක් පවරන ලෙස, රෙජිස්ට්‍රාර්වරයා විසින් නියම කරනු ලැබිය හැකි ආකෘතියක රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉල්ලුම් කළ යුතු ය. එසේ පවරන ලද නව අංකය රෙජිස්ටරයේ සහ 485 වන වගන්තියේ (6) වන උපවගන්තියේ විධිවිධාන යටතේ නිකුත් කරනු ලබන අලුත් සංස්ථාගත කිරීමේ සහතිකයේ ඇතුළත් කළ යුතු ය.

(3) මේ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ නිශ්චිතව නියම කර තිබෙන කාලය ඇතුළත ඒ උපවගන්තිය යටතේ පනවා ඇති නියමයන් අනුව ක්‍රියා කිරීම යම් පවත්නා සමාගමක් විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක, ඒ සමාගමේ නම රෙජිස්ට්‍රාර්වරයා විසින් දිනපතා සිංහල පුවත්පතක, දෙමළ පුවත්පතක සහ ඉංග්‍රීසි පුවත් පතක පළ කිරීමට

සැළැස්විය යුතු අතර ඉන් පසුව ද ඒ සමාගම තවදුරටත් ඒ නියමයන් අනුව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබුවහොත්, ඒ සමාගමේ නම පුවත්පත්වල පළ කරනු ලැබීමේ සිට මාස හයක් ඇතුළත රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ සමාගමේ නම ඔහු විසින් 473 වන වගන්තියේ විධිවිධාන යටතේ පවත්වා ගෙන යන රෙජිස්ටරයෙන් කපා හැරිය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ සඳහන් මාස හයක කාලසීමාව ඇතුළත, ඒ සමාගමට නව අංකයක් (2) වන උපවගන්තිය යටතේ නියම කරවා ගැනීම සඳහා ඉල්ලුම් කිරීමට, අධ්‍යක්ෂවරයකුට අමතරව, ඒ සමාගමේ කොටස් හිමියකුට හෝ 102 වන වගන්තිය යටතේ සෘණභාරයක් ලියාපදිංචි කර ඇති තැනැත්තකුට හෝ අධිකරණයක් ඉදිරිපිට හෝ බේරුම් කිරීමේ නඩු කටයුත්තක විභාගවෙමින් පවතින, මුදල් හිමිකම්පෑමක් ඇති තැනැත්තකු ට ද හිමිකම ඇත්තේ ය.

(5) සමාගමක නාමයක් (3) වන උපවගන්තිය යටතේ රෙජිස්ටරයෙන් කපා හරිනු ලැබූ අවස්ථාවක එහි නම එසේ කපා හරිනු ලැබූ දිනයට පෙරාතුව ම සමාගම සතුව තිබුණ හෝ ඒ සමාගම සඳහා භාරයක් වශයෙන් දරනු ලැබූ (බදු අයිතිය ඇති දේපළ ඇතුළුව, එහෙත් වෙනත් යම් තැනැත්තකු සඳහා භාරයක් ලෙස සමාගම විසින් දරනු ලබන දේපළ ඇතුළත් නොවන) කවර වූ හෝ සියලු දේපළ හා අයිතිවාසිකම් රජය වෙත සතුවිය යුතු හා රජයට මනාපයක් කළ හැකි විය යුතු ය.

## XVIII වන කොටස

## **විදේශ සමාගම්**

අර්ථ නිරූපණය.

488. මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා—

"අධ්‍යක්ෂවරයා" යන යෙදුම සමාගමක් සම්බන්ධයෙන් වන විට, යම් තැනැත්තකුගේ විධාන හා උපදෙස්වලට අනුකූලව ක්‍රියා කිරීමට සමාගමේ අධ්‍යක්ෂවරුන් පුරුදුව සිටී ද එම තැනැත්තා ඇතුළත් වේ ;

"විදේශ සමාගම්" යන්නෙන්, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරනු ලැබූ යම් සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් අදහස් වන අතර, එයින්—

(අ) නියමිත දිනට පසුව ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරික ස්ථානයක් පිහිටුවනු ලැබූ ; හෝ

(ආ) නියමිත දිනට පෙර ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරික ස්ථානයක් පිහිටුවා නියමිත දිනයේ දී ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරික ස්ථානයක් දිගටම පවත්වාගෙන යන,

යම් සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් අදහස් වේ ;

"ව්‍යාපාරික ස්ථානය" යන්නට කොටස් පවරන හෝ කොටස් ලියාපදිංචි කරන කාර්යාලයක් ද ඇතුළත් වේ ;

"ලියාපදිංචි විදේශ සමාගම" යන්නෙන් 489 වන වගන්තිය යටතේ නියමිත ලේඛන සහ විස්තර රෙජිස්ට්‍රාර්වරයා වෙත භාර දී ඇති හෝ භාර දී ඇතැයි සලකනු ලබන විදේශ සමාගමක් අදහස් වේ ; සහ

"ලේකම්වරයා" යන්නට කවර නමකින් හඳුන්වනු ලැබුව ද ලේකම් ධුරය දරන තැනැත්තකු ඊට ඇතුළත් වේ.

විදේශ සමාගම් විසින් රෙජිස්ට්‍රාර්වරයා වෙත භාරදිය යුතු ලේඛන සහ විස්තර.

**489**. (1) ශ්‍රී ලංකාවෙන් පිටස්තරව සංස්ථාගත කරනු ලැබ නියමිත දිනයෙන් පසු ශ්‍රී ලංකාව ඇතුළත ව්‍යාපාර ස්ථානයක් පිහිටුවන්නා වූ සෑම සමාගමක් විසින් ම ස්වකීය ව්‍යාපාරික ස්ථානය පිහිටුවීමේ දින සිට එක් මාසයක් ඇතුළත ලියාපදිංචි කිරීමේ කාර්ය සඳහා පහත දැක්වෙන ලේඛන රෙජිස්ට්‍රාර්වරයා වෙත බාර දිය යුතු ය :—

(අ) සමාගමේ අධිකාර පත්‍රයේ, ව්‍යවස්ථාවේ හෝ සාංගමික සංස්ථා පත්‍රයේ හෝ ව්‍යවස්ථාවලියේ හෝ සමාගමේ සංයුතිය සමන්විත වන නැතහොත් අර්ථ නිරූපණය වන වෙනත් සාධන පත්‍රයක සහතික කළ පිටපතක්, තව ද ඒ සාධන පත්‍රය ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂාවකින් හෝ ඉංග්‍රීසි භාෂාවෙන් හෝ නොවන අවස්ථාවක, රෙජිස්ට්‍රාර්වරයා විසින් නියම කරනු ලබන භාෂාවකින් ඒ සාධන පත්‍රයේ පරිවර්තනයක් ;

(ආ) සමාගමක අධ්‍යක්ෂ නාම ලේඛනයේ අධ්‍යක්ෂවරයන් සම්බන්ධයෙන් ඇතුළත් විය යුතු යයි මේ පනතින් නියම කර ඇති පරිදි අධ්‍යක්ෂවරයන් පිළිබඳ විස්තර ඇතුළත් සමාගමේ අධ්‍යක්ෂවරයන්ගේ නාමාවලියක් ;

(ඇ) සමාගම වෙත භාර දීමට නියමිත ලේඛන හා වෙනත් දැන්වීම් සමාගම වෙනුවෙන් භාර ගැනීමට බලය පවරනු ලැබූ ශ්‍රී ලංකාවෙහි වෙසෙන තැනැත්තන් එක්කෙනකුගේ හෝ ඊට වැඩි සංඛ්‍යාවකගේ නම් හා ලිපිනයන් ;

(ඇ) පහත සඳහන් ස්ථානවල සම්පූර්ණ ලිපිනය ඇතුළත් ප්‍රකාශයක් :—

(i) සමාගමේ ලියාපදිංචි කළ කාර්යාලය හෝ ප්‍රධාන කාර්යාලය ; සහ

(ii) ශ්‍රී ලංකාව තුළ සමාගමේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය.

(ඉ) සමාගම සංස්ථාගත කිරීම බලාත්මක කරන හෝ ඊට සාක්ෂි දරන යම් ලේඛනයක මෑතකදී සහතික කරන ලද සහතික පිටපතක්.

(2) පැහැර හැරීම සිදුකළ සමාගම විසින් ප්‍රමාණවත් හේතු පෙන්වා දෙනු ලැබුවහොත්, රෙජිස්ට්‍රාර්වරයා විසින් (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව එක් මාසයකින් දීර්ඝ කරනු ලැබිය හැකි ය.

(3) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරනු ලැබ නියමිත දිනයේ දී හෝ ඉන් පෙර ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරික ස්ථානයක් පිහිටුවන හෝ පිහිටුවනු ලැබ ඇති සෑම සමාගමක් විසින් (4) වන උපවගන්තියට යටත්ව ඒ දින සිට එක් මාසයක කාලසීමාවක් ඇතුළත (1) වන උපවගන්තියේ සඳහන් ලේඛන හා විස්තර ලියාපදිංචි කිරීම සඳහා රෙජිස්ට්‍රාර්වරයා වෙත භාර දිය යුතු ය.

(4) විදේශ සමාගමක් විසින් නියමිත දිනට පෙර ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරික ස්ථානයක් පිහිටුවනු ලැබ ලේඛන හා විස්තර රෙජිස්ට්‍රාර්වරයාට භාර දීමට අදාළව 1982 අංක 17 දරන සමාගම් පනතේ XIII වන කොටසේ නියමයන්ට අනුකූලව ක්‍රියා කර ඇති අවස්ථාවක—

(අ) එවැනි සමාගමක් (3) වන උපවගන්තියට එකඟව ක්‍රියා කර ඇති ලෙස සලකනු ලැබිය යුතු ය ; සහ

(ආ) 1982 අංක 17 දරන සමාගම් පනතේ XIII වන කොටස යටතේ භාර දෙනු ලැබූ ලේඛන හා විස්තර රෙජිස්ට්‍රාර්වරයා විසින් විදේශ සමාගම් පිළිබඳ ලේඛනයෙහි ඇතුළත් කර, එම විදේශ සමාගමට ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(5) අවස්ථාවෝචිත පරිදි (1) සහ (3) උපවගන්තිවල සඳහන් ලේඛන ලැබීමෙන් පසු රෙජිස්ට්‍රාර්වරයා විසින් එම සමාගම විදේශ සමාගමක් ලෙස ලියාපදිංචි කරනු ලැබිය හැකි අතර, එකී නම විදේශ සමාගම් පිළිබඳ ලේඛනයේ ඇතුළත් කරනු ලැබිය යුතු ය. සෑම ලියාපදිංචි විදේශ සමාගමකටම, එය ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු ලියාපදිංචි සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(6) යම් විශේෂ අවස්ථාවක, අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගෙන, (3) වන උපවගන්තියේ සඳහන් එක් මාසයක කාලසීමාව දීර්ඝ කළ යුතු යයි, රෙජිස්ට්‍රාර්වරයාට පෙනී යන්නේ නම්, ඔහුට එසේ දීර්ඝ කළ හැක.

(7) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරනු ලැබූ සමාගමක් විසින් පවත්වාගෙන යන ව්‍යාපාර කටයුතු විනිමය, පාලන පනත මගින් හෝ එය යටතේ සාදන ලද පිරිවිතරවලට අනුකූල නොවන අවස්ථාවක, එම සමාගම විසින් ශ්‍රී ලංකාව ඇතුළත ව්‍යාපාරික ස්ථානයක් පිහිටුවීම හෝ එම සමාගම විදේශ සමාගමක් ලෙස ලියාපදිංචි කිරීම හෝ නොකළ යුතු ය.

විදේශ සමාගම්වලට ඉඩම් දැරීමට ඇති බලය.

**490**. මේ පනත යටතේ සංස්ථාගත කරනු ලැබූ සමාගමක් වූ කලක පරිද්දෙන් ශ්‍රී ලංකාවෙහි ඉඩම් දැරීමට සමාන බලතල ලියාපදිංචි කළ විදේශ සමාගමකට ඇත්තේ ය.

ලේඛන ආදිය වෙනස් කරනු ලැබූ අවස්ථාවක වාර වාර්තාවක් රෙජිස්ට්‍රාර්වරයා වෙත භාරදිය යුතු බව.

**491**. ලියාපදිංචි විදේශ සමාගමක් සම්බන්ධයෙන් වන විට—

(අ) ඒ සමාගමේ අධිකාර පත්‍රයෙහි, ව්‍යවස්ථාවල හෝ සාංගමික සංස්ථා පත්‍රයෙහි හෝ ව්‍යවස්ථාවලියෙහි හෝ, සමාගමේ සංයුතිය සමන්විත වන නැතහොත් අර්ථ නිරූපණය වන වෙනත් යම් සාධන පත්‍රයක ; හෝ

(ආ) සමාගමේ අධ්‍යක්ෂවරයන් සම්බන්ධයෙන් හෝ අධ්‍යක්ෂවරයන්ගේ නාමාවලියෙහි ඇතුළත් විස්තරවල ; හෝ

(ඇ) සමාගම වෙනුවෙන් සේවය කිරීම පිළිගැනීමට බලය පවරනු ලැබූ තැනැත්තන්ගේ නම්වල හෝ ලිපිනවල ; හෝ

(ඈ) (i) සමාගමේ ලියාපදිංචි කළ කාර්යාලයේ හෝ ප්‍රධාන කාර්යාලයේ ලිපිනයේ ; නැතහොත්

(ii) සමාගමේ ශ්‍රී ලංකාව ඇතුළත පිහිටි ප්‍රධාන ව්‍යාපාර ස්ථානයේ ලිපිනයේ,

යම් වෙනසක් කරනු ලැබුවහොත්, සමාගම විසින්, ඒ වෙනස් කිරීම පිළිබඳ නියමිත විස්තර ඇතුළත් වාර වාර්තාවක් නියමිත කාලය ඇතුළත රෙජිස්ට්‍රාර්වරයා වෙත භාර දිය යුතු ය.

විදේශීය සමාගම්වල මූල්‍ය ප්‍රකාශ.

**492**. (1) ලියාපදිංචි කළ සෑම විදේශ සමාගමක් ම සම්බන්ධයෙන් වන විට, ඒ සමාගම මේ පනතේ අර්ථානුකූලව සමාන විස්තරයක සමාගමක් වූයේ නම් එය විසින් මේ පනතේ විධිවිධාන යටතේ (එසේ වුව ද නියමිත යම් ව්‍යතිරේකවලට යටත්ව) පිළියෙල කිරීමට නියමිත ආකෘතියට අනුකූලව සහ නියමිත විස්තර හා ලේඛන ඇතුළත් කළ මූල්‍ය ප්‍රකාශ ද ඒ සමාගම පාලක සමාගමක් වන විට සමූහ මූල්‍ය

ප්‍රකාශ ද සෑම ලිත් වර්ෂයක දී ම පිළියෙල කොට, එම ලේඛන ලියාපදිංචි කිරීම සඳහා, එම ලේඛනවල සහතික පිටපත් රෙජිස්ට්‍රාර්වරයා වෙත භාර දෙනු ලැබිය යුතු ය.

(2) (1) වන උපලේඛනයේ සඳහන් යම් ලේඛනයක් ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂාවකින් හෝ ඉංග්‍රීසියෙන් හෝ නොමැති අවස්ථාවක, රෙජිස්ට්‍රාර්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන භාෂාවකින් නියමිත ආකාරයට එහි සහතික කළ පරිවර්තනයක් ඊට අමුණනු ලැබිය යුතු ය.

විදේශ සමාගමේ නම.

**493**. (1) ලියාපදිංචි කළ විදේශ සමාගමක සංස්ථාපිත නාමය, මේ පනත යටතේ ඒ සමාගම පිහිටුවනු ලැබුවේ නම් අදාළ දිනයේ දී මේ පනතේ 7 වන වගන්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබීමෙන් වළක්වනු ලැබිය හැකිව තිබූ නාමයක් බව හෝ 10 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ ඒ සම්බන්ධයෙන් විධානයක් දෙනු ලැබිය හැකිව තිබූ බව හෝ රෙජිස්ට්‍රාර්වරයාට පෙනී යන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, නම ලියාපදිංචි කිරීම කළ නොහැකි වූයේ මන්ද යන්න හෝ විධානයක් කරනු ලැබුවේ කවර හේතු මත ද යන්න සඳහන් කරමින් රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ ලියාපදිංචි කළ විදේශ සමාගම වෙත දැන්වීමක් යවනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක් අදාළ දින සිට මාස දොළහකට පසුව, සමාගමක් වෙත යවනු නොලැබිය යුතු ය.

(3) (2) වන සහ (3) වන උපවගන්තිවල කාර්ය සඳහා "අදාළ දිනය" වන්නේ—

(අ) විදේශ සමාගම 489 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියාකර ඇති දිනය ; හෝ

(ආ) විදේශ සමාගමේ සංස්ථාපිත නාමයේ වෙනසක් සිදු වී ඇත්නම් 491 වන වගන්තිය යටතේ ඒ වෙනස පිළිබඳව දැනුම් දුන් දිනය වේ.

(4) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් භාරදෙනු ලැබූ ලියාපදිංචි කළ විදේශ සමාගමක් විසින්—

(අ) ශ්‍රී ලංකාවෙහි ව්‍යාපාර කටයුතු කරගෙන යාමට එම සමාගම අදහස් කරන එහි සංස්ථාපිත නම හැර රෙජිස්ට්‍රාර්වරයා විසින් අනුමත කරන ලද නමක් නිශ්චිතව සඳහන් කරමින් නියමිත ආකෘති පත්‍රයේ වූ දැන්වීමක් රෙජිස්ට්‍රාර්වරයා වෙත භාර දෙනු ලැබිය හැකි ය ; තව ද

(ආ) ඒ නම ලියාපදිංචි කිරීමෙන් පසු, කලින් ලියාපදිංචි කරන ලද නම වෙනුවට ආදේශ කිරීම සඳහා එම සමාගමේ සංස්ථාපිත නම හැර, රෙජිස්ට්‍රාර්වරයා විසින් අනුමත කරනු ලබන නමක් නිශ්චිතව සඳහන් කරමින් නියමිත ආකෘති පත්‍රයෙහි වූ දැන්වීමක්, කවර හෝ අවස්ථාවක දී රෙජිස්ට්‍රාර්වරයා වෙත භාර දෙනු ලැබිය හැකි ය.

(5) (4) වන උපවගන්තිය යටතේ තත්කාලය සඳහා ලියාපදිංචි කළ විදේශ සමාගමේ නම, ශ්‍රී ලංකාවේ සියලු නීතිමය කාර්ය සඳහා සමාගමේ නම ලෙස සලකනු ලැබිය යුතු ය. මේ උපවගන්තියේ විධිවිධාන—

(අ) මේ වගන්තියෙහි සමාගමේ සංස්ථාපිත නමට කරන ලද සඳහන් කිරීම්වලට බල නො පෑ යුතු ය ;

(ආ) සමාගමේ යම් අයිතිවාසිකම් හෝ බැඳීම්වලට බල නොපෑ යුතු ය ; නැතහොත් සමාගම විසින් හෝ එයට එරෙහිව පවරා ඇති නීති කෘත්‍ය දෝෂ සහිත ඒවා බවට පත් නොකළ යුතු ය. සංස්ථාපිත නමින් සමාගමට එරෙහිව ආරම්භ කර ඇති හෝ දිගටම පවත්වාගෙන යන යම් නීති කෘත්‍යයක්, තත් කාලයේ දී සමාගම ලියාපදිංචි කරනු ලැබ ඇති නමින් ආරම්භ කිරීම හෝ දිගටම පවත්වාගෙන යාම සිදු කළ හැකි ය.

(6) (1) වන උපවගන්තිය යටතේ දෙන ලද දැන්වීමක්, එසේ නොදිය යුතුව තිබූ බවට හෝ ඒ දැන්වීම දෙන ලද අවස්ථාවේ තිබුන අවස්ථානුගත කරුණු වෙනස් වී ඇති බවට හෝ රෙජිස්ට්‍රාර්වරයා සෑහීමට පත් වන්නේ නම්, ඔහු විසින් ඒ දැන්වීම ඉල්ලා අස්තර ගත හැකි අතර එසේ ඉල්ලා අස්කර ගන්නා අවස්ථාවේදී එවැනි දැන්වීමක් කිරීම සඳහා වූ කිසිම හේතුවක් නොතිබිය යුතු ය. (7) වන උපවගන්තියේ විධිවිධාන, මේ උපවගන්තිය යටතේ ඉල්ලා අස්කර ගනු ලැබූ දැන්වීමක් සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

(7) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් භාර දෙනු ලැබූ ලියාපදිංචි කළ විදේශ සමාගමක් විසින්, ඒ දැන්වීම භාර දෙනු ලැබ මාස දෙකක් (හෝ දැන්වීමේ නිශ්චිතව සඳහන් කළ හැකි යම් දීර්ඝ කාලසීමාවක්) ඉකුත් වීමෙන් පසු කවර හෝ අවස්ථාවක දී එහි සංස්ථාගත නමින් ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන නොයා යුතු ය.

(8) ලියාපදිංචි කළ විදේශ සමාගමක් විසින් (7) වන උපවගන්තියේ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින අවස්ථාවක,—

(අ) සමාගම වරදකට වරදකරු වන අතර එසේ වරදකරු කිරීමේ දී රුපියල් ලක්ෂ දෙකකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය ;

(ආ) පැහැර හැරීම සිදුකළ සමාගමේ සෑම නිලධරයකු ම වරදකට වරදකරු වන අතර එසේ වරදකරු කිරීමේ දී රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

සමාගමේ නම සහ විස්තර සඳහන් කිරීමට බැඳී සිටින බව.

**494**. සෑම ලියාපදිංචි කළ විදේශ සමාගමක් විසින් ම—

(අ) ශ්‍රී ලංකාව තුළ ස්වකීය කොටස් හෝ ණය පත්‍ර සඳහා සහභාග කැඳවීමේ සෑම සංස්ථා ප්‍රකාශයකම සමාගම සංස්ථාගත කරනු ලැබූ රට සඳහන් කළ යුතු ය ;

(ආ) ශ්‍රී ලංකාව තුළ එහි ව්‍යාපාරය පවත්වා ගෙන යනු ලබන සෑම ස්ථානයකම සමාගමේ නම සහ සමාගම සංස්ථාගත කරනු ලැබූ රට පැහැදිලිව ප්‍රදර්ශනය කළ යුතු බවට වග බලා ගත යුතු ය ;

(ඇ) (i) සමාගමේ සියලු ව්‍යාපාරික ලිපිවල ;

(ii) සමාගමේ සියලු දැන්වීම්වල හා නිල ප්‍රකාශනවල ;

(iii) සමාගම වෙනුවෙන් අත්සන් තබා ඇති සියලු විනිමය බිල්පත්වල, පොරොන්දු නෝට්ටුවල, පිටසන්වල, චෙක්පත්වල සහ මුදල් හා භාණ්ඩ ඇනවුම්වල ;

(iv) සමාගමේ සියලු ඉන්වොයිස්පත්වල, ලදුපත්වල සහ ණයවර ලිපිවල ; සහ

(v) සමාගමේ නෛතික බැඳීම්වලට සාක්ෂි දරන හෝ එවැනි බැඳීම් ඇති කරන, සමාගම විසින් නිකුත් කරන ලද හෝ අත්සන් තබන ලද වෙනත් සියලු ලේඛනවල,

සමාගමේ නම සහ සමාගම සංස්ථාගත කරනු ලැබූ රට පැහැදිලිව සඳහන් කරනු ලබන බවට වගබලා ගත යුතු ය ; තව ද

(ඈ) සමාගමේ සාමාජිකයන්ගේ වගකීම සීමාසහිත වන අවස්ථාවක, එම කරුණු පිළිබඳ දැන්වීම සෑම සංස්ථා ප්‍රකාශයකම සහ (ඇ) ඡේදයේ සඳහන් සියලු ලිපි හා වෙනත් ලේඛනවල පැහැදිලිව සඳහන් කරන බවට කටයුතු සැලැස්විය යුතු අතර ඒවා සමාගම ව්‍යාපාර කටයුතුවල යෙදෙන සෑම ස්ථානයකම පැහැදිලිව ප්‍රදර්ශනය කළ යුතු ය.

විදේශ සමාගමක් වෙත භාරදීම.

**495**. (1) ලියාපදිංචි කළ යම් විදේශ සමාගමක් වෙත භාර දීමට නියමිත යම් ලේඛනයක් හෝ දැන්වීමක්, මේ පනතේ මේ කොටස යටතේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ලිපිනය භාර දෙනු ලැබූ යම් තැනැත්තකු නමින් එසේ භාර දී ඇති ලිපිනය යොදා එසේ භාර දෙන ලද ලිපිනයෙහි තැබීම හෝ තැපෑලෙන් යැවීම කරනු ලැබුවහොත්, එය ප්‍රමාණවත් වූ භාරදීමක් විය යුතු ය.

(2) (අ) භාර දෙනු ලබන ලේඛන හා දැන්වීම් සමාගම වෙනුවෙන් පිළිගැනීමට බලය පවරා ඇති ශ්‍රී ලංකාවේ පදිංචි තැනැත්තකුගේ නම හා ලිපිනය, යම් ලියාපදිංචි කළ විදේශීය සමාගමක් විසින් රෙජිස්ට්‍රාර්වරයා වෙත භාරදීමට අපොහොසත්ව ඇති අවස්ථාවක ; හෝ

(ආ) නම් හෝ ලිපිනයන් එසේ භාර දී ඇත්තේ යම් තැනැත්තන්ගේ ද එම තැනැත්තන් කවර හෝ අවස්ථාවක මියගොස් ඇති හෝ ශ්‍රී ලංකාවේ පදිංචිය අත්හැර ඇති හෝ සමාගම වෙනුවෙන් භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ යම් හේතුවක් නිසා හෝ භාර දිය නොහැකි අවස්ථාවක,

ශ්‍රී ලංකාව තුළ සමාගම පිහිටුවා ඇති යම් ව්‍යාපාරික ස්ථානයක් වෙත ලේඛනය භාර දීමෙන් හෝ තැපෑලෙන් යැවීමෙන් සමාගම වෙත ඒ ලේඛනය භාර දෙනු ලැබිය හැකි ය.

සමාගමක්, ශ්‍රී ලංකාව තුළ තිබූ ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යාම නතර කළ විට, ඒ බව රෙජිස්ට්‍රාර්වරයා වෙත දැන්විය යුතු බව.

**496**. යම් ලියාපදිංචි කළ විදේශ සමාගමක් ව්‍යාපාර ස්ථානයක් ශ්‍රී ලංකාවෙහි පවත්වාගෙන යාම නතර කරන අවස්ථාවක, රෙජිස්ට්‍රාර්වරයා වෙත සමාගම විසින්, නොපමාව ඒ කාරණය දැනුම් දිය යුතු අතර, එසේ දැන්වීම කරනු ලැබූ දින සිට රෙජිස්ට්‍රාර්වරයා වෙත සමාගම විසින් යම් දැන්වීමක් භාර දීමෙහි ලා ඇති වගකීම අවසන් වන්නේ ය.

විදේශ සමාගමක් ශ්‍රී ලංකාවේ ඇති වත්කම් ඈවර කිරීම.

**497**. (1) දහතුන් වන උපලේඛනයෙහි දක්වා ඇති වෙනස් කිරීම් හා අත්හැරීම්වලට යටත්ව XII වන කොටසට අනුකූලව විදේශ සමාගමක් ශ්‍රී ලංකාවේ වත්කම් ගණන් බේරා වසා දැමීම සඳහා අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) විදේශ සමාගම —

(අ) ලියාපදිංචි කළ විදේශ සමාගමක් වුව ද, එසේ නැති වුව ද ;

(ආ) එය ශ්‍රී ලංකාවෙහි ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යාම නතර කර ඇති බවට 496 වන වගන්තිය යටතේ දැනුම් දී ඇති වුව ද, එසේ නැති වුව ද ;

(ඇ) වෙනත් යම් රටක නීති යටතේ හෝ එම නීති ප්‍රකාරව හෝ විසුරුවා හැර ඇති නැතහොත් සමාගමක් ලෙස පැවතීම අන්‍යාකාරයකින් නවතා ඇති සමාගමක් වුව ද නොවුව ද,

ඒ සමාගම විසින් (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

අනුකූලව ක්‍රියා නොකිරීම සඳහා දණ්ඩන.

**498**. මේ පනතේ මේ කොටස අදාළ වන යම් සමාගමක් විසින් 493 වන වගන්තිය හැර මේ කොටසෙහි විධිවිධාන අතරෙන් යම් විධිවිධානයකට අනුකූලව ක්‍රියාකිරීම පැහැර හරිනු ලබන අවස්ථාවක සමාගම ද දැන දැනම සහ ඕනෑකමින්ම ඒ පැහැර හැරීමට බලය දෙන හෝ අවසර දෙන සමාගමේ සෑම නිලධරයකුම හෝ අනුයෝජිතයකුමද වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබීමෙන් පසු රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

මේ කොටසේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීමට ඇති යුතුකම ඉටුකිරීම බලාත්මක කිරීම.

**499**. (1) යම් විදේශ සමාගමක් මේ පනතේ මේ කොටසෙහි යම් විධිවිධානයකට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබ, පැහැර හැරීම යථාවත් කරන ලෙස නියම කරනු ලබන දැන්වීමක් සමාගම වෙත භාරදුන් දින සිට වැඩ කරන දින දහයක් ඇතුළත එසේ කිරීම පැහැර හරිනු ලැබුවහොත්, රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ සමාගමේ යම් ණය හිමියකු විසින් හෝ සම්බන්ධතාවක් ඇතැයි අධිකරණයට පෙනී යන වෙනත් යම් තැනැත්තකු විසින් හෝ අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, අධිකරණය විසින් ආඥාවක් කිරීමෙන් ඒ ආඥාවෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි කාලයක් ඇතුළත, පැහැර හැරීම යථාවත් කරන ලෙස සමාගම හා සමාගමේ යම් නිලධරයකු වෙත නියම කරනු ලැබිය හැකි ය.

(2) ඉල්ලීම පිළිබඳ වූ හෝ ඊට ආනුෂංගික වූ සියලුම පිරිවැය සමාගම විසින් හෝ පැහැර හැරීමට වගකිව යුතු සමාගමේ යම් නිලධරයකු විසින් හෝ දැරිය යුතු යයි (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන ආඥාවකින් සැලැස්විය හැකි ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් යම් පැහැර හැරීමක් සම්බන්ධයෙන් සමාගමකට හෝ එහි නිලධරයන්ට හෝ දණ්ඩන පනවන යම් ප්‍රඥප්තියක් ක්‍රියාත්මක වීම කෙරෙහි ලා අගතියක් මේ වගන්තියේ සඳහන් කිසිවකින් සිදු නොවන්නේ ය.

## කොටස් විකිණීම හා විකිණීම සඳහා කොටස් අර්පණය කිරීම පිළිබඳ පරිසීමා

**500**. (1) ශ්‍රී ලංකාවෙන් පිටස්තරව සංස්ථාගත කරනු ලැබූ නැතහොත් සංස්ථාගත කිරීමට ඇති සාමාගමක් විසින් ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර ස්ථානයක් පිහිටුවා තිබුණ ද නොතිබුණ ද ඒ සමාගම සංස්ථාගත කරනු ලැබීමෙන් පසු ව්‍යාපාර ස්ථානයක් පිහිටුවනු ලබන්නේ වුව ද නොවුව ද දායකවීම සඳහා ඒ සමාගමේ කොටස් හෝ සෘණපත්‍ර අර්පණය කිරීමේ යම් සංස්ථා ප්‍රකාශයක් යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ නිකුත් කිරීම, සංසරණය කිරීම හෝ බෙදා හැරීම, එයට දින යොදා ඇත්නම් සහ,— සංස්ථා ප්‍රකාශයට දින යෙදීම සහ එහි ඇතුළත් විය යුතු විස්තර.

(අ) පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන් විස්තර එහි ඇතුළත් වන්නේ නම්, එනම් :—

(i) සමාගමේ සංයුතිය සමන්විත වන නැතහොත් අර්ථ නිරූපණය කරනු ලබන සාධනපත්‍රය ;

(ii) සමාගම සංස්ථාගත කරනු ලැබුවේ කවර ප්‍රඥප්ති මගින් හෝ කවර ප්‍රඥප්ති යටතේ ද නැතහොත් ප්‍රඥප්තියක බලය ඇති විධිවිධාන මගින් හෝ විධිවිධාන යටතේ ද ඒ ප්‍රඥප්ති හෝ විධිවිධාන ;

(iii) එම සාධන පත්‍රය, ප්‍රඥප්ති හෝ විධිවිධාන හෝ ඒවායේ පිටපත් ද ඒවා ඉංග්‍රීසි භාෂාවෙන් හෝ ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂාවෙන් හැර වෙනත් භාෂාවකින් වුවහොත් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන භාෂාවකින් වූ හා නියමිත ආකාරයෙන් සහතික කළ ඒවායේ පරිවර්තනයක් ද පරීක්ෂා කළ හැකි ශ්‍රී ලංකාවෙහි යම් ස්ථානයක ලිපිනයක් ;

(iv) සමාගම සංස්ථාගත කළ දිනය හා රට ;

(v) ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර ස්ථානයක් සමාගම විසින් පිහිටුවා තිබේද යන වග සහ එසේ පිහිටුවා තිබේ නම් ශ්‍රී ලංකාව තුළ වූ එහි ප්‍රධාන කාර්යාලයේ ලිපිනය ;

(ආ) මෙහි හතරවන උපලේඛනයේ I වන කොටසෙහි සඳහන් කාරණා ප්‍රකාශ කර ඇත්නම් හා III වන කොටසේ ඇතුළත් විධිවිධානවලට යටත්ව, එම උපලේඛනයේ II වන කොටසෙහි සඳහන් වාර්තා නිශ්චිතව දක්වන්නේ නම්,

මිස, නීත්‍යානුකූල නොවිය යුතු ය :

එසේ වුව ද, ව්‍යාපාරය ආරම්භ කිරීමට සමාගම විසින් හිමිකම් ලබා ඇති දින සිට අවුරුදු දෙකකට වැඩි කාලයකට පසු නිකුත් කරන ලද සංස්ථා ප්‍රකාශයක් සම්බන්ධයෙන් වූ විට (අ) ඡේදයේ (i) වන, (ii) වන සහ (iii) වන අනුඡේදයන්හි විධිවිධාන අදාළ නොවිය යුතු අතර, මේ උපවගන්තියේ කාර්ය සඳහා හතරවන උපලේඛනයේ I වන කොටස අදාළවීමේ දී ඒ උපලේඛනයේ I වන කොටසේ 3 වන ඡේදයේ ව්‍යවස්ථාවලිය පිළිබඳව කර ඇති සඳහන් කිරීම වෙනුවට සාමාගමේ සංස්ථාපනය පිළිබඳව වූ සඳහන් කිරීම ආදේශ කිරීමෙන් එම ඡේදය බලාත්මක කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (අ) ඡේදය හෝ (ආ) ඡේදය ප්‍රකාර පනවනු ලැබූ යම් නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම අත් හරින ලෙස යම් කොටස් හෝ සෘණ පත්‍ර ඉල්ලුම්කරුවකුට නියම කරනු ලබන හෝ එසේ අත්හැරීමට ඔහු බැඳීමකට යටත් කරනු ලබන හෝ යම් කොන්දේසියක් හෝ සංස්ථා ප්‍රකාශයෙහි විශේෂයෙන්ම සඳහන් කරනු නොලැබූ යම් ගිවිසුමක්, ලේඛනයක් හෝ කාරණයක් පිළිබඳව දැන්වීමකින් ඔහුට බලපෑමක් වනු ඇතැයි උද්දේශිත යම් කොන්දේසියක් අවලංගු විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් සමාගමක හෝ අභිප්‍රේත සමාගමක හෝ කොටස් හෝ සෘණ පත්‍ර හෝ සඳහා වූ ඉල්ලුම් පත්‍ර ආකෘතියක්, එය මේ කොටසට අනුකූල වූ සංස්ථා ප්‍රකාශයක් සමග නිකුත් කරනු ලැබුවහොත් ද එය ශ්‍රී ලංකාව තුළ නිකුත් කිරීම මේ පනතේ 501 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන කඩකිරීමක් නොවන්නේ නම් ද මිස, යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ යම් තැනැත්තකු වෙත නිකුත් කිරීම නීත්‍යානුකූල නොවන්නේ ය :

එසේ වුව ද, කොටස් හෝ සෘණ පත්‍ර සම්බන්ධයෙන් ප්‍රාරක්ෂක එකඟවීමකට ඇතුළත් වන ලෙස යම් තැනැත්තකුට සද්භාවයෙන් කරන ලද ආරාධනාවක් සම්බන්ධයෙන් ඒ ඉල්ලුම්පත්‍ර ආකෘතිය නිකුත් කරනු ලැබූ බව පෙන්වනු ලැබුවහොත්, මේ උපවගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදවලින් පනවන ලද යම් නියමයන් අනුව ක්‍රියා නොකරන හෝ ඒ නියමයන් කිසිවක් කඩකරන හෝ අවස්ථාවක —

(අ) අනාවරණය කරනු නොලැබූ යම් කරුණක් සම්බන්ධයෙන් වන විට ඒ ගැන දැනුමක් තමාට නොතිබූ බව ඔහු විසින් ඔප්පු කරනු ලැබුවහොත් ; හෝ

(ආ) ඒ අනුව ක්‍රියා නොකිරීම හෝ කඩකිරීම තමා සද්භාවයෙන් කරුණු වරදවා තේරුම් ගැනීමෙන් උද්ගත වූ බව ඔහු විසින් ඔප්පු කරනු ලැබුවහොත් ; හෝ

(ඇ) ඒ අනුව ක්‍රියා නොකිරීම හෝ කඩකිරීම හෝ ඒ නඩුව සම්බන්ධයෙන් කටයුතු කරන අධිකරණයේ මතය අනුව නොවැදගත් වන හෝ නඩුවට සම්බන්ධ සියලු අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගැනීමෙන් පසු අධිකරණයේ මතය අනුව සාධාරණ ලෙස සමා කළ යුතු වූ හෝ කරුණු වුවහොත්,

එසේ ක්‍රියා නොකිරීම හෝ කඩකිරීම හේතුකොට ගෙන, සංස්ථා ප්‍රකාශය නිකුත් කිරීම පිළිබඳව වගකිව යුතු අධ්‍යක්ෂවරයකු හෝ වෙනත් තැනැත්තකු යම් බැඳීමකට යටත් නොවිය යුතු ය :

එසේ වුව ද, මෙහි හතරවන උපලේඛනයේ 17 වන ඡේදයෙහි ඇතුළත් කාරණා සම්බන්ධයෙන් වූ ප්‍රකාශයක්, සංස්ථා ප්‍රකාශයක ඇතුළත් කිරීම පැහැර හැරියහොත්, අනාවරණය කරනු නොලැබූ කාරණා ගැන කිසිම අධ්‍යක්ෂවරයකු හෝ වෙනත් තැනැත්තකු දැන සිටි බව ඔප්පු කරනු ලැබුවහොත් මිස පැහැර හැරීම සම්බන්ධයෙන් ඔහු යම් බැඳීමකට යටත් නොවිය යුතු ය.

(5) මේ වගන්තියේ විධිවිධාන —

(අ) වෙනත් තැනැත්තන්ගේ වාසියට අත්හැරීමේ අයිතිය කොටස් හෝ ණය පත්‍ර ඉල්ලුම්කරුවකු සතුව ඇතත් නැතත් සමාගමේ කොටස් හෝ ණය පත්‍ර සම්බන්ධ සංස්ථා ප්‍රකාශයක් හෝ ඉල්ලුම් පත්‍ර ආකෘතියක් හෝ සමාගමේ සිටින සාමාජිකයන් වෙත හෝ ණය පත්‍ර දරන්නන් වෙත නිකුත් කිරීම සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය ; තව ද

(ආ) සංස්ථා ප්‍රකාශයකට දිනය යෙදීමට නියමව ඇති තාක් ප්‍රමාණයට හැර, කලින් නිකුත් කරන ලද කොටස් හෝ ඝෘණ පත්‍රවලට සෑම අතින් ම සමරූප වන හෝ සමරූප වීමට ඇති කොටස් හෝ ඝෘණ පත්‍ර සම්බන්ධ සංස්ථා ප්‍රකාශයක් නිකුත් කිරීම සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

එහෙත් සමාගමක් පිහිටුවීමේ දී හෝ පිහිටුවීම සම්බන්ධයෙන් හෝ නිකුත් කරනු ලැබුව ද නැතහොත් තදනන්තරව නිකුත් කරනු ලැබුව ද, සංස්ථා ප්‍රකාශයකට හෝ ඉල්ලීම් ආකෘතියකට, ඉහත කී ආකාරයට යටත් ව මේ වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

(6) මේ වගන්තිය හැර, මේ පනතේ විධිවිධාන යටතේ යම් තැනැත්තකු විසින් දරනු ලැබිය හැකි යම් වගකීමක්, මේ වගන්තියේ සඳහන් කිසිවක් නිසා සීමා කරනු නොලැබිය යුතු ය ; නැතහොත් අඩු කරනු නොලැබිය යුතු ය.

විශේෂඥයන්ගේ කැමැත්ත සහ විභජනය පිළිබඳ වූ විධිවිධාන.

**501**. (1) ශ්‍රී ලංකාවෙන් පිටස්තරව සංස්ථාගත කරනු ලැබූ නැතහොත් සංස්ථාගත කිරීමට ඇති සමාගමක් විසින් ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර ස්ථානයක් පිහිටුවා තිබුණ ද නොතිබුණ ද, ඒ සමාගම සංස්ථාගත කරනු ලැබූ පසු පිහිටුවන්නේ වුව ද නොවූව ද, එහි දායක කොටස් හෝ ඝෘණ පත්‍ර සඳහා අර්පණය කිරීමේ යම් සංස්ථා ප්‍රකාශයක්, යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ නිකුත් කිරීම, සංසරණය කිරීම හෝ බෙදා හැරීම —

(අ) විශේෂඥයකු විසින් කරන ලද බව හැඟවෙන ප්‍රකාශයක් සංස්ථා ප්‍රකාශයට ඇතුළත් අවස්ථාවක, එම ප්‍රකාශය ඇතුළත් කර ඇති ආකාරයට හා සන්දර්භය අනුව එය ඇතුළත් කර සංස්ථා ප්‍රකාශය නිකුත් කිරීම සම්බන්ධයෙන් ඔහුගේ ලිඛිත කැමැත්ත දී නැත්නම් හෝ සංස්ථා ප්‍රකාශය ලියාපදිංචි කිරීම සඳහා භාරදීමට පෙර එම කැමැත්ත ඉල්ලා අස්කර ගෙන ඇත්නම්, හෝ ඉහත කී පරිදි ඔහුගේ කැමැත්ත දී ඇති බවට සහ ඉල්ලා අස්කර ගෙන නැති බවට වූ ප්‍රකාශයක් සංස්ථා ප්‍රකාශයෙහි නොදැක්වේ නම් ; හෝ

(ආ) සංස්ථා ප්‍රකාශයක් ප්‍රකාර ඉල්ලීමක් කරන අවස්ථාවක, 47 වන වගන්තියේ දණ්ඩන විධිවිධාන නොවන විධිවිධාන වලින් ඊට අදාළ කළ හැකිතාක්දුරට, අදාළ සියලු තැනැත්තන් බැඳීමට යටත් කිරීමේ බලපෑම ඒ සංස්ථා ප්‍රකාශයේ නැත්නම්,

නීත්‍යානුකූල නොවිය යුතු ය.

(2) මේ වගන්තියේ, "විශේෂඥයා" යන යෙදුමට ඉංජිනේරුවකු, තක්සේරුකරුවකු, ගණකාධිකාරීවරයකු සහ තමා කරන ප්‍රකාශයට තමාගේ වෘත්තීය නිසා බලය ලැබෙන වෙනත් යම් තැනැත්තකු ඇතුළත් වන අතර, ප්‍රකාශයක්, සංස්ථා ප්‍රකාශයක අඩංගු නම් හෝ එම සංස්ථා ප්‍රකාශයේ ම ඇති හෝ යොමු කිරීමෙන් ඊට සම්බන්ධ කර ඇති හෝ එය සමග නිකුත් කර ඇති යම් වාර්තාවක හෝ සංදේශයක අඩංගු නම් හෝ එම ප්‍රකාශය එම සංස්ථා ප්‍රකාශයේ ඇතුළත් කර ඇති ලෙස මේ වගන්තියේ කාර්යය සඳහා සලකනු ලැබිය යුතු ය.

සංස්ථා ප්‍රකාශය ලියාපදිංචි කිරීම.

**502**. ශ්‍රී ලංකාවෙන් පිටස්තරව සංස්ථාගත කරනු ලැබූ නැතහොත් සංස්ථාගත කිරීමට ඇති සමාගමක් විසින් ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර ස්ථානයක් පිහිටුවා තිබුණ ද නොතිබුණ ද ඒ සමාගම සංස්ථාගත කරනු ලැබීමෙන් පසු ව්‍යාපාර ස්ථානයක් පිහිටුවනු ලබන්නේ වුව ද නොවුව ද දායක වීම සඳහා ඒ සමාගමේ කොටස් හෝ ණය පත්‍ර අර්පණය කිරීමේ යම් සංස්ථා ප්‍රකාශයක්, ශ්‍රී ලංකාව තුළ නිකුත් කිරීමට, සංසරණය කිරීමට හෝ බෙදා හැරීමට පෙර, කළමනාකාර මණ්ඩලයේ යෝජනා සම්මතයක් මගින් අනුමත කරනු ලැබූ බව සමාගමේ සභාපති විසින් සහතික කරනු ලැබූ සංස්ථා ප්‍රකාශයෙහි පිටපතක් භාර දෙනු ලැබුවහොත් ද —

(අ) 501 වන වගන්තියේ විධිවිධානවලින් නියම කර ඇති පරිදි සංස්ථා ප්‍රකාශය නිකුත් කිරීම සඳහා වූ යම් කැමැත්තක් ; සහ

(ආ) මෙහි හතරවන උපලේඛනයේ II වන කොටසට අනුකූලව යම් වාර්තාවක් සපයන තැනැත්තන් විසින් එම උපලේඛනයේ 30 වන ඡේදයේ සඳහන් පරිදි වූ යම් යථාවක් කිරීම් එහි කර තිබෙන හෝ හේතු නොදක්වා එහි සඳහන් කර තිබෙන අවස්ථාවක, එබඳු යම් යථාවත් කිරීම් දැක්වෙන සහ ඊට හේතු සඳහන් වන, ඒ තැනැත්තන් විසින් අත්සන් කරනු ලැබූ ලිඛිත ප්‍රකාශයක්,

එහි පිටසන් කර හෝ එහි පිටපතට අමුණා ඇත්නම් ද මිස, ඒ සංස්ථා ප්‍රකාශය යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ නිකුත් කිරීම, සංසරණය කිරීම හෝ බෙදා හැරීම නීත්‍යානුකූල නොවිය යුතු ය.

500 වන වගන්තිය, 501 වන වගන්තිය හෝ 502 වන වගන්තිය කඩ කිරීම වෙනුවෙන් දණ්ඩන.

**503**. 500 වන වගන්තියේ, 501 වන වගන්තියේ හෝ 502 වන වගන්තියේ යම් විධිවිධානයක් කඩකරමින් යම් සංස්ථා ප්‍රකාශයක් නිකුත් කිරීමට, සංසරණය කිරීමට හෝ බෙදා හැරීමට නැතහොත් කොටස් හෝ ණය පත්‍ර සඳහා ඉල්ලුම් කිරීමේ ආකෘතියක් නිකුත් කිරීමට දැනුවත්වම වගකිව යුතු යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබීමෙන් පසු රුපියල් පනස් පන්දහසක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

සංස්ථා ප්‍රකාශයක වැරදි ප්‍රකාශ කිරීම ගැන සිවිල් වගකීම.

**504**. ශ්‍රී ලංකාවෙන් පිටස්තරව සංස්ථාගත කරනු ලැබූ නැතහොත් සංස්ථාගත කිරීමට ඇති සමාගමක් විසින් ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර ස්ථානයක් පිහිටුවා තිබුණ ද නොතිබුන ද ඒ සමාගම සංස්ථාගත කරනු ලැබූ පසු පිහිටුවන්නේ වුව ද නොවුව ද දායකවීම සඳහා එහි කොටස් හෝ සෘණ පත්‍ර අර්පණය කරනු ලබන සෑම සංස්ථා ප්‍රකාශයකට ම, මේ පනතේ 38 වන වගන්තිය ගැන කර ඇති යම් සඳහන් කිරීමක් වෙනුවට මේ පනතේ 501 වන වගන්තිය ගැන වූ සඳහන් කිරීමක් ආදේශ කරනු ලැබීමෙන් පසු මේ පනතේ 41 වන වගන්තියේ විධිවිධාන අදාළ වන්නේ ය.

සංස්ථා ප්‍රකාශ සම්බන්ධ විධිවිධාන අර්ථ නිරූපණය කිරීම.

**505** (1) ශ්‍රී ලංකාවෙන් පිටස්තරව සංස්ථාගත කරනු ලැබූ සමාගමක් මේ පනතේ අර්ථානුකූල වූ සමාගමක් වන අවස්ථාවක, ඒ සමාගමේ කොටස් හෝ සෘණ පත්‍ර විකිණීම සඳහා මහජනයා වෙත අර්පණය කිරීමේ යම් ලේඛනයක්, 43 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර සමාගම විසින් නිකුත් කරනු ලැබූ සංස්ථා ප්‍රකාශයක් ලෙස සලකනු ලැබූ අවස්ථාවක, මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා, ඒ ලේඛනය සමාගම විසින් නිකුත් කරනු ලැබූ සංස්ථා ප්‍රකාශයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) ප්‍රධානියා ලෙස වුව හෝ අනුයෝජිතයකු ලෙස වුව හෝ කොටස් හෝ සෘණ පත්‍ර මිලට ගැනීම හෝ විකිණීම ස්වකීය සාමාන්‍ය ව්‍යාපාරය කරගත් යම් තැනැත්තකු වෙත දායකවීම හෝ විකිණීම සඳහා කොටස් හෝ සෘණ පත්‍ර අර්පණය කිරීමක්, මේ කොටසේ කාර්ය සඳහා මහජනයා වෙත අර්පණය කිරීමක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

(3) මේ කොටසෙහි "සංස්ථා ප්‍රකාශය", "කොටස්" සහ "සෘණ පත්‍ර" යන යෙදුම්වලට මේ පනත යටතේ සංස්ථාගත කරනු ලැබූ සමාගමක් සම්බන්ධයෙන් යෙදුනු ආකාරයට හා යෙදුනු විට ඒවාට දී ඇති අර්ථය ම ඇත්තේ ය.

XIX වන කොටස

## උපදේශක කොමිෂන් සභාව

උපදේශක කොමිෂන් සභාව පත්කිරීම ආදිය.

**506**. (1) සමාගම්වලට අදාළ නීතිය පිළිබඳව යම් කාරණයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීමේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් —

(අ) යෝග්‍ය සුදුසුකම් ඇති පස්දෙනකුට නොඅඩු සහ දහදෙනකුට නොවැඩි තැනැත්තන් සංඛ්‍යාවකින් සමන්විත (මෙහි මින් මතු "උපදේශක කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) කොමිෂන් සභාවක් සංස්ථාපනය කරනු ලැබිය හැකි ය ; සහ

(ආ) ඒ තැනැත්තන්ගෙන් එක් අයෙකු එකී උපදේශක කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය හැකි ය.

(2) උපදේශක කොමිෂන් සභාවේ කාර්ය පහත දැක්වෙන පරිදි විය යුතු ය :—

(අ) අමාත්‍යවරයා විසින් කලින් කල එය වෙත යොමු කරනු ලබන, සමාගම් පිළිබඳ සහ සමාගම්වලට අදාළ වූ නීතිය පිළිබඳ යම් කාරණාවක් නැතහොත් ප්‍රශ්ණයක් ගැන විමසා බලා අමාත්‍යවරයාට වාර්තා කිරීම ;

(ආ) සමාගම්වලට අදාළ නීතිය කලින් කල සමාලෝචනය කොට, ඒ නීතිය වෙනස් කිරීම, සුළුවෙන් වෙනස් කිරීම හෝ ඊට එකතු කිරීම සඳහා වූ යෝජනා අමාත්‍යවරයාට ඉදිරිපත් කිරීම ;

(ඇ) (අ) හෝ (ආ) ඡේදවල සඳහන් නිර්දේශ කිරීමේ දී, අවශ්‍යයයි උපදේශක කොමිෂන් සභාව සළකන අවස්ථාවල, වෙළෙඳ මණ්ඩල, වෘත්තිය සංවිධාන, මුදල් ආයතන, ආණ්ඩුවේ අධිකාර සහ පොදු මහජනයා විමසා ඔවුන්ගේ අදහස් සැලකිල්ලට ගැනීම.

(3) රෙජිස්ට්‍රාර්වරයා නිලබලයෙන්, උපදේශක කොමිෂන් සභාවේ සාමාජිකයකු විය යුතු අතර, එහි කැඳවුම්කරු හා ලේකම් ලෙස ද ක්‍රියා කල යුතු ය.

(4) (6), (7) සහ (8) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, උපදේශක කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ ධුර කාලය අවුරුදු තුනක් විය යුතු ය :

එසේ වුව ද ඉල්ලා අස්වන්නා වූ හෝ ඉවත් කරනු ලබන්නා වූ හෝ අන්‍යාකාරයකින් සිය ධුරය හිස් කරන්නා වූ සාමාජිකයකු වෙනුවට පත් කරනු ලබන සාමාජිකයකු විසින්, තමා අනුප්‍රාප්ත වූයේ කවර සාමාජිකයකුගේ ධුරයට ද ඒ සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉතිරි වී ඇති කොටස සඳහා ධුරය දරනු ලැබිය යුතු ය.

(5) කාලය ඉකුත්වීම නිසා සිය ධුරය හිස් කරන උපදේශක කොමිෂන් සභාවේ යම් සාමාජිකයෙක් නැවත පත් කිරීම සඳහා සුදුස්සෙක් වන්නේ ය.

(6) තත්කාර්ය සඳහා අමාත්‍යවරයා අමතන ලිපියක් මගින්, උපදේශක කොමිෂන් සභාවේ සාමාජිකයකු විසින් සිය ධුරයෙන් ඉල්ලා අස්වීම කරනු ලැබිය හැකි ය.

(7) උපදේශක කොමිෂන් සභාවේ සියලු සාමාජිකයන් යහපත් කල් ක්‍රියාවෙන් සිටින තාක් කල් ධුර දැරිය යුතු අතර, අමාත්‍යවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(8) රෝගාතුරවීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා සාමාජිකයකුට එම ධුරයේ කාර්ය ඉටුකිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඔහු හෝ ඇය වෙනුවට, සාමාජිකයකු ලෙස ක්‍රියා කිරීමට අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(9) මේ පනතේ මේ කොටස යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීමෙහි ලා උපදේශක කොමිෂන් සභාවට සහාය වීමට යෝග්‍ය යයි කොමිෂන් සභාව සලකන නිලධරයන් සහ සේවකයන් අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව උපදේශක කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය හැකි ය.

(10) උපදේශක කොමිෂන් සභාවේ සාමාජිකයන්ට, එහි ලේකම්ට සහ වෙනත් නිලධරයන්ට හා සේවකයන්ට අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික අරමුදලින් ගෙවිය හැකි ය.

XX වන කොටස

සමාගම් ආරාවුල් මණ්ඩලය

සමාගම් ආරාවුල් මණ්ඩලය.

**507**. (1) මේ පනතේ මේ කොටසේ විධිවිධාන මගින් මණ්ඩලය වෙත පවරනු ලබන කර්තව්‍ය ඉටු කිරීමේ කාර්ය සඳහා (මේ පනතේ "සමාගම් ආරාවුල් මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) මණ්ඩලයක් අමාත්‍යවරයා විසින් සංස්ථාපනය කරනු ලැබිය හැකි ය.

(2) සමාගම්වලට අදාළ නීතිය සම්බන්ධයෙන් හෝ සමාගම් පරිපාලනය සම්බන්ධයෙන් සැහෙන පළපුරුද්දක් සහිත, අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන තැනැත්තන් තුන්දෙනකුට නොඅඩු සහ පස්දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින්, සමාගම් ආරාවුල් මණ්ඩලය සමන්විත විය යුතු ය.

(3) සමාගම් ආරාවුල් මණ්ඩලයේ සාමාජිකයන් අතරින් එක් සාමාජිකයකු මණ්ඩලයේ සභාපතිවරයා ලෙස අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(4) (6), (7) සහ (8) උපවගන්තිවල විධිවිධානවලට යටත්ව සමාගම් ආරාවුල් මණ්ඩලයේ සාමාජිකයන්ගේ ධුරකාලය අවුරුදු පහක් විය යුතු ය :

එසේ වුව ද, ඉල්ලා අස්වන්නා වූ හෝ ධුරයෙන් ඉවත් කරනු ලබන්නා වූ හෝ අන්‍යාකාරයකින් සිය ධුරය අත්හරින්නා වූ සාමාජිකයකු වෙනුවට පත් කරනු ලබන සාමාජිකයකු විසින් තමා අනුප්‍රාප්ත වූයේ කවර සාමාජිකයකුගේ ධුරයට ද ඒ සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉතිරි වී ඇති කොටස සඳහා පමණක් ධුරය දරනු ලැබිය යුතු ය.

(5) කාලය ඉකුත්වීම නිසා ධුරය හිස් කරන සමාගම් ආරාවුල් මණ්ඩලයේ යම් සාමාජිකයකු නැවත පත්කිරීම සඳහා සුදුස්සෙක් වන්නේ ය.

(6) තත්කාර්ය සඳහා අමාත්‍යවරයා ඇමතූ ලිපියක් මගින්, සමාගම් ආරාවුල් මණ්ඩලයේ සාමාජිකයකු විසින් සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(7) සමාගම් ආරාවුල් මණ්ඩලයේ සාමාජිකයකු යහපත් කල්ක්‍රියාවෙන් සිටින තාක් කල් සිය ධුරය දැරිය හැකි අතර, අමාත්‍යවරයා විසින් ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(8) රෝගාතුරවීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා තාවකාලිකව සිය ධුරයේ කාර්ය ඉටුකිරීමට සාමාජිකයකුට නොහැකි වන අවස්ථාවක ඔහු වෙනුවට, සාමාජිකයකු ලෙස ක්‍රියා කිරීමට අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තකු පත්කරනු ලැබිය හැකි ය.

(9) මේ පනතේ මේ කොටස යටතේ ස්වකීය කාර්ය ඉටුකිරීමෙහි ලා සමාගම් ආරාවුල් මණ්ඩලයට සහායවීමට යෝග්‍යයයි මණ්ඩලය සලකන නිලධරයන් සහ සේවකයන්, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව සමාගම් ආරාවුල් මණ්ඩලය විසින් පත් කරනු ලැබිය හැකි ය.

(10) සමාගම් ආරාවුල් මණ්ඩලයේ සාමාජිකයන්ට සහ එහි නිලධරයන්ට සහ සේවකයන්ට අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

මණ්ඩලයේ සාමාජිකයන් විසින් ආරාවුල් සමථයකට පත්කළ හැකි බව.

**508**. (1) (අ) මේ පනතේ විධිවිධාන බලාත්මක කිරීමේ දී පැන නගින ; හෝ

(ආ) යම් සමාගමක කටයුතුවලට හෝ එහි කළමනාකරණයට අදාළ

ආරාවුලකට පාර්ශ්වකරුවන් වන තැනැත්තන් විසින් සමාගම් ආරාවුල් මණ්ඩලයේ සභාපතිවරයාගේ අනුමතය ඇතිව එම ආරාවුල සමථයකට පත්කිරීම සඳහා මණ්ඩලයේ සාමාජිකයකු වෙත යොමු කරනු ලැබිය හැකි ය.

(2) යම් අධිකරණයක් ඉදිරියේ විභාග වෙමින් පවතින නඩු කටයුත්තක් සමාගම් ආරාවුල් මණ්ඩලය වෙත යොමු කිරීම සුදුසු යයි අධිකරණය විසින් සලකනු ලබයි නම් එම නඩු කටයුත්තේ සියලුම පාර්ශ්වකරුවන්ගේ කැමැත්ත ඇතිව අධිකරණය විසින් එම නඩු කටයුත්ත සමථයකට පත්කිරීම සඳහා සමාගම් ආරාවුල් මණ්ඩලයේ සාමාජිකයකු වෙත යොමු කරනු ලැබිය හැකි ය. සමථයක් එළඹෙන තුරු හෝ සමථයට පත්කිරීම සමථයකින් අවසන් වී නොමැති බවට මණ්ඩලය විසින් අධිකරණය වෙත දැන්වීමක් මගින්, දැනුම් දෙන තුරු නඩු කටයුත්ත අත්හිටුවනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ සමථයකට පත්කිරීම සඳහා යොමුකරනු ලැබූ ආරාවුලකට හෝ නඩු කටයුත්තකට පාර්ශ්වකරුවන් එම ආරාවුල හෝ නඩු කටයුත්ත සමථයකට පත්කිරීම සඳහා එකඟ වන අවස්ථාවක —

(අ) එම සමථයට පත්කිරීමේ එකඟත්වය ලිඛිතව සඳහන් කොට පාර්ශ්වකරුවන් විසින් ද, සමථකරු වශයෙන් ක්‍රියා කළ මණ්ඩලයේ සාමාජිකයා විසින් ද අත්සන් තැබිය යුතු ය ; තව ද

(ආ) සමථයට පත්කිරීමේ එකඟත්වයේ සහතික පිටපතක් අධිකරණය වෙත ගොනු කරනු ලැබිය යුතු අතර, එය අධිකරණයේ නඩු තීන්දුවක් ලෙස බලාත්මක විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ සමථයට පත්කිරීම සඳහා යොමු කරනු ලැබූ යම් ආරාවුලක දී නඩු කටයුතු පවත්වාගෙන යාම සඳහා වූ කාර්ය පටිපාටිය නියම කරමින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(5) මේ වගන්තිය යටතේ සමථයකට පත්කිරීම සඳහා යොමු කරනු ලැබූ ආරාවුලකට හෝ නඩු කටයුත්තකට පාර්ශ්වකරුවන් වූ තැනැත්තන් එසේ සමථයකට පත්කිරීම සඳහා යොමු කොට මාස තුනක් ඇතුළත හෝ සියලුම පාර්ශ්වකරුවන් විසින් එකඟ වූ දීර්ඝ කරන ලද යම් කාලසීමාවක් ඇතුළත එම ආරාවුල හෝ නඩු කටයුත්ත සමථයට පත් කිරීම සඳහා එකඟ නොවන අවස්ථාවක, මණ්ඩලයේ සාමාජිකයකු විසින් යොමු කිරීම සමථයකට පත් කිරීමෙන් අවසන් වී නොමැති බවට—

(අ) පාර්ශ්වයන්ට ; සහ

(ආ) එම කරුණ සමථයට පත්කිරීම සඳහා යොමු කරනු ලැබුවේ අධිකරණය විසින් නම්, එම අධිකරණය වෙත,—

වහාම දැනුම් දිය යුතු ය.

**509**. සමාගම් ආරාවුල් මණ්ඩලයේ සාමාජිකයකු ඉදිරිපිට පැවැත්වෙන සමථයට පත්කිරීමේ පරීක්ෂණයක හෝ එවැනි පරීක්ෂණයකට අදාළව කරනු ලබන සියලු ප්‍රකාශ —

සමථයට පත් කිරීමේ කටයුතු සම්බන්ධයෙන් වරප්‍රසාද.

(අ) සමථයට පත්කිරීම සඳහා යොමු කරනු ලැබූ ආරාවුල හෝ නඩු කටයුත්ත සමථයට පත්කිරීමේ කාර්ය සඳහා සිදුකරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ආ) සමථයට අදාළ සියලුම පාර්ශ්වකරුවන්ගේ කැමැත්ත නොමැතිව සමථයට අදාළ පාර්ශ්වකරුවන්ට සහ ඔවුන්ගේ නීති උපදේශකයන්ට හැර වෙනත් කිසිම තැනැත්තකුට හෙළි කරනු නොලැබිය යුතු ය ;

(ඇ) සමථයට අදාළ සියලු පාර්ශ්වකරුවන්ගේ එකඟත්වය නොමැතිව යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී ආවේශ්‍ය කරනු නොලැබිය යුතු ය.

**510**. (1) 508 වන වගන්තිය යටතේ සමථයකට පත්කිරීම සඳහා යම් කරුණක් යොමු කරනු ලැබූ අවස්ථාවක උපචිත වූ සමථ ගාස්තු සහ මණ්ඩලයේ සභාපතිවරයා සහ සමථයට අදාළ පාර්ශ්වකරුවන් අතර එකඟ වූ යම් ගාස්තු ද සම්බන්ධයෙන් යම් මුදලක් සමාගම් ආරාවුල් මණ්ඩලය වෙත පාර්ශ්වකරුවන් විසින් ගෙවනු ලැබිය යුතු ය. පටහැනිව ඇති යම් ගිවිසුමකට යටත්ව, පාර්ශ්වකරුවන් විසින්, ගෙවිය යුතු සමථ ගාස්තු සහ ගාස්තු සමව දැරිය යුතු ය.

සමථය සම්බන්ධයෙන් ගෙවිය යුතු ගාස්තු.

(2) (3) වන උපවගන්තියට යටත්ව මේ වගන්තිය යටතේ ගෙවිය යුතු සියලු මුදල් මේ පනත යටතේ පිහිටුවනු ලැබූ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) සමථයක් සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ ගෙවිය යුතු යම් ගාස්තුවක සම්පූර්ණ මුදල හෝ ඉන් යම් කොටසක් සමථකරු වශයෙන් ක්‍රියාකළ මණ්ඩලයේ සාමාජිකයා වෙත මණ්ඩලය විසින් ගෙවනු ලැබිය යුතු බවට සභාපතිවරයා විසින් විධාන කරනු ලැබිය හැකි ය.

## XXI වන කොටස

## වැරදි

### විවිධ වැරදි

අසත්‍ය ප්‍රකාශ සඳහා දණ්ඩනය.

**511**. මේ පනතින් නියමිත හෝ මේ පනතේ කාර්ය සඳහා වූ හෝ යම් වාර වාර්තාවක, වාර්තාවක, සහතිකයක, ශේෂ පත්‍රයක හෝ වෙනත් ලේඛනයක යම් තැනැත්තකු විසින් ඕනෑකමින්ම යම් වැදගත් කාරණයක් විෂයයෙහි අසත්‍ය බව දැන දැනම අසත්‍ය ප්‍රකාශයක් කරන අවස්ථාවක, ඔහු වරදකට වරදකරු වන අතර එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දශ ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ පස් අවුරුද්දකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය.

වාර්තා කූට ලෙස වෙනස් කිරීම සඳහා දණ්ඩනය.

**512**. (1) තැනැත්තකුට වංචාකිරීමේ හෝ ඔහු රැවටීමේ අදහසින්–

(අ) සමාගමකට අයත් හෝ එම සමාගමට අදාළ හෝ යම් රෙජිස්ටරයක්, ගිණුම් වාර්තාවක්, පොතක්, පත්‍රයක් හෝ වෙනත් ලේඛනයක් විනාශ කරන, ඉවතලන, විකෘති කරන, වෙනස් කරන හෝ කූට ලෙස වෙනස් කරන හෝ එසේ විනාශ කිරීමට, විකෘති කිරීමට, වෙනස් කිරීමට හෝ කූට ලෙස වෙනස් කිරීමට පාර්ශ්වකරුවකු වන ; හෝ

(ආ) සමාගමකට අයත් හෝ සමාගමකට අදාළ හෝ යම් රෙජිස්ටරයක, ගිණුම් වාර්තාවක, පොතක, පත්‍රයක හෝ වෙනත් ලේඛනයක ව්‍යාජ සටහනක් කරන හෝ ව්‍යාජ සටහනක් කිරීමට පාර්ශ්වකරුවකු වන යම් තැනැත්තකු,

වරදකට වරදකරු විය යුතු අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දශලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු 5 ක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට නැතහොත් එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම ඔහු යටත් විය යුතු ය.

**513**. "සීමාසහිත" යන වචනය හෝ ඒ වචනයේ යම් සංක්ෂේප කිරීමක් නැතහොත් අනුකරණයක් අවසානයට යෙදූ යම් නාමයක් හෝ අභිධානයක් යටතේ යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් ව්‍යාපාරයක් පවත්වාගෙන යාම හෝ වෙළෙඳාමක් කිරීම කරන අවස්ථාවක, එහි වගකීම සීමාසහිත බවට විධිමත් ලෙස සංස්ථාගත කර ඇතහොත් මිස, ඒ තැනැත්තා හෝ තැනැත්තන් වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබීමෙන් පසු රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට ඒ තැනැත්තා හෝ තැනැත්තන් යටත් විය යුතු ය.

"සීමාසහිත" යන වචන අනිසි ලෙස භාවිත කිරීමට දණ්ඩනය.

### වරදවල් පිළිබඳ සාමාන්‍ය විධිවිධාන

**514**. (1) යම් ගිණුමක්, ලේඛනයක් හෝ වාර වාර්තාවක් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරන ලෙස හෝ භාරදෙන ලෙස හෝ යවන ලෙස නැතහොත් යම් කාරණයක් සම්බන්ධයෙන් ඔහු වෙත දැන්වීමක් කරන ලෙස නියම කෙරෙන මේ පනතේ යම් විධිවිධානයක් අනුව කටයුතු කිරීමෙහි ලා යම් සමාගමක් විසින් පැහැර හැරීමක් කොට, ඒ පැහැර හැරීම හේතුකොටගෙන මේ පනත යටතේ වරදක් කරනු ලැබූ අවස්ථාවක, ඒ වරද සම්බන්ධයෙන් සමාගමකට හෝ සමාගමේ යම් නිලධරයකුට විරුද්ධව අධිකරණයක නඩුකටයුතු පැවරීම හෝ එවකටත් නඩු කටයුතු පවරනු ලැබ ඇත්නම්, ඒ නඩු කටයුතු පවත්වාගෙන යෑම හෝ වෙනුවට, රෙජිස්ට්‍රාර්වරයා විසින් මැනවැයි අදහස් කරන්නේ නම්, වරද සමථයකට පත් කිරීමෙහි ලා යෝග්‍ය යයි සිතිය හැකි මුදලක් සමාගමෙන් හෝ ඒ නිලධරයාගෙන් භාරගනු ලැබිය හැකි ය ; එසේ භාරගනු ලැබූ යම් මුදලක් මේ පනත යටතේ පිහිටුවන ලද අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

ඇතැම් වරදවල් සමථයට පත් කිරීම.

(2) යම් වරදක් සමථයට පත් කිරීමෙහි ලා (1) වන උපවගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් යම් මුදලක් භාරගනු ලැබූ අවස්ථාවක, ඒ වරද සම්බන්ධයෙන් සමාගමට හෝ සමාගමේ යම් නිලධරයකුට හෝ විරුද්ධව නඩු කටයුතු ඉදිරිපත් නොකළ යුතු ය ; නැතහොත් එවකටත් නඩු කටයුතු ඉදිරිපත් කරනු ලැබ ඇත්නම්, එය පවත්වාගෙන නොයා යුතු ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ යම් වරදක් සමථයකට පත් කරනු ලැබීමේ දී ගෙවිය යුතු යම් මුදල් ප්‍රමාණයක්, ගෙවීම සඳහා රෙජිස්ට්‍රාර්වරයා විසින් නියම කරනු ලැබූ දින සිට මාසයක කාලයක්

ඇතුළත හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් ඉඩ දෙනු ලැබිය හැකි දීර්ඝ කරන ලද කාලය ඇතුළත හෝ නොගෙවා තිබෙන අවස්ථාවක, ඒ ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයා විසින් මහෙස්ත්‍රාත්වරයකුට වාර්තා කරනු ලැබිය හැකි ය. ඒ නොගෙවා පැහැර හැරීම සම්බන්ධයෙන් වූ ඒ මුදල් ප්‍රමාණය අධිකරණයක් විසින් නියම කරන ලද දඩමුදලක් මෙන් සලකා සමාගමෙන් හෝ සමාගමේ යම් නිලධරයකුගෙන් අයකරගත යුතු අතර, නොගෙවා පැහැර හැර ඇති මුදල අරමුදලට බැර කරන ලෙස ඒ අධිකරණය විසින් විධාන කරනු ලැබිය යුතු ය.

ලඝු වශයෙන් විභාග කළ හැකි වරදවල්.

**515**. පටහැනිව වෙනත් යම් නීතියක කුමක් සඳහන් වුව ද, මේ පනත යටතේ දඬුවම් කළ හැකි සියලු වැරදි මහෙස්ත්‍රාත්වරයකු විසින් ලඝු කාර්ය පරිපාටිය අනුව විභාග කරනු ලැබිය හැකි ය.

දඩමුදල් පැනවීම හා යෙදවීම.

**516**. (1) මේ පනත යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් අධිකරණයක් විසින් දඩයක් නියම කිරීම, ඒ දඩය අධිකරණයේ සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී නියම කරනු ලැබිය හැකි දඩමුදල ඉක්මවන්නේ වුව ද, කරනු ලැබිය හැකි ය.

(2) මේ පනත යටතේ යම් දඩයක් නියම කරන අධිකරණය විසින් නඩු කටයුතුවල වියදම් ගෙවීමෙහි ලා නැතහොත් ගෙවීම් සඳහා හෝ දඩය අයකර ගැනීමට ඉවහල් වූ තොරතුරු සැපයූ නොහොත් නඩුව ඉදිරිපත් කළ තැනැත්තන්ට තෑගි දීමෙහි ලා නැතහොත් දීම සඳහා එය සම්පූර්ණයෙන් ම හෝ එහි යම් කොටසක් හෝ යොදවන ලෙස විධාන කළ හැකි ය.

පෞද්ගලික චෝදකයන්ට ඉඩ හැරීම.

**517**. නීතිපතිවරයා විසින් අපරාධ නඩු කටයුතු පැවරීම සම්බන්ධව මේ පනතේ සඳහන් කිසිවකින් එවැනි නඩු කටයුතු කිසිවක් පැවරීමෙන් හෝ පවත්වාගෙන යාමෙන් යම් තැනැත්තකු වැළැක්වෙතැයි තේරුම් නොගත යුතු ය.

වරප්‍රසාද ලත් විනැවුම්වලට ඉඩ හැරීම.

**518**. මේ පනත යටතේ යම් තැනැත්තකුට විරුද්ධව නීතිපතිවරයා විසින් නඩු කටයුතු පවරනු ලැබූ අවස්ථාවක, චූදිතයා වෙනුවෙන් නීතිඥයකු ලෙස ක්‍රියා කළ යම් තැනැත්තකු විසින් ඒ තත්ත්වයෙන් ලැබූ යම් වරප්‍රසාද ලත් විනැවුමක් අනාවරණය කරන ලෙස ඔහුට නියම කෙරෙන බවක් මේ පනතේ සඳහන් කිසිවකින් තේරුම් නොගත යුතු ය.

XXII කොටස

## විවිධ කරුණු

### සාමාජිකයන් විසි දෙනකුට වැඩි ගණනක හවුල් ව්‍යාපාර තහනම් කිරීම

**519**. (1) තැනැත්තන් විසිදෙනකුට වැඩි සංඛ්‍යාවකින් සමන්විත වූ කිසිම සමාගමක්, සංගමයක් හෝ හවුල් ව්‍යාපාරයක්, මේ පනත යටතේ නැතහොත් වෙනත් යම් ප්‍රඥප්තියක් යටතේ සමාගමක් ලෙස ලියාපදිංචි කරනු ලැබුවහොත්, මිස, සමාගම, සංගමය හෝ හවුල් ව්‍යාපාරය විසින් නැතහොත් එහි තනි සාමාජිකයන් විසින් ලාභ අත්කර ගැනීම පරමාර්ථය කොටගත් යම් ව්‍යාපාරයක් කරගෙන යාමේ කාර්යය සඳහා එය නොපිහිටුවිය යුතු ය.

සාමාජිකයන් විසිදෙනකුට වැඩි ගණනක හවුල් ව්‍යාපාර තහනම් කිරීම.

(2) ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටුවනු ලැබූ තැනැත්තන් විසිදෙනකුට වැඩි සංඛ්‍යාවකින් සමන්විත වූ කිසිම සමාගමක්, සංගමයක් හෝ හවුල් ව්‍යාපාරයක් —

(අ) ශ්‍රී ලංකාවෙන් පිටත සමාගමක් ලෙස එය යථා පරිදි සංස්ථාගත කරනු ලැබ ඇත්නම් ; සහ

(ආ) ශ්‍රී ලංකාව ඇතුළත ස්ථාපිත ව්‍යාපාර ස්ථානයක් ඇත්නම් මිස,

සමාගම, සංගමය හෝ හවුල් ව්‍යාපාරය විසින් නැතහොත් එහි තනි සාමාජිකයන් විසින් ලාභ අත්කර ගැනීම පරමාර්ථය කොටගත් යම් ව්‍යාපාරයක් ශ්‍රී ලංකාව තුළ නොපැවැත්විය යුතු ය.

(3) (1) වන හෝ (2) වන උපවගන්තිවල සඳහන් කිසිවක් —

(අ) එක් එක් තැනැත්තා නීතිඥවරයකු වන තැනැත්තන්ගෙන් සමන්විත වූ නීතිඥවරයන් ලෙස කටයුතු කිරීමේ කාර්ය සඳහා ඇතිකරගත් හවුල් ව්‍යාපාරයකට ;

(ආ) එක් එක් තැනැත්තා වරලත් ගණකාධිකාරීවරයකු වන තැනැත්තන්ගෙන් සමන්විත වූ, ගණකාධිකාරීවරයන් ලෙස කටයුතු කිරීමේ කාර්ය සඳහා ඇති කරගත් හවුල් ව්‍යාපාරයකට ;

(ඇ) එක් එක් තැනැත්තා බලපත්‍රලත් ස්කන්ධ විනිමය ස්ථානයක සාමාජිකයන් වන විටක එකී තැනැත්තන්ගෙන් සමන්විත වූ බලපත්‍රලත් ස්කන්ධ විනිමය ස්ථානයක සාමාජිකයන් ලෙස කටයුතු කිරීමේ කාර්ය සඳහා ඇතිකරගත් හවුල් ව්‍යාපාරයකට ;

(ඈ) නියමිත තැනැත්තන්ගෙන් සමන්විත වූ නියමිත යම් කාර්යයක් සඳහා ඇතිකරගත් හවුල් ව්‍යාපාරයකට,

අදාළ නොවිය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩකරමින් තැනැත්තන් විසි දෙනකුට වැඩි සංඛ්‍යාවකින් සමන්විත යම් සමාගමක්, සංගමයක් හෝ හවුල් ව්‍යාපාරයක් පිහිටුවනු ලැබූ අවස්ථාවක හෝ (2) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් යම් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන අවස්ථාවක, ඒ එක් එක් තැනැත්තා —

(අ) වරදකට වරදකරු වන අතර එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය ; සහ

(ආ) (අ) ඡේදයේ විධිවිධානවලට හානියක් නොමැතිව, ඔහු සාමාජිකයකු වන සාමාජිකයකු වී සිටි සමාගමේ, සංගමයේ හෝ හවුල් ව්‍යාපාරයේ සම්පූර්ණ ණය ගෙවීම සඳහා වෙන් වෙන් වශයෙන් වගකිව යුතු අතර ඒ අනුව ඒ සමාගමේ, සංගමයේ හෝ හවුල් ව්‍යාපාරයේ වෙනත් යම් සාමාජිකයකු සමග ඒකාබද්ධ නොකර, ඒ එක් එක් තැනැත්තාට විරුද්ධව නඩු පවරනු ලැබීමට යටත් විය යුතු ය.

## අධිකරණය වෙත කරනු ලබන ඉල්ලීම් සහ යොමු කිරීම්

කාර්ය පටිපාටිය.

**520**. (1) මේ පනතේ විධිවිධාන යටතේ අධිකරණය වෙත කරනු ලබන සෑම ඉල්ලීමක් ම හෝ යොමු කිරීමක් ම, වෙනත් ආකාරයකින් ප්‍රකාශිතව ම විධිවිධාන සලසා ඇතොත් මිස හෝ අධිකරණය විසින් වෙනත් ආකාරයකින් විධාන කරනු ලබන්නේ නම් මිස, පෙත්සමක් හා දිවුරුම් ප්‍රකාශයක් මගින් කරනු ලැබිය යුතු ය. ඒ ඉල්ලීම හෝ යොමු කිරීම කරනු ලබන්නේ යම් තැනැත්තකුට විරුද්ධව ද ඒ තැනැත්තා ඒ පෙත්සමේ වගඋත්තරකරුවකු වශයෙන් නම් කරනු ලැබිය යුතු අතර, ඒ පිළිබඳව ඔහුට දන්වනු ලැබිය යුතු ය. තව ද ඒ ඉල්ලීමට හෝ යොමු කිරීමට විරෝධතා දැක්වීමට ඔහුට හිමිකම තිබිය යුතු ය.

(2) මේ පනත යටතේ යම් නඩුවක් පවතින කාලය තුළ දී, අධිකරණය වෙත ඒ සම්බන්ධයෙන් හෝ ඊට ආනුෂංගිකව ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලීමක් ම හෝ යොමු කිරීමක් ම ලිඛිත මෝසමක් මගින් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ අධිකරණය වෙත කරන ලද යම් ඉල්ලීමක දී හෝ යොමු කිරීමක දී, ඒ ඉල්ලීමේ හෝ යොමු කිරීමේ කවර අවස්ථාවක දී වුව ද කරුණු කියා සිටීමට හෝ තමා නියෝජනය කරනු ලැබීමට හිමිකම, රෙජිස්ට්‍රාර්වරයාට ඇත්තේ ය.

(4) මේ පනත යටතේ ඉල්ලීමක් හෝ යොමු කිරීමක් වෙනුවෙන් අධිකරණයක් ඉදිරියේ පැවැත්වෙන සියලු නීති කෘත්‍යවල දී. රෙජිස්ට්‍රාර්වරයාට එරෙහිව නඩු ගාස්තු සඳහා වූ කිසිම ආඥාවක් කරනු නොලැබිය යුතු ය.

**521**. (1) (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, මේ පනත යටතේ අධිකරණය වෙත කරනු ලැබූ යම් ඉල්ලීමක දී හෝ යොමු කිරීමක දී අවසාන ආඥාවක් කරන තුරු, නීති කෘත්‍යයේ පාර්ශ්වකරුවකු විසින් කරනු ලබන ඉල්ලීමක් මත අධිකරණය විසින් වළක්වාලීමේ ආඥාවක් ද ඇතුළුව සුදුසු යයි සලකනු ලබන අතුරු ආඥාවක් කරනු ලැබිය හැකි ය. ඒ ආඥාව අධිකරණයේ අභිමතය පරිදි ඒක පාර්ශ්විකව හෝ වගඋත්තරකරුට දැනුම් දීමෙන් පසු කරනු ලැබිය හැකි ය. පෙත්සම්කරුට දැනුම් දී ඒකපාර්ශ්වික ආඥාව ප්‍රත්‍යාදිෂ්ට කිරීම සඳහා හෝ වෙනස් කිරීම සඳහා වූ ආඥාවක් සඳහා වගඋත්තරකරු විසින් ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය. අතුරු සහන ප්‍රදානය කිරීම.

(2) අපේක්ෂිත ආඥාව ප්‍රදානය කරනු ලැබ සමාගමට හෝ වෙනත් යම් තැනැත්තකුට පාඩුවක් හෝ අලාභයක් සිදු වී එම පාඩුව හෝ අලාභය ඉල්ලුම්කරු විසින් දැරීම සාධාරණ හා යුක්ති සහගත යයි අධිකරණය සළකන්නේ නම් එම පාඩුවට හෝ අලාභයට එරෙහිව ඉල්ලුම්කරු විසින් එම සමාගමට හෝ වෙනත් තැනැත්තාට හානිපූර්ණය කරනු ලබන බවට වූ ලිඛිත පොරොන්දුවක් ඉල්ලුම්කරු විසින් පළමුවෙන් අධිකරණය වෙත යොමු කරනු ලැබ ඇත්නම් මිස, කොටස් හිමියකුගේ, කලින් සිටි කොටස් හිමියකුගේ හෝ අධ්‍යක්ෂවරයකුගේ ඉල්ලීමක් මත, මේ පනත යටතේ අතුරු තහනම හෝ වෙනත් යම් ආකාරයක අතුරු ආඥාවක් අධිකරණය විසින් ප්‍රදානය කරනු නොලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ දෙන ලද පොරොන්දුව සඳහා ඉල්ලුම්කරු විසින් සැපයිය යුතු ඇප මුදලේ ප්‍රමාණය, අතුරු තහනම හෝ වෙනත් යම් ආකාරයක අතුරු ආඥාවක් ප්‍රදානය කිරීමට පෙර හෝ ප්‍රදානය කරන අවස්ථාවේ දී අධිකරණය විසින් නියම කරනු ලැබිය යුතු ය. අධිකරණය වෙත මුදල් තැන්පත් කිරීමෙන් හෝ බැංකු ඇපකරයක් ඉදිරිපත් කිරීමෙන් හෝ ප්‍රමාණවත් යයි අධිකරණය සළකන වෙනත් යම් ආකාරයකට ඇප ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(4) අතුරු ආඥාවක් කිරීමේ හෝ දිගටම බලාත්මකව තිබීමේ ප්‍රතිඵලයක් වශයෙන් පාඩුවක් හෝ අලාභයක් සිදුවිය හැකි සමාගම හෝ වෙනත් යම් තැනැත්තකු විසින් කරනු ලබන ඉල්ලීමක් මත, (2) වන උපවගන්තිය යටතේ දෙන ලද පොරොන්දුව සඳහා ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කළ යුතු ඇප මුදලේ ප්‍රමාණය අධිකරණය විසින් කලින් කල වැඩි කරනු ලැබිය හැකි ය. ඉදිරිපත් කළ යුතු ඇප මුදල වැඩි කිරීම සඳහා වූ ආඥාවක් කරනු ලැබූ අවස්ථාවක, අධිකරණය විසින් නිශ්චිතව දක්වනු ලබන කාලයක් ඇතුළත වැඩි කරන ලද ඇප මුදල ඉදිරිපත් කළ යුතු බව, අතුරු ආඥාව දිගටම බලාත්මක වීම සඳහා වූ කොන්දේසියක් විය යුතු ය.

(5) (අ) (2) වන උපවගන්තිය යටතේ වූ පොරොන්දුවක් ක්‍රියාත්මක කිරීම මගින් ;

(ආ) (3) වන උපවගන්තිය යටතේ ඇප වශයෙන් තැන්පත් කරන ලද මුදල් යම් තැනැත්තකුට ගෙවීම සඳහා ;

(ඇ) (3) වන උපවගන්තිය යටතේ ඇප වශයෙන් තැන්පත් කරන ලද යම් මුදල් පොලී උපදවන බැංකු ගිණුමක ආයෝජනය කිරීම සඳහා,

සාධාරණ සහ යුක්ති සහගත යයි අධිකරණය සළකන ආඥා අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.

නීතිඥයන් හා බැංකුකරුවන් සඳහා ශේෂ කිරීම්.

**522**. (අ) තමා නීතිඥවරයකු වන්නේ නම්, තම සේවාදායකයාගේ නම සහ ලිපිනය හැර, අධිකරණයක පැවැත්වෙන නීති කෘත්‍යයක දී නීති වෘත්තීයමය වරප්‍රසාද මත හෙළි කිරීම ප්‍රතික්ෂේප කිරීමට යම් තැනැත්තකුට හිමිකම් ඇති යම් තොරතුරක් ; හෝ

(ආ) අධිකරණය විසින් අන්‍යාකාරයකින් ආඥා කරනු ලබන්නේ නම් මිස, සමාගම හැර, සමාගමේ බැංකුකරුවන්ගේ සේවාදායකයන් අතරෙන් යම් සේවාදායකයකු සම්බන්ධයෙන් වූ යම් තොරතුරක් සමාගමේ බැංකුකරුවන් විසින්,

රෙජිස්ට්‍රාර්වරයාට හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් පත් කරන ලද පරීක්ෂකවරයකුට හෙළි කිරීමට මේ පනතේ වූ කිසිවකින් නියම කරනු නොලැබිය යුතු ය.

සමාගමකට ලේඛන භාරදීම.

**523**. ලේඛනයක් —

(අ) එය සමාගමේ ලියාපදිංචි කාර්යාලය වෙත තැබීමෙන් හෝ තැපෑලෙන් යැවීමෙන් ; නැතහොත්

(ආ) එය සමාගමේ යම් අධ්‍යක්ෂවරයකු, ලේකම්, කළමනාකරු හෝ වෙනත් නිලධරයකු වෙත භාරදීමෙන් හෝ තැපෑලෙන් යැවීමෙන් ; නැතහොත්

(ඇ) යම් හේතුවක් නිසා එය ඒ අධ්‍යක්ෂවරයා, ලේකම්, කළමනාකරු හෝ වෙනත් නිලධරයකු වෙත පෞද්ගලිකව භාර දීමෙන් හෝ තැපෑලෙන් යැවීමෙන් භාරදිය නොහැකි නම්, එය අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි යම් ආකාරයකට,

සමාගමක් වෙත භාර දෙනු ලැබිය හැකි ය.

සාක්ෂි වශයෙන් ගනු ලැබිය යුතු ලේඛන.

**524**. සමාගමක් විසින් හෝ වෙනුවෙන් නැතහොත් යම් තැනැත්තකු විසින් මේ පනතේ කාර්ය සඳහා පිළියෙල කරනු ලැබූ හෝ සපයනු ලැබූ බව ඇඟවෙන යම් ලේඛනයක්, එය එසේ නොවන බවට ඔප්පු කරනු ලබන තෙක්, සියලුම කාර්ය සඳහා අවස්ථාවෝචිතව, ඒ සමාගම විසින් නැතහොත් ඒ තැනැත්තා විසින් පිළියෙල කරනු ලැබූ ලෙස හෝ සපයනු ලැබූ ලෙස සළකනු ලැබිය යුතු ය. එවැනි යම් ලේඛනයක් අත්සන් කරන යම් තැනැත්තකු එහි වූ සියලුම කරුණු දැනුවත්ව සිටි ලෙස සළකනු ලැබිය යුතු ය.

ඇතැම් සීමාසහිත සමාගම් විසින් පවරනු ලබන නඩුවල ගාස්තු.

**525**. සීමාසහිත සාමගමක් යම් නඩුවක හෝ වෙනත් නඩු කටයුත්තක පැමිණිලිකරු වන අවස්ථාවක එම කාරණය සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති යම් විනිශ්චයකාරවරයකු විසින් විත්තිකරුගේ විත්ති වාචකය සාර්ථක වුවහොත් ඔහුගේ වියදම් සමාගම විසින් ගෙවිය

නොහැකි යයි විශ්වාස කිරීමට හේතු ඇති බව විශ්වාසනීය සාක්ෂි මගින් පෙනී යන අවස්ථාවක ඒ වියදම් සඳහා ප්‍රමාණවත් ඇපයක් තැබීමට නියම කළ හැකි අතර, ඒ ඇපය දෙනු ලබන තෙක් සියලුම නඩු කටයුතු නවත්වනු ලැබිය හැකි ය.

ඇතැම් නඩුවල දී සහනය දීමට අධිකරණයට ඇති බලය.

**526**. (1) සමාගමක නිලධරයකුට හෝ විගණකවරයකු වශයෙන් (ඔහු සමාගමේ නිලධරයකු වුව ද නොවුව ද) සමාගමක් විසින් සේවයෙහි නියුක්ත කරන ලද තැනැත්තකුට විරුද්ධව නොසැලකිල්ල, පැහැර හැරීම, කාර්ය කඩ කිරීම හෝ විශ්වාසය කඩ කිරීම සම්බන්ධයෙන් ඇති යම් නඩු කටයුත්තක දී නොසැලකිල්ලට, පැහැර හැරීමට, කාර්ය කඩ කිරීමට හෝ විශ්වාසය කඩ කිරීමට ඒ නිලධරයා හෝ තැනැත්තා වගකිව යුතු වී සිටින බව හෝ වගකිව යුතු විය හැකි බවත්, එහෙත් අවංකව හා සාධාරණ ලෙස ඔහු ක්‍රියා කොට ඇති බවත් ඔහුගේ පත්වීම හා සම්බන්ධ කරුණු ඇතුළුව අවස්ථානුගත කරුණු සියල්ල ගැන සලකා බැලූ කල්හි නොසැලකිල්ල, පැහැර හැරීම, කාර්ය කඩ කිරීම හෝ විශ්වාසය කඩ කිරීම සම්බන්ධයෙන් ඔහුට සාධාරණ ලෙස සමාව දිය යුතු බව නඩුව විභාග කරන අධිකරණයට පෙනී යන අවස්ථාවක, ඒ අධිකරණය විසින් සුදුසු යයි අදහස් කරන නියමයක් මත ඔහුගේ වගකීමෙන් මුළුමණින් ම හෝ ඉන් කොටසකින් ඔහු නිදහස් කරනු ලැබිය හැකි ය.

(2) යම් නොසැලකිල්ලක්, පැහැර හැරීමක්, කාර්ය කඩ කිරීමක් හෝ විශ්වාසය කඩ කිරීමක් සම්බන්ධයෙන් තමාට විරුද්ධව යම් හිමිකම් පෑමක් කරනු ලබන්නේ යයි හෝ කළ හැකි වෙතැයි (1) වන උපවගන්තියේ සඳහන් එවැනි යම් නිලධරයකු හෝ තැනැත්තකු හට සැක කිරීමට හේතුවක් ඇති අවස්ථාවක, ඔහු විසින් සහනය පතා අධිකරණයට ඉල්ලීම් කරනු ලැබිය හැකි ය. තව ද එවැනි යම් ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක එම අධිකරණය, නොසැලකිල්ල, පැහැර හැරීම, කාර්ය කඩ කිරීම හෝ විශ්වාසය කඩ කිරීම සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව නඩු කටයුතු ඉදිරිපත් කරනු ලැබූ එවැනි යම් අධිකරණයක් වූයේ නම් මේ වගන්තිය යටතේ ඔහුට සහනයක් දීමෙහි ලා එය සතු බලය ඊට තිබිය යුතු ය.

නියෝග.

**527**. (1) නියම කළ යුතු යයි මේ පනතින් ප්‍රකාශිත හෝ නියමිත සියලු කාරණා සඳහා නැතහොත් නියෝග සෑදීමට මේ පනතින් නියමිත හෝ බලය දෙන ලද සියලු කාරණා සඳහා ඒවා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර, ඒ පළ කරනු ලැබූ දින සිට හෝ නියෝගයෙහි නියම කරනු ලැබිය හැකි වෙනත් යම් පසු දිනයක දී හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමත කිරීම සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක්, ඒ අනනුමතියේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය. එහෙත් ඒ යටතේ කලින් කරන ලද කවර වූ හෝ දෙයකට ඉන් හානියක් නොවිය යුතු ය. යම් නියෝගයක් එසේ පරිච්ඡින්න වූ සේ සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**528**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**529**. (1) පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි —

"ගිණුම් කාලසීමාව" යන්නෙන්, සංස්ථාපිත මණ්ඩලයක් සම්බන්ධයෙන් වන විට එකී කාලසීමාව එක් අවුරුද්දක් වුව ද නොවුව ද එම සංස්ථාපිත මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශ සාදනු ලබන්නේ යම් කාලසීමාවක් සම්බන්ධයෙන් ද ඒ කාලසීමාව අදහස් වේ ;

"අනුයෝජිතයා" යන්නට යම් තැනැත්තකුගේ නීතිඥවරයකු වශයෙන් ක්‍රියා කරන්නා වූ නීතිඥවරයකු ඇතුළත් නොවේ ;

"වාර්ෂික වාර වාර්තාව" යන්නෙන්, 131 වන වගන්තිය යටතේ සමාගමක් විසින් ඉදිරිපත් කරනු ලැබීමට නියමිත වාර්තාව අදහස් වේ ;

"ව්‍යවස්ථාවලිය" යන්නෙන්, 1861 සංයුක්ත ස්කන්ධ සමාගම් ආඥාපනතේ උපලේඛනයේ "ඇ" කොටසෙහි හෝ 1897 සංයුක්ත ස්කන්ධ බැංකු ආඥාපනතේ උපලේඛනයේ "ආ" චක්‍රයෙහි හෝ (145 වන අධිකාරය වූ) සමාගම් ආඥාපනතේ පළමුවන උපලේඛනයේ "ආ" චක්‍රයේ හෝ 1982 අංක 17 දරන සමාගම් පනතේ පළමුවන උපලේඛනයේ "අ" චක්‍රයේ හෝ ආදර්ශ ව්‍යවස්ථාවල අන්තර්ගත වූ නියෝග සමාගමට අදාළ වන තාක් දුරට ඒවා ද ඇතුළුව සමාගමක මුලින්ම සකස් කළ නොහොත් විශේෂ යෝජනා සම්මතයක් මගින් වෙනස් කළ සමාගමක සාංගමික ව්‍යවස්ථාවලිය අදහස් වේ ;

"ශේෂ පත්‍ර දිනය" යන්නෙන්, මාර්තු 31 වන දින අවසානය හෝ සමාගමේ ශේෂ දිනය වශයෙන් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිළිගනු ලබන්නා වූ ද රෙජිස්ට්‍රාර්වරයාට වහාම දැනුම් දිය යුතු වන්නා වූ ද වෙනත් දිනයක් හෝ අදහස් වේ ;

සමාගමක් සම්බන්ධයෙන් වන විට "මණ්ඩලය" සහ "අධ්‍යක්ෂ මණ්ඩලය" යන්නෙන් —

(අ) අධ්‍යක්ෂ මණ්ඩලය වශයෙන් එක්ව ක්‍රියා කරන කල්හි අවශ්‍ය ගණපූරණයට වඩා අඩු නොවන සංඛ්‍යාවකින් සංයුක්ත වන සමාගමේ අධ්‍යක්ෂවරුන් ; හෝ

(ආ) සමාගමට සිටින්නේ එක් අධ්‍යක්ෂවරයෙක් පමණක් නම්, ඒ අධ්‍යක්ෂවරයා, හෝ

අදහස් වේ ;

"පොතක් හා පතක්" සහ "පොතක් හෝ පතක්" යන්නට ගිණුම්, ඔප්පු, ලියවිලි හා ලේඛන ඇතුළත් වේ ;

"සහතික කිරීම" යන්නෙන්, නියම කරනු ලැබිය හැකි ආකාරයට සහතික කිරීම හෝ යම් ලේඛනයක් හෝ ලේඛන පන්තියක් සම්බන්ධයෙන් සහතික කිරීමේ කිසිම ආකාරයක් නියම කරනු නොලැබ ඇති විට රෙජිස්ට්‍රාර්වරයා විසින් නියම කරනු ලැබිය හැකි ආකාරයට සහතික කිරීම ද අදහස් වේ ;

"පන්තිය" යන්නෙන්, සමාන අයිතිවාසිකම්, වරප්‍රසාද, සීමාකිරීම් හා කොන්දේසි අනුගත වී ඇති කොටස් පන්තියක් අදහස් වේ ;

"සමාගම" යන්නෙන්, මේ පනත යටතේ සංස්ථාපනය කරනු ලැබූ සමාගමක් හෝ පවත්නා සමාගමක් අදහස් වේ ;

"අධිකරණය" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පළාතක් සඳහා පිහිටුවනු ලැබුවාවූද 1996 අංක 10 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනතේ 2 වන වගන්තිය යටතේ ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් එය පිහිටුවනු ලැබූ පළාත ඇතුළත සිවිල් අධිකරණ බලය පැවරුනාවූද මහාධිකරණයක් හෝ යම් පළාතක් සඳහා එවැනි සිවිල් අධිකරණ බලයක් පැවරුණු මහාධිකරණයක් පිහිටුවනු ලැබ නොමැති විටක බස්නාහිර පළාත සඳහා පිහිටුවනු ලැබූ මහාධිකරණය හෝ අදහස් වේ ;

"සෑණ පත්‍රය" යන්නට සෑණ පත්‍ර, ස්කන්ධ, බැඳුම්කර හා සමාගමේ වත්කම්වල සෑණ භාරයක් වුවත් නැතත් සමාගමක වෙනත් සුරැකුම් පත් කිසිවක් ඇතුළත් වේ ;

"අධ්‍යක්ෂ" යන්නට —

(අ) කවර නමකින් හැඳින්වුව ද සමාගමේ අධ්‍යක්ෂ වරයකුගේ තත්ත්වය උසුලන තැනැත්තෙක් ද ;

(ආ) 187, 188, 189, 190, 197, 374, සහ 377 වන වගන්තිවල කාර්යය සඳහා —

(i) (අ) ඡේදයේ සඳහන් තැනැත්තකු ක්‍රියාකළයුතු වන්නේ හෝ ක්‍රියා කිරීමට පුරුදු වී ඇත්තේ යම් තැනැත්තකුගේ විධාන හෝ උපදෙස්වලට අනුකූලව ද ඒ දෙවනු කී තැනැත්තෙක් ;

(ii) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රියා කළ යුතු වන්නේ හෝ ක්‍රියා කිරීමට පුරුදු වී ඇත්තේ යම් තැනැත්තකුගේ විධාන හෝ උපදෙස්වලට අනුකූලව ද ඒ තැනැත්තා ;

(iii) සමාගමේ ව්‍යවස්ථාවලියෙන් බාහිරව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ක්‍රියාවේ යෙදීමට නියමිතව තිබිය හැකි බලතල ක්‍රියාවේ යොදන හෝ ක්‍රියාවේ යෙදීමට හිමිකම තිබෙන නැතහොත් ඒ බලතල ක්‍රියාවේ යෙදීම පාලනය කරන හෝ පාලනය කිරීමට හිමිකම ඇති තැනැත්තෙක් ; සහ

(ඇ) 187 සිට 195 දක්වා (ඒ වගන්ති දෙකම ඇතුළුව) වගන්තිවල සහ 197, 374, සහ 377 වන වගන්තිවල කාර්ය සඳහා, මණ්ඩලයේ බලතල හෝ කාර්ය කිසිවක් මණ්ඩලය විසින් යම් තැනැත්තකුගේ කැමැත්ත හෝ එකඟත්වය සහිතව සෘජුවම පවරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකුට ද එවැනි තැනැත්තෙක් නැතහොත් ඒ බලතල හෝ කාර්ය කිසිවක් අධ්‍යක්ෂ මණ්ඩලයේ කැමැත්ත හෝ එකඟත්වය ඇතිව ක්‍රියාවේ යොදනු ලබන්නේ යම් තැනැත්තකු විසින් ද ඒ යම් තැනැත්තෙක්,

ඇතුළත් වේ ;

"බෙදාහැරීම" යන්නෙන්-

(අ) සමාගමක කොටස් හැර, එම කොටස් හිමියන්ගේ යහපත උදෙසා කෙලින්ම හෝ අන්‍යාකාරයකින් මුදල් හෝ දේපළ මාරු කිරීම ; හෝ

(ආ) ඒ කොටස් හිමියා විසින් දරනු ලබන කොටසක් හෝ කොටස් සම්බන්ධයෙන් වන විට, ලාභාංශ ගෙවීම මගින් හෝ කොටස් හෝ කොටසක් බේරුම් කිරීම මගින් හෝ අත්කර ගැනීම මගින් හෝ ණයගැති භාවය බෙදාහැරීම මගින් හෝ අන්‍යාකාරයකින් හෝ ඒ කොටස් හිමියාගේ ප්‍රතිලාභය සඳහා ණයක් ඇති කිරීම,

අදහස් වේ ;

"ලාභාංශ" යන්නට 60 වන වගන්තියේ දී ඇති අර්ථයම තිබිය යුතු ය ;

"ලේඛනය" යන්නට—

(අ) ද්‍රව්‍යයක් මත වූ යම් ලියවිල්ලක් ;

(ආ) ටේප් රෙකෝඩරයක්, පරිඝණකයක් හෝ වෙනත් උපකරණයක් මගින් වාර්තාගත කරන ලද හෝ රැස් කරන ලද තොරතුරුද එසේ වාර්තාගත කරනු ලැබූ හෝ රැස් කරනු ලැබූ තොරතුරුවලින් පසුව ලබාගත් තොරතුරු ;

(ඇ) පොතක්, ප්‍රස්ථාරයක් හෝ චිත්‍රයක් ; සහ

(ඈ) (උපකරණයක ආධාරයෙන් හෝ එසේ නොමැතිව) නැවත මුද්‍රණය කළ හැකි ලෙස අන්තර්ගත වී ඇති දෘශ්‍ය ඡායා එකක් හෝ වැඩි ගණනක් ඇති ඡායාරූප, චිත්‍රපටි, දළ සේයා පටි, නෙගටිව් පටි, ටේප් පටි හෝ වෙනත් උපකරණයක් ඇතුළුව

යම් ආකාරයක ලේඛනයක් අදහස් වේ ;

"සේවා නියුක්තියන්ගේ කොටස් යෝජනා ක්‍රමය" යන්න සමාගමක් සම්බන්ධයෙන් වන විට-

(අ) සමාගමේ හෝ යම් ආශ්‍රිත සමාගමක සද්භාවයෙන් යුත් සේවා නියුක්තයන් හෝ හිටපු සේවා නියුක්තයන් ; හෝ

(ආ) එවැනි යම් සේවා නියුක්තයකුගේ හෝ හිටපු සේවා නියුක්තයකුගේ භාර්යාව, ස්වාමි පුරුෂයා, වැන්දඹුව, වැන්දඹු පුරුෂයා හෝ ළමයා හෝ පෙර විවාහයක ළමයින්ගේ,

යහපත උදෙසා සමාගමේ කොටස් දැරීම ධෛර්යමත් කිරීම හෝ එයට පහසුකම් සැලසීම සඳහා වූ යෝජනා ක්‍රමයක් අදහස් වේ ;

"පවත්නා සමාගම" යන්නෙන් 1861 සංයුක්ත ස්කන්ධ සමාගම් ආඥාපනත යටතේ හෝ 1897 සංයුක්ත ස්කන්ධ බැංකු ආඥාපනත යටතේ හෝ (145 වන අධිකාරය වූ) සමාගම් ආඥාපනත යටතේ හෝ 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ පිහිටුවා ලියාපදිංචි කරනු ලැබූ සමාගමක් අදහස් වේ ;

"මූල්‍ය ප්‍රකාශය" යන්නෙන්—

(අ) ශේෂ පත්‍රය සඳහා නියමිත දිනට, සමාගමේ ශේෂ පත්‍රයක් ; සහ

(ආ) (i) ලාභ සඳහා අලෙවි කටයුතු කරන සමාගමක් සම්බන්ධයෙන් වන විට ශේෂ පත්‍ර දිනයෙන් අවසන් වන ගිණුම් කාලය සඳහා සමාගමේ ලාබ අලාභ ප්‍රකාශයක් ද ;

(ii) ලාභ සඳහා අලෙවි කටයුතු නොකරන සමාගමක් සම්බන්ධයෙන් වන විට ශේෂ පත්‍ර දිනයෙන් අවසන් වන ගිණුම් කාලය සඳහා සමාගමේ ආදායම් හා වියදම් ප්‍රකාශයක් ද,

සමඟ එම ශේෂ පත්‍රය හෝ ප්‍රකාශය පිළිබඳ තොරතුරු සැපයෙන යම් සටහනක් හෝ ලේඛන සමග ගත්කළ අදහස් වේ.

"අරමුදල" යන්නෙන්, 479 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ අරමුදල අදහස් වේ ;

"පාලක සමාගම" යන්නෙන්, යම් සමාගමක් වෙනත් සමාගමක පාලිත සමාගමක් වන්නේ නම් සහ එසේ වන්නේ නම් පමණක් ඒ වෙනත් සමාගම ඒ මුලින් කී සමාගමේ පාලක සමාගම ලෙස සලකනු ලබන්නේ ය ;

මේ අර්ථ කථනයේ කාර්යය සඳහා—

"සමාගම" යන්නට යම් සංස්ථාගත මණ්ඩලයක් ද ඇතුළත් වේ ;

"සමූහ මූල්‍ය ප්‍රකාශ" යන්නෙන්—

(අ) අදාළ ශේෂ පත්‍ර දිනට සමාගම් සමූහය සඳහා ඒකාබද්ධ ශේෂ පත්‍රය ද ;

(ආ) සමාගම් සමූහයේ එක් සමාජිකයකු ලාභය සඳහා අළෙවි කටයුතු කරගෙන යන අවස්ථාවක එම ශේෂ පත්‍ර දිනෙන් අවසන් වන ගිණුම් කාලයට අදාළව එම සමාගම් සමූහයේ ඒකාබද්ධ ලාභ අලාභ ප්‍රකාශය ද ;

(ඇ) සමාගම් සමූහයේ කිසිදු සාමාජිකයකු ලාභය සඳහා අළෙවි කටයුතු කරනු නොලබන අවස්ථාවක එම ශේෂ පත්‍ර දිනෙන් අවසන් වන ගිණුම් කාලයට අදාළව එම සමාගම් සමූහයේ ඒකාබද්ධ ආදායම් හා වියදම් ප්‍රකාශය ද,

ඇතුළුව, ශේෂ පත්‍රයට හෝ ප්‍රකාශයට අදාල යම් සටහන් හෝ ලේඛන

අදහස් වේ.

කොටස්වලට අදාළ අයිතිවාසිකම්වලට බලපාන යම් ක්‍රියාවක් හෝ යෝජනාවක් සම්බන්ධයෙන් වන විට—

"සම්බන්ධතා දරන කණ්ඩායම" යන්නෙන්-

(අ) බලපෑමට භාජන වූ ස්වකීය අයිතිවාසිකම් සර්ව සම වන ; සහ

(ආ) තමාගේ අයිතිවාසිකම්වලට බලපෑම සිදු වූ ක්‍රියාව හෝ යෝජනාව එකම ආකාරයක වන,

කොටස් හිමියන් කණ්ඩායමක් අදහස් වේ ;

"නීත්‍යානුකූල නියෝජිතයා" යන්නෙන්, පොල්මඃකරුවෙක් හෝ අද්මිනිස්ත්‍රාසිකරුවෙක් හෝ නීතියෙන් පාලනය නොවන බූදලයක් නම් උරුමය භාර ගෙන සිටින ළඟම ඥාතියා හෝ අදහස් වේ ;

"ලැයිස්තුගත සමාගම" යන්නෙන්, බලපත්‍රලත් ස්කන්ධ විනිමය ස්ථානයක දී යම් සමාගමක යම් කොටස්වලට හෝ සුරැකුම්පත්වලට මිල ගණන් ඉදිරිපත් කර ඇත්තේ ද එවැනි සමාගමක් අදහස් වේ ;

"බලපත්‍ර ලත් වාණිජ බැංකුව" යන්නෙන්, බලපත්‍ර ලත් වාණිජ බැංකුවක් ලෙස ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යාම සඳහා 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති සමාගමක් අදහස් වේ ;

"කළමනාකරු" යන්නට, කවර නමකින් හඳුන්වනු ලැබුව ද කළමනාකාර තනතුර දරන යම් තැනැත්තෙක් ඇතුළත් වේ ;

"අවම දායක මුදල" යන්නෙන්, අධ්‍යක්ෂවරුන්ගේ මතය අනුව, කොටස් ප්‍රාග්ධනය නිකුත් කිරීම මගින් උපයා ගත යුතු අවම මුදල වශයෙන් සංස්ථා ප්‍රකාශයේ සඳහන් වන්නා වූ ද තනිකරම තත් කාර්යය සඳහා ගණන් ගනු ලබන්නා වූ ද මුදල අදහස් වේ ;

"නිලධරයා" යන්නට, සංස්ථාගත මණ්ඩලයක් සම්බන්ධයෙන් වන විට අධ්‍යක්ෂවරයකු, කළමනාකරු, හෝ ලේකම් ඇතුළත් වේ ;

"සාමාන්‍ය යෝජනා සම්මතය" යන්නෙන්, ප්‍රශ්නය පිළිබඳව ඡන්දය දීමට අයිතියක් තිබෙන්නා වූ ද එසේ ඡන්දය දෙන්නා වූ ද කොටස් හිමියන්ගේ ඡන්දයෙන් සාමාන්‍ය බහුතරයක් මගින් අනුමත කරනු ලබන යෝජනා සම්මතයක් අදහස් වේ ;

"විදේශ සමාගම්" යන්නට, 488 වන වගන්තියේ දී ඇති අර්ථයම තිබිය යුතු ය ;

"නියමිත" යන්නෙන්, නියෝග මගින් නියම කිරීම අදහස් වේ ;

"සංස්ථා ප්‍රකාශය" යන්නෙන් සමාගමක කොටස් හෝ සෘණ පත්‍ර කිසිවක් සඳහා සහභාග වීම නැතහොත් ඒවා මිලට ගැනීම සඳහා මහජනයා වෙත අර්පණය කරන යම් සංස්ථා ප්‍රකාශයක්, දැන්වීමක්, චක්‍රලේඛයක්, ප්‍රචාරක දැන්වීමක් හෝ වෙනත් ආරාධනයක් අදහස් වන අතර, එවැනි යම් දැන්වීමක්, චක්‍රලේඛයක්, ප්‍රචාරක දැන්වීමක් හෝ වෙනත් ආරාධනයක් එය සංස්ථා ප්‍රකාශයක් හෝ මහජනයා වෙත කෙරෙන කොටස් අර්පණය කිරීමක් නොවන බව ඒ මත දැක්වුන ද ඒ බව නොතකා එය ද ඊට ඇතුළත් වේ ;

"භාර ගැනුම්කරු" යන්නෙන්, XV වන කොටස යටතේ පත් කරනු ලැබූ, සමාගමක දේපළ සහ ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම හෝ එහි යම් කොටසක් භාරගනු ලබන්නකු අදහස් වේ ;

"බේරුම් කළ හැකි" යන්නට, 66 වන වගන්තියේ දී ඇති අර්ථයම තිබිය යුතු ය ;

"රෙජිස්ටරය" යන්නට, 473 වන වගන්තිය යටතේ තබා ගැනීමට නියමිත රෙජිස්ටරයක් අදහස් වේ ;

"රෙජිස්ට්‍රාර්වරයා" යන්නෙන්, මේ පනත යටතේ සමාගම් ලියාපදිංචි කිරීමේ කාර්යය ඉටු කරන සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා හෝ වෙනත් නිලධරයෙක් හෝ අදහස් වේ ;

"ව්‍යවස්ථා වෙනස් කරන යෝජනා සම්මතය" යන්නට, 15 වන වගන්තියෙහි දී ඇති අර්ථයම තිබිය යුතු ය ;

"කොටස" යන්නෙන්, සමාගමක් විසින් නිකුත් කරන ලද කොටසක් අදහස් වේ ;

"කොටස් ලේඛනය" යන්නෙන්, 123 වන වගන්තිය යටතේ තැබීමට නියමිත ලේඛනය අදහස් වේ ;

"කොටස් හිමියා" යන්නට, 86 වන වගන්තියෙහි දී ඇති අර්ථයම තිබිය යුතු ය ;

"ප්‍රකාශිත ප්‍රාග්ධනය" යන්නට, 58 වන වගන්තියේ දී ඇති අර්ථයම තිබිය යුතු ය ;

යම් සමාගමක් වෙනත් සමාගමක "පාලිත සමාගමක්" යන්නෙන්-

(අ) ඒ වෙනත් සමාගම—

(i) එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය පාලනය කරන්නේ නම් ;

(ii) සමාගමේ රැස්වීමක දී පාවිච්චි කළ හැකි උපරිම ඡන්ද සංඛ්‍යාවෙන් අර්ධයකට වැඩි ප්‍රමාණයක් පාවිච්චි කිරීමට හෝ පාවිච්චි කිරීම පාලනය කිරීමට හැකි තත්ත්වයක සිටී නම් ;

(iii) ලාභ බෙදා දීමේ දී හෝ ප්‍රාග්ධනයේ හෝ යම් නිශ්චිත මුදල් ප්‍රමාණයක් ඉක්මවා සහභාගිත්වයක් ලැබීමට අයිතිවාසිකම නොමැති කොටස් නොවන, සමාගමේ නිකුත් කළ කොටස් වලින් අර්ධයකට වැඩි ප්‍රමාණයක් දරන්නේ නම් ;

(iv) ලාභ බෙදා දීමේ දී හෝ ප්‍රාග්ධනයේ හෝ යම් නිශ්චිත මුදල් ප්‍රමාණයක් ඉක්මවා සහභාගිත්වයක් ලැබීමට අයිතිවාසිකම නොමැති කොටස් නොවන, සමාගමේ නිකුත් කළ කොටස් සඳහා ගෙවන සෑම ලාභාංශයකින් ම අර්ධයකට වැඩි ප්‍රමාණයක් ලැබීමට හිමිකම දරන්නේ නම් ; හෝ

(ආ) පළමු සඳහන් සමාගම, එකී වෙනත් සමාගමේ පාලිත සමාගමක් වන සමාගමක පාලිත සමාගමක් වන්නේ නම්,

එවැන්නක් අදහස් වේ.

මේ නිර්වචනයේ කාර්ය සඳහා යම් වෙනත් සමාගමකට වෙනත් යම් තැනැත්තකුගේ අනුමැතිය හෝ එකඟත්වය නොමැතිව ඒ සමාගම විසින් ක්‍රියාවේ යොදනු ලැබිය හැකි යම් බලයක් ක්‍රියාවේ යෙදීමෙන් යම් සමාගමක සියලු අධ්‍යක්ෂවරයන් හෝ අධ්‍යක්ෂවරයන්ගෙන් බහුතරය හෝ පත් කළ හැකි නම් හෝ ඉවත් කළ හැකි නම්, සහ එසේ කළ හැකි නම් පමණක්, එකී යම් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය එකී වෙනත් සමාගම විසින් පාලනය කරනු ලබන සේ සැලකිය යුතු ය. මේ විධිවිධානවල කාර්ය සඳහා—

(අ) අධ්‍යක්ෂකවරයකු පත් කිරීම සඳහා එකී වෙනත් සමාගම සතු බලය යම් තැනැත්තකුට පක්ෂව ක්‍රියාවේ යෙදීමෙන් තොරව ඒ තැනැත්තා අධ්‍යක්ෂවරයකු ලෙස පත් කරනු ලැබිය නොහැකි නම් ; හෝ

(ආ) යම් තැනැත්තකු අධ්‍යක්ෂවරයකු ලෙස පත් කිරීම අවශ්‍යයෙන් ම එකී වෙනත් සමාගමේ අධ්‍යක්ෂවරයකු ලෙස එකී ඔහුගේ පත්වීමේ අනුසාරයෙන් සිදුවන්නේ නම්,

අධ්‍යක්ෂවරයකු පත් කිරීමට එකී වෙනත් සමාගමට බලය ඇති ලෙස සැලකිය යුතු ය.

එක් සමාගමක් තවත් සමාගමක පාලිත සමාගමක් ද යන්න තීරණය කිරීමේ දී-

(අ) විශ්වසනීය තත්ත්වය මත සමාගමක් විසින් කරනු ලබන යම් කොටස් හෝ ක්‍රියාවේ යොදනු ලැබිය හැකි යම් බලයක් ඒ සමාගම විසින් දරනු නොලබන හෝ ක්‍රියාවේ යොදනු ලැබිය නොහැකි ලෙස සැලකිය යුතු ය ;

(ආ) (i) එකී වෙනත් සමාගම සඳහා නාමිකයකු ලෙස යම් තැනැත්තකු (එකී වෙනත් සමාගම විශ්වසනීය තත්ත්වයෙන් පමණක් සම්බන්ධව සිටින අවස්ථාවක දී හැර) විසින් දරනු ලබන කොටස් හෝ ක්‍රියාවේ යෙදිය හැකි යම් බලයක් ; හෝ

(ii) ඒ වෙනත් සමාගමේ විශ්වසනීය තත්ත්වයෙන් පමණක් සම්බන්ධව සිටින පාලිත සමාගමක් නොවන්නා වූ පාලිත සමාගමක් විසින් හෝ ඒ පාලිත සමාගමක නාමිකයකු විසින් හෝ දරනු ලබන කොටස් හෝ ක්‍රියාවේ යෙදිය හැකි යම් බලයක්,

ඒ වෙනත් සමාගම විසින් දරනු ලබන ලෙස, (ඇ) ඡේදයේ සහ (ඈ) ඡේදයේ විධිවිධානවලට යටත්ව සැලකිය යුතු ය.

(ඇ) පළමු සඳහන් සමාගමේ යම් සෘණ පත්‍රයක විධිවිධාන ප්‍රකාර හෝ ඒ යම් සෘණ පත්‍ර නිකුතුවක් සුරක්ෂිත කිරීම සඳහා වූ භාර ඔප්පුවක විධිවිධාන ප්‍රකාර යම් තැනැත්තකු දරනු ලබන යම් කොටස් හෝ ක්‍රියාවේ යෙදිය හැකි යම් බලයක් නොසලකා හැරිය යුතු ය;

(ඈ) ඒ වෙනත් සමාගම විසින් හෝ එහි පාලිත සමාගම විසින් හෝ දරනු ලබන යම් කොටස් හෝ ක්‍රියාවේ යෙදිය හැකි යම් බලයක් ((ඇ) ඡේදයේ සඳහන් පරිදි දරන හෝ ක්‍රියාවේ යෙදිය හැකි යම් කොටස් හෝ බලයක් නොවන) අවස්ථාවෝචිත පරිදි ඒ වෙනත් සමාගමේ හෝ එහි පාලිත සමාගමේ සාමාන්‍ය ව්‍යාපාරයට මුදල් ණයට දීම ද ඇතුළත් නම් සහ කොටස් දැරීම හෝ බලය ක්‍රියාවේ යෙදීම ඒ ව්‍යාපාරයේ සාමාන්‍ය ක්‍රියාවලියේ දී එළඹෙන ලද ගනුදෙනුවක කාර්ය සඳහා ඇපකරයක් වශයෙන් පමණක් නම්, ඒ කොටස් හෝ බලය ඒ වෙනත් සමාගම විසින් දරනු නොලබන කොටස් ලෙස හෝ ක්‍රියාවේ යෙදිය නොහැකි බලයක් ලෙස සැලකිය යුතු ය.

මේ නිර්වචනයේ කාර්යය සඳහා "සමාගම" යන්නට සංස්ථාපිත මණ්ඩලයක් ඇතුළත් වේ ;

"වැඩ කරන දිනය" යන්නෙන් සෙනසුරාදා, ඉරිදා හෝ රජයේ නිවාඩු දිනයක් නොවන දිනයක් අදහස් වේ.

(2) මේ පනතේ කාර්ය සඳහා—

(අ) (i) යම් සමාගමක් වෙනත් සමාගමක පාලිත සමාගම හෝ පාලක සමාගම වන්නේ නම් ; හෝ

(ii) එම සමාගමේ පාලක සමාගම වෙනත් සමාගමක පාලක සමාගම වන්නේ නම් ; හෝ

(iii) එම සමාගම වෙනත් සමාගමකට සම්බන්ධතාවක් ඇති වෙනත් සමාගමක් සමග සම්බන්ධතාවක් දරයි නම්,

එවැනි සමාගමක් වෙනත් සමාගමක් සමග සම්බන්ධතාවක් දරන්නේ යයි සලකනු ලැබේ.

(ආ) සමාගමක නිලධරයකු විසින් පැහැර හැරීමක් කරනු ලැබ ඔහු දණ්ඩනයකට යටත් විය යුතු බවට මේ පනතේ යම් වගන්තියක් මගින් විධිවිධාන සලස්වා ඇති විටක, "ගෙවීම පැහැර හැර ඇති නිලධරයා" යන යෙදුමෙන් එම වගන්තියේ සඳහන් පැහැර හැරීම, ප්‍රතික්ෂේප කිරීම හෝ කඩ කිරීම සඳහා දැන දැනම සහ සිතාමතාම බලය පැවරූ හෝ අවසර දුන් සමාගමේ යම් අධ්‍යක්ෂවරයෙක්, කළමනාකාරවරයෙක්, ලේකම් වරයෙක් හෝ වෙනත් නිලධරයෙක් අදහස් වේ ; තව ද

(ඇ) (i) යම් ක්‍රියාවක් හෝ යෝජනාවක් සම්බන්ධයෙන් සම්බන්ධතා කණ්ඩායම් එකක් හෝ වැඩි ගණනක් සිටිය හැකි ය ; තව ද

(ii) (අ) අනෙක් කොටස් හිමියන්ට අදාළව නොව යම් පන්තියක කොටස් හිමියන් සම්බන්ධයෙන් පමණක් ක්‍රියා මාර්ගයක් ගනු ලැබුවහොත් ; හෝ

(ආ) එක් පන්තියක කොටස් හිමියන් සහ ඒ පන්තියේ වෙනත් කොටස් හිමියන් අතර යෝජනාවක් ප්‍රකාශිතව ම වෙන් කොට දක්වන්නේ නම්,

එම පන්තියේ කොටස් හිමියන් සම්බන්ධතා කණ්ඩායම් දෙකකට හෝ ඊට වැඩි ගණනකට බෙදේ.

(3) මේ පනතේ—

(අ) (i) සමාගමක කොටස් හිමියන් පිළිබඳව කරන ලද සඳහනකට, එක් කොටස් හිමියෙක් පමණක් සිටින සමාගමකට අදාළව එම කොටස් හිමියාට කරන ලද සඳහනක් ඇතුළත් වේ ;

(ii) සමාගමක අධ්‍යක්ෂවරුන්ට කරන ලද සඳහනකට එක් අධ්‍යක්ෂවරයෙක් පමණක් සිටින සමාගමක් සම්බන්ධයෙන් වන විට, ඒ අධක්ෂවරයාට කරන ලද සඳහනක් ඇතුළත් වේ ;

(ආ) පුද්ගල මණ්ඩලයක් හෝ සංස්ථාවක් හෝ සම්බන්ධයෙන් කර ඇති සඳහනකට තනි පුද්ගල සංස්ථාවක් පමණක් ඇතුළත් වන ලෙස තේරුම් නොගත යුතු අතර, එයට ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරනු ලැබූ සමාගමක් ද ඇතුළත් වන ලෙස තේරුම් ගත යුතු ය ;

(ඇ) පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, භාරගැනුම්කරුවකු පත් කළ තැනැත්තකු හෝ භාර ගැනුම්කරුවකු පත්කොට ඇත්තේ යම් තැනැත්තකුගේ අර්ථලාභය සඳහා ද එවැනි තැනැත්තකු සම්බන්ධයෙන් කර ඇති සඳහනකට, ඒ භාරගැනුම්කරු පත් කරන ලද්දේ යම් ඔප්පුවක් හෝ ගිවිසුමක් හෝ මගින් ද නැතහොත් ඒ යටතේ ද ඒ ඔප්පුව හෝ ගිවිසුම හෝ යටතේ අයිතිවාසිකම් සහ සම්බන්ධතා මාරු කොට හෝ පවරා හෝ ඇති තැනැත්තා සම්බන්ධයෙන් කරන ලද සඳහනක් ඇතුළත් වේ.

(4) මේ පනත යටතේ යම් කරුණක් පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමක් කිරීමට නියමිතව ඇති අවස්ථාවක, එම කරුණ පිළිබඳ දැන්වීම—

(අ) අවම වශයෙන් ගැසට් පත්‍රයේ එක් කලාපයක පළ කිරීමෙන් ; සහ

(ආ) (i) සමාගමේ ව්‍යාපාර ස්ථානය පිහිටි ප්‍රදේශයේ ;

(ii) සමාගමට ව්‍යාපාර ස්ථාන එකකට වැඩි ගණනක් ඇත්නම්, සමාගමේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පිහිටි ප්‍රදේශයේ ; හෝ

(iii) සමාගමට ව්‍යාපාරික ස්ථානයක් නොමැති නම් හෝ එහි ප්‍රධාන ව්‍යාපාරික ස්ථානයේ හෝ වෙනයම් ව්‍යාපාරික ස්ථානයක පිහිටීම, දැන්වීම කිරීමට නියමිත තැනැත්තා නොදනී නම්, සමාගමේ ලියාපදිංචි කාර්යාලය පිහිටි ප්‍රදේශයේ,

බෙදා හරිනු ලබන සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ දිනපතා පුවත්පතක අවම වශයෙන් එක් කලාපයකවත් පළ කිරීමෙන් ඒ දැන්වීම කරනු ලැබිය යුතු ය.

## අන්තර්කාලීන විධිවිධාන හා ශේෂ කිරීම්

**530**. (1) අර්ථ නිරූපණ ආඥාපනතේ 5 වන හා 10 වන වගන්තිවල අන්තර්ගත විධිවිධානවලට හානියක් නොමැතිව,– අන්තර්කාලීන විධිවිධාන.

(අ) සමාගම්වලට අදාළ කලින් වූ යම් ලිඛිත නීතියක් ඉවත් කිරීම, සමාගම්වලට අදාළ එකී ලිඛිත නීතිය යටතේ පනවනු ලැබූ යම් ආඥාවක්, රීතියක්, නියෝගයක්, ගාස්තු පරිමාණයකට, කරනු ලැබූ පත්වීමක්, කරනු ලැබූ හිමිකරදීමක්, උකසක්, සාදනු ලැබූ ඔප්පුවක් හෝ ගිවිසුමක්, සම්මතකරනු ලැබූ යෝජනා සම්මතයක්, දෙනු ලැබූ විධානයක්, ඉදිරිපත් කරනු ලැබූ නඩු කටයුත්තක්, නිකුත් කරනු ලැබූ සාධන පත්‍රයක් හෝ කරන ලද යම් දෙයක් කෙරෙහි බල නොපෑ යුතුය. තව ද එවැනි යම් ආඥාවක්, රීතියක්, නියෝගයක්, ගාස්තු පරිමාණයක්, පත්වීමක්, හිමිකරදීමක්, උකසක්, ඔප්පුවක්, ගිවි සුමක්, යෝජනා සම්මතයක්, විධානයක්, නඩු කටයුත්තක්, සාධන පත්‍රයක් හෝ දෙයක් නියමිත දිනයේ දී වලංගුව තිබුණේ නම් එය දිගටම වලංගුව පැවතිය යුතු අතර, මේ පනත යටතේ එය පැනවීම, සකස්කිරීම, සම්මත කිරීම, දීම, ඉදිරිපත් කිරීම,

නිකුත් කිරීම හෝ කිරීම කළ හැකිව තිබූ යම් ප්‍රමාණයකට, මේ පනතේ විධිවිධාන යටතේ සකස් කරනු ලැබූ, සම්මත කරනු ලැබූ, දෙනු ලැබූ, ඉදිරිපත් කරනු ලැබූ, නිකුත් කරනු ලැබූ හෝ කරනු ලැබූ පරිදි එය බලාත්මක විය යුතු ය ;

(ආ) සමාගම්වලට අදාළ කලින් වූ යම් ලිඛිත නීතියක් ගැන සඳහන් කරනු ලබන යම් ලේඛනයක් මේ පනතේ අනුරූප විධිවිධාන ගැන සඳහන් කරනු ලබන ලෙස තේරුම් ගනු ලැබිය යුතු ය ;

(ඇ) සමාගම්වලට අදාළ කලින් වූ යම් ලිඛිත නීතියක් යටතේ හෝ ඒ ප්‍රකාර, යම් ධුරයකට පත් කරනු ලැබූ යම් තැනැත්තකු, මේ පනතේ විධිවිධාන යටතේ හෝ ඒ ප්‍රකාර ඒ ධුරයට පත් කරනු ලැබූවකු ලෙස සැලකිය යුතු ය ;

(ඈ) සමාගම්වලට අදාළ කලින් වූ යම් ලිඛිත නීතියක් යටතේ තබා ගත් යම් රෙජිස්ටරයක්, මේ පනතේ විධිවිධානවල අනුරූප විධිවිධාන යටතේ තබාගත යුතු රෙජිස්ටරයේ කොටසක් ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ඉ) මේ පනතේ විධිවිධාන යටතේ සංස්ථාපනය කරනු ලැබූ සියලු අරමුදල් හා ගිණුම්, සමාගම්වලට කලින් වූ අදාළ ලිඛිත නීතිය යටතේ සංස්ථාපනය කරනු ලැබූ අනුරූප අරමුදල් හා ගිණුම් පවත්වාගෙන යාමක් ලෙස සැලකිය යුතු ය.

(2) මේ වගන්තියෙහි "සමාගම්වලට අදාළ කලින් වූ ලිඛිත නීතිය" යන යෙදුමෙන් (145 වන අධිකාරය වූ) සමාගම් ආඥාපනත මගින් ඉවත් කරනු ලැබූ යම් ලිඛිත නීතියක් හෝ 1982 අංක 17 දරන සමාගම් පනත හෝ අදහස් වේ.

(3) 532 වන වගන්තියේ සඳහන් නඩු, නීති කෘත්‍ය හෝ කාරණා හැර මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව වූ දිනයේ දී දිසා අධිකරණයේ පවතින සියලු නඩු, නීති කෘත්‍යයන් හෝ කාරණා, මේ පනතේ අර්ථනිරූපණය කර ඇති පරිදි වූ අධිකරණය වෙත යවනු ලැබිය යුතු අතර, එම නඩු, නීති කෘත්‍ය හෝ කාරණ, අධිකරණමය වශයෙන් සැලකිල්ලට ගෙන, විභාග කොට තීරණය කිරීමට හෝ දිගටම පවත්වා, ගෙන ගොස් නිම කිරීමට එම අධිකරණයට අධිකරණ බලය තිබිය යුතු ය :

එසේ වුව ද, මේ පනත ක්‍රියාත්මක වූ දිනයට පෙරාතුව වූ දිනයේ දී සාක්ෂි ලබාගැනීම දිසා අධිකණයේ දී ආරම්භ වී ඇති එවැනි යම් නඩුවක්, නීති කෘත්‍යයක් හෝ කාරණයක් එම දිසා අධිකරණය විසින් විභාග කොට තීරණය කළ යුතු ය.

**531**. මේ පනතේ කිසිවක්— ශේෂ කිරීම්.

(අ) (145 වන අධිකාරය වූ) සමාගම් ආඥාපනත හෝ 1982 අංක 17 දරන සමාගම් පනත හෝ මේ පනත හෝ මගින් ඉවත් කරනු ලැබූ යම් ලිඛිත නීතියක් යටතේ ලියාපදිංචි කළ යම් සමාගමක් සංස්ථාගත කිරීමට ;

(ආ) 1861 සංයුක්ත ස්කන්ධ සමාගම් ආඥාපනතේ උපලේඛනයේ "ඇ" කොටස හෝ එහි යම් කොටසක්, නියමිත දිනයේ දී පවත්නා යම් සමාගමකට අදාළවන තාක් දුරට ;

(ඇ) 1897 සංයුක්ත ස්කන්ධ බැංකු ආඥාපනතේ උපලේඛනයේ "ආ" වක්‍රය හෝ එහි යම් කොටසක්, නියමිත දිනයේ දී පවත්නා යම් සමාගමකට අදාළ වනතාක් දුරට ;

(ඈ) (145 වන අධිකාරය වූ) සමාගම් ආඥාපනතේ පළමුවන උපලේඛනයේ "අ" සහ "ඇ" වක්‍ර හෝ ඒවායේ යම් කොටසක්, නියමිත දිනයේ දී පවත්නා යම් සමාගමකට අදාළ වනතාක් දුරට ;

(ඉ) 1982 අංක 17 දරන සමාගම් පනතේ පළමුවන උපලේඛනයේ "අ" සහ "ඇ" වක්‍ර හෝ ඒවායේ යම් කොටසක්, නියමිත දිනයේ දී පවත්නා යම් සමාගමකට අදාළවන තාක් දුරට,

බල නොපෑ යුතු ය.

**532**. (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව නියමිත දිනයට පෙර ගණන් බේරා වසා දැමීම ආරම්භ කළ යම් සමාගමකට, ගණන් බේරා වසා දැමීම සම්බන්ධයෙන් වූ මේ පනතේ විධිවිධාන අදාළ නොවිය යුතු ය. ඒ සෑම සමාගමක් ම මේ පනත පනවා නොතිබුණු ආකාරයෙන් හා එසේ පනවා නොතිබුණේ නම්, ඇතිවිය හැකි ප්‍රතිඵලම සහිතව ගණන් බේරා වසා දැමිය යුතු ය. තව ද, ගණන් බේරා වසාදැමීම ආරම්භ කළේ යම් ලිඛිත නීතියක් යටතේ ද, ඒ ලිඛිත නීතිය සම්පූර්ණයෙන් වලංගුව පවත්නා ලෙස ඒ ගණන් බේරා වසා දැමීමේ කාර්යය සඳහා, සලකනු ලැබිය යුතු ය. ගණන් බේරා වසා දැමීම සඳහා පවත්නා නඩු කටයුතු සඳහා ශේෂ කිරීම්.

(2) (1) වන උපවගන්තියට අනුකූලව යම් සමාගමක් ගණන් බේරා වසා දමනු ලබන අවස්ථාවක, රෙජිස්ට්‍රාර් විසින් හෝ සමාගමේ යම් ණය හිමියකු විසින් හෝ කරනු ලැබූ ඉල්ලීමක් මත සහ අවස්ථානුගත කරුණු අනුව එසේ කිරීම යෝග්‍ය බව අධිකරණයේ මතය වූ අවස්ථාවක,

අධිකරණය විසින්, ඈවර කිරීම සම්බන්ධයෙන් මේ පනතේ යම් නිශ්චිත විධිවිධානයක් ඒ සමාගම ගණන් බේරා වසා දැමීම සම්බන්ධයෙන් අදාළ විය යුතු යයි ආඥා කරනු ලැබිය හැකි අතර, ඒ විධිවිධානය අදාළ කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය යයි අධිකරණයට පෙනී යන ආනුෂංගික හෝ පරිපූරක විධාන අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය. තව ද, අධිකරණය විසින් එවැනි යම් ආඥාවක් කරනු ලැබූ අවස්ථාවක, එවැනි යම් විධානවලට යටත්ව, ආඥාවේ සඳහන් කරනු ලැබූ මේ පනතේ යම් විධිවිධානයක් ඒ අනුව අදාළ විය යුතු ය.

## XXIII වන කොටස

## ඉවත් කිරීම් සහ සංශෝධන

ඉවත් කිරීම්.

**533**. (1) 1982 අංක 17 දරන සමාගම් පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) 1974 අංක 19 දරන සමාගම් (විශේෂ විධිවිධාන) පනත සහ ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 9 දරන විදේශ සමාගම් (විශේෂ විධිවිධාන) පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

1996 අංක 10 දරන පනතේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

**534**. 1996 අංක 10 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනතේ පළමුවන උපලේඛනය එකී උපලේඛනයේ (2) වන අයිතම වෙනුවට පහත දැක්වෙන අයිතම ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(2) 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ වූ සියලු ඉල්ලුම්පත්‍ර සහ නඩු කටයුතු.".

පළමුවන උපලේඛනය (14 වන වගන්තිය)

## ආදර්ශ ව්‍යවස්ථා

අ. කොටස්

### 1. කොටස් නිකුත් කිරීම.

(1) මේ ව්‍යවස්ථාවල 1(2) වන සහ 1(3) වන ව්‍යවස්ථාවලට යටත්ව, මණ්ඩලය විසින් පනතේ 51 වන වගන්තියට අනුකූලව සුදුසු යයි සලකන යම් තැනැත්තන් වෙත කොටස් කිසිවක් නිකුත් කරනු ලැබිය හැකි ය. පනතේ 49 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් අයිතිවාසිකම් නොවන අයිතිවාසිකම් කිසිවක් කොටස් මගින් පවරා දෙන හෝ දරන්නා වෙත බැඳීමක් ඇති කරන හෝ අවස්ථාවක දී 51 වන වගන්තියේ (2) වන උපවගන්තියෙන් නියමකරනු ලැබ ඇති පරිදි කොටස්වලට සම්බන්ධ අයිතිවාසිකම් හා බැඳීම් සඳහන් කරමින් කොටස් නිකුත් කිරීම පිළිබඳ නියමයන් මණ්ඩලය විසින් අනුමත කරනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලය විසින්, කොටස් නිකුත් කිරීමට පෙරාතුව, කොටස් නිකුත් කරනු ලබන්නේ යම් ප්‍රතිෂ්ඨාවකට ද ඒ ප්‍රතිෂ්ඨාව පිළිබඳව තීරණය කරනු ලැබිය යුතු ය. ප්‍රතිෂ්ඨාව සමාගමට සහ දැනට සිටින සියලු කොටස් හිමියන්ට සාධාරණ හා යුක්ති සහගත විය යුතු ය.

(3) පවත්නා කොටස් සමග සම තත්ත්වයෙහිලා සැලකෙන්නා වූ හෝ ඊට පෙරාතුව වූ හෝ කොටස් සමාගම විසින් නිකුත් කරනු ලබන්නා වූ අවස්ථාවක, ඒ කොටස් පවත්නා කොටස් දරන්නන් වෙත අර්පණය කළ යුතු ය. එය පිළිගන්වනු ලැබිය යුත්තේ ඔවුන් විසින් ඒවා පිළිගනු ලැබුවහොත්, ඒ කොටස් හිමියන්ගේ, සාපේක්ෂ ඡන්දය දීමේ හා බෙදාහැරීමේ අයිතිවාසිකම් පවත්වාගෙන යා හැකි පරිදිය. අර්පණය, පිළිගැනීම සඳහා යුක්ති සහගත කාලයක් විවෘතව තැබිය යුතු ය.

### 2. කොටස් ඇරයුම්.

(1) කොටසක් මගින් මුදල් ප්‍රමාණයක් ගෙවිය යුතු යයි දරන්නා මත යම් බැඳීමක් පනවනු ලබන අවස්ථාවක,–

(අ) ඒ නියම කරන ලද දිනයේ දී දරන්නා විසින් ඒ මුදල් ප්‍රමාණය ගෙවනු ලැබිය යුතු ය ;

(ආ) එසේ කළ යුතු යයි මණ්ඩලය විසින් ඉල්ලා සිටිනු ලැබූ විටෙක, වැඩකරන දින විස්සකට නොඅඩු වූ නිශ්චිත කාල පරිච්ඡේදයක් ඇතුළත ගෙවීම කළ යුතු බවට නියම කෙරෙමින් වූ ලිඛිත දැන්වීමක් කවර වූ හෝ අවස්ථාවක දී මණ්ඩලය විසින් දරන්නා වෙත කරනු ලැබිය හැකි අතර, ඒ දැන්වීමට අනුකූලව ගෙවීම කරනු ලැබිය යුතු ය. නියමිත දිනට ගෙවනු නොලැබූ යම් ප්‍රමාණයකට දිනපතා එකතුවන සියයට දහයට වැඩි නොවූ, මණ්ඩලය විසින් නියම කරනු ලබන අනුපාතයක පොලියක් ගෙවනු ලැබිය යුතු ය. පොලිය ගෙවීම මණ්ඩලය විසින් අත්හරිනු ලැබිය හැකි ය.

(2) කොටසක හවුල් දරන්නන්, මේ ව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ කළ යුතු ගෙවීම් කිසිවක් සම්බන්ධයෙන් එක්ව හා වෙන් වෙන්ව වගකිය යුතු ය.

(3) 1 ව්‍යවස්ථාවේ (1) වන ඡේදය අදාළ වන්නා වූ සෑම කොටසක් විෂයයෙහි ම සහ, ඒ කොටස සම්බන්ධයෙන් සමාගමට දැනට අයවිය යුතු හා ගෙවිය යුතු සියලු මුදල් වෙනුවෙන් ඒ කොටස සම්බන්ධයෙන් ගෙවිය යුතු සෑම බෙදා හැරීමකට ම, සමාගමට කැප අයිතියක් ඇත්තේ ය.

(4) සමාගමට කැප අයිතියක් ඇත්තා වූ කොටස් කිසිවක්, සුදුසු යයි මණ්ඩලය සලකන යම් ආකාරයකින් විකිණීම,–

(අ) එසේ කිරීමට සමාගම තුළ පවත්නා අදහස පිළිබඳ ලිඛිත දැන්වීමක්, සමාගම විසින් කොටස් හිමියා වෙත කරනු ලැබ ඇත්නම් ; සහ

(ආ) ඒ දැන්වීම කිරීමෙන් වැඩ කරන දින දහයක් ඇතුළත, කැප අයිතිය උද්ගතව ඇත්තා වූ ගෙවීම කිරීමට කොටස් හිමියා අපොහොසත් වී ඇත්නම්,

සමාගම විසින් කරනු ලැබිය හැකි ය.

ගැනුම්කරු වෙනුවෙන් අත්සන් කිරීම මණ්ඩලය විසින් පත් කරන ලද යම් තැනැත්තකු විසින් කරනු ලැබිය හැකි අතර, පැවරූ කොටස් දරන්නා වශයෙන් ගැනුම්කරු ලියාපදිංචි කරනු ලැබිය යුතු අතර, විකිණීමේ දී සිදුවන යම් අක්‍රමිකතාවක් හෝ නිර්බලවීමක් ඔහුගේ හිමිකම කෙරෙහි බල නොපෑ යුතු ය.

(5) මේ ව්‍යවස්ථාවේ (4) වන ඡේදය යටතේ විකිණීමකින් ලත් මුදල් සමාගම විසින් ලබා ගත යුතු ය. තව ද විකිණීමේ වියදම් ගෙවීම සඳහා ඒ මුදල් ප්‍රථමයෙන් යෙදවිය යුතු අතර, කැප අයිතිය උද්ගත වූයේ යම් මුදල් ප්‍රමාණයක් සම්බන්ධයෙන් ද ඒ මුදල් ප්‍රමාණය ගෙවීම සඳහා අනතුරුව ඒ මුදල් යෙදවිය යුතු ය. ඉතිරිය විකිණීම සිදු කරන අවස්ථාවේ කොටස්වලට හිමිකම ඇති තැනැත්තාට ගෙවනු ලැබිය යුතු ය.

## 3. බෙදාහැරීම්

(1) පනතේ 56 වන වගන්තියට අනුකූලව, සමාගම විසින් කොටස් හිමියන් වෙත බෙදා හැරීම් කරනු ලැබිය හැකි ය. 3(2) වන ව්‍යවස්ථාවට යටත්ව සෑම ලාභාංශයක් ම මණ්ඩලය විසින් සහ කොටස් හිමියන්ගේ සාමාන්‍ය යෝජනා සම්මතයක් මගින් අනුමත කරනු ලැබිය යුතු ය. බෙදා හැරීමෙන් ඉක්බිතිව ම, සමාගම විසින් ණය ගෙවිය හැකි භාවය පිළිබඳ පරීක්ෂාව සපුරාලනු ඇති බවට මණ්ඩලය සෑහීමට පත්විය යුතු ය. බෙදා හැරීමට පක්ෂව ඡන්දය දෙන අධ්‍යක්ෂවරුන් විසින්, ඒ බවට ස්වකීය මතය පිළිබඳ සහතිකයක් අත්සන් කරනු ලැබිය යුතු ය.

(2) කොටස් හිමියන්ගේ සාමාන්‍ය යෝජනා සම්මුතියක් මගින් අනුමත කිරීමේ අවශ්‍යතාවක් නොමැතිව සමාගමේ ලාභවලින් කොටස් හිමියන් වෙත අතුරු ලාභාංශයක් ගෙවීම සාධාරණ යයි පෙනී යන අවස්ථාවක, මණ්ඩලය විසින් කලින් කල එය අනුමත කරනු ලැබිය හැකි ය. අතුරු ලාභාංශය ගෙවනු ලැබීමෙන් ඉත්බිතිව ම, සමාගම විසින් ණය ගෙවිය හැකි භාවය පිළිබඳ පරීක්ෂාව සපුරාලන බවට මණ්ඩලය සෑහීමට පත්විය යුතු ය. අතුරු ලාභාංශයට පක්ෂව ඡන්දය දෙන අධ්‍යක්ෂවරුන් විසින්, ඒ සම්බන්ධයෙන් වූ තම මතය පිළිබඳ සහතිකයක් අත්සන් කරනු ලැබිය යුතු ය.

(3) සමාගමකට,–

(අ) සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවල දී, එහි ණය, ඒවා අයවිය යුතු අවස්ථාවල දී ගෙවිය හැකි නම් ; සහ

(ආ) එහි වත්කම්වල වටිනාකම, එහි බැඳීම් හා එහි ප්‍රකාශිත ප්‍රාග්ධනයේ මුළු වටිනාකමට වඩා වැඩි නම්,

සමාගම ණය ගෙවිය හැකි භාවය පිළිබඳ පරීක්ෂාව සපුරාලූ ලෙස සලකනු ලැබිය යුතු ය.

### 4 කොටස් රෙජිස්ටරය, කොටස් සහතික සහ පැවරීම හා කොටස් ප්‍රේෂණය.

(1) පනතේ 123 වන වගන්තියට අනුකූලවන කොටස් රෙජිස්ටරයක් සමාගම විසින් පවත්වාගෙන යා යුතු ය. කොටස් රෙජිස්ටරය සමාගමේ ලියාපදිංචි කාර්යාලයෙහි හෝ මේ පනතේ 124 වන වගන්තියේ (4) වන උපවගන්තියට අනුකූලව රෙජිස්ට්‍රාර් වෙත දැනුම්දීමක් කර ඇත්තා වූ, ශ්‍රී ලංකාවේ වෙනත් යම් ස්ථානයක හෝ තැබිය යුතු ය.

(2) කොටස් පැවරිය යුතු වන අවස්ථාවක, දරන්නා විසින් හෝ ඔහුගේ නීත්‍යානුකූල නියෝජිතයා විසින් අත්සන් කරන ලද පැවරීමේ ආකෘතියක් සමාගම වෙත භාරදිය යුතු ය. කොටස මගින්, එය දරන්නා වෙත යම් වගකීමක් පැවරේ නම්, පැවරුම්ලාභියා විසින් පැවරීම අත්සන් කරනු ලැබිය යුතු ය.

(3) පවරනු ලැබූ කොටස සම්බන්ධයෙන් සමාගමට ගෙවිය යුතු යම් මුදලක් ගෙවා නොමැති නම් එවැනි කොටසක් පැවරීම ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීමේ යෝජනා සම්මතයක්, එම පැවරීම ලැබී සති හයක් තුළ දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබිය හැකි ය. මේ හේතුව නිසා පැවරීමක් ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීම මණ්ඩලය සම්මත කරන්නේ නම්, ඒ සම්මතයේ දින සිට සතියක් ඇතුළත කොටස් හිමියා වෙත ඒ ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ දැනුම් දීමක් කරනු ලැබිය යුතු ය.

(4) කොටසක හවුල් දරන්නකු මිය යන අවස්ථාවක, ඉතිරි වූ දරන්නන්, ඒ කොටස දරන්නන් වශයෙන් සමාගම විසින් සලකනු ලැබිය යුතු ය. යම් කොටසක එකම දරන්නා මිය යන අවස්ථාවක, කොටසේ යම් හිමිකමක් හෝ සම්බන්ධතාවක් ඇති තැනැත්තා ලෙස සමාගම විසින් පිළිගනු ලබන එකම තැනැත්තා ඒ කොටස් හිමියාගේ නීත්‍යානුකූල නියෝජිතයා, විය යුතු ය.

(5) කොටස් හිමියකුගේ මරණය, බුන්වත්වීම, වස්තු භංගත්වය හෝ අශක්නුතාවේ ප්‍රතිඵලයක් වශයෙන් කොටසක හිමිකමට පත්වන යම් තැනැත්තකු ඒ කොටස් හිමියාගේ කොටස් දරන්නා වශයෙන් ලියා පදිංචිවීම සඳහා ඒ හිමිකම පිළිබඳව මණ්ඩලය සෑහීමකට පත්වන සාධක ඇතිව ලියවිල්ලකින් වූ ඉල්ලීමක් සමාගම වෙත කරනු ලැබූ විට, එසේ ලියාපදිංචි කරනු ලැබිය හැකි ය. මේ ව්‍යවස්ථාවේ (3) වන ඡේදයේ දක්වා ඇති අවස්ථානුගත කරුණු අනුව, මේ ව්‍යවස්ථාව යටතේ පැවරීමක ලියාපදිංචි කිරීම, මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(6) සමාගම විසින් කොටස් නිකුත් කරනු ලබන්නා වූ හෝ කොටස් කිසිවක් පැවරීම කොටස් රෙජිස්ටරයේ ඇතුළත් කරනු ලැබ ඇත්තා වූ හෝ අවස්ථාවක, සමාගම විසින්, මාස දෙකක් ඇතුළත කොටස් සම්බන්ධයෙන් වූ කොටස් සහතිකයක් සම්පූර්ණ කර, භාරදීම සඳහා සූදානම්කර තැබිය යුතු ය.

ආ. කොටස් හිමියන්ගේ රැස්වීම්

### 5. කොටස් හිමියන්ගේ රැස්වීම්වලට අදාළ රීති

කොටස් හිමියන්ගේ රැස්වීමක් මගින්, ස්වකීය කාර්ය පටිපාටිය, මේ ව්‍යවස්ථා මගින් පාලනය නොවන තාක් දුරට නිශ්චය කරනු ලැබිය හැකි ය.

### 6. රැස්වීම් පිළිබඳ දැන්වීම

(1) කොටස් හිමියන්ගේ රැස්වීමක් පැවැත්වෙන වේලාව හා ස්ථානය පිළිබඳ ලිඛිත දැන්වීමක්, රැස්වීම පිළිබඳ දැන්වීම ලැබීමට හිමිකම ඇති සෑම කොටස් හිමියකුට ම සමාගමේ සෑම අධ්‍යක්ෂවරයකුට සහ විගණකවරයකුට ම–

(අ) සමාගම පෞද්ගලික සමාගමක් නොවේ නම් සහ රැස්වීමේ දී විශේෂ යෝජනා සම්මතයක් වශයෙන් යෝජනා සම්මතයක් යෝජනා කිරීමට අදහස් කෙරේ නම්, රැස්වීමට වැඩකරන දින පහළොවකට නොඅඩු කාලයකට පෙර ;

(ආ) වෙන යම් අවස්ථාවක දී නම් රැස්වීමට වැඩකරන දින දහයකට නොඅඩු කාලයකට පෙර,

දිය යුතු ය.

(2) දැන්වීමෙහි–

(අ) රැස්වීමේ දී කෙරෙන කටයුතුවලට අදාළව කොටස් හිමියකුට හේතු සහගත විනිශ්චයකට එළඹිය හැකිවන පරිදි, ප්‍රමාණවත් විස්තර සහිතව රැස්වීම් කටයුතුවල ස්වභාවය ; සහ

(ආ) රැස්වීමේ දී ඉදිරිපත් කෙරෙන යම් යෝජනාවක පාඨය,

දැක්විය යුතු ය.

(3) යම් රැස්වීමකට පැමිණ ඡන්දය දීමට හිමිකමක් ඇති සියලුම කොටස් හිමියන් ඒ රැස්වීම පිළිබඳ යම් අක්‍රමිකතාවක් පිළිබඳ විරෝධතාවක් නොමැතිව රැස්වීමට පැමිණේ නම් හෝ ඒ අක්‍රමිකතාව අත් හැරීමට ඒ සියලුම කොටස් හිමියන් එකඟ වේ නම්, ඒ රැස්වීම පිළිබඳ දැන්වීමේ ඇති අක්‍රමිකතාවක් අතහැර දැමුවා නම් වේ.

(4) කොටස් හිමියන්ගේ රැස්වීමක් දින තිහකට අඩු කාලයක් සඳහා අඩාළව කල් තැබුවහොත්, අඩාළව කල් තැබූ රැස්වීමේ දී කරනු ලබන දැනුම්දීමක් මගින් හැර, අඩාළව කල් තැබූ රැස්වීමේ වේලාව හා ස්ථානය පිළිබඳ දැන්වීමක් කිරීම අවශ්‍ය නොවේ.

### 7. රැස්වීම් පැවැත්වීමේ ක්‍රම

කොටස් හිමියන්ගේ රැස්වීමක්–

(අ) ගණපූරණයක් සංස්ථාපනය කෙරෙන කොටස් හිමියන්ගේ සංඛ්‍යාවක් රැස්වීම සඳහා නියමිත ස්ථානයේ, නියමිත දින හා වේලාවට යටත්ව රැස්වීමෙන් ; හෝ

(ආ) සියලු කොටස් හිමියන් සහභාගිවීමෙන් ගණපූරණයක් සංස්ථාපනය කෙරෙන, රැස්වීම පුරාම එකිනෙකාට සමගාමීව සවන් දිය හැකි ශ්‍රව්‍ය හෝ ශ්‍රව්‍ය-දෘශ්‍ය සංනිවේදන මගින්,

පවත්වනු ලැබිය හැකි ය.

## 8. ගණපූරණය

(1) ගණපූරණයක් නොමැත්තේ නම්, මේ ව්‍යවස්ථාවේ (3) වන ඡේදයට යටත්ව, කොටස් හිමියන්ගේ රැස්වීමක කිසිම ව්‍යාපාර කටයුත්තක් කරනු නොලැබිය යුතු ය.

(2) රැස්වීමේ දී සාකච්ඡාවට භාජනය කළ යුතු කරුණු සම්බන්ධයෙන් ලැබිය යුතු ඡන්ද බහුතරයක් ප්‍රකාශ කිරීමේ හැකියාව ඇත්තා වූ කොටස් හිමියන් හෝ ඔවුන්ගේ ප්‍රතියුක්තයන් හෝ පැමිණ සිටී නම්, කොටස් හිමියන්ගේ රැස්වීමක් සඳහා ගණපූරණයක් ඇත්තේ ය.

(3) රැස්වීම සඳහා නියමිත වේලාවෙන් පසු මිනිත්තු තිහක් ඇතුළත ගණපූරණයක් නොමැති වුවහොත්, රැස්වීමට පසුව එළඹෙන සතියේ එම දිනයේ ම එම වේලාවේ සහ ස්ථානයේ දී ම හෝ අධ්‍යක්ෂවරුන් විසින් නියම කරනු ලැබිය හැකි වෙනත් දිනක, වේලාවක හා ස්ථානයක පැවැත්වීම සඳහා රැස්වීම අඩාළව කල් තබනු ලැබේ. අඩාළව කල් තැබූ රැස්වීමේ දී, රැස්වීම සඳහා නියමිත වේලාවෙන් පසු මිනිත්තු තිහක් ඇතුළත ගණපූරණයක් ඇති නොවුවහොත්, පැමිණ ඇති කොටස් හිමියන්ගෙන් හෝ ඔවුන්ගේ ප්‍රතියුක්තයන්ගෙන් ගණපූරණයක් ඇතිවන සේ සලකනු ලැබිය යුතු ය.

## 9. සභාපති

(1) අධ්‍යක්ෂවරුන් විසින් මණ්ඩලයේ සභාපතිවරයකු තෝරාපත් කර ගනු ලැබුවහොත්, සහ මණ්ඩලයේ සභාපතිවරයා කොටස් හිමියන්ගේ රැස්වීමකට පැමිණියහොත්, ඔහු හෝ ඇය රැස්වීමේ මුලසුන දැරිය යුතු ය.

(2) මණ්ඩලයේ සභාපතිවරයකු තෝරා පත් කර ගනු නොලැබුවහොත් හෝ කොටස් හිමියන්ගේ යම් රැස්වීමක දී, රැස්වීම සඳහා නියමිත වේලාවේ සිට මිනිත්තු පහළොවක් ඇතුළත මණ්ඩලයේ සභාපතිවරයා නොපැමිණියහොත් පැමිණි කොටස් හිමියන් විසින් පැමිණි සංඛ්‍යාවෙන් කෙනෙකු රැස්වීමේ සභාපති වශයෙන් තෝරා ගනු ලැබිය යුතු ය.

## 10. ඡන්දය දීම

(1) 7 වන ව්‍යවස්ථාවේ (අ) ඡේදය යටතේ පවත්වනු ලබන කොටස් හිමියන්ගේ රැස්වීමක් සම්බන්ධයෙන් වන විට, ඡන්ද විමසීමක් ඉල්ලුවහොත් මිස, රැස්වීමේ සභාපතිවරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි, රැස්වීමේ දී ඡන්දය දීම පහත දැක්වෙන ක්‍රම අතුරෙන් කවර වූ හෝ ක්‍රමයක් මගින් සිදු කළ යුතු ය :—

(අ) කටහඬ මගින් ඡන්දය දීමෙන් ; හෝ

(ආ) අත් ඔසවා පෙන්වීම මගින් ඡන්දය දීමෙන්.

(2) 7 වන ව්‍යවස්ථාවේ (ආ) ඡේදය යටතේ පවත්වනු ලබන කොටස් හිමියන්ගේ රැස්වීමක් සම්බන්ධයෙන් වන විට, ඡන්ද විමසීමක් ඉල්ලා සිටිනු ලැබුවහොත් මිස, රැස්වීමේ දී ඡන්දය දීම, කොටස් හිමියන් විසින් ඔවුන්ගේ එකඟවීම හෝ එකඟ නොවීම එක් එක් තැනැත්තා වෙන් වෙන්ව තම කටහඬින් දැන්වීම මගින් සිදු කළ යුතු ය.

(3) අවශ්‍ය කරන බහුතරයෙන් යෝජනා සම්මතය සම්මත වී ඇති බවට රැස්වීමේ සභාපතිවරයා විසින් කරන ලද ප්‍රකාශයක්, මේ ව්‍යවස්ථාවේ (4) වන ඡේදයට අනුකූලව ඡන්ද විමසීමක් ඉල්ලනු ලැබුවහොත් මිස, තත් කාරණය සම්බන්ධයෙන් තීරණාත්මක සාක්ෂියක් විය යුත්තේ ය.

(4) කොටස් හිමියන්ගේ රැස්වීමක දී,–

(අ) රැස්වීමේ දී ඡන්දය දීමේ අයිතිය ඇති කොටස් හිමියන් පස් දෙනකුට නො අඩු සංඛ්‍යාවක් ; හෝ

(ආ) රැස්වීමේ දී ඡන්දය දීමේ අයිතිය ඇති සියලු කොටස් හිමියන්ගේ මුළු ඡන්දය දීමේ අයිතිවාසිකම්වලින් සියයට දහයකට නොඅඩුව නියෝජනය කරන කොටස් හිමියකු හෝ කොටස් හිමියන්,

විසින් ඡන්ද විමසීමක් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

(5) යෝජනා සම්මතයක් සම්බන්ධයෙන් ඡන්දය ගැනීමට පෙර හෝ ඡන්දය ගැනීමෙන් පසුව ඡන්ද විමසීමක් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

(6) ඡන්ද විමසීමක් කරනු ලැබුවහොත්, පැමිණ ඡන්දය දෙන එක් එක් කොටස් හිමියාගේ කොටස්වලට බැඳුනු ඡන්දවලට අනුව ඡන්ද ගණන් කරනු ලැබිය යුතු ය.

(7) කොටස් හිමියන්ගේ රැස්වීමක සභාපතිවරයා තීරක ඡන්දයක් සඳහා හිමිකම නොලබන්නේ ය.

## 11. ප්‍රතියුක්තයෝ

(1) කොටස් හිමියකු විසින්, පෞද්ගලිකව පෙනීසිටීමෙන් හෝ ප්‍රතියුක්තයකු මගින් හෝ ඡන්දය දීමේ අයිතිය ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(2) ප්‍රතියුක්තයා කොටස් හිමියකු වූ විටක පරිද්දෙන් රැස්වීමකට පැමිණ සිටීමේ සහ අදහස් දැක්වීමේ හිමිකම, කොටස් හිමියකුගේ ප්‍රතියුක්තයාට ඇත්තේ ය.

(3) කොටස් හිමියා විසින් අත්සන් කරන ලද ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් ප්‍රතියුක්තයකු පත් කරනු ලැබිය හැකි ය. පත්වීම යම් විශේෂ රැස්වීමක් සඳහා ද නැතහොත්, යම් නිශ්චිත කාලයක් සඳහා ද යන බව දැන්වීමෙහි ප්‍රකාශ විය යුතු ය.

(4) රැස්වීමකට අදාළ කිසිම ප්‍රතියුක්ත කිරීමක්, පත්වීම පිළිබඳ දැන්වීමේ පිටපතක්, රැස්වීම ආරම්භ කිරීමට පැය විසිහතරකට නොඅඩු කාලයකට පෙර සමාගම වෙත දුනහොත් මිස, බලාත්මක නොවන්නේ ය.

## 12. වාර්තා

(1) මණ්ඩලය විසින්, කොටස් හිමියන්ගේ රැස්වීම්වල සියලු කටයුතු පිළිබඳ වාර්තා තැබීමට වගබලා ගත යුතු ය.

(2) රැස්වීමේ සභාපතිවරයා විසින් නිවැරදි යයි අත්සන් කරන ලද වාර්තා රැස්වීම් කටයුතු පිළිබඳ බැලූ බැල්මට පෙනෙන සාක්ෂි වන්නේ ය.

## 13. කොටස් හිමිකරු යෝජනා

සමාගම වෙත යෝජනා සම්මත පිළිබඳ දැනුම්දීමක් කිරීමට හිමිකම ඇති කොටස් හිමියන් විසින් පනතේ 142 වන වගන්තියට අනුකූලව එසේ කරනු ලැබිය හැකි අතර, 142 වන වගන්තියට අනුකූලව, අවස්ථාවෝචිත පරිදි, යෝජනා සම්මතය පිළිබඳ

දැනුම් දීම හෝ ප්‍රකාශය බෙදා හැරීම හෝ ඒ කටයුතු දෙකම කිරීම සමාගමේ කාර්යය වන්නේ ය. සමාගමක් විසින් යෝජනා සම්මතයක් පිළිබඳ දැනුම්දීමක් කිරීම හෝ ප්‍රකාශයක් කිරීම 142 වන වගන්තියේ (4) වන හෝ (5) වන උපවගන්තිවල දක්වා ඇති අවස්ථානුගත කරුණු යටතේ අවශ්‍ය නොවන්නේ ය.

### 14. සංස්ථා විසින් නියෝජිතයන් මගින් ක්‍රියා කළ හැකි බව.

කොටස් හිමියකු වන පුද්ගල සංස්ථාවක් විසින්, එය වෙනුවෙන් ප්‍රතියුක්තයකු පත්කළ හැකි ආකාරයෙන් ම, කොටස්හිමියන්ගේ රැස්වීමක පෙනීසිටීම සඳහා නියෝජිතයකු පත් කරනු ලැබිය හැකි ය.

### 15. හවුල් කොටස් හිමියන්ගේ ඡන්ද

යම් කොටසක හිමියන් ලෙස තැනැත්තන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් ලියාපදිංචි කරනු ලැබ ඇති අවස්ථාවක, කොටස් ලේඛනයේ ප්‍රථමයෙන් නම් කරනු ලැබ, යම් කාරණයක් පිළිබඳව ඡන්දය දෙන තැනැත්තාගේ ඡන්දය, අනෙක් හවුල් කොටස් හිමියන්ගේ ඡන්ද බැහැර කොට පිළිගනු ලැබිය යුතු ය.

### 16. ඇරයුම් නොගෙවුවහොත්, ඡන්දය දීමේ අයිතිය නැතිවීම

කොටසක් සම්බන්ධයෙන් සමාගමට අයවිය යුතු මුදලක් ගෙවනු නොලැබුවහොත්, සම්බන්ධතා ඇති කණ්ඩායමක රැස්වීමක් නොවන කොටස් හිමියන්ගේ රැස්වීමක දී ඒ කොටස වෙනුවෙන් ඡන්දය දිය නොහැකි ය.

### 17. කොටස් හිමියන්ගේ වාර්ෂික රුස්වීම් සහ අතිවිශේෂ රුස්වීම්

(1) මේ ව්‍යවස්ථාවේ (2) වන සහ (3) වන ඡේදවලට යටත් ව, මණ්ඩලය විසින් සමාගමේ වාර්ෂික රැස්වීමක්,–

(අ) එක් එක් ලිත් වර්ෂයකට වරක් ;

(ආ) සමාගමේ ශේෂ දිනයෙන් පසු මාස හයක් පසු නොවී ; සහ

(ඇ) කලින් වාර්ෂික රැස්වීමට පසු මාස පහළොවක් පසු නොවී,

කැඳවනු ලැබිය යුතු ය.

රැස්වීම පැවැත්විය යුතු යයි කැඳවන ලද දින රැස්වීම පැවැත්විය යුතු ය.

(2) සමාගම විසින් එහි ප්‍රථම වාර්ෂික රැස්වීම එය සංස්ථාගත කරනු ලැබූ ලිත් වර්ෂයේ දී පැවැත්වීම අවශ්‍ය නොවන නමුත් ඒ රැස්වීම, සමාගම සංස්ථාගත කිරීමෙන් මාස දහඅටක් ඇතුළත පවත්වනු ලැබිය යුතු ය.

(3) කිසියම් විසඳිය යුතු ප්‍රශ්නයක දී ඡන්දය දීමට හිමිකම ඇති කොටස් හිමියන්ගේ අති විශේෂ රැස්වීමක්, මණ්ඩලය විසින් කවර වූ හෝ අවස්ථාවක දී කැඳවනු ලැබිය හැකි අතර, ඒ විසඳිය යුතු ප්‍රශ්නය මත දිය හැකි ඡන්දවලින් සියයට දහයකට නොඅඩු ප්‍රමාණයක් උසුලන කොටස් දරන්නා වූ කොටස් හිමියන්ගේ ලිඛිත ඉල්ලීමක් මත මණ්ඩලය විසින් ඒ රැස්වීම කැඳවනු ලැබිය යුතු ය.

(4) කොටස් හිමියන්ගේ රැස්වීමක දී යම් යෝජනා සම්මතයක් සම්බන්ධයෙන් දීමට හිමිකම ඇති ඡන්දවලින් සියයට අසූපහකට නොඅඩු ඡන්ද සංඛ්‍යාවක් එක්ව දරන්නා වූ ද ඡන්දය දීමට හිමිකම ඇති කොටස් හිමියන්ගෙන් සියයට අසූපහකට නොඅඩු වූ ද සංඛ්‍යාවක් විසින් අත්සන් කරන ලද්දා වූ ලියවිල්ලකින් වූ යෝජනා සම්මතයක් ඒ කොටස් හිමියන්ගේ රැස්වීමක දී සම්මත කරගත් යෝජනා සම්මතයක් පරිද්දෙන් වලංගු වන්නේ ය. ඒ රැස්වීමේ දී කළ යුතු සෑම දෙයක්ම (යෝජනා සම්මතයක් මගින් හෝ අන්‍යාකාරයකින්) මේ වගන්තියට අනුකූලව යෝජනා සම්මතයක් මගින් කරනු ලැබ ඇත්නම්, සමාගම විසින් වාර්ෂික රැස්වීමක් පැවැත්වීම අවශ්‍ය නොවන්නේ ය.

(5) මේ ව්‍යවස්ථාවේ (4) වන ඡේදය යටතේ යෝජනා සම්මතයක් සම්මත කිරීමෙන් වැඩ කරන දින පහක් ඇතුළත යෝජනා සම්මතයක පිටපතක් එයට අත්සන් නොතැබූ සෑම කොටස් හිමියකු වෙතම සමාගම විසින් යවනු ලැබිය යුතු ය.

(6) කොටස් හිමියන් වෙත යම් පූර්ව දැන්වීමක් නොකර මේ ව්‍යවස්ථාවේ (4) වන ඡේදය යටතේ යෝජනාවක් සම්මත කරනු ලැබිය හැකි ය.

### 18. සම්බන්ධතා ඇති කණ්ඩායම්වල ඡන්දය දීම

මේ පනතේ 99 වන වගන්තියේ අර්ථානුකූලව කොටස්වලට සම්බන්ධ අයිතිවාසිකම් කෙරෙහි බලපාන ක්‍රියාමාර්ගයක් ගැනීමට සමාගම යෝජනා කරන අවස්ථාවක, මේ පනතේ විග්‍රහ කරනු ලැබ ඇති පරිදි, එක් එක් සම්බන්ධතා ඇති කණ්ඩායමේ විශේෂ යෝජනාවක් මගින් එය අනුමත කරනු ලැබුවහොත් මිස, ක්‍රියාමාර්ගය ගත නොහැකි ය.

### 19. බෙදා හැරීම් ලැබීමට, පූර්වක්‍රය අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමට සහ රැස්වීම්වලට පැමිණ ඡන්දය දීමට හිමිකම ලබන කොටස් හිමියන්

(1) යම් කාර්යයක් සඳහා කොටස් හිමියන්ගේ රැස්වීමක දැන්වීම ලැබීමට හිමිකම ඇති කොටස් හිමියන් වනුයේ –

(අ) තත් කාර්යය සඳහා මණ්ඩලය විසින් දිනයක් නියම කරනු ලබන්නේ නම්, ඒ දිනයේ දී කොටස් ලේඛනයෙහි නම් ලියාපදිංචි කරනු ලැබූ කොටස් හිමියන් ; හෝ

(ආ) තත් කාර්යය සඳහා මණ්ඩලය විසින් දිනයක් නියම කරනු නොලබන්නේ නම්, දැන්වීම දුන් දිනයට පෙරාතුව ම වූ දින රැස්වීම් කටයුතු අවසානයේ දී කොටස් ලේඛනයෙහි නම් ලියාපදිංචි කරනු ලැබූ ඒ කොටස් හිමියන් ය.

(2) මේ ව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ නියමිත දිනයක්, රැස්වීම පැවැත්විය යුතු දිනයට වඩා වැඩ කරන දින තිහකට වඩා කලින් නොවිය යුතු ය.

(3) කොටස් හිමියන්ගේ රැස්වීමකට පෙරාතුව,–

(අ) මේ ව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ දිනයක් නියම කරනු ලැබ ඇත්නම්, ඒ දිනට පසුව, වැඩකරන දින දහයක් පසු නොවී ; හෝ

(ආ) එවැනි දිනයක් නියම කරනු ලැබ නැත්නම්, දැන්වීම කරනු ලැබූ දිනට පෙරාතුව ම වූ දින රැස්වීම් කටයුතු අවසානයේ දී,

රැස්වීමේ දැන්වීම ලැබීමට හිමිකම ඇත්තා වූ ද, අකාරාදී පිළිවෙලට සකස්කර, එක් එක් කොටස් හිමියා විසින් දරන කොටස් සංඛ්‍යාව දැක්වෙන්නා වූ ද කොටස් හිමියන්ගේ ලැයිස්තුවක් සමාගම විසින් පිළියෙල කරනු ලැබිය යුතු ය.

(4) (3) වන ඡේදය යටතේ පිළියෙල කරන ලද ලැයිස්තුවක නම සඳහන් තැනැත්තකුට,—

(අ) රැස්වීමේ දැන්වීම ලැබීමට හිමිකම ලැබූ කොටස් හිමියන් කවුරුන් දැ යි නිශ්චය කරනු ලැබූ දින පටන්, ඒ තැනැත්තා විසින් වෙනත් යම් තැනැත්තකුට තම කොටස්වලින් යම් කොටසක් පවරනු ලැබ ඇතිතාක් දුරට ; සහ

(ආ) ඒ කොටස්වල පැවරුම්ලාභියා ඒ කොටස්වල දරන්නා වශයෙන් ලියාපදිංචි කරනු ලැබ, රැස්වීම ආරම්භ කිරීමට පෙර, ඔහුගේ හෝ ඇගේ නම මේ ව්‍යවස්ථාවේ (3) වන ඡේදය යටතේ පිළියෙල කරන ලද ලැයිස්තුවේ ඇතුළත් කළ යුතු යයි ඉල්ලා ඇත්නම්,

ඒ හැර, රැස්වීමට පැමිණ, ඔහුගේ නමට ඉදිරියෙන් දක්වන ලද කොටස් සම්බන්ධයෙන් පෞද්ගලිකව හෝ ප්‍රතියුක්තයකු මගින් ඡන්දය දීමට හිමිකම ඇත්තේ ය.

(5) මේ ව්‍යවස්ථාවේ (3) වන ඡේදය යටතේ පිළියෙල කරන ලද ලැයිස්තුවක්, සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු කරන වේලාවන් තුළ දී කොටස් හිමියකු විසින් පරීක්ෂා කරනු ලැබිය හැකි ය.

ඇ. අධ්‍යක්ෂවරු සහ ලේකම්.

**20. අධ්‍යක්ෂවරුන් පත් කිරීම හා ඉවත් කිරීම.**

(1) කොටස් හිමියන් විසින් සාමාන්‍ය යෝජනා සම්මතයක් මගින් සමාගමේ අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව නියම කරනු ලැබිය හැකි ය.

(2) අධ්‍යක්ෂවරයකු පත් කිරීම හෝ ඉවත් කිරීම, ඒ කාර්යය සඳහා කැඳවන ලද රැස්වීමක දී සම්මත කර ගත් සාමාන්‍ය යෝජනා සම්මතයක් මගින් හෝ 17 වන ව්‍යවස්ථාවේ (4) වන අනුඡේදය ව්‍යවස්ථාවට අනුකූලව ලිඛිත යෝජනාවක් මගින් හෝ කරනු ලැබිය හැකි ය. සමාගම පෞද්ගලික සමාගමක් නම් මිස, —

(අ) යෝජනාව, එක් අධ්‍යක්ෂවරයකු පත්කිරීම සඳහා වන්නේ නම් ; හෝ

(ආ) යෝජනාව, තැනැත්තන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් අධ්‍යක්ෂවරුන් වශයෙන් පත් කිරීම සඳහා වන තනි යෝජනාවක් වන්නේ නම් සහ ඒ යෝජනාවට එසේ ඡන්දය ප්‍රකාශ කළ යුතු බවට වූ වෙනම යෝජනාවක් ඊට විරුද්ධව ඡන්ද ප්‍රකාශ කිරීමක් නොමැතිව පළමු කොට සම්මත කොට ගෙන තිබුණේ නම්,

පමණක් අධ්‍යක්ෂවරයකු පත්කිරීම සඳහා වූ යෝජනාවකට කොටස් හිමියන් විසින්, ඡන්දය දෙනු ලැබිය හැකි ය.

(3) අධ්‍යක්ෂවරයකු විසින් අත්සන් යොදන ලද ඉල්ලා අස්වීමේ ලිඛිත දැන්වීමක් සමාගමේ ලියාපදිංචි කාර්යාලයට භාරදීමෙන් ඉල්ලා අස්විය හැකි ය. පනතේ 208 වන වගන්තියට යටත් ව, දැන්වීම ලියාපදිංචි කාර්යාලයට ලැබුණු විට හෝ දැන්වීමේ සඳහන් යම් පසු අවස්ථාවක එය බලාත්මක වන්නේ ය.

(4) අධ්‍යක්ෂවරයකු—

(අ) මේ ව්‍යවස්ථාවේ (3) වන ඡේදයට අනුකූලව ඉල්ලා අස්වේ නම් ;

(ආ) මේ පනතේ විධිවිධානවලට හෝ මේ ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූලව ධුරයෙන් ඉවත් කරනු ලැබුවේ නම් ;

(ඇ) පනතේ 202 වන වගන්තියට අනුව අධ්‍යක්ෂවරයකු වීම සඳහා නුසුදුස්සෙකු වේ නම් ;

(ඈ) මිය යන්නේ නම් ; හෝ

(ඉ) ඔහුගේ වයස පිළිබඳ හේතුව මත පනතේ 210 වන වගන්තියේ (2) වන උපවගන්තියට අනුව ධුරය අත්හරින්නේ නම්,

ඔහු ධුරය අත්හරින්නේ ය.

### 21. අධ්‍යක්ෂවරුන්ගේ බලතල හා කාර්ය

(1) ප්‍රධාන ගනුදෙනුවලට අදාළ, පනතේ 185 වන වගන්තියට යටත් ව, සමාගමේ ව්‍යාපාර හා කටයුතු මණ්ඩලයේ විධානය හෝ අධීක්ෂණය යටතේ හෝ මණ්ඩලය විසින් හෝ කළමනාකරණය කරනු ලැබිය යුතු ය. සමාගමේ ව්‍යාපාර හා කටයුතු කළමනාකරණය කිරීම, සහ කළමනාකරණය විධානය කිරීම හා අධීක්ෂණය කිරීම ද සඳහා අවශ්‍ය සියලු බලතල මණ්ඩලයට ඇත්තේ ය.

(2) මණ්ඩලයට, පනතේ 186 වන වගන්තිය යටතේ පැවරීමට අවසර දී ඇති එහි බලතල අතුරෙන් කිසිවක්, මණ්ඩලය විසින් අධ්‍යක්ෂ කමිටුවක් වෙත හෝ අධ්‍යක්ෂවරයකු හෝ සේවා නියුක්තයකු වෙත පවරනු ලැබිය හැකි ය.

(3) අධ්‍යක්ෂවරුන්ට පනතේ දක්වා ඇති කාර්ය ඇත්තේ ය. තව ද විශේෂයෙන්ම—

(අ) එක් එක් අධ්‍යක්ෂවරයා සද්භාවයෙන් හා සමාගමේ උපරිම යහපත යයි තමා විශ්වාස කරන ආකාරයෙන් ක්‍රියා කළ යුතු ය ;

(ආ) මේ පනතේ විධිවිධාන කිසිවක් හෝ මේ ව්‍යවස්ථා හෝ කඩකරන ආකාරයෙන් කිසිම අධ්‍යක්ෂවරයකු ක්‍රියා නොකළ යුතු ය ; නැතහොත්, සමාගම එසේ ක්‍රියා කිරීම සම්බන්ධයෙන් එකඟ නොවිය යුතු ය.

### 22. සම්බන්ධතා ඇති අධ්‍යක්ෂවරුන්

(1) සමාගම පාර්ශ්වකරුවකු වන ගනුදෙනුවකට සම්බන්ධතාවක් ඇති අධ්‍යක්ෂවරයකු විසින්, පනතේ 192 වන වගන්තියට අනුකූලව ඒ සම්බන්ධතාව හෙළිකරනු ලැබිය යුතු ය.

(2) මේ ව්‍යවස්ථාවේ (3) වන ඡේදයට යටත්ව, සමාගම පාර්ශ්වකරුවකු වන යම් ගනුදෙනුවක් සම්බන්ධයෙන් ඒ සමාගමේ අධ්‍යක්ෂවරයකු-

(අ) ඒ ගනුදෙනුවේ පාර්ශ්වකරුවකු නම් හෝ ඒ ගනුදෙනුවෙන් සැලකිය යුතු මුල්‍ය ප්‍රතිලාභයක් ලබයි නම් හෝ ලැබිය හැකි නම් පමණක් ;

(ආ) ගනුදෙනුවේ වෙනත් පාර්ශ්වකරුවකු සමග සැලකිය යුතු මූල්‍ය සම්බන්ධතාවක් ඇති කෙනකු නම් සහ එසේ විය හැකි නම් පමණක් ;

(ඇ) ගනුදෙනුවෙන් සැලකිය යුතු මූල්‍ය ප්‍රතිලාභයක් ලබන හෝ ලැබිය හැකි—

(i) සම්පූර්ණයෙන් ම අයත් පාලිත සමාගමේ පාලක සමාගමක් වන සමාගමේ පාලක සමාගමක් ;

(ii) සමාගමේ, සම්පූර්ණයෙන් අයත් පාලිත සමාගමක් ; හෝ

(iii) සමාගම සම්පූර්ණයෙන් ම අයත් සමාගමක් ද වන්නා වූ පාලක සමාගමේ, සම්පූර්ණයෙන් අයත් පාලිත සමාගමක්,

නොවන වෙනත් පාර්ශ්වකරුවකුගේ හෝ තැනැත්තකුගේ අධ්‍යක්ෂවරයකු, නිලධරයකු හෝ භාරකරුවකු නම් සහ එසේ විය හැකි නම් පමණක් ;

(ඈ) ගනුදෙනුවෙන් සැලකිය යුතු මූල්‍ය ප්‍රතිලාභයක් ලබන හෝ ලැබිය හැකි වෙනත් පාර්ශ්වකරුවකුගේ හෝ තැනැත්තකුගේ මව්පිය කෙනකු, දරුවකු හෝ භාර්යාව හෝ ස්වාමි පුරුෂයා වේ නම් සහ එසේ විය හැකි නම් පමණක් ; හෝ

(ඉ) එසේ නොමැතිව, අන්‍යාකාරයකින් ගනුදෙනුව කෙරෙහි කෙළින් ම හෝ වක්‍රව අන්‍යාකාරයකින් සැලකිය යුතු සම්බන්ධතාවක් ඔහුට ඇත්නම් සහ එසේ විය හැකි නම් පමණක්

සමාගමක අධ්‍යක්ෂවරයකුට, සමාගම පාර්ශ්වකරුවකු වූ ගනුදෙනුවක සම්බන්ධතාවක් ඇත්තේ ය.

(3) සමාගම පාර්ශ්වකරුවකු වූ ගනුදෙනුවකට, අධ්‍යක්ෂවරයා සමග කිසිම සම්බන්ධතාවක් නැති තුන්වන පාර්ශ්වකරුවකුව ඒ තුන්වන පාර්ශ්වකරුගේ ඉල්ලීම පිට, අයවීමක් හෝ හානි පූරණයක් යටතේ නැතහොත්, ඇපයක් තැන්පත් කිරීම මගින් සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන්, ඒ අධ්‍යක්ෂවරයා හෝ වෙනත් තැනැත්තකු විසින් පෞද්ගලිකව ම වගකීම භාරගත්, සමාගමේ ණයක් හෝ බැඳීමක් සම්බන්ධයෙන්, සමාගම විසින් ඇපදීම පමණක් ගනුදෙනුවට ඇතුළත් වේ නම්, සමාගමක අධයක්ෂවරයකුව ඒ ගනුදෙනුවට අදාළ සම්බන්ධතාවක් නැත්තේ ය.

(4) පනතේ 216 වන වගන්තියට අනුකූලව අධ්‍යක්ෂවරයකුට දෙන ලද යම් පාරිශ්‍රමිකයට හෝ වෙනත් ප්‍රතිලාභයකට නැතහොත් 218 වන වගන්තියට අනුකූලව සලසන ලද යම් රක්ෂණයකට හෝ හානි පූරණයකට මේ ව්‍යවස්ථාවේ (2) වන ඡේදය අදාළ නොවන්නේ ය.

(5) සමාගම ඇතුළත් වූ හෝ ඇතුළත් වීමට සිටින ගනුදෙනුවක සම්බන්ධතාවක් ඇති සමාගමක අධ්‍යක්ෂවරයකු විසින්, තමා ගනුදෙනුවට සම්බන්ධතාවක් නැතුවාක් මෙන් සලකා-

(අ) ගනුදෙනුවට අදාළ කරුණක් සම්බන්ධයෙන් ඡන්දය දෙනු ලැබිය හැකි ය ;

(ආ) ගනුදෙනුවට අදාළ කරුණක් උද්ගතවන අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීමකට ඔහුට පැමිණිය හැකි අතර, ගණපූරණයක කාර්යය සඳහා රැස්වීමේ දී පැමිණි අධ්‍යක්ෂවරුන් අතරට ඔහු ඇතුළත් කරනු ලැබිය හැකි ය ;

(ඇ) සමාගම වෙනුවෙන් ගනුදෙනුවට අදාළ ලේඛනයක් අත්සන් කරනු ලැබිය හැකි ය ; තව ද

(ඈ) අධ්‍යක්ෂවරයකු වශයෙන් තම තත්ත්වයෙන් ගනුදෙනුවට අදාළ වෙනත් යම් දෙයක් කරනු ලැබිය හැකි ය.

(6) සමාගමේ අධ්‍යක්ෂවරයකු වශයෙන් හෝ සේවා නියුක්තයකු වශයෙන් තම තත්ත්වය නිසා නොවේ නම් තමා වෙත ලැබිය නොහැකිව තිබුණු ඒ අධ්‍යක්ෂවරයා සතු තොරතුරු ඒ අධ්‍යක්ෂවරයා විසින්-

(අ) සමාගමේ කාර්ය සඳහා ; හෝ

(ආ) නීතියෙන් නියමිත පරිදි ; හෝ

(ඇ) මේ ව්‍යවස්ථාවේ (7) වන ඡේදයට අනුකූලව,

හැර යම් තැනැත්තකු වෙත හෙළිකිරීම, තොරතුරු ප්‍රයෝජනයට ගැනීම, නැතහොත්, ඒ තොරතුරු මත ක්‍රියා කිරීම, කරනු නොලැබිය යුතු ය.

(7) සමාගමක අධ්‍යක්ෂවරයකු විසින්, තොරතුරු හෙළිකිරීම, ඒ තොරතුරු ප්‍රයෝජනයට ගැනීම හෝ ඒ තොරතුරු මත ක්‍රියා කිරීම-

(අ) මේ ව්‍යවස්ථාවේ (8) වන ඡේදය යටතේ එසේ කිරීම සඳහා අධ්‍යක්ෂවරයාට මණ්ඩලය විසින් ප්‍රථමයෙන් බලය දී ඇත්නම් ; සහ

(ආ) බලය දීම පිළිබඳ විස්තර, සම්බන්ධ ලේඛනයෙහි ඇතුළත් කර ඇත්නම්,

කරනු ලැබිය හැකි ය.

(8) තොරතුරු හෙළිකිරීම, ප්‍රයෝජනයට ගැනීම හෝ ඒ තොරතුරු මත ක්‍රියා කිරීම සමාගමට හානිකර විය නොහැකි බවට මණ්ඩලය සෑහීමට පත් වේ නම්, එසේ කිරීම සඳහා මණ්ඩලය විසින් අධ්‍යක්ෂවරයකුට අවසර දෙනු ලැබිය හැකි ය.

(9) පනතේ 198 වන, 199 වන සහ 200 වන වගන්තිවලට අනුකූලව, අධ්‍යක්ෂවරයකු විසින්, තමාට අදාළ වන සම්බන්ධතාවක් ඇති, සමාගමේ කොටස් පිළිබඳ සියලු කටයුතු හෙළි කරනු ලැබිය යුතු ය.

**23**. අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම්වල කාර්ය පරිපාටිය.

(1) අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම්වල දී අනුගමනය කළයුතු කාර්ය පරිපාටිය 24 වන ව්‍යවස්ථාවේ සිට 30 වන ව්‍යවස්ථාව දක්වා වූ ව්‍යවස්ථාවලින් දැක් වේ.

(2) අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීමක කාර්ය පරිපාටිය මේ ව්‍යවස්ථා මගින් පාලනය නොවන තාක් ප්‍රමාණයට, එහි රැස්වීමක් මගින් නිශ්චය කරනු ලැබිය හැකි ය.

## 24. සභාපති

(1) අධ්‍යක්ෂවරුන් විසින්, ස්වකීය සාමාජිකයන් අතුරෙන් කෙනෙකු මණ්ඩලයේ සභාපති වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය හැකි අතර, සභාපති ධුරය දැරිය යුතු කාලපරිච්ඡේදය ද නිශ්චය කරනු ලැබිය හැකි ය.

(2) සභාපතිවරයකු තෝරා පත් කර ගනු නොලැබුවහොත් හෝ මණ්ඩලයේ රැස්වීමක දී, රැස්වීම ආරම්භ වීමට නියමිත වේලාවෙන් පසු මිනිත්තු පහක් ඇතුළත සභාපතිවරයා පැමිණ නොසිටියහොත්, පැමිණ ඇති අධ්‍යක්ෂවරුන් විසින්, රැස්වීමේ සභාපති වශයෙන් තමන් අතුරින් කෙනකු තෝරා ගනු ලැබිය හැකි ය.

## 25. රැස්වීම් පිළිබඳ දැන්වීම

(1) අධ්‍යක්ෂවරයකු විසින් හෝ ලේකම් විසින් හෝ අධ්‍යක්ෂවරයකු විසින් ඉල්ලා සිටිනු ලැබුවහොත් සමාගමේ සේවා නියුක්තයකු විසින් හෝ මේ ව්‍යවස්ථාවට අනුකූලව දැනුම් දීමක් කිරීමෙන් මණ්ඩලයේ රැස්වීමක් කැඳවනු ලැබිය හැකි ය.

(2) මණ්ඩලයේ රැස්වීමක් පිළිබඳව පැය විසිහතරකට නොඅඩු දැනුම් දීමක්, ශ්‍රී ලංකාවේ සිටින සෑම අධ්‍යක්ෂවරයකු වෙතම කරනු ලැබිය යුතු ය.

(3) රැස්වීමක් පිළිබඳ දැන්වීමෙහි ඇති අක්‍රමිකතාවක් අත්හැරීම, අක්‍රමිකතා ව පිළිබඳ විරෝධතාවක් නොමැතිව රැස්වීමේ දැන්වීම ලැබීමට හිමිකම ඇති සියලුම අධ්‍යක්ෂවරුන් රැස්වීමට පැමිණ ඇත්නම් හෝ රැස්වීමේ දැන්වීම ලැබීමට හිමිකම ඇති සියලුම අධ්‍යක්ෂවරුන් එසේ අත්හැරීමට එකඟවන්නේ නම් හෝ කරනු ලැබේ.

## 26. රැස්වීම් පැවැත්වීමේ ක්‍රම

මණ්ඩලයේ රැස්වීමක්-

(අ) ගණපූරණයක් සංස්ථාපනය කෙරෙන අධ්‍යක්ෂවරුන්ගේ සංඛ්‍යාවක්, රැස්වීම සඳහා නියමිත ස්ථානයේ, දිනයේ සහ වේලාවේ දී එක් වී රැස්වීමෙන් ; හෝ

(ආ) සහභාගි වන්නා වූ සහ ගණපූරණයක් සංස්ථාපනය කෙරෙන්නා වූ සියලුම අධ්‍යක්ෂවරුන්ට රැස්වීම් පුරා එකිනෙකට සමගාමීව සවන් දිය හැකි ශ්‍රව්‍ය හෝ ශ්‍රව්‍ය හා දෘශ්‍ය නිවේදන ක්‍රමයක් මගින්,

පවත්වනු ලැබිය හැකි ය.

## 27. ගණපූරණය

(1) මණ්ඩලයේ රැස්වීමක් සඳහා ගණපූරණය අධ්‍යක්ෂවරුන්ගේ බහුතරයක් වන්නේ ය.

(2) ගණපූරණයක් නොමැති නම්, අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීමක දී කිසිම ව්‍යාපාර කටයුත්තක් කළ නොහැකි ය.

## 28. ඡන්දය දීම

(1) සෑම අධ්‍යක්ෂවරයකුට ම එක ඡන්දයක් ඇත.

(2) සභාපතිවරයාට තීරක ඡන්දයක් ඇත.

(3) මණ්ඩලයේ යෝජනා සම්මතයක්, විපක්ෂවීමක් නොමැතිව පැමිණ ඇති සියලු අධ්‍යක්ෂවරුන් එකඟ වන්නේ නම් හෝ ඒ සම්බන්ධයෙන් දී ඇති ඡන්ද අතුරෙන් බහුතරයක් යෝජනාවට පක්ෂ වේ නම් එය සම්මත වන්නේ ය.

(4) මණ්ඩලයේ රැස්වීමට පැමිණ ඇති අධ්‍යක්ෂවරයකු, රැස්වීමේ දී යෝජනාවට ඔහු හෝ ඇය ප්‍රකාශිතව ම විපක්ෂවන්නේ නම් හෝ ඊට එරෙහිව ඡන්දය දෙන්නේ නම් මිස, මණ්ඩලයේ යෝජනාවකට එකඟ වූ ලෙස හෝ පක්ෂව ඡන්දය දුන් ලෙස පූර්වානුමිති කරනු ලැබේ.

### 29. වාර්තා

මණ්ඩලයේ රැස්වීම්වල සියලු රැස්වීම් කටයුතු පිළිබඳ වාර්තා තැබීමට මණ්ඩලය වග බලා ගත යුතු ය.

### 30. ඒකමතික යෝජනා සම්මතය

(1) මණ්ඩලයේ රැස්වීමක් පිළිබඳ දැන්වීමක් ලැබීමට හිමිකම ඇති සියලු අධ්‍යක්ෂවරුන් විසින් අත්සන් කරනු ලැබූ හෝ පිළිගනු ලැබූ ලියවිල්ලකින් වූ යෝජනා සම්මතයක් යථා පරිදි කැඳවා පවත්වන ලද මණ්ඩලයේ රැස්වීමක දී සම්මත කර ගත් යෝජනා සම්මතයක් මෙන් වලංගු හා බලසහිත වන්නේ ය.

(2) එවැනි යම් යෝජනා සම්මතයක් (ප්‍රතිරූපයක ආකාරයෙන් හෝ ඒ හා සමාන වෙනත් සන්නිවේදන මාර්ගයකින් වූ ලේඛන ඇතුළුව) එක හා සමාන ආකෘතියකින් වූ ලේඛන කීපයකින් සමන්විත විය හැකි අතර, ඒ එක් එක් ආකෘතිය අධ්‍යක්ෂවරුන් එක්කෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් විසින් අත්සන් කොට හෝ අනුමත කොට හෝ තිබිය යුතු ය.

(3) එවැනි යම් යෝජනා සම්මතයක පිටපතක් මණ්ඩලයේ රැස්වීම් කටයුතු පිළිබඳ වාර්තා පොතේ ඇතුළත් කරනු ලැබිය යුතු ය.

### 31. කළමනාකාර අධ්‍යක්ෂ හා වෙනත් විධායක අධ්‍යක්ෂවරුන්.

(1) සුදුසුයයි මණ්ඩලය සලකන යම් කාලයක් සඳහා හා යම් නියම මත කළමනාකාර අධ්‍යක්ෂවරයකු වශයෙන් අධ්‍යක්ෂවරයකු කලින් කල පත් කිරීම මණ්ඩලය විසින් කරනු ලැබිය හැකි ය.

(2) කළමනාකාර අධ්‍යක්ෂවරයකුගේ පත්වීමේ නියමවලට යටත්ව, කළමනාකාර අධ්‍යක්ෂවරයකු වශයෙන් අධ්‍යක්ෂවරයකුගේ පත්වීමක් කවර විටෙක වුව ද මණ්ඩලය විසින් අවලංගු කරනු ලැබිය හැකි ය.

(3) කළමනාකාර අධ්‍යක්ෂවරයකු වශයෙන් ධුරය දරන අධ්‍යක්ෂවරයකු තමා සමාගමේ අධ්‍යක්ෂවරයකු වශයෙන් කටයුතු කිරීම අවසන් වූ විට, කළමනාකාර අධ්‍යක්ෂවරයකු වශයෙන් ධුරය දැරීම අවසන් විය යුතු ය.

(4) කළමනාකාර අධ්‍යක්ෂවරයාට, ඔහු හා මණ්ඩලය අතර එකඟවිය හැකි යම් පාරිශ්‍රමිකයක් ගෙවනු ලැබිය යුතු ය. ඔහුගේ පාරිශ්‍රමික වැටුප් මගින්, කොමිස් මුදල් මගින්, ලාභවලට සහභාගි වීම මගින් හෝ මේ ක්‍රමවල යම් සංකලනයක් මගින් හෝ පාරිශ්‍රමික නියම කිරීමේ වෙනත් යම් ක්‍රමයක් මගින් හෝ විය හැකි ය.

(5) උචිත යයි මණ්ඩලය සලකන කොන්දේසි හෝ සීමා කිසිවකට යටත්ව, නීත්‍යානුකූලව පැවරිය හැකි ස්වකීය බලතල කිසිවක් මණ්ඩලය විසින් කළමනාකාර අධ්‍යක්ෂවරයා වෙත පවරනු ලැබිය හැකි ය. කවර විටෙක වුව ද, එවැනි යම් පැවරීමක්, මණ්ඩලය විසින් කවර හෝ වේලාවක අස්කරගනු ලැබිය හැකි ය. නැතහොත්, වෙනස් කරනු ලැබිය හැකි ය. මණ්ඩලයේ බලයක් කළමනාකාර අධ්‍යක්ෂකට පැවරීමෙන්, පැවරීමේ නියමයන්ගෙන් අන්‍යාකාර විධිවිධාන ප්‍රකාශිතව ම සලස්වනු ලැබ ඇත්නම් මිස, මණ්ඩලය විසින් බලය ක්‍රියාත්මක කිරීම වළක්වාලීමක් සිදු නොකෙරෙන්නේ ය.

(6) සමාගම විසින් සේවයේ නියුක්ත කරවනු ලැබූ කළමනාකාර අධ්‍යක්ෂ නොවන අධ්‍යක්ෂවරයකුට, ඔහු හා මණ්ඩලය අතර එකඟවිය හැකි යම් පාරිශ්‍රමිකයක් ගෙවනු ලැබිය යුතු ය. ඔහුගේ පාරිශ්‍රමික වැටුප මගින්, කොමිස් මුදල් මගින්, ලාභවලට සහභාගිවීම මගින් හෝ මේ ක්‍රමවල යම් සංකලනයක් මගින් හෝ පාරිශ්‍රමික නියම කිරීමේ වෙනත් යම් ක්‍රමයක් මගින් හෝ විය හැකි ය.

### 32. ලේකම්වරයා

(1) සමාගමට සියලු කල්හිම ලේකම්වරයකු සිටිය යුතු ය.

(2) සුදුසු යයි මණ්ඩලය සලකන යම් නියම හා කොන්දේසි මත, මණ්ඩලය විසින් ලේකම්වරයකු පත්කරනු ලැබිය හැකි ය. ලේකම්වරයාගේ පාරිශ්‍රමිකය පිළිබඳව මණ්ඩලය හා ලේකම් එකඟ වන පරිදි විය යුතු ය.

(3) මණ්ඩලය විසින් ලේකම්වරයා ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) ලේකම්වරයා-

(අ) සමාගමේ එකම අධ්‍යක්ෂ ; හෝ

(ආ) සමාගමේ එකම අධ්‍යක්ෂ, සංස්ථාවේ එකම අධ්‍යක්ෂ වන සංස්ථාවක් ද

විය නොහැකි ය.

(5) අධ්‍යක්ෂවරයකු හා ලේකම්වරයකු විසින් යම් දෙයක් කළ යුතු බවට පනත මගින් හෝ මේ ව්‍යවස්ථාවලියෙන් නියම කෙරෙන අවස්ථාවක, දෙදෙනාගේ ම තත්ත්වයෙන් එකම තැනැත්තා ක්‍රියා කිරීමෙන් එය ඉටු නොකෙරෙන්නේ ය.

ඇ. ගිණුම් සහ විගණනය.

### 33. ගිණුම් වාර්තා, මූල්‍ය ප්‍රකාශ, විගණනය ආදිය.

(1) සමාගම විසින්—

(අ) සමාගමේ ගනුදෙනු නිවැරදි ලෙස වාර්තා කෙරෙන හා පැහැදිලි කෙරෙන ;

(ආ) කවර විටෙක වුව ද සමාගමේ මුදල් තත්ත්වය ප්‍රමාණවත් නිරවද්‍යතාවකින් නිශ්චය කිරීමේ හැකියාව ඇති කෙරෙන ;

(ඇ) මේ පනතට අනුකූලව මුදල් ප්‍රකාශ පිළියෙල කිරීමට මණ්ඩලයට හැකියාව ඇති කෙරෙන ; සහ

(ඇ) සමාගමේ මුදල් ප්‍රකාශ වහාම හා නිසියාකාරව විගණනය කිරීමේ හැකියාව ඇති කෙරෙන,

ගිණුම් වාර්තා තැබීම පිළිබඳව මණ්ඩලය වග බලා ගත යුතු ය.

(2) ගිණුම් වාර්තා පනතේ 148 වන වගන්තියේ (2) වන උපවගන්තියට අනුකූල විය යුතු ය.

(3) සමාගමේ ශේෂ පත්‍ර දිනට පසු මාස පහක් ඇතුළත පනතේ 151 වන වගන්තියට අනුකූල වන මුදල් ප්‍රකාශ (සහ අදාළ වන්නේ නම්, පනතේ 153 වන වගන්තියට අනුකූලවන සමූහ මුදල් ප්‍රකාශ) ඒ ශේෂ පත්‍ර දිනට අදාළව සම්පූර්ණ කර, මණ්ඩලය වෙනුවෙන් අධ්‍යක්ෂවරුන් දෙදෙනකු විසින් හෝ සමාගමේ එක් අධ්‍යක්ෂවරයකු පමණක් ඇත්නම්, ඒ අධ්‍යක්ෂ විසින් දින යොදා අත්සන් කර ඇති බවට මණ්ඩලය වග බලා ගත යුතු ය.

(4) සෑම වාර්ෂික රැස්වීමක දී ම, පනතේ 154 වන වගන්තියට අනුකූලව, සමාගම විසින් එළඹෙන වර්ෂය සඳහා විගණකවරයකු පත් කරනු ලැබිය යුතු ය. වාර්ෂික රැස්වීමක දී පත්කරනු ලැබූ විගණකවරයකු—

(අ) නැවත පත්කිරීම සඳහා ඔහු සුදුසුකම් නොලැබ ඇත්නම් ;

(ආ) ඔහු වෙනුවට වෙනත් තැනැත්තකු පත්කිරීමට ඒ රැස්වීමේ දී සමාගම තීරණය කරන්නේ නම් ; හෝ

(ඇ) තමා නැවත පත්කිරීමට නොකැමති බැව් විගණකවරයා විසින් සමාගම වෙත දැනුම් දෙනු ලැබ ඇත්තේ නම්,

මිස, එළඹෙන වාර්ෂික රැස්වීමේ දී ඔහු නැවත පත් කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(5) සමාගමේ ශේෂ පත්‍ර දිනට පසු මාස පහක් ඇතුළත ඒ දිනයෙන් අවසාන වන ගිණුම් කාල සීමාව තුළ සමාගමේ කටයුතු පිළිබඳව පනතේ 166 වන වගන්තියට අනුකූල වූ වාර්ෂික වාර්තාවක් මණ්ඩලය විසින් පිළියෙල කරනු ලැබිය යුතු ය. මණ්ඩලය විසින් වාර්ෂික වාර්තාවේ පිටපතක්, කොටස් හිමියන්ගේ වාර්ෂික රැස්වීම පැවැත්වීම සඳහා නියමිත දිනට වැඩකරන දින විස්සකට නොඅඩු කාලයකට පෙර සෑම කොටස් හිමියකු වෙතම යවනු ලැබිය යුතු ය.

ඉ. ඈවර කිරීම සහ ලේඛනයෙන් ඉවත් කිරීම.

**34**. ඈවරකරු පත් කිරීමේ යෝජනා සම්මතය

විශේෂ යෝජනා සම්මතයක් මගින් සමාගම ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම සඳහා කොටස් හිමියන් විසින් තීරණය කරනු ලැබිය හැකි ය.

**35**. අතිරික්ත වත්කම් බෙදා හැරීම.

(1) සමාගමේ සියලු ණය හිමියන්ට ගෙවීම් කිරීමෙන් පසුව කොටස් හිමියන් වෙත බෙදා හැරීම සඳහා ඇති සමාගමේ අතිරික්ත වත්කම්, කොටස් කිසිවක් නිකුත් කිරීම පිළිබඳ නියමවලට යටත් ව, එක් එක් කොටස් හිමියා විසින් දරනු ලබන කොටස් සංඛ්‍යාවට අනුපාතිකව බෙදා හරිනු ලැබිය යුතු ය.

(2) ඈවරකරුවකු විසින්, විශේෂ යෝජනා සම්මතයක අනුමතය ඇතිව, සමාගමේ අතිරික්ත වත්කම් ද්‍රව්‍ය මගින් කොටස් හිමියන් අතර බෙදනු ලැබිය හැකි ය. මේ කාර්යය සඳහා ඔහු විසින්, බෙදිය යුතු යම් දේපළක් සම්බන්ධයෙන් සාධාරණ යයි තමා සලකන යම් අගැයීමක් කරනු ලැබිය හැකි අතර, බෙදා හැරීම, කොටස් හිමියන් හෝ විවිධ පන්තිවල කොටස් හිමියන් අතර කළ යුත්තේ කෙසේ දැ යි නිශ්චය කරනු ලැබිය හැකි ය.

ඊ. විවිධ.

**36. සමාගම විසින් තැබිය යුතු ලේඛන.**

(1) සමාගම විසින් ස්වකීය ලියාපදිංචි කාර්යාලයෙහි හෝ පනතේ 116 වන වගන්තියේ (4) වන උපවගන්තියට අනුකූලව රෙජිස්ට්‍රාර් වෙත දැනුම් දෙනු ලැබූ වෙනත් යම් ස්ථානයක හෝ පහත දැක්වෙන ලේඛන තැබිය යුතු ය :—

(අ) සමාගමේ සංස්ථාගත කිරීමේ සහතිකය සහ සමාගමේ ව්‍යවස්ථාවලිය ;

(ආ) පසුගිය අවුරුදු දහය ඇතුළත කොටස් හිමියන්ගේ සියලුම රැස්වීම්වල වාර්තා සහ යෝජනා සම්මත ;

(ඇ) සම්බන්ධතා ලේඛනයක් තැබීම අවශ්‍ය නැතැ යි සැලකෙන පෞද්ගලික සමාගමක් වේ නම් මිස, එවැනි සම්බන්ධතා ලේඛනයක් ;

(ඈ) පසුගිය අවුරුදු දහය ඇතුළත අධ්‍යක්ෂවරුන්ගේ සියලු රැස්වීම්වල හා අධ්‍යක්ෂවරුන්ගේ කමිටුවල වාර්තා හා යෝජනා සම්මත ;

(ඉ) පසුගිය අවුරුදු දහය ඇතුළත මේ පනත යටතේ අධ්‍යක්ෂවරුන් විසින් දෙන ලද සහතික ;

(ඊ) මේ පනතේ 223 වන වගන්තිය යටතේ තැබිය යුතු යයි නියමිත අධ්‍යක්ෂවරුන්ගේ හා ලේකම්වරුන්ගේ රෙජිස්ටරය ;

(උ) පසුගිය අවුරුදු දහය ඇතුළත, 33(5) වන ව්‍යවස්ථාව යටතේ පිළියෙල කරන ලද වාර්ෂික වාර්තා ද ඇතුලුව, සියලු කොටස් හිමියන් වෙත හෝ එකම පන්තියේ කොටස් දරන සියල්ලන් වෙත යවන ලද සියලු ලිඛිත සන්නිවේදනවල පිටපත් ;

(ඌ) සමාගමේ පසුගිය සම්පූර්ණ කරන ලද ගිණුම් කාලසීමා දහය සඳහා පනත යටතේ සම්පූර්ණ කළ යුතු යයි නියමිත සියලු මුදල් ප්‍රකාශවල සහ සමූහ මුදල් ප්‍රකාශවල පිටපත් ;

(එ) සෘණභාර ඇති කෙරෙන්නා වූ හෝ සෘණභාර සඳහා සාක්ෂි වශයෙන් ඇත්තා වූ සාධන පත්‍රවල පිටපත් සහ පනතේ 109 වන හා 110 වන වගන්ති යටතේ තැබිය යුතු යයි නියමිත සෘණභාර රෙජිස්ටරය ;

(ඒ) මේ පනතේ 123 වන වගන්තිය යටතේ තැබිය යුතු යයි නියමිත කොටස් ලේඛණය ; සහ

(ඔ) වර්තමාන ගිණුම් කාලසීමාව සඳහා සහ සමාගමේ පසුගිය සම්පූර්ණ කරන ලද ගිණුම් කාලසීමා දහය සඳහා පනතේ 148 වන වගන්තිය මගින් නියමිත ගිණුම් වාර්තා.

(2) මේ ව්‍යවස්ථාවේ (1) වන ඡේදයේ "අවුරුදු දහය" සහ "සම්පූර්ණ කරන ලද ගිණුම් කාලසීමා දහය" යන යොමුකිරීම්වලට රෙජිස්ට්‍රාර් විසින් සමාගම වෙත යවන ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් අනුමත කරනු ලැබිය හැකි වඩා අඩු කාලසීමා ඇතුළත් කළ යුතු ය.

**37**. ලේඛන ආදිය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන් හා කොටස් හිමියන් සතු අයිතිවාසිකම්.

(1) පනතේ 118 වන වගන්තියට අනුකූලව සමාගමේ වාර්තාවලට ප්‍රවේශ වීමට සමාගමේ අධ්‍යක්ෂවරුන්ට හිමිකම ඇත්තේ ය.

(2) සමාගමේ කොටස් හිමියකුට—

(අ) පනතේ 121 වන වගන්තියේ සඳහන් ආකාරයෙන් පනතේ 110 වන වගන්තියේ සඳහන් ලේඛන පරීක්ෂා කිරීමට හිමිකම ඇත්තේ ය ; සහ

(ආ) ඔහු විසින් පරීක්ෂා කරනු ලැබිය හැකි යම් ලේඛනයක පිටපත් හෝ උධෘත, සමාගම විසින් නිශ්චය කරනු ලබන සාධාරණ වූ පිටපත් කිරීමේ හා පරිපාලන ගාස්තුවක් ගෙවීමෙන් පසු ඒ සඳහා ලිඛිත ඉල්ලීමක් කරන ලද දින සිට වැඩ කරන දින පහක් ඇතුලත ලබා ගැනීමේ හිමිකම ඔහුට ඇත්තේ ය. මණ්ඩලයෙන් ලැබෙන විධාන කිසිවකට යටත් ව, යම් අධ්‍යක්ෂවරයකු හෝ ලේකම් වරයා විසින් ගාස්තුව නිශ්චය කරනු ලැබිය හැකි ය.

**38**. සමාගමේ නාමය.

පනතේ 8 වන වගන්තියට අනුකූලව විශේෂ යෝජනා සම්මතයක් මගින් සමාගම විසින් එහි නාමය වෙනස් කරනු ලැබිය හැකි ය.

**39**. දැන්වීම්.

(1) යම් ලේඛනයක් කොටස් හිමියකු වෙත යැවීමට හෝ යම් කරුණක් පිළිබඳ වූ දැනුම් දීමක් කොටස් හිමියකු වෙත කිරීමට සමාගමට අවශ්‍ය වන අවස්ථාවක, සමාගම විසින් ලේඛනය හෝ දැන්වීම සාමාන්‍ය තැපැලෙන් කොටස් හිමියාගේ ලියාපදිංචි ලිපිනය වෙත යැවීම ප්‍රමාණවත් වන්නේ ය. එසේ යවන ලද යම් ලේඛණයක් හෝ දැන්වීමක්, ලේඛනය හෝ දැන්වීම ඇතුළත්, නියමාකාරයෙන් ලිපිනය ලියන ලද්දා වූ හා කලින් ගෙවීම් කරන ලද්දා වූ ලිපියක් තැපැල් කිරීමෙන් වැඩ කරන දින තුනක් ඇතුළත කොටස් හිමියාට ලැබුණු ලෙස, සලකනු ලැබිය යුතු ය.

(2) ස්වකීය ලියාපදිංචි ලිපිනය ශ්‍රී ලංකා වෙන් බැහැරව ඇත්තා වූ කොටස් හිමියකු විසින්, සියලුම ලේඛන හා දැන්වීම් යැවිය යුතු ශ්‍රී ලංකාවේ ලිපිනයක් පිළිබඳව සමාගම වෙත දැනුම් දිය හැකි අතර, සමාගම විසින් ඒ ලිපිනය සියලු කාර්ය සඳහා කොටස් හිමියාගේ ලියාපදිංචි ලිපිනය ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) කොටස සම්බන්ධයෙන් කොටස් ලේඛනයේ පළමුව නම සඳහන් කොට ඇති කොටස් හිමියා වෙත දැනුම් දීමෙන් යම් කොටසක හවුල් කොටස් හිමියන් වෙත සමාගම විසින් ලේඛනයක් යැවීම හෝ දැන්වීමක් දීම හෝ කරනු ලැබිය හැකි ය.

(4) කොටස් හිමියකු මිය ගිය හෝ බුන්වත් බවට නැතහොත් වස්තු භංගත්වයට පත්වූ අවස්ථාවක, ඔහුගේ මරණය, බුන්වත් වීම හෝ වස්තු භංගත්වයට පත් වීම හේතුකොටගෙන වෙනත් තැනැත්තකුට ඒ කොටස් හිමි වී ඇති බව නොතකා, ඔහුගේ කොටස් සම්බන්ධයෙන් වූ සියලු දැන්වීම් සහ ලේඛන, ඔහුගේ ලියාපදිංචි ලිපිනයට යැවීම සමාගම විසින් නොකඩවා කරගෙන යා හැකි ය. නැතහොත්, ඒ දැන්වීම් හෝ ලේඛන යැවිය යුතු යයි ඒ වෙනත් තැනැත්තා ඉල්ලා සිටින ලිපිනයකට ඒ දැන්වීම් හෝ ලේඛන යවනු ලැබිය හැකි ය.

(5) සියලුම කොටස් හිමියන් වෙත යවන ලද සෑම දැන්වීමක ම හෝ ලේඛනයක ම පිටපතක් සමාගමේ විගණකවරයා වෙත යැවිය යුතු ය.

### 40. රක්ෂණය සහ වන්දි පූරණය කිරීම.

(1) අධ්‍යක්ෂවරයකු, විගණකවරයකු හෝ ලේකම්වරයකු වශයෙන් තම තත්ත්වයෙන් කරන ලද යම් ක්‍රියාවකට හෝ නොකර හැරීමකට අදාළව තමාගේ වාසියට නඩු තීන්දුවක් දී ඇත්තා වූ හෝ තමා නිදොස් කරන ලද්දා වූ හෝ පවත්වාගෙන යාම නතර කරන ලද්දා වූ නීති කෘත්‍යයක විත්තිය පෙනී සිටීමේ දී දරන ලද ගාස්තු කිසිවක් සම්බන්ධයෙන් තත් කාලයේ වූ සෑම අධ්‍යක්ෂවරයකු ම, විගණකවරයකු සහ ලේකම්වරයකු ම සමාගම විසින් වන්දි පූරණය කරනු ලැබිය යුතු ය.

(2) (1) වන ඡේදය අදාළ නොවන තත්ත්වයන් යටතේ අධ්‍යක්ෂවරයකු හෝ සේවා නියුක්තයකු වන්දිපූරණය කරනු ලැබීම උචිත යයි මණ්ඩලය සළකන්නේ නම්, පනතේ 218 වන වගන්තියේ (3) වන උපවගන්තිය මගින් අවසර දී ඇති ප්‍රමාණයට මණ්ඩලය විසින් එසේ කරනු ලැබිය හැකි ය.

### 41. පුද්ගලික සමාගම් සම්බන්ධයෙන් මද වශයෙන් වෙනස් කිරීම්

(1) සමාගම ලියාපදිංචි කර ඇත්තේ පුද්ගලික සමාගමක් වශයෙන් නම්, මේ ව්‍යවස්ථාව ඒ සමාගමට අදාළ විය යුතු ය.

(2) සමාගම විසින් නිකුත් කරන ලද යම් කොටස් හෝ වෙනත් සුරැකුම්පත් එය විසින් මහජනයාට අර්පණය නොකළ යුතු ය.

(3) (අ) සමාගමේ සේවා නියුක්තිකයන් වන ; හෝ

(ආ) සමාගම විසින් සේවයෙහි නියුක්ත කර සිටිය දී සමාගමේ කොටස් හිමියන් බවට පත් වූවා වූ ද සමාගම විසින් සේවයෙහි නියුක්ත කිරීම අවසන් වූ පසු ද එහි කොටස් හිමියන් ලෙස දිගටම සිටින්නා වූ ද,

කොටස් හිමියන් ඇතුළත් නොවන කොටස් හිමියන් පනහකට වැඩි සංඛ්‍යාවක් කවර හෝ අවස්ථාවක සමාගමට නොසිටිය යුතු ය.

(4) සමාගම විසින් ඒකමතික යෝජනා සම්මතයක් මගින් සම්බන්ධතා ලේඛනයක් තබාගැනීම අත්හැරිය හැකි ය. එවැනි යම් යෝජනා සම්මතයක්, සම්බන්ධතා ලේඛනයක් සමාගම විසින් තබාගැනීම තමාට අවශ්‍ය කරන බවට යම් කොටස් හිමියකු විසින් ලියවිල්ලකින් සමාගමට දැන්වීමක් කරනු ලැබුවේ නම්, බලාත්මකවීම අවසන් විය යුතු ය.

(5) සමාගම විසින් රැගෙන ඇති හෝ ගැනීමට ඇති යම් ක්‍රියාවකට සමාගමේ කොටස් හිමියන් සියල්ල ම එකඟවන හෝ ඊට කැමැත්ත පළකර ඇති අවස්ථාවක,—

(අ) මෙම ව්‍යවස්ථාවලියේ කුමක් සඳහන්ව තිබුන ද ඒ ක්‍රියාව ගැනීමට සමාගම විසින් වලංගු ලෙස බලය දී තිබෙන ලෙස සළකනු ලැබිය යුතු ය ; තව ද

(ආ) පනතෙහි දෙවන උපලේඛනයෙහි සඳහන් වන පනතේ විධිවිධාන පනතේ 31 වන වගන්තිය ප්‍රකාරව, ඒ ක්‍රියාව සම්බන්ධයෙන් අදාළ නොවන්නේ ය.

**42. අර්ථ නිරූපණය**

මෙම ව්‍යවස්ථාවලියෙහි පනත යන්නෙන් 2007 අංක 07 දරන සමාගම් පනත අදහස් වන අතර, පනතේ අර්ථ නිරූපනය කර ඇති පදවල අර්ථය මේ ව්‍යවස්ථාවේ දී ඇති අර්ථයම වන්නේ ය.

දෙවන උපලේඛනය [31 (1) වන වගන්තිය]

**කොටස් හිමියන්ගේ ඒකමතික අනුමතිය ඇතිව ක්‍රියාකරන පුද්ගලික සමාගම්වලට අදාළ නොවන විධිවිධාන**

| | |
|---|---|
| 52 වන වගන්තිය | (කොටස් නිකුත් කිරීම සඳහා ප්‍රතිෂ්ඨාව) |
| 53 වන වගන්තිය | (අළුත් නිකුත් කිරීම්වලට ඇති පූර්ව චක්‍ර අයිතිය) |
| 56 වන වගන්තිය | (බෙදා හැරීම) |
| 60 වන වගන්තිය | (ලාභාංශ) |
| 61 වන වගන්තිය | (බෙදා හැරීම් අයකර ගැනීම) |
| 64 වන වගන්තිය | (තමාගේ ම කොටස් මිලට ගැනීම) |
| 70 වන වගන්තිය | (මූල්‍යමය ආධාර දීම පිළිබඳ සීමා කිරීම්) |
| 90 වන වගන්තිය | (කොටස් හිමියන්ට වෙන් කළ බලතල ක්‍රියාත්මක කිරීම) |
| 92 (1) (ආ) වගන්තිය | (විශේෂ යෝජනා සම්මතයක් මගින් ක්‍රියාත්මක කරන බලතල) |
| 99 වන වගන්තිය | (කොටස් හිමි අයිතිවාසිකම් වෙනස් කිරීම) |
| 185 වන වගන්තිය | (ප්‍රධාන ගනුදෙනු කිරීම්) |
| 192 වන වගන්තිය | (සම්බන්ධතා හෙළිදරව් කිරීම) |
| 193 වන වගන්තිය | (ගනුදෙනු කිරීම් මගහැරීම) |
| 216 වන වගන්තිය | (පාරිශ්‍රමික හා වෙනත් ප්‍රතිලාභ) |
| 217 වන වගන්තිය | (අධ්‍යක්ෂවරයන්ට ණය දීම පිළිබඳ සීමාකිරීම්) |
| 218 වන වගන්තිය | (හානිපූරණය හා රක්ෂණය) |

3 වන උපලේඛනය [35(1) වන වගන්තිය]

## ඇපයෙන් සීමිත සමාගම්වලට අදාළ නොවන විධිවිධාන

| | |
|---|---|
| iv කොටස | (කොටස් සහ සෘණපත්‍ර) |
| 93 වන වගන්තියේ සිට 98 වන වගන්තිය දක්වා | (සුළු කොටස් ප්‍රමාණයන් පවතින මිලට ගැනීම) |
| 99 වන වගන්තියේ සිට 101 වන වගන්තිය දක්වා | (සම්බන්ධතා කණ්ඩායම්) |
| 123 (1) (ආ) සහ (ඇ) වගන්ති | (සමාගම විසින් කොටස් ලේඛනය පවත්වාගෙන යා යුතු බව) |
| 124 (1) හා (3) වගන්ති | (කොටස් හිමි ලේඛනය තබන ස්ථානය) |
| 198 සිට 200 දක්වා වගන්ති | (කොටස් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයන්ගේ සම්බන්ධතා හෙළිදරව් කිරීම) |
| 220 වන වගන්තිය | (ප්‍රාග්ධනය බරපතල ලෙස අඩුවීමේ දී අධ්‍යක්ෂවරයන්ගේ කාර්ය භාරය) |
| viii වන කොටස | (ඒකාබද්ධ කිරීම්) |
| 5 වන උපලේඛනයේ (ආ) සහ (ඉ) සිට (ඒ) දක්වා වූ අනුඡේද | (වාර්ෂික වාර්තාවේ ඇතුළත් විය යුතු කාරණා) |

හතරවන උපලේඛනය (37 (1) වන වගන්තිය)

## සංස්ථා ප්‍රකාශයේ නිශ්චිතව සඳහන් කළ යුතු කාරණා සහ එහි දැක්විය යුතු වාර්තා

1 වන කොටස.

### නිශ්චිතව සඳහන් කළ යුතු කාරණා

1. සමාගම විසින් එහි කටයුතු ආරම්භ කිරීමේ දිනයෙන් පසුව වූ අවුරුදු පහක කාල පරිච්ඡේදය තුළ සමාගම විසින් ක්‍රියාත්මක කළ යුතු යයි සහභාගයන් හෝ ප්‍රවර්ධනයන් විසින් අදහස් කරනු ලබන ව්‍යාපාර.

2. ආරම්භක, කළමනාකාර හෝ විලම්බිත කොටස් ඇත්නම් ඒවායේ ගණන සහ සමාගමේ දේපළ සහ ලාභ සම්බන්ධයෙන් දරන්නන්ගේ සම්බන්ධතාවේ ස්වභාවය හා ප්‍රමාණය

3. අධ්‍යක්ෂවරයකුගේ සුදුසුකම වශයෙන් ව්‍යවස්ථාවලියෙන් නියමිත කොටස් ගණනක් ඇත්නම් ඒ ගණන සහ අධ්‍යක්ෂවරයන්ගේ පාරිශ්‍රමිකය සම්බන්ධයෙන් ව්‍යවස්ථාවලියේ ඇති යම් විධිවිධාන.

4. අධ්‍යක්ෂවරයන්ගේ හෝ යෝජිත අධ්‍යක්ෂවරයන්ගේ නම්, විස්තර සහ ලිපිනයන්.

5. මහජනයාට සහභාගී වීම සඳහා කොටස් අර්පණය කර ඇති අවස්ථාවක, පහත දැක්වෙන දේ සම්බන්ධ විස්තර :—

(අ) පහත සඳහන් එක් එක් කාරණය සම්බන්ධයෙන් සැපයිය යුතු මුදල් හෝ එහි යම් කොටසක් වෙනත් යම් ආකාරයකට ගෙවිය යුතු වේ නම්, මුදල්වල ඉතිරි ප්‍රමාණ සැපයීම සඳහා ඒ කොටස් නිකුත් කිරීමෙන් සපයා ගත යුතු යයි අධ්‍යක්ෂවරයන් විසින් අදහස් කරනු ලබන අවම ප්‍රමාණය :—

(i) නිකුත් කිරීමෙන් ලැබෙන මුදලින් සම්පූර්ණයෙන් ම හෝ කොටසක් වියදම් ගෙවිය යුතු, මිළට හෝ මිළට ගැනීමට අදහස් කර ඇති යම් දේපළක ගැනුම් මිල ;

(ii) සමාගම විසින් ගෙවිය යුතු යම් මූලික වියදම් සහ සමාගමේ යම් කොටස්වලට සහභාගිවීමට එකඟවීම සඳහා හෝ සහභාග කුට්ටනය කිරීම සඳහා හෝ කුට්ටනය කිරීමට එකඟවීම සඳහා ප්‍රතිෂ්ඨාවක් වශයෙන් යම් තැනැත්තකුට එසේ ගෙවිය යුතු යම් කොමිස් මුදලක් ;

(iii) ඉහත සඳහන් යම් කාරණයක් වෙනුවෙන් සමාගම විසින් ඉල්ලා ගන්නා ලද යම් මුදල් ආපසු ගෙවීම ;

(iv) කාරක ප්‍රාග්ධනය ; සහ

(ආ) නිකුත් කිරීමෙන් ලැබෙන මුදලින් හැර අන්‍යාකාරයෙන් ඉහත කී කාරණා සම්බන්ධයෙන් සැපයිය යුතු මුදල් ප්‍රමාණ සහ ඒ මුදල් ප්‍රමාණ සපයා ගත යුත්තේ කවර ප්‍රභවවලින් ද ඒ ප්‍රභව.

6. සහභාග ලැයිස්තු විවෘත කිරීමේ සහ වැසීමේ කාලසීමා.

7. ඉල්ලුම්කිරීමේ දී සහ එක් එක් කොටස විභජනයේ දී ගෙවිය යුතු මුදල් ප්‍රමාණ සහ දෙවන වරට හෝ ඊට පසුව කරනු ලබන කොටස් අර්පණයක් සම්බන්ධයෙන් වූ විට, පූර්වයෙන් වූ වර්ෂ දෙක ඇතුළත කරන ලද එක් එක් පූර්ව විභජන මත සහභාග සඳහා අර්පණය කරන ලද මුදල් ප්‍රමාණ ද, ඇත්ත වශයෙන් විභජනය කරන ලද මුදල් ප්‍රමාණ ද සහ එසේ විභජනය කරන ලද කොටස් සම්බන්ධයෙන් ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් ප්‍රමාණ ද.

8. යම් තැනැත්තකුට සහභාගී වීම සඳහා මනාපය පළ කිරීමේ අවස්ථාවක් ඇති හෝ දෙනු ලැබීමට හිමිකමක් ඇති සමාගමේ යම් කොටස් හෝ සෘණපත්‍රවල ගණන, විස්තරය සහ ප්‍රමාණය, මනාපය පිළිබඳ පහත සඳහන් විස්තර සමග ; එනම් :—

(අ) එය ක්‍රියාත්මක කළ හැකි කාල සීමාව ;

(ආ) එය යටතේ සහභාග වූ කොටස් ගණන හෝ සෘණපත්‍ර සඳහා ගෙවිය යුතු මිළ ;

(ඇ) එය සඳහා හෝ ඊට ඇති අයිතිවාසිකම් සඳහා දෙන ලද හෝ දීමට ඇති යම් ප්‍රතිෂ්ඨාවක් වේ නම් ඒ ප්‍රතිෂ්ඨාව ;

(ඇ) එය හෝ එය සඳහා ඇති අයිතිවාසිකම දෙනු ලැබූ තැනැත්තන්ගේ නම් සහ ලිපින හෝ එවකට සිටින කොටස් හිමියන්ට හෝ සෘණපත්‍ර දරන්නන්ට ඒ තත්ත්වයෙන් දී ඇත්නම් ; අදාළ කොටස් හෝ සෘණපත්‍ර.

9. මුදලින් හැර ප්‍රතිෂ්ඨාවක් සඳහා සම්පූර්ණයෙන් හෝ කොටසක් ගෙවා නිම කරන ලද ඒවා වශයෙන් කලින් වූ අවුරුදු දෙක ඇතුළත දී නිකුත් කරනු ලැබූ හෝ නිකුත් කිරීමට එකඟවනු ලැබූ කොටස් සහ සෘණපත්‍රවල ගණන සහ ප්‍රමාණය සහ ඒ කොටස් හෝ සෘණපත්‍ර නිකුත් කරන ලද්දේ හෝ නිකුත් කිරීමට යෝජනා හෝ අදහස් කරන ලද්දේ කවර ප්‍රතිෂ්ඨාවක් සඳහා ද, එකී ප්‍රතිශ්ඨාව.

10. (1) මේ ඡේදය අදාළ වන යම් දේපළක් සම්බන්ධයෙන්-

(අ) විකුනුම්කරුවන්ගේ නම් සහ ලිපිනයන් ;

(ආ) මුදලින්, කොටස්වලින් හෝ සෘණපත්‍රවලින් විකුණුම්කරුට ගෙවිය යුතු ප්‍රමාණය සහ වෙන් වෙන් විකුණුම්කරුවන් එක් අයෙකුට වැඩි ගණනන් සිටින හෝ සමාගම උප ගැනුම්කරුවකු වන අවස්ථාවක, එක් එක් විකුනුම්කරුවකුට එසේ ගෙවිය යුතු ප්‍රමාණය ;

(ඇ) ගනුදෙනු කරන වේලාවේදී සමාගමට දේපළ විකුණන ලද විකුණුම්කරුවකුට හෝ ගනුදෙනු කරන වේලාවේ දී සමාගමේ ප්‍රවර්ධකයකු, අධ්‍යක්ෂවරයකු හෝ යෝජිත අධ්‍යක්ෂවරයකු වන හෝ වූ යම් තැනැත්තකුට සෘජුව හෝ වක්‍රාකාරව යම් සම්බන්ධතාවක් තිබූ කලින් වූ වර්ෂ දෙක තුළ දී සම්පූර්ණ කළ දේපළ සම්බන්ධයෙන් වූ යම් ගනුදෙනුවක් පිළිබඳ කෙටි විස්තර.

(2) මේ ඡේදය අදාළ වන දේපළ, සමාගම විසින් මිල දී ගත් හෝ අත්කර ගත් හෝ එසේ මිල දී ගැනීමට හෝ අත්කර ගැනීමට යෝජිත වූ දේපළ වන අතර එම දේපළ සඳහා ගෙවීම සම්පූර්ණයෙන් ම හෝ කොටසක් සංස්ථා ප්‍රකාශයෙන් සහභාගී වීම සඳහා අර්පණය කර ඇති නිකුත් කිරීම මගින් ලැබෙන මුදලින් විය යුතු ය ; නැතහොත් සංස්ථා ප්‍රකාශය නිකුත් කිරීමේ දිනයේ දී මිල දී ගැනීම හෝ අත්කර ගැනීම සම්පූර්ණ වී නොමැති දේපළ විය යුතු ය. එම දේපළ පහත සඳහන් ආකාරයේ දේපළ නොවිය යුතු ය :—

(අ) ගිවිසුම නිකුත් කිරීම බලාපොරොත්තුවෙන් කරන ලද්දක් හෝ නිකුත් කිරීම ගිවිසුමේ ප්‍රථිඵලයක් වශයෙන් වූවක් හෝ නොවී, සමාගමේ ව්‍යාපාරයේ සාමාන්‍ය ක්‍රියාවලියේ දී ගිවිසුමකට ඇතුළත් වූයේ යම් දේපළක් මිලදී ගැනීම හෝ අත්කර ගැනීම සඳහා ද එම දේපළ ; හෝ

(ආ) ගැනුම් මිලේ ප්‍රමාණය වැදගත් නොවන්නේ යම් දේපළක් සම්බන්ධයෙන් ද ඒ දේපළ.

11. කීර්තිනාමය සඳහා ගෙවිය යුතු යම් මුදලක් වේ නම් එය නිශ්චිතව සඳහන් කරමින්, ඉහත අන්තිමට වූ ඡේදය අදාළවන යම් දේපළක් සඳහා මුදලින්, කොටස්වලින් හෝ සෘණපත්‍රවලින් ගැනුම් මිල වශයෙන් ගෙවූ හෝ ගෙවිය යුතු යම් මුදලක් වේ නම්, එකී මුදල් ප්‍රමාණය.

12. සමාගමේ යම් කොටස් හෝ සෘණපත්‍රවල සහභාගවීම හෝ සහභාගවීමට එකඟවීම හෝ සහභාග කුට්ටනය කිරීම හෝ සහභාග කුට්ටනය කිරීමට එකඟවීම සඳහා කොමිස් මුදල් වශයෙන් කලින් වූ අවුරුදු දෙක ඇතුළත ගෙවූ හෝ ගෙවිය යුතු (උප ප්‍රාරක්ෂකයන්ගේ කොමිස් මුදල් ඇතුළත් නොවන) කොමිස් මුදලක් වේ නම් එය හෝ එවැනි යම් කොමිස් මුදලක අනුප්‍රමාණ.

13. මූලික වියදම්වල ප්‍රමාණය හෝ ගණන් බලන ලද ප්‍රමාණය සහ එකී වියදම්වලින් කිසිවක් ගෙවූ හෝ ගෙවිය යුතු තැනැත්තන් සහ නිකුත් කිරීමේ වියදම්වල ප්‍රමාණය හෝ ගණන් බලන ලද ප්‍රමාණය සහ ඒ වියදම්වලින් කිසිවක් ගෙවූ හෝ ගෙවිය යුතු වන තැනැත්තන්.

14. කලින් වූ වර්ෂ දෙක ඇතුළත යම් ප්‍රවර්ධකයකුට ගෙවන ලද හෝ දෙන ලද නැතහොත් ගෙවීමට හෝ දීමට අදහස් කරන ලද යම් මුදලක් හෝ ප්‍රතිලාභයක් සහ ගෙවීම හෝ ප්‍රතිලාභය දීම සඳහා ප්‍රතිෂ්ඨාව.

15. සමාගම විසින් කරගෙන යන හෝ කරගෙන යාමට අදහස් කරන ලද ව්‍යාපාරයක සාමාන්‍ය ක්‍රියාවලියේ දී ඇතුළත් වූ ගිවිසුමක් හෝ සංස්ථා ප්‍රකාශය නිකුත් කිරීමේ දිනයට අවුරුදු දෙකකට වඩා කලින් ඇතුළත් වූ ගිවිසුමක් හෝ නොවන සෑම වැදගත් ගිවිසුමක ම දිනය, පාර්ශ්වකරුවන් සහ සාමාන්‍ය ස්වභාවය.

16. සමාගමේ විගණකවරයන් කිසිවකු වේ නම් ඔවුන්ගේ නම් සහ ලිපිනයන්.

17. අධ්‍යක්ෂවරයකු වන ලෙස පෙළඹවීම සඳහා හෝ අධ්‍යක්ෂවරයකු වීමේ සුදුසුකම ලබා දීම සඳහා නැතහොත් සමාගම ප්‍රවර්ධනය කිරීම නොහොත් පිහිටුවීම සම්බන්ධයෙන් ඔහු විසින් හෝ ව්‍යාපාර ආයතනය විසින් සමාගමට ලබා දුන් සේවය සඳහා යම් තැනැත්තකු විසින් ඔහුට හෝ ව්‍යාපාර ආයතනයට මුදලින් හෝ කොටස්වලින් හෝ අන් ලෙසකින් ගෙවූ හෝ ගෙවීමට එකඟ වූ සියළුම මුදල් පිළිබඳ විස්තරයක් සහිතව, සමාගම ප්‍රවර්ධනය කිරීමෙහි ලා නැතහොත් සමාගම විසින් අත්කර ගැනීමට යෝජිත දේපළ කෙරෙහි සෑම අධ්‍යක්ෂවරයකුම දක්වන සම්බන්ධතාවේ (එවැනි සම්බන්ධතාවක් වේ නම්) ස්වභාවය හා ප්‍රමාණය පිළිබඳව නැතහොත් එබඳු අධ්‍යක්ෂවරයකු දක්වන සම්බන්ධතාව ඇතිවූයේ ඔහු ව්‍යාපාර ආයතනයක හවුල්කරුවකු වීම නිසා නම් ව්‍යාපාර ආයතනය දක්වන සම්බන්ධතාවේ ස්වභාවය හා ප්‍රමාණය පිළිබඳ සම්පූර්ණ විස්තර.

18. සමාගමේ කොටස්වලට සහභාගිවන ලෙස මහජනයා වෙත සංස්ථා ප්‍රකාශයෙන් ආරාධනය කොට ඇති සහ සමාගමේ කොටස් ප්‍රාග්ධනය විවිධ කොටස් පන්තිවලට බෙදා ඇති කල්හි පිළිවෙලින් කොටස් පන්ති කිහිපයෙන් පැවරෙන සමාගමේ සහා රැස්වීම්වලදී ඡන්දය දීමේ අයිතිය හා එයට බද්ධ වී ඇති අනිකුත් අයිතීන් හා බැදීම්.

19. ව්‍යාපාරයක් පවත්වාගෙන යන සමාගමක් නැතහොත් අවුරුදු තුනකට අඩු කාලයක් පවත්වාගෙන යනු ලැබූ ව්‍යාපාරයක් වූ විටක, අවස්ථාවෝචිත පරිදි, සමාගමේ ව්‍යාපාරය නැතහොත් අත්කර ගැනීමට ඇති ව්‍යාපාරය පවත්වාගෙන යනු ලැබූ කාලය.

II වන කොටස

දැක්විය යුතු වාර්තා

20. (1) පහත සඳහන් දේ සම්බන්ධයෙන් සමාගමේ විගණකවරයන්ගේ වාර්තාවක්—

(අ) අවශ්‍ය වනු ලබන පරිදි මේ ඡේදයේ (2) වන අනුඡේදයේ හෝ (3) වන අනුඡේදයේ විධිවිධානවලට අනුකූලව ලාභ හා අලාභ සහ වත්කම් හා බැරකම් ; සහ

(ආ) සංස්ථා ප්‍රකාශය නිකුත් කිරීමට පෙරාතුව ම වූ මුදල් වර්ෂ පහේ එක් එක් මුදල් වර්ෂය සම්බන්ධයෙන් සමාගමේ තිබූ එක් එක් කොටස් පන්තිය වෙනුවෙන් සමාගම විසින් ගෙවන ලද ලාභාංශ කිසිවක් වුවහොත් ඒවායේ අනුප්‍රමාණ, ඒ ලාභාංශ ගෙවනු ලැබූ ඒ එක් එක් කොටස් පන්තිය පිළිබඳ විස්තර හා ඒ අවුරුදුවලින් කිසිවක් සම්බන්ධයෙන් යම් කොටස් පන්තියකට ලාභාංශ නොගෙවූ අවස්ථා පිළිබඳ විස්තර ද,

සහිතව සහ සංස්ථා ප්‍රකාශය නිකුත් කිරීමට මාස තුනකට පෙර වූ දිනයකින් අවසන් වූ පස් අවුරුදු කාලසීමාවේ යම් කොටසක් සම්බන්ධයෙන් ගිණුම් පිළියෙල කොට නොමැති වුවහොත් ඒ සිද්ධිය පිළිබඳ ප්‍රකාශයක් ද ඇතුළත් විය යුතු ය.

(2) සමාගමට පාලිත සමාගම් නොමැති විට ඒ වාර්තාවේ—

(අ) ලාභ සහ අලාභ සම්බන්ධයෙන් වන තාක් දුරට, සංස්ථා ප්‍රකාශය නිකුත් කිරීමට පෙරාතුව ම වූ මුදල් වර්ෂ පහෙන් එක් එක් මුදල් වර්ෂය වෙනුවෙන් සමාගමේ ලාභ සහ අලාභ සම්බන්ධයෙන් ක්‍රියාකල යුතු ය ; තවද

(ආ) වත්කම් සහ බැරකම් සම්බන්ධයෙන් වන තාක් දුරට, සමාගමේ ගිණුම් පිළියෙල කරනු ලැබුවේ යම් අන්තිම දිනයකට ද ඒ දිනයේ දී සමාගමේ වත්කම් හා බැරකම් සම්බන්ධව ක්‍රියාකල යුතු ය.

(3) සමාගමට පාලිත සමාගම් ඇති විට ඒ වාර්තාවේ—

(අ) ලාභ සහ අලාභ සම්බන්ධයෙන් වන තාක් දුරට, මේ ඡේදයේ (2) වන අනුඡේදයේ විධිවිධානවලින් විධිවිධාන සලසා ඇති පරිදි සමාගමේ ලාභ හෝ අලාභ සම්බන්ධයෙන් වෙනම ක්‍රියා කල යුතු ය ; තව ද ඊට අතිරේකව—

(i) එහි පාලිත සමාගම්වල ඒකාබද්ධ ලාභ හා අලාභ සම්බන්ධයෙන්, ඒවා සමාගමේ සාමාජිකයන්ට බලපාන තාක් දුරට සමස්තයක් වශයෙන් ; හෝ

(ii) සමාගමේ සාමාජිකයන්ට බලපාන තාක් දුරට එක් එක් පාලිත සමාගමේ ලාභ හෝ අලාභ සම්බන්ධයෙන් තනි තනිව හෝ ක්‍රියා කල යුතු ය :

එසේ නැතහොත් සමාගමේ ලාභ හෝ අලාභ සම්බන්ධයෙන් වෙන වෙනම ක්‍රියා කිරීම වෙනුවට සමාගමේ ලාභ හෝ අලාභ සම්බන්ධයෙන් සමස්තයක් වශයෙන් ක්‍රියා කල යුතු අතර සමාගමේ සාමාජිකයන්ට බලපාන තාක් දුරට එහි පාලිත සමාගම්වල ඒකාබද්ධ ලාභ හෝ අලාභ සම්බන්ධව ක්‍රියා කල යුතු ය ; තව ද—

(ආ) වත්කම් සහ බැරකම් සම්බන්ධයෙන් වනතාක් දුරට ඉහත (අ) අනුඡේදයෙන් විධිවිධාන සලසා ඇති පරිදි සමාගමේ වත්කම් සහ බැරකම් සම්බන්ධයෙන් වෙන වෙනම ක්‍රියා කල යුතු ය ; තව ද ඊට අතිරේකව—

(i) සමාගමේ වත්කම් හා බැරකම් සමග හෝ ඒවා නැතිව, එහි පාලිත සමාගම්වල ඒකාබද්ධ වත්කම් හා බැරකම් සම්බන්ධයෙන්, සමස්තයක් වශයෙන් ; හෝ

(ii) එක් එක් පාලිත සමාගමේ වත්කම් සහ බැරකම් සම්බන්ධයෙන් තනි තනිව,

ක්‍රියා කල යුතු අතර පාලිත සමාගම්වල වත්කම් හා බැරකම් සම්බන්ධයෙන් සමාගමේ සාමාජිකයන් නොවන තැනැත්තන් සඳහා කළ යුතු ඉඩ හැරීම් දැක්විය යුතු ය.

21. කොටස් හෝ ඍණපත්‍ර නිකුත් කිරීමෙන් ලැබෙන මුදල් හෝ ඉන් යම් කොටසක් යම් ව්‍යාපාරයක් මිලදී ගැනීම සඳහා කෙළින්ම හෝ වක්‍රව යෙදීමට අදහස් කරනු ලබන අවස්ථාවක—

(අ) සංස්ථා ප්‍රකාශය නිකුත් කිරීමට පොරාතුව ම වූ මුදල් වර්ෂ පහෙන් එක් එක් වර්ෂය වෙනුවෙන් ව්‍යාපාරයේ ලාභ හෝ අලාභ සම්බන්ධයෙන් ; සහ

(ආ) ව්‍යාපාරයේ ගිණුම් පිළියෙල කරනු ලැබුවේ යම් අන්තිම දිනයකට ද ඒ දිනයේ දී ව්‍යාපාරයේ වත්කම් සහ බැරකම් සම්බන්ධයෙන්

(සංස්ථා ප්‍රකාශයේ නම් කරනු ලැබිය යුතු) ගණකාධිකාරීවරුන් විසින් පිළියෙල කරන ලද වාර්තාවක්.

22. (1) (අ) කොටස් හෝ ඍණ පත්‍ර නිකුත් කිරීමෙන් ලැබෙන මුදල් හෝ ඉන් යම් කොටසක්, වෙනත් යම් සංස්ථාපිත මණ්ඩලයක කොටස් සමාගම විසින් අත්කර ගැනීම සිදුවන යම් ආකාරයකින් කෙළින්ම හෝ අන් ආකාරයකින් යෙදීමට අදහස් කරනු ලබන අවස්ථාවකදී ; සහ

(ආ) එම අත්කර ගැනීමේ හේතුව නිසා හෝ එහි ප්‍රතිඵලයක් වශයෙන් හෝ ඒ සම්බන්ධයෙන් කළ යුතු යම් දෙයක හේතුව නිසා එම සංස්ථාපිත මණ්ඩලය සමාගමේ පාලිත සමාගමක් වන අවස්ථාවක දී, (සංස්ථා ප්‍රකාශයේ නම් සඳහන් කරනු ලැබිය යුතු) ගණකාධිකාරීවරුන් විසින් —

(i) සංස්ථා ප්‍රකාශය නිකුත් කිරීමේ දිනයට පෙරාතුව ම වූ මුදල් වර්ෂ පහෙන් එක් එක් මුදල් වර්ෂය සම්බන්ධයෙන් අනික් සංස්ථාපිත මණ්ඩලයේ ලාභ හෝ අලාභ ; සහ

(ii) අතික් සංස්ථාපිත මණ්ඩලයේ ගිණුම් පිළියෙල කරනු ලැබුවේ යම් අන්තිම දිනයකට ද ඒ දිනයේ දී සංස්ථාපිත මණ්ඩලයේ වත්කම් සහ බැරකම්,

සම්බන්ධයෙන් පිළියෙල කරන ලද වාර්තාවක්.

(2) (1) වන අනුඡේදයේ සඳහන් වාර්තාවේ—

(අ) වාර්තාවට විෂය වී ඇති අතික් සංස්ථාපිත මණ්ඩලයේ ලාභ හෝ අලාභ අත්කර ගැනීමට ඇති කොටස් සම්බන්ධයෙන් සමාගමේ සාමාජිකයන්ට බලපෑහැකි ආකාරය සහ අත්කර ගැනීමට ඇති කොටස් සියලු වැදගත් කාලවල දී සමාගම විසින් දරනු ලැබුවේ නම් එසේ ක්‍රියා කරනු ලැබූ වත්කම් සහ බැරකම්වලට අදාළ ව අතිකුත් කොටස් හිමියන් සඳහා කවර අන්දමේ ඉඩ හැරීම් කිරීමට සිදුව තිබේ දැ යි යන්න පෙන්නුම් කළ යුතු ය ; සහ

(ආ) අතික් සංස්ථා, සංස්ථාපිත මණඩලයට පාලිත සමාගම් ඇති අවස්ථාවක, සමාගම සහ එහි පාලිත සමාගම සම්බන්ධයෙන් 20 වන ඡේදයේ (3) වන අනුඡේදයෙන් විධිවිධාන සලස්වා ඇති ආකාරයට සංස්ථාපිත මණ්ඩලයේ සහ එහි පාලිත සමාගම්වල ලාභ හෝ අලාභ සහ වත්කම් හා බැරකම් සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු ය.

## III වන කොටස

### 1 සිට 22 දක්වා වූ ඡේදවලට අදාළවන විධිවිධාන

23. ව්‍යාපාරය ආරම්භ කිරීමට සමාගමට හිමිකම් ඇති දිනයට අවුරුදු දෙකකට වැඩි කාලයකට පසු නිකුත් කරන ලද සංස්ථා ප්‍රකාශයක් සම්බන්ධයෙන් 3 වන, 4 වන සහ 13 වන ඡේදවල විධිවිධාන ඒවා (මූලික වියදම් සම්බන්ධයෙන්) අදාලවන තාක් දුරට සහ 17 වන ඡේදයේ විධිවිධාන අදාල නොවිය යුතු ය.

24. (අ) සංස්ථා ප්‍රකාශය නිකුත් කිරීමේ දිනයේ දී ගැනුම් මිල සම්පූර්ණයෙන් ගෙවා නැති;

(ආ) සහභාගිවීම සඳහා සංස්ථා ප්‍රකාශයෙන් අර්පණය කර ඇති නිකුත් කිරීමෙන් ලැබෙන මුදලින් ගැනුම් මිල සම්පූර්ණයෙන් හෝ කොටසක් හෝ ගෙවීමට හෝ පියවීමට ඇති;

(ඇ) ගිවිසුමේ වලංගුභාවය හෝ එය ඉටු කිරීම ඒ නිකුත් කිරීමේ ප්‍රතිඵල මත රඳා පවතින,

යම් අවස්ථාවක, සමාගම විසින් අත්කර ගැනීමට ඇති යම් දේපළක් විකිණීම හෝ මිල දී ගැනීම හෝ මිල දී ගැනීමේ මනාපය සඳහා නියත හෝ කොන්දේසි සහිත යම් ගිවිසුමකට ඇතුළත් වී ඇති සෑම තැනැත්තකු ම මේ උපලේඛණයේ කාර්යය සඳහා විකුණුම්කරුවකු වශයෙන් සලකනු ලැබිය යුතු ය.

25. සමාගම විසින් අත්කර ගැනීමට ඇති යම් දේපළක් බද්දට ගැනීමට ඇති අවස්ථාවක, 'විකුණුම්කරු' යන යෙදුමට බදුදීමනාකරු ඇතුළත් වූ ලෙස ද 'ගැනුම් මිල' යන යෙදුමට බද්ද සඳහා වූ ප්‍රතිෂ්ඨාව ඇතුළත් වූ ලෙසද 'උපගැනුම්කරු' යන යෙදුමට 'උප - බදුගැනුම්කරුවකු' ඇතුළත් වූ ලෙසද මේ උපලේඛනය බලපැවැත්විය යුතු ය.

26. කොටස් හෝ සෑණ පත්‍රවලට සහභාගිවීම ගැන 8 වන ඡේදයේ ඇති යම් සඳහන් කිරීමකට ඒවා විකිණීමට ඉදිරිපත් කිරීමේ අදහසින් ඒවා වෙන් කර දෙනු ලැබූ හෝ වෙන් කර දීමට එකඟවනු ලැබූ තැනැත්තකුගෙන් අත්කර ගැනීම ඇතුළත් විය යුතු ය.

27. විකුණුම්කරුවන් හෝ ඔවුන්ගෙන් යම් තැනැත්තකු ව්‍යාපාර ආයතනයක් වූ අවස්ථාවක, 10 වන ඡේදයේ කාර්යය සඳහා ව්‍යාපාර ආයතනයේ සාමාජිකයන් වෙන් වෙන් විකුණුම්කරුවන් ලෙස සලකනු නොලැබිය යුතු ය.

28. අවුරුදු පහකට අඩු කාලයක් ව්‍යාපාරය කරගෙන ගිය සමාගමක් හෝ අවුරුදු පහකට අඩු කාලයක් කරගෙන ගිය ව්‍යාපාරයක් හෝ සම්බන්ධයෙන් වූ විට සමාගමේ හෝ ව්‍යාපාරයේ ගිණුම් අවුරුදු හතරක්, අවුරුදු තුනක්, අවුරුදු දෙකක් හෝ එක් අවුරුද්දක් සම්බන්ධයෙන් පමණක් පිළියෙල කොට ඇති අවස්ථාවක දී 20 වන, 21 වන හා 22 වන ඡේදවල විධිවිධාන, අවස්ථාවෝචිත පරිදි අවුරුදු හතරක්, අවුරුදු තුනක්, අවුරුදු දෙකක් හෝ එක් අවුරුද්දක් සම්බන්ධයෙන් කර ඇති සඳහන් කිරීම් පස් අවුරුද්දක් සඳහා වූ සඳහන් කිරීම්වලට ආදේශ කරනු ලැබූ සේ බලපැවැත්විය යුතු ය.

29. 20 වන, 21 වන හා 22 වන ඡේදවල 'මුදල් වර්ෂය' යන යෙදුමෙන් අවස්ථාවෝචිත පරිදි සමාගමේ හෝ ව්‍යාපාරයේ ගිණුම් පිළියෙල කරනු ලැබුවේ යම් වර්ෂයක් සම්බන්ධයෙන් ද ඒ වර්ෂය අදහස් වන අතර සමාගමේ හෝ ව්‍යාපාරයේ මුදල් වර්ෂය අවසන් වන දිනය වෙනස් වීමේ හේතුවෙන් සමාගමේ හෝ ව්‍යාපාරයේ ගිණුම් අවුරුද්දකට වැඩි හෝ අඩු කාල පරිච්ඡේදයක් සඳහා පිළියෙල කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ වැඩි හෝ අඩු කාල පරිච්ඡේදය එම ඡේදවල කාර්යය සඳහා මුදල් වර්ෂයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

30. 20 වන, 21 වන සහ 22 වන ඡේදවලින් නියමිත යම් වාර්තාවක, වාර්තාව පිළියෙල කරන තැනැත්තාට අවශ්‍ය යයි පෙනී යන වාර්තාවේ සඳහන් යම් ලාභ හෝ පාඩු හෝ වත්කම් සහ බැරකම් ගණන් සම්බන්ධයෙන් වූ යම් ගැලපීම්, සටහනක් වශයෙන් දැක්වීම හෝ එම ගැලපීම් කොට ගැලපීම් කළ බව දැක්වීම හෝ කළ යුතු ය.

31. 20 වන, 21 වන සහ 22 වන ඡේදවලින් නියමිත යම් ගණකාධිකාරිවරුන්ගේ වාර්තාවක්, සමාගමක විගණකවරුන් වශයෙන් පත් කරනු ලැබීමට පනත යටතේ සුදුසුකම් ලත් ගණකාධිකාරීවරුන් විසින් පිළියෙල කරනු ලැබිය යුතු අතර, සමාගමේ හෝ සමාගමේ පාලිත සමාගමේ හෝ පාලක සමාගමේ නැතහොත් සමාගමේ පාලක සමාගමේ, පාලිත සමාගමක නිලධරයකු හෝ සේවකයකු හෝ හවුල්කරුවකු වන යම් ගණකාධිකාරිවරයකු විසින් හෝ එවැනි නිලධරයකුගේ හෝ සේවකයකුගේ හෝ සේවා නියුක්තියෙහි යොදවා සිටින යම් ගණකාධිකාරීවරයකු විසින් පිළියෙල කරනු නොලැබිය යුතු ය. තවද මේ ඡේදයේ කාර්යය සඳහා 'නිලධරයා' යන යෙදුමට යෝජිත අධ්‍යක්ෂවරයකු ඇතුළත් විය යුතු අතර විගණකවරයකු ඇතුළත් නොවිය යුතු ය.

පස්වන උපලේඛනය (131 වන වගන්තිය)

## වාර්ෂික වාර්තාවේ ඇතුළත් කිරීම පිණිස වූ කාරණා

සියලු සමාගම් විසින් හෝ යම් සමාගම් පන්තියක් විසින් ඔවුන්ගේ වාර්ෂික වාර්තාවෙහි ඇතුළත් කිරීමෙන් අත්හැර දැමිය හැකි කරුණු ලෙස මේ පනත යටතේ සාදන ලද නියෝගවල සඳහන් කරනු ලැබ ඇති යම් කරුණු හැරෙන්නට, සමාගමක වාර්ෂික වාර්තාවෙහි පහත දැක්වෙන කරුණු ඇතුළත් කරනු ලැබිය යුතු ය :–

(අ) වර්ෂයේ පළමුවන හෝ එකම සාමාන්‍ය මහා රැස්වීමේ දිනයෙන් දාහතරවන දිනයේ දී සමාගමේ කොටස් හිමියන් වන්නා වූ සියලු තැනැත්තන්ගේ සහ අන්තිම වරට වූ වාර්තාවේ දිනයෙන් පසුව නැතහොත් පළමුවන වාර්තාව සම්බන්ධයෙන් වූ විට සමාගම සංස්ථාගත කළ දිනයෙන් පසුව කොටස් හිමියන් වීම අවසන් කළ සියලු තැනැත්තන්ගේ ලැයිස්තුවක්;

(ආ) අන්තිමට දෙන ලද වාර්තාවේ දිනයේ සිට හෝ පළමුවන වාර්තාව සම්බන්ධයෙන් වන විට සමාගම සංස්ථාගත කරන ලද දිනයේ සිට පිළිවෙලින් තවමත් කොටස්හිමියන් ලෙස සිටින තැනැත්තන් විසින් සහ කොටස් හිමියන් ලෙස සිටීම අවසන් කරන ලද තැනැත්තන් විසින් පවරනු ලැබූ කොටස් ප්‍රමාණයන් සහ පැවරීම් ලියාපදිංචි කළ දිනයන් නිශ්චිතව සඳහන් කරමින් වාර්තාවේ සඳහන් කර ඇති කලින් සිටි සහ දැන් සිටින සියලු කොටස් හිමියන්ගේ නම් සහ ලිපිනයන් සහ වාර්තාවේ දිනයේ දී සිටින කොටස් හිමියන් එක් එක් අයකු විසින් දරන කොටස් ගණන. නම් අකාරාදි පිළිවෙලට පිළියෙල කර නොමැති නම්, ඒ ලැයිස්තුවේ ඇතුළත් යම් තැනැත්තකුගේ නම පහසුවෙන් සොයා ගැනීමට හැකිවනු පිණිස ප්‍රමාණවත් වන පටුනක් ඒ වාර්තාවට අමුණා තිබිය යුතු ය;

(ඇ) සංස්ථාගත කිරීමේ දිනය සහ සමාගමේ නමේ යම් වෙනස් කිරීමක්;

(ඈ) සමාගමේ ලියාපදිංචි කළ කාර්යාලයේ ලිපිනය;

(ඉ) සමාගම විසින් නිකුත් කර ඇති මුළු කොටස් සංඛ්‍යාව;

(ඊ) සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය;

(උ) අභිමිකරනු ලැබූ මුළු කොටස් සංඛ්‍යාව;

(ඌ) වාර්තාවේ දිනයට කොටස් බලපත්‍ර නිකුත් කිරීමට ඉතිරිව ඇත්තේ කවර කොටස් ප්‍රමාණයක් සඳහා ද ඒ මුළු කොටස් ප්‍රමාණය;

(එ) අන්තිම වාර්තාවේ දිනයෙන් පසු පිළිවෙලින්, නිකුත් කරන ලද සහ පවාරණය කරන ලද කොටස් බලපත්‍රවල මුළු ප්‍රමාණය;

(ඒ) එක් එක් කොටස් බලපත්‍රයක් සමන්විත වූ කොටස් ගණන

(ඔ) සමාගමේ අධ්‍යක්ෂවරයන්ගේ සහ ලේකම්වරුන්ගේ ලේඛනයෙහි අන්තර්ගත කිරීමට නියම කරනු ලැබ ඇති පරිදි වූ, වාර්තාවේ දිනයට සමාගමේ අධ්‍යක්ෂවරයන් වන හෝ ලේකම්වරයා වන තැනැත්තන් සම්බන්ධයෙන් සියලු විස්තර;

(ඕ) මේ පනත යටතේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි කිරීමට නියම කරනු ලැබ ඇති සියලු උකස් කිරීම් සහ අස්ථිර බැඳීම් සම්බන්ධයෙන් වූ සමාගමේ ණයගැතිභාවයේ මුළු ප්‍රමාණය;

(ක) වාර්තාවේ දිනට සමාගමේ විගණකවරයාගේ නම සහ ලිපිනය.

හයවන උපලේඛනය (186 වන වගන්තිය)

## පවරා දිය නොහැකි බලතල අධ්‍යක්ෂ මණ්ඩලයට පිරිනැමෙන විධිවිධාන

| | |
|---|---|
| 51 වන වගන්තිය | (කොටස් නිකුත් කිරීම) |
| 52 වන වගන්තිය | (කොටස් නිකුතුව සඳහා ප්‍රතිෂ්ඨාව) |
| 56 වන වගන්තිය | ( බෙදා හැරීම) |
| 58 (2) වන හා (3) වන වගන්ති | (ප්‍රකාශිත ප්‍රාග්ධනය) |
| 59 (4) වන වගන්තිය | (ප්‍රකාශිත ප්‍රාග්ධනය අඩු කිරීම) |
| 64 වන වගන්තිය | (තමාගේම කොටස් මිලදී ගැනීම) |
| 67 වන වගන්තිය | (සමාගමේ මනාපය නිදහස් කිරීම) |
| 70 වන වගන්තිය | (මූල්‍ය ආධාර දීමේදී සීමා කිරීම්) |
| 114 වන වගන්තිය | (ලියාපදිංචි කාර්යාලය වෙනස් කිරීම) |
| 241 වන වගන්තිය | (ඒකාබද්ධ කිරීමේ යෝජනාව අනුමත කිරීම) |
| 242 වන වගන්තිය | (කෙටි ආකාර ඒකාබද්ධ කිරීම) |
| 401 වන වගන්තිය | (අද්මිනිස්ත්‍රාසිකරු පත්කිරීමට මණ්ඩලය සතු බලය) |
| 415 වන වගන්තිය | (අද්මිනිස්ත්‍රාසිකරු ධුරයේ පුරප්පාඩුව) |

හත්වන උපලේඛනය [249 (2) වන වගන්තිය]

## ණයහිමියන්ගේ රැස්වීම්වල කාර්යය පටිපාටිය

1. රැස්වීම් පැවැත්වීමේ ආකාරය—

(අ) රැස්වීමට සහභාගි වීමට හිමිකම් ඇත්තා වූ ද රැස්වීම් පැවැත්වීමට නියම කරගෙන ඇති ස්ථානයට, දිනයට හා වේලාවට පැමිණීමට මනාපය පලකලා වූ ද ණයහිමියන් එක්රැස්වීම මගින්;

(ආ) සහභාගි වන සියලු ණයහිමියන්ට රැස්වීම පැවැත්වෙන මුළු කාලය තුළදීම එකිනෙකාට සවන් දිය හැකි ශ්‍රව්‍ය හෝ ශ්‍රව්‍ය සහ දෘශ්‍ය සන්දේශනය මගින් ; හෝ

(ඇ) මෙම උපලේඛනයේ 7 වන ඡේදයට අනුකූලව, සහභාගිවීමට හිමිකම් ඇති ණයහිමියන්ගේ තැපැල් ඡන්ද විමසීමක් පැවැත්වීම මගින්

ණයහිමියන්ගේ රැස්වීමක් පවත්වනු ලැබිය හැකි ය.

2. රැස්වීම පිළිබඳ දැන්වීම—

(1) රැස්වීම පැවැත්වීමට ප්‍රථම වැඩ කරන දින පහකට නොඅඩු කාලයක දී රැස්වීමට සහභාගි වීමට හිමිකම ඇති සෑම ණයහිමියකු වෙත සහ යම් ඇවරකරුවකු වෙත –

(අ) මේ උපලේඛනයේ 1(අ) ඡේදය යටතේ පැවැත්වීමට ඇති සෑම රැස්වීමකම වේලාව හා ස්ථානය;

(ආ) මේ උපලේඛයේ 1 (ආ) ඡේදය යටතේ පැවැත්වීමට ඇති සෑම රැස්වීමක් සඳහා වේලාව හා සංදේශන ක්‍රමය ;

(ඇ) මේ උපලේඛනයේ 1(අ), (ආ) හෝ (ඇ) ඡේද යටතේ පැවැත්වීමට ඇති සෑම රැස්වීමක් සඳහා ඡන්දය දීමේ ලියකියවිලි ආපසු යැවීම සඳහා වේලාව සහ ලිපිනය,

පිළිබඳ ලිඛිත දැන්වීමක් යැවිය යුතු ය.

(2) දැන්වීමෙහි –

(අ) තත් කාරණයට අදාළව ණයහිමියකුට සාධාරණ විනිශ්චයක් ඇති කර ගැනීමට හැකිවණු පිණිස, ප්‍රමාණවත් විස්තරයකින් යුතුව රැස්වීමේදී කටයුතු කිරීමට යන කටයුතුවල ස්වභාවය සඳහන් විය යුතු ය;

(ආ) රැස්වීමට ඉදිරිපත් කිරීමට ඇති යම් යෝජනා සම්මතයක පාඨය දැක්විය යුතු ය;

(ඇ) ඒ එක් එක් යෝජනා සම්මතය සම්බන්ධයෙන් ඡන්ද පත්‍රිකාවක් සහ ඡන්දය ප්‍රකාශ කිරීම හා එය තැපැල් කිරීම සම්බන්ධයෙන් උපදෙස් ඇතුළත් විය යුතු ය.

(3) ණයහිමියන්ගේ රැස්වීමක දැන්වීමක ඇති අවිධිමත්කමක් හෝ දැන්වීමක් ලැබීමට නොහැකිවීම හේතුවෙන් –

(අ) ඒ අවිධිමත්කම හෝ නොහැකිවීම වැදගත් නොවන්නේ නම්;

(ආ) රැස්වීමට සහභාගිවීමට සහ ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකම් ඇති සියලුම ණයහිමියන් අවිධිමත්කම හෝ නොහැකිවීම ගැන විරෝධයක් නොපා රැස්වීමට සහභාගි වන්නේ නම්; හෝ

(ඈ) ඒ සියලු ණයහිමියන් අවිධිමත්කම හෝ නොහැකිවීම අත්හැර දැමීමට එකඟ වන්නේ නම්,

ණයහිමියන්ගේ රැස්වීමක් විසින් කරන ලද කිසිවක් අවලංගු නොවන්නේ ය.

(4) ණයහිමියන්ගේ රැස්වීම එකඟවන්නේ නම්, සභාපතිවරයා විසින් රැස්වීම කලින් කල අඩාලව කල්තැබීම සහ තැනින් තැනට ගෙනයාම කළ හැකි ය.

(5) අඩාලව කල්තැබීම සඳහා වූ යෝජනා සම්මතයෙහි වෙනත් ස්ථානයක් නිශ්චිතව සඳහන් කර ඇත්තේ නම් මිස, අඩාලව කල්තබන ලද රැස්වීමක් එම ස්ථානයෙහිම පැවැත්විය යුතු ය.

(6) මේ උපලේඛනයේ 1 (අ) හෝ 1 (ආ) ඡේදය යටතේ වූ ණයහිමියන්ගේ රැස්වීමක් දින තිහකට අඩු කාලයකට අඩාලව කල්තබන ලද අවස්ථාවක, අඩාලව කල් තබන ලද රැස්වීමේ දී ඒ බව දැනුම්දීමක් කිරීම හැර, අඩාලව කල් තැබූ රැස්වීමේ දිනය හා ස්ථානය පිළිබඳ දැන්වීමක් කිරීම අවශ්‍ය නොවන්නේ ය.

3. සභාපතිවරයා—

(1) ඇවරකරුවකු පත් කරනු ලැබ ඇති සහ ඔහු පැමිණ සිටින නැතහොත් ඇවරකරු විසින් නාමිකයකු පත් කරනු ලැබ ඇති සහ ඒ නාමිකයා පැමිණ සිටින අවස්ථාවක, ඔහු හෝ ඇය මේ උපලේඛනයේ 1(අ), හෝ (ආ) ඡේදයට අනුකූලව පවත්වනු ලබන රැස්වීමක සභාපතිවරයා ලෙස ක්‍රියා කළ යුතු ය.

(2) ඇවරකරුවකු නොමැති හෝ ඇවරකරු හෝ ඇවරකරුගේ යම් නාමිකයකු යන දෙදෙනාගෙන් කවරකු හෝ පැමිණ නොසිටින යම් අවස්ථාවක, රැස්වීමට සහභාගි වන ණයහිමියන් විසින් ඔවුන්ගෙන් එක් අයකු ඒ රැස්වීමේ සභාපතිවරයා ලෙස තෝරා ගත යුතු ය.

(3) අන්‍යාකාරයෙන් කරනු නොලැබුවේ නම් රැස්වීමේ මුලසුන ගන්නා තැනැත්තා විසින් කරනු ලැබිය හැකි අවශ්‍ය සියලු දේ, මේ උපලේඛනයේ 1 (ඇ) ඡේදය යටතේ රැස්වීමක් කැඳවන තැනැත්තා විසින් අන්‍යාකාරයෙන් කළ යුතු ය.

4. ගණපූරණය—

(1) ණයහිමියන්ගේ රැස්වීමක් සඳහා –

(අ) ඡන්දය ප්‍රකාශ කිරීමට ඇති ණයහිමියන් තුන්දෙනකු හෝ ඔවුන්ගේ ප්‍රතියුක්තයන් පැමිණ සිටී නම් හෝ ඔවුන් විසින් තැපැල් ඡන්දය ප්‍රකාශ කර ඇත්නම්; හෝ

(ආ) ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකම් ඇති ණයහිමියන්ගේ සංඛ්‍යාව තුන නොඉක්මවන්නේ නම්, ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකම් ඇති ණයහිමියන් හෝ ඔවුන්ගේ ප්‍රතියුක්තයන් පැමිණ සිටී නම් හෝ තැපැල් ඡන්දය ප්‍රකාශ කර ඇත්නම්,

ගණපූරණයක් තිබිය යුතු ය.

(2) රැස්වීම පැවැත්වීමට නියමිත වේලාවෙන් පසු විනාඩි තිහක් ඇතුළත දී ගණපූරණයක් ඇති නොවූ අවස්ථාවක, ඒ රැස්වීම ඊළඟ සතියේ එම දිනයේ එම වේලාවටම හා එම ස්ථානයේදීම පැවැත්වීම පිණිස හෝ එහි සභාපතිවරයා විසින් නියම කරනු ලැබිය හැකි වෙනත් යම් දිනයක, වේලාවක සහ ස්ථානයක පැවැත්වීම පිණිස අඩාලව කල් තැබිය යුතු ය ; අඩාලව කල් තැබූ රැස්වීමේ දී ඒ රැස්වීම පැවිත්වීමට නියමිත වේලාවෙන් පසු විනාඩි තිහක් ඇතුළත ගණපූරණයක් ඇති නොවුනහොත්, පැමිණ සිටින ණයහිමියන් හෝ ඔවුන්ගේ ප්‍රතියුක්තයන් විසින් ගණපූරණයක් ඇති කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

5. ඡන්දය ප්‍රකාශ කිරීම—

(1) 250 වන වගන්තියේ හෝ 407 වන වගන්තියේ කාර්යය සඳහා පවත්වනු ලබන රැස්වීමක දී හැර, ණයහිමියන්ගේ හෝ ණයහිමියන් පන්තියක යම් රැස්වීමක දී පුද්ගලිකව හෝ ප්‍රතියුක්තයන් මගින් ඡන්දය ප්‍රකාශ කරන ණය හිමියන් හෝ ණයහිමියන් පන්තියක බහුතර සංඛ්‍යාවක් විසින් සහ බහුතර අගයක් සහිතව යෝජනා සම්මතයකට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළහොත්, ඒ යෝජනා සම්මතය සම්මත විය යුතු ය.

(2) 250 වන හෝ 407 වන වගන්තියේ කාර්යය සඳහා පවත්වනු ලබන ණයහිමියන්ගේ හෝ ණයහිමියන් පන්තියක යම් රැස්වීමක දී, ණයහිමියන්ගේ හෝ ණයහිමියන් පන්තියක හෝ අගයෙන් සියයට හැත්තෑපහක් නියෝජනය වන සංඛ්‍යාවෙන් බහුතරයක් විසින් පුද්ගලිකව හෝ ප්‍රතියුක්තකයන් මගින් යෝජනා සම්මතයට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළහොත් ඒ යෝජනා සම්මතය සම්මත විය යුතු ය.

(3) රැස්වීමේ සභාපතිවරයාට තීරක ඡන්දයක් නොතිබිය යුතු ය.

6. ප්‍රතියුක්තයන්—

(1) තමාම පැමිණ සිටීමෙන් හෝ ප්‍රතියුක්තියකු මගින් යන දෙයාකාරයෙන් කවර හෝ ආකාරයකින් ණයහිමියකු විසින් ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ක්‍රියාත්මක කළ හැකි ය.

(2) ණයහිමියකුගේ ප්‍රතියුක්තයාට ප්‍රතියුක්තයා ණයහිමියාම වන්නේ නම්, ඒ ආකාරයෙන්ම ණයහිමියන්ගේ රැස්වීමට පැමිණ සිටීමට සහ සවන් දෙනු ලැබීමට හිමිකම තිබේ.

(3) ණයහිමියා විසින් අත්සන් කරන ලද ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් ප්‍රතියුක්තයකු පත් කරනු ලැබිය යුතු අතර ඒ පත්වීම යම් විශේෂ රැස්වීමක් සඳහා ද නැතහොත් මාස දොළහක් නොඉක්මවන යම් නිශ්චිතව සඳහන් කාලසීමාවක් සඳහා ද යන්න දැන්වීමෙහි සඳහන් විය යුතු ය.

(4) ප්‍රතියුක්තයකු පත්කිරීමේ දැන්වීමේ පිටපතක් රැස්වීම ආරම්භ වීමට පැය විසි හතරකට නොඅඩු කාලයකට පෙර, ඈවරකරුට හෝ, ඈවරකරුවකු ක්‍රියා නොකරන්නේ නම් රැස්වීම කැඳවීමේ දැන්වීම ලබාදුන් තැනැත්තාට හෝ භාරදෙනු ලැබ ඇත්නම් මිස, කිසිම ප්‍රතියුක්තයකු පත්කිරීමක් රැස්වීමක් සම්බන්ධයෙන් බලසහිත නොවේ.

7. තැපැල් ඡන්ද—

(1) මේ උපලේඛනයේ 1(අ) වන හෝ (ආ) වන හෝ (ඇ) වන හෝ ඡේදයට අනුකූලව පවත්වනු ලබන ණය හිමියන්ගේ රැස්වීමක දී, ඡන්දය දීමට හිමිකමක් ඇති ණය හිමියකු විසින්, රැස්වීමේ දී තීරණය කළ යුතු කරුණක් සම්බන්ධයෙන්, තැපැල් ඡන්දයක් දීමෙන්, ඡන්දය දීමේ තම අයිතිවාසිකම ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(2) ඒ රැස්වීම සම්බන්ධයෙන් තැපැල් ඡන්ද භාර ගැනීමට හා ගණන් කිරීමට බලය දෙනු ලැබ ඇති තැනැත්තාගේ නම, රැස්වීම පිළිබඳ දැන්වීමේ ප්‍රකාශ කර තිබිය යුතු ය.

(3) රැස්වීමක් සම්බන්ධයෙන් තැපැල් ඡන්ද භාර ගැනීමට හා ගණන් කිරීමට කිසිම තැනැත්තකුට බලය දී නොමැති නම්, හෝ රැස්වීම පිළිබඳ දැන්වීමේ එසේ බලය දී ඇති බවට කිසිම තැනැත්තකු නම් කර නොමැති නම් –

(අ) සෑම අධ්‍යක්ෂවරයකුට ම;

(ආ) සමාගම අද්මිනිස්ත්‍රාසිකර ඇත්නම්, අද්මිනිස්ත්‍රාසිකරුට; හෝ

(ඇ) සමාගම ඈවරකර ඇත්නම් ඈවරකරුට,

ඒ බලය පවරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) ලකුණු කරන ලද ඡන්ද ප්‍රතිකාවක්, රැස්වීමට අදාලව තැපැල් ඡන්දය භාර ගැනීමට සහ ගණන් කිරීමට බලය දෙනු ලැබ ඇති තැනැත්තා වෙත ඒ රැස්වීම ආරම්භ වීමට පැය විසිහතරකට නොඅඩු කාලයකට පෙර ලැබෙන පරිදි හෝ, ඒ රැස්වීම පවත්වනු ලබන්නේ මේ උපලේඛනයේ 1(ඇ) වන ඡේදය යටතේ නම්, ඡන්ද පත්‍රිකාව ආපසු එවීමට නියමිත දිනයට වඩා පසු නොවන පරිදි හෝ එවීමෙන්, රැස්වීමක දී ඡන්දය දෙනු ලැබිය යුතු සියලු කරුණු හෝ යම් කරුණක් පිළිබඳව ණයහිමියකු විසින් තැපැල් ඡන්දයක් දෙනු ලැබිය හැකි ය.

(5) (අ) ඔහු හෝ ඇය විසින් භාරගන්නා ලද සියලු තැපැල් ඡන්ද එකතු කිරීම; සහ

(ආ) ඡන්ද දිය යුතු එක් ඒක් යෝජනා සම්මතයට අදාලව –

(i) යෝජනා සම්මතයට පක්ෂව ඡන්දය දී ඇති, අවස්ථාවෝචිත පරිදි ණය හිමියන් සංඛ්‍යාව හෝ ණය හිමියන් පන්තියකට අයත් ණය හිමියන් සංඛ්‍යාව ගණන් කර, ඒ ණය හිමියන්ට සමාගමෙන් ණයව ඇති මුළු ණය ප්‍රමාණය නිශ්චය කිරීම; සහ

(ii) යෝජනා සම්මතයට විපක්ෂව ඡන්දය දී ඇති, අවස්ථාවෝචිත පරිදි ණය හිමියන් සංඛ්‍යාව හෝ ණය හිමියන් පන්තියකට අයත් ණය හිමියන් සංඛ්‍යාව ගණන් කර, ඒ ණය හිමියන්ට සමාගමෙන් ණයව ඇති මුළු ණය ප්‍රමාණය නිශ්චය කිරීම; සහ

(ඇ) (i) (අ) සහ (ආ) අනු ඡේදවල දක්වා ඇති කාර්යය ඔහු හෝ ඇය විසින් ක්‍රියාවට නැංවූ බවට; සහ

(ii) (ආ) වන අනු ඡේදය මගින් නියම කර ඇති ගණන් කිරීමේ ප්‍රතිඵල සහ තීරණය කිරීම්වල ප්‍රතිඵල ප්‍රකාශ කරමින්,

සහතිකයක් අත්සන් කිරීම; සහ

(ඇ) ඉහත (ඇ) උප ඡේදයේ නියම කර ඇති සහතිකය රැස්වීම කැඳවන හෝ එහි මූලාසනය දරන තැනැත්තා වෙත ඉදිරිපත් කරන බවට සහතික වීම,

රැස්වීම්වලට අදාලව තැපැල් ඡන්ද භාර ගැනීමට හා ගණන් කිරීමට බලය දෙනු ලැබ ඇති තැනැත්තාගේ කාර්යය විය යුතු ය.

(6) මේ උපලේඛනයේ 1(අ) වන හෝ (ආ) වන හෝ ඡේද යටතේ පවත්වනු ලබන රැස්වීමක දී තැපැල් ඡන්ද දෙනු ලැබ ඇති යෝජනා සම්මතයන් පිළිබඳව ඡන්දයක් විමසනු ලබන්නේ නම්, යෝජනා සම්මතයට පක්ෂව හෝ විපක්ෂව හෝ යථා පරිදි ඡන්ද පත්‍රිකාවල ලකුණු කර එවන ලද, සියලු ණය හිමියන්ගේ ඡන්දවල ප්‍රතිඵල ඒ රැස්වීමේ මූලසුන දරන තැනැත්තා විසින් ඊට ඇතුළත් කළ යුතු ය.

(7) ණය හිමියන්ගේ රැස්වීමක් සම්බන්ධව දෙන ලද තැපැල් ඡන්ද සම්බන්ධයෙන්, (5) වන උප ඡේදය යටතේ දෙන ලද සහතිකයක්, රැස්වීමේ වාර්තාවට අමුණනු ලැබිය යුතු ය.

8. වාර්තා

(1) ණය හිමියන්ගේ රැස්වීමක මූලාසනය දරන තැනැත්තා විසින් හෝ, මේ උපලේඛනයේ 1(ඇ) වන ඡේදය යටතේ පවත්වනු ලබන රැස්වීමක් සම්බන්ධයෙන් වන විට, රැස්වීම කැඳවනු ලබන තැනැත්තා විසින් හෝ එහි සියලු කටයුතුවල වාර්තා තබන බවට වගබලා ගත යුතු ය.

(2) රැස්වීමේ මූලාසනය දරන තැනැත්තා හෝ රැස්වීම කැඳවනු ලබන තැනැත්තා හෝ විසින්, නිවැරදි බවට අත්සන් කරන ලද වාර්තා රැස්වීමේ කටයුතු පිළිබඳව බැලූ බැල්මට පෙනෙන සාක්ෂි වන්නේ ය.

9. සංස්ථාවලට නියෝජිතයන් මගින් ක්‍රියා කළ හැකි බව.

ණය හිමියකු වන සංස්ථාපිත මණ්ඩලයක් විසින්, ණයහිමියන්ගේ රැස්වීමකට තමා වෙනුවෙන් සහභාගි වීම සඳහා නියෝජිතයකු පත් කරනු ලැබිය හැකි ය.

10. වෙනත් කටයුතු.

මේ උපලේඛනයේ සහ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක හැර ණයහිමියන්ගේ රැස්වීමක කාර්යය පරිපාටිය ඒ රැස්වීම විසින්ම විධිමත් කර ගනු ලැබිය හැකි ය.

අටවන උපලේඛනය [355 (2) වන වගන්තිය]

## අධිකරණයෙහි අධීක්ෂණයට යටත්ව කෙරෙන ගණන් බේරා වසා දැමීමක් විෂයෙහි ලා අදාළ නොවන විධිවිධාන

| | |
|---|---|
| නිල භාරගැනුම්කරුට ඉදිරිපත් කරනු ලැබිය යුතු සමාගමේ කටයුතු පිළිබඳ ප්‍රකාශය | (වග. 283) |
| නිල භාරගැනුම්කරු විසින් පකස් කරනු ලබන වාර්තාව | (වග. 284) |
| ඈවරකරුවන් පත්කිරීමට අධිකරණයට ඇති බලය | (වග, 285) |
| තාවකාලික ඈවරකරුගේ පත් කිරීම සහ බලතල | (වග. 286) |
| ගණන් බේරා වසා දැමීමේ දී ඈවරකරුවන් පත් කිරීම, ඔවුන්ගේ අභිධාන ආදිය | (වග. 287) |
| ඈවරකරු වශයෙන් නිල භාර ගැනුම්කරු නොවන වෙනත් තැනැත්තකු පත් කරනු ලැබූ විට බලපෑ යුතු විධිවිධාන | (වග. 288) |
| ඈවරකරුවන්ට අදාළ සාමාන්‍ය විධිවිධාන | (වග. 289) |
| ඈවරකරුවන්ගේ බලතල ක්‍රියාත්මක කිරීම සහ පාලනය කිරීම | (වග. 293) |
| ඈවරකරු විසින් තැබිය යුතු පොත් | (වග. 294) |
| ඈවරකරු බැංකුවට කරන ගෙවීම් | (වග. 295) |
| ඈවරකරුවන්ගේ ගිණුම් විගණනය කිරීම | (වග. 296) |
| සමාගමේ රෙජිස්ට්‍රාර්වරයා විසින් ඈවරකරුවන් පාලනය කිරීම | (වග. 297) |
| ඈවරකරුවන් මුදාහැරීම | (වග. 298) |
| පරීක්ෂණ කමිටුවක් පත්කළ යුතු ද නැද්ද යන්න නිශ්චය කිරීම සඳහා ණය හිමියන් ගේ සහ ආධාරකරුවන්ගේ රැස්වීම | (වග. 299) |
| පරීක්ෂණ කමිටුවේ සංයුතිය සහ කාර්යය පරිපාටිය | (වග. 300) |
| පරීක්ෂණ කමිටුවක් නොමැති අවස්ථාවක අධිකරණය සතු බලතල | (වග, 301) |

විශේෂ කළමනාකරු පත්කිරීම (වග. 307)

ප්‍රවර්ධකයන්, අධ්‍යක්ෂවරුන් ආදීන් මහජන පරීක්ෂාවට භාජනය කිරීමට ආඥා කිරීමේ බලය (වග. 311)

සමාගම් පාලනය කිරීම තහනම් කරනු ලැබූ තැනැත්තන් (වග. 213)

අධිකරණයේ ඇතැම් බලතල ඇවරකරු වෙත පැවරීම (වග. 315)

නමවන උපලේඛනය [365 (2) වන වගන්තිය]

### වරණීය හිමිකම් පෑම්

1. ඇවරකරු විසින්, ඒවා ලැයිස්තුගත කර ඇති ප්‍රමුඛත්වයේ අනුපිළිවෙල අනුව පහත දැක්වෙන ගෙවීම් පළමුව කළ යුතු ය :–

(අ) ඇවරකරුගේ කාර්යය කිරීමේ දී සහ බලතල ක්‍රියාත්මක කිරීමේ දී, ඇවරකරු විසින් නිසි පරිදි දරන ලද ගාස්තු සහ වියදම් සහ, ඇවරකරුගේ පාරිශ්‍රමික;

(ආ) ඉල්ලීම මගින් පෙනී සිටින තැනැත්තාගේ අධිකරණය විසින් ඉඩ දෙන ලද සාධාරණ නඩු ගාස්තු ඇතුළත් කරමින්, සමාගම ඇවරකරනු ලැබිය යුතු බවට ආඥාවක් ලබාගැනීම සඳහා, අධිකරණයට ඉල්ලීමක් කළ තැනැත්තකුගේ සාධාරණ නඩු ගාස්තු;

(ඇ) ඇවරකිරීමේ කමිටුව විසින් අවශ්‍යයෙන්ම ස්වකීය පුද්ගලික මුදලින් දරන ලද සැබෑ වියදම්.

2. 1 වන ඡේදයේ දක්වා ඇති හිමිකම් පෑම් සඳහා ගෙවීම් කිරීමෙන් පසුව, ඇවරකරු විසින් පහත දැක්වෙන ගෙවීම් ඉන් අනතුරුව කළ යුතු ය :–

(අ) යම් සේවා නියුක්තයකුට අයවිය යුතු සියළු අර්ථ සාධක අරමුදල් සේවක භාරකාර අරමුදල් සහ පාර්තෝෂික ගෙවීම ;

(ආ) ඇවරකිරීම ආරම්භ කිරීමට පෙරාතුව වූ පූර්ණ අවුරුද්දක් සඳහා අය කරනු ලැබූ හෝ අය කරනු ලැබිය හැකි ආදායම් බද්ද, එම අවුරුද්ද දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන අනුව තෝරා ගනු ලැබිය යුතු ය;

(ඇ) ඇවර කිරීම ආරම්භ කිරීමට පෙරාතුව එක් සම්පූර්ණ වර්ෂයක් සඳහා අයකරන ලද හෝ අයකළ යුතු පිරිවැටුම් බද්ද ;

(ඈ) ඇවරකිරීම ආරම්භ කිරීමට පෙරාතුව වූ බදු අයකළ හැකි කාලසීමා හතරක් සඳහා අය කරනු ලැබූ හෝ අය කරනු ලැබිය හැකි වූ එකතු කළ අගය මත බදු, එම බදු අයකළ හැකි කාලසීමා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ විධිවිධාන අනුව තෝරාගනු ලැබිය යුතු ය;

(ඉ) ඇවරකිරීම ආරම්භයේ දී සමාගමෙන් අය විය යුතුව තිබෙන එම දිනයට පෙරාතුව වූ දොළොස් මාසය ඇතුළත අයවිය යුතු හා ගෙවිය යුතු සියලුම වරිපනම් හෝ (ආදායම් බදු නොවන) බදු;

(ඊ) කලින් කල කරනු ලැබුවා වූ හෝ සපයනු ලැබුවා වූ සේවාවන් සඳහා පුනරාවර්තන ගෙවීම් වශයෙන්, ආණ්ඩුවට අය විය යුතු වූ සියලු අයවීම්;

(උ) කාර්මික අධිකරණ ප්‍රදානයන් සහ යම් සේවා නියුක්තයකුට ගෙවිය යුතු වෙනත් ව්‍යවස්ථාපිත අයකිරීම් ;

(ඌ) 4 වන ඡේදයට යටත්ව, ඇවරකිරීම ආරම්භයට පෙරාතුව වූ මාස හතර තුළ සමාගමට කරන ලද සේවාවන් සම්බන්ධයෙන් කොමිස් මුදලක් වශයෙන් මුළුමණින්ම හෝ කොටසක් වශයෙන් හෝ උපයනු ලැබූ හෝ එසේ උපයනු නොලැබූ ද කාලය අනුව ගෙවිය යුතු වූ ද නැතහොත් කෑලි ගණනට ගෙවිය යුතු වූද, යම් සේවා නියුක්තයකුගේ සියලු වැටුප් හෝ වේතන;

(එ) ඇවරකිරීම ආරම්භ කිරීමට පෙර හෝ ඇවර කිරීම ආරම්භ කිරීමේ හේතුවෙන් හෝ යම් සේවා නියුක්තයකුගේ සේවය අවසන් වූ විට, ඔහුට (හෝ සේවා නියුක්තිකයා මියගොස් ඇති අවස්ථාවක, සේවා නියුක්තයාගේ අයිතිවාසිකම යටතේ වෙනත් තැනැත්තකුට) ගෙවිය යුතු වන නිවාඩු වැටුප්;

(ඒ) ඇවරකිරීම ආරම්භයේ දී කම්කරු වන්දි ආඥා පනතේ 24 වන වගන්තියේ සඳහන් කර ඇති වර්ගයේ ගිවිසුමක් යටතේ සේවා නියුක්තිකයා වෙත පවරා ඔහු සතු කොට දෙනු ලැබිය හැකි අයිතිවාසිකම් සමාගම සතුව ඇත්නම් මිස, ඇවර කිරීම ආරම්භ කිරීමට පෙර ඒ ආඥාපනත යටතේ උපචිත වූ යම් වන්දි හෝ වන්දි ගෙවීමට යටත් වීමක් හෝ සම්බන්ධයෙන් ලැබිය යුතු සියලුම මුදල්;

(ඔ) 4 වන ඡේදයට යටත්ව, සේවා නියුක්තයාගේ බැඳීම් සම්පූර්ණයෙන් නිදහස් කිරීම සඳහා සමාගම විසින් සේවානියුක්තයකුගේ වැටුප හෝ වේතනයෙන්, අඩු කර ගන්නා ලද මුදල්.

3. 2 වන ඡේදයේ සඳහන් කර ඇති හිමිකම් පෑම් ගෙවීමෙන් පසුව, ඇවරකරු විසින් මේ පනතේ 254 වන වගන්තියේ (ඈ) වන ඡේදයේ සඳහන් කර ඇති අනිකුත් ගාස්තු ප්‍රමාණ ඉන් අනතුරුව ගෙවිය යුතු ය.

4. 2 (ඌ) වන ඡේදය යටතේ ප්‍රමුඛත්වය දෙනු ලැබිය යුතු මුදල, යම් සේවා නියුක්තයකු විෂයෙහි ලා රුපියල් දොළොස් දහසක මුදලක් හෝ ඇවරකිරීම ආරම්භයේ දී තීරණය කරනු ලබන ඊට වඩා වැඩි මුදලක් හෝ නොඉක්මවිය යුතු ය.

5. කම්කරු වන්දි ආඥා පනත යටතේ වූ යම් වන්දියක් අර්ධ මාසික ගෙවීමක් වන අවස්ථාවක, 2(ඒ) වන ඡේදයේ කාර්යය සඳහා ඒ වන්දිය සම්බන්ධයෙන් අයවිය යුතු මුදල, ඒ ආඥා පනත යටතේ ඒ ගෙවීම එකවර ලැබෙන මුදලක් බවට පරිවර්තනය කරනු ලැබිය හැකි ප්‍රමාණය විය යුතු ය.

6. (අ) සමාගමක යම් සේවා නියුක්තයකුට වැටුප් වශයෙන් හෝ වේතන වශයෙන්; හෝ

(ආ) එවැනි යම් සේවා නියුක්තයකුට හෝ ඔහු මිය ගිය අවස්ථාවක, සේවා නියුක්තයා වෙනුවෙන් වෙනත් තැනැත්තකුට, නිවාඩු වැටුප් වශයෙන්,

යම් ගෙවීමක්, ඒ කාර්යය සඳහා යම් තැනැත්තකු විසින් කලින් දෙන ලද මුදල් ප්‍රමාණයකින් කරනු ලැබ ඇති අවස්ථාවක, ගෙවීම කර නොතිබුනේ නම්, ඈවර කිරීමේ දී ඒ සේවා නියුක්තයා හට හෝ සේවා නියුක්තිකයා වෙනුවෙන් ගෙවීම ලබා ගන්නා තැනැත්තාට එසේ කලින් දෙන ලද මුදල සඳහා ඇති ප්‍රමුඛතා අයිතියට සමාන වූ ප්‍රමුඛතා අයිතියක් එසේ කලින් මුදල් දෙන ලද තැනැත්තාට ද ඇත්තේ ය.

7. 1. 2 හා 3 යන එක් එක් ඡේදවල ලැයිස්තුගත කරන ලද හිමිකම් පෑම්—

(අ) ඒවා අතරෙහි සම තලයක තිබිය යුතු අතර, ඒවා ගෙවීම සඳහා වත්කම් ප්‍රමාණවත් නොවුවහොත් මිස, සම්පූර්ණයෙන්ම ගෙවනු ලැබිය යුතු ය; තව ද එකී හිමිකම් පෑම් ගෙවීම සඳහා වත්කම් ප්‍රමාණවත් නොවුවහොත් ඒවා සමානුපාතිකව අඩු කළ යුතු ය; තව ද

(ආ) සාමාන්‍ය ණය හිමියන්ට ගෙවීම සඳහා සමාගමේ ඇති වත්කම් යම්තාක් දුරට ප්‍රමාණවත් නොවන්නේ ද එවිට, එසේ ප්‍රමාණවත් නොවූ කොටසට චල සෘණ භාරයකට යටත් යම් තැනැත්තන්ගේ හිමිකම්පෑම් අභිභවා ප්‍රමුඛත්වයක් හිමිවිය යුතු අතර, ඒ අනුව ඒ වත්කම්වලින් ඒවා ගෙවිය යුතු ය.

මේ ඡේදයේ කාර්යය සඳහා "චල සෘණභාරය" යන්නට, ඒ චල සෘණ භාරය ඇති කරන ලද අවස්ථාවේ දී චල සෘණ භාරයක් ප්‍රදානය කිරීමට උපයෝජිත වූ නමුත් පසුව ස්ථාවර හෝ නිශ්චිත හෝ බැඳීමක් බවට පත්වූ යම් ඇපයක් ඇතුළත් වේ.

8. මේ උපලේඛනයේ කාර්යය සඳහා –

(අ) නිවාඩු කාලපරිච්ඡේදයක් වෙනුවෙන් නැතහොත් අසනීපවීම නිසා හෝ වෙනත් සෑහෙන හේතුවක් නිසා හෝ වැඩට නොපැමිණ සිටි කාලපරිච්ඡේදයක් වෙනුවෙන් වූ පාරිශ්‍රමිකයක්, ඒ කාලපරිච්ඡේදය තුළ දී සමාගම වෙත ඉටු කරන ලද සේවා වෙනුවෙන් වූ වැටුප් ලෙස සලකනු ලැබිය යුතු ය.

(ආ) "නිවාඩු වැටුප" යන්න යම් තැනැත්තකු සම්බන්ධයෙන් යෙදී ඇති විට, නිවාඩුව ලැබීමට ඔහු හිමිකම් ලබන තෙක් සමාගමේ ඔහුගේ සේවා නියුක්තිය නොකඩවා පැවතියේ නම් නිවාඩු කාල පරිච්ඡේද සම්බන්ධයෙන් සාමාන්‍ය ක්‍රියාවලියේ දී සමාගම විසින් ඒ තැනැත්තාට පාරිශ්‍රමික වශයෙන් ඔහුගේ සේවා නියුක්ත ගිවිසුම ප්‍රකාර හෝ (යම් ලිඛිත නීතියක් යටතේ කරන ලද යම් ආඥාවක් හෝ දෙන ලද විධානයක් ඇතුළුව) යම් ප්‍රඥප්තියක් ප්‍රකාර ගෙවිය යුතුව ඇති සියලු මුදල් ඒ යෙදුමට ඇතුළත් වේ.

(ඇ) "වරිපනම්" හෝ "බදු" යන යෙදුමෙන් ආණ්ඩුව විසින් හෝ යම් පළාත් සභාවක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ යම් ලිඛිත නීතියක් මගින් හෝ යටතේ පිහිටුවන ලද වෙනත් ආයතනයක් විසින් හෝ පනවනු ලැබූ යම් වරිපනම් ගාස්තු, බදු නැතහොත් කරන ලද තක්සේරුවක් අදහස් වේ.

දහවන උපලේඛනය [ 366 (5) වන වගන්තිය]

## ඇවර කිරීමේ දී හිමිකම් ගෙවීම්

1. ඇවරකරු, ඔහු විසින් දරනු ලබන අරමුදල්වලින් ඔහු සුදුසුයයි සිතනු ලබන යම් ප්‍රමාණයක් ඇවර කිරීමේ දී හිමිකම් ඉදිරිපත් කර ඇති ණය හිමියන්ට, කලින් කලට බෙදා දෙනු ලැබිය හැකි ය.

2.ණය හිමියන්ට යම් ගෙවීමක් කිරීමට පෙර, ඇවරකරු ඔහු විසින් භාරගෙන ඇති සියලුම හිමිකම් පෑම්, හිමිකමේ ප්‍රමාණය, සහ හිමිකම් පෑම් කර ඇති එක් එක් තැනැත්තාට ගෙවීමට ඇති ප්‍රමාණය පෙන්නුම් කරමින් ලැයිස්තුවක් සකස් කළ යුතු ය.

3. ගෙවීමක් කිරීමට පෙර, ඇවරකරු විසින් –

(අ) ගෙවීමට සහභාගි වීමට කැමැති යම් ණය හිමියකු, විසින් හිමිකම්පෑමක් ගොනු කරනු ලැබිය යුතු වන්නේ යම් දිනයක දීද එදිනට පෙරාතුව වූ යම් දිනයක් හිමිකම් පෑම ගොනු කිරීම පිණිස නියම කරනු ලැබිය හැකි අතර;

(ආ) ගෙවීමක් කරනු ලබන බවට සහ (අ) වන අනු ඡේදය යටතේ නියම කර න ලද දිනය පිළිබඳව ප්‍රසිද්ධ දැන්වීමක් කරනු ලැබිය හැකි ය.

4. 3 වන ඡේදයේ (අ) අනු ඡේදයේ කාර්යය සඳහා නියම කර ඇති දිනය, 3 වන ඡේදයේ (ආ) අනු ඡේදය යටතේ ප්‍රසිද්ධ දැන්වීම කරනු ලැබූ දිනයෙන් පසු එළඹෙන වැඩ කරන දින විස්සකට අඩු කාලයක් නොවිය යුතු හෝ, යෝජිත ගෙවීමේ දිනයට පෙර එළඹෙන වැඩ කරන දින විස්සක් ඉක්ම වූ දිනයක් හෝ නොවිය යුතු ය.

5. ඇවරකරු විසින්, 3 වන ඡේදය යටතේ කරන ලද දැන්වීමක නිශ්චිතව දක්වා ඇති දිනයට පෙර හිමිකම් පෑමක් කරනු නොලබන යම් ණය හිමියකු, ගෙවීමකින් බැහැර කරනු ලැබිය හැකි ය.

6. 2 වන ඡේදය යටතේ ඇවරකරු විසින් සකස් කරන ලද ලැයිස්තුව, හිමිකමක් ඉදිරිපත් කර ඇති යම් ණය හිමියකුගේ හෝ සමාගමේ යම් කොටස් හිමියකුගේ පරීක්ෂාව සඳහා, ගෙවීමේ දිනයට පෙර එළඹෙන වැඩ කරන දින දහයකට වඩා අඩු කාලයක එක් එක් වැඩ කරන දිනයේ දී, ලබාගත හැකි විය යුතු ය.

7. ඒ ණය හිමියාගේ හිමිකම් පෑම භාර ගැනීම සඳහා වූ ඇවරකරුගේ තීරණය, ප්‍රතිවර්තනය කිරීමේ හෝ මඳ වශයෙන් වෙනස් කිරීමේ හෝ ආඥාවක් සඳහා 292 වන වගන්තියේ (3) වන උපවගන්තිය හෝ 348 වන වගන්තිය හෝ යටතේ වූ ඉල්ලීමක් පිළිබඳව දැනුම් දීම, ඇවරකරු විසින් 3 වන ඡේදය යටතේ කරන ලද ප්‍රසිද්ධ දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති දිනයට පෙර ඇවරකරුට භාර දී ඇත්නම් මිස, ඇවරකරු විසින් 3 වන ඡේදය යටතේ වූ ප්‍රසිද්ධ දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති දිනයේ දී, ලැයිස්තුවේ දක්වා ඇති එක් එක් ණය හිමියාට ගෙවීම කරනු ලැබිය යුතු ය. ඇවරකරු විසින් හිමිකම් පෑමක් පිළිගනු ලැබීමට එරෙහිව පසුව කරන ලද අභියෝගයක ප්‍රතිඵලයක් වශයෙන් මේ ඡේදයට අනුකූලව කරන ලද කිසිම ගෙවීමක්, වෙනස් කිරීමකට යටත් නොවිය යුතු ය.

8. ඇවරකරු විසින් ණය හිමියන්ට ගෙවීම් එකක් හෝ ඊට වැඩි ගණනක් කරනු ලැබීමෙන් පසුව, ණය හිමියකු විසින් හිමිකම් පෑමක් කරනු ලබන විටක –

(අ) සමාගමේ වත්කම් ගෙවීම් කිරීමට ප්‍රමාණවත් වන තාක් දුරට ඒ ණය හිමියාගේ හිමිකම් පෑම් සම්බන්ධයෙන් ද එම තත්වයේම හිමිකම් පා ඇති වෙනත් ණය හිමියන්ට කලින් කරන ලද ගෙවීම්වල අනුප්‍රමාණය මතම ගෙවීම් කරනු ලැබිය යුතු ය;

(ආ) වෙනත් ණය හිමියන්ට දැනටමත් කර ඇති යම් ගෙවීමකට බාධා කරනු නොලැබිය යුතු ය;

(ඇ) එවැනි ණය හිමියන්ට තව දුරටත් කරනු ලබන ගෙවීමක දී, සමාන තත්ත්වයේ හිමිකම් පෑම් ඇති වෙනත් ණය හිමියන් ආකාරයෙන්ම ඊට සහභාගි වීමට, ඒ ණය හිමියාට හිමිකම් තිබිය යුතු ය.

9. ණය හිමියන්ට ගෙවීමක් කරනු ලබන කාලයේ දී, යම් ණයහිමියකුගේ හිමිකම් පෑමක්—

(අ) ඈවරකරු විසින් ප්‍රතික්ෂේප කරනු ලැබ, ණය හිමියා විසින් 292 වන වගන්තියේ (3) වන උපවගන්තිය හෝ 348 වන වගන්තිය යටතේ, ඈවරකරුගේ තීරණය ප්‍රතිවර්තනය කිරීමේ හෝ මඳ වශයෙන් වෙනස් කිරීමේ ආඥාවක් සඳහා අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබ ඇති විට; හෝ

(ආ) ඈවරකරු විසින් පිළිගනු ලැබූ නමුත්, ණය හිමියා විසින් 292 වන වගන්තියේ (3) වන උපවගන්තිය හෝ 348 වන වගන්තිය හෝ යටතේ, ඈවරකරුගේ තීරණය ප්‍රතිවර්තනය කිරීමේ හෝ මඳ වශයෙන් වෙනස් කිරීමේ හෝ ආඥාවක් සඳහා කරන ලද ඉල්ලීමක් පිළිබඳව දැනුම් දීම ඈවරකරුට භාර දෙනු ලැබ ඇති විටක,

ඈවරකරු විසින් –

(ඇ) ඒ හිමිකම් පෑම සම්බන්ධයෙන් ඒ ණය හිමියාට ගෙවීමක් නොකළ යුතු ය ;

(ඈ) සුදුසු යයි සිතනු ලබන්නේ නම්, වෙනත් ණය හිමියන්ට ගෙවීම් කිරීමට පෙර, ඒ හිමිකම් පෑම පිළිගනු ලැබුවේ නම් ඒ හිමිකම් පෑම සම්බන්ධයෙන් සහ ඉල්ලීමේ සම්භාව්‍ය පිරිවැය සඳහා කරනු ලැබිය හැකිව තිබූ ගෙවීම් සඳහා ප්‍රතිපාදන සලස්වනු ලැබිය හැකි ය ;

10. සමාගමක යම් ණයක් හෝ බැඳීමක්, සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් හෝ, ඈවර කිරීම ආරම්භ කිරීමට පෙර වුවද පසුව වුවද ගෙවා ඇති හෝ නිදහස් කර ඇති ඇපකරුවකු විසින් ප්‍රධාන ණය හිමියා සමඟ පවතින යම් ප්‍රතිවිරුද්ධ ගිවිසුමකට යටත්ව –

(අ) එසේ ගෙවන ලද හෝ නිදහස් කරන ලද ප්‍රමාණය සම්බන්ධයෙන් හිමිකම් පෑමක්, ප්‍රධාන ණය හිමියා විසින්, ඈවර කිරීමේදී ඉදිරිපත් කරනු ලැබ ඇත්නම්, ඒ ප්‍රමාණය සම්බන්ධයෙන් එම හිමිකම් පෑම අදාළ වන තාක් දුරට, ප්‍රධාන ණය හිමියාගේ තැන ගනු ලැබිය හැකි ය; හෝ

(ආ) ඒ ගෙවන ලද හෝ නිදහස් කරන ලද ණය හෝ බැඳීමේ ප්‍රමාණය සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් හිමිකම් පෑමක් කළ හැකි ය.

එකොළොස්වෙනි උපලේඛනය [429 (1) වගන්තිය]

## වල සෘණ භාර ඇති කරනු ලබන සාධන පත්‍රවල ව්‍යංගික නියමයන්

1. සමාගම විසින් සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රියාවලියේ දී හැර (මේ උපලේඛනයේ "සුරක්ෂිත දේපළ" යනුවෙන් සඳහන් කරනු ලැබ ඇති) වල සෘණ භාරයක අඩංගු දේපළ විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම හෝ නොකළ යුතු ය.

2. සමාගමෙන් කලින් කල ප්‍රදාන ලාභියා වෙත අයවිය යුතු සියලුම මුදල් ගෙවීම සඳහා වල සෘණ භාර ඇපයක් විය යුතු ය.

3. වල සෘණ භාරය හා එය ඇති කරනු ලබන සාධන පත්‍රය සම්පූර්ණයෙන් බලාත්මකව සහ වලංගුව පැවතිය යුතු අතර, යම් මුදලක් හෝ මුදල් ප්‍රමාණයක් ප්‍රදාන ලාභියාට ගෙවීමට හැකි වුව ද සමාගම සහ ප්‍රදාන ලාභියා අතර වූ යම් ගිණුමක් කලින් කල ණයව තිබුනේ වුව ද එසේම, ගිණුම හෝ කවරාකාර වූ හෝ වෙනත් කාරණය හෝ දෙය පිළිබඳ යම් සමථයක් තිබුනේ වුව ද, ඒ වල සෘණ භාර අඩංගු වන දේපළ සම්බන්ධයෙන් ප්‍රදාන ලාභියා විසින් ඒ වල සෘණ භාර පිළිබඳ අවසාන නිදහස් කිරීමක් ලියා අත්සන් කරනු ලබන තෙක් සමාගමෙන් ප්‍රදාන ලාභියාට කලින් කල අය විය යුතු යම් මුදල් ප්‍රමාණ ගෙවීම සඳහා අඛණ්ඩව පවත්නා ඇපයක් විය යුතු ය.

4. (අ) ඒ කෙරෙහි බැඳීමක් ඇති කෙරෙන සියලු නීතිවලට අනුකූලව විධිමත් ලෙස හා කලට වේලාවට ක්‍රියා කිරීමට;

(ආ) සමාගම හා ප්‍රදානලාභියා අතර වූ සියලුම ගිවිසුම්වල නියමයන්ට අනුකූලව විධිමත් ලෙස හා කලට වේලාවට ක්‍රියා කිරීමට හා ඒ නියමයන් විධිමත් ලෙස හා කලට වේලාවට ඉටු කිරීමට;

(ඇ) සුරක්ෂිත දේපළ සම්බන්ධයෙන් වූ කුලී, බදු, රක්ෂණ වාරික හා වෙනත් ගෙවීම් ඇතුළත්ව එහි සියලු වගකීම්, ණය, ගෙවීම්, වියදම් හා මූල්‍ය ස්වභාවයකින් යුත් බැඳීම් නියමිත දිනට හෝ ඊට පෙර ගෙවීමට හෝ නිදහස් කිරීමට;

(ඈ) සුරක්ෂිත දේපළ සම්බන්ධයෙන් වූ සියලු බදුදීම්, අතුරු බදුදීම්, බදුදීමේ ගිවිසුම්, කුලියට දීමේ ගිවිසුම් හෝ බලපත්‍ර ඇතුළුව ගිවිසුමකින් පැන නැගුන ද අන්‍යාකාරයකින් පැන නැගුන ද සමාගම කෙරෙහි බැඳීමක් ඇති කෙරෙන සියලු බැඳීම්, යුතුකම් හා පරිසීමා කිරීම් වලට අනුකූලව ක්‍රියා කිරීමට;

(ඉ) එහි සියලු වත්කම් යහපත් අයුරින් අළුත් වැඩියා කිරීමෙන් හා මනා තත්වයෙන් තබා ගැනීමට ද සහ යහපත් වාණිජ සම්ප්‍රදායට අනුකූලව එහි ව්‍යාපාර කටයුතු වලට අත්‍යාවශ්‍ය වත්කම් නඩත්තු කිරීමට, සේවා කිරීමට, අළුත් කිරීමට හෝ ආදේශ කිරීමට;

(ඊ) එහි ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා දැනට අවශ්‍ය කරන හෝ අවශ්‍ය විය හැකි හෝ වාණිජමය වශයෙන් වාසිදායක විය හැකි යම් බලය පැවරීම් ලබා ගැනීම, ඒවා වලංගුව තබා ගැනීම සහ බැහැර කිරීමට හෝ ඉකුත්වීමට ඉඩ නොදීම සහ එම බලය පැවරීම්වල සියලු කොන්දේසි හා නියම කිරීම් අනුව ක්‍රියා කිරීමට;

(උ) රක්ෂණය කළ හැකි ස්වභාවයේ වූ සුරක්ෂිත දේපලේ යම් කොටසක් ගින්නෙන්, හදිසි අනතුරුවලින්, සොරකම්, ද්වේශ සහගත හානි, ජලගැල්ම හා භූමිකම්පා වලින් සිදුවන පාඩු හෝ හානි වලට එරෙහිව රක්ෂණය කිරීමට සහ රක්ෂණය කර තබා ගැනීමට;

(ඌ) ඒ සියලුම රක්ෂණ සම්බන්ධයෙන් ගෙවිය යුතු වාරික යථා පරිදි ගෙවීමට,

සමාගම භාර ගනී.

5. සාධන පත්‍රයෙහි හෝ සමාගම හා ප්‍රදානලාභියා අතර වූ ගිවිසුමෙහි ප්‍රකාශිත හෝ ව්‍යංගික නියමයන්ගෙන් යම් නියමයක් ඉටු කිරීම හෝ පිළිපැදීම සමාගම විසින් නොසලකා හරින ලද විට හෝ පැහැර හරින ලදවිට, ප්‍රදානලාභියාට සමාගම වෙනුවෙන් ගෙවීම මගින් හෝ සමාගම වෙනුවෙන් ක්‍රියා කරමින් එවැනි යම් නියමයක් ඉටු කිරීමට හෝ පිළිපැදීමට අයිතිය තිබිය යුතු නමුත් එසේ කිරීමට ඔහු බැඳී නොසිටින්නේය. මේ ඡේදය යටතේ ප්‍රදානලාභියා විසින් ගෙවන ලද හෝ දරන ලද සියලුම ගාස්තු, වියදම් හා අයභාර වල සෑණ භාරය මගින් ආරක්ෂා කරන ලද මුදලට එකතු කල යුතු අතර එයින් ඒ මුදලෙහි කොටසක් සෑදිය යුත්තේ ය.

6. සමාගම විසින්—

(අ) සමාගම විසින් සකස් කොට එහි කොටස් හිමියන් වෙත යැවිය යුතු යැයි නීතියෙන් නියම කර ඇති සියලු විගණක වාර්තා, වාර්ෂික වාර්තා, හා වෙනත් ලේඛන ද සමග එය විසින් සකස් කළ යුතු යයි නීතියෙන් නියම කර ඇති සියලු මූල්‍ය ප්‍රකාශද ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මණින් සහ කවර කරුණක් නිසා වුව ද එහි එක් එක් මුදල් වර්ෂවල අවසාන දිනයෙන් පසු මාස තුනක් ඇතුළත සමාගම විසින් ප්‍රදාන ලාභියා වෙත භාරදිය යුතු ය;

(ආ) ප්‍රදානලාභියා විසින් ලිඛිත දැන්වීමක් මගින් සාධාරණව අවශ්‍යකරනු ලබන සමාගමේ ව්‍යාපාරය, මූල්‍යමය තත්ත්වය හා එහි ක්‍රියාකාරීත්වය පිලිබඳ වූ වෙනත් යම් තොරතුරු සැපයිය යුතු ය;

(ඇ) එහි කොටහිමියන් වෙත යම් දැන්වීම්, ලේඛන හෝ තොරතුරු යවන වි ට ඒ අවස්ථාවේදී ම ඒ දැන්වීම්වල, ලේඛනවල හෝ තොරතුරුවල පිටපත් ප්‍රදානලාභියා වෙත භාරදිය යුතු ය.

7. පහත සඳහන් සිද්ධීන්වලින් යම් සිද්ධියක් ඇතිවීම මත, සමාගම හා ප්‍රදානලාභියා අතර වූ වෙනත් යම් ගිවිසුමක කුමක් සඳහන්ව තිබුණ ද වල සෑණ භාර මගින් ආරක්ෂා කරන ලද සියලුම මුදල් ප්‍රමාණ, ප්‍රදානකරු විසින් ඉල්ලීම මත ප්‍රදානලාභියාගෙන් වහාම අයවිය යුතු හා ගෙවිය යුතු වන්නේ ය :–

(අ) සමාගම විසින් ප්‍රදානලාභියා වෙත ගෙවිය යුතු යම් මුදල් ප්‍රමාණයක් ගෙවිය යුතු දිනයේදී ගෙවීම සමාගම විසින් පැහැර හරින ලද විට;

(ආ) සමාගම විසින් සාධන පත්‍රයෙහි වෙනත් යම් නියමයන් හෝ සමාගම හා ප්‍රදානලාභියා අතර පවතින වෙනත් යම් ගිවිසුමක යම් නියමයක් හෝ ඉටුකිරීම හෝ පිළිපැදීම පැහැර හරින ලද විට;

(ඇ) සමාගමේ යම් දේපළක් කෙරෙහි ඇප සම්බන්ධතාව දරන්නකු ඒ දේපළෙහි සන්තකය ලබාගන්නා ලද විට හෝ සම්පූර්ණ සුරක්ෂිත දේපළ සම්බන්ධයෙන් හෝ එහි යම් කොටසක් සම්බන්ධයෙන් දේපළ භාර ගැනුම්කරුවකු හෝ ඇවරකරුවකු පත්කරන ලද විට;

(ඈ) සම්පූර්ණ සුරක්ෂිත දේපළට හෝ එහි යම් කොටසකට එරෙහිව ක්‍රියාවේ යෙදවීමේ රිට් ආඥාවක් සමාගමේ යම් ණය හිමියකු විසින් ලබාගන්නා ලද විට;

(ඉ) සමාගමේ ගණන් බේරා වසා දැමීම ආරම්භ කරන ලද විට;

(ඊ) සමාගමේ පරිපාලකයකු පත්කරන ලද විට;

(උ) සමාන්‍ය ව්‍යාපාරික ක්‍රියාවලියේ දී හැර සමාගමේ සම්පූර්ණ ව්‍යවසාය හෝ එහි යම් කොටසක් හෝ සමාගම විසින් බැහැර කරන ලද විට;

(ඌ) සමාගම විසින් ව්‍යාපාරය කරගෙන යාම නතර කරන ලද විට.

8. සුරක්ෂිත දේපළ, සමාගමේ සියලුම දේපළ හා ව්‍යවසාය සමන්විත වන විට, 7 වන ඡේදයේ නිශ්චිතව සඳහන් අවස්ථාවන්ගෙන් යම් අවස්ථාවක් ඇතිවීමේ දී ඒ ඡේදය යටතේ ඉල්ලීමක් කිරීමට පෙර හෝ පසුව වුව ද ප්‍රදානලාභියා විසින් සුරක්ෂිත දේපළේ, දේපළ භාර ගැනුම්කරුවකු පත්කළ හැකි ය.

දොළොස් වෙනි උපලේඛනය [443 (2) වගන්තිය]

## දේපළ භාරගැනුම්කරුවන්ගේ බලතල

1. XV වන කොටස යටතේ පත්කරන ලද සෑම දේපළ භාර ගැනුම්කරුවකුටම සාධන පත්‍රයට යටත්ව හෝ, පත්කිරීම කරන ලද්දේ යම් අධිකරණ ආඥාවක් මගින් හෝ යටතේ ද ඒ ආඥාවට යටත්ව, පහත සඳහන් බලතල ඇත්තේ ය :—

(අ) දේපළ භාර ගැනුම්කාරත්වයට අයත් දේපළෙහි ආදායම නඩුවක් මගින් හෝ අන්‍යාකාරයකින් ඉල්ලා සිටීම හා අයකර ගැනීම;

(ආ) අයකර ගන්නා ලද ආදායම සඳහා රිසිට්පත් නිකුත් කිරීම;

(ඇ) දේපළ භාර ගැනුම්කාරත්වයට අයත් දේපළ කළමනාකරණය කිරීම;

(ඈ) දේපළ භාර ගැනුම්කාරත්වයට අයත් දේපළ රක්ෂණය කිරීම;

(ඉ) දේපළ භාර ගැනුම්කාරත්වයට අයත් දේපළ අළුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම;

(ඊ) දේපළ භාර ගැනුම්කාරත්වයට අයත් දේපළට අදාළ හා ප්‍රදානකරුගේ සන්තකයේ හෝ පාලනය යටතේ තිබෙන පොත්පත් හෝ ලේඛන යම් සාධාරණ අවස්ථාවක දී පරීක්ෂා කිරීම;

(උ) දේපළ භාර ගැනුම්කාරත්වයට අයත් දේපළට අදාළ හා ප්‍රදානකරු නොවන තැනැත්තකුගේ සන්තකයේ හෝ පාලනය යටතේ තිබෙන පොත්පත් හෝ ලේඛන පරීක්ෂා කිරීමේ අයිතිවාසිකම ප්‍රදානකරු වෙනුවෙන් ක්‍රියාත්මක කිරීම;

(ඌ) සමාගමේ සියලුම දේපළ හා ව්‍යාපාරය හෝ හරයාත්මක වශයෙන් සියලුම දේපළ හා ව්‍යාපාරය සම්බන්ධයෙන් දේපළ භාර ගැනුම්කරු පත්කරන ලද අවස්ථාවක දී, සමාගමේ ලියාපදිංචි කාර්යාලය වෙනස් කිරීම;

(එ) මේ ඡේදයෙහි දක්වා ඇති හෝ මේ පනතේ වෙනත් යම් විධිවිධානයක් මගින් පවරන ලද බලතල ක්‍රියාත්මක කිරීමට ආනුෂංගික වන වෙනත් සියලු දේ කිරීම.

2. 1 වන ඡේදයේ විධිවිධාන සීමා කිරීමකින් තොරව, සාමාගමක සම්පූර්ණ දේපළ හා ව්‍යාපාරය සම්බන්ධයෙන් පත් කරන ලද දේපළ භාර ගැනුම්කරුවකුහට, සාධන පත්‍රයට යටත්ව හෝ, පත්කිරීම සිදුකරන ලද්දේ යම් අධිකරණ ආඥාවක් මගින් හෝ යටතේ ද එකී ආඥාවට යටත්ව, පහත සඳහන් බලතල ඇත්තේ ය :—

(අ) සමාගමේ දේපළෙහි සන්තකය අත්කර ගැනීම, එක්රැස් කිරීම හා ලබාගැනීම සහ ඒ කාර්යය සඳහා යෝග්‍ය යයි ඔහුට පෙනී යා හැකි යම් නඩු කටයුතු ආරම්භ කිරීම;

(ආ) ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ පෞද්ගලික වෙන්දේසියේ හෝ පෞද්ගලික ගිවිසුමක් මගින් හෝ සමාගමේ දේපළ විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;

(ඇ) මුදල් ලබාගැනීම හෝ ණයට ගැනීම සහ ඒ මුදල් සඳහා සමාගමේ දේපළ මත ඇප ලබාදීම;

(ඈ) තම කර්තව්‍ය ඉටුකිරීමේ ලා තමාට සහායවීම පිණිස සොලිසිටර්වරයකු හෝ ගණකාධිකාරීවරයකු හෝ වෘත්තීයමය සුදුසුකම් ඇති වෙනත් තැනැත්තකු පත්කිරීම;

(ඉ) සමාගමේ නමින් හෝ සමාගම වෙනුවෙන් යම් නඩුවක් හෝ නඩු කටයුත්තක් පැවරීම හෝ විත්තිවාචක ඉදිරිපත් කිරීම;

(ඊ) සමාගමට බලපාන යම් ප්‍රශ්නයක් බේරුම් කිරීමට යොමු කිරීම;

(උ) සමාගම සතුව මුද්‍රාවක් තිබේනම් ඒ මුද්‍රාව පාවිච්චි කිරීම;

(ඌ) සමාගමේ නමින් හා වෙනුවෙන් සියලුම ක්‍රියා කිරීම සහ යම් ලේඛනයක් ලියා අත්සන් කිරීම;

(එ) යම් විනිමය බිල්පතක් හෝ පොරොන්දු නෝට්ටුවක් සමාගම නමින් හෝ වෙනුවෙන් ලිවීම, භාරගැනීම, සකස් කිරීම හා පිටසන් කිරීම;

(ඒ) .තමාටම කල නොහැකි හෝ අනුයෝජිතයකු මගින් වඩාත් පහසුවෙන් කරවනු ලැබිය හැකි යම් ව්‍යාපාරයක් කිරීමට අනුයෝජිතයකු පත්කිරීම, සේවකයන් සේවයේ යෙදවීම සහ සේවයෙන් පහකිරීම;

(ඔ) සමාගමේ දේපළ මුදල් කිරීම සඳහා අවශ්‍ය විය හැකි (වැඩ කරගෙන යාම ඇතුළත්ව) සියලු දේ කිරීම;

(ඕ) ඔහුගේ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා අවශය වන්නා වූ හෝ ආනුෂංගික වන්නා වූ යම් ගෙවීමක් සිදු කිරීම;

(ක) සමාගමේ ව්‍යාපාරය හා දේපළ සම්බන්ධයෙන් රක්ෂණයන් ලබාගැනීම හා පවත්වා ගෙන යාම;

(ග) සමාගමේ ව්‍යාපාරය කරගෙන යාම;

(ච) සමාගමේ පාලිත සමාගම් පිහිටුවීම;

(ජ) සමාගමේ ව්‍යාපාරය හා දේපළ සම්පූර්ණයෙන්ම හෝ එහි යම් කොටසක් හෝ සමාගමේ පාලිත සමාගම්වලට පැවරීම;

(ට) සමාගමේ යම් දේපළක් පිළිබඳ බද්දක් හෝ කුලීකරයක් පවාරණය කිරීමක් ප්‍රදානය කිරීම හෝ භාරගැනීම සහ සමාගමේ ව්‍යාපාරය සඳහා අවශ්‍ය වන හෝ පහසු කරවන යම් දේපළක් බද්දට ගැනීම හෝ දේපළක කුලීකරයක් ගැනීම;

(ඩ) සමාගම වෙනුවෙන් යම් සමථයකට පැමිණීම හෝ වැඩපිළිවෙලක් යොදාගැනීම;

(ණ) සමාගමට ණයගැති වී සිටින යම් තැනැත්තකු වස්තුභංගත්වයට පත්වීමේ දී බුන්වත් වීමේ දී හෝ ඔහුගේ දේපළ තහනම් කිරීමේ දී හෝ ඈවර කිරීමේ දී හිමිකම් ලැයිස්තුවට ඇතුළත් වීම හා හිමිකම් පෑම හා ලාභාංශ ලැබීම සහ එවැනි යම් තැනැත්තකුගේ ණය හිමියන් සඳහා වූ භාර ඔප්පු වලට එකඟ වීම;

(ත) සමාගමේ ඈවරකරුවකු පත්කිරීම සඳහා ඉල්ලා සිටීම;

(ද) මේ ඡේදයේ දක්වා ඇති බලතල ක්‍රියාත්මක කිරීමට ආනුෂංගික වන්නා වූ වෙනත් සියලු දේ කිරීම.

දහතුන්වෙනි උපලේඛනය [497 (1) වන වගන්තිය]

### විදේශ සමාගම්වල වත්කම් ඈවර කිරීම

1. XII වන කොටස, අවශ්‍ය සියලු සුළු වශයෙන් වූ වෙනස් කිරීම් සහ බැහැර කිරීම් හා විශේෂයෙන්ම පහත දැක්වෙන දේවල් සහිතව විදේශ සමාගමක ශ්‍රී ලංකාව තුළ තිබෙන වත්කම් ගණන් බේරා වසා දැමීම කෙරෙහි අදාළ විය යුතු ය :–

(අ) වත්කම් පිළිබඳ සඳහන් කිරීම් ශ්‍රී ලංකාව තුළ තිබෙන වත්කම් පිළිබඳ සඳහන් කිරීම් ලෙස සැලකිය යුතු ය;

(ආ) සමාගමක් පිළිබඳව සඳහන් කිරීම් වලට විදේශ සමාගමක් පිළිබඳ සඳහන් කිරීම් ද ඇතුළත් ලෙස සැලකිය යුතු ය;

(ඇ) විසුරුවා හැරීම පිළිබඳ සඳහන් කිරීම් ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරය කරගෙන යාම නතර කරනු ලැබීමට කරනු ලබන සඳහන් කිරීම් ලෙස සැලකිය යුතු ය;

(ඈ) එවැනි ගණන් බේරා වසා දැමීමක් සඳහා පහත සඳහන් විධිවිධාන අදාළ නොවිය යුතු ය :–

(i) 267 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) සහ (ඇ) ඡේදයන්;

(ii) 268, 269, 316, 319 සිට 355 (දෙකම ඇතුළුව) 393, 394 හා 395 යන වගන්ති;

(ඉ) XII වන කොටස යටතේ නියම කරනු ලැබ ඇති හෝ ක්‍රියාත්මක කිරීමට අවසර දෙනු ලැබ ඇති බලතල, කර්තව්‍ය හා කාර්යය හැර විදේශ සමාගමට සහ එහි අධ්‍යක්ෂවරයන්ට ශ්‍රී ලංකාව තුළ ඇති සමාගමේ වත්කම්වලට අදාළව යම් බලතල, කර්තව්‍ය සහ කාර්ය ගණන් බේරා වසා දැමීම ආරම්භ වූ අවස්ථාවෙහි සිට නතර වන්නේ ය.

2\. (අ) ඇවරකිරීමේ දී හිමිකම් පෑම් ඉදිරිපත් කරනු නොලැබූ ණයකට හෝ ඇවර කිරීම සම්පූර්ණ කිරීමෙන් පසු නොගෙවා ඉතිරිව ඇති ණය ශේෂයට හෝ අදාළව විදේශ සමාගමට එරෙහිව ශ්‍රී ලංකාවෙන් පිටස්තරව නඩු කටයුතු පැවරීම; හෝ

(ආ) ඇවර කිරීම සම්පූර්ණ කිරීමෙන් පසු නොගෙවා ඉතිරිව ඇති ණය ශේෂයට අදාළව ශ්‍රී ලංකාව තුළ නඩු කටයුතු පැවරීම,

සඳහා ඇවරකරුවකු පත් කරනු ලැබූ වත්කම් වලට අදාළව විදේශ සමාගමක ණයහිමියකුගේ අයිතිවාසිකම් මේ පනතේ අඩංගු කිසිවක් මගින් බැහැර කිරීමක් හෝ ඊට බලපෑමක් හෝ ඇති නොවන්නේ ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.